ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවල් සමඟ නැවත සම්බන්ධ වීමට සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අවස්ථාව සැලසේ. 2024 වසරේ දී, මධ්‍යම රජයේ ණය 2023 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 104.7 සිට 2024 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 96.1 ක් දක්වා අඩු විය.

2024 වසරේ දී, ශ්‍රී ලංකාව ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම්වල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත් අතර, එය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ සාර්ව ආර්ථික ස්ථායිකරණ ප්‍රයත්නයන්හි ශ්‍රී ලංකාවෙහි ප්‍රගතිය පිළිබිඹු කරයි. 2022 වසරේ මැයි මාසයේ දී සිය පළමු විදේශ ණය ගෙවීම පැහැර හැරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව 2023 වසරේ මාර්තු මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ඇ.ඩො. බිලියන 2.9 ක් ලබා ගත් අතර එය පුළුල් රාජ්‍ය මූල්‍ය-මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මුලපිරීම් සඳහා අවශ්‍ය පදනම සපයන ලදී. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ෆිච් (fitch) ශ්‍රේණිගත කිරීම් මඟින් ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත් කරන්නන්ගේ පැහැරහැරීම් ශ්‍රේණිගත කිරීම (Sri Lanka's long-term foreign-currency issuer default rating) සීමා කරන ලද ණය පැහැර හැරීම් මට්ටමේ සිට 'CCC+' දක්වා අදියර කිහිපයකින් ඉහළ නැංවීමත් සමඟ ණය ශ්‍රේණිගත කිරීම් සැලකිය යුතු සන්ධිස්ථානයකට ළඟා විය. බාහිර අවදානම අඩු වීම සහ රජයේ ද්‍රවශීලතාවය වැඩිදියුණු වීම විදහා දක්වමින් මූඩීස් ආයෝජක සේවාව ද ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත් කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම 'Ca' සිට 'Caa1' දක්වා අදියර කිහිපයකින් ඉහළ නැංවීම මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය හඳුනා ගන්නා ලදී. ශ්‍රී ලංකාවෙහි පවතින ස්ථාවරත්වය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ සිදු කරනු ලබන අඛණ්ඩ ප්‍රතිසංස්කරණ පිළිබඳව වන ශ්‍රී ලංකාවෙහි කැපවීම පිළිබිඹු කරන අතර ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථාවත් වීම පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීම විදහා දක්වයි. කෙසේ වුවද, ද.දේ.නි. යට ඉහළ ණය අනුපාතයක් පැවතීම සහ දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීම සඳහා අඛණ්ඩව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාවය ආදී අභියෝග තවමත් පවතී. ලෝක බැංකුව 2025 වසර සඳහා සියයට 3.5 ක ආර්ථික වර්ධනයක් පුරෝකථනය කරන අතර, එමඟින් වෙළඳාම, ආයෝජන සහ සියල්ල අන්තර්ගත වර්ධනය උත්තේජනය කිරීම සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. මේ අතර, එක්සත් ජනපදය විසින් යෝජිත තීරුබදු ප්‍රතිපත්තිය මෙන්ම එහි ප්‍රතිවිපාක ගෝලීය භූ දේශපාලනික අවිනිශ්චිතතාවයන් සමඟ සංයෝජනය වී ආර්ථික දැක්ම කෙරෙහි අවදානම් ඇති කළ හැකිය.

දිගුකාලීන රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සහතික කිරීමේ දී වර්ධනය ඉහළ නැංවීම සඳහා ආයතනික හා නීතිමය ප්‍රතිසංස්කරණවල වැදගත්කම හඳුනාගෙන ඇත. මෙම සන්දර්භය තුළ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත වැනි ප්‍රධාන නීති සම්පාදන රාමු 2024 වසරේ දී බලාත්මක කිරීම, වගකිවයුතු සහ විනයගරුක රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ වෘත්තීය ණය කළමනාකරණය සහතික කිරීම සඳහා වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරනු ලබයි. මෙලෙස රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ඇති ප්‍රධාන නීති මඟින් රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කර, රාජ්‍ය මූල්‍ය අංශයෙහි විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කර, සහ විචක්ෂණශීලී ණය කළමනාකරණ භාවිතයන් ආයතනීකරණය කරනු ඇති අතර, මේ සියල්ල ලබා ගත් ජයග්‍රහණ තහවුරු කිරීමට සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල ප්‍රතිෂ්ඨාපනය කරන ලද විශ්වසනීයත්වය ආරක්ෂා කිරීමට ඉතා වැදගත් වනු ඇත. මෙම ප්‍රතිසංස්කරණ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙහි මිණුම් දඬු සමඟ අනුකූල වීම සඳහා සහාය වූවා පමණක් නොව, ආයතනික විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම සහ රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත බලාත්මක කිරීම, කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණය, රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම සහ රාජ්‍ය අංශයේ ආයතනවල වැඩිදියුණු කළ අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පාලන රාමුව ප්‍රතිසංස්කරණය කිරීමේ පරිවර්තනීය පියවරක් සනිටුහන් කරන ලදී. මෙමඟින් 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රතිස්ථාපනය කරමින් සහ 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති කිහිපයක් ප්‍රතිස්ථාපනය කරමින්, නව නීති සම්පාදනය මඟින් අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සිට ගිණුම්කරණය, වාර්තා කිරීම සහ අධීක්ෂණය දක්වා සමස්ත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ චක්‍රය කළමනාකරණය කිරීම සඳහා පුළුල් නීතිමය ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ දැඩි ලෙස අනුගත වී ඇති අතර රාජ්‍ය මූල්‍ය පිළිබඳ වගකීම, වගවීම, විනිවිදභාවය සහ රාජ්‍ය සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව වැනි මූලික මූලධර්ම මෙමඟින් හඳුන්වා දෙනු ලබයි.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි වැදගත්ම ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය මූල්‍ය විනය සහතික කිරීම සඳහා බැඳීම් සහිත රාජ්‍ය මූල්‍ය රීති ස්ථාපනය කිරීමයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් ප්‍රාථමික වියදම් සඳහා ද.දේ.නි.යෙන් සියයට 13 ක සීමාවක් නියම කරන අතර ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා අනුකූල වන පරිදි ප්‍රාථමික අතිරික්ත ඉලක්කය මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවෙහි අංගයක් ලෙස නිරන්තර නිරීක්ෂණයට ලක් කෙරෙනු ඇත. ප්‍රතිඵල මත පදනම් වූ රාජ්‍ය වියදම් සහතික කිරීම සහ රජයේ වැඩසටහන්වල සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ප්‍රවේශයක් අනුගමනය කිරීමට අපේක්ෂා කෙරේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ, වාර්ෂික අයවැය සකස් කිරීම සහ රාජ්‍ය මූල්‍ය අධීක්ෂණය ශක්තිමත් කරන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය (Fiscal Strategy Statement) සමඟ රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය (Fiscal Risk Statement) 2025 වසරේ ජුනි මස අවසානය වන විට ප්‍රකාශයට පත් කළ යුතුය. මේ මඟින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ පුරෝකථනය කිරීමේ හැකියාව, විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කරනු ඇත. ප්‍රකාශිත

ප්‍රතිපත්ති අරමුණු සහ රාජ්‍ය මූල්‍ය පරාමිතීන් අතර පැහැදිලි සම්බන්ධයක් සපයමින් රජයේ ආදායම, රජයේ වියදම්, රාජ්‍ය මූල්‍ය පිළිබඳ සමස්ත ශේෂය සහ ප්‍රාථමික ශේෂය ආදී රාජ්‍ය මූල්‍ය සමස්තයන් ඇතුළත් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළ ඇතුළත් වේ. රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවෙහි පරාමිතීන් මත පදනම්ව වාර්ෂික අයවැය සකස් කෙරේ. රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රතිපත්ති, තිරසාර රාජ්‍ය ණය මට්ටමක් සාක්ෂාත් කර ගැනීම සඳහා වන කාල රාමුව, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සහ ස්ථාපිත රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට අනුකූලව කාර්යසාධනය පිළිබඳ තක්සේරු කිරීම දක්වා ඇත. මේ අතර, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරනු ලබන රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය, අසම්භාව්‍ය බැරකම් (contingent labilities), සාර්ව ආර්ථික අංශය මඟින් ඇතිවිය හැකි අවදානම් සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් මඟින් පැන නැගිය හැකි අවදානම්, ඒවායෙහි රාජ්‍ය මූල්‍ය බලපෑම සහ එම බලපෑම් අවම කිරීමේ පියවර ඇතුළු රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ විභවයන් පිළිබඳව සඳහන් කරනු ලබයි. මෙම ලිපිලේඛන මඟින් මහජනතාව වෙත තොරතුරු අනාවරණය කිරීම සහ පාර්ලිමේන්තුවේ සුපරීක්ෂණයට වගවීම ශක්තිමත් කරනු ලබයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීමෙන් අනතුරුව එය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ විශ්වසනීයත්වය ඉහළ නැංවීම, අනාගතයේ දී රාජ්‍ය මූල්‍ය අංශය සම්බන්ධ අපගමනයවීම්වලින් ආරක්ෂා වීම සහ ශ්‍රී ලංකාවේ පුළුල් ආර්ථික ප්‍රකෘතියට සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ විනිවිදභාවය සහතික කිරීම සඳහා, රජය අයවැය, ආර්ථික හා මූල්‍ය තත්ත්ව වාර්තාව 2025 සමඟ 2023/2024 වසර සඳහා වන බදු වියදම් ප්‍රකාශය 2025 වසරේ පෙබරවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රකාශය මඟින් පවතින බදු වියදම්වල මුළු පිරිවැය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර වාර්තාකරණ කාලය තුළ හඳුන්වා දුන් නව බදු වියදම් පිළිබඳ සම්පූර්ණ වශයෙන් තොරතුරු සපයනු ලබයි. බදු නිදහස් කිරීම්, අඩු කිරීම් සහ සහනදායී බදු ආදී බදු සම්බන්ධ සහන සැලසීම මඟින් ආදායම් අහිමිවීම පුරෝකථනය කරමින්, මෙම බදු වියදම් ප්‍රකාශය වැඩි රාජ්‍ය මූල්‍ය විනිවිදභාවයක් සහ වගවීමක් සහතික කරනු ලබයි. එය පාර්ලිමේන්තුවට සහ මහජනතාවට බදු ප්‍රතිපත්ති තීරණවල රාජ්‍ය මූල්‍ය බලපෑම වඩා හොඳින් අවබෝධ කර ගැනීමට, බදු දිරිගැන්වීම්වල ඵලදායීතාවය ඇගයීමට සහ එවැනි පියවර රජයේ පුළුල් ආර්ථික හා සමාජීය අරමුණු සමඟ අනුගත වී ඇති බව සහතික කිරීම සඳහා හැකියාව ලබා දෙයි.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති තවත් තීරණාත්මක ප්‍රධාන ආරක්ෂිත පියවරක් වන්නේ රජයේ ඇපකරවල සමස්ත තොගය සඳහා ව්‍යවස්ථාපිත සීමාවක් පැනවීමය. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අදාළ මුදල් වර්ෂයේ සහ ඊට පෙර අනුයාත මුදල් වර්ෂ දෙකක හිඟ සමුච්චිත රජයේ ඇපකරවල වටිනාකම ද.දේ.නි.යේ සාමාන්‍ය අගයෙන් සියයට 7.5 නොඉක්මවන ලෙස සීමා කර තිබේ. මෙම විධිවිධානය මඟින් ශ්‍රී ලංකාවේ තිරසාර නොවන ණය එකතුවීම කෙරෙහි හේතු වූ ව්‍යුහාත්මක දුර්වලතාවලින් එකක් වන මධ්‍යම රජයේ ශේෂ පත්‍රයෙන් බැහැරව ඇපකරයක් මඟින් ගෙවීම සහතික කරන ලද ණය වගකීම් පාලනයකින් තොරව පුළුල් වීම සම්බන්ධයෙන් සෘජුවම සලකා බලනු ලබයි. අසම්භාව්‍ය බැරකම් සඳහා නිරාවරණය වීම සීමා කිරීමෙන්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ශක්තිමත් කරන අතර සම්පූර්ණයෙන් ග්‍රහණය කර ගත නොහැකි රාජ්‍ය මූල්‍ය අවදානම් අඩු කරයි. ඇපකර සීමාව වසර පහක සමාලෝචන චක්‍රයකට ද යටත් වන අතර එය විකාශනය වන සාර්ව ආර්ථික තත්ත්වයන් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති ණය අඩු කිරීමේ ඉලක්ක සමඟ සමපාතව පවතින බව සහතික කරයි. මෙම ක්‍රියාමාර්ගය මඟින් ඇපකර නිකුත් කිරීමේ දී ඉහළ විනයක් ඇති කිරීමට සහ තිරසාර ණය කළමනාකරණයේ ඉලක්කය කරා ලඟා කර ගැනීමට අවශ්‍ය සහය ලබාදීමට අපේක්ෂා කෙරේ.

මේ අතර, රාජ්‍ය ණය කළමනාකරණයේ දිගුකාලීන ආයතනික සහ නෛතික අඩුලුහුඬුකම් සඳහා නිසි විසඳුමක් සපයමින් ණය මෙහෙයුම් විනිවිදභාවයෙන්, වගවීමෙන් සහ තිරසාර අයුරින් ඉටු කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ පනත මඟින් පුළුල් නීතිමය සහ ආයතනික රාමුවක් ස්ථාපිත කරන ලදී. එමඟින් මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ප්‍රධාන ආයතනවල බලතල සහ වගකීම් නිරූපණය කරන අතර, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයක් සහ වාර්ෂික ණය ගැනීමේ සැලැස්මක් සකස් කිරීම ණය සැලසුම් කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා මූලික අයිතම ලෙස ක්‍රියා කරයි. මෙම විධිවිධානවලට අනුකූලව, 2025 වසරට අදාළ අයවැය සමඟ 2025 වසරේ පෙබරවාරි මාසයේදී මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2025–2029 සහ වාර්ෂික ණය ගැනීමේ සැළැස්ම 2025 ප්‍රකාශයට පත් කරන ලද අතර, එමඟින් මහජනතාවට සහ වෙළෙඳපොළ සහභාගිවන්නන්ට රජයේ ණය ගැනීමේ අභිප්‍රායන් සහ ණය අවදානම් කළමනාකරණ ප්‍රමුඛතා පිළිබඳ පැහැදිලි ඉදිරි දැක්මක් ලබා දෙන ලදී. මෙම ලේඛන රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ ආයෝජකන්ගේ විශ්වාසය වැඩි දියුණු කරන අතර, පුළුල් සාර්ව ආර්ථික අරමුණු සමඟ ණය ගැනීමේ තීරණ අනුගත කිරීම සඳහා අත්‍යවශ්‍ය මෙවලම් ලෙස කටයුතු කරයි. දිගුකාලීන ණය තිරසාරභාවය සහතික කිරීමේදී සහ වඩාත් හොඳ රාජ්‍ය මූල්‍ය හා සාර්ව ආර්ථික පාලනය සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම ශක්තිමත් කිරීමේදී රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීම වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය 2024 වසරේ දෙසැම්බර් මස 2 වන දින මුදල් අමාත්‍යාංශය යටතේ විධිමත් ලෙස ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීමේදී පැහැදිලි ස්වාධීනත්වයක් සහ විශේෂිත

විශේෂඥතාවයක් සහිත ණය කළමනාකරණය සඳහාම කැපවූ කාර්යාලයක් ලෙස නිර්මාණය කර ඇති අතර මෙම ආයතනය මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සහ වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සකස් කිරීම සඳහා වගකියනු ලැබේ. ණය කළමනාකරණය, ණය ඇපකර නිකුත් කිරීම සහ ණය ඇපකර කළමනාකරණය කිරීම, අරමුදල් ණයට ගැනීමේ ක්‍රියාවලිය හසුරුවන ආකාරය සහ එම අරමුදල් නැවත ණයට දෙන ආකාරය කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ ණය වාර්තා කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධ ඉදිරි කාර්යාල, මධ්‍යම කාර්යාල සහ පසු කාර්යාල මෙහෙයුම්වල ද මෙම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පුරෝගාමී ලෙස කටයුතු කරනු ඇත. 2025 වසර අවසානය වන විට සම්පූර්ණ ක්‍රියාත්මක වීම ඉලක්කගත කර ගනිමින් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය දැනට එහි මූලික වශයෙන් ස්ථාපිත කිරීමේ අදියරේ පවතී. සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරී වූ පසු, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය කාර්යක්ෂම ලෙස ණය මෙහෙයුම් සහතික කිරීම, අවදානම් අධීක්ෂණය වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය මූල්‍ය විනය සහ වෙළෙඳපොල විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2023 වසරේ මාර්තු මස 20 වන දින ඇ. ඩො. බිලියන 2.9 ක විස්තීරණ ණය පහසුකම අනුමත කිරීමෙන් අනතුරුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය එකිනෙක සම්බන්ධ වීම ආරම්භ විය. විස්තීරණ ණය පහසුකම යටතේ සපයන ලද තාක්ෂණික සහාය 2022-2023 කාලය තුළ දී අත්විඳින ලද දැඩි ආර්ථික අර්බුදයට මුහුණ දීම පිණිස පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම පුළුල් ප්‍රතිසංස්කරණ රාජ්‍ය මූල්‍ය, මුදල්, පාලනය සහ ආයතනික ක්ෂේත්‍ර ආශ්‍රිතව ගැඹුරට කිදා බැසගත් අභියෝග සඳහා විසඳුම් ලබා දෙන ලදී. තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම; ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තහවුරු කිරීම ; අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම සඳහා සමාජ ආරක්ෂණ ජාලය වැඩි දියුණු කිරීම; මිල ස්ථාවරත්වය පවත්වා ගැනීම; නම්‍යශීලී විනිමය අනුපාත ව්‍යූහයක් යටතේ ජාත්‍යන්තර සංචිත නැවත ගොඩනැගීම; මූල්‍ය අංශයේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම; සහ වර්ධනය සඳහා වන විභවයන් අනාවරණය කිරීම සහ පාලනය සහ දූෂණ විරෝධී ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම සඳහා පුළුල් පදනම් වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම මෙම වැඩසටහනේ ප්‍රධාන අංග අතරට ඇතුළත් විය. මේ දක්වා ක්‍රියාත්මක කර ඇති ප්‍රතිසංස්කරණ පියවර හුදෙක් අර්බුදය සඳහා කඩිනම් විසඳුම් පමණක් නොව, අර්බුදය සඳහා මූලික වූ හේතු සඳහා විසඳුම් ලබාදෙන පදනමක් සපයන, දිගුකාලීන උපාය මාර්ග විය. එහි ප්‍රතිඵලයක් ලෙස, අර්බුදකාරී වසරවල දී ආසන්න වශයෙන් සියයට 10 කින් පමණ හැකිලුණු ශ්‍රී ලංකා ආර්ථිකය 2024 වසරේ දී සියයට 5 ක ධනාත්මක වර්ධනයක් කරා නැවත පැමිණෙනු දක්නට ලැබුණි. 2024 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව අත්කරගත් කාර්යසාධනය ප්‍රශංසනීය විය. සමාජ වියදම් පිළිබඳ දර්ශක ඉලක්කය හැර, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය සඳහා අත්කරගැනීමට නියමිතව තිබූ සියලුම ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සපුරා ගන්නා ලදී. 2025 වසරේ ජනවාරි මස අවසානය වන විට සපුරා ගැනීමට නියමිතව තිබූ බොහෝ ව්‍යුහාත්මක මිණුම් දඬු සුළු ප්‍රමාදයන් සහිතව සපුරා ගන්නා ලදී. 2025 වසරේ මාර්තු මස අවසානය වන විට සපුරාගත යුතුව තිබූ සියලුම දර්ශක ඉලක්ක සාර්ථකව ලභා කර ගන්නා ලදී. මෙම කැපී පෙනෙන ප්‍රගතිය පිළිබිඹු කරමින්, 2025 වසරේ පෙබරවාරි මස 28 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ තුන්වන සමාලෝචනය සම්පූර්ණ කළ අතර, එමඟින් අඛණ්ඩ ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්ට සහාය වීම සඳහා ඇ.ඩො. මිලියන 334 ක ක්ෂණික අරමුදල් නිදහස් කරන ලදී. මෙමඟින් වැඩසටහන යටතේ නිදහස් කරන ලද සමස්ත අරමුදල් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 1.34 ක් විය.

2025 වසරේ අප්‍රේල් මස 25 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරීන් ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ සිව්වන සමාලෝචනය අවසන් කිරීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණෙන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් අනතුරුව, අමතර මූල්‍යාකරණයක් ලෙස ශ්‍රී ලංකාවට ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 344 ක් ලබා ගැනීම සඳහා ප්‍රවේශය ලැබෙනු ඇත. මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහන යටතේ, ප්‍රධාන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, විශේෂයෙන්ම පිරිවැය නිරූපිත විදුලි මිලකරණය පවත්වා ගැනීම, රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ගෝලීය වෙළෙඳ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවය ඉහළ යාම අනාගතයට අවාසිදායක ලෙස බලපෑම් ඇති කළ හැකි බවට අනතුරු ඇඟවූ අතර, වැඩසටහනේ අරමුණු නිසි පරිදි පවත්වා ගැනීම පිණිස අවිනිශ්චිත අවස්ථාවන් සඳහා සැලසුම් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන මඟින් සහාය දක්වනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ වැඩසටහන, ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා පමණක් නොව, වඩාත්ම අවදානමට ලක්විය හැකි පුරවැසියන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම ද අරමුණු කරගෙන නිර්මාණය කර ඇත. 2022 වසරේ දී සිදු වූ අර්බුදයේ සංකීර්ණ සමාජ බලපෑම් හඳුනා ගනිමින්, රාජ්‍ය මූල්‍ය හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමඟ සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා ද රජය ප්‍රමුඛත්වය ලබා දී තිබේ. 2024 වසරේ දී, ශ්‍රී ලංකාවෙහි සමාජ ආරක්ෂණ රාමුව නිවැරදි කිරීම සඳහා සැළකිය යුතු පියවර රැසක් ගෙන ඇත.

2025 වසරේ අප්‍රේල් මාසයේ දී, රජය දුප්පත් සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා වන දීමනා වැඩි කරන ලද අතර, මෙහිදී වැඩිහිටි, ආබාධිත සහ නිදන්ගත වකුගඩු රෝගීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. මීට අමතරව, 2025 වසරේ ජනවාරි මස සිට මැයි මස දක්වා කාලය තුළ අඩු වරප්‍රසාද ලත් පාසල්වල දරුවන්ට ලිපි ද්‍රව්‍ය සඳහා දීමනා ලබා දෙන ලදී. මෙම ප්‍රයත්නයන්හි ප්‍රධානතම අංගය වූයේ අවශ්‍යතා ඇති අයට ඉලක්කගත මූල්‍ය සහන ලබා දීම අරමුණු කරගත් අස්වැසුම නම් සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමයි. වැඩසටහනේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, 2024 වසරේ පෙබරවාරි මස වන විට සැළකිය යුතු ප්‍රමාණයේ දුක්ගැනවිලි සංඛ්‍යාවක් සඳහා විසඳුම් ලබා දී සුදුසුකම් ලත් ප්‍රතිලාභීන්ට ගෙවීම් සිදු කරනු ලැබූ අතර පසුගිය කාලපරිච්ඡේදය සඳහා ඔවුන්ට ලැබීමට හිමිකම් ඇති මුදල් ගෙවීමට අවශ්‍ය කටයුතු ද ආරම්භ කරන ලදී. බැහැර කිරීමේ දෝෂ නිවැරදි කිරීම සඳහා දෙවනවරට අයදුම්පත් කැඳවීමේ වටයක් 2024 වසරේ මාර්තු මාසයේ දී ආරම්භ කරන ලද අතර, මේ සඳහා ආසන්න වශයෙන් නව අයදුම්කරුවන් 450,000 ක් පමණ ඇතුළත් විය. සුභසාධන වියදම් ඉලක්කගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා, 2025 වසරේ දී පළමු වටයේ අයදුම්කරුවන් මිලියන 3.4 ක් නැවත සහතික කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතිය (IWMS) වෙත හඳුන්වා දීමට නියමිතය. එමෙන්ම, අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා කුසලතා පුහුණුව සහ ජීවනෝපාය සඳහා සහාය වීම පිණිස බලගැන්වීමේ වැඩසටහනක් ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

දක්ෂ හා පුහුණු සේවකයින් රාජ්‍ය අංශයට ආකර්ෂණය කර ගන්නා අතරම රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා යහපත් ජීවන තත්ත්වයක් ලබා දීම පිණිස, දශකයකට පසු එනම් 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මූලික වැටුප් සංශෝධනය ක්‍රියාත්මක කරන ලදී. අතුරු සහ විශේෂ දීමනාව මූලික වැටුපට ඒකාබද්ධ කරමින් අවම මාසික මූලික වැටුප රු. 15,750 කින් එනම් රු. 24,250 සිට රු. 40,000 දක්වා ඉහළ නංවන ලදී. ඒ අයුරින්ම, 2024 වසරේ ජනවාරි මස 01 වන දිනට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා විසඳමින්, 2024 වසරේ පැවති ජනාධිපතිවරණයෙන් අනතුරුව, විශ්‍රාමිකයන් සඳහා මාසිකව රු. 3,000 ක වැටුප් වැඩිවීමක් ක්‍රියාත්මක කරන ලදී. තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව 2020 වසරේ ජනවාරි මස 01 වන දිනට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් අදියර තුනකින් සංශෝධනය කිරීමට 2025 වසරේ අයවැය මඟින් යෝජනා කරන ලදී. එහි පළමු අදියරේ දී, 2018 වසරේ ජනවාරි මස 01 වන දිනට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් 2025 වසරේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කෙරේ.

ආර්ථිකය සංකීර්ණ මෙන්ම සීඝ්‍ර ලෙස වෙනස් වෙමින් පවතින ගෝලීය පරිසරයකට ගොදුරු වීමේ අවදානමට ලක්ව ඇත. මේ අතුරින් වඩාත්ම ක්ෂණිකව ඇති විය හැකි අවදානම් අතර ඇඟලුම් සහ රබර් පදනම් කරගත් නිෂ්පාදන කෙරෙහි ඍණාත්මක ලෙස බලපෑ හැකි එක්සත් ජනපද තීරුබදු ඉහළ නැංවීමේ අවදානම ද වේ. මීට අමතරව, භූ දේශපාලනික ගැටුම් තීව්‍ර වීමෙහි වඩාත් බරපතල තත්ත්වයන්, බලශක්ති මිල අස්ථාවරත්වය සහ දේශගුණික විපර්යාස වැනි පුළුල්ව පැතිරුණු බාහිර අවිනිශ්චිතතාවයන් ද ආර්ථිකය මත දැඩි ලෙස බලපෑම් එල්ල කල හැකිය. වෙළෙඳ ප්‍රවාහයන්, ප්‍රාග්ධනය සීමාවන් නොමැතිව දේශසීමා හරහා හෝ ආර්ථිකයක් තුළ ගමන් කිරීම සහ භාණ්ඩ මිල ගණන්වලට බලපාන අඛණ්ඩ ලෙස පහළ යාමට බලපාන අවදානම් හේතුවෙන් ගෝලීය ආර්ථිකය සියයට 3.5 ක පමණ මන්දගාමී කාර්ය සාධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඵලදායිතාව වැඩි දියුණු කිරීම, අපනයන වෙළෙඳපොල විවිධාංගීකරණය කිරීම සහ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක ගොඩනැගීම මඟින් ශ්‍රී ලංකාව තම දේශීය ආර්ථිකයෙහි ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කළ යුතු බවට මේ මඟින් සහතික කර ඇත.

දුෂ්කර ප්‍රයත්නයන් සමූහයක් ඔස්සේ ලබාගත් මෙම ජයග්‍රහණ ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම අඛණ්ඩවූ ව්‍යුහාත්මක දුර්වලතා සහ ගෝලීය අවිනිශ්චිතතාවයන් තවමත් පැවතීම හමුවේ, ආර්ථික වර්ධනය සඳහා සැළකිය යුතු අවදානමක් පවතී. නව අර්බුදයක් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ආයතන ශක්තිමත් කිරීම, අවදානමට ලක්විය හැකි ජනතාව සඳහා සමාජ ආරක්ෂණය සහතික කිරීම සහ ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය පවත්වා ගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වනු ඇත. වඩාත් සාධනීය ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මඟින් සහ ප්‍රතිසංස්කරණ සඳහා පුළුල් මහජන සහයෝගයක් ගොඩනැගීම මඟින් පමණක්ම සියල්ල අන්තර්ගත, ඔරොත්තු දීමේ හැකියාව සහිත සහ තිරසාර සංවර්ධනයක් ලභා කරගත හැකි වනු ඇත.

ඉදිරි අනාගතය දෙස බලන විට, ශ්‍රී ලංකාව සාර්ව ආර්ථික ස්ථාවරත්වය වඩාත් තහවුරු කිරීමසහ ව්‍යුහාත්මක පරිවර්තනය වේගවත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ, විනයගරුක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමේ සහ සියළු දෙනා ඇතුළත් වර්ධනයක් සාක්ෂාත් කරගැනීමේ සාර්ථකත්වය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම, ආයතනික විනිවිදභාවය සහ සියලු අංශ හරහා පැතිර පවතින අඛණ්ඩ සහයෝගිතාවය මත ය. 2024 වසරේ දී ශක්තිමත් අත්තිවාරමක් දැමීමත් සමඟ, අනාගතයේ දී ඇතිවිය හැකි කම්පනවලට ඔරොත්තු දීමට සහ දිගුකාලීන, තිරසාර සමෘද්ධිය කරා ළඟා වීමට ශ්‍රී ලංකාව වර්තමානයේ දී ශක්තිමත් තත්ත්වයක පවතියි.

**විශේෂ සටහන 1.2 | 2024 දී ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ**

ආර්ථික ස්ථාවරත්වය ලගාකරගැනීම, ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රකරණය වැඩිදියුණු කිරීම, දූෂණ අවදානම් අවම කිරීම, පාලනය වැඩිදියුණු කිරීම සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව IMF-EFF වැඩසටහන සමඟින් ඉතා අවශ්‍ය, කඩිනම් ප්‍රතිසංස්කරණ සිදු කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ මෙන්ම ඩිජිටල්කරණය වැනි පුළුල් ක්ෂේත්‍ර ආවරණය කරයි. 2024 දී ආර්ථික ක්‍රියාකාරකම් යළි යථා තත්ත්වයට පත් වීම, උද්ධමනය ඉහළ යාම නැවතීම, ආකර්ෂණීය බදු ආදායමක් වාර්තාවීම, රට තුළ සංචිත තත්ත්වය ඉහළ යාම සහ ජනතාවට ණය සහන ලබා දීම වැනි තත්ත්වයන් වාර්තා වීම තුලින් මෙම ප්‍රතිසංස්කරණ සාර්ථක වී ඇති බවට පෙන්නුම් කෙරේ. ඒ අනුව, පෙර පැවති ප්‍රතිපත්තිමය වැරදි නිවැරදි කර ගැනීමටත්, ජනතාවගේ ජීවනෝපාය ඉහළ නංවන අතරම දුෂ්කරව ලගා කරගත් ආර්ථික ප්‍රකෘතිය පවත්වා ගැනීමටත් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම අතිශයින් වැදගත් වේ.

**2024 වසරේ දී හඳුන්වා දෙන ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ :**

**1. රාජ්‍ය මූල්‍ය විනය සඳහා නව නීතිමය රාමුවක්**

- 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත (PDMA) 2024 ජුනි මාසයේදී බලාත්මක කිරීම.
- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (PFMA) 2024 අගෝස්තු මාසයේදී බලාත්මක කිරීම.
- 2024 දෙසැම්බර් 02 වැනි දින රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම.
- බදු ආදායම් අභිමිවීම් පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

**2. ප්‍රධාන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ: බදු පදනම පුළුල් කිරීම, 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු අනුපාත දර්ශකකරණය;**

- සම්මත එකතු කළ අගය මත බදු (VAT) අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම.
- ප්‍රධාන අයිතම කිහිපයක් සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් බහුතරයක් ඉවත් කිරීම.
- එකතු කළ අගය මත බදු බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම.
- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 120 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම.
- උද්ධමනය මත සකස් කරන ලද දර්ශකයක් මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අය කළ හැකි සියලුම භාණ්ඩ මත නිෂ්පාදන බද්ද සියයට 14 කින් සංශෝධනය කිරීම.
- වාර්ෂික උද්ධමනය අනුව සකස් කරන ලද දර්ශකයක් මත පදනම්ව සියලුම මත්පැන් වර්ග සඳහා සුරාබදු බද්ද සියයට 14 කින් වැඩි කිරීම.

**2025 ජනවාරි 11 දින සිට බලපැවැත්වෙන පරිදි;**

- උද්ධමනය මත සකස් කරන ලද දර්ශකයක් මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අය කළ හැකි සියලුම භාණ්ඩ මත නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් සංශෝධනය කිරීම.
- වාර්ෂික උද්ධමනය අනුව සකස් කරන ලද දර්ශකයක් මත පදනම්ව සියලුම මත්පැන් වර්ග සඳහා සුරාබදු බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.

**2025 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි;**

- පුද්ගලයෙකුගේ පුද්ගලික ආදායම් බදු සහනය වාර්ෂිකව රු. 1,200,000/- සිට රු. 1,800,000/- දක්වා වැඩි කිරීම සහ පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායම මත අදාළ වන බදු අනුපාත සංශෝධනය කිරීම.

**විශේෂ සටහන 1.2 | 2024 දී ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සම්බන්ධිතයි..**

**පුද්ගලික ආදායම් බදු (PIT) ව්‍යුහයට සංශෝධන**

| | වාර්ෂික බදු අයවන ආදායම (රු. මිලි.) | |
|---|---|---|
| ආන්තික බදු අනුපාතය | පැවති බදු අනුපාත ව්‍යුහය | නව බදු අනුපාත ව්‍යුහය |
| 0 | 1.2 දක්වා | 1.8 දක්වා |
| 6 | 1.2 – 1.7 | 1.8 – 2.8 |
| 12 | 1.7 – 2.2 | - |
| 18 | 2.2 – 2.7 | 2.8 – 3.3 |
| 24 | 2.7 – 3.2 | 3.3 – 3.8 |
| 30 | 3.2 – 3.7 | 3.8 – 4.3 |
| 36 | 3.7 ට වැඩි | 4.3 ට වැඩි |

**3. බදු පරිපාලනය සහ ආයතනික ප්‍රතිසංස්කරණය**

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

- අපරාධ විමර්ශන ඒකකය පිහිටුවීම.
- රැකියා සහ පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින් සඳහා 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සරල කළ පුද්ගල ආදායම් බදු ආපසු ගෙවීමේ පෝරමයක් හඳුන්වා දීම.
- අවදානම් කළමනාකරණ ඒකකය පුළුල් කිරීම.
- 2025 ඔක්තෝම්බර් මාසයේදී සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අහෝසි කිරීමෙන් පසු එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් කඩිනම් කිරීම සඳහා අපනයනකරුවන් සඳහා ආපසු ගෙවීමේ ඒකකයක් ආරම්භ කිරීම.
- අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම.

**ශ්‍රී ලංකා රේගුව**

- 2024–2028 සඳහා උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම.
- අභ්‍යන්තර කටයුතු ඒකකයක් ස්ථාපිත කිරීම.
- සතිපතා ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPI) ලකුණු කාඩ්පත් සමඟ "දින 80 විශිෂ්ටතා" වැඩසටහන දියත් කිරීම.
- අවදානම් රීති (Risk Rules) සහ බහාලුම් නිෂ්කාශන වාර (container-exam hit rate) යාවත්කාලීන කිරීම.
- ASYHUB පද්ධතිය ක්‍රියාත්මක නැංවීම.

**සුරාබදු දෙපාර්තමේන්තුව**

- සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
- රට පුරා බලපත්‍රලාභී සුරාබදු පරිශ්‍රයන්හි අධීක්ෂණය වැඩි දියුණු කිරීම.
- දින 100 ක විශේෂ බලාත්මක කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම (2024.05.20 සිට 2024.08.27 දක්වා).
- පැය 24 පුරා ක්‍රියාත්මක 1913 ක්ෂණික දුරකථන අංකය දියත් කිරීම.
- මත්පැන් වර්ග සඳහා දැඩි තත්ත්ව පාලනයන් පවත්වා ගැනීම සඳහා මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම.
- සුරාබදු ආදායම් එකතු කිරීම හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම.
- මූල්‍ය බුද්ධි ඒකකයක් (FIU) ස්ථාපිත කිරීම.
- ආරක්ෂක සලකුණු සහ ආරක්ෂක සලකුණු කළමනාකරණ පද්ධතිය හරහා නීත්‍යානුකූලව නිෂ්පාදනය කරන ලද මධ්‍යසාර පාන වර්ග හඳුනා ගැනීම සඳහා නිර්මාණය කර ඇති නව ජංගම යෙදුමක් හඳුන්වාදීම.

**විශේෂ සටහන 1.2 | 2024 දී ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සම්බන්ධිතයි...**

**4. ආර්ථිකය මත පැවති බර ප්‍රධාන රුකුළක් බවට පත්වීම: ශක්තිමත් ආර්ථිකයක් සඳහා රාජ්‍ය ව්‍යාපාර පරිවර්තනය කිරීම**

**අන්තර්-ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ**

- විදුලිය සහ ඉන්ධන සඳහා පිරිවැය අයකර ගත හැකි පරිදි මිලකරණය අබාණ්ඩව පවත්වාගෙන යාම.
- නිෂ්පාදන පිරිවැය පිළිබිඹුවන පරිදි ජල ගාස්තු සඳහා සූත්‍රයක් හඳුන්වාදීම.
- පැරණි ණය රජයේ ශේෂ පත්‍රය වෙත මාරු කිරීම හරහා තෝරාගත් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම.
- ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් අතර ඇති වගකීම් නිරවුල්කිරීම.
- ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPI) ඇතුළුව ආයතනික අභිප්‍රායන් පිළිබඳ ප්‍රකාශන (SCI) අත්සන් කිරීම ඇතුළුව ආයතනික දියුණුව (උදා: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා).
- රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය දැනටමත් කෙටුම්පත් කර ඇත, නමුත් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ (SOERU) ක්‍රියාකාරකම් ප්‍රතිපත්ති සඳහා අනුමැතිය ලැබෙන තෙක් අත්හිටුවා ඇත.

**බලශක්ති අංශය**

- 2024 අංක 36 දරන විදුලිබල පනත බලාත්මක කිරීම.
- බනිජ තෙල් වෙළෙඳපොළ ලිහිල් කිරීම, සේවා සපයන්නන් සංඛ්‍යාව 3 සිට 5 දක්වා වැඩි වීම. මෙම මුලපිරීමත් සමඟ, සිනොපෙක් (චීනය), යුනයිටඩ් පෙට්‍රෝලියම් (ඕස්ට්‍රේලියාව) සහ ආර්එම් පාර්ක්ස් (ඇමරිකා එක්සත් ජනපදය) වෙත සිල්ලර බලපත්‍ර නිකුත් කිරීම.
- ණය වෙත නිරාවරණය වීම නවත්වමින් ශ්‍රී ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ මුදල් පදනම් කරගත් ගනුදෙනු වලට මාරු වීම.

**රාජ්‍ය බැංකු**

- රාජ්‍ය බැංකු ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය හඳුන්වාදීම.
- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ විශේෂිත අධීක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම.
- මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට කුසලතා මත පදනම් වූ පත්වීම් සිදු කිරීම සඳහා ප්‍රමිතිගත පාලන රාමුවක් හඳුන්වාදීම මෙන්ම රාජ්‍ය මූල්‍ය බර අඩු කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ මූල්‍ය සේවාවන් සඳහා සියලු දෙනාට ප්‍රවේශවීමට ඇති හැකියාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන ඇත.
- ආයතනික අභිප්‍රායන් ප්‍රකාශය (SCI) අත්සන් කිරීමට සහ තෝරාගත් රාජ්‍ය ව්‍යාපාර සඳහා ප්‍රධාන කාර්යසාධක දර්ශක හඳුන්වාදීමට සහාය වීම.

**5. රාජ්‍ය අංශය නිසි ප්‍රමාණකරණය - ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ මුලපිරීම්**

- දශකයක් මුළුල්ලේ මූලික වැටුප් සංශෝධනවලින් පසු 2025 අප්‍රේල් මාසයේදී වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීම මෙන්ම 2020 ජනවාරි මාසයට පෙර විශ්‍රාම ගිය පුද්ගලයින් සඳහා විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම
- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය විසුරුවා හැරීම.
- ජනාධිපතිවරණයෙන් සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව විද්‍යාත්මක හා තාර්කික ක්‍රියාවලියක් හරහා අමාත්‍යාංශ ස්ථාපිත කිරීම.
- නව බඳවා ගැනීම් සීමා කිරීම
- සේවක සංඛ්‍යාව උපායමාර්ගිකව අඩු කිරීම සහ පවත්නා සේවක උපයෝජනය වැඩිදියුණු කිරීම.
- නව බඳවා ගැනීම් සඳහා වන සියලුම ඉල්ලීම් මෙන්ම සේවක සංඛ්‍යාව පුළුල් කිරීමේ යෝජනා සඳහා පුළුල් ඇගයීමක් හඳුන්වාදීම.

**විශේෂ සටහන 1.2 | 2024 දී ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සම්බන්ධිතයි...**

- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත බලාත්මක කිරීම, විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවලට තනතුරු ඇති කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වන 63 වන වගන්තිය.
- පුළුල් ජාතික ආර්ථික වර්ධන සන්දර්භයක් තුල රාජ්‍ය අංශයෙන් ඔබ්බට විහිදෙන මානව සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම පිළිබඳ සාකච්ඡා මුළපිරීම.

**6. නවෝත්පාදනයන් හරහා කාර්යක්ෂමතාව - රාජ්‍ය මූල්‍ය නවීකරණ ප්‍රතිසංස්කරණ**

- **ක්‍රියාත්මක කිරීම් සහ මෙහෙයුම් ප්‍රතිසංස්කරණ**
  - රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 3/2024 2024 – රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් අගෝස්තු 15 දින නිකුත් කිරීම.
  - ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විධිමත් කිරීම – සියලුම ව්‍යවස්ථාපිත අරමුදල් අධීක්ෂණය කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පරිවර්තනය නොකළහොත් වසරක් ඇතුළත විසුරුවා හැරීමට අවශ්‍ය වේ.
  - භාණ්ඩාගාර අධීක්ෂණ බලතල වැඩි දියුණු කිරීම – ව්‍යවස්ථාපිත අරමුදල් අධීක්ෂණය, පරීක්ෂා කිරීම සහ උපදෙස් නිකුත් කිරීමට භාණ්ඩාගාර ලේකම් වෙත බලය පවරනු ලැබේ.
- **විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP)පද්ධතියේ ප්‍රතිසංස්කරණ**
  - වැඩිදියුණු කරන ලද ඊ-ප්‍රසම්පාදන පද්ධතිය යෙදවීම: පාර්ශවකරුවන්ගේ අදහස් මත නවීකරණය කරන ලද මිල සැදැහුම් ක්‍රමය යටතේ හඳුන්වාදුන් නව අනුවාදය.
  - යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම: ඉහළ මට්ටමේ මාර්ගගත පහසුකම් ඇතුළුව අවශ්‍ය මෘදුකාංග සඳහා යටිතල පහසුකම් ප්‍රසම්පාදනය සහ ලෝක බැංකු තාක්ෂණික හා මූල්‍ය සහාය ඇතිව ස්වාධීන තෙවන පාර්ශවීය රක්ෂණකරුවෙකු සම්බන්ධ කර ගැනීම.
  - ඊ-ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය ශක්තිමත් කිරීම: පද්ධති සංවර්ධනයට සහාය වීම සඳහා තාක්ෂණික උපදේශකයින් 13 දෙනෙකු බඳවා ගැනීම.
- **වත්කම් කළමනාකරණ ප්‍රතිසංස්කරණ**
  - වාහන හිමිකාරිත්වය නිරවුල් කිරීමේ මුලපිරීම: 2024 තුළ වාහන හිමිකාරිත්වය පිළිබඳ ගැටළු 334 ක් නිසි පරිපාලන ක්‍රියා පටිපාටි හරහා විසඳීම.
  - නිසි වාර්තා කිරීම සහ අවසන් කරන ලද රජයේ ව්‍යාපෘතිවලින් වත්කම් නැවත වෙන් කිරීම සඳහා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2024 නිකුත් කිරීම, වාහන තක්සේරුව යාවත්කාලීන කිරීම මෙන්ම පෙර චක්‍රලේඛ විධිවිධාන සහ වත්කම් කළමනාකරණය හා වත්කම් කළමනාකරණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා උපදෙස් ඇතුළත්ව වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024 නිකුත් කිරීම හා නව වාහන බැහැර කිරීම සඳහා චක්‍රලේඛ අංක 05/2024 නිකුත් කිරීම.
- **නියාමනය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය**
  - රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ රෙගුලාසි කෙටුම්පත් කිරීම: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ කාල රාමුව අනුව අවශ්‍යතාවයන් සමඟ 2025 දෙසැම්බර් වන විට සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ පුළුල් නියාමන කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක් මහා භාණ්ඩාගාරය විසින් ආරම්භ කිරීම.

**7. රජයේ වියදම් තාර්කිකකරණය කිරීම: ඩිජිටල් විසඳුම් සහ සුහුරු අයවැය පාලනයන්**

- **වියදම් පාලන සහ කළමනාකරණ ප්‍රතිසංස්කරණ**
  - වියදම් පාලන පියවර ඒකාබද්ධ කිරීම, අතිකාල ගෙවීම්, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා සහ රජයේ උත්සව හා ඒ ආශ්‍රිත වියදම් සඳහා විනය ස්ථාපිත කිරීම සඳහා අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කිරීම.

**විශේෂ සටහන 1.2 | 2024 දී ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සම්බන්ධිතයි...**

- ප්‍රමුඛතාවය දීමේදී වැඩි විශ්ලේෂණයන් තුලින් ප්‍රාග්ධන වියදම් කළමනාකරණය සහ ප්‍රාග්ධන වියදම්වල මුදලට සරිලන වටිනාකම සහතික කිරීම.

- **ඩිජිටල් පරිවර්තන ප්‍රතිසංස්කරණ**

  - මධ්‍යගත කැපවීම් පාලනයන් ශක්තිමත් කිරීම, වියදම් පසුවිපරම වැඩිදියුණු කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) පුළුල් කිරීම

  - මිල සොයා ගැනීම, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහ රාජ්‍ය ප්‍රසම්පාදනයේ කාර්යක්ෂමතාව සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය පුළුල් කිරීම.

  - රජයේ කාර්යයන්හි ඵලදායිතාව වැඩි දියුණු කිරීම, මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සහ සමස්ත රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා පුළුල් ඩිජිටල් රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ.

**8. ශක්තිමත් ප්‍රජාවන් ගොඩනැගීම: අස්වැසුම ප්‍රමුඛ සමාජ ආරක්ෂණ විප්ලවය**

- සංක්‍රාන්ති, අවදානමට ලක්විය හැකි, දරිද්‍රතාවයෙන් සහ දැඩි දරිද්‍රතාවයෙන් පෙලෙන ප්‍රජා කොටස් ඉලක්ක කරගත් "අස්වැසුම" වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම.

- සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ආවරණය වැඩි දියුණු කිරීම, ඇතුළත් වීමේ සහ බැහැර වීමේ දෝෂ අඩු කිරීම සහ ප්‍රතිලාභීන් වඩා හොඳින් ඉලක්ක කර ගැනීම සඳහා සමාජ ලේඛන තොරතුරු පද්ධතියක් (SRIS) ස්ථාපිත කිරීම.

- 2025 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි මාසික ගෙවීම් වැඩි කිරීම සඳහා ප්‍රතිලාභ දීමනාව ඉහළ නැංවීම. දුප්පතුන් සඳහා වන දීමනාව රු. 8,500 සිට රු. 10,000 දක්වා වැඩි කර ඇති අතර, දැඩි දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් සඳහා වන දීමනාව රු. 15,000 සිට රු. 17,500 දක්වා වැඩි කිරීම.

- 2025 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂිත කණ්ඩායම් සඳහාව වන දීමනාව වැඩි කිරීම. මේ යටතේ වකුගඩු රෝගීන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසික දීමනාව රු. 7,500 සිට රු. 10,000 ක් වන අතර, වැඩිහිටි පුද්ගලයින් සඳහා වන දීමනාව රු. 3,000 සිට රු. 5,000 දක්වා වැඩි කිරීම.

- 2025 ජනවාරි - මැයි කාලය තුළ අඩු වරප්‍රසාද ලත් පාසල්වල ළමුන් සඳහා ලිපි ද්‍රව්‍ය දීමනාව ලබා දීම.

- සමාජ ආධාර, සමාජ සත්කාර, සමාජ රක්ෂණය, ශ්‍රම වෙළෙඳපොළ සහ ඵලදායී ඇතුළත් කිරීමේ වැඩසටහන් ඇතුළු ප්‍රධාන කුළුණු හතරක් ආවරණය වන පරිදි ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (NSPP) දියත් කිරීම.

- රු. බිලියන 4.6 ක් වෙන් කරමින් "අස්වැසුම" ප්‍රතිලාභීන් මිලියන 1.2 ක් බලගැන්වීමට රජය අපේක්ෂා කරයි. ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිවල සහාය ඇතිව බලගැන්වීම සඳහා පවුල් 25,000 ක් පමණ තෝරාගෙන ඇත. සුදුසුකම් ලත් ඉතිරි පවුල් ක්‍රමයෙන් දේශීය අරමුදල් භාවිතයෙන් බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

- ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ගයක් ස්ථාපිත කිරීම.

**9. අර්බුදයේ සිට වර්ධනය දක්වා : ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය විප්ලවය**

- ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් පුනර්ජීවන පැකේජය තුලින් මෙන්ම ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක වන ණය මාර්ග (SMELoC & SMELoC-2) මඟින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පුනර්ජීවනය කිරීම.

- පොහොර සහනාධාර ප්‍රතිසංස්කරණය හරහා කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය ආදායම් සඳහා වන සහාය ශක්තිමත් කිරීම, අනිවාර්ය බෝග රක්ෂණය පුළුල් කිරීම, කුඩා වතු හිමියන්ට සහනාධාර, සත්ත්ව ආහාර මිල පිරිවැය ස්ථාවර කිරීම සහ ගොවීන්ගේ සහ ධීවරයින්ගේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම.


- රජයේ වී මිලදී ගැනීම සහ පොරොන්දු ණය යෝජනා ක්‍රමය පුළුල් කිරීම, වී, සහල් බෙදා හැරීමේ වැඩසටහන සඳහා සහතික කළ අවම මිල සංශෝධනය කිරීම සහ නවීන ධාන්‍ය සංරක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව සහ වෙළෙඳපොළ ස්ථාවරත්වය සහතික කිරීම.

- සමාජ ආරක්ෂණ- ශුද්ධ පොලී යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම.

## 1.2 2024 වසරේ ආර්ථික තත්ත්වය

අර්බුදයෙන් පසු 2024 වසරේ දී සියයට 5 ක ආර්ථික වර්ධනයක් ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත් වූ අතර, එය වසර හතක් තුළ වාර්තා වූ ඉහළම වර්ධනය විය. කාර්තු හතරේම ධනාත්මක වර්ධනයන් සමඟ සංවර්ධනය පුළුල් පරාසයක පැවතිණි. ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් යළි නැඟී සිටීම හේතුවෙන් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම, සංචාරක හා තොරතුරු තාක්ෂණ අංශවල පුනරුදය හේතුවෙන් සේවා අංශය සැළකිය යුතු කාර්යසාධනයක් පිළිඹිබු කිරීම සහ කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථ වර්ධනය මෙම ධනාත්මක ගමන්මග සඳහා බලපා ඇත.


**රූප සටහන 1.1 | දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය වර්ධන අනුපාතය**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉතිහාසගත ඉහළම අගයක් වාර්තා කරමින් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8 ක් වූ උද්ධමනය එතැන් සිට සැළකිය යුතු නිවැරදි කිරීමකට ලක් විය. ඉල්ලුම් පීඩනයන් පාලනය කිරීම අරමුණු කරගත් දැඩි මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය මෙම පහත වැටීමට මූලිකව බලපා ඇත. විදුලි ගාස්තු සැළකිය යුතු මට්ටමකින් අඩු කිරීම, ගෝලීය බලශක්ති මිල ගණන්වල හිතකර ප්‍රවණතා සහ 2024 වසර මුළුල්ලේ විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම යනාදියේ සංයුක්ත බලපෑම හේතුවෙන් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට උද්ධමනය ඍණ කලාපයකට අවතීර්ණ විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොළඹ පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 දෙසැම්බර් මාසයේදී සියයට 1.7 ක අවධමනයක් වාර්තා කළ අතර, එය වසර තුළ පැවති දැඩි නිර්-උද්ධමනකාරී ස්වභාවය විශේෂයෙන් පිළිඹිබු කරන ලදී. 2025 ජනවාරි මාසයේදී විදුලි ගාස්තු අඩු කිරීම සඳහා වන ගැළපීම් සිදු කිරීමත් සමඟ උද්ධමනය අඩු වීමේ ප්‍රවණතාවය තවදුරටත් ප්‍රබල වූ අතර, එය අඛණ්ඩව අවධමනකාරී පීඩනයන්ට දායක විය. 2025 මැයි මස වන විට, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොළඹ පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය සියයට 0.7 ක ඍණ අගයක පැවතුණි. නිර්-උද්ධමනය මුර්ත ආදායම යථා තත්ත්වයට පත් කිරීමට සහ ආර්ථිකය ස්ථාවර කිරීමට උපකාරී වී ඇතත්, දිගු කාලයක් උද්ධමනය ඍණ මට්ටමක පවත්වා ගැනීම ආර්ථික ක්‍රියාකාරකම් සහ ණය තත්ත්වය කෙරෙහි අවදානමක් ඇති කරනු ඇත. මෙම සංදර්භය තුළ, උද්ධමනය සියයට 5 ක් වූ මහ බැංකුවේ මධ්‍යකාලීන ඉලක්කය කරා ප්‍රමාදයකින් තොරව ළඟාවීම අත්‍යවශ්‍ය වේ. මධ්‍යස්ථ ධනාත්මක උද්ධමනයක් කරා ක්‍රමයෙන් නැවත පැමිණීම මඟින් ආර්ථික තත්ත්වයන් සාමාන්‍යකරණය වීම, උද්ධමන අපේක්ෂාවන් ශක්තිමත් වීම සහ තිරසාර වර්ධනයට සහාය වීම සිදු වේ. ඉදිරියේදී, මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී උද්ධමන අපේක්ෂාවන් සියයට 5 ක ඉලක්කය සමඟ සමපාතව පවත්වා ගැනීම තහවුරු කරමින් නැවත යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වීම ප්‍රවේශමෙන් තුලනය කළ යුතුය.

**රූප සටහන 1.2 | කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව උද්ධමනයේ මාසික හැසිරීම**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සටහන: 2022 ජනවාරි සිට 2024 මාර්තු දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව (2013-100) සහ 2023 ඔක්තෝබර් සිට 2025 මැයි දක්වා (2021-100)

2025 අප්‍රේල් මාසයේදී ලෝක බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ යාවත්කාලීන සංවර්ධනයට අනුව, අපේක්ෂිත ප්‍රමාණයට වඩා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය හා විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය මධ්‍යයේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වන මාවතකට පිවිසුනද, අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ගෘහස්ථ ආදායම, සේවා නියුක්තිය සහ ජීවන තත්ත්වය අර්බුදයට පෙර මට්ටම්වලට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතී. 2024 වසරේ දී, දිනකට පුද්ගලයෙකුගේ ක්‍රය ශක්ති සමානාත්මතා සීමාව ඇමරිකානු ඩොලර් 3.65 ක් වන විට, දරිද්‍රතා අනුපාතය සියයට 24.5 ක් විය. මෙය ආන්තික පහත වැටීමක් පිළිබිඹු කළ ද, දරිද්‍රතාවය 2019 දී වාර්තා වූ සියයට 11.3 මෙන් දෙගුණයකටත් වඩා වැඩිය. ශ්‍රම බලකා සහභාගීත්වය 2019 වසරේ දී වාර්තා වූ සියයට 52.3 ට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 48.6 සිට 2024 වසරේ දී සියයට 47.4 දක්වා අඩු විය. සංක්‍රමණ වැඩිවීම, දේශීය වශයෙන් ආර්ථික අවස්ථා සීමා වීම සහ අර්බුදයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වන කාලය තුළ රාජ්‍ය අංශයේ බඳවා ගැනීම් සීමා කිරීම, මෙම පහත වැටීමට හේතු වී ඇත. සාර්ව ආර්ථික ස්ථායීකරණය අඛණ්ඩව ක්‍රියාත්මක වීමත් සමඟ 2025 වසරේ දී දරිද්‍රතා අනුපාතය සියයට 22.7 දක්වා පහත වැටෙනු ඇතැයි ලෝක බැංකුව පුරෝකථනය කර ඇත. කෙසේවෙතත්, ජීවනෝපායය සහ සමාජ සුභසාධනය පුළුල් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා සාර්ව ආර්ථික ප්‍රතිලාභ ඊට යෙදවීම සඳහා තිරසාර ලෙස ප්‍රයත්නයන් දැරිය යුතු වේ.

2024 වසරේ දී, ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා වන ප්‍රයත්නයන්ගේ ප්‍රතිලාභ ලබමින් බදු ආදායම වර්ධනය වීම සහ රාජ්‍ය වියදම් විවක්ෂණශීලී අන්දමින් කළමනාකරණය කිරීම හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශයේ සුවිශාල වර්ධනයක් සිදු විය.

**විශේෂ සටහන 1.3 | ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත්ව නඟා සිටුවීමේ ගමන් මඟ: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රගතිය සහ සන්ධිස්ථාන**

2022 වසරේ දී ඇති වූ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයෙන් පසුව, ශ්‍රී ලංකාව 2023 වසරේ මාර්තු මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විශේෂ ගැණුම් හිමිකම් බිලියන 2.286 ක (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 3 ක පමණ) විස්තීරණ ණය පහසුකමක් යටතේ සිව් අවුරුදු වැඩපිළිවෙලක් සඳහා එකඟතාවයකට එළඹුණි. මෙම වැඩසටහන හුදෙක් සරල මූල්‍යකරණ ගිවිසුමක් පමණක් නොවේ; එය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවේ සහ ප්‍රතිසංස්කරණ ගමන් පථයේ මූලික වෙනසක් සනිටුහන් කරන ලදී. මෙම විස්තීරණ ණය පහසුකම් වැඩසටහන මූල්‍ය ආරක්ෂණ පද්ධතියක් මෙන්ම ගැඹුරු ව්‍යුහාත්මක පරිවර්තනයක් සඳහා උත්ප්‍රේරකයක් ලෙස ද ක්‍රියාකළ අතර, එය රාජ්‍ය මූල්‍ය හා විදේශීය අංශයේ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම, පාලනය ශක්තිමත් කිරීම, විදේශ සංචිත නැවත ගොඩනැගීම, සහ තිරසාර හා සියල්ල ඇතුළත් වන වර්ධනයක් සඳහා අඩිතාලම දැමීම අරමුණු කරගත්තකි.

රාජ්‍ය මූල්‍ය, ණය කළමනාකරණය සහ ආයතනික පාලනය යන ක්ෂේත්‍රවල දිගුකාලීනව පැවති දුර්වලතා සඳහා විසඳුම් සොයන අතරතුර, ඉලක්කගත සමාජ සහයෝගිතා වැඩසටහන් හරහා සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ජනතා කණ්ඩායම් ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින්, මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන උපායමාර්ගිකව සැලසුම් කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රධාන සංරචක හත සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා රජය දැඩි කැපවීමකින් ක්‍රියාකරයි:

1. ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය;
2. ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල;
3. ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීම;
4. මිල ස්ථායීතාවය ප්‍රතිස්ථාපනය කිරීම හා විදේශ සංචිත යළි ගොඩනැගීම;
5. මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම;
6. පාලන දුර්වලතා හා දූෂණ අවදානම් ආමන්ත්‍රණය කිරීම; සහ
7. ශ්‍රී ලංකාවේ වර්ධන විභවය නිරාවරණය කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකාව විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ වසර දෙකකට ආසන්න කාලයක් සම්පූර්ණ කරමින් සිටින මෙම අවස්ථාවේ, ප්‍රධාන සාර්ව ආර්ථික සහ ආයතනික දර්ශකවල පැහැදිලි ප්‍රගතියක් දැකගත හැකි අතර, මෙය රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ තීරණාත්මක හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කරයි.

**වැඩසටහනේ අරමුණු**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන, ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සහ තිරසාර වර්ධනයක් ඇති කිරීම අරමුණු කරගනිමින් නිර්මාණය කර ඇත:

**ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය:** ප්‍රගතිශීලී බදු සහ ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රමුඛතා වියදම් එලෙසම පවත්වා ගනිමින් වියදම් තාර්කීකරණය, රාජ්‍ය මූල්‍ය දත්තවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ව්‍යවසායයන්වල පාලනය සහ මූල්‍ය විනිවිදභාවය වැඩි දියුණු කිරීම.

**ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල:** ශක්තිමත් සහ කාර්යක්ෂමව මෙහෙයවනු ලබන සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින්, අවදානමට ලක්විය හැකි පිරිස් ආර්ථික කම්පනවල බලපෑම්වලින් ආරක්ෂා කිරීම

**රාජ්‍ය ණය තිරසාරභාවය:** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරාමිතීන්ට අනුකූලව ණය හිමියන් අතර සාධාරණ හා සමාන ලෙස බර බෙදී යන ණය නිරවුල්කරණ විසඳුමක් සෙවීම, රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ ණය විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම.

**මිල ස්ථායීතාව සහ විදේශ අංශයේ තිරසාරභාවය:** උද්ධමනය පාලනය කිරීම සඳහා හොඳින් සැලසුම් කළ උපායමාර්ගික ප්‍රවේශයක් භාවිතා කිරීම, පුළුල් විනිමය අනුපාත නම්‍යශීලීත්වයක් ඇති කිරීම, මුදල් හා විනිමය අනුපාත ප්‍රතිපත්ති සඳහා සහාය සැළසීමට ආයතනික රාමු ශක්තිමත් කිරීම, සහ විදේශ සංචිත ගොඩනැගීම අඛණ්ඩව සිදු කිරීම.

**මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම:** ශක්තිමත් සහ හොඳින් ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් තහවුරු කිරීම, මූල්‍ය අංශයේ අධීක්ෂණය සහ අර්බුද කළමනාකරණය ශක්තිමත් කිරීම, සහ රාජ්‍ය බැංකුවල පාලනය ශක්තිමත් කිරීම.

**පාලන දුර්වලතා හා දූෂණ අවදානම් ආමන්ත්‍රණය කිරීම:** ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූල වන ලෙස දූෂණය වැළක්වීමේ නීති රාමු ශක්තිමත් කිරීම, රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීම, සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කළ පාලනය පිළිබඳ විනිශ්චයාත්මක වාර්තාව ප්‍රයෝජනවත් අයුරින් භාවිතා කිරීම.

**විශේෂ සටහන 1.3 | ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත්ව නඟා සිටුවීමේ ගමන් මඟ: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රගතිය සහ සන්ධිස්ථාන සම්බන්ධිතයි...**

**වර්ධන විභවය නිරාවරණය කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම:** වෙළෙඳ ලිහිල්කරණය, ශ්‍රම වෙළෙඳපොළ, රාජ්‍ය ව්‍යවසායයන් පාලනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම, සහ දේශගුණික ප්‍රත්‍යාස්ථිතිය ඉලක්ක කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ.

**ප්‍රතිලබ්ධි (අරමුදල් මුදාහැරීම්)**

2025 වසරේ අප්‍රේල් මස වන විට, ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඇ.ඩො.බිලියන 1.72 ක අරමුදල් ප්‍රමාණයක් ලැබී ඇති අතර, එම ප්‍රතිලබ්ධීන්, මූල්‍ය අවකාශය පුළුල් කිරීමට සහ ගෙවුම් ශේෂය ස්ථාවර කිරීමට බෙහෙවින් උපකාරී වී ඇත. අරමුදල් මුදාහැරීමේ කාලසටහන පහත පරිදි වේ:

| මෙතෙක් ලබා දී ඇති වාරික | ලැබුණු දිනය | විශේෂ ගැණුම් හිමිකම් මිලියන | ආසන්න වශයෙන් සමාන ඇ.ඩො. මිලියන |
|---|---|---|---|
| පළමු වාරිකය | 2023 මාර්තු 22 | 254 | 333 |
| දෙවන වාරිකය | 2023 දෙසැ. 14 | 254 | 337 |
| තෙවන වාරිකය | 2024 ජුනි 14 | 254 | 336 |
| සිව්වන වාරිකය | 2025 මාර්තු 04 | 254 | 334 |
| **එකතුව** | | **1,016** | **1,340** |

| ඉදිරියේ දී ලැබීමට නියමිත වාරික | ලබාදීමට නියමිත දිනය | විශේෂ ගැණුම් හිමිකම් මිලියන |
|---|---|---|
| පස්වන වාරිකය | 2025 | 254 |
| සයවන වාරිකය | 2025 | 254 |
| හත්වන වාරිකය | 2026 | 254 |
| අටවන වාරිකය | 2026 | 254 |
| නවවන වාරිකය | 2027 | 254 |
| **තවමත් මුදාහැර නොමැති මුළු එකතුව** | | **1,270** |

මේ දක්වා මුදාහැර ඇති වාරික මඟින්, ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට, වෙළෙඳපොළ ස්ථාවර කිරීමට සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව ලබා දුණි.

**2024 වසර අවසානය වන විට ප්‍රගතිය**

විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව සුවිසල් ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර, එය සාර්ව ආර්ථික ස්ථායීකරණය, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ ආයතනික ප්‍රතිසංස්කරණ මඟින් සනිටුහන් වේ.

**සාර්ව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ ස්ථායීකරණය**

- **ශක්තිමත් ආර්ථික වර්ධනය**: මූර්ත ද.දේ.නි. යේ වර්ධන වේගය සියයට 5 ක් වාර්තා කරමින්, 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්විය. මෙම ආර්ථික පුනර්ජීවනය පුළුල් පදනමක් මත සිදු වූවක් වන අතර, ප්‍රධාන වශයෙන්ම ඉදිකිරීම්, පතල් හා කැණීම් ක්ෂේත්‍රයන්හි ශක්තිමත් කාර්යසාධනය හේතුකොටගෙන කර්මාන්ත අංශයේ සිදු වූ වර්ධනය ද, එමෙන්ම නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් වැනි සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉහළ යාම, සහ සත්ව නිෂ්පාදන හා ධාන්‍ය වගාව යන අංශවල වූ වර්ධනය ද, මේ සඳහා හේතු විය.

- **උද්ධමනය පාලනය**: 2023 වසරේ දී සියයට 50කට වඩා ඉහළ අගයක් වාර්තා කළ උද්ධමනය, 2025 වසරේ මැයි මස වන විට සියයට -0.7 දක්වා පහත වැටුණි. මෙම උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බලශක්ති මිල ගණන් අඩුවීම, සැපයුම් දාමයන්ගේ තත්ත්වය වැඩිදියුණු වීම සහ ඉල්ලුම අඩුවීමයි.

- **විදේශ සංචිත යළි ගොඩනැගීම**: 2025 වසරේ අප්‍රේල් මස වන විට දළ නිල සංචිත ඇ.ඩො. බිලියන 6.3 දක්වා ඉහළ ගිය අතර එය විදේශ අංශයේ ස්ථාවරත්වය සහ මුදල් වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකා රුපියල කෙරෙහි ඇති විශ්වාසය තහවුරු කරගැනීමට සහාය වන තීරණාත්මක ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකරයි.

**විශේෂ සටහන 1.3 | ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත්ව නඟා සිටුවීමේ ගමන් මග: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රගතිය සහ සන්ධිස්ථාන සම්බන්ධිතයි...**

**මූල්‍ය ඒකාග්‍රතාවය සහ ආදායම් ඉහළ නැංවීම**

- **ආදායම් ඉහළ නැංවීම**: ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස මුළු ආදායම (ප්‍රදාන හැර), 2022 වසරේ දී වාර්තා වූ සියයට 8.2 සිට 2024 වසරේ දී සියයට 13.5 ක් දක්වා ඉහළ යන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ බදු ආදායම ඉහළ යාම, බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම සහ සාධනීය නොවන බදු නිදහස් කිරීම් ඉවත් කිරීමයි.
- **වියදම් කාර්යක්ෂමතාවය**: අත්‍යවශ්‍ය සමාජ සේවා වැඩසටහන් සහ තීරණාත්මක ප්‍රාග්ධන ආයෝජන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා, රාජ්‍ය වියදම් තාර්කීකරණය කර උපායමාර්ගිකව නැවත ප්‍රමුඛතාගත කරන ලද අතර, තිරසාර ප්‍රාථමික ශේෂයක් පවත්වා ගෙන යාම සඳහා සමස්ත වියදම් සරල හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරන ලදී.

**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ**

- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතිමය රාමුව**: 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් වඩා උසස් තත්ත්වයේ රාජ්‍ය මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් හඳුන්වා දීම ද, අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම ද, එමඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමක් කරා රැගෙන යාම ද සිදුවේ.
- **ආයතනික රාමුව ශක්තිමත් කිරීම**: 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීම මඟින් ණය කළමනාකරණය සඳහාම විශේෂිත වූ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් නිර්මාණය කළ අතර, එමඟින් ණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල විනිවිදභාවය, අවදානම් විශ්ලේෂණය සහ පාලනය වැඩි දියුණු විය.
- **රාජ්‍ය ව්‍යවසායයන්ගේ ප්‍රතිසංස්කරණ**: බලශක්ති අංශයේ රාජ්‍ය ව්‍යවසායයන්, දිගුකාලීන අලාභ පියවාගනිමින් ලාභ ඉපැයීම සඳහා, පිරිවැය නිරූපිත මිලකරණ ආකෘති කරා යොමුවිය. රාජ්‍ය ව්‍යවසාය අධීක්ෂණය සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාමාර්ග පුළුල් පරාසයක ක්‍රියාත්මක වෙමින් පවතින අතර, වැඩිදියුණු කළ කාර්යසාධන නිරීක්ෂණ ක්‍රමවේද මඟින් ඒ සඳහා සහාය ලැබේ.
- **භාණ්ඩාගාරය සහ මුදල් කළමනාකරණය**: මහා භාණ්ඩාගාරයේ කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම සහ භාණ්ඩාගාර තනි ගිණුම (TSA) සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම මඟින් මුදල් ප්‍රවාහ පුරෝකථනය සහ ඒකාබද්ධ රජයේ අරමුදල් වැඩි දියුණු කිරීම සිදු වූ අතර එමඟින් වඩා හොඳ මුදල් කළමනාකරණයක් සඳහා අඩිතාලම සැකසුණි.

**දූෂණ විරෝධී ක්‍රියාමාර්ග**

- **දූෂණ විරෝධී ප්‍රතිපත්ති රාමුව**: 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත හඳුන්වාදීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව බලගැන්වීම මඟින් ආයතනික විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කරන ලදී.
- **විගණනය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම**: තම අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට අපොහොසත් වන නිලධාරීන්ගෙන් සාධනීය ලෙස දඩ මුදල් අය කිරීමට හැකියාව ලැබෙන පරිදි ජාතික විගණන පනතට සංශෝධන හඳුන්වාදීමට සහ, රාජ්‍ය වත්කම් අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා වන නියාමන රාමුව ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.


**අභියෝග සහ ඉදිරි ගමන් මග**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන, ශ්‍රී ලංකාවේ ආර්ථිකය තිරසාරව යළි නඟා සිටුවීමට සහ රාජ්‍ය ආයතන නවීකරණය කිරීමට දරන උත්සාහයේ තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මේ වන විට සාර්ව ආර්ථික ස්ථායීකරණය සහ ඉතා වැදගත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම ඇතුළුව සැළකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇතත්, දැනට පවතින අභියෝග මඟින්, ශක්තිමත් ප්‍රතිපත්ති අනුගමනය කිරීමට සහ ප්‍රතිසංස්කරණ දිගටම ක්‍රියාත්මක කිරීමට ඇති අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

මෙම සංක්‍රමණ අවධිය තුළ දී, අවදානමට ලක්විය හැකි ජනතාව සුරැකිව තබා ගැනීම සඳහා සුදුසු සමාජ ආරක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, විශේෂයෙන් බලශක්ති අංශයේ සහ රාජ්‍ය ව්‍යවසායයන්ගේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නිසි කලට මුළුමනින් ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය තහවුරු කිරීමට සහ ආර්ථික තරහකාරිත්වය වැඩිදියුණු කිරීමට ඉතා වැදගත් වේ.

මෙම පරිවර්තනීය කාලපරිච්ඡේදය පසුකරමින් ශ්‍රී ලංකාව ඉදිරියට ගමන් කරන විට, විනිවිදභාවය, වගවීම සහ පුළුල් ප්‍රතිසංස්කරණ සඳහා නොසැලෙන කැපවීමකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින්, ශ්‍රී ලංකාවේ ශක්තිමත්භාවය ඉහළ නැංවීමට සහ සියල්ල ඇතුළත් වන දිගුකාලීන වර්ධනයක් සඳහා ශක්තිමත් පදනමක් සකස් කිරීමට අවශ්‍ය තීරණාත්මක තාක්ෂණික සහ මූල්‍යමය සහයෝගය ලබා දීම අඛණ්ඩව සිදු කරනු ලැබේ.


**රූප සටහන 1.3 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද.දේ.නි. % ලෙස)**




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ප්‍රාථමික අතිරික්තය, 2023 වසරේ දී වාර්තා වූ රු. බිලියන 173.3 ට (ද.දේ.නි.යෙන් සියයට 0.6) සාපේක්ෂව රු. බිලියන 649.6 ක් (ද.දේ.නි.යෙන් සියයට 2.2) විය. අඛණ්ඩව දෙවන වසර සඳහාත් වාර්තා වූ ප්‍රාථමික අතිරික්තය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ බදු ආදායම වැඩිවීම සහ ප්‍රාග්ධන වියදම් අඩුවීමයි. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම 2023 වසරේ දී සියයට 11.2 සිට 2024 වසරේ දී සියයට 13.7 දක්වා ඉහළ ගිය අතර, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජන 2023 වසරේ දී සියයට 3.4 සිට 2024 වසරේ දී සියයට 2.7 දක්වා පහත වැටුණි. සමස්ත ආදායම, 2024 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 1,216.0 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල රු. බිලියන 1,453.3 දක්වා සියයට 19.5 කින් වැඩිවීමෙන් පිළිබිඹු වන සැළකිය යුතු ආදායම් කාර්යසාධනය අඛණ්ඩව පැවතුනි. මේ අතර, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය 2023 වසරේ දී සියයට 104.7 සිට 2024 වසරේ දී සියයට 96.1 දක්වා පහත වැටුණි.


**රූප සටහන 1.4 | වෙළඳ ශේෂය සහ ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි. යෙහි % ලෙස)**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතාමත් අස්ථාවර වූ ගෝලීය ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුව ද, විදේශ අංශය ඔරොත්තු දෙන ස්ථාවර මට්ටමක පැවතුනි. ශ්‍රමික ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම්වල ශක්තිමත් ක්‍රියාකාරිත්වය හේතුවෙන් අඛණ්ඩව දෙවන වසරටත් ශ්‍රී ලංකාව විදේශ අංශයේ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරන ලදී. විදේශ අංශයේ ජංගම ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී රු. බිලියන 481.5 (ද.දේ.නි.යෙන් සියයට 1.8) සිට 2024 වසරේ දී රු. බිලියන 373.1 (ද.දේ.නි.යෙන් සියයට 1.2) දක්වා අඩු විය. සංචාරක ඉපැයීම් 2023 වසරේ දී ඇ.ඩො. බිලියන 2.1 සිට 2024 වසරේ දී ඇ.ඩො. බිලියන 3.2 දක්වා වැඩි වූ අතර, ශ්‍රමික ප්‍රේෂණ 2023 වසරේ දී ඇ.ඩො. බිලියන 6.0 සිට 2024 වසරේ දී ඇ.ඩො. බිලියන 6.6 කට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, අනෙකුත් සාධක අතර වාහන ආනයන සීමා ඉවත් කිරීමෙන් පසුව වෙළඳ හිඟය 2023 වසරේ දී ඇ.ඩො. බිලියන 4.9 සිට 2024 වසරේ දී ඇ.ඩො. බිලියන 6.1 දක්වා පුළුල් විය.


**රූප සටහන 1.5 | දළ නිල සංචිත**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

දළ නිල සංචිත, 2023 වසර අවසානයේ පැවති ඇ.ඩො. බිලියන 4.4 සිට 2024 වසර අවසානයේ ඇ.ඩො. බිලියන 6.1 දක්වා සැළකිය යුතු ලෙස වැඩි විය. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණයක් වන ඇ.ඩො. මිලියන 2,846 ක ශුද්ධ මිලදී ගැනීම් සිදු කිරීම, ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු මූල්‍ය ආධාර සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ තුන්වන වාරිකය ලැබීම මෙම වර්ධනයට හේතු විය. 2025 වසරේ මැයි මස අවසානය වන විට, දළ නිල සංචිත තවදුරටත් ඇ.ඩො. බිලියන 6.3 දක්වා වැඩි විය. විදේශ අංශයේ කාර්යසාධනය වර්ධනය වීම හේතුවෙන්, 2023 වසරේ දෙසැම්බර් මස අග වන විට රුපියලේ වටිනාකම ඇමරිකානු ඩොලරයකට රු. 323.92 සිට 2024 වසරේ දෙසැම්බර් මස අග වන විට රු. 292.58 දක්වා සියයට 9.7 කින් අතිප්‍රමාණය විය. මෙම අතිප්‍රමාණය වීම, සාර්ව ආර්ථික ස්ථායීකරණය හේතුවෙන් වර්ධනය වූ වෙළඳපොළ විශ්වාසය සමඟ, ශ්‍රමික ප්‍රේෂණ ශක්තිමත් ලෙස ගලා ඒම, සංචාරක ඉපැයීම් සහ විදේශ මූල්‍යනයෙන් ලැබෙන ධනාත්මක බලපෑම පිළිබිඹු කරයි.


**රූප සටහන 1.6 | විනිමය අනුපාතයේ හැසිරීම්**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2023 වසරේ ජුනි මාසයේ සිට උද්ධමනය අඛණ්ඩව පහත වැටීමෙන් අනතුරුව, ආර්ථිකය යතා තත්ත්වයට පත් වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රමානුකූලව වඩාත් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදී. 2024 වසරේ සැප්තැම්බර් මාසය වන විට උද්ධමනය ඍණ කලාපයකට අවතීර්ණ විය. මුදල් ප්‍රතිපත්ති රාමුවේ වෙනස් වීම පිළිබිඹු කරමින්, 2024 වසරේ නොවැම්බර් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට ශ්‍රී ලංකා මහ බැංකුව අවතීර්ණ විය. නව ක්‍රමවේදය යටතේ සියයට 8.00 ක් වන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන එකම මිණුම්දණ්ඩ ලෙස ක්‍රියාත්මක වේ. සියයට 5 ක් වූ උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා 2025 වසරේ මැයි මස 22 වන දින එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25 කින් සියයට 7.75 දක්වා අඩු කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ. ඒ වෙනුවට, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ පදනම් අංක ±50 ක සීමාවකින් සම්බන්ධ වෙමින් සහභාගීත්ව ආයතන විසින් එක්දින ගනුදෙනු සඳහා මෙහෙයුම් අනුපාතික ලෙස ඒවා පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7.50 ක් ද නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.50 ක් ද වේ. මෙම ව්‍යුහාත්මක වෙනස මඟින් සාර්ව ආර්ථික තත්ත්වයන් තුළ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල පැහැදිලි බව, කාර්යක්ෂමතාව සහ සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම අරමුණු කෙරේ.

**රූප සටහන 1.7 | ප්‍රතිපත්ති පොලී අනුපාත (%)**





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2023 වසරේ දී රු. බිලියන 7,366 සිට 2024 වසරේ දී රු. බිලියන 8,156 ක් දක්වා සියයට 10.7 කින් වර්ධනය විය. වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වයන් සහ ණය ගැනීමේ පිරිවැය අඩු වීම හේතුවෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය වසර මුළුල්ලේ ස්ථාවරව පැවතුනි. මෙම සාධක එක් වීම හා වෙළෙඳපොළ විශ්වාසය වර්ධනය වීම පෞද්ගලික අංශයේ මූල්‍ය අවශ්‍යතා ඉහළ යාමට හේතු විය. ණය සඳහා ප්‍රවේශය පහසු කිරීමට උපකාරී වූ මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ලිහිල් කිරීම මගින් මෙම ප්‍රවණතාවය තවදුරටත් ශක්තිමත් විය.

## 1.3 රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය

සමස්ත ආදායම සහ ප්‍රදාන 2023 වසරේ දී වූ රු. බිලියන 3,074.3 සිට 2024 වසරේ දී රු. බිලියන 4,090.8 දක්වා සියයට 33.1 කින් එනම්, රු. බිලියන 1,016.5 කින් වර්ධනය විය. සමස්ත වියදම 2023 වසරේ දී වූ රු. බිලියන 5,356.6 සිට 2024 වසරේ දී රු. බිලියන 6,130.7 දක්වා සියයට 14.5 කින් එනම්, රු. බිලියන 774.1 කින් වර්ධනය විය. ඒ අනුව, අයවැය හිඟය 2023 වසරේ දී රු. බිලියන 2,282.3 සිට 2024 වසරේ දී රු. බිලියන 2,039.9 දක්වා අඩු විය.

**රූප සටහන 1.8 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් - 2023/2024**





මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මෙම වියදම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පොලී වියදම් සියයට 9.5 කින් එනම් රු. බිලියන 233.9 කින් රු. බිලියන 2,689.5 දක්වා වර්ධනය වීම, වැටුප් හා වේතන සියයට 13.5 කින් එනම්, රු. බිලියන 126.6 කින් රු.බිලියන 1,066.0 දක්වා වර්ධනය වීම සහ සහනාධාර සහ පැවරුම් සියයට 22.8 කින් එනම්, රු. බිලියන 228.6 කින් රු. බිලියන 1,233.5 දක්වා වර්ධනය වීමයි.

ආදායම සහ ප්‍රදාන ද.දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස, 2023 වසරේ දී වූ සියයට 11.2 සිට 2024 වසරේ දී සියයට 13.7 දක්වා වර්ධනය විය. පුනරාවර්තන වියදම් වර්ධනය වීමත් සමඟ වියදම් ද.දේ.නි.ය.ට දක්වන අනුපාතය 2023 වසරේ දී වූ සියයට 19.5 සිට 2024 වසරේ දී සියයට 20.5 දක්වා වර්ධනය විය. ඒ අනුව, අයවැය හිඟය 2023 වසරේ දී වූ සියයට 8.3 සිට 2024 වසරේ දී සියයට 6.8 දක්වා අඩු විය.

**රූප සටහන 1.9 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් - 2023/2024 (ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව


## රාජ්‍ය ආදායම

2024 වසරේ දී, රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද සියලු ප්‍රයත්නයන් හේතුවෙන් බදු ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 2,720.6 සිට රු. බිලියන 3,704.6 දක්වා සියයට 36.2 කින් එනම්, රු. බිලියන 984.0 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආදායම් බද්දෙන් සහ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමෙහි වර්ධනය පිළිබිඹු කරමින්, බදු ආදායම ද.දේ.නි.ය.ට දක්වන අනුපාතය 2023 වසරේ දී වූ සියයට 9.9 සිට 2024 වසරේ දී සියයට 12.4 දක්වා වර්ධනය විය.

බදු ආදායමේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම සියයට 55.0 කින් එනම්, රු. බිලියන 780.8 කින් සහ ආදායම් බදුවලින් ලද ආදායම සියයට 12.6 කින් එනම් රු. බිලියන 114.8 කින් වර්ධනය වීමයි. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමෙහි සැළකිය යුතු වර්ධනය හේතුවෙන් භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම වර්ධනය විය. 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක කරන ලද බදු අනුපාත සහ බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාවන් සංශෝධනය කිරීම සහ එකතු කළ අගය මත බද්ද සඳහා වූ නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් ඉවත් කිරීම ඇතුළු සැළකිය යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන්, එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 694.5 සිට රු. බිලියන 615.2 කින් එනම්, සියයට 88.6 කින් රු. බිලියන 1,309.7 දක්වා වර්ධනය විය. 2024 වසරේ දී එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී ලද ආදායම මෙන් දෙගුණයක් පමණ විය. 2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සම්පූර්ණ බලපෑම සාක්ෂාත් කර ගැනීම හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම ද වර්ධනය වූ අතර පුද්ගලික ආදායම් බදු ව්‍යුහයට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ, අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද අනිවාර්ය කිරීම, සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 24 සිට සියයට 30 දක්වා ඉහළ නැංවීම සහ 2022 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, අංශ සඳහා විශේෂිත සහන අනුපාත ඉවත් කිරීම මෙම ප්‍රතිසංස්කරණවලට ඇතුළත් වේ. නාමික වශයෙන් ගත් කළ, මෙම ආදායම් ප්‍රභවයන් දෙවර්ගයෙන් ලද ආදායම 2024 වසරේ දී රු. ට්‍රිලියන 1 ඉක්මවා යන ලදී.

2024 වසරේ දී නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම සියයට 27.4 කින් වර්ධනය වූ අතර එය, 2023 වසරේ දී නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම රු. බිලියන 128.9 කින් සහ එම බදු ආදායම් සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව රු. බිලියන 53.5 කින් ඉක්මවා යන්නකි. 2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉන්ධන මත නිෂ්පාදන බද්ද ලීටරයකට රු. 25 කින් සහ 2023 වසරේ ජූනි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලීටරයකට තවත් රු. 25 කින් වැඩිවීම හේතුවෙන් 2024 වසරේදී බනිජ තෙල් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම සියයට 39.4 කින් රු. බිලියන 200.2 දක්වා වර්ධනය විය. ඉන්ධන ආනයන වර්ධනය වීම සඳහා ඉන්ධන භාවිතය පිණිස පැවති කෝටා ක්‍රමය ලිහිල් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය වීම හේතුවෙන් ඉල්ලුම වැඩි වීම හේතු විය. 2023 වසරේ ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද බදු අනුපාත සංශෝධනවල බලපෑම සහ උද්ධමනය සඳහා ගැලපුම් කළ දර්ශකය යෙදීමත් හේතුවෙන් 2024 වසරේ දී මත්පැන් මත සුරාබදු බද්දෙන් ලද ආදායම රු. බිලියන 43.1 කින් එනම්, සියයට 25.3 කින් වර්ධනය විය. කෙසේ වුවද , දුම්වැටි අලෙවිය අඩු වීම නිසා 2024 වසරේ දී දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම සුළු වශයෙන් අඩු විය. තීරුබදු අනුපාත වැඩි කිරීම නිසාත් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම සියයට 124.4 කින් එනම් රු. බිලියන 63.9 කින් වර්ධනය වීම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත බද්දෙන් ලද ආදායම සියයට 22.7 කින් රු. බිලියන 477.5 ක් දක්වා වර්ධනය විය. මේ අතර, බදු නොවන ද.දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2023 වසරේ දී වූ සියයට 1.2 සිට 2024 වසරේ දී සියයට 1.1 රු. බිලියන 326.3 දක්වා අඩු විය.

රූප සටහන 1.10 | ආදායම් කාර්යසාධනය




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
සටහන: භාණ්ඩ හා සේවා මත වෙනත් බදු ආදායම සැළකිය යුතු ලෙස ඉහළ යාමට හේතු වූයේ, 2024 වසරේ දී රු. බිලියන 216.2 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් සමස්ත වසරේ දී ලද බලපෑමය.

## රාජ්‍ය වියදම

2023 වසරේ දී රු. බිලියන 5,356.6 ක් වූ රජයේ වියදම් 2024 වසරේ දී රු. බිලියන 6,130.7 ක් දක්වා සියයට 14.5 කින් ඉහළ ගියේය. පුනරාවර්තන වියදම් 2024 වසරේ දී රු. බිලියන 5,339.9 ක් දක්වා සියයට 13.6 කින් ඉහළ ගියේය. ප්‍රාග්ධන වියදම්වලට වඩා පුනරාවර්තන ආශ්‍රිත වියදම්වල අඛණ්ඩ ආධිපත්‍ය පිළිඹිබු කරමින් 2024 වසරේ දී සමස්ත වියදමෙන් ආසන්න වශයෙන් සියයට 87.1 ක් පුනරාවර්තන වියදම් විය.

පොලී ගෙවීම් සඳහා වන වියදම 2023 වසරේ දී රු. බිලියන 2,455.6 සිට සියයට 9.5 කින් මධ්‍යස්ථ වශයෙන් රු. බිලියන 2,689.5 ක් දක්වා ඉහළ ගියේය. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස එම වියදම සියයට 9.0 ක් ලෙස ඉහළ අගයක පැවතුණි.

සහනාධාර සහ පැවරුම් සඳහා වන වියදම රු. බිලියන 1,233.5 ක් දක්වා සියයට 22.8 කින් ඉහළ ගිය අතර එය පුනරාවර්තන වියදම්වලින් සියයට 23.1 ක් විය. විශ්‍රාම වැටුප්, ආබාධිත සොල්දාදුවන්, නොමිලේ ඖෂධ, පාසල් නිල ඇඳුම්, පෝෂණ වැඩසටහන සහ අස්වැසුම් ඇතුළුව ගෘහස්ත වෙත වන පැවරුම් සියයට 24.4 කින් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. භාණ්ඩ හා සේවා සඳහා වන

**විශේෂ සටහන1.4 | ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිණාමනය**

ශ්‍රී ලංකාව, ඩිජිටල්කරණයෙන් සමන්විත, පුරවැසි කේන්ද්‍රීය සහ නවෝත්පාදනය මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැගීමේ දූරදර්ශී ඉලක්කයක් සහිතව, ජාතික ඩිජිටල් ආර්ථික උපාය මාර්ගයෙන් මහ පෙන්වනු ලබන සිය ඩිජිටල් පරිවර්තන ගමන 2024 දී නැවත ආරම්භ කළේය. මෙම පරිවර්තනයේ අරමුණ වනුයේ අති නවීන ඩිජිටල් තාක්ෂණයන් උපායමාර්ගිකව භාවිතා කිරීම තුළින් රාජ්‍ය සේවා සැපයීම ඉහළ නැංවීම, විනිවිදභාවය දියුණු කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීමයි.

මෙම ගමන් මඟෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් වනුයේ 2025 ජනවාරි මසදී රජයේ සේවාවන් සඳහා මධ්‍යගත ඩිජිටල් ගෙවීම් වේදිකාවක් (platform) වන GovPay දියත් කිරීමයි. GovPay මඟින් පුරවැසියන්ට සහ ව්‍යාපාරවලට බදු, ගාස්තු සහ බලපත්‍ර සඳහා ආරක්ෂිත, මුදල් රහිත ගනුදෙනු සිදු කිරීමට බලය ලබා දෙන අතර එමඟින් මූල්‍ය විනිවිදභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ශක්තිමත් කරන අතරම ගණුදෙණු පහසුව වැඩි දියුණු කරයි. මෙම වේදිකාව සියලුම රජයේ ආයතන හරහා සීඝ්‍රව ව්‍යාප්ත කරන අතර අනෙකුත් ජාතික ඩිජිටල් මූලපිරීම් සමඟ ඒකාබද්ධ කෙරේ. එවැනි ප්‍රවේශ විය හැකි සහ විශ්වාසදායක ඩිජිටල් ගෙවීම් පද්ධතියක් ස්ථාපිත කිරීම, ඩිජිටල්කරණය තුළ පුරවැසි සහභාගීත්වය උත්ප්‍රේරණය කිරීමට සහ ශ්‍රී ලංකාව පූර්ණ ඩිජිටල් ආර්ථිකයකට මාරුවීම වේගවත් කිරීමට තීරණාත්මක සාධකයක් වේ.




ඩිජිටල්කරණය තුළින් බලගැන්වූ ජාතියක මූලික අංගයක් වනුයේ පුළුල් විද්‍යුත් ලේඛනයක් මඟින්, සෑම පුරවැසියෙකු සඳහාම විශේෂිත වූ ඩිජිටල් අනන්‍යතාවයක් ස්ථාපිත කිරීමයි. ආරක්ෂිත, ජෛවමිතික-සක්‍රීය ඩිජිටල් හැඳුනුම්පත් පද්ධතියක් වන ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම් වැඩසටහන (SLUDI) මූලපිරීම හරහා මෙම අවශ්‍යතාවය සපුරාලනු ලැබේ. SLUDI ව්‍යාපෘතිය මඟින්, මහජන සේවාවන් සඳහා විධිමත් ප්‍රවේශයක් සහතික කිරීම, මූල්‍ය දත්ත ඇතුළත් කිරීම ප්‍රවර්ධනය කිරීම, සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති සහ පාලනය සක්‍රීය කිරීම තුළින්, සෑම පුරවැසියෙකුටම සත්‍යාපනය කළ හැකි අනන්‍යතාවයකින් සන්නද්ධ කිරීම, කරනු ඇත. SLUDI ව්‍යාපෘතිය සමඟ ප්‍රධාන මහජන දත්ත සමුදායන් ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක වෙමින් පවතින අතර එමඟින් විශ්වාසදායක, ආරක්ෂිත සහ අන්තර් ක්‍රියාකාරී ඩිජිටල් පරිසර පද්ධතියක් සඳහා අඩිතාලම දමනු ඇත.

ඩිජිටල්කරණය තුළින් බලගැන්වූ ශ්‍රම බලකායක් වර්ධනය කිරීම සඳහා, කෘතිම බුද්ධිය (AI) උපාය මාර්ග කෙටුම්පත් කිරීමටත්, 2024 දී පාසල් පද්ධතිය පුරා AI සමාජ ඇති කිරීම වැනි වැඩසටහන් දියත් කිරීමටත් රජය අවශ්‍ය පියවර ගෙන තිබේ. එමඟින් කෘතිම බුද්ධිය, දත්ත විද්‍යාව සහ යන්ත්‍ර ඉගෙනුම (Machine Learning) අධ්‍යාපනය වැනි ඩිජිටල් කුසලතා සහිත ශ්‍රම බලකායක්(දැනට සිටින හා හැකියාව සහිත), ඇති කිරීම සඳහා අඩිතාලම දමයි. මීට අමතරව, ප්‍රධාන රාජ්‍ය ආයතනවල ඩිජිටල් පරිවර්තනය වේගවත් කරමින්, සියළු ක්ෂේත්‍ර පුරා ඩිජිටල් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා අනුපූරක ඩිජිටල් මූලපිරීම් කිහිපයක් හඳුන්වා දී ඇති අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සඳහා, විද්‍යුත්- වාණිජ වේදිකා, ඩිජිටල් ගෙවීම් විසඳුම් සහ cloud තාක්ෂණ අනුගමනය කිරීමට සහ ඔවුන්ගේ ඵලදායිතාව, නවෝත්පාදනය සහ ගෝලීය තරහකාරිත්වය වැඩි දියුණු කිරීමට සහාය වේ.

ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ වැදගත්කම හඳුනා ගනිමින්, රජය ජාතික සයිබර් ආරක්ෂණ උපාය මාර්ගයක් කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත. මෙම කෙටුම්පත් උපාය මාර්ගය, ආරක්ෂිත සහ ඔරොත්තු දෙන ඩිජිටල් පරිසරයක් සහතික කිරීම සඳහා තීරණාත්මක පියවරක් සනිටුහන් කරනු ඇත. එමඟින්, අවදානම් කළමනාකරණය, සිදුවීම් ප්‍රතිචාර සහ ආයතනික ධාරිතා ගොඩනැගීම සඳහා, තීරණාත්මක ඩිජිටල් යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා රාමු (frameworks) සකස් කරයි. ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකයේ (GCI) පවතින දෙවන මට්ටමේ සිට පළමු මට්ටමේ රටකට රටේ සයිබර් ආරක්ෂණ තත්ත්වය සහ තත්ත්වය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා CERT ආයතනය ක්‍රියාකාරීව කටයුතු කරයි.

**1.4 | සටහන : ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිණාමනය සම්බන්ධිතයි...**

ඒ සමඟම, රජය විසින් දත්ත සදාචාරාත්මක, ආරක්ෂිත සහ වගකිවයුතු භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා නීතිමය සහ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කරමින් සිටී. දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම සඳහා මූලික පියවර ගෙන ඇති අතර එය පුරවැසියන්ගේ පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම, අනුකූලතාවය සහතික කිරීම සහ ඩිජිටල් පද්ධති කෙරෙහි විශ්වාසය ශක්තිමත් කිරීම අරමුණු කරගත් මෙම උත්සාහයේ ප්‍රධාන සන්ධිස්ථානයක් වනු ඇත.

මෙම මූලපිරීම් 2030 ඩිජිටල් ආර්ථික උපායමාර්ගයේ දක්වා ඇති ඉලක්ක සමඟ සම්පූර්ණයෙන්ම අනුගත වන අතර, අරමුණු වන්නේ:


- වාර්ෂිකව ඇ.ඩො. බිලියන 5 ක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපනයන ළඟා කර ගැනීම
- ඩිජිටල් ආර්ථික පද්ධතියේ මුළු දායකත්වය ඇ.ඩො. බිලියන 15 දක්වා වැඩි කිරීම
- ජනගහනයෙන් සියයට 95 ක ඩිජිටල් සාක්ෂරතාවයක් ළඟා කර ගැනීම
- 200,000 කින් යුත් ඩිජිටල් කුසලතා ඇති ශ්‍රම බලකායක් ඇති කිරීම
- රාජ්‍ය සේවාවන්ගෙන් සියයට 100 ක් මාර්ගගතව ලබා ගත හැකි බව සහතික කිරීම
- රට පුරා සියයට 99 ක පුළුල් පරාස (broadband) විනිවිද යාමක් ලබා ගැනීම
- සියලුම ප්‍රධාන ජාතික දත්ත සමුහයන් ආරක්ෂිත, අන්තර් ක්‍රියාකාරී රාමුවක් යටතේ ඒකාබද්ධ කිරීම
- ඩිජිටල් සේවා, නවෝත්පාදන සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවන්හි කලාපීය ප්‍රමුඛයෙකු ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම

ඉලක්කගත ආයෝජන, ඵලදායී අන්තර් ආයතන සහයෝගිතාවය සහ ශක්තිමත් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් තුළින්, කලාපය තුළ සහ ඉන් ඔබ්බට තරඟකාරී ඩිජිටල් ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාව නැගී සිටීම සහතික කරමින්, සියල්ල ඇතුළත්, නව්‍ය සහ ආරක්ෂිත ඩිජිටල් ජාතියක් ගොඩනැගීමට රජය කැපවී සිටී. ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා, රජය විසින් 2025 අයවැය මඟින් රු. බිලියන 3 ක් වෙන් කර ඇත.

වියදම 2023 වසරේ දී රු. බිලියන 299.7 සිට 2024 වසරේ දී රු. බිලියන 350.9 දක්වා සියයට 17.1 කින් සුළු වශයෙන් වර්ධනය විය. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, භාණ්ඩ හා සේවා සඳහා වන වියදම සියයට 1.2 ක් විය.

2023 වසරේ දී රු. බිලියන 939.5 ක් වූ වැටුප් හා චේතන සඳහා වන වියදම 2024 වසරේ දී රු. බිලියන 1,066.0 ක් දක්වා සියයට 13.5 කින් ඉහළ ගියේය. රාජ්‍ය සේවයට පිරිස් බඳවා ගැනීම අත්‍යවශ්‍ය බඳවාගැනීම් වලට සීමා කිරීම හේතුවෙන් මෙම වියදම් වැඩිවීම සීමා වී ඇත. වැටුප් හා චේතන සඳහා වන වියදම 2024 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.6 දක්වා සුළු වශයෙන් වර්ධනය වූ අතර එය පෙර වසර 5 සඳහා වූ සාමාන්‍යය අගය වන සියයට 4.3 ට වඩා බෙහෙවින් අඩු අගයක් විය.

**රූප සටහන 1.11 | රාජ්‍ය වියදම**





මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2023 වසරේ දී රු. බිලියන 656.9 ක් වූ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම 2024 වසරේ දී රු. බිලියන 790.8 ක් දක්වා සියයට 20.4 කින් ඉහළ ගියේය. 2023 වසරේ දී රු. බිලියන 913.6 ක් වූ ප්‍රාග්ධන වියදම් 2024 වසරේ දී රු. බිලියන 776.6 ක් දක්වා සියයට 15.0 කින් අඩු විය.

ඒ අනුව, 2023 වසරේ දී රු. බිලියන 932.7 ක් වූ රාජ්‍ය ආයෝජන 2024 වසරේ දී රු. බිලියන 817.1 ක් දක්වා සියයට 12.4 කින් පහත වැටුණි. රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, 2023 වසරේ දී වූ සියයට 3.4 සිට 2024 වසරේ දී සියයට 2.7 දක්වා පහත වැටී ඇත.

**රූප සටහන 1.12 | රාජ්‍ය ආදායම හා වියදම (2024)**




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2024 වසර සඳහා වන ඇස්තමේන්තුව ප්‍රතිශතාංක 0.6 කින් ඉක්මවා යමින්, 2024 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 13.7 ක් දක්වා රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා පසුගිය වසර දෙක තුළ ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ගැලපීම්

**වගුව 1.1 | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් [අ]**


| | (රු.බිලියන) | | (ද.දේ.නි. % ලෙස) | |
|---|---|---|---|---|
| | 2023 | 2024[b] | 2023 | 2024[b] |
| **ආදායම් සහ ප්‍රදාන** | **3,074** | **4,091** | **11.2** | **13.7** |
| ආදායම | 3,049 | 4,031 | 11.1 | 13.5 |
| බදු ආදායම | 2,721 | 3,705 | 9.9 | 12.4 |
| ආදායම් බදු | 911 | 1,026 | 3.3 | 3.4 |
| භාණ්ඩ හා සේවා මත බදු | 1,420 | 2,201 | 5.2 | 7.4 |
| විදේශ වෙළඳාම මත බදු | 389 | 477 | 1.4 | 1.6 |
| බදු නොවන ආදායම | 328 | 326 | 1.2 | 1.1 |
| ප්‍රදාන | 26 | 60 | 0.09 | 0.20 |
| **වියදම** | **5,357** | **6,131** | **19.5** | **20.5** |
| චර්තන වියදම | 4,700 | 5,340 | 17.1 | 17.9 |
| වැටුප් හා වේතන | 939 | 1,066 | 3.4 | 3.6 |
| භාණ්ඩ හා සේවා | 300 | 351 | 1.1 | 1.2 |
| පොලී වියදම | 2,456 | 2,690 | 9.0 | 9.0 |
| සහනාධාර හා පැවරුම් | 1,005 | 1,234 | 3.7 | 4.1 |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | 657 | 791 | 2.4 | 2.6 |
| රාජ්‍ය ආයෝජන | 933 | 817 | 3.4 | 2.7 |
| වෙනත් | -276 | -26 | -1.0 | -0.1 |
| **ජංගම ගිණුම් ශේෂය** | **-1,651** | **-1,309** | **-6.0** | **-4.4** |
| **ප්‍රාථමික ශේෂය** | **173** | **650** | **0.6** | **2.2** |
| **සමස්ත ශේෂය (අයවැය හිඟය)** | **-2,282** | **-2,040** | **-8.3** | **-6.8** |
| **අයවැය හිඟය මූල්‍යයනය** | **2,282** | **2,040** | **8.3** | **6.8** |
| ශුද්ධ විදේශීය මූල්‍යයනය | 495 | 333 | 1.8 | 1.1 |
| ශුද්ධ දේශීය මූල්‍යයනය | 1,788 | 1,707 | 6.5 | 5.7 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව

[අ] රාජ්‍ය මූල්‍ය කටයුතු වලට අදාළ ආර්ථික වර්ගීකරණය මත පදනම් වේ.
සටහන: - යන්නෙන් හිඟයක් අදහස් වේ.

දායක විය. කෙසේ වුවද , ආදායම් ලැබීමට සාපේක්ෂව රජයේ වියදම් සැළකිය යුතු මට්ටමක පැවතුන අතර එය බොහෝ දුරට පුනරාවර්තන වියදම්වල ව්‍යුහාත්මක දැඩි බව/දෘඩතාවය පිළිබිඹු කරයි. පුනරාවර්තන වියදම් පමණක් මුළු ආදායම සහ ප්‍රදාන මෙන් 1.3 ගුණයක් වූ අතර එය ආදායම් ධාරිතාව සහ වියදම් අතර පවතින අඛණ්ඩ අසමතුලිතතාවය ඉස්මතු කරයි. 2024 වසරේ දී පොලී ගෙවීම් සමස්ත ආදායමෙන් සියයට 65.7 ක් විය. සහනාධාර සහ පැවරුම් සමස්ත ආදායමෙන් සියයට 30.2 ක් වූ අතර, එය අවදානමට ලක්විය හැකි ජනගහනය අවම කිරීම සඳහා රජය දරන ප්‍රයත්නයන් කෙරෙහි වන අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි. ආදායමෙන් සියයට 26.1 ක් වූ වැටුප් සහ වේතන සඳහා ද, තවත් සියයට 8.6 ක් භාණ්ඩ හා සේවා සඳහා ද වැය කරන ලදී.

**රූප සටහන 1.13 | රාජ්‍ය වියදමේ ප්‍රධාන සංරචක (ද.දේ.නි.යෙහි % ලෙස)**




මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රජයේ අදායම හා පුනරාවර්තන වියදම් අතර පරතරය අඩු කිරීම සඳහා අඛණ්ඩ බදු ප්‍රතිපත්තිය හා පරිපාලන ප්‍රතිසංස්කරණ තුලින් අදායම් වර්ධනය පවත්වාගැනීමත්, රාජ්‍ය ආයෝජන වැඩිවන පරිදි වියදම් නැවත ප්‍රමුඛතා ගත කිරීමත් අත්‍යාවශ්‍ය වේ.

## අයවැය හිඟය මූල්‍යයනය


2024 වසරේ දී, රු. බිලියන 2,039.9 ක් වූ අයවැය හිඟය ප්‍රධාන වශයෙන්ම දේශීය මූලාශ්‍ර හරහා මූල්‍යකරණය කරන ලද අතර එය සමස්ත මූල්‍යකරණයෙන් සියයට 83.7 ක් පමණ විය. බැංකු නොවන ශුද්ධ දේශීය මූල්‍යකරණය රු. බිලියන 2,087.5 ක් වූ අතර, එමඟින් රජය වෙළෙඳපොල පදනම් කරගත් දේශීය අරමුදල් මත අඛණ්ඩව රඳා පැවතීම පැහැදිලි විය. මුදල් මූල්‍යකරණයෙන් වැළකී සිටීමට රජයේ කැපවීම පිළිබිඹු කරමින් ශුද්ධ බැංකු මූල්‍යකරණය රු. බිලියන 293.8 ක් ලෙස සෘණාත්මකව පැවතුණි. සමස්ත මූල්‍යකරණයෙන් සියයට 16.3 කට පමණ විදේශීය මූල්‍යකරණය දායක වූ අතර එය රු. බිලියන 3,967.3 ක දළ ණය ගැනීම් සහ රු. බිලියන 3,634.1 ක ආපසු ගෙවීම්වලින් සමන්විත විය.

## මධ්‍යම රජයේ ණය

2023 වසරේ දී රු. බිලියන 28,695.9 ක් වූ මධ්‍යම රජයේ නොපියවූ ණය 2024 වසරේ දී රු. බිලියන 28,738.7 දක්වා ඉහළ ගියේය. 2023 වසරේ දී රු. බිලියන 17,051.9 ක් වූ

දේශීය ණය 2024 වසරේ දී රු. බිලියන 18,309.7 දක්වා ඉහළ ගියේය. විදේශ මූල්‍යකරණය සඳහා වන සීමිත ප්‍රවේශය, බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ඇති විය හැකි බලපෑම් සහ මුදලේ අගය අධිප්‍රමාණය වීම හේතුවෙන්, 2023 වසරේ දී රු. බිලියන 11,644.1 ක් වූ නොපියවූ විදේශ ණය ප්‍රමාණය 2024 වසරේ දී රු. බිලියන 10,429.0 දක්වා සියයට 10.4 කින් සැළකිය යුතු ලෙස අඩු විය. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, මධ්‍යම රජයේ ණය 2023 වසර අවසානය වන විට පැවති සියයට 104.7 සිට 2024 වසරේ දී සියයට 96.1 දක්වා අඩු විය. ඒ අනුව, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස නොපියවූ දේශීය ණය 2023 වසරේ දී වූ සියයට 62.2 සිට 2024 වසරේ දී සියයට 61.2 දක්වා සුළු වශයෙන් අඩු වූ අතර, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස නොපියවූ විදේශ ණය 2023 වසරේ දී වූ සියයට 42.5 සිට 2024 වසරේ දී සියයට 34.9 දක්වා අඩු විය.

රූප සටහන 1.14 | මධ්‍යම රජයේ නොපියවූ ණය (ද.දේ.නි. % ලෙස)




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.4 සාර්ව ආර්ථික ස්ථාවරත්වය ළඟා කරගැනීමේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්යභාරය

සාර්ව ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්කරගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය බෙහෙවින් උපකාරී විය. 2024 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීම මඟින් මූල්‍ය විනය වඩා ශක්තිමත් වීම පිළිබිඹු වන අතර, මෙලෙස මූල්‍ය විනය ශක්තිමත් වීම හේතුවෙන් ණය ලබා ගැනීමට ඇති අවශ්‍යතාවය අඩු විය. බදු ප්‍රතිපත්තිය සහ පරිපාලන ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා සමගාමීව වියදම් ප්‍රමුඛතාකරණය වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය සම්පත් වඩාත් කාර්යක්ෂමව වෙන් කිරීම හේතුවෙන්, උද්ධමනකාරී මුදල් මූල්‍යකරණයකට යොමු නොවී මූල්‍ය අවකාශය පුළුල් කර ගැනීමට හැකිවිය. මෙම පියවරයන් වෙළෙඳපොළ විශ්වසනීත්වය ඉහළ නැංවීමට සහ වඩාත් ස්ථාවර හා ශක්තිමත් ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීමට දායක විය.

රජය සතු ව්‍යවසායයන් සඳහා හඳුන්වා දුන් පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හේතුවෙන්, ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි මුළු ලාභය, 2023 වසරේ දී වාර්තා වූ රු. බිලියන 445.4 ට සාපේක්ෂව 2024 වසරේ දී රු. බිලියන 534.1 ක් වාර්තා කරමින් වඩා ඉහළ ලාභදායීතාවයක් පෙන්නුම් කරන ලදී. විදුලිය සහ ඉන්ධන සඳහා පිරිවැය නිරූපිත මිලකරණය හඳුන්වාදීම, කල්ගතවූ ණය රජයේ ශේෂ පත්‍රයට පැවරීම මඟින් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු රාජ්‍ය ව්‍යවසාය අංශයට හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ රුපියල අධිප්‍රමාණය වීම සහ වගකීම් පියවීම යනාදිය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රාජ්‍ය ව්‍යවසායයන්ට ණය ලබා ගැනීම සඳහා ඇති අවශ්‍යතාවයන් අඩු වීම හේතුවෙන් බැංකු ක්ෂේත්‍රය මත ඇති පීඩනය තවදුරටත් අඩු වූ අතර, සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ නැංවී වඩාත් ස්ථාවර මූල්‍ය පරිසරයක් නිර්මාණය විය.

## 1.5 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව පදනම් වී ඇත්තේ, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 5 ක තිරසාර අගයක් අත්පත් කර ගැනීම, උද්ධමනය සියයට 5 කට ආසන්නයේ පවත්වා ගැනීම, විදේශ අංශයේ ශක්තිමත් කාර්යසාධනයක් සහතික කිරීම, ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වාගැනීම, සහ දැඩි කැපවීමකින් ළඟා කරගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය මධ්‍යකාලීනව එලෙසම පවත්වාගෙන යාම මතයි.

මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම පහත දැක්වෙන ආකාරයට ඉලක්කගත කර ඇත:

- 2025 වසරේ දී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) ප්‍රතිශතයක් ලෙස සියයට 15 ක් දක්වා ඉහළ නැංවීම සහ එම අගය මධ්‍යකාලීනව තවදුරටත් ඉහළ නැංවීම.

- ප්‍රාථමික වියදම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13 ට අඩුවෙන් පවත්වා ගැනීම, සහ රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4 ට වඩා වැඩි අගයක පවත්වා ගැනීම.

- 2025 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් අත්පත් කර ගැනීම සහ මධ්‍යකාලීනව එම මට්ටම පවත්වාගැනීම.

- 2026 වසරේ සිට අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5 කට වඩා අඩු අගයකට සීමා කිරීම.

- ණය තිරසාර මට්ටමකට අඩු කිරීම සඳහා මධ්‍යම රජයේ ණය ක්‍රමයෙන් අඩු කිරීම.

මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වූ සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය පරාමිතීන් සැළකිල්ලට ගෙන සකසා ඇත. රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග, වියදම් තාර්කිකකරණය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල එකතුවක් තුළින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ළඟා කර ගැනීම සඳහා රජය දක්වන කැපවීම එමඟින් පිළිබිඹු වේ. බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ණය කළමනාකරණය යන ක්ෂේත්‍රවල දැනට ක්‍රියාත්මක වන සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ප්‍රතිසංස්කරණවල ප්‍රතික්ෂේපිත ප්‍රතිඵල මෙම රාමුව තුළ අන්තර්ගත වේ. එමෙන්ම මෙය තුළ මධ්‍යකාලීන

සාර්ව ආර්ථික අරමුණු ද අන්තර්ගත වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ පනවා ඇති ණය තිරසාරභාවය පිළිබඳ ඉලක්ක සහ ප්‍රතිසංස්කරණ ඉලක්කවලට අනුකූලවන පරිදි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තීරණ හැඩගැස්වීමට අත්‍යවශ්‍ය වන ඉතා වැදගත් මෙවලමක් ලෙස මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව ක්‍රියාකරයි.

**වගුව 1.2 මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව 2024 - 2029**

(ද.දේ.නි. % ලෙස)

| දර්ශකය | 2024 තාවකාලික | 2025 අයවැය | ප්‍රක්ෂේපනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2026 | 2027 | 2028 | 2029 |
| **මුළු ආදායම හා ප්‍රධාන** | **13.7** | **15.1** | **15.1** | **15.2** | **15.3** | **15.3** |
| **මුළු ආදායම** | **13.4** | **15.0** | **15.0** | **15.1** | **15.2** | **15.2** |
| **බදු ආදායම** | **12.4** | **13.9** | **13.9** | **13.9** | **14.2** | **14.2** |
| ආදායම් බදු | 3.4 | 3.5 | 3.6 | 3.6 | 3.7 | 3.8 |
| භාණ්ඩ හා සේවා මත බදු | 7.3 | 8.4 | 8.7 | 8.7 | 8.7 | 8.7 |
| විදේශ වෙළඳාම මත බදු | 1.6 | 2.0 | 1.6 | 1.6 | 1.7 | 1.7 |
| **බදු නොවන ආදායම** | **1.1** | **1.1** | **1.1** | **1.1** | **1.1** | **1.1** |
| **ප්‍රදාන** | **0.2** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** |
| **මුළු වියදම** | **20.5** | **21.8** | **19.6** | **19.1** | **19.0** | **18.8** |
| **වර්ථන වියදම** | **17.9** | **17.8** | **15.5** | **15.0** | **14.8** | **14.7** |
| වැටුප් හා වේතන | 3.6 | 3.7 | 3.7 | 3.8 | 3.8 | 3.8 |
| භාණ්ඩ හා සේවා | 1.2 | 1.3 | 1.1 | 1.1 | 1.1 | 1.1 |
| පොලී ගෙවීම් | 9.0 | 8.9 | 6.8 | 6.2 | 6.1 | 5.9 |
| සහනාධාර හා පැවරුම් | 4.1 | 3.9 | 3.9 | 3.8 | 3.8 | 3.8 |
| **ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම්** | **2.6** | **4.0** | **4.1** | **4.1** | **4.2** | **4.2** |
| එයින් රාජ්‍ය ආයෝජන | 2.7 | 4.0 | 4.1 | 4.1 | 4.2 | 4.2 |
| **ජංගම ගිණුමේ ශේෂය** | **(4.4)** | **(2.8)** | **(0.5)** | **0.1** | **0.4** | **0.6** |
| **ප්‍රාථමික ශේෂය** | **2.2** | **2.3** | **2.3** | **2.3** | **2.4** | **2.4** |
| **අයවැය හිඟය** | **(6.8)** | **(6.7)** | **(4.5)** | **(4.0)** | **(3.7)** | **(3.5)** |

මූලාශ්‍රය: මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වැඩසටහන් පරාමිතීන් අනුව

**විශේෂ සටහන 1.5 | පිවිතුරු ශ්‍රී ලංකා: තිරසර සංවර්ධනය සඳහා වූ පරිවර්තනීය ජාතික වැඩසටහන**


පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහන හරහා ශ්‍රී ලංකාව පිරිසිදු, හරිත හා වඩාත් සදාචාරාත්මක අනාගතයක් කරා පියවර තබමින් සිටින අතර එය ආර්ථික, සමාජීය සහ පාලන පද්ධතිය යන ජාතික සංවර්ධනයේ සියලු අංශ හරහා තිරසරභාවය මූලික මූලධර්මයක් ලෙස තහවුරු කිරීමට සැලසුම් කර ඇති අභිලාශකාමී, ජාතික වැඩසටහනකි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් " යන දැක්ම මත පදනම් වූ මෙම වැඩසටහන, සමාජ සංවර්ධනය, පාරිසරික සංවර්ධනය සහ ආචාරධර්මීය සංවර්ධනය යන අන්තර් සම්බන්ධිත කුළුණු තුනක් හරහා ශ්‍රී ලංකාව 2030 වන විට වඩාත් යහපත් රටක් බවට පරිවර්තනය කිරීමේ සමස්ත වෑයමකි.

**ප්‍රතිපත්තියෙන් ඔබ්බට වූ දැක්මක්:**

"තිරසරත්වය ප්‍රතිස්ථාපනය කිරීම" යන තේමාව යටතේ ක්‍රියාත්මක වන පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහන සාම්ප්‍රදායික සංවර්ධන ආකෘතීන් වලින් ඔබ්බට දිවෙන වැඩසටහනකි. එමගින් පිරිසිදු භෞතික පරිසරයක් පමණක් නොව, වගවීම, අන්තර්ග්‍රහණය සහ විනිවිදභාවය මත පදනම් වූ සදාචාර සම්පන්න සමාජයක් ද අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා රජය විසින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන, රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ ප්‍රමුඛයන්, සිවිල් සමාජය, ශාස්ත්‍රඥයින්, සංවර්ධන හවුල්කරුවන් සහ විවිධ ප්‍රජාවන් ඇතුළු ප්‍රබල පාර්ශවකරුවන්ගේ සංකලනයකි.

**"පිවිතුරු ශ්‍රී ලංකා" යටතේ කුළුණු තුනක්**

**සමාජ කුළුණ:** පොදු සේවා පුළුල් කිරීම, සෞඛ්‍ය සහ සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, යහපැවැත්ම ඉහළ නැංවීම හා ජාතික අභිමානය ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල් ප්‍රවේශය වැඩි කිරීම.




**ආචාරධර්මීය කුළුණ:** මහජන විශ්වාසය සහ පුද්ගල වගවීම ශක්තිමත් කිරීම සඳහා යහපාලනය, විනිවිදභාවය, රාජ්‍ය සේවයේ ආචාර ධර්ම සහ සිවිල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම.

**පාරිසරික කුළුණ:** වක්‍රීය ආර්ථික ප්‍රතිපත්ති සමඟ අනුගත වන පරිදි ඝන අපද්‍රව්‍ය, අපජලය සහ ස්වභාවික සම්පත් කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම.

**විශේෂ සටහන 1.5 | පිවිතුරු ශ්‍රී ලංකා: තිරසර සංවර්ධනය සඳහා වූ පරිවර්තනීය ජාතික වැඩසටහන සම්බන්ධිතයි...**

**පිවිතුරු මනසකින් පිවිතුරු ජාතියක්: ඒකාබද්ධ බලපෑම**

පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහනෙහි සාර්ථකත්වය මෙම කුළුණු 3 අතර පවතින ඒකාබද්ධ සහයෝගීතාවය මත රඳා පවතී. තිරසරත්වය අගය කිරීමට අධ්‍යාපනය ලද ජනතාවක් (සමාජ), ඒ අනුව ජීවත් වීමට සවිබල ගැන්වුණු පරිසරයක් (පාරිසරික) සහ අවංක, කාර්යක්ෂම පාලන පද්ධතියක් (ආචාරධාර්මික) තුළින් රටෙහි දිගුකාලීන පරිවර්තනය සඳහා පදනම සාදයි. මෙම අංගයන් ඒකාබද්ධව ක්‍රියාත්මක වන විට පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහන හරහා රටෙහි ස්වයංපෝෂිත ධනාත්මක වෙනසක් ඇති කිරීමට ඉවහල් වන අතර පිවිතුරු සමාජයක් පමණක් නොව, එය සාක්ෂාත් කර ගැනීමට ව්‍යුහාත්මකව හා සංස්කෘතිකව හැකියාව ඇති සමාජයක් ද නිර්මාණය කරයි.

සමාජ-ආචාරධර්මීය ඒකාබද්ධතාවය: ජනතා කේන්ද්‍රීය සංවර්ධනය

ආචාරධර්මීය- පාරිසරික ඒකාබද්ධතාවය: තිරසාර ජීවනෝපායන් සහ මහජන විශ්වාසය

සමාජ-පාරිසරික ඒකාබද්ධතාවය: සියලු ජන කොටස් ඇතුළත් හරිත යටිතල පහසුකම

සමාජ- පාරිසරික-ආචාරධර්මීය ඒකාබද්ධතාවය : තිරසරභාවය සඳහා සමස්ත ආයතනික පාලනය

**පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහන-අතුරු ක්ෂේත්‍ර සම්බන්ධතා**

සමාජ, පාරිසරික සහ ආචාරධර්මීය යන පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහනේ කුළුණු තුන ඉතා පුළුල්ව අන්තර් සම්බන්ධිත වන අතර අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් වේ. පිරිසිදු, වඩාත් තිරසර සහ විශ්වාසනීය ජාතියක් ගොඩනැගීම යන මෙම වැඩසටහනේ සමස්ත ඉලක්කය සාක්ෂාත් කර ගැනීම මෙම මානයන් තුනම සම්බන්ධීකරණය සහ ඒකාබද්ධ ක්‍රියාත්මක කිරීම මත රඳා පවතී.

**ඉදිරි කැපවීම**

හරිත ආයෝජන ඒකාබද්ධ කිරීම, වක්‍රීය ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම, සහ ප්‍රජාවන් සවිබල ගැන්වීම මගින්, පිවිතුරු ශ්‍රී ලංකා වැඩසටහන හරහා රටේ සංවර්ධන ගමන් මග ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. එමගින් සියලුම ශ්‍රී ලාංකිකයන්ගෙන් අපේක්ෂා කරනුයේ තිරසරත්වය යන සංකල්පය තාවකාලික ප්‍රවණතාවක් ලෙස සැලකීම නොව,දෛනික ජීවිතයේ හැසිරීම්, සහ පාලන පද්ධති තුළ ගැඹුරින් තැන්පත් වූ ජීවන මාර්ගයක් ලෙස අනුගත වීම වේ.

මෙම වැඩසටහනේ ඊළඟ අදියර ඉදිරියට ගෙන යාම සඳහා, 2025 රාජ්‍ය අයවැයෙන්, සමාජ, පාරිසරික සහ ආචාරධාර්මික කුළුණු යටතේ ප්‍රමුඛතා ලබා දුන් ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 5,000 ක් වෙන් කර ඇත.

ඉදිරියේදී, සංවර්ධන හවුල්කරුවන්ගේ සහ පරිත්‍යාගශීලීන්ගේ මූල්‍ය ආධාර ද උපයෝගී කර ගනිමින්, එක් එක් කුළුණ යටතේ තවදුරටත් මේ සඳහා උපාය මාර්ගිකව මුල්‍ය පහසුකම් සපයනු ලැබේ.

# 02

# 2024 වසරේ ආර්ථික ප්‍රවණතා


## 2.1 සමාලෝචනය

අඛණ්ඩව වසර දෙකක් මුළුල්ලේ ගැඹුරු ලෙස මුල් බැසගත් ආර්ථික අර්බුදයෙන් පසුව, 2024 වසරේ දී ශ්‍රී ලංකාව, අපේක්ෂිත මට්ටමට වඩා වේගයෙන් සාර්ව ආර්ථික ස්ථායීතාවය යලි ගොඩනගා ගැනීමේ සැලකියයුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. දැනට ක්‍රියාත්මක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ සහාය ද ඇතිව පුළුල් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සඳහා රජයේ කැපවීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාව පිළිබඳ විශ්වාසය යලි ගොඩනැඟී ඇති අතර, නිවැරදි රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම මගින් සාර්ව ආර්ථික ස්ථායීතාවය සඳහා පදනම වැටී ඇත. නිවැරදි ක්‍රියාමාර්ගයන්ගේ ධනාත්මක බලපෑම් මේ වන විට ඵල දරමින් තිබේ.

ගෝලීය ආර්ථික අර්බුද මධ්‍යයේ වුවද, ආර්ථිකය ශක්තිමත් ලෙස හසුරුවමින් අඛණ්ඩව වසර දෙකක ආර්ථික සංකෝචනයකින් පසු 2024 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 5.0 කින් වර්ධනය විය. වසර හයකට පසු පළමු වරට 2024 වසරේ සෑම කාර්තුවකම ධනාත්මක වර්ධනයක් වාර්තා වූ අතර, ආර්ථික වර්ධනය වඩාත් පුළුල් ලෙස පැවතුණි. නිෂ්පාදන හා ඉදිකිරීම් උප අංශයන් යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත අංශයේ සියයට 11.0 ක සැලකියයුතු අන්දමේ වර්ධනයක් වාර්තා විය. නවාතැන් සැපයීම හා ප්‍රවාහන සේවාවන් ව්‍යාප්තවීම හේතුවෙන් සේවා අංශය සියයට 2.4 කින් වර්ධනය විය. සත්ත්ව නිෂ්පාදනයේ සහ පළතුරු වගාවේ වාර්තා වූ වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික අංශය සියයට 1.2 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2024 වසරේ දී පරිභෝජන වියදම් සහ ආයෝජන වියදම් පිළිවෙළින් සියයට 6.4 කින් සහ සියයට 19.6 කින් වැඩිවීම හේතුවෙන් දේශීය ඉල්ලුම පවත්නා වෙළෙඳපොළ මිල ගණන් යටතේ සියයට 9.5 කින් වැඩි විය. ප්‍රධාන වශයෙන් දේශීය ඉතුරුම් සියයට 18.3 කින් වර්ධනය වීම හේතුවෙන් 2024 වසරේ දී රටේ ජාතික ඉතුරුම් පවත්නා වෙළෙඳපොළ මිල ගණන් යටතේ සියයට 17.3 කින් වැඩි විය.

**රූපසටහන 2.1 | ද.දේ. නිෂ්පාදනයේ කාර්තුමය වර්ධනය**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**වගුව 2.1 | ද.දේ.නි. ආංශික වර්ධන වේගය 2024 (%)**

| අංශය | කා. 1 | කා. 2 | කා. 3 | කා. 4 | වාර්ෂික |
|---|---|---|---|---|---|
| **ද.දේ.නි. (නාමික)** | **8.7** | **10.9** | **9.0** | **7.9** | **9.0** |
| කෘෂිකාර්මික | 14.2 | 14.1 | 11.5 | 6.4 | 11.4 |
| කාර්මික | 3.5 | 7.5 | 10.2 | 11.7 | 8.0 |
| සේවා | 6.5 | 5.5 | 3.7 | 3.3 | 4.7 |
| **ද.දේ.නි.(මූර්ත)** | **5.1** | **4.1** | **5.3** | **5.4** | **5.0** |
| කෘෂිකාර්මික | 0.9 | 2.7 | 3.7 | -2.2 | 1.2 |
| කාර්මික | 11.2 | 9.7 | 10.1 | 13.1 | 11.0 |
| සේවා | 2.5 | 1.9 | 2.6 | 2.5 | 2.4 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කා: කාර්තු

විදේශ අංශයේ වර්ධනය තිරසාරව පවත්වා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අඛණ්ඩව දෙවන වසරටත් විදේශ ජංගම ගිණුමේ සැලකිය යුතු අතිරික්තයක් ඇති විය. කෙසේ වෙතත්, වෙළෙඳ භාණ්ඩ ආනයන යථා තත්ත්වයට පත්වීමත් සමඟ වෙළෙඳ හිඟය පුළුල් වී ඇත. සංචාරක ඉපැයීම් තිව්‍ර ලෙස වැඩිවීම සහ ශ්‍රමිකප්‍රේෂණ ස්ථාවර ලෙස වැඩිවීම, විදේශ විනිමය සංචිත නැවත ගොඩ නැංවීමටත්, විදේශ මූල්‍ය පීඩනයන් ලිහිල් කිරීමටත්, සමස්ත විදේශ අංශයේ ස්ථායීතාවය ශක්තිමත් කිරීමටත් සැලකිය යුතු ලෙස දායක විය. දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ ශේෂය 2023 වසරේ දී වූ සියයට 1.7 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 1.2 ක අතිරික්තයක් වාර්තා කළේය. අපනයන ඉපැයීම් වැඩිවීමට වඩා ආනයන වියදම් වැඩිවීමත් සමඟ 2023 වසරේ දී සියයට 5.9 ක් වූ වෙළෙඳ හිඟය 2024 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.1 ක් දක්වා පුළුල් විය. 2024 වසරේ දී සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 3,168.6 දක්වා සියයට 53.2 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 6,575.4 දක්වා සියයට 10.1 කින් වැඩි විය.

ප්‍රධාන වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉතිහාසයේ ඉහළම විදේශ විනිමය ප්‍රමාණයක් දේශීයව මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් 2023 වසර අවසානයේ ඇ.ඩො. බිලියන 4.4 ක් වූ දළ නිල සංචිත ප්‍රමාණය 2024 වසර අවසානයේ ඇ.ඩො. බිලියන 6.1 දක්වා වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ජංගම ගිණුමේ අතිරික්තයන් සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත අඛණ්ඩව ශුද්ධ විදේශ විනිමය ලැබීම හේතුවෙන්, විනිමය අනුපාතිකය 2023 වසර අවසානයේ පැවති සියයට 12.1 ක වාර්ෂික අතිප්‍රමාණය වීමට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී සියයට 10.7 ක වාර්ෂික අතිප්‍රමාණයක් අඛණ්ඩව දෙවන වසරටත් වාර්තා කරන ලදී.


ආර්ථිකය ගොඩනැංවීමට සහාය වීම පිණිස ඵලදායී අංශ වෙත ණය ලබාදීමට පහසුකම් සැලසීම සඳහා උද්ධමනය සියයට 5 ක් වූ මධ්‍යකාලීන ඉලක්කය වටා පවත්වා ගැනීම අරමුණු කරගත් වඩාත් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් මහ බැංකුව විසින් අනුගමනය කරන ලදී. විනිවිදභාවය වර්ධනය කිරීම, ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම සහ උද්ධමන ඉලක්කකරණයේ යහ භාවිතයන් සමඟ අනුකූල වීම සඳහා 2024 වසරේ නොවැම්බර් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 8.00 ක තනි ප්‍රතිපත්ති පොලී

අනුපාතයක් හඳුන්වා දීමෙන් මුදල් ප්‍රතිපත්ති රාමුව තවදුරටත් විධිමත් කරන ලදී. උද්ධමනය සියයට 5 ක ඉලක්කයේ පවත්වා ගැනීමට සහාය වන පරිදි 2025 වසරේ මැයි මස 22 වන දින සිට මෙම එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 7.75 දක්වා පදනම් අංක 25 කින් තවදුරටත් අඩු කරන ලදී. මේ අතර, විරැකියා අනුපාතිකය 2023 වසරේ වූ සියයට 4.7 ට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 4.4 දක්වා අඩු විය.

උද්ධමනය, 2024 වසර මුළුල්ලේ නොකඩවා අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, 2024 වසර අවසානය වන විට සෘණාත්මක කලාපයකට අවතීර්ණ විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2023 වසරේ දී වාර්තා කළ සියයට 17.4 ට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 1.2 දක්වා තියුනු ලෙස පහත වැටුණි. එසේම, ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2023 වසරේ දී වාර්තා කළ සියයට 16.5 ට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 1.6 දක්වා තියුනු ලෙස පහත වැටුණි. 2024 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතයේ වැඩිවීම සහ ඇතැම් පාරිභෝගික භාණ්ඩ සඳහා එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ මුල් මාස කිහිපය තුල දී, මතුපිට උද්ධමනය තාවකාලික වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, 2024 වසරේ මාර්තු මාසයේදී බලශක්ති මිල ගණන් අඩු කිරීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් උද්ධමනය සියයට 5 ඉලක්කයට වඩා පහත වැටුණි. 2024 වසරේ ජූලි මාසයේ සිට විදුලි ගාස්තු තවදුරටත් අඩු කිරීම ද උද්ධමනය පහත වැටීමට දායක විය. 2024 වසරේ සැප්තැම්බර් මාසය වන විට, මතුපිට උද්ධමනය සෘණාත්මක මට්ටම් කරා ළඟා වූයේ වසර නවයකට පසු අවධමනයක් සනිටුහන් කරමිනි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) මඟින් මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2024 වසරේ මැයි මස අගදී පැවති සියයට 0.9 සිට 2025 වසරේ මැයි මස අග වන විට සියයට -0.7 දක්වා අඩු වූ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) මඟින් මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2024 වසරේ අප්‍රේල් මස අගදී පැවති සියයට 2.7 සිට 2025 වසරේ අප්‍රේල් මස අග වන විට සියයට -0.8 දක්වා අඩු විය. කෙසේ වෙතත්, 2025 වසරේ මැද භාගය වන විට උද්ධමනය ධනාත්මක කලාපයකට නැවත අවතීර්ණ වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර, මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුව, මධ්‍ය කාලීනව සියයට 5 ඉලක්කය සමඟ ක්‍රමයෙන් අනුකූල වනු ඇත.

**රූපසටහන 2.2 | ඒක පුද්ගල ද.දේ.නි. (ඇ.ඩො.)**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ වන විටත් ක්‍රියාත්මකවන ආර්ථික හා දූෂණ විරෝධී වැඩපිළිවෙළ මඟින් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යාම හේතුවෙන් 2024 වසරේ දී කොටස් වෙළෙඳපොළ ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2024 වසර අවසානය වන විට සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 15,944.6 දක්වා සියයට 49.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය ඒකක 4,862.1 දක්වා සියයට 58.5 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2023 වසර අවසානයේ පැවති රු. බිලියන 4,248.9 ට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී රු. බිලියන 5,695.6 දක්වා සියයට 34.1 කින් වර්ධනය විය.

## 2.2 ශ්‍රී ලංකාවේ ආර්ථිකය

2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වූ අතර, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 5 ක් විය. විශේෂයෙන්ම, 2024 වසරේ කාර්තු හතර තුළ දීම, 2017 වසරින් පසු ප්‍රථම වතාවට ධනාත්මක වර්ධනයන් වාර්තා කරන ලදී. එසේම, කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා යන ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනම 2024 වසර තුළ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී.

2023 වසරේ දී සියයට 1.6 ක වර්ධනයක් වාර්තා කළ කෘෂිකාර්මික අංශය 2024 වසරේ දී සියයට 1.2 ක ආන්තික වර්ධනයක් වාර්තා කරන ලදී. සත්ව නිෂ්පාදනය, ධාන්‍ය, සහල්, එළවළු, පලතුරු, රබර්, තේ සහ කුළුබඩු වගාව, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව ඇතුළු උප අංශ කිහිපයක වාර්තා වූ ධනාත්මක කාර්ය සාධනය, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසරේ දී වාර්තා වූ සියයට 9.2 ක සැලකිය යුතු හැකිලීමට සාපේක්ෂව, 2024 වසරේ දී කර්මාන්ත අංශය සියයට 11.0 කින් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. මෙම අංශය යථා තත්ත්වයට පත්වීමට බොහෝ දුරට හේතු වූයේ ඉදිකිරීම්, සහ පතල් හා කැණීම් උප අංශවල ශක්තිමත් කාර්ය සාධනය යි. අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන උප අංශය හැර, කර්මාන්ත අංශයේ අනෙකුත් සියලුම උප අංශ 2024 වසරේ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. රු. බිලියන 7,381 ක අගය එකතු කළ වටිනාකමක් සහිත, ආර්ථිකයට විශාලතම දායකත්වය සපයන අංශය වන සේවා අංශය, 2023 වසරේ දී වාර්තා වූ සියයට 0.2 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 2.4 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්, මෙන්ම තැපැල් සහ කුරියර් සේවාවන් යන උප අංශවල ඉහළ කාර්යසාධනය මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

මේ අතර, පවත්නා වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය 2023 වසරේ දී රු. බිලියන 27,419.8 ක් වූ අතර,

එය 2024 වසරේ දී රු. බිලියන 29,898.5 ක් දක්වා සියයට 9.0 කින් වර්ධනය විය. ඇමරිකානු ඩොලර් (ඇ.ඩො.) වටිනාකම අනුව, 2024 වසරේ දී ද.දේ.නි.ය ඇ.ඩො. බිලියන 99.0 ක් දක්වා ඉහළ ගිය අතර, එය 2023 වසරේ දී ඇ.ඩො. බිලියන 83.8 ක් විය. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ද, 2023 වසරේ දී වාර්තා වූ ඇ.ඩො. 3,801 සිට 2024 වසරේ දී ඇ.ඩො. 4,516 ක් දක්වා සියයට 18.8 ක හෙවත් ඇමරිකානු ඩොලර් 715 ක කැපී පෙනෙන ඉහළයාමක් වාර්තා කර ඇති අතර, නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළයාම සහ වසර මැද ජනගහනයේ පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.


පවත්නා වෙළෙඳපොළ මිල අනුව, 2024 වසරේ දී ආයෝජන වියදම් සියයට 19.6 කින් ඉහළ ගිය අතර, ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනය හේතුවෙන්, ආයෝජන වියදම්වල ප්‍රධාන සංරචකය වන දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වර්ධනය වීම, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. පුද්ගලික සහ රාජ්‍ය වියදම් යන දෙකම ඇතුළත්වන පරිභෝජන වියදම්, 2023 වසරේ දී වාර්තා වූ සියයට 15.9 ක ඉහළ යාමට සාපේක්ෂව, 2024 වසරේ දී සියයට 6.4 කින් මධ්‍යස්ථ ලෙස ඉහළ ගොස් ඇති අතර, එය මිල අඩුවීම මඟින් පාරිභෝගික වියදම් කෙරෙහි ඇති වූ බලපෑම පිළිබිඹු කරයි. 2023 වසරට සාපේක්ෂව ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන්, පවත්නා වෙළෙඳපොළ මිල අනුව 2024 වසරේ දී ශුද්ධ විදේශ ඉල්ලුම සියයට 32.6 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. 2023 වසරේ දී වාර්තා වූ සියයට 15.6 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී ජාතික ඉතුරුම් සියයට 17.3 කින් වර්ධනය විය. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්, 2023 වසරේ දී වූ සියයට 26.3 ක සිට 2024 වසරේ දී සියයට 28.3 ක් දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී. තවද, ආයෝජන වියදම්වලට සාපේක්ෂව ජාතික ඉතුරුම්වල ඉහළ වර්ධනය හේතුවෙන්, 2024 වසරේ දී ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය, රු. බිලියන 413.2 ක් ලෙස ධනාත්මක අගයක් වාර්තා කරන ලදී.

## කෘෂිකාර්මික අංශය

2023 වසරේ දී වාර්තා වූ සියයට 1.6 ක වර්ධනයට සාපේක්ෂව, කෘෂිකාර්මික අංශය, 2024 වසරේ දී සියයට 1.2 කින් ආන්තික වශයෙන් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ සත්ත්ව නිෂ්පාදනය සහ ධාන්‍ය වගාව වැනි උප අංශවල සිදු වූ වර්ධනයයි. මීට අමතරව, වී, එළවළු, පලතුරු, රබර්, තේ, සහ කුළුබඩු වගාව, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව යන උප අංශ මෙම කාර්යසාධනය සඳහා ධනාත්මක ලෙස දායක විය. කෙසේ නමුත්, කෘෂිකාර්මික අංශයේ උප අංශ කිහිපයක්ම 2024 වසරේ දී සෘණාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙයට, උක්, දුම්කොළ සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග වගාව, තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල් ඇතුළුව), කෝපි, කොකෝවා සහ වෙනත් පානීය භෝග වගාව, පැල බෝ කිරීම, වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය, සහ මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව ඇතුළත් විය.

2024 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 8.3 ක් පමණක් වුව ද, වසරේ සිව්වන කාර්තුව වන විට කෘෂිකාර්මික අංශයේ රැකියාවන්හී නියැලී සිටි ජනගහනය මුළු රැකියා නියුක්ත ජනගහනයෙන් සියයට 26.8 ක් විය. ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා, කෘෂිකාර්මික අංශය විවිධාංගීකරණය කිරීම සහ මෙම අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වැදගත්කම මෙයින් පිළිබිඹු වේ. ජලය සහ ඉඩම් අකාර්යක්ෂම ලෙස පරිභෝජනය කිරීම, ඉහළ පසු අස්වනු හානිය, ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය හිඟය, සීමිත වෙළෙඳපොළ ප්‍රවේශය සහ දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් ඇතුළු ප්‍රධාන අභියෝගවලට සාර්ථකව විසඳුම් ලබා දීම තුළින් කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැදගත්කම ද මෙමඟින් අවධාරණය කෙරේ.

**රූපසටහන 2.3 | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2024**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### වී

අගය එකතු කළ වටිනාකම අනුව, වී වගාව උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 17.1 ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 3.1 ක සුළු වර්ධනයක් වාර්තා කළ අතර, වී වගා කරන ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණය මෙලෙස වර්ධනය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. 2024 වසරේ දී වී වපුරන ලද සමස්ත භූමි ප්‍රමාණය මෙන්ම අස්වනු නෙළන ලද ශුද්ධ භූමි ප්‍රමාණය ද අඩු විය. මෙහිදී 2023 වසරේ දී හෙක්ටයාර 1,317,677 ක් වූ වී වපුරන ලද සමස්ත භූමි ප්‍රමාණය 2024 වසරේ දී හෙක්ටයාර 1,287,989 ක් දක්වා සියයට 2.3 කින් අඩු වූ අතර, 2023 වසරේ දී හෙක්ටයාර 1,162,805 ක් වූ අස්වනු නෙළන ලද ශුද්ධ භූමි ප්‍රමාණය 2024 වසරේ දී හෙක්ටයාර 1,131,859 ක් දක්වා සියයට 2.6 කින් අඩු විය.

2023 වසරේ දී මෙට්‍රික් ටොන් 4,513,431 ක් වූ මුළු වී නිෂ්පාදනය 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 4,698,454 ක් දක්වා සියයට 4.1 කින් ඉහළ ගොස් ඇති අතර, එය 2023/24 මහ කන්නයේ දී මෙට්‍රික් ටොන් 2,721,958 ක සහ යල කන්නයේ දී මෙට්‍රික් ටොන් 1,976,496 ක අස්වනු ප්‍රමාණයකින් සමන්විත විය. කෙසේනමුත්, හෙක්ටයාරයකින් ලැබුණු අස්වනු ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, 2023 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,882 ක් වූ එම අගය 2024 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,151 දක්වා සියයට 6.9 කින් ඉහළ ගොස් තිබේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉහළ අස්වැන්නක්

## වගුව 2.2 | ස්ථාවර (2015) වෙළෙඳ මිල ගණන් අනුව දළ දේශීය නිෂ්පාදනය, 2019 සිට 2024

රු. මිලියන

| | ආර්ථික ක්‍රියාකාරකම් | 2019 | 2020 | 2021(අ) | 2022(අ) | 2023(අ) | 2024(ඉ) | 2023/2022 වෙනස (%) | 2024/2023 වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | | **949,582** | **941,046** | **950,548** | **911,252** | **925,822** | **937,104** | **1.6** | **1.2** |
| 1 | ධාන්‍ය (වී හැර) | 13,355 | 21,342 | 21,949 | 16,507 | 16,920 | 18,758 | 2.5 | 10.9 |
| 2 | වී වගාව | 112,919 | 121,663 | 107,359 | 94,730 | 110,946 | 114,369 | 17.1 | 3.1 |
| 3 | එළවළු වගාව | 102,037 | 111,088 | 109,147 | 103,161 | 106,135 | 109,069 | 2.9 | 2.8 |
| 4 | උක් වගාව දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික නොවන භෝග | 3,275 | 4,021 | 3,729 | 3,803 | 3,515 | 3,187 | -7.6 | -9.3 |
| 5 | පළතුරු වගාව | 77,200 | 81,823 | 72,949 | 73,310 | 78,076 | 81,548 | 6.5 | 4.4 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල් තැඹිලි සහ ඔයිල් ෆාම් වගාව) | 102,800 | 92,197 | 102,490 | 111,196 | 104,725 | 92,703 | -5.8 | -11.5 |
| 7 | තේ වගාව | 72,733 | 67,971 | 74,604 | 62,867 | 61,912 | 62,953 | -1.5 | 1.7 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි කොකෝවා ආදී) | 1,302 | 1,613 | 1,352 | 1,229 | 1,136 | 1,110 | -7.6 | -2.3 |
| 9 | කුළුබඩු , සුවඳ දෙන භෝග බෙහෙත් සහ ඖෂධීය පැලැටි වර්ග | 90,880 | 93,776 | 97,767 | 101,653 | 99,729 | 101,653 | -1.9 | 1.9 |
| 10 | රබර් වගාව | 24,029 | 24,081 | 26,464 | 23,871 | 22,024 | 22,503 | -7.7 | 2.2 |
| 11 | වෙනත් බහු වාර්ෂික භෝග වගාව | 28,751 | 29,781 | 26,963 | 27,533 | 29,440 | 25,949 | 6.9 | -11.9 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 90,284 | 86,907 | 94,039 | 83,307 | 83,587 | 95,363 | 0.3 | 14.1 |
| 13 | පැල බෝ කිරීම | 772 | 622 | 813 | 965.41 | 728 | 625.956 | -24.6 | -14.0 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 22,969 | 26,102 | 29,019 | 33,062 | 32,888 | 31,868 | -0.5 | -3.1 |
| 15 | වන වගාව දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 43,133 | 42,587 | 44,348 | 50,931 | 47,221 | 46,209 | -7.3 | -2.1 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | 141,700 | 111,307 | 112,814 | 95,447 | 100,099 | 104,947 | 4.9 | 4.8 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව | 21,444 | 24,166 | 24,742 | 27,682 | 26,739 | 24,290 | -3.4 | -9.2 |
| **කර්මාන්ත** | | **3,933,728** | **3,724,566** | **3,937,895** | **3,308,573** | **3,002,968** | **3,333,008** | **-9.2** | **11.0** |
| 18 | පතල් මා කැණීම් කර්මාන්තය | 318,658 | 284,079 | 287,969 | 198,613 | 154,303 | 184,166 | -22.3 | 19.4 |
| 19 | ආහාර බීම සහ දුම් කොළ නිෂ්පාදනය | 929,371 | 980,863 | 1,014,150 | 869,371 | 899,739 | 954,409 | 3.5 | 6.1 |
| 20 | රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය | 469,028 | 416,312 | 473,911 | 511,860 | 450,438 | 500,210 | -12.0 | 11.0 |
| 21 | ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 36,321 | 32,831 | 35,579 | 29,758 | 23,807 | 24,975 | -20.0 | 4.9 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 54,064 | 51,896 | 56,811 | 52,069 | 47,259 | 48,734 | -9.2 | 3.1 |
| 23 | අඟුරු සහ ඛනිජතෙල් පරිපහදු කිරීමේ නිෂ්පාදන | 24,630 | 22,108 | 15,492 | 6,474 | 21,895 | 19,690 | 238.2 | -10.1 |
| 24 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 90,144 | 92,157 | 95,793 | 82,349 | 82,949 | 90,994 | 0.7 | 9.7 |
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 98,429 | 81,182 | 97,436 | 67,505 | 56,157 | 60,972 | -16.8 | 8.6 |
| 26 | ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 107,062 | 102,685 | 119,973 | 85,182 | 84,670 | 86,813 | -0.6 | 2.5 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 80,312 | 77,859 | 81,174 | 58,780 | 60,303 | 70,963 | 2.6 | 17.7 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 66,114 | 65,187 | 73,090 | 59,181 | 50,229 | 53,372 | -15.1 | 6.3 |

**වගුව 2.2 | ස්ථාවර (2015) වෙළෙඳ මිල ගණන් අනුව දළ දේශීය නිෂ්පාදනය, 2019 සිට 2024 සම්බන්ධිතයි...**

රු. මිලියන

| | | 2019 | 2020 | 2021(අ) | 2022(අ) | 2023(අ) | 2024(ආ) | 2023/2022 වෙනස (%) | 2024/2023 වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 29 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 95,470 | 81,651 | 82,694 | 60,837 | 56,089 | 61,740 | -7.8 | 10.1 |
| 30 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 96,432 | 87,586 | 101,048 | 79,088 | 66,747 | 72,427 | -15.6 | 8.5 |
| 31 | විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 184,041 | 180,176 | 188,924 | 178,059 | 174,017 | 185,978 | -2.3 | 6.9 |
| 32 | ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 14,701 | 15,908 | 13,099 | 14,059 | 11,590 | 11,906 | -17.6 | 2.7 |
| 33 | මළාපවාහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 29,253 | 28,960 | 27,992 | 28,070 | 27,955 | 28,319 | -0.4 | 1.3 |
| 34 | ඉදිකිරීම් කර්මාන්තය | 1,239,700 | 1,123,127 | 1,172,761 | 927,319 | 734,821 | 877,339 | -20.8 | 19.4 |
| | **සේවාවන්** | **7,307,036** | **7,166,506** | **7,410,705** | **7,217,485** | **7,206,496** | **7,381,059** | **-0.2** | **2.4** |
| 35 | තොග හා සිල්ලර වෙළෙඳාම | 1,636,752 | 1,650,889 | 1,675,083 | 1,675,528 | 1,677,941 | 1,700,232 | 0.1 | 1.3 |
| 36 | මහින් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,398,230 | 1,313,312 | 1,325,233 | 1,364,677 | 1,422,786 | 1,464,296 | 4.3 | 2.9 |
| 37 | තැපැල් හා කුරියර් සේවාවන් | 17,099 | 17,620 | 18,886 | 19,780 | 20,349 | 21,627 | 2.9 | 6.3 |
| 38 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 216,976 | 128,556 | 130,743 | 166,030 | 209,172 | 274,921 | 26.0 | 31.4 |
| 39 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 42,752 | 43,841 | 42,161 | 37,350 | 36,551 | 37,767 | -2.1 | 3.3 |
| 40 | විදුලි සංදේශ සේවාවන් | 103,325 | 118,845 | 131,952 | 140,524 | 137,403 | 143,109 | -2.2 | 4.2 |
| 41 | පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 175,634 | 194,893 | 243,971 | 238,455 | 187,341 | 198,512 | -21.4 | 6.0 |
| 42 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 510,367 | 557,357 | 596,106 | 529,744 | 475,201 | 482,557 | -10.3 | 1.5 |
| 43 | රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 120,550 | 117,595 | 148,658 | 78,187 | 103,519 | 89,030 | 32.4 | -14.0 |
| 44 | නිවාස අයිතිය හා දේපල වෙළෙඳාම | 610,231 | 604,259 | 630,570 | 554,456 | 521,463 | 543,265 | -6.0 | 4.2 |
| 45 | වෘත්තියමය සේවාවන් | 297,462 | 287,781 | 301,890 | 248,467 | 254,360 | 263,382 | 2.4 | 3.5 |
| 46 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 605,938 | 616,176 | 621,834 | 629,031 | 618,542 | 600,314 | -1.7 | -2.9 |
| 47 | අධ්‍යාපනය | 283,605 | 284,751 | 290,475 | 302,435 | 307,712 | 314,755 | 1.7 | 2.3 |
| 48 | සෞඛ්‍ය, නොවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 235,136 | 246,735 | 260,482 | 237,677 | 236,087 | 234,358 | -0.7 | -0.7 |
| 49 | වෙනත් පෞද්ගලික සේවාවන් | 1,052,980 | 983,900 | 992,662 | 995,147 | 998,069 | 1,012,933 | 0.3 | 1.5 |
| | සමස්ත එකතුකළ අගය (GVA)වල මූලික මිළ ගණන් අනුව | **12,190,346** | **11,832,118** | **12,299,149** | **11,437,626** | **11,135,286** | **11,651,170** | **-2.6** | **4.6** |
| | (+) භාණ්ඩ හා සේවා මත අයකරන බදු (-) සහනාධාර | **1,015,930** | **763,432** | **826,356** | **723,576** | **742,270** | **821,299** | **2.6** | **10.6** |
| | දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළෙඳපොළ මිල | **13,206,276** | **12,595,550** | **13,125,505** | **12,160,886** | **11,877,556** | **12,472,469** | **-2.3** | **5.0** |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

## වගුව 2.3 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) - ස්ථාවර මිල (2015) (අ)

| | ආර්ථික ක්‍රියාකාරකම් | 2019 | 2020 | 2021(ආ) | 2021(ඇ) | 2023(ඇ) | 2024(ඇ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | | **0.5** | **-0.9** | **1.0** | **-4.1** | **1.6** | **1.2** |
| 1 | ධාන්‍ය (වී හැර) | -9.0 | 59.8 | 2.8 | -24.8 | 2.5 | 10.9 |
| 2 | වී වගාව | 6.2 | 7.7 | -11.8 | -11.8 | 17.1 | 3.1 |
| 3 | එළවළු වගාව | -2.9 | 8.9 | -1.7 | -5.5 | 2.9 | 2.8 |
| 4 | උක් වගාව දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික නොවන භෝග | 5.1 | 22.8 | -7.3 | 2.0 | -7.6 | -9.3 |
| 5 | පළතුරු වගාව | 8.9 | 6.0 | -10.8 | 0.5 | 6.5 | 4.4 |
| 6 | ගෙල් සහිත පළතුරු භෝග වගාව (පොල් තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 14.6 | -10.3 | 11.2 | 8.5 | -5.8 | -11.5 |
| 7 | තේ වගාව | -3.3 | -6.5 | 9.8 | -15.7 | -1.5 | 1.7 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි කොකෝවා ආදී) | -25.5 | 23.9 | -16.2 | -9.1 | -7.5 | -2.3 |
| 9 | කුළුබඩු , සුවඳ දෙන භෝග බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වර්ග | -0.7 | 3.2 | 4.3 | 4.0 | -1.9 | 1.9 |
| 10 | රබර් වගාව | -7.8 | 0.2 | 9.9 | -9.8 | -7.7 | 2.2 |
| 11 | වෙනත් බහු වාර්ෂික භෝග වගාව | 5.8 | 3.6 | -9.5 | 2.1 | 6.9 | -11.9 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | -4.5 | -3.7 | 8.2 | -11.4 | 0.3 | 14.1 |
| 13 | පැල බෝ කිරීම | -2.9 | -19.5 | 30.8 | 18.7 | -24.6 | -14.0 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | -0.8 | 13.6 | 11.2 | 13.9 | -0.5 | -3.1 |
| 15 | වන වගාව දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | -3.3 | -1.3 | 4.1 | 14.8 | -7.3 | -2.1 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | -5.4 | -21.4 | 1.4 | -15.4 | 4.9 | 4.8 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව | 3.0 | 12.7 | 2.4 | 11.9 | -3.4 | -9.2 |
| **කර්මාන්ත** | | **-4.1** | **-5.3** | **5.7** | **-16.0** | **-9.2** | **11.0** |
| 18 | පතල් මා කැණීම් කර්මාන්තය | -1.2 | -10.9 | 1.4 | -31.0 | -22.3 | 19.4 |
| 19 | ආහාර බීම සහ දුම් කොළ නිෂ්පාදනය | 3.6 | 5.5 | 3.4 | -14.3 | 3.5 | 6.1 |
| 20 | රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය | 1.2 | -11.2 | 13.8 | 8.0 | -12.0 | 11.0 |
| 21 | ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | -8.9 | -9.6 | 8.4 | -16.4 | -20.0 | 4.9 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | -6.3 | -4.0 | 9.5 | -8.3 | -9.2 | 3.1 |
| 23 | අඟුරු සහ බනිජතෙල් පරිපහදු කිරීමේ නිෂ්පාදන | 24.1 | -10.2 | -29.9 | -58.2 | 238.2 | -10.1 |
| 24 | රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 2.0 | 2.2 | 3.9 | -14.0 | 0.7 | 9.7 |
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | -3.4 | -17.5 | 20.0 | -30.7 | -16.8 | 8.6 |
| 26 | ලෝහමය නොවන වෙනත් බනිජ නිෂ්පාදන | 4.4 | -4.1 | 16.8 | -29.0 | -0.6 | 2.5 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | -4.5 | -3.1 | 4.3 | -27.6 | 2.6 | 17.7 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 2.3 | -1.4 | 12.1 | -19.0 | -15.1 | 6.3 |
| 29 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 8.4 | -14.5 | 1.3 | -26.4 | -7.8 | 10.1 |
| 30 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | -0.7 | -9.2 | 15.4 | -21.7 | -15.6 | 8.5 |
| 31 | විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 4.9 | -2.1 | 4.9 | -5.8 | -2.3 | 6.9 |
| 32 | ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | -7.3 | 8.2 | -17.7 | 7.3 | -17.6 | 2.7 |
| 33 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිවක්‍රීකරණය | 7.3 | -1.0 | -3.3 | 0.3 | -0.4 | 1.3 |
| 34. | ඉදිකිරීම් කර්මාන්තය | -14.8 | -9.4 | 4.4 | -20.9 | -20.8 | 19.4 |
| **සේවාවන්** | | **2.9** | **-1.9** | **3.4** | **-2.6** | **-0.2** | **2.4** |
| 35. | තොග හා සිල්ලර වෙළෙඳාම | 3.6 | 0.9 | 1.5 | 0.0 | 0.1 | 1.3 |
| 36. | මහීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 2.0 | -6.1 | 0.9 | 3.0 | 4.3 | 2.9 |
| 37. | තැපැල් හා කුරියර් සේවාවන් | 3.7 | 3.0 | 7.2 | 4.7 | 2.9 | 6.3 |
| 38. | නවාකැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | -6.0 | 40.8 | 1.7 | 27.0 | 26.0 | 31.4 |
| 39. | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 4.7 | 2.5 | -3.8 | -11.4 | -2.1 | 3.3 |
| 40. | විදුලි සංදේශ සේවාවන් | 17.6 | 15.0 | 11.0 | 6.5 | -2.2 | 4.2 |

**වගුව 2.3 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) - ස්ථාවර මිල (2015) (අ) සම්බන්ධිතයි...**

| | ආර්ථික ක්‍රියාකාරකම් | 2019 | 2020 | 2021(අ) | 2021(අ) | 2023(අ) | 2024(ආ) |
|---|---|---|---|---|---|---|---|
| 41 | පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 10.8 | 11.0 | 25.2 | -2.3 | -21.4 | 6.0 |
| 42 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | -0.2 | 9.2 | 7.0 | -11.1 | -10.3 | 1.5 |
| 43 | රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 7.8 | -2.5 | 26.4 | -47.4 | 32.4 | -14.0 |
| 44 | නිවාස අයිතිය හා දේපල වෙළෙඳාම | 5.1 | -1.0 | 4.4 | -12.1 | -6.0 | 4.2 |
| 45 | වෘත්තියමය සේවාවන් | 5.4 | -3.3 | 4.9 | -17.7 | 2.4 | 3.5 |
| 46 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 0.8 | 1.7 | 0.9 | 1.2 | -1.7 | -2.9 |
| 47 | අධ්‍යාපනය | 6.0 | 0.4 | 2.0 | 4.1 | 1.7 | 2.3 |
| 48 | සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 3.0 | 4.9 | 5.6 | -8.8 | -0.7 | -0.7 |
| 49 | වෙනත් පෞද්ගලික සේවාවන් | 2.0 | -6.6 | 0.9 | 0.3 | 0.3 | 1.5 |
| | **සමස්ත එකතුකළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **0.4** | **-2.9** | **3.9** | **-7.0** | **-2.6** | **4.6** |
| | **(+) භාණ්ඩ හා සේවා මත අයකරන බදු (-) සහනාධාර** | **-6.8** | **-24.9** | **8.2** | **-12.4** | **2.6** | **10.6** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළෙඳපොළ මිල** | **-0.2** | **-4.6** | **4.2** | **-7.3** | **-2.3** | **5.0** |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

ලබා දෙන වී ප්‍රභේද වගා කිරීම සහ නවීන ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීමයි.

මෙලෙස වී නිෂ්පාදනය ඉහළ ගිය නමුත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී සහල් මිල ඉහළ ගිය අතර, ඇතැම් සහල් වර්ගවල සැපයුම සීමිත වීම, සහ මෝල් හිමියන් සහ සිල්ලර වෙළෙන්දන් විසින් ඔවුනට ඇවැසි ලෙස වෙළෙඳපොළ හැසිරවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. ඒ අනුව, පිටකොටුව වෙළෙඳපොළේ සම්බා සහල් කිලෝවක සාමාන්‍ය සිල්ලර මිල, 2023 වසරේ දී වාර්තා වූ රු. 247.69 ක සිට 2024 වසරේ දී රු. 256.00 ක් දක්වා සියයට 3.4 කින් ඉහළ යන ලදී. 2023 වසරේ දී රු. 220.00 ක් වූ නාඩු සහල් කිලෝවක සාමාන්‍ය සිල්ලර මිල 2024 වසරේ දී රු. 256.00 ක් දක්වා සියයට 16.4 කින් ඉහළ යන ලදී. එමෙන්ම, රතු කැකුළු සහල් කිලෝවක සාමාන්‍ය සිල්ලර මිල ද 2023 වසරේ දී වාර්තා වූ රු. 206.32 ක සිට 2024 වසරේ දී රු. 248.47 ක් දක්වා සියයට 20.4 කින් ඉහළ යන ලදී. මෙම හේතුව නිසා 2024 වසරේ දී රජයට සහල් ආනයනය කිරීමට සිදු විය. ඒ අනුව, 2023 වසරේ දී මෙට්‍රික් ටොන් 29,605 ක් වූ මුළු සහල් ආනයනය 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 131,338 ක් දක්වා සියයට 343.6 කින් තියුණු ලෙස ඉහළ යන ලදී.

2024 වසරේ දී රජය පොහොර සහනාධාර සැපයීම සඳහා රු. බිලියන 36 ක වියදමක් දරන ලදී. රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන 2024 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, වී අලෙවි මණ්ඩලය හරහා වී මෙට්‍රික් ටොන් 66,146 ක් මිලදී ගැනීම සඳහා රජයට ආසන්න වශයෙන් රු. මිලියන 7,100 ක් වැය විය.

## තේ

අගය එකතු කළ වටිනාකම අනුව, තේ උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 1.5 ක හැකිලීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 1.7 කින් සුළු වශයෙන් ප්‍රසාරණය විය. මධ්‍යම හා පහත් වගා ප්‍රදේශවල අස්වැන්න ඉහළ යාම හේතුවෙන්, තේ නිෂ්පාදනය, 2023 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 256 ට සාපේක්ෂව 2024 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 262 ක් දක්වා සියයට 2.3 කින් ඉහළ යන ලදී. කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 2023 වසරේ දී වාර්තා වූ රු. 1,188.33 ක සිට 2024 වසරේ දී රු. 1,245.10 ක් දක්වා සියයට 4.7 කින් ඉහළ යන ලදී. තේ අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය, 2023 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට රු. 1,770.44 ක සිට 2024 වසරේ දී කිලෝග්‍රෑමයකට රු. 1,763.61 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් අඩු වූ අතර, ඇ.ඩො. වටිනාකම අනුව අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය (නැ.වි.ස.) 2023 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට ඇ. ඩො. 5.41 ක සිට කිලෝග්‍රෑමයකට ඇ.ඩො. 5.86 ක් දක්වා සියයට 8.3 කින් වැඩි විය.

## රබර්

අගය එකතු කළ වටිනාකම අනුව, රබර් උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 7.7 ක හැකිලීමෙන් පසුව, 2024 වසරේ දී සියයට 2.2 කින් ප්‍රසාරණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, විශේෂයෙන්ම සෞඛ්‍ය සේවා සහ මෝටර් රථ වැනි අංශවල රබර් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යාමයි. 2023 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 64.4 ක් වූ සමස්ත රබර් නිෂ්පාදනය 2024 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 69.1 ක් දක්වා සියයට 7.3 කින් ඉහළ යන ලදී. කොළඹ රබර් වෙන්දේසියේ RSS1 රබර් මිල 2023 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට රු. 559.41 ක සිට 2024 වසරේ දී කිලෝග්‍රෑමයකට රු. 714.03 ක් දක්වා සියයට 27.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. මෙලෙස ධනාත්මක ප්‍රවණතා තිබියදීත්, 2024 වසරේ දී රබර් සහ රබර් නිෂ්පාදන අපනයනවල මුළු වටිනාකම සියයට 15.7 කින් අඩු වූ අතර, මුළු අපනයන පරිමාව සියයට 31.8 කින් පහත වැටුණි. කෙසේ නමුත්, රබර්වල අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය, 2023 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට රු. 732.93 ක සිට 2024 වසරේ දී කිලෝග්‍රෑමයකට රු. 907.28 ක් දක්වා සියයට 23.7 කින් වැඩි විය. ඇමරිකානු

ඩොලර් වටිනාකම අනුව රබර්වල අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය ද 2023 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට ඇ.ඩො. 2.21 ක සිට 2024 වසරේ දී කිලෝග්‍රෑමයකට ඇ.ඩො. 3.01 ක් දක්වා සියයට 35.9 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසර තුළ දී ගෝලීය වෙළෙඳපොළ තුළ ස්වභාවික රබර් සඳහා ඉල්ලුම ඉහළ යාම සහ සැපයුම අඩුවීමයි.

## පොල්

2023 වසරේ දී ගෙඩි මිලියන 3,169 ක් වූ පොල් නිෂ්පාදනය 2024 වසරේ දී ගෙඩි මිලියන 2,792 ක් දක්වා සියයට 11.8 කින් පහත වැටුණි. මෙලෙස පොල් නිෂ්පාදනය පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොහොර මිල ඉහළ යාම, පළිබෝධ ආක්‍රමණ, පොල් ඉඩම් කැබලි කිරීම සහ දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් ය. මීට අමතරව, පොල් ගස් බොහෝමයක් ඒවායේ ආර්ථික වශයෙන් ඵලදායී ආයු කාලය ඉක්මවා ඇති අතර, එය පොල් නිෂ්පාදනය තවදුරටත් අඩුවීමට දායක විය. 2024 වසරේ දී ඇතැම් පොල් ආශ්‍රිත කර්මාන්තවල කාර්යසාධනය ධනාත්මක වූ අතර ඇතැමෙක කාර්යසාධනය සෘණාත්මක විය. දිසිඳි පොල් නිෂ්පාදනය, 2023 වසරේ දී වාර්තා වූ ගෙඩි මිලියන 285 සිට 2024 වසරේ දී ගෙඩි මිලියන 297 ක් දක්වා සියයට 4.1 කින් සුළු වශයෙන් වැඩි විය. එසේ නමුත්, 2023 වසරේ දී ගෙඩි මිලියන 209 ක් වූ පොල්තෙල් නිෂ්පාදනය, 2024 වසරේ දී ගෙඩි මිලියන 54 ක් දක්වා සියයට 74.1 කින් තියුනු ලෙස පහත වැටුණි. මෙලෙස පොල් නිෂ්පාදනයේ සමස්ත වශයෙන් පහත වැටීමක් වාර්තා වුවද, පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි සහ පොල් කිරි නිෂ්පාදනය, 2024 වසරේ දී සියයට 30.4 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී.

2024 වසරේ දී අපනයන කරන ලද දිසිඳි පොල් ප්‍රමාණය සියයට 14.6 කින් ඉහළ ගිය අතර, අපනයන කරන ලද කොප්පරා ප්‍රමාණය සියයට 64.9 කින් තියුනු ලෙස පහත වැටුණි. දේශීය නිෂ්පාදනයේ සැලකිය යුතු පහත වැටීමක් තිබියදී ද, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී අපනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය සියයට 16.5 කින් ඉහළ යාම කැපී පෙනේ. 2023 වසරේ දී පොල් ගෙඩියකට රු. 75.68 ක් වූ පොල් ගෙඩියක සාමාන්‍ය නැ.වි.ස. මිල 2024 වසරේ දී ගෙඩියකට රු. 80.13 ක් දක්වා සියයට 5.8 කින් ඉහළ යන ලදී.

## සුළු අපනයන භෝග

සුළු අපනයන භෝගවල මුළු අපනයන ප්‍රමාණය, 2023 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 173,680 ක සිට 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 179,181 ක් දක්වා සියයට 3.1 කින් සුළු වශයෙන් වැඩි විය. ගම්මිරිස්, එළවළු, කොකෝවා, සුගන්ධ තෙල් සහ කජු වැනි නිෂ්පාදනවල අපනයන ප්‍රමාණය ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඇමරිකානු ඩොලර් වටිනාකම අනුව ගත් කල, 2024 වසරේ දී සුළු අපනයන භෝගවලින් ලැබුණු මුළු අපනයන ආදායම සියයට 5.3 කින් වැඩි විය. කෙසේ නමුත්, රුපියල් වටිනාකම අනුව ගත් කල, අපනයන ආදායම සියයට 2.8 කින් පහත වැටුණු අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීමයි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව පහත වැටෙමින් පවතින අතර, සුළු අපනයන භෝග සඳහා වන ගෝලීය ඉල්ලුම අඛණ්ඩව ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. සුළු අපනයන භෝගවලින් ලැබෙන අපනයන ආදායම තවදුරටත් ඉහළ නැංවීම සඳහා ඇති ඉහළ හැකියාව මෙමඟින් පෙන්නුම් කෙරේ. ශ්‍රී ලංකාවේ කුළුබඩු සහ සුගන්ධ තෙල්වල ඉහළ ගුණාත්මකභාවය, අද්විතීය රසය, වර්ණ සහ සුවඳ, මෙලෙස ජාත්‍යන්තර ඉල්ලුම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වේ. එමෙන්ම, ශ්‍රී ලංකාවේ නැවුම් සහ සැකසූ එළවළු සඳහා ඇති ගෝලීය ඉල්ලුම ද ඉහළ යමින් පවතී.

## අනෙකුත් භෝග

අගය එකතු කළ වටිනාකම අනුව, ධාන්‍ය වර්ග (වී හැර) උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 2.5 ක සුළු වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 10.9 කින් වර්ධනය විය. 2024 වසරේ දී එළවළු උප අංශය සියයට 2.8 ක සුළු වර්ධනයක් වාර්තා කළ අතර පලතුරු උප අංශය ද සියයට 4.4 කින් වර්ධනය විය. 2023 වසරේ දී මෙට්‍රික් ටොන් 15,409 ක් වූ, අපනයනය කරන ලද එළවළු ප්‍රමාණය, 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 17,294 ක් දක්වා සියයට 12.2 කින් ඉහළ යන ලදී. එසේ වුවද, අපනයනය කරන ලද මුළු පලතුරු ප්‍රමාණය පෙර වසරේ වාර්තා වූ මෙට්‍රික් ටොන් 42,343 ට සාපේක්ෂව 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 42,327 ක් ලෙස බොහෝදුරට නොවෙනස්ව පැවතිණි.

**වගුව 2.4 | සුළු අපනයන කෘෂිකාර්මික බෝග: නිෂ්පාදනය සහ අපනයනය (මෙ.ටො.)**

| බෝගය | නිෂ්පාදනය | | | | | | අපනයනය* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023(අ) | 2024(ආ) | 2019 | 2020 | 2021 | 2022 | 2023(අ) | 2024(ආ) |
| කුරුඳු | 20,352 | 20,866 | 22,872 | 24,094 | 24,475 | 23,180 | 17,480 | 19,090 | 19,195 | 18,298 | 19,882 | 19,809 |
| ගම්මිරිස් | 22,156 | 23,970 | 25,047 | 24,029 | 24,618 | 39,617 | 8,335 | 9,542 | 18,575 | 11,416 | 14,668 | 26,388 |
| කොකෝවා | 548 | 612 | 658 | 709 | 716 | 814 | 520 | 255 | 159 | 67 | 84 | 99 |
| කරදමුංගු | 69 | 86 | 104 | 140 | 141 | 80 | 13 | 1 | 3 | 3 | 8 | 9 |
| කරාබු නැට් | 4,786 | 3,512 | 3,837 | 4,088 | 4,179 | 2,390 | 5,126 | 2,597 | 6,487 | 2,325 | 5,852 | 1,070 |
| සාදික්කා/ වසාවාසි | 5,119 | 2,751 | 2,818 | 2,878 | 2,902 | 2,947 | 3,417 | 2,451 | 2,651 | 2,284 | 2,970 | 2,971 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රේගුව
(අ) සංශෝධිත
(ආ) තාවකාලික
*ප්‍රති අපනයන සමඟ

2023 වසරේ දී මෙට්‍රික් ටොන් 426,497 ක් වූ ක්ෂේත්‍ර බෝග (වී හැර) නිෂ්පාදනය 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 426,882 ක් ලෙස බොහෝදුරට නොවෙනස්ව පැවතුනි. බඩ ඉරිඟු නිෂ්පාදනය, 2023 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 221,248 ක සිට 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 223,496 ක් දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් වැඩි විය. 2023 වසරේ දී මෙට්‍රික් ටොන් 40,748 ක් වූ අර්තාපල් නිෂ්පාදනය 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 42,206 ක් දක්වා සියයට 3.5 කින් වර්ධනය විය. විශේෂයෙන්ම, ලොකු ළූණු නිෂ්පාදනය 2023 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 5,084 ක සිට 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 8,828 ක් දක්වා සියයට 73.6 කින් කැපීපෙනෙන ලෙස ඉහළ යන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශවල ලොකු ළූණු වගාව දිරිමත් කිරීම සඳහා රජය ක්‍රියාත්මක කළ වැඩපිළිවෙලයි.

## පශු සම්පත්

අගය එකතු කළ වටිනාකම අනුව, සත්ත්ව නිෂ්පාදන උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 0.3 ක සුළු වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 14.1 කින් වර්ධනය විය. සත්ත්ව නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම, මෙම වර්ධනය සඳහා හේතු විය. 2023 වසරේ දී ලීටර් මිලියන 504 ක් වූ මුළු කිරි නිෂ්පාදනය 2024 වසරේ දී ලීටර් මිලියන 522 ක් දක්වා සියයට 3.4 කින් ඉහළ යන ලදී. බිත්තර නිෂ්පාදනය, 2023 වසරේ දී වාර්තා වූ බිත්තර මිලියන 1,604 ක සිට 2024 වසරේ දී බිත්තර මිලියන 1,693 ක් දක්වා සියයට 5.3 කින් වැඩි විය. ඉහළ නිෂ්පාදන පිරිවැය වැනි පෙර පැවති අභියෝගවලට විසඳුම් ලැබීම මෙන්ම කුකුළු නිෂ්පාදනය ශක්තිමත් කිරීම සඳහා රජය විවිධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මෙම වර්ධනය සඳහා හේතු විය. මේ අතර, 2023 වසරේ දී මෙට්‍රික් ටොන් 236,110 ක් වූ කුකුළු මස් නිෂ්පාදනය 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 258,540 ක් දක්වා සියයට 9.4 කින් ඉහළ යන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රජය ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා ප්‍රධාන යෙදවුමක් වන දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය යථා තත්ත්වයට පත්වීමයි.


## කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය

2023 වසරේ දී මෙට්‍රික් ටොන් 407,070 ක් වූ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 410,760 ක් දක්වා සියයට 0.9 කින් සුළු වශයෙන් වැඩි විය. වෙරළබඩ ප්‍රදේශවල ධීවර කර්මාන්තයේ සිදුවූ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. අගය එකතු කළ වටිනාකම අනුව, කරදිය ධීවර කර්මාන්තය හා කරදිය ජලජීවී වගාව උප අංශය, 2023 වසරේ දී වාර්තා වූ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 4.8 කින් වර්ධනය විය. කෙසේ නමුත්, මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 3.4 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 9.2 කින් සංකෝචනය විය. 2023 වසරේ දී සියයට 38.4 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ, ක්‍රස්ටේෂියාවන් සහ මොලුස්කාවන් ඇතුළු මත්ස්‍ය නිපැයුම් අපනයනවල වටිනාකම, 2024 වසරේ දී සියයට 88.9 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. මෙලෙස ධනාත්මක කාර්යසාධනයක් අත්පත් කරගෙන ඇති නමුත්, අධික ලෙස මසුන් ඇල්ලීම, තිරසාර නොවන මසුන් ඇල්ලීම, පරිසර දූෂණය සහ දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් වැනි තීරණාත්මක අභියෝග රැසකට මෙරට ධීවර කර්මාන්තය මුහුණ පා ඇත. මෙම අංශයේ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා, ඵලදායී හා ඉලක්කගත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් මෙම ගැටළු විසඳීම අත්‍යවශ්‍ය වේ.

## කර්මාන්ත අංශය

අගය එකතු කළ වටිනාකම අනුව, 2023 වසරේ දී සියයට 9.2 ක සංකෝචනයක් වාර්තා කළ කර්මාන්ත අංශය 2024 වසරේ දී සියයට 11.0 කින් ප්‍රසාරණය විය. ඉදිකිරීම් අංශයේ ඉහළ කාර්යසාධනය, සහ පතල් හා කැණීම් කටයුතු ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව නිෂ්පාදන උප අංශ කිහිපයක්ම මෙම වර්ධනය සඳහා ධනාත්මක ලෙස දායක විය. රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම්භාණ්ඩ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු; ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය; දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන; රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය; රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය; සහ මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදනය යන උප අංශ මීට ඇතුළත් වේ. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනය හැරුණු විට, අනෙකුත් සියලුම නිෂ්පාදන උප අංශ ද 2024 වසරේ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී.

**රූපසටහන 2.4 | කර්මාන්ත අංශයේ සංයුතිය - 2024**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## පතල් හා කැණීම්

අගය එකතු කළ වටිනාකම අනුව, පතල් හා කැණීම් ක්‍රියාකාරකම්, 2023 වසරේ දී වාර්තා වූ සියයට 22.3 ක සැලකිය යුතු සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 19.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඉදිකිරීම් අංශයේ පුනර්ජීවනය හේතුවෙන් අමුද්‍රව්‍ය සහ ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. දේශීය පතල් සහ කැණීම් කටයුතු මෙලෙස ප්‍රසාරණය වුවද, ඛනිජ අපනයනවල වටිනාකම 2023 වසරේ දී වූ සියයට 22.9 ක අඩු වීමට සාපේක්ෂව, 2024 වසරේ දී සියයට 41.5 කින් සැලකිය යුතු ලෙස අඩු විය. ස්වාභාවික මිනිරන්,

ස්වාභාවික වැලි, ක්වාර්ට්ස් සහ අනෙකුත් ඛනිජ නිෂ්පාදන වැනි ප්‍රධාන ඛනිජ අපනයනවලින් ලද ආදායම පෙර වසරට සාපේක්ෂව පහත වැටීමක් වාර්තා කරන ලදී.

## නිෂ්පාදන කර්මාන්ත

අගය එකතු කළ වටිනාකම අනුව, සමස්ත නිෂ්පාදන ක්‍රියාකාරකම් 2023 වසරේ දී වාර්තා වූ සියයට 3.2 ක හැකිලීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 7.6 කින් ප්‍රසාරණය විය. නිෂ්පාදන අංශයට විශාලතම දායකත්වය සපයන ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කටයුතු, 2023 වසරේ දී වාර්තා වූ සියයට 3.5 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 6.1 කින් වර්ධනය විය.

නිෂ්පාදන අංශයට දෙවන විශාලතම දායකත්වය සපයන රෙදිපිළි, නිම් ඇඳුම් සහ සම්භාණ්ඩ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු, 2023 වසරේ දී වාර්තා වූ සියයට 12.0 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 11.0 කින් ප්‍රසාරණය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන ඉල්ලුම වැඩිවීම සහ ප්‍රමාද වූ ඇණවුම් මේ වසරේ දී සාර්ථකව ඉටුකිරීමයි.

2024 වසරේ දී දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන සියයට 4.9 කින් ප්‍රසාරණය වූ අතර, කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි ප්‍රතිනිෂ්පාදනය සියයට 3.1 කින් වර්ධනය විය. රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සියයට 8.6 ක වර්ධනයක් වාර්තා කළ අතර ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදනය සියයට 2.5 ක සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය සියයට 6.3 කින් වර්ධනය වූ අතර ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සියයට 10.1 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව සහ සවි කිරීම ඇතුළත් උප අංශය, 2024 වසරේ දී සියයට 8.5 කින් වර්ධනය විය. කර්මාන්ත අංශයේ සමස්ත ශක්තිමත් ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයුම් උප අංශය ද 2024 වසරේ දී සියයට 6.9 කින් ප්‍රසාරණය විය.

## ඉදිකිරීම්

අගය එකතු කළ වටිනාකම අනුව, ඉදිකිරීම් අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 20.8 ක සැළකිය යුතු හැකිලීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 19.4 ක සැළකිය යුතු ප්‍රසාරණයක් වාර්තා කරන ලදී. නේවාසික සහ වාණිජ යන අංශ දෙකෙහිම ඇතිවූ ඉහළ ඉල්ලුම මෙන්ම කලින් අත්හිටුවන ලද ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම, මෙම ශක්තිමත් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන්ම විදේශ අරමුදල් මගින් මූල්‍යකරණය කරන ලද මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, මෙම වර්ධනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලබා දෙන ලදී. මීට අමතරව, හෝටල් සහ නිවාඩු නිකේතන ව්‍යාපෘති ඇතුළු සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ඉදිකිරීම් සඳහා විදේශ ආයෝජන ඉහළ යාම ද, ඉදිකිරීම් අංශයේ වර්ධනයට දායකත්වයක් දැක්වීය.

## සේවා අංශය

අගය එකතු කළ වටිනාකම අනුව, සේවා අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 0.2 ක ආන්තික හැකිලීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 2.4 කින් ප්‍රසාරණය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්; තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්; වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්; විදුලි සංදේශ සේවාවන්; මූල්‍ය සේවා ක්‍රියාකාරකම් සහ අතිරේක මූල්‍ය සේවා; නිවාස අයිතිය හා දේපළ වෙළෙඳාම; තොග හා සිල්ලර වෙළෙඳාම; භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය; තැපැල් සහ කුරියර් සේවාවන්; ව්‍යාත්තිමය

**වගුව 2.5 | තෝරා ගත් කාර්මික අපනයන**

ඇ.ඩො.මිලියන

| අයිතමය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|
| ආහාර පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදන | 393 | 462 | 447 | 464 | 587 | 520 | 539 | 652 |
| සත්ව ආහාර | 80 | 108 | 129 | 103 | 149 | 171 | 146 | 133 |
| රෙදිපිළි සහ ඇඟළුම් | 5,032 | 5,318 | 5,596 | 4,423 | 5,435 | 5,952 | 4,879 | 5,061 |
| රබර් නිෂ්පාදන | 835 | 875 | 866 | 786 | 1050 | 977 | 902 | 976 |
| මැණික්, දියමන්ති, ආභරණ | 258 | 278 | 306 | 181 | 277 | 451 | 500 | 382 |
| යන්ත්‍ර සහ යාන්ත්‍රික උපකරණ | 371 | 435 | 400 | 338 | 501 | 581 | 598 | 486 |
| ප්‍රවාහන උපකරණ | 162 | 120 | 146 | 71 | 148 | 129 | 149 | 107 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 434 | 622 | 521 | 374 | 506 | 568 | 539 | 1,064 |
| රසායනික නිෂ්පාදන | 146 | 167 | 176 | 173 | 223 | 224 | 194 | 234 |
| දැව සහ කඩදාසි නිෂ්පාදන | 139 | 141 | 129 | 99 | 130 | 137 | 114 | 124 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් | 158 | 148 | 103 | 54 | 58 | 86 | 71 | 62 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත අයිතම | 75 | 78 | 73 | 176 | 79 | 61 | 56 | 54 |
| මූල ලෝහ සහ මූල ලෝහ නිෂ්පාදිත | 116 | 165 | 177 | 111 | 156 | 177 | 178 | 187 |
| පිහන් මැටි නිෂ්පාදිත | 34 | 31 | 30 | 24 | 37 | 38 | 34 | 32 |
| අනෙකුත් කාර්මික අපනයන | 309 | 311 | 326 | 295 | 361 | 395 | 378 | 395 |
| **එකතුව** | **8,542** | **9,258** | **9,426** | **7,672** | **9,702** | **10,465** | **9,278** | **9,947** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

සේවාවන්; අධ්‍යාපනය; සහ වෙනත් පෞද්ගලික සේවාවන් යන උප අංශවල වූ ධනාත්මක වර්ධනයයි. කෙසේ නමුත්, 2024 වසරේ දී සේවා අංශයේ උප අංශ කිහිපයක්ම සෘණාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල්; රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව; සහ මානව සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් මීට ඇතුළත් වේ.

## තොග සහ සිල්ලර වෙළෙඳාම

අගය එකතු කළ වටිනාකම් අනුව, තොග සහ සිල්ලර වෙළෙඳ කටයුතු 2023 වසරේ දී වාර්තා වූ සියයට 0.1 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 1.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. හජ් උත්සව සමය තුළ ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළ යාම, සංචාරකයින්ගේ පැමිණීම් ඉහළ යාම, සහ සාර්ව ආර්ථික තත්ත්වයන් වඩා ස්ථාවර වීම මේ සඳහා හේතු විය.

**වගුව 2.6 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්**

| දර්ශකය | 2020 | 2021 | 2022 | 2023(අ) | 2024(ආ) |
|---|---|---|---|---|---|
| **වරාය සේවා (ඇ)** | | | | | |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,337 | 4,180 | 4,073 | 4,809 | 4,562 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. 000) | 102,908 | 109,369 | 100,376 | 103,794 | 120,239 |
| මෙහෙයවන ලද මුළු බහාළුම් (TEU 000) | 6,855 | 7,249 | 6,862 | 6,950 | 7,792 |
| ප්‍රති නැවගත කිරීම ** (TEU 000) | 5,765 | 6,050 | 5,832 | 5,960 | 6,623 |
| **විදුලි සංදේශ අංශය** | | | | | |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව ‘000) | 2,613 | 2,852 | 2,651 | 2,308 | 2,122 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව ‘000) | 28,739 | 29,959 | 28,838 | 28,986 | 28,820 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව ‘000) | 1,367 | 1,587 | 1,388 | 1,163 | 1,046 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව ‘000) | 17,524 | 22,106 | 21,668 | 22,864 | 23,149 |
| **සෞඛ්‍ය අංශය** | | | | | |
| පෞද්ගලික රෝහල් | 217 | 243 | 250 | n.a | n.a |
| රජයේ රෝහල් | 609 | 618 | 651 | 649 | n.a |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 77,121 | 78,228 | 89,903 | 90,392 | n.a |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 18,218 | 20,209 | 23,416 | 23,999 | 24,069 |
| හෙදියන් සංඛ්‍යාව | 37,133 | 39,091 | 50,516 | 53,283 | 50,304 |
| **මූල්‍ය අංශය** | | | | | |
| බැංකු ශාඛා* හා අනෙකුත් සේවා මධ්‍යස්ථානය | 7,406 | 7,369 | 7,382 | 7,521 | 7,613 |
| ණය කාඩ්පත් (ක්‍රියාකාරී) | 1,984,525 | 2,054,985 | 2,054,896 | 1,987,857 | 1,990,271 |
| ලියාපදිංචි මූල්‍ය සමාගම් (ඇ) | 40 | 39 | 36 | 33 | 32 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 3 | 3 | 1 | 1 | 1 |
| **සංචාරක අංශය** | | | | | |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 507,704 | 194,495 | 719,978 | 1,487,303 | 2,053,465 |
| සංචාරක ඉපැයීම් (ඇ.ඩො. මිලියන) | 682 | 507 | 1,136 | 2,068 | 3,169 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 5.0 | 18.6 | 30.4 | n.a | n.a |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම්)** | | | | | |
| බස් රථ | 578 | 281 | 404 | 685 | 146 |
| මෝටර් කාර් | 21,021 | 3,495 | 1,489 | 1,816 | 1,644 |
| ද්විත්ව කාර්ය වාහන *** | 9,532 | 771 | 760 | 586 | 1,027 |
| භාණ්ඩ ප්‍රවහනය රථ (ඇ) | 3,941 | 4,432 | 1,833 | 288 | 715 |
| යතුරුපැදි | 151,634 | 8,011 | 9,060 | 20,200 | 65,289 |
| ත්‍රිරෝද රථ | 7,150 | 2,093 | 36 | 60 | 94 |
| ඉඩම් වාහන - ට්‍රැක්ටර් | 6,025 | 8,272 | 4,369 | 1,770 | 1,882 |
| ඉඩම් වාහන - ට්‍රේලර් | 2,277 | 4,344 | 2,560 | 1,236 | 1,887 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට වරාය පමණි.
(ඇ) ETI මූල්‍ය සමාගම ඇතුළත්ව (කොළඹ වාණිජ මහාධිකරණය නියෝග කළේ, 2023 දෙසැම්බර් 15 වන දින අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ETI මූල්‍ය සමාගම ඇවර කරන ලෙසයි)

* විදේශ බැංකු ඇතුළුව

**නැවත ඇසිරීම ඇතුලත්ව

*** තනි කැබ් රථ ඇතුළුව

## මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවා

අගය එකතු කළ වටිනාකම් අනුව, ප්‍රවාහන උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 2.9 කින් ප්‍රසාරණය වූ අතර, වරාය මෙහෙයුම් ක්‍රියාකාරකම් ඉහළ යාම සහ නැව් මඟින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇති ගෝලීය ඉල්ලුම ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, වත්මන් පොදු ප්‍රවාහන පද්ධතියේ ඇති අකාර්යක්ෂමතා හේතුවෙන් මගීන් වැඩි වැඩියෙන් පෞද්ගලික ප්‍රවාහනය තෝරා ගැනීම නිසා ශ්‍රී ලංකා දුම්රිය සේවය සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය පිළිවෙලින් සියයට 14.8 කින් සහ සියයට 7.8 කින් පහත වැටුණි. මීට අමතරව, සංචාරකයින්ගේ පැමිණීමේ ඉහළ යාමක් තිබියදී වුවද, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් පියාසර කරන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය සියයට 5.2 කින් අඩු විය. කෙසේ නමුත්, ගෝලීය වෙළෙඳාමේ හටගත් වර්ධනය පිළිබිඹු කරමින්, 2024 වසරේ දී බහාලුම් හැසිරවීමේ ක්‍රියාකාරකම් සියයට 15.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. තවද, ආනයන සීමාවන් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමෙන් පසු නව මෝටර් රථ ලියාපදිංචි කිරීම් සියයට 166.8 කින් ඉහළ යන ලදී.

## නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා

අගය එකතු කළ වටිනාකම් අනුව, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන්, 2023 වසරේ දී වාර්තා වූ සියයට 26.0 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 31.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම ශක්තිමත් වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස ඉහළ යාමයි.

## මූල්‍ය, රක්ෂණය සහ දේපළ වෙළෙඳාම් ක්‍රියාකාරකම්

අගය එකතු කළ වටිනාකම අනුව, මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය ඇතුළු දේපළ වෙළෙඳාම් ක්‍රියාකාරකම්, 2023 වසරේ දී වාර්තා වූ සියයට 5.3 ක හැකිලීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 1.3 කින් සුළු වශයෙන් ප්‍රසාරණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මූල්‍ය හා දේපළ වෙළෙඳාම් ක්‍රියාකාරකම්වල සිදුවූ වර්ධනයයි. 2023 වසරේ දී වාර්තා වූ සියයට 10.3 ක හැකිලීමකට සාපේක්ෂව, මූල්‍ය සේවා ක්‍රියාකාරකම් සහ අතිරේක මූල්‍ය සේවා 2024 වසරේ දී සියයට 1.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ වාහන ආනයන සීමාවන් ඉවත් කිරීම මඟින්, ලීසිං සහ කුලියට ගැනීම් වැනි මෙම උප අංශයේ ව්‍යාපාර සඳහා ඇතිවූ ධනාත්මක බලපෑමයි. 2023 වසරේ දී වාර්තා වූ සියයට 6.0 ක හැකිලීමට සාපේක්ෂව, නිවාස අයිතිය හා දේපළ වෙළෙඳාම් උප අංශය 2024 වසරේ දී සියයට 4.2 කින් ප්‍රසාරණය වූ අතර, නාගරීකරණය ඉහළ යාම, මධ්‍යම පන්තියේ වර්ධනය, සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ දේශීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් රජයේ මූලපිරීම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, 2023 වසරේ දී වාර්තා වූ සියයට 32.4 ක සැලකිය යුතු ප්‍රසාරණයට සාපේක්ෂව, රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් උප අංශය 2024 වසරේ දී සියයට 14.0 කින් සංකෝචනය විය.

## වෙනත් සේවා ක්‍රියාකාරකම්

අගය එකතු කළ වටිනාකම අනුව, විදුලි සංදේශ සේවා ක්‍රියාකාරකම් 2023 වසරේ දී වාර්තා වූ සියයට 2.2 ක හැකිලීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 4.2 කින් වර්ධනය විය. ඩිජිටල් විසඳුම් සඳහා වන ගෝලීය ඉල්ලුම ඉහළ යාම, තොරතුරු තාක්ෂණ අංශය සඳහා රජය සහාය දැක්වීම, සහ දුරස්ථ රැකියා අවස්ථා ඉහළ යාම හේතුවෙන්, 2023 වසරේ දී සියයට 21.4 ක සැලකිය යුතු පහත වැටීමක් වාර්තා කළ තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්, 2024 වසරේ දී සියයට 6.0 කින් වර්ධනය විය. 2023 වසරේ දී සියයට 2.4 ක වර්ධනයක් වාර්තා කළ වෘත්තීමය සේවා උප අංශය, 2024 වසරේ දී සියයට 3.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2023 වසරේ දී වාර්තා වූ සියයට 2.1 ක හැකිලීමට සාපේක්ෂව, වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන් උප අංශය 2024 වසරේ දී සියයට 3.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. මානව සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් උප අංශය 2023 වසරේ දී වාර්තා වූ සියයට 0.7 ක හැකිලීමෙන් පසුව 2024 වසරේ දී ද සියයට 0.7 කින් සුළු වශයෙන් සංකෝචනය විය. මේ අතර, අධ්‍යාපනය, වෙනත් පෞද්ගලික සේවාවන්, සහ තැපැල් සහ කුරියර් සේවාවන් ආර්ථික වර්ධනයට ධනාත්මක ලෙස දායක වූ අතර, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව උප අංශය 2024 වසරේ දී සමස්ත ආර්ථික වර්ධනයට ඍණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

## දේශීය ඉල්ලුම සහ පරිභෝජනය

පරිභෝජන සහ ආයෝජන වියදම් වලින් සමන්විත දේශීය ඉල්ලුම, 2023 වසරේ දී වාර්තා වූ රු. බිලියන 28,011.5 ක සිට 2024 වසරේ දී රු. බිලියන 30,683.4 ක් දක්වා සියයට 9.5 කින් වර්ධනය විය. මේ සඳහා පෞද්ගලික සහ රජයේ පරිභෝජන වියදම් ඉහළ යාම මෙන්ම ආයෝජන වියදම් ඉහළ යාම හේතු විය. පවත්නා වෙළෙඳපොළ මිල අනුව, 2023 වසරේ දී රු. බිලියන 21,270.3 ක් වූ මුළු පරිභෝජනය 2024 වසරේ දී රු. බිලියන 22,623.0 ක් දක්වා සියයට 6.4 කින් ඉහළ යන ලදී. මිල ගණන් පහළ යෑම නිසා පාරිභෝගික වියදම් ඉහළ යාම හේතුවෙන් පෞද්ගලික අංශයේ පරිභෝජන වියදම් ඉහළ යාම මේ සඳහා හේතු විය. ස්ථාවර වෙළෙඳපොළ මිල ගණන් අනුව, 2024 වසරේ දී පරිභෝජන වියදම් සියයට 3.2 කින් වර්ධනය විය. මුළු පරිභෝජනයෙන් සියයට 90.8 ක් වූ පෞද්ගලික පරිභෝජනය, පවත්නා වෙළෙඳපොළ මිල අනුව, 2023 වසරේ දී වාර්තා වූ සියයට 16.8 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 5.8 කින් වර්ධනය විය. රජයේ පරිභෝජනය, පවත්නා වෙළෙඳපොළ මිල අනුව, 2023 වසරේ දී වාර්තා වූ සියයට 6.8 ක වැඩිවීමට

**වගුව 2.7 | දේශීය ඉල්ලුම, සැපයුම [අ]**

| අයිතමය | පවත්නා වෙළෙඳපොළ මිල (රු. බිලියන) | | | වෙනස (%) | | | ද.දේ.නි. (%) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2022[ආ] | 2023[ආ] | 2024[ඇ] | 2022[ආ] | 2023[ආ] | 2024[ඇ] | 2022[ආ] | 2023[ආ] | 2024[ඇ] |
| **දේශීය ඉල්ලුම** | **24,921** | **28,012** | **30,683** | **24.1** | **12.4** | **9.5** | **103.6** | **102.2** | **102.6** |
| පරිභෝජනය | 18,358 | 21,270 | 22,623 | 47.5 | 15.9 | 6.4 | 76.3 | 77.6 | 75.7 |
| පුද්ගලික | 16,618 | 19,412 | 20,542 | 54.2 | 16.8 | 5.8 | 69.1 | 70.8 | 68.7 |
| රජයේ | 1,740 | 1,858 | 2,081 | 9.6 | 6.8 | 12.0 | 7.2 | 6.8 | 7.0 |
| ආයෝජන | 6,562 | 6,741 | 8,060 | 1.4 | 2.7 | 19.6 | 27.3 | 24.6 | 27.0 |
| **ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-857** | **-592** | **-785** | **34.1** | **31.0** | **-32.6** | **-3.5** | **-2.2** | **-2.6** |
| භාණ්ඩ හා සේවා අපනයනය | 5,188 | 5,673 | 5,946 | 74.1 | 9.3 | 4.8 | 21.6 | 20.7 | 19.9 |
| භාණ්ඩ හා සේවා ආනයනය | 6,045 | 6,265 | 6,731 | 41.2 | 3.6 | 7.4 | 25.1 | 22.8 | 22.5 |
| **දේශීය සැපයුම - ද.දේ.නි.** | **24,064** | **27,420** | **29,899** | **36.7** | **13.9** | **9.0** | **100.0** | **100.0** | **100.0** |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂය ඇස්තමේන්තු ද.දේ.නි. මූලික කර ගත් දත්ත වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

සාපේක්ෂව 2024 වසරේ දී සියයට 12.0 කින් ඉහළ ගිය අතර එය සමස්ත පරිභෝජනය ඉහළ යාමට තවදුරටත් දායක විය.

## ශුද්ධ විදේශීය ඉල්ලුම

2023 වසරේ දී රු. බිලියන 5,672.9 ක් වූ භාණ්ඩ හා සේවා අපනයනය 2024 වසරේ දී රු. බිලියන 5,945.7 ක් දක්වා සියයට 4.8 කින් ඉහළ ගිය අතර, බනිජ තෙල් නිෂ්පාදන, රෙදිපිළි සහ ඇඟලුම් වලින් ලැබුණු ඉපැයීම් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ආනයන ඉල්ලුම ඉහළ යාම හේතුවෙන්, භාණ්ඩ හා සේවා ආනයනය 2023 වසරේ දී වාර්තා වූ රු. බිලියන 6,264.6 ක සිට 2024 වසරේ දී රු. බිලියන 6,730.5 ක් දක්වා සියයට 7.4 කින් ඉහළ යන ලදී. ආනයන වියදම් මෙලෙස සැළකිය යුතු ලෙස ඉහළ යාම නිසා, පවත්නා වෙළෙඳපොළ මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම, 2023 වසරේ දී වාර්තා වූ සියයට 31.0 ක වැඩිවීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 32.6 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

## ආයෝජන සහ ඉතුරුම්

ඉදිකිරීම්, පතල් හා කැණීම්, නිෂ්පාදන සහ සංචාරක ක්‍රියාකාරකම්වල ඉහළ යාම හේතුවෙන්, පවත්නා වෙළෙඳපොළ මිල අනුව ආයෝජන වියදම්, 2023 වසරේ දී වාර්තා වූ සියයට 2.7 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී රු. බිලියන 8,060.3 ක් දක්වා සියයට 19.6 කින් වර්ධනය විය. ආයෝජන වියදම්වල ප්‍රධාන සංරචකය වන දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, පවත්නා වෙළෙඳපොළ මිල අනුව, 2023 වසරේ දී වාර්තා වූ සියයට 15.0 ක අඩු වීමට සාපේක්ෂව 2024 වසරේ දී සියයට 14.9 කින් වැඩි වූ අතර, ඉදිකිරීම් වියදම් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 2.8 | සමස්ත සැපයුම හා භාණ්ඩ හා සේවා පරිභෝජනය [අ]**

| අයිතමය | පවත්නා වෙළෙඳපොළ මිල රු. බිලියන | | | වෙනස (%) | | ද.දේ.නි. (%) | |
|---|---|---|---|---|---|---|---|
| | 2022[ආ] | 2023[ආ] | 2024[ඇ] | 2022/ 2023[ආ] | 2023/ 2024[ඇ] | 2023[ආ] | 2024[ඇ] |
| **සමස්ත ඉල්ලුම** | **30,109** | **33,684** | **36,629** | **11.9** | **8.7** | **122.8** | **122.5** |
| දේශීය ඉල්ලුම | 24,921 | 28,012 | 30,683 | 12.4 | 9.5 | 102.2 | 102.6 |
| විදේශීය ඉල්ලුම = භාණ්ඩ හා සේවා අපනයන | 5,188 | 5,673 | 5,946 | 9.3 | 4.8 | 20.7 | 19.9 |
| **සමස්ත සැපයුම** | **30,109** | **33,684** | **36,629** | **11.9** | **8.7** | **122.8** | **122.5** |
| දළ දේශීය නිෂ්පාදනය | 24,064 | 27,420 | 29,899 | 13.9 | 9.0 | 100.0 | 100.0 |
| භාණ්ඩ හා සේවා ආනයන | 6,045 | 6,265 | 6,731 | 3.6 | 7.4 | 22.8 | 22.5 |
| භාණ්ඩ හා සේවා වෙළෙඳ පරතරය | -857 | -592 | -785 | -31.0 | 32.6 | -2.2 | -2.6 |
| භාණ්ඩ හා සේවා ආනයන සමස්ත සැපයුමේ (%) ලෙස | 20.1 | 18.6 | 18.4 | -1.5 | -0.2 | 0.1 | 0.1 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂය ඇස්තමේන්තු ද.දේ.නි. මූලික කර ගත් දත්ත වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

**වගුව 2.9 | ආයෝජන හා ඉතිරිකිරීම්**

| අයිතමය | රු. බිලියන | | | ද.දේ.නි. (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2022 (අ) | 2023 (අ) | 2024 (ආ) | 2022 (අ) | 2023 (අ) | 2024 (ආ) |
| **දේශීය ආයෝජන** | **6,562** | **6,741** | **8,060** | **28.6** | **24.6** | **27.0** |
| **දේශීය ඉතුරුම්** | **7,419** | **6,149** | **7,276** | **25.0** | **22.4** | **24.3** |
| පෞද්ගලික | 9,306 | 7,800 | 8,585 | 31.4 | 28.4 | 28.7 |
| රජය | -1,887 | -1,651 | -1,309 | -6.4 | -6.0 | -4.4 |
| **ආයෝජන – දේශීය ඉතුරුම් පරතරය** | **-857** | **-592** | **-785** | **-3.6** | **-2.2** | **-2.6** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම (ඇ) | -617 | -834 | -745 | -2.6 | -3.0 | -2.5 |
| විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම | 1,159 | 1,907 | 1,943 | 4.8 | 7.0 | 6.5 |
| **ජාතික ඉතුරුම්** | **6,247** | **7,223** | **8,474** | **27.2** | **26.3** | **28.3** |


මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ගෙවුම් ශේෂ ලේඛනයේ දත්ත සමඟ මෙහි ඇස්තමේන්තුගත දත්ත වෙනස් වීමට කාලපමාව හේතු වී ඇත.

**රූපසටහන 2.5 | ඉතුරුම් හා ආයෝජන පරතරය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


2023 වසරේ දී වාර්තා වූ සියයට 7.8 ක වර්ධනයට සාපේක්ෂව දේශීය ඉතුරුම් 2024 වසරේ දී සියයට 18.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, පෞද්ගලික ඉතුරුම්වල සිදු වූ ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම් ද, 2023 වසරේ දී වාර්තා වූ සියයට 22.4 සිට 2024 වසරේ දී සියයට 24.3 දක්වා වැඩි විය. රුපියල් වටිනාකම අනුව, 2024 වසරේ දී විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම සියයට 10.6 කින් ඉහළ ගිය අතර, විදේශීය ශුද්ධ ද්විතීයික ආදායම සියයට 1.9 කින් සුළු වශයෙන් වැඩි විය. 2024 වසරේ දී ජාතික ඉතුරුම් සියයට 17.3 ක වර්ධනයක් වාර්තා කළ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 28.3 ක් දක්වා ළඟා විය.

## 2.3 විදේශ අංශය

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2024 වසරේ දී වෙළෙඳ හිඟය පුළුල් වුවද දළ නිල සංචිත ශක්තිමත් වීමත් සමඟම වාර්ෂික ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරමින් සංචාරක අංශයෙන් සහ සේවක ප්‍රේෂණවලින් ලැබුණු ආදායම වැඩිවීම හේතුවෙන් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තියේ සිදු කරනු ලබන සංශෝධන හේතුවෙන් විදේශ අංශයේ කෙටි කාලීන අස්ථාවරත්වයන් මතු විය හැකිය.

ආර්ථික පුනර්ජීවනයත් සමඟ ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ආදායමේ වැඩිවීම හේතුවෙන් අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 11,910.7 ට සාපේක්ෂව 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 12,772.0 ක් දක්වා සියයට 7.2 කින් වැඩි විය. ජනවාරි, අප්‍රේල් සහ නොවැම්බර් මාස හැර 2024 වසරේ අනෙකුත් මාස තුළ දී මාසික අපනයන ආදායම ඇ. ඩො. බිලියන 1.0 ඉක්මවනු ලැබීය. මේ අතර, ප්‍රධාන වශයෙන් අතරමැදි භාණ්ඩ සඳහා ආනයන ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ආනයන ඉල්ලුම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 16,811.1 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 18,841.4 දක්වා සියයට 12.1 කින් වැඩි විය. අපනයන ආදායම වැඩිවීමට වඩා ආනයන ඉල්ලුම වැඩි වීමත් සමඟ 2023 වසරේ දී ඇ. ඩො. මිලියන 4,900.4 ක් වූ වෙළෙඳ හිඟය 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 6,069.4 දක්වා පුළුල් විය.

**රූපසටහන 2.6 | ආනයන, අපනයන සහ වෙළෙඳ ශේෂයෙහි වර්ධනය (කාර්තුමය)**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ජංගම ගිණුම 2023 වසරේ දී වාර්තා වූ ඇ. ඩො. බිලියන 1.4 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ දී ඇ. ඩො. බිලියන 1.2 ක අතිරික්තයක් වාර්තා කළේය. ඒ අනුව, 2023 වසරේ දී ද. දේ. නි. යෙන් සියයට 1.7 ක් වූ ජංගම ගිණුමේ අතිරික්තය 2024 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 1.2 ක අතිරික්තයක් ලෙස වාර්තා විය. සංචාරක, මුහුදු ප්‍රවාහන, පරිගණක සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශවලින් ලැබුණු ලැබීම් වැඩිවීම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී වූ ඇ. ඩො. බිලියන 3.1 සිට 2024 වසරේ දී ඇ. ඩො. බිලියන 3.4 දක්වා ඉහළ ගියේය.

වගුව 2.10 | විදේශ වෙළෙඳාම


ඇ.ඩො. මිලියන

| අයිතමය | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|
| **අපනයන** | **12,499** | **13,106** | **11,911** | **12,772** |
| කෘෂිකාර්මික අපනයන | 2,730 | 2,568 | 2,567 | 2,775 |
| කාර්මික අපනයන | 9,702 | 10,465 | 9,278 | 9,947 |
| ඛනිජ නිෂ්පාදන | 45 | 50 | 38 | 25 |
| වර්ගීකරණය නොකළ | 23 | 23 | 28 | 26 |
| **ආනයන** | **20,637** | **18,291** | **16,811** | **18,841** |
| පාරිභෝගික භාණ්ඩ | 3,849 | 2,813 | 3,044 | 3,466 |
| අන්තර් භාණ්ඩ | 12,309 | 12,439 | 11,007 | 11,915 |
| ආයෝජන භාණ්ඩ | 4,463 | 3,031 | 2,745 | 3,448 |
| වර්ගීකරණය නොකළ | 17 | 9 | 16 | 13 |
| **වෙළෙඳ හිඟය** | **-8,139** | **-5,185** | **-4,900** | **-6,069** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

2024 වසරේ දී රජයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන අඩු වීම හේතුවෙන් ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 37 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 12 දක්වා අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ ලැබීම් සහ ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද වාරික සමඟ 2023 වසරේ දී ඇ. ඩො. මිලියන 1,483 ක් වූ මූල්‍ය ගිණුමේ සමස්ත ශේෂය 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 892 ක් ලෙස වාර්තා විය. 2024 වසරේ දී සෘජු විදේශ ආයෝජන ලැබීම් අඩු මට්ටමක පැවති අතර 2023 වසරේ දී ඇ. ඩො. මිලියන 759 ක් වූ සෘජු විදේශ ආයෝජන වලට සාපේක්ෂව 2024 වසරේ දී විදේශ ණය ඇතුළුව සෘජු විදේශ ආයෝජන ඇ. ඩො. මිලියන 846 ක් ලෙස වාර්තා විය.


රූපසටහන 2.7 | වෙළෙඳ ශේෂය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2023 වසරේ දී පුද්ගලයින් 1,487,303 ක් වූ සංචාරකයින්ගේ පැමිණීම්වලට සාපේක්ෂව 2024 වසරේ දී පුද්ගලයින් 2,053,465 ක් දක්වා සියයට 38.1 කින් සංචාරකයින්ගේ පැමිණීම් කැපී පෙනෙන ලෙස ඉහළ යාමත් සමඟ සංචාරක අංශය කැපී පෙනෙන කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, සංචාරක ඉපැයීම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 2,068.0 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 3,168.6 දක්වා සියයට 53.2 කින් සැලකිය යුතු ලෙස වැඩි විය.

රූපසටහන 2.8 | ගෙවුම් ශේෂ තුලනය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


දළ නිල සංචිත 2023 වසරේ අවසානයේ පැවති ඇ. ඩො. මිලියන 4,392 සිට 2024 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට ඇ. ඩො. මිලියන 6,122 දක්වා වර්ධනය වූ අතර, මුළු විදේශ වත්කම් 2023 වසර අවසානය වන විට පැවති ඇ. ඩො. බිලියන 12.5 සිට 2024 වසර අවසානයේ ඇ. ඩො. බිලියන 14.5 දක්වා වැඩි විය. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය ශුද්ධ මිලදී ගැනීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ලැබීම් දළ නිල සංචිත වැඩිවීමට හේතු විය. 2024 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ පදනම් මත ඇ. ඩො. මිලියන 2,846 ක් මිලදී ගන්නා ලදී. සමස්ත ගෙවුම් ශේෂය 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 2,825.6 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 2,890.4 ක අතිරික්තයක් වාර්තා කළේය. මේ අතර, 2024 වසරේ දී අඛණ්ඩව දෙවන වසරටත් ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වූ අතර, 2024 වසරේ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 10.7 ක වාර්ෂික අතිප්‍රමාණය වීමක් වාර්තා විය.

## අපනයන

ආර්ථික පුනර්ජීවනය සහ ගෝලීය අවිනිශ්චිත අස්ථාවරත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව හේතුවෙන් අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 11,910.7 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 12,772.0 දක්වා සියයට 7.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කාර්මික අපනයන ආදායම මුළු අපනයන ආදායමෙන් සියයට 77.9 ක් වූ අතර, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන ආදායම පිළිවෙළින් මුළු අපනයන ආදායමෙන් සියයට 21.7 ක් සහ සියයට 0.2 ක් විය. ඒ අනුව, කාර්මික අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 9,277.7 ක සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 9,946.9 ක් දක්වා සියයට 7.2 කින් වර්ධනය වී ඇති අතර, කෘෂිකාර්මික අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ.ඩො. මිලියන 2,566.5 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 2,774.5 දක්වා සියයට 8.1 කින් ඉහළ ගොස් ඇති අතර ඛනිජ අපනයන ආදායම

2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 38.5 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 24.5 දක්වා සියයට 36.2 කින් පහත වැටී ඇත. කෙසේ වෙතත්, අපනයන ආදායම ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී සියයට 14.2 සිට 2024 වසරේ දී සියයට 12.9 දක්වා පහත වැටුණි.


**රූපසටහන 2.9 | අපනයන සංයුතිය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

කාර්මික අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 9,277.9 ට සාපේක්ෂව 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 9,946.9 ක් දක්වා සියයට 7.2 කින් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසර තුළ රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම සියයට 3.7 කින් ඇ. ඩො. මිලියන 5,061 දක්වාත්, ඛනිජ තෙල් නිෂ්පාදන සියයට 97.2 කින් ඇ. ඩො. මිලියන 1,063.5 දක්වාත්, රබර් නිෂ්පාදන සියයට 8.1 කින් ඇ. ඩො. මිලියන 975.6 දක්වාත් ඉහළ යාමයි. 2024 වසරේ දී නැව් සහ ගුවන් යානා සඳහා සපයන ඉන්ධන අපනයන පරිමාව ඉහළ යාමත් සමඟ ඛනිජ තෙල් නිෂ්පාදන වලින් ලැබෙන ආදායම වර්ධනය වූ අතර රෙදිපිළි හා ඇඟලුම් අපනයන අංශය ද සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් විය. කෙසේ වෙතත්, යන්ත්‍ර සූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ සහ සත්ත්ව ආහාර අපනයනයන්ගෙන් අපනයන ආදායම අඩු විය.

**රූපසටහන 2.10 |මුළු අපනයන සහ රෙදිපිළි සහ ඇඟලුම් අපනයන**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

තේ, කුළුබඩු, පොල් සහ එළවළු වලින් ලැබුණු අපනයන ආදායම වැඩිවීමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ.ඩො. මිලියන 2,566.5 සිට 2024 වසරේ දී ඇ.ඩො. මිලියන 2,774.5 ක් දක්වා සියයට 8.1 කින් වැඩි විය. තේ අපනයන පරිමාව සහ මිල ගණන් ඉහළ යාමත් සමඟ තේ අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 1,309.9 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 1,435.9 ක් දක්වා සියයට 9.6 කින් ඉහළ යන ලදී. කෙසේ වෙතත්, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, රබර් සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහත වැටුණි. මේ අතර, ඛනිජ අපනයන ආදායම 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 38.5 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 24.5 දක්වා සියයට 36.2 කින් අඩු විය. වර්ගීකරණය නොකළ අපනයන ඉපැයීම් ද 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 26.1 දක්වා සියයට 6.6 කින් පහත වැටුණි.

**වගුව 2.11 | සේවා ආනයන සහ අපනයන**

ඇ.ඩො. මිලියන

| අයිතමය | ආනයන | | | අපනයන | | |
|---|---|---|---|---|---|---|
| | 2022 | 2023 | 2024(අ) | 2022 | 2023 | 2024(අ) |
| ගමනාගමන සේවා | 333.0 | 732.0 | 1,017.2 | 676.0 | 1,549.7 | 1,793.9 |
| පරිගණක හා තොරතුරු සේවා | 133.0 | 197.7 | 193.9 | 1,066.0 | 795.0 | 848.4 |
| ගමන් හා සංචාරක | 244.0 | 503.1 | 755.4 | 1,136.0 | 2,068.0 | 3,168.6 |
| සන්නිවේදන සේවා | 28.0 | 53.0 | 50.5 | 31.0 | 121.8 | 123.1 |
| ඉදි කිරීම් සේවා | 11.0 | 110.6 | 126.6 | 9.0 | 354.8 | 212.2 |
| රක්ෂණ සේවා | 36.0 | 51.1 | 57.3 | 19.0 | 34.7 | 23.7 |
| මූල්‍ය සේවා | 96.0 | 57.2 | 64.6 | 92.0 | 64.0 | 55.2 |
| අනෙකුත් ව්‍යාපාර සේවා | 16.0 | 343.6 | 563.2 | 15.0 | 310.2 | 540.2 |
| රජයේ වියදම් (අත් තැනක සඳහන් නොවන) | 56.0 | 7.5 | 250.8 | 18.0 | 6.5 | 35.8 |
| **එකතුව** | **953** | **2,056** | **3,080** | **3,062** | **5,305** | **6,801** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

**වගුව 2.12 | කාර්මික අපනයන වටිනාකම**

ඇ.ඩො. මිලියන

| කාණ්ඩය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| රෙදිපිළි සහ ඇඟලුම් | 5,597 | 4,423 | 5,435 | 5,952 | 4,879 | 5,061 |
| රබර් නිෂ්පාදන | 866 | 786 | 1,050 | 977 | 902 | 976 |
| ඛනිජ තෙල් හා රසායනික නිෂ්පාදන | 521 | 374 | 506 | 568 | 539 | 1,064 |
| මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ | 306 | 181 | 277 | 451 | 500 | 382 |
| යන්ත්‍ර, යාන්ත්‍රික උපකරණ සහ අනෙකුත් කාර්මික අපනයන | 400 | 338 | 501 | 581 | 598 | 486 |
| ආහාර, පාන සහ දුම්කොළ | 447 | 464 | 587 | 520 | 539 | 652 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,290 | 1,106 | 1,346 | 1,417 | 1,320 | 1,328 |
| **එකතුව** | **9,426** | **7,672** | **9,702** | **10,465** | **9,278** | **9,947** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

**වගුව 2.13 | කෘෂිකාර්මික අපනයන වටිනාකම**

ඇ.ඩො. මිලියන

| කාණ්ඩය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| තේ | 1,346.4 | 1,240.9 | 1,324.4 | 1,258.8 | 1,309.9 | 1,435.9 |
| රබර් | 24.2 | 30.1 | 42.2 | 41.4 | 28.0 | 26.0 |
| පොල් | 329.5 | 345.2 | 425.2 | 400.3 | 336.8 | 416.5 |
| අනෙකුත් කෘෂිකාර්මික අපනයන | 499.2 | 530.2 | 663.6 | 598.5 | 629.6 | 663.1 |
| මුහුදු ආහාර | 262.5 | 189.8 | 274.1 | 269.0 | 262.2 | 233.0 |
| **එකතුව** | **2,461.8** | **2,336.2** | **2,729.5** | **2,568.0** | **2,566.5** | **2,774.5** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

## ආනයන

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්වයට පත් වීම සහ ආනයන සීමා කිරීම් බොහොමයක් ඉවත් කිරීමත් සමඟ ඉල්ලුම් වැඩිවීම හේතුවෙන් පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම් වැඩිවීමෙන්, මුළු ආනයන වියදම් 2023 වසරේ දී වූ ඇ.ඩො. මිලියන 16,811.1 ට සාපේක්ෂව 2024 වසරේ දී ඇ.ඩො. මිලියන 18,841.4 ක් දක්වා සැලකිය යුතු ලෙස සියයට 12.1 කින් වැඩි විය. කෙසේ වෙතත්, ආනයන වියදම් ද. දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී සියයට 20.1 සිට 2024 වසරේ දී සියයට 19.0 දක්වා අඩු විය.

ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩ දෙකෙහිම ආනයන වියදම් වර්ධනය වීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ සඳහා වන ආනයන වියදම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 3,043.9 ට සාපේක්ෂව 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 3,465.7 දක්වා සියයට 13.9 කින් වැඩි විය. එළවළු, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්ත නිෂ්පාදන සහ මුහුදු ආහාර කාණ්ඩ සඳහා ආනයන වියදම් වැඩිවීමත් සමඟ, ආහාර සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 1,693.0 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 1,914.3 දක්වා සියයට 13.1 කින් ඉහළ ගියේය. රෙදිපිළි හා උපාංග, ගෘහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ ගෘහ හා දැව භාණ්ඩ සඳහා වන ආනයන වියදම් වැඩිවීම හේතුවෙන් 2024 වසරේ දී ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම් ඇ. ඩො. මිලියන 1,551.4 ක් දක්වා සියයට 14.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආනයන සීමා කිරීම් අදියර තුනක් හරහා ඉවත් කිරීම යටතේ 2024 වසරේ දෙසැම්බර් මාසයේදී අදියර 1 ද, 2025 ජනවාරි මාසයේ දී අදියර 2 සහ 3 ද ක්‍රියාත්මක කිරීමත් සමඟ පෞද්ගලික වාහන ආනයන වියදම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 27.7 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 66.2 දක්වා සියයට 139.2 කින් ඉහළ යන ලදී.

ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ රසායනික නිෂ්පාදන ආනයනය සඳහා වන වියදම් වැඩිවීම හේතුවෙන් සමස්ත ආනයන වියදමෙන් සියයට 63.2 ක කොටසක් වන අතරමැදි භාණ්ඩ සඳහා වන ආනයන වියදම්, 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 11,006.6 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 11,914.5 දක්වා සියයට 8.2 කින් වැඩි විය. බොරතෙල් සහ ගල් අඟුරු ආනයන මිල ගණන් සහ ආනයන පරිමාව අඩු වීමත් සමඟ ඉන්ධන ආනයන වියදම් 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 4,354.4 දක්වා සියයට 7.4 කින් අඩු විය. ජල විදුලිබල උත්පාදනයේ ඉහළ දායකත්වය හේතුවෙන් විදුලිබල උත්පාදනය සඳහා ඉන්ධන ආනයනයට ඇති ඉල්ලුම් අඩු වීම හේතුවෙන් බොරතෙල් සහ ගල් අඟුරු ආනයන වියදම් අඩුවිය.

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සහ ආනයන සීමාවන් ඉවත් කිරීමත් සමඟ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණවල ආනයන වියදම් වැඩිවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 2,744.6 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 3,448.2 දක්වා සියයට 25.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2024 වසරේ දී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම් ඇ. ඩො. මිලියන 2,363.1 ක් දක්වා සියයට 26.5 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම් ඇ. ඩො. මිලියන 927.2 ක් දක්වා සියයට 19.6 කින් ද, ප්‍රවාහන උපකරණ ආනයන වියදම් ඇ. ඩො. මිලියන 154.8 දක්වා සියයට 57.1 කින් ද වර්ධනය විය.

### වගුව 2.14 | ආනයන වටිනාකම

ඇ.ඩො. මිලියන

| කාණ්ඩය | 2020 | 2021 | 2022 | 2023 | 2024 (අ) |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **3,401.7** | **3,848.7** | **2,813.0** | **3,043.9** | **3,465.7** |
| ආහාර හා පාන වර්ග | 1,554.4 | 1,666.5 | 1,607.9 | 1,693.0 | 1,914.3 |
| සීනි | 277.1 | 288.8 | 257.8 | 435.5 | 389.5 |
| කිරි හා කිරි නිෂ්පාදන | 333.8 | 317.7 | 225.3 | 273.7 | 239.7 |
| අනෙකුත් ආහාර හා පාන වර්ග | 943.5 | 1,060.0 | 1,124.8 | 983.8 | 1,285.1 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 1,847.3 | 2,182.2 | 1,205.1 | 1,350.9 | 1,551.4 |
| වාහන | 282.9 | 12.8 | 11.7 | 27.7 | 66.2 |
| ගෘහ උපකරණ - ගුවන් විදුලි හා රූපවාහිනී | 174.2 | 257.1 | 85.5 | 72.4 | 155.6 |
| බෙහෙත් සහ ඖෂධ නිෂ්පාදන | 595.5 | 882.5 | 533.4 | 667.0 | 575.6 |
| ගෘහ උපකරණ සහ දැව භාණ්ඩ | 146.9 | 161.2 | 116.3 | 122.1 | 138.1 |
| අනෙකුත් | 647.8 | 868.6 | 458.2 | 461.7 | 615.9 |
| **අන්තර් භාණ්ඩ** | **9,076.5** | **12,308.9** | **12,438.8** | **11,006.6** | **11,914.5** |
| පොහොර | 258.9 | 158.2 | 275.9 | 235.0 | 201.1 |
| බනිජ තෙල් | 2,542.6 | 3,742.9 | 4,896.8 | 4,702.6 | 4,354.4 |
| රසායනික නිෂ්පාදන | 831.5 | 1,074.4 | 966.2 | 814.7 | 987.0 |
| කඩදාසි සහ සන කඩදාසි | 383.1 | 468.9 | 465.9 | 412.4 | 447.0 |
| තිරිඟු සහ ඉරිඟු | 384.4 | 418.3 | 303.1 | 338.2 | 382.5 |
| ඇගළුම් | 2,335.1 | 3,066.9 | 3,065.2 | 2,371.2 | 2,847.1 |
| දියමන්ති සහ වටින ලෝහ | 117.2 | 143.6 | 203.8 | 268.4 | 216.9 |
| මූල ලෝහ | 460.3 | 866.4 | 323.2 | 313.8 | 473.4 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 1,763.4 | 2,369.3 | 1,938.7 | 1,550.3 | 2,005.1 |
| **ආයෝජන භාණ්ඩ** | **3,563.2** | **4,462.7** | **3,030.5** | **2,744.6** | **3,448.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,176.1 | 2,809.5 | 1,969.0 | 1,867.6 | 2,363.1 |
| ප්‍රවාහන උපකරණ | 348.3 | 398.5 | 132.1 | 98.5 | 154.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,035.6 | 1,248.9 | 926.3 | 775.1 | 927.2 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 3.2 | 5.8 | 3.0 | 3.3 | 3.1 |
| **වර්ගීකරණය නොකළ ආනයන** | **14.0** | **17.1** | **8.8** | **16.0** | **13.0** |
| **මුළු ආනයන** | **16,055.4** | **20,637.4** | **18,291.0** | **16,811.1** | **18,841.4** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) තාවකාලික

### වගුව 2.15 | ගෙවුම් ශේෂ තුලනය : 2019- 2024

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023(අ) | 2024(ආ) |
|---|---|---|---|---|---|---|
| **වෙළෙඳ ශේෂය** | **-7,997** | **-6,008** | **-8,139** | **-5,185** | **-4,900** | **-6,069** |
| අපනයන | 11,940 | 10,047 | 12,499 | 13,106 | 11,911 | 12,772 |
| ආනයන | 19,937 | 16,055 | 20,637 | 18,291 | 16,811 | 18,841 |
| **සේවා (ශුද්ධ)** | **2,849** | **819** | **1,586** | **2,110** | **3,053** | **3,435** |
| ලැබීම් | 7,474 | 3,035 | 2,475 | 3,062 | 5,416 | 6,910 |
| ගෙවීම් | 4,625 | 2,216 | 889 | 953 | 2,363 | 3,476 |
| **ආදායම (ශුද්ධ)** | **-2,462** | **-2,205** | **-1,959** | **-1,870** | **-2,548** | **-2,599** |
| ලැබීම් | 252 | 198 | 116 | 266 | 460 | 609 |
| ගෙවීම් | 2,713 | 2,404 | 2,075 | 2,136 | 3,008 | 3,208 |
| **භාණ්ඩ, සේවා සහ ආදායම් (ශුද්ධ)** | **-7,610** | **-7,394** | **-8,512** | **-4,945** | **-4,395** | **-5,234** |
| **ජංගම සංක්‍රාම (ශුද්ධ)** | **5,766** | **6,207** | **5,228** | **3,496** | **5,835** | **6,439** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 5,757 | 6,194 | 5,221 | 3,493 | 5,815 | 6,429 |
| ලැබීම් (සේවක ප්‍රේෂණ) | 6,717 | 7,104 | 5,491 | 3,789 | 5,970 | 6,575 |
| ගෙවීම් | 960 | 910 | 270 | 296 | 155 | 146 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 9 | 13 | 6 | 3 | 20 | 10 |
| **ජංගම ගිණුම** | **-1,843** | **-1,187** | **-3,284** | **-1,448** | **1,439** | **1,206** |
| **ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම** | **-2,437** | **-232** | **-4,186** | **-1,549** | **1,520** | **904** |
| **ප්‍රාග්ධන ගිණුම** | **23** | **28** | **25** | **19** | **37** | **12** |
| **ප්‍රාග්ධන හා ජංගම ගිණුම** | **-1,820** | **-1,159** | **-3,259** | **-1,429** | **1,476** | **1,217** |
| **මූල්‍ය ගිණුම (ඇ)** | **-2,460** | **-260** | **-4,211** | **-1,569** | **1,483** | **892** |
| වැරදි හා අත්හැරීම් | -640 | 795 | -952 | -139 | 6 | -325 |
| **සමස්ත ශේෂය (ගෙවුම් ශේෂය)** | **377** | **-2,328** | **-3,967** | **-2,806** | **2,826** | **2,890** |
| **ද.දේ.නි % ලෙස** | | | | | | |
| වෙළෙඳ හිඟය | -9.5 | -7.4 | -9.2 | -6.7 | -5.9 | -6.1 |
| ජංගම ගිණුමේ හිඟය | -2.2 | -1.5 | -3.7 | -1.9 | 1.7 | 1.2 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව
(අ) සංශෝධිත
(ආ)තාවකාලික


### සංචාරක ඉපැයීම්

ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ චීනය යන රටවලින් සංචාරකයින්ගේ පැමිණීම් වැඩිවීමත් සමඟ සංචාරක ඉපැයීම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 2,068.0 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 3,168.6 දක්වා සියයට 53.2 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 2023 වසරේ දී පුද්ගලයින් 1,487,303 ක් වූ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 2024 වසරේ දී සංචාරක පැමිණීම් පුද්ගලයින් 2,053,465 ක් දක්වා සියයට 106.6 කින් ඉහළ ගියේය.

### ශ්‍රමික ප්‍රේෂණ

විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ දිරිමත් කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය පියවර සමඟ විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ලැබීම් සහ විදේශ රැකියා සඳහා පිටත්වීම් ඉහළ යාම හේතුවෙන් ශ්‍රමික ප්‍රේෂණ 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 5,969.6 සිට 2024 වසරේ දී ඇ. ඩො. මිලියන 6,575.4 දක්වා සියයට 10.1 කින් වැඩි විය. විදේශ රැකියා සඳහා පිටත්වීම් 2023 වසරේ දී වාර්තා වූ පුද්ගලයින් 297,305 ට සාපේක්ෂව 2024 වසරේ දී පුද්ගලයින් 313,642 ක් දක්වා සියයට 5.5 කින් වර්ධනය විය.

**රූපසටහන 2.11 | සේවක ප්‍රේෂණ**





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.4 මුදල් අංශය

2022–2023 අර්බුදයෙන් පසු රටේ ආර්ථික ප්‍රකෘතියට සහාය වීම සඳහා 2024 දී ශ්‍රී ලංකා මහ බැංකුව සහනශීලී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරණ ලදී. උද්ධමනය පහත වැටීම සහ විදේශ අංශය ශක්තිමත් කිරීම ඇතුළු සාර්ව ආර්ථික තත්ත්වයන්හි වැඩිදියුණු කිරීම් පිළිබිඹු කරමින්, තනි ප්‍රතිපත්ති අනුපාතයක් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව විධිමත් කරණ ලදී.

2024 නොවැම්බර් 27 වන දින, මුදල් මෙහෙයුම්වල පැහැදිලි බව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් ඉදිරි මග පෙන්වීමක් ලබා දීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව ද්විත්ව පොලී අනුපාත ව්‍යුහය ඒකාබද්ධ මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතයක් සමඟ ප්‍රතිස්ථාපනය කරමින් එය සියයට 8.0 අගයට ගෙනඑන ලදී. 2023 ජූනි මාසයේ සිට කිහිප වතාවක් ප්‍රතිපත්ති පොලී අනුපාතය අඩු කිරීමෙන් පසුව මෙම පියවරට එළඹෙන ලදී .


**රූපසටහන 2.12 | සංචිත මුදල් සහ පුද්ගලික අංශය සඳහා ණය සැපයුම් වර්ධනය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

මහ බැංකුවේ මුදල් ලිහිල් කිරීමේ අරමුණ වූයේ උද්ධමනය සියයට 5 ක මධ්‍ය කාලීන ඉලක්කයක රඳවා තබා ගැනීම සහ නිෂ්පාදක අංශවලට ණය ප්‍රවාහයන් පහසු කිරීමයි. මෙම පියවරයන් දේශීය මුදල් වෙළෙඳපොළේ ඉහළ ද්‍රවශීලතාවයට දායක විය. බැංකු පද්ධතියේ ද්‍රවශීලතා තත්ත්වයන්ට අඛණ්ඩව සහාය වෙමින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2 ක මට්ටමක පවත්වාගෙන යන ලදී.

**රූපසටහන 2.13| පුද්ගලික අංශය සඳහා ණය සැපයුමෙහි වර්ධනය සහ වෙළෙඳ හිඟය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අවධමන කාල පරිච්ඡේද ඇතුළුව 2024 වසර පුරාවටම උද්ධමන පීඩනය අඩුවීමත් සමඟ වෙළෙඳපොළේ පොලී අනුපාත තවදුරටත් පහත වැටුණි. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතය නව ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පහත වැටුණු අතර, බරිත සාමාන්‍ය ණය අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය තවදුරටත් පහත වැටීම් වාර්තා කළ අතර, එමඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) ඇතුළු සියලුම අංශවල ණය ගැනුම්කරුවන්ට ප්‍රතිලාභ සැලසුණි.

බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය අනුපාතිකය ද 2024 දී පහත වැටීමක් පෙන්නුම් කළ අතර, එමඟින් ව්‍යවසායකයින් සඳහා මූල්‍ය ප්‍රවේශය ලිහිල් වූ අතර ව්‍යාපාර යථා තත්ත්වයට පත්වීමට සහාය විය.

පුළුල් මුදල් සැපයුමේ (M2b) වර්ධනය මධ්‍යස්ථව පැවතුනි. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය ව්‍යවසායන්හි ණය අඩුවීම, මූල්‍ය ස්ථාවර කිරීමේ පියවර සහ රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය පහත වැටීම, ස්ථාවර මුදල් වාතාවරණයකට දායක විය. මේ අතර, රජයට ශුද්ධ ණය (NCG) සහ බැංකු අංශයේ ශුද්ධ විදේශ වත්කම් (NFA) ඉහළයාම මුදල් සැපයුමේ ස්ථාවරත්වයට හේතු විය. 2024 දෙසැම්බර් අවසානය වන විට, පුළුල් මුදල් සැපයුමේ (M2b) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 8.6 ක් ලෙස දැක්වුනු අතර, 2023 දී නිරීක්ෂණය වූ ක්‍රමයෙන් අඩුවීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවතුනි.

**වගුව 2.16 | වාණිජ බැංකු විසින් ලබා දුන් ණය අත්තිකාරම් සහ නොපිය වූ ණය (අ) (ආ)**

රු. බිලියන

| අයිතමය | 2023(ඇ) | 2024(ඇ) | 2024/2023 % වෙනස |
|---|---|---|---|
| **කෘෂිකර්ම සහ ධීවර** | **657.6** | **740.4** | **12.6** |
| එයින් | | | |
| තේ | 129.1 | 162.9 | 26.2 |
| රබර් | 51.2 | 47.4 | -7.4 |
| පොල් | 28.8 | 38.2 | 32.7 |
| වී | 41.1 | 49.8 | 21.3 |
| එළවළු, පළතුරු සහ සුළු ආහාර බෝග | 33.0 | 42.2 | 27.8 |
| පශු සම්පත් හා කිරි ගොවිකැන | 42.2 | 47.0 | 11.4 |
| ධීවර කර්මාන්තය | 31.1 | 35.0 | 12.5 |
| **කර්මාන්ත** | **3,027.9** | **3,283.5** | **8.4** |
| එයින් | | | |
| ඉදිකිරීම් | 1,487.5 | 1569.3 | 5.5 |
| ආහාර පාන | 222.8 | 233.4 | 4.8 |
| රෙදි පිළි සහ ඇඟළුම් | 277.1 | 322.7 | 16.5 |
| රසායන ද්‍රව්‍ය ඛණිජ තෙල් සහ ඖෂධ | 180.6 | 208.8 | 15.6 |
| මූලික ලෝහ නිෂ්පාදන | 50.2 | 57.2 | 13.9 |
| යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 170.5 | 191.8 | 12.5 |
| **සේවා** | **2,013.6** | **2,260.8** | **12.3** |
| එයින් | | | |
| තොග හා සිල්ලර වෙළෙඳාම | 579.3 | 674.3 | 16.4 |
| සංචාරක | 348.2 | 324.8 | -6.7 |
| මූල්‍ය හා ව්‍යාපාර සේවා | 314.1 | 406.9 | 29.5 |
| ප්‍රවාහනය | 58.4 | 67.3 | 15.2 |
| සන්නිවේදන තොරතුරු තාක්ෂණය | 128.9 | 147.2 | 14.2 |
| **පුද්ගලික ණය සහ අත්තිකාරම්** | **1,777.0** | **1,977.8** | **11.3** |
| එයින් | | | |
| කල්පවතින පරිභෝජන | 319.9 | 307.8 | -3.8 |
| උකස් | 546.7 | 658.8 | 20.5 |
| ණය පත් | 156.1 | 169.0 | 8.3 |
| **එකතුව** | **7,476.1** | **8,262.5** | **10.5** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණ මත පදනම් වී ඇති අතර මෙයට වාණිජ බැංකුවල, දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල ණය සහ අත්තිකාරම් ඇතුළත් වේ.

(ආ) ණය, අයිරා සහ වට්ටම් කළ සහ මිලට ගත් බිල්පත් ඇතුළත් වන අතර එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ.

(ඇ) සංශෝධිත


(ඈ) තාවකාලික

(ඉ) "කර්මාන්ත" යටතේ වර්ගීකරණය කර ඇති "ඉදි කිරීම්" කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත් කර ඇති අතර සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධිත ණය මෙම කාණ්ඩයට ඇතුළත් වේ

**විශේෂ සටහන 2.1 | ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ පුනර්ජීවනය: ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත්වීම සහ අපේක්ෂා සහගත අනාගත වර්ධනය**


ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ ප්‍රධාන සාධකයක් වන සංචාරක කර්මාන්තය විදේශ විනිමය ඉපයීම සඳහා අත්‍යවශ්‍ය මූලාශ්‍රයක් ලෙස දායක වන අතරම තිරසාර සංවර්ධනය සඳහා සැලකිය යුතු විභවයක් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ සංචාරක අංශය වසංගතයට පෙර පැවති සංචාරක පැමිණීම් මට්ටම් කරා ළඟා වීමට ඇති හැකියාව පිළිඹිබු කරමින් 2024 වසරේ දී ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත්වෙමින් පැවති අතර ශක්තිමත් ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය. 2018 වසරෙන් පසු වාර්තා වූ ඉහළම වාර්ෂික සංචාරක පැමිණීම් සංඛ්‍යාව වාර්තා කරමින්, 2023 වසරේ දී වූ පැමිණීම් 1,487,303 ට සාපේක්ෂව 2024 වසරේ දී සංචාරකයින්ගේ පැමිණීම් සැලකිය යුතු ලෙස සියයට 38.1 කින් ඉහළ ගොස් පැමිණීම් සංඛ්‍යාව 2,053,465 දක්වා ළඟා විය. සංචාරක අංශය 2025 වසරේ මුල් මාස හතර තුළ ද සංචාරක පැමිණීම් 896,884 ක් වාර්තා කරමින් එහි ධනාත්මක ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 14.3 ක වැඩිවීමකි. මෙම සංචාරක අංශයේ පිබිදීමත් සමඟ, 2025 වසරේ දී සංචාරකයින් මිලියන තුනක් ආකර්ෂණය කර ගැනීම රජයේ අරමුණ වන අතර එමඟින් ඇ. ඩො. බිලියන 5 ඉක්මවන ආදායමක් ඉපයීමට කිරීමට අපේක්ෂා කරයි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා මෙම වසර තුළ සංචාරක අංශයේ ප්‍රධාන ආයතනික ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**සංචාරක ක්ෂේත්‍රයේ පුනර්ජීවනය**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව


**සංචාරක පැමිණීම්හි යළි පිබිදීම**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2024 වසරේ දී ඉන්දියාව, රුසියානු සමූහාණ්ඩුව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ චීනය සංචාරක පැමිණීම් සඳහා ප්‍රමුඛ මූලාශ්‍ර රටවල් ලෙස වාර්තා විය. වැඩිම සංචාරක පැමිණීම් සංඛ්‍යාවක් ඉන්දියාවෙන් වාර්තා වූ අතර එය මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 20.3 ක් ව සංචාරක පැමිණීම් 416,974 ක් ලෙස වාර්තා විය. සංචාරක පැමිණීම් 201,920 ක් වාර්තා කරමින් රුසියාව දෙවන ස්ථානයට පත්ව ඇති අතර එය මුළු පැමිණීම් වලින් සියයට 9.8 කි. එක්සත් රාජධානිය, ජර්මනිය, චීනය සහ ඕස්ට්‍රේලියාව යන රටවල් 2024 වසරේ දී සංචාරක පැමිණීම් වැඩි වීමක් වාර්තා කළ අනෙකුත් ප්‍රධාන රටවල් වන අතර, එම රටවල් වලින් පිළිවෙලින් පැමිණීම් 178,339 ක්, පැමිණීම් 136,084 ක්, පැමිණීම් 131,681 ක් සහ පැමිණීම් 89,573 ක් වාර්තා විය.

**සංචාරක පැමිණීම් ඉහළම රටවල් හය වෙතින් වාර්තා වූ සංචාරක පැමිණීම්**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**විශේෂ සටහන 2.1 | ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ පුනර්ජීවනය: ස්ථාවර ලෙස යථාතත්වයට පත්වීම සහ අපේක්ෂා සහගත අනාගත වර්ධනය සම්බන්ධිතයි...**

සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස, සංචාරක ඉපැයීම් 2023 වසරේ දී වූ ඇ. ඩො. මිලියන 2,068.0 ට සාපේක්ෂව 2024 වසරේ දී සැලකිය යුතු ලෙස සියයට 53.2 කින් වැඩි වී ඇ. ඩො. මිලියන 3,168.6 ක් දක්වා වර්ධනය විය. මෙම සැලකිය යුතු වර්ධනය පූර්ව වසංගත මට්ටම් කරා අඛණ්ඩව වර්ධනය වීමක් පිළිබිඹු කරයි.

**ජාත්‍යන්තර සංචාරක අංශයේ යළි පිබිදීම**

කොවිඩ්-19 වසංගතය සහ භූ දේශපාලනික අභියෝග නිසා ඇති වූ බාධාවන්ගෙන් යථා තත්ත්වයට පත් වෙමින් ගෝලීය සංචාරක කර්මාන්තය 2024 වසරේ දී ශක්තිමත්ව නැඟිසිටීමක් සිදුව ඇත. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයට අනුව, 2024 වසරේ දී සංචාරකයින් බිලියන 1.4 ක් ජාත්‍යන්තරව සංචාරය කළ අතර එය පූර්ව වසංගත මට්ටම්වලින් සියයට 99 ක් දක්වා ළඟා වීමක් පෙන්නුම් කරයි. කලාපීය වශයෙන් සංචාරක අංශයේ වර්ධනය ගත් කල, මැදපෙරදිග කලාපය වසංගතයට පෙර පැවති මට්ටම්වලට වඩා සියයට 32 ක ජාත්‍යන්තර පැමිණීම්හි වර්ධනයක් වාර්තා කළ අතර අප්‍රිකාව ද එහි 2019 වසරේ සංචාරක පැමිණීම් මට්ටම ඉක්මවා යමින් සංචාරක පැමිණීම්වල සියයට 7 ක වර්ධනයක් පෙන්නුම් කළේය. රුසියානු-යුක්‍රේන ගැටුමේ බලපෑම් හේතුවෙන් ගමනාන්ත කිහිපයක් අඛණ්ඩව බාධාවන්ට ලක්වූ මධ්‍යම සහ නැගෙනහිර යුරෝපය හැරුණු විට, යුරෝපයේ සියලුම උප කලාප ඔවුන්ගේ පූර්ව වසංගත සංචාරක පැමිණීම් මට්ටම් ඉක්මවීය. ඇමරිකාවට වූ සංචාරක පැමිණීම් පූර්ව වසංගත මට්ටම්වලින් සියයට 97 ක් දක්වා යථා තත්ත්වයට පත් වූ අතර, ආසියා සහ පැසිෆික් කලාපය එහි පූර්ව වසංගත සංචාරක පැමිණීම්වලින් සියයට 87 ක් දක්වා ළඟා විය.

**සංචාරක අංශය මුහුණ දෙන අභියෝග**

බොහෝ රටවල් වර්තමානයේ ජාත්‍යන්තර සංචාරකයින් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා වීසා රහිත ප්‍රවේශ පහසුකම් ලබා දෙන බැවින්, අනෙකුත් කලාපීය ගමනාන්තවලින් ඇතිවන තරහකාරිත්වය තීව්‍ර වී ඇත. තවද, බොහෝ විට සංචාරකයින් වඩාත් ස්ථාවර හා ගැටුම් රහිත ස්ථාන සහ ගමන් මාර්ග වෙත යොමු වීමට පෙළඹෙන බැවින් කලාපීය භූ දේශපාලනික අර්බුධ හේතුවෙන් ඇතිවන නොසන්සුන්කාරී තත්වයන් සංචාරකයින්ගේ ගමනාන්ත තෝරා ගැනීම් සඳහා සැලකිය යුතු ලෙස බලපෑමක් සිදු කරයි. කොවිඩ්-19 ඇතුළු රෝග පැතිරීම් හේතුවෙන් සංචාරක සීමාවන් පැනවීමෙන් සහ ආරක්ෂක ගැටළු ඉහළ යාමෙන් සංචාරකයින්ගේ පැමිණීම අඩුවීමේ අවදානමක් ඇති කරයි. සංචාරක අංශයේ නිරතවන අවිධිමත් ක්‍රියාකරුවන් සහ සංචාරක කර්මාන්තය තුළ සිදුවන නීති විරෝධී ක්‍රියාකාරකම් රටේ ප්‍රතිරූපයට හානි කළ හැකි අතර එය සංචාරක ආකර්ෂණය සහ පැමිණීම් පහත වැටීමට හේතු විය හැකිය.

**මෑත කාලීන ප්‍රතිපත්තිමය මූලපිරීම්**

සංචාරකයින් සඳහා ආකර්ශනීය ගමනාන්තයක් නිර්මාණය කිරීමේ අරමුණින්, ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ උපාය මාර්ග හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකා රජය සංචාරක කර්මාන්තය නවීකරණය කිරීම සඳහා මූලපිරීම් හඳුන්වා දුන්නේය. මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ, පහත සඳහන් ප්‍රතිපත්තිමය මූලධර්ම ආවරණය වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- දූරදර්ශී නායකත්වය, ක්‍රමෝපායී ප්‍රවේශය සහ විස්තීර්ණ ආර්ථික සංවර්ධනය;
- ස්වාභාවික හා සංස්කෘතික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම;
- සංචාරක කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීම;
- නව සංචාරක නිෂ්පාදන සංවර්ධනය හා ප්‍රමිතිකරණය; සහ
- උපායමාර්ගික ගමනාන්ත ප්‍රවර්ධනය

ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ සංචාරක අංශය සංවර්ධනය කිරීම සඳහා, නව සංචාරක පනතක් ක්‍රියාත්මක කිරීම, නව ගමනාන්ත සහ නිෂ්පාදන හඳුනා ගැනීම, දේශීය සංචාරක කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක ව්‍යාපාරයේ අවිධිමත් අංශය විධිමත් අංශයක් බවට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැපයීම, සංචාරක අංශයේ අපරාධ සහ නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීම, සංචාරක පර්යේෂණ ආයතනයක් පිහිටුවීම, තෝරාගත් වෙළඳපොළවල් සඳහා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සහ අත්‍යවශ්‍ය සංචාරක තොරතුරු සැපයීම සඳහා ඩිජිටල් ප්‍රවේශයන් අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ.

ජාත්‍යන්තර සංචාරකයින් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස, සංචාරකයින්ට ගාස්තු රහිතව සංචාරක වීසා ලබා දීම සඳහා මූලික පියවර ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කරමින් සිටී. කලාපය තුළ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපළවල තරහකාරිත්වය වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ හා කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - රත්මලාන වෙතින් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන පුද්ගලයින් සඳහා අදාළ වන ඇ. ඩො. 60 ක අපගමන බද්ද ඇ. ඩො. 30 ක් ලෙස සංශෝධනය කර සහනදායී අපගමන බදු අනුපාතයක් රජය විසින් ප්‍රදානය කරන ලද අතර මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයින් ද

**විශේෂ සටහන 2.1 | ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ පුනර්ජීවනය: ස්ථාවර ලෙස යථාතත්වයට පත්වීම සහ අපේක්ෂා සහගත අනාගත වර්ධනය සම්බන්ධිතයි...**

අදාළ අපගමන බද්දෙන් සම්පූර්ණයෙන් නිදහස් කරන ලදී. තවද, ශ්‍රී ලංකාවෙන් මගී යාත්‍රා මඟින් තොටුපළකින් පිටත් වන පුද්ගලයෙකුට ඇ. ඩො. 5 ක සහනදායී අපගමන බදු අනුපාතයක් සහ මගී නෞකාවකින් පිටත් වන පුද්ගලයෙකුට ඇ. ඩො. 20 ක සහනදායී අපගමන බදු අනුපාතයක් ලබා දී ඇත. මෙම ප්‍රවේශයන් ශ්‍රී ලංකාව සහ ප්‍රධාන සංචාරක මූලාශ්‍ර වෙළඳපොළවල් අතර සෘජු සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සඳහා උපකාර වන ලෙස ජාත්‍යන්තර ගුවන් සමාගම් සහ නැව් ආකර්ෂණය කර ගැනීමට හේතු වේ.

**ඉදිරි දැක්ම**

ආසියාවේ සහ පැසිෆික් කලාපයේ සිදුවෙමින් පවතින යථා තත්වයට පත් වීම් සහ අනෙකුත් බොහෝ කලාපවල තිරසාර වර්ධනය හේතුවෙන්, 2024 වසරට සාපේක්ෂව 2025 වසරේ දී ජාත්‍යන්තර සංචාරක පැමිණීම් සියයට 3 සිට සියයට 5 දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කරන බව එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය පුරෝකථනය කරයි. කෙසේ වෙතත්, භූ දේශපාලනික අර්බුද හේතුවෙන් ඇතිවන අවදානම්, ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ ආන්තික කාලගුණික සිදුවීම් සංචාරක අංශයට ඇති ප්‍රධාන අභියෝග ලෙස හඳුනාගෙන ඇත.

සංචාරක අංශය සංවර්ධනය කිරීම සඳහා අනාගතයේ සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කළ හැකි නව සංචාරක වෙළඳපොළවල් හඳුනා ගැනීම සහ මෙම කලාපවලින් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. 2024 වසරේ දී ප්‍රංශයෙන් සහ නෙදර්ලන්තයෙන් සංචාරකයින්ගේ පැමිණීම් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, මෙම වෙළඳපොළවල් තුළ ශ්‍රී ලංකාවේ ජනප්‍රියතාවය පවත්වා ගැනීමට සහ එය තවදුරටත් ශක්තිමත් කිරීමට ප්‍රවර්ධන උත්සාහයන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරනු ලබයි. සමස්ත සංචාරකයින් සංඛ්‍යාව ඉහළ නැංවීමට සහ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට සමුද්‍රීය සංචාරක අංශවලට සැලකිය යුතු විභවයක් ඇති බැවින්, විශේෂයෙන් ඉන්දියාව වැනි අසල්වැසි රටවල් සමඟ නෞකා ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය සහ මගී යාත්‍රා සම්බන්ධතා ඇතුළුව සමුද්‍රීය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා තවදුරටත් පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

2025 වසරේ දී 'CEOWORLD' සඟරාව විසින් ප්‍රකාශයට පත් කරන ලද 'ඔබේ ජීවිත කාලය තුළ සංචාරය කිරීමට සුදුසු ලෝකයේ හොඳම රටවල්' ලැයිස්තුවේ ශ්‍රී ලංකාව 5 වන ස්ථානයට පත්විය. තවද, 2024 වසරේ දී ලන්ඩන් පදනම් කරගත් ජාත්‍යන්තර සඟරාවක් වන 'Time Out' විසින් ශ්‍රී ලංකාව තනිව සංචාරය කරන කාන්තා සංචාරකයින් සඳහා හොඳම ගමනාන්තය ලෙස පිළිගෙන ඇත. එපමණක් නොව, 2025 වසරේ දී බී.බී.සී ය (BBC) මඟින් සංචාරය කිරීමට සුදුසු හොඳම ස්ථාන ලැයිස්තුවේ ශ්‍රී ලංකාව 9 වන ස්ථානයට ඇතුළත් කර ඇත. මෙම පිළිගැනීම් ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉස්මතු කරන අතර, ලොව පුරා සංචාරකයින් මෙරට කෙරෙහි පොළඹවා ගැනීමට සහ ආකර්ෂණය කර ගැනීමට ඇති හැකියාව අවධාරණය කරයි. එබැවින්, ශ්‍රී ලංකාවට කලාපීය බාධාවන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමට සහ නැගී එන සහ විවිධ වූ වෙළඳපොළවල් වෙත තම ප්‍රවේශය පුළුල් කිරීමෙන් සංචාරක අංශයේ තිරසාර වර්ධනය සඳහා වඩාත් ශක්තිමත් පදනමක් ස්ථාපිත කිරීමට හැකියාව පවතී.

## 2.5 උද්ධමනය

2024 වසරේදී, උද්ධමන ගමන් මාර්ගය එහි පහළ යාමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවති අතර, වසරේ අග භාගය වන විට අවධමනකාරී තත්ත්වයකට මාරු විය. මේ සඳහා බලපාන ලද ප්‍රධාන සාධක අතරට දැඩි මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති, ගෝලීය සහ දේශීය සැපයුම් සීමාවන් ලිහිල් කිරීම, ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය වීම සහ ගෝලීය භාණ්ඩ මිල ගණන් පහළ යාම ඇතුළත් විය.


කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොපාමිද, 2021=100) වාර්ෂික වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 සැප්තැම්බර් මාසයේදී සෘණ අගයක් වාර්තා කළ අතර, 2015 සැප්තැම්බර් මාසයෙන් පසු එවැනි පළමු සිදුවීම ලෙස සියයට 0.5 ක අවධමනයක් වාර්තා කළේය. මෙම අවධමන ප්‍රවණතාවය අඛණ්ඩව පැවති අතර, 2024 දෙසැම්බර් වන විට සියයට 1.7 ක වාර්ෂික ලක්ෂ්‍යමය අවධමනයක් වාර්තා කළ අතර කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කොපාමිද, 2021=100) මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 දෙසැම්බර් මාසයේ දර්ශක අගය 195.1 සිට 2024 දෙසැම්බර් මාසයේදී 191.7 දක්වා පහත වැටුණි. මුදල් අගය ඉහළ යාම, මූල්‍යකරණ පිරිවැය අඩු කිරීම සහ සැපයුම් දාම ස්ථාවර කිරීම ඇතුළු සාර්ව ආර්ථික තත්ත්වයන්හි වැඩිදියුණු කිරීම් මෙම පහත වැටීමෙන් පිළිබිඹු විය.

මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2025 ජනවාරි මාසයේ 192.6 සිට 2025 මැයි මාසයේදී 192.8 දක්වා ඉහළගොස් ඇත. 2024 සඳහා වාර්ෂික සාමාන්‍ය කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය

සියයට 1.2 දක්වා තියුනු ලෙස පහත වැටුණු අතර, එය 2023 අවසානයේදී සියයට 17.4 ක්ව පැවති උද්ධමනය සැලකිය යුතු අඩුවීමක් වන අතර එමගින් වසර පුරා මිල පීඩනයන් අඛණ්ඩව ලිහිල් කිරීමක් පෙන්නුම් කරයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකයද (ජා.පා.මි.ද, 2021=100) කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ප්‍රවණතාවය හා සමාන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමන ප්‍රවණතාවක් පිළිබිඹු කළ අතර, එය 2023 අවසානයේ වාර්තා වූ සියයට 4.2 ට සාපේක්ෂව 2024 වසර අවසාන වන විට සියයට -2.0 දක්වා පහත වැටුණි. 2024 වසරේදී වාර්ෂික සාමාන්‍ය ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2023 වසරේදී වාර්තා වූ සියයට 16.5 ට සාපේක්ෂව, සියයට 1.6 දක්වා පහත වැටුණි. කෙසේවෙතත්, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන පරිදි, 2025 මැයි මාසයේදී මතුපිට උද්ධමනය සියයට -0.7 දක්වා සුළු වශයෙන් ඉහළ ගිය අතර එය 2025 ජනවාරි මාසයේදී සියයට -4.0 ක් විය.

**රූපසටහන 2.14 | මතුපට උද්ධමනය , ආහාර උද්ධමනය සහ ආහාර නොවන ද්‍රව්‍ය වල උද්ධමනය**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සටහන: 2022 ජනවාරි සිට 2023 දක්වා කො.පා.මි.ද. (2013=100), 2023 පෙබරවාරි සිට කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ.

ආහාර සහ බලශක්ති අයිතම බැහැර කරන ලද මූලික උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මගින් මනිනු ලබන මූලික උද්ධමනය 2024 දෙසැම්බර් වන විට සියයට 2.7 ක් දක්වා ඉහළ ගිය අතර එය 2023 ජනවාරි මාසයේ දී සියයට 0.6 ක් විය. මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2023 වසරේදී වාර්තා වූ සියයට 14.5 ට සාපේක්ෂව 2024 වසරේදී සියයට 3.3 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වෙතත්, ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික මූලික උද්ධමනය 2023 වසරේ දෙසැම්බර් වන විට වාර්තා වූ සියයට 0.9 ට සාපේක්ෂව, 2024 වසරේ දෙසැම්බර් වන විට සියයට 1.3 කින් වැඩි විය. 2023 වසරේදී වාර්තා වූ සියයට 15.8 ට සාපේක්ෂව 2024 වසරේදී වාර්ෂික සාමාන්‍ය ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මූලික උද්ධමනය සියයට 2.5 දක්වා අඩු විය. ඇතැම් මූල්‍ය පියවරයන් මිල මට්ටම්වල තාවකාලික වැඩිවීමකට හේතු වුවද, සමස්ත උද්ධමනය පුළුල් ලෙස පාලනය වී පැවතුන අතර, එමගින් සාර්ව ආර්ථික ස්ථායිකරණ උත්සාහයන්හි කාර්යක්ෂමතාව සහ උද්ධමන අපේක්ෂාවන් වැඩිදියුණු කළ බව පිළිබිඹු කෙරේ.

## 2.6 සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

2024 වසරේදී, ශ්‍රම වෙළෙඳපොළ මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් පැවති අතර, මුළු ශ්‍රම බලකාය මිලියන 8.316 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2023 වසරේදී වාර්තා වූ මිලියන 8.408 ට සාපේක්ෂව සියයට 1.2 ක අඩුවීමක් සනිටුහන් කරයි. ආර්ථිකය තුළ ව්‍යුහාත්මක ගැලපීම් පිළිබිඹු කරමින් රැකියා සහ විරැකියා සංඛ්‍යාලේඛන පහත වැටුණි. රැකියා අඩුවීම ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශයේ හැකිලීම් සමඟ සම්බන්ධ වූ අතර, සේවා අංශයේ, විශේෂයෙන් සංචාරක, සිල්ලර වෙළෙඳාම සහ තොරතුරු තාක්ෂණයේ රැකියා දිරිගන්වන වර්ධනයක් පෙන්නුම් කළේය. 2024 වසර තුළ කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය නොවෙනස්ව පැවතුනි.

ප්‍රධාන අංශ අතර ශ්‍රම බලකායේ ව්‍යාප්තිය, කෘෂිකර්මාන්ත අංශයේ සියයට 26.4 ක් ද, කර්මාන්ත අංශයේ සියයට 25.4 ක් ද, සේවා අංශයේ සියයට 48.3 ක් ද ලෙස වාර්තා විය. මෙම ප්‍රවණතාවය ප්‍රධාන රැකියා සපයන්නා ලෙස සේවා අංශයේ ප්‍රමුඛ භූමිකාව ශක්තිමත් කරන අතර, කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත අංශවල ශ්‍රම බලකාය පෙර වසරවලට සාපේක්ෂව සුළු පහත වැටීම් වාර්තා කළේය.

2023 වසරේදී සියයට 48.6 ක් ව පැවති ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2024 වසරේදී සියයට 47.4 දක්වා තවදුරටත් අඩු වූ අතර, එය 2021 වසරේ සිට අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. පිරිමි සහ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාත පිළිවෙළින් සියයට 68.0 සහ සියයට 30.8 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. මීට අමතරව, නව බඳවා ගැනීම් සඳහා අඛණ්ඩ සීමා කිරීම් සහ විශ්‍රාම ගැනීම් වැඩිවීම හේතුවෙන් රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අනුපාතය 2023 වසරේදී සියයට 14.6 සිට 2024 වසරේදී සියයට 14.3 දක්වා අඩු විය. එහෙත්, ආර්ථික ප්‍රකෘතිය මධ්‍යයේ නව බඳවා ගැනීම් හේතුවෙන් පෞද්ගලික අංශයේ රැකියා ප්‍රසාරණය වෙමින් මුළු රැකියා නියුක්තියෙන් සියයට 45.2 දක්වා වර්ධනය විය.

ශ්‍රම බලකායේ සහභාගීත්වය අඩු වුවද , විරැකියා අනුපාතය, 2023 වසරේදී සියයට 4.7 සිට 2024 වසරේදී සියයට 4.4 දක්වා පහත වැටුණි. පිරිමි විරැකියා අනුපාතය සියයට 3.5 දක්වා අඩු වූ අතර, කාන්තා විරැකියාව සියයට 6.8 දක්වා සුළු අඩුවීමක් දක්නට ලැබුණි. කෙසේවෙතත්, තරුණ අංශයේ අභියෝග තවමත් පවතින අතර, වයස අවුරුදු 15-24 අතර විරැකියාව සියයට 23.5 දක්වා සුළු වශයෙන් වැඩි විය.

## 2.7 කොටස් වෙළෙඳපොළ සංවර්ධනයන්

වැඩිදියුණු වන සාර්ව ආර්ථික මූලධර්ම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අඛණ්ඩ ප්‍රගතිය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතාවයන් මධ්‍යයේ, 2024 වසරේදී දේශීය

කොටස් වෙළෙඳපොළ ප්‍රවේසම් සහගත ශුභවාදී බවක් පිළිබිඹු කරන ලදී. වරින් වර අස්ථාවරත්වය තිබියදීත්, ප්‍රධාන මිල දර්ශක වසරේ ඉහළම අගය වාර්තා කළ අතර, එමඟින් වෙළෙඳපොළේ දිගුකාලීන විභවය පිළිබඳ ආයෝජක විශ්වාසය අලුත් වී ඇති බව පිළිබිඹු විය.

කොළඹ කොටස් වෙළෙඳපොළේ (CSE) සියලු කොටස් මිල දර්ශකය (ASPI) 2024 දෙසැම්බර් 31 වන දින වන විට වසරින් වසර සියයට 49.7 ක වර්ධනයක් වාර්තා විය. එසේම, වඩාත්ම ද්‍රවශීල සහ මූලික වශයෙන් ශක්තිමත් කොටස් නිරීක්ෂණය කරන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (S&P SL20) දර්ශකය, වසරින් වසර වර්ධනය සියයට 58.5 ක් ලෙස වාර්තා කරමින් 2024 වසර අවසන් වන විට 3,300 ක පමණ දර්ශක අගයකට ළඟා විය.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2023 වසර අවසානයේ පැවති රු. බිලියන 4,248.9 ට සාපේක්ෂව 2024 අවසානයේ දී රු. බිලියන 5,695.6 ක් ලෙස වාර්තා කරමින් සියයට 34.1 කින් ඉහළ ගියේය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2023 දෙසැම්බර් මාසයේ පැවති සියයට 15.4 සිට 2024 අවසානය වන විට සියයට 19.0 දක්වා සුළු වශයෙන් වැඩි විය.

කොළඹ කොටස් හුවමාරුවේ කොටස් වෙළෙඳාමේ සාමාන්‍ය දෛනික පිරිවැටුම 2024 වසරේ දී රු. මිලියන 2,240.2 ක් වූ අතර 2023 වසරේ දී දෛනික සාමාන්‍ය පිරිවැටුම රු. මිලියන 1,696.2 ට සාපේක්ෂව සියයට 32.1 ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. කෙසේවෙතත්, 2024 වසරේ දෛනික ගනුදෙනු සංඛ්‍යාව, 2023 වසරේ සිදු වූ දෛනික ගනුදෙනු 14,972 සිට 14,684 දක්වා අඩු වූ අතර එය අඛණ්ඩ ප්‍රවේසම් සහගත ආයෝජක හැසිරීම පිළිබිඹු කරයි. මේ අතර, කොටස් වෙළෙඳපොළේ විදේශීය සහභාගීත්වය මධ්‍යස්ථව පැවති අතර, ශුද්ධ විදේශ ගලා ඒම් රු. බිලියන 20.3 ක් පමණ වූ අතර, 2024 වසර සඳහා ප්‍රාථමික වෙළෙඳපොළ ගලා ඒම් ඇතුළුව 2024 වසර තුළ ආයෝජකයින් අතර ධනාත්මක දැක්මක් පිළිබිඹු කරයි.

කොළඹ කොටස් වෙළෙඳපොළේ (CSE) ලැයිස්තුගත කර ඇති මුළු සමාගම් සංඛ්‍යාව 284 ක් දක්වා අඩුවීමක් සිදුවී ඇත. ආයෝජකයින්ගේ අභිප්‍රායන් වැඩිදියුණු කිරීම සහ දිගු කාලීන ආයතනික ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා නියාමන වැඩිදියුණු කිරීම් සහ වැඩිදියුණු කළ වෙළෙඳපල යටිතල පහසුකම් 2024 වසරේදී හඳුන්වා දෙන ලදී.

**වගුව 2.17 | ප්‍රාග්ධන වෙළෙඳපොල වෙනස්වීම්**

| දර්ශකය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 =100) | 6,228 | 6,369 | 6,052 | 6,129 | 6,774 | 12,226 | 8,490 | 10,654 | 15,945 |
| එස්. ඇන්ඩ් පී.එස්.එල්. 20 දර්ශකය | 3,496 | 3,672 | 3,135 | 2,937 | 2,638 | 4,233 | 2,636 | 3,068 | 4,862 |
| වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණය (රු.බිලියන) | 2,745 | 2,899 | 2,840 | 2,851 | 2,961 | 5,489 | 3,847 | 4,249 | 5,696 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 295 | 296 | 297 | 289 | 283 | 296 | 290 | 290 | 284 |
| වාර්ෂික පිරිවැටුම (රු.බිලියන) | 176 | 221 | 200 | 171 | 397 | 1,173 | 687 | 411 | 538 |
| විදේශීය විකුණුම් (රු.මිලියන) | 74,275 | 94,627 | 100,316 | 68,272 | 104,165 | 86,689 | 36,863 | 37,088 | 58,492 |
| විදේශීය ගැණුම් (රු.මිලියන) | 74,625 | 112,285 | 77,067 | 56,537 | 52,889 | 39,410 | 67,488 | 41,451 | 48,013 |

මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළෙඳපොල හා ශ්‍රී ලංකා මහ බැංකුව

# 03

# ගෝලීය ආර්ථික ප්‍රවණතා

## 3.1 සමාලෝචනය[1]

මෙම වාර්තාව සකස්කරන මොහොත වන විට ගෝලීය වෙළෙඳාම ආශ්‍රිත අවිනිශ්චිතතා, භූ-දේශපාලන කැළඹීම් උත්සන්න වීම සහ සමස්ත ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්මට අවදානමක් මතුකර ඇත. එක්සත් ජනපදයේ නව ඉහළ ද්විපාර්ශික තීරුබදු හේතුවෙන් ගෝලීය සැපයුම් දාම කෙරෙහි බාධා ඇතිවනු ඇතැයි ද එමඟින් නිෂ්පාදන පිරිවැය වැඩි වී ගෝලීය ආයෝජන ප්‍රවාහවල වෙනස්කම් සිදුවනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අප්‍රේල් මස ප්‍රකාශනයට අනුව 2024 වසරේ දී වාර්තා වූ සියයට 3.3 ක් වූ ගෝලීය වර්ධනය, 2025 වසරේ දී සියයට 2.8 ක් දක්වා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම ආර්ථික පසුබෑම, ශ්‍රී ලංකාව වැනි ආනයන මත යැපෙන සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයනයන්ට, භාණ්ඩ මිල ගණන්වලට සහ, ආයෝජනයන්ට අභියෝග ඇති වීමට මෙන්ම මූල්‍ය තත්ත්වය තවදුරටත් තීව්‍ර වීමට හේතු වන අතර දිගුකාලීන ආර්ථික වර්ධන අපේක්ෂාවන් අඩාල කරනු ඇත.

2024 වසරේ දී ගෝලීය ආර්ථිකය, කෝවිඩ්-19 වසංගතයේ පසු කම්පන තත්ත්වයන්, සැපයුම් දාමයන්ට වූ බාධා, උද්ධමනකාරී පීඩන සහ මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම් ඇතුළු විවිධ අභියෝගයන්ට මුහුණ දෙන ලදි. උද්ධමනකාරී පීඩනය සමනය වීමත් සමඟ ආර්ථික වර්ධන වේගය මධ්‍යස්ථ වූ නමුත් ඇතැම් අංශවල වර්ධන වේගය අඩු මට්ටමක පවතී. ඒ හා සමානව, ගෝලීය මූල්‍ය තත්ත්වය ක්‍රමයෙන් ලිහිල් විය. කලාපීය විෂමතා දැඩි විය: ආසියාව, විශේෂයෙන් ඉන්දියාව සහ අග්නිදිග ආසියානු රටවල් ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළ ද, යුරෝ කලාපය සහ ලතින් ඇමරිකානු කලාපය තුල ආර්ථික වර්ධනය දුර්වල විය. විශේෂයෙන් නැගෙනහිර යුරෝපයේ සහ මැද පෙරදිග වර්ධන අපේක්ෂාවන් කෙරෙහි භූ දේශපාලනික කැළඹීම් අබණ්ඩව බලපාන ලදී. මෙයින් පෙනී යන්නේ ගෝලීය ප්‍රතිපත්ති සම්බන්ධතා තීරණාත්මක නමුත් ඒවා නොපැහැදිලි බවත්, බොහෝ රටවල් තම දේශීය ආර්ථිකයන් ආරක්ෂා කර ගැනීම සඳහා දේශීයත්වයට නැඹුරු වූ උපාය මාර්ග අනුගමනය කරන බවත්ය.

## 3.2 ගෝලීය නිෂ්පාදනය

2023 වසරේ දී සියයට 3.5 ක් වූ ගෝලීය වර්ධනය 2024 වසරේ දී සියයට 3.3 ක් දක්වා අඩු විය. අපේක්ෂිත සියයට 1.7 ක වර්ධනයට සමානව දියුණු ආර්ථිකයන් සියයට 1.8 කින් වර්ධනය විය. ඉහළ මූර්ත පොලී අනුපාතිකය, ක්‍රමයෙන් අඩුවූ රාජ්‍ය මූල්‍ය සහාය සහ වයස්ගත ජනගහනය වැඩිවීම සහ අඩු ඵලදායිතාව වැනි ව්‍යුහාත්මක අභියෝග මෙම දුර්වල වර්ධනයට සාධක විය. කෙසේ වුවද ශක්තිමත් දේශීය ඉල්ලුම, ශ්‍රම වෙළඳපොළ වැඩිදියුණු වීම් සහ ශක්තිමත් ආයෝජන ප්‍රවාහ හේතුවෙන් ආසියාව සහ උප සහරානු අප්‍රිකාව වැනි නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සියයට 4.3 ක ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය විය. 2024 වසරේ දී ප්‍රධාන වශයෙන් පාරිභෝගික අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ මූල්‍ය තත්ත්වය ලිහිල් වීමත් සමඟ පෞද්ගලික ආයෝජන යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් එක්සත් ජනපදය සියයට 2.8 ක මධ්‍යස්ථ ආර්ථික වර්ධන වේගයක් ළඟාකරගත් අතර, චීන දේපල වෙළෙඳපොළ දුර්වලතා මැඩපැවැත්වීම සඳහා චීන රජය විසින් ගන්නා ලද උත්තේජක ක්‍රියාමාර්ග හේතුවෙන් 2024 වසරේ දී චීනය සියයට 5.0 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ඉහළ බලශක්ති පිරිවැය සහ දැඩි ණය කොන්දේසි හේතුවෙන් යුරෝ කලාප ආර්ථිකය වර්ධනය 2024 වසරේ දී සියයට 0.9 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කරන ලදි.

නව වෙළෙඳ බාධකවල සෘජු බලපෑම් සහ වෙළෙඳ සබඳතා පළුදු වීම් හරහා ඇතිවෙන වක්‍ර බලපෑම් සමඟින් ඉහළ අවිනිශ්චිතතා සහ ආයෝජක අපේක්ෂා අඩුවීම හේතුවෙන් 2024 වර්ෂයේ දී වාර්තා වූ සියයට 3.3 ගෝලීය වර්ධනය 2025 වසරේ දී සියයට 2.8 ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර කෙටි කාලීනව 2026 වසරේදී ගෝලීය ආර්ථික වර්ධනය සියයට 3.0 දක්වා යථාතත්ත්වයට පත්වෙනු ඇත. දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2024 වසරේ දී සියයට 1.8 ක සිට 2025 වසරේ දී සියයට 1.4 ක් දක්වාත් ඉන්පසු 2026 වසරේ දී සියයට 1.5 ක් දක්වාත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2026 වසරේ දී එක්සත් ජනපදයෙහි ආර්ථික වර්ධනය තීරුබදු ගැටළු හේතුවෙන් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කරන අතර එය මධ්‍යස්ථ පෞද්ගලික පරිභෝජනය හේතුවෙන් සියයට 1.7 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. යුරෝ කලාපයේ ආර්ථික වර්ධනය, 2026 වසරේ දී සියයට 1.2 ක් දක්වා සාමාන්‍ය ලෙස වර්ධනය වීමට පෙර, ඉහළ යන අවිනිශ්චිතතා සහ තීරුබදුවල ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වර්ධනය මන්දගාමී වීම හේතුවෙන් 2025 වසරේ දී සියයට 0.8 ක් දක්වා සුළු වශයෙන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වන ආර්ථිකයන්හි ආර්ථික වර්ධනය 2025 වසරේ දී සියයට 3.7 ක් දක්වා සහ 2026 වසරේ දී සියයට 3.9 ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. අප්‍රේල් මස ප්‍රකාශයට පත්කරන ලද තීරුබදු හේතුවෙන් වඩාත්ම බලපෑමට ලක්වී ඇති නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ වර්ධනය 2025 වසරේ දී සියයට 4.5 ක් සහ 2026 වසරේ දී සියයට 4.6 ක් දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑතකදී ක්‍රියාත්මක කරන ලද තීරුබදුවල බලපෑම පිළිබිඹු කරමින් 2024 වර්ෂයේ වාර්තා වූ සියයට 5.0 ක අගයට සාපේක්ෂව 2025 වසරේ දී චීනයේ ආර්ථික වර්ධනය සියයට 4.0 දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වෙළෙඳ ප්‍රතිපත්තිවල දිගු කාලීන බලපෑම් හේතුවෙන් 2026 වසරේ දී ද ආර්ථික වර්ධනය සියයට 4.0 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, 2025 වසරේ දී ඉන්දියාවේ ආර්ථික වර්ධනය ශක්තිමත් ග්‍රාමීය පෞද්ගලික පරිභෝජනය හේතුවෙන් සියයට 6.2 ක ස්ථාවර අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තෙල් නිෂ්පාදනයට හා නැව් ගමනාගමනයට ඇති බාධා සහ වර්තමානයේ පවතින ගැටුම්වල බලපෑම් පහව යෑමත් සමඟ, මැදපෙරදිග සහ මධ්‍යම ආසියාව වසර කිහිපයක පුරා වාර්තා

1 "World Economic Outlook 2025". ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, "Global Financial Stability Report". ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, "Fiscal Monitor 2025". ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, "Commodity Markets Outlook". ලෝක බැංකුව, "Global Debt Report 2025". ආර්ථික සහයෝගිතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය යන ප්‍රකාශන මත පදනම්ව ඇත.

**වගුව 3.1 | ලෝක ආර්ථික තත්ත්වයන් සංක්ෂිප්තව - 2024**

| රට | දදේ.නි.වර්ධනය (වාර්ෂික ප්‍රතිශතක වෙනස) | 2024 උද්ධමනය (ප්‍රතිශතය) | සේවා වියුක්තිය (ප්‍රතිශතය) | රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | දළ ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| ආර්ජන්ටිනාව | -1.7 | 219.9 | 7.2 | 0.9 | 85.3 |
| ඔස්ට්‍රේලියාව | 1.0 | 3.2 | 4 | -2.2 | 49.8 |
| බ්‍රසීලය | 3.4 | 4.4 | 6.9 | -6.6 | 87.3 |
| කැනඩාව | 1.5 | 2.4 | 6.4 | -2.1 | 110.8 |
| චිලී | 2.6 | 3.9 | 8.5 | -2.7 | 42.0 |
| චීනය | 5.0 | 0.2 | 5.1 | -7.3 | 88.3 |
| ප්‍රංශය | 1.1 | 2.3 | 7.4 | -5.8 | 113.1 |
| ජර්මනිය | -0.2 | 2.5 | 3.4 | -2.8 | 63.9 |
| ග්‍රීසිය | 2.3 | 3 | 10.1 | -0.3 | 150.9 |
| ඉන්දියාව | 6.5 | 4.7 | 4.9 | -7.4 | 81.3 |
| ඉන්දුනීසියාව | 5.0 | 2.3 | 4.9 | -2.3 | 40.2 |
| ඉතාලිය | 0.7 | 1.1 | 6.6 | -3.4 | 135.3 |
| ජපානය | 0.1 | 2.7 | 2.6 | -2.5 | 236.7 |
| කොරියාව | 2.0 | 2.3 | 2.8 | -0.6 | 52.5 |
| මැලේසියාව | 5.1 | 1.8 | 3.2 | -4.0 | 70.4 |
| මෙක්සිකෝව | 1.5 | 4.7 | 2.7 | -5.7 | 58.4 |
| රුසියාව | 4.1 | 8.4 | 2.5 | -2.2 | 20.3 |
| සිංගප්පූරුව | 4.4 | 2.4 | 2.0 | 4.4 | 174.3 |
| දකුණු අප්‍රිකාව | 0.6 | 4.4 | 32.8 | -6.1 | 76.4 |
| ස්පාඤ්ඤය | 3.2 | 2.9 | 11.3 | -3.2 | 101.8 |
| ශ්‍රී ලංකාව | 5.0 | 1.2 | 4.4 | -6.8 | 96.1 |
| තායිලන්තය | 2.5 | 0.4 | 1.0 | -1.3 | 63.2 |
| එක්සත් රාජධානිය | 1.1 | 2.5 | 4.3 | -5.7 | 101.2 |
| එක්සත් ජනපදය | 2.8 | 3.0 | 4.0 | -7.3 | 120.8 |
| වියට්නාමය | 7.1 | 3.6 | 2.2 | -1.6 | 32.9 |
| වෙනිසියුලාව | 5.3 | 49.0 | ... | -3.6 | 164.3 |

මූලාශ්‍රය: "World Economic Outlook", ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප්‍රේල් 2025
*Fiscal Monitor*, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප්‍රේල් 2025
වාර්ෂික ආර්ථික විවරණය 2024, ශ්‍රී ලංකා මහ බැංකුව
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

... දත්ත නොමැත.

**වගුව 3.2 | ලෝක සහ කලාපීය නිමවුම**

වාර්ෂික ප්‍රතිශතක වෙනස

| | තත්‍ය | | පුරෝකථන | |
|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2026 |
| **ලෝක නිමවුම** | **3.5** | **3.3** | **2.8** | **3.0** |
| **දියුණු ආර්ථිකයන්** | **1.7** | **1.8** | **1.4** | **1.5** |
| ඇමරිකා එක්සත් ජනපදය | 2.9 | 2.8 | 1.8 | 1.7 |
| යුරෝ ප්‍රදේශ | 0.4 | 0.9 | 0.8 | 1.2 |
| ජර්මනිය | -0.3 | -0.2 | 0.0 | 0.9 |
| ප්‍රංශය | 1.1 | 1.1 | 0.6 | 1.0 |
| ඉතාලිය | 0.7 | 0.7 | 0.4 | 0.8 |
| ස්පාඤ්ඤය | 2.7 | 3.2 | 2.5 | 1.8 |
| ජපානය | 1.5 | 0.1 | 0.6 | 0.6 |
| එක්සත් රාජධානිය | 0.4 | 1.1 | 1.1 | 1.4 |
| කැනඩාව | 1.5 | 1.5 | 1.4 | 1.6 |
| **නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන්** | **4.7** | **4.3** | **3.7** | **3.9** |
| **නැගී එන සහ සංවර්ධනය වන ආසියාව** | **6.1** | **5.3** | **4.5** | **4.6** |
| චීනය | 5.4 | 5.0 | 4.0 | 4.0 |
| ඉන්දියාව | 9.2 | 6.5 | 6.2 | 6.3 |
| ඉන්දුනීසියාව | 5.0 | 5.0 | 4.7 | 4.7 |
| මැලේසියාව | 3.6 | 5.1 | 4.1 | 3.8 |
| තායිලන්තය | 2.0 | 2.5 | 1.8 | 1.6 |
| වියට්නාමය | 5.1 | 7.1 | 5.2 | 4.0 |
| **ලතින් ඇමරිකානු සහ කැරිබියානු** | **2.4** | **2.4** | **2.0** | **2.4** |
| බ්‍රසීලය | 3.2 | 3.4 | 2.0 | 2.0 |
| **නැගී එන සහ සංවර්ධනය වන යුරෝපය** | **3.6** | **3.4** | **2.1** | **2.1** |
| රුසියාව | 4.1 | 4.1 | 1.5 | 0.9 |
| **මැද පෙරදිග සහ දකුණු අප්‍රිකාව** | **2.2** | **2.4** | **3.0** | **3.5** |
| **උප සහරානු අප්‍රිකාව** | **3.6** | **4.0** | **3.8** | **4.2** |
| දකුණු අප්‍රිකාව | 0.7 | 0.6 | 1.0 | 1.3 |
| ශ්‍රී ලංකාව | -2.3 | 5.0 | 3.0 | 3.0 |

මූලාශ්‍ර: "World Economic Outlook" , ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් 2025
"IMF Country Report on Sri Lanka" ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මාර්තු 2025

කරන ලද මන්දගාමී වර්ධනයෙන් මිදී, 2024 වසරේ දී ඇස්තමේන්තුගත සියයට 2.4 වර්ධනයක සිට 2025 වසරේ දී සියයට 3.0 ක් දක්වා සහ 2026 වසරේ දී සියයට 3.5 ක් දක්වා වේගයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.3 ගෝලීය උද්ධමනය

2022-2023 වසරවල දී උච්චතම අවස්ථාවට පැමිණි ගෝලීය උද්ධමන තත්ත්වයන් 2024 වසරේ දී මධ්‍යස්ථ විය. 2024 වසරේ දී ගෝලීය මතුපිට උද්ධමනය සියයට 5.7 ක් විය. දියුණු ආර්ථිකයන්හි උද්ධමනය සියයට 2.6 ක් ලෙස මහ බැංකු ඉලක්ක වලට සමීප වූ අතර නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වන ආර්ථිකයන්හි උද්ධමන අනුපාත අඩු වෙමින් පැවතියද ඉහළ අගයක් විය. 2024 වසරේ දී නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වන ආර්ථිකයන්හි උද්ධමනය සියයට 7.7 ක් වූ අතර නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ උද්ධමනය සියයට 2.0 ක් විය. විශේෂයෙන්, ආහාර හා බලශක්ති වෙළඳ භාණ්ඩ මිල සාමාන්‍යකරණය වීමෙන් පිරිවැය පීඩනය සමනය විය. එසේ වුවද, ශක්තිමත් ශ්‍රම වෙළෙඳපොළ තත්ත්ව හේතුවෙන් සේවා උද්ධමනය ඉහළ මට්ටමක පැවතුනි. 2024 වසරේ දී ලතින් ඇමරිකා සහ කැරිබියානු සහ උප සහරා අප්‍රිකාව වැනි ප්‍රදේශ පිළිවෙළින් සියයට 16.6 ක සහ සියයට 18.3 ක ඉහළ උද්ධමන අගයන් වාර්තා කළ බැවින් ඒ සම්බන්ධයෙන් අඛණ්ඩ තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සුපරීක්ෂාවක් අත්‍යවශ්‍ය විය.

ගෝලීය මතුපිට උද්ධමනය, දියුණු ආර්ථිකයන් සඳහා සියයට 2.6 ක සැළකිය යුතු ලෙස ඉහළ යෑම සහ නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සඳහා සියයට 5.5 ක සුළු පහළ යාමත් සමඟම ගෝලීය මතුපිට උද්ධමනය 2025 වසරේ දී සියයට 4.3 ක් සහ 2026 වසරේ දී සියයට 3.6 ක් දක්වා තරමක් මන්දගාමී වේගයකින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වගුව 3.3 | සාමාන්‍ය පාරිභෝගික මිල ගණන් අනුව උද්ධමනය**

වාර්ෂික ප්‍රතිශතක වෙනස


| | තත්‍ය | | ප්‍රක්ෂේපණ | |
|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2026 |
| **ලෝකය** | **3.5** | **3.2** | **3.2** | **3.2** |
| **සංවර්ධිත ආර්ථිකයන්** | **4.6** | **2.6** | **2.5** | **2.2** |
| එක්සත් ජනපදය | 4.1 | 3.0 | 3.0 | 2.5 |
| යුරෝ කලාපය | 5.4 | 2.4 | 2.1 | 1.9 |
| ජර්මනිය | 6.0 | 2.5 | 2.1 | 1.9 |
| ප්‍රංශය | 5.7 | 2.3 | 1.3 | 1.6 |
| ඉතාලිය | 5.9 | 1.1 | 1.7 | 2.0 |
| ස්පාඤ්ඤය | 3.4 | 2.9 | 2.2 | 2.0 |
| ජපානය | 3.3 | 2.7 | 2.4 | 1.7 |
| එක්සත් රාජධානිය | 7.3 | 2.5 | 3.1 | 2.2 |
| කැනඩාව | 3.9 | 2.4 | 2.0 | 2.1 |
| නැගී එන වෙළෙඳපොල හා සංවර්ධනය වන ආර්ථිකයන් | | | | |
| **නැගී එන හා සංවර්ධනය වන ආසියාව** | **2.4** | **2.0** | **1.7** | **2.0** |
| චීනය | 0.2 | 0.2 | 0.0 | 0.6 |
| ඉන්දියාව | 5.4 | 4.7 | 4.2 | 4.1 |
| ඉන්දුනීසියාව | 3.7 | 2.3 | 1.7 | 2.5 |
| මැලේසියාව | 2.5 | 1.8 | 2.4 | 2.2 |
| තායිලන්තය | 1.2 | 0.4 | 0.7 | 0.9 |
| වියට්නාමය | 3.3 | 3.6 | 2.9 | 2.5 |
| **ලතින් ඇමරිකා සහ කැරිබියානු** | **14.8** | **16.6** | **7.2** | **4.8** |
| බ්‍රසීලය | 4.6 | 4.4 | 5.3 | 4.3 |
| **නැගී එන හා සංවර්ධනය වන යුරෝපය** | **17.1** | **16.8** | **13.5** | **8.7** |
| රුසියාව | 5.9 | 8.4 | 9.3 | 5.5 |
| **මැදපෙරදිග සහ මධ්‍යම ආසියාව** | **2.4** | **2.0** | **1.7** | **2.0** |
| **උප-සහරානු අප්‍රිකාව** | **17.6** | **18.3** | **13.3** | **12.9** |
| දකුණු අප්‍රිකාව | 5.9 | 4.4 | 3.8 | 4.5 |
| ශ්‍රී ලංකාව | 17.4 | 1.2 | 3.8 | 5.4 |

මූලාශ්‍ර: “World Economic Outlook” , ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් 2025
“IMF Country Report on Sri Lanka” ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මාර්තු 2025

## 3.4 පොලී අනුපාත


දියුණු හා නැගී එන ආර්ථිකයන්හි මහා බැංකු තීව්‍ර දැඩි මුදල් ප්‍රතිපත්ති වාතාවරණයක සිට ක්‍රමයෙන් ලිහිල් ප්‍රතිපත්ති ස්ථාවරයක් දක්වා ප්‍රතිපත්තිමය මාරු වීමත් සමඟ 2024 වසරේ දී ගෝලීය මූල්‍ය ප්‍රතිපත්ති පසුබිම තුල සැලකිය යුතු වලනයක් පෙන්නුම් කළේය. 2024 වසරේ අග භාගය වන විට එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, යුරෝපීය මහ බැංකුව සහ එංගලන්ත බැංකුව වැනි ප්‍රධාන මහ බැංකු තීව්‍ර ලෙස සිය දැඩි මුදල් ප්‍රතිපත්ති සුපරික්ෂාකාරී ලෙස ලිහිල් කරමින් පොලී අනුපාතික අඩු කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, උද්ධමන අපේක්ෂාවන් මනා ලෙස කළමනාකරණය කරමින් මූර්ත පොලී අනුපාතික ධනාත්මකව පැවතුනි. 2024 වසරේ මුල් මාස කීපය තුල බ්‍රසීලය සහ ඉන්දුනීසියාව වැනි සමහර නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් ක්‍රමයෙන් තම මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම් ආරම්භ කරන ලදී.

**රූප සටහන 3.1 | සාමාන්‍ය පාරිභෝගික මිල අනුව උද්ධමනය**




මූලාශ්‍රය: “World Economic Outlook”, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප්‍රේල් 2025

**රූප සටහන 3.2 | SOFR හි දින 30 ක සාමාන්‍යයෙහි සංචලන**




මූලාශ්‍රය: Moneycafe.com

ආරම්භක අවස්ථාවේදී මුදල් පුතිපත්ති දැඩි වීම හේතුවෙන් ඉහළ යන ලද දීර්ඝ-කාලීන පොලී අනුපාතිකය, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවලිය ලිහිල් වුවද ගෝලීය පදනම් වාරිකයන් ඉහළ යාම හේතුවෙන් අඛණ්ඩව ඉහළ අගයක පවතී. 2025 වසරේ ජනවාරි මස මැද භාගය වන තෙක් ණයකර නිකුත් කිරීම ඉහළ යාම, ඉහළ උද්ධමන අපේක්ෂා සහ අවදානම් අධිමිල හේතුවෙන් එක්සත් ජනපදයේ දීර්ඝ-කාලීන පොලී අනුපාතිකය අඩු විය. මෑත කාලීනව සිදු කරන ලද තීරුබදු නිවේදන හේතුවෙන් පොලී අනුපාතිකය නැවත ඉහළ ගොස් ඇත.

## 3.5 රාජ්‍ය මූල්‍ය තත්ත්වය

### 3.5.1 අයවැය හිඟය

2024 වසරේ දී බොහෝ ආර්ථිකයන්හි සමස්ථ අයවැය හිඟය සාමාන්‍යයෙන් සුළු වශයෙන් අඩු වූ නමුත්, 2020 වසරේ දී වාර්තා වූ පූර්ව වසංගත අවධියේ සාමාන්‍ය අයවැය හිඟයට වඩා වැඩිව පැවතුනි.

2024 වසරේ දී, දියුණු ආර්ථිකයන්හි දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස සියයට 4.7 ක අයවැය හිඟයක් පවත්වා ගෙන ගිය අතර නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වන ආර්ථිකයන්හි සාමාන්‍ය අයවැය හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 ක් විය. ඉහළ ගිය සමාජ ආරක්ෂණ වියදම්, ඉහළ ජාතික ආරක්ෂාව සම්බන්ධ වියදම් සහ රාජ්‍ය ආයෝජන පියවර මෙම අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය පීඩනයට හේතු විය. උප සහරා අප්‍රිකාව වැනි සමහර කලාපයන්ගේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සීමා වීම සහ ඉහළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් අයවැය හිඟය ඉහළ මට්ටමක පැවතුනි.

**වගුව 3.4 | මධ්‍යම රජයේ අයවැය ශේෂය : සමස්ත ශේෂය**

ද.දේ.නි. % ලෙස

| | තත්‍ය | | පුරෝකථන | |
|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2026 |
| **ලෝකය** | **-4.9** | **-5.0** | **-5.1** | **-4.7** |
| **සංවර්ධිත ආර්ථිකයන්** | **-4.6** | **-4.7** | **-4.3** | **-3.6** |
| කැනඩාව | 0.1 | -2.1 | -1.9 | -1.6 |
| **යුරෝ කලාපය** | **-3.6** | **-3.1** | **-3.2** | **-3.4** |
| ප්‍රංශය | -5.4 | -5.8 | -5.5 | -5.9 |
| ජර්මනිය | -2.5 | -2.8 | -3.0 | -3.5 |
| ඉතාලිය | -7.2 | -3.4 | -3.3 | -2.8 |
| ස්පාඤ්ඤය | -3.5 | -3.2 | -2.7 | -2.4 |
| ජපානය | -2.3 | -2.5 | -2.9 | -3.1 |
| එක්සත් රාජධානිය | -6.1 | -5.7 | -4.4 | -3.7 |
| එක්සත් ජනපදය | -7.2 | -7.3 | -6.5 | -5.5 |
| අනෙකුත් සංවර්ධිත ආර්ථිකයන් | -0.2 | -0.5 | -0.6 | -0.3 |
| **නැගී එන වෙළෙඳපොල ආර්ථිකයන් හා සංවර්ධනය වන ආර්ථිකයන්** | **-5.2** | **-5.5** | **-6.1** | **-5.9** |
| **නැගී එන වෙළෙඳපොළයන් චීනය හැර** | **-4.2** | **-4.3** | **-4.5** | **-4.2** |
| මැද පෙරදිග, උතුරු අප්‍රිකාවේ තෙල් නිපදවන්නන් හැර | -5.8 | -6.0 | -6.5 | -6.3 |
| ආසියාව | -6.4 | -6.7 | -7.6 | -7.6 |
| චීනය | -6.7 | -7.3 | -8.6 | -8.5 |
| ඉන්දියාව | -7.9 | -7.4 | -6.9 | -7.4 |
| යුරෝපය | -4.2 | -4.4 | -4.0 | -3.4 |
| රුසියාව | -2.5 | -2.2 | -1.0 | -1.2 |
| **ලතින් ඇමරිකා** | **-5.2** | **-4.8** | **-4.8** | **-4.0** |
| බ්‍රසීලය | -7.7 | -6.6 | -8.5 | -7.7 |
| මෙක්සිකෝව | -4.3 | -5.7 | -4.0 | -3.3 |
| මැද පෙරදිග, උතුරු අප්‍රිකාවල | 0.1 | -1.6 | -3.4 | -3.2 |
| සෞදි අරාබියාව | -2.0 | -2.8 | -4.9 | -4.9 |
| දකුණු අප්‍රිකාව | -5.4 | -6.1 | -6.6 | -6.1 |
| **අඩු ආදායම් හා සංවර්ධනය වන රටවල්** | **-3.9** | **-3.4** | **-3.5** | **-3.3** |
| කෙන්යාව | -5.7 | -5.5 | -5.4 | -5.0 |
| නයිජීරියාව | -4.2 | -3.4 | -4.5 | -4.5 |
| වියට්නාමය | -2.4 | -1.6 | -3.4 | -3.2 |
| **තෙල් නිපදවන්නන්** | **0.5** | **-0.9** | **-1.2** | **-1.3** |
| ශ්‍රී ලංකාව | -8.3 | -6.8 | -6.7 | -4.6 |

මූලාශ්‍ර: "World Economic Outlook" , ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් 2025
"IMF Country Report on Sri Lanka" ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මාර්තු 2025
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ජාතික හා ආර්ථික සුරක්ෂිතතාව සහතික කිරීමට සමගාමීව රාජ්‍ය මූල්‍ය අවකාශය යළි ස්ථාපිත කිරීම සහ රාජ්‍ය ණය තිරසාර මාවතකට යොමු කිරීම 2025 වසර තුළ ප්‍රමුඛතාවයන් ලෙස පවතී. මේ සඳහා තීරණාත්මක නමුත් වර්ධනයට හිතකර ගැළපීම් සහිත විශ්වාසනීය මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් අවශ්‍යය වේ. බලාපොරොත්තු වූවාට වඩා ඉහළ පොලී අනුපාතික හේතුවෙන් සමාජ ප්‍රතිලාභ සහ රාජ්‍ය ආයෝජන ඇතුළු අත්‍යවශ්‍ය වියදම් සීමා විය හැකි අතර, විදේශ ආධාර අඩු වීම, අඩු ආදායම් හා සංවර්ධනය වන රටවල මූල්‍යකරණ අවදානම් තවදුරටත් උග්‍ර කරනු ඇත. 2025 වසරේ දී එක්සත් ජනපදයේ ඉහළ හා අඛණ්ඩ මූල්‍ය හිඟය, චීනයේ දේශීය ඉල්ලුම අපේක්ෂිත මට්ටමට වඩා දුර්වල වීම, දිගු කාලීන අවිනිශ්චිතතාව සහ ඵලදායිතා වර්ධනය නොවෙනස් වීම යනාදිය රාජ්‍ය මූල්‍ය අවදානම් තීව්‍ර කරනු ඇත.

ලතින් ඇමරිකා රටවල අයවැය හිඟය 2023 වසරේ සියයට 5.2 ක සිට 2024 වසරේ දී සියයට 4.8 ක් දක්වා අඩු වූ අතර, එය 2026 වසරේ දී සියයට 4.0 දක්වා අඩු වීමට පෙර 2025 වසරේ දී සියයට 4.8 හි නොවෙනස්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ හා සමානව, අඩු ආදායම් හා සංවර්ධනය වන රටවල අයවැය හිඟය 2023 වසරේ දී සියයට 3.9 ක සිට 2024 වසරේ දී සියයට 3.4 ක් දක්වා පහත වැටී ඇති අතර 2026 වසරේ දී සියයට 3.3 ක් දක්වා අඩු වීමට පෙර 2025 වසරේ දී සියයට 3.5 ක් දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.5.2 රාජ්‍ය ණය

ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ගෝලීය ණය 2024 වසරේ දී සියයට 90 ඉක්මවා ඉහළ මට්ටමක පැවතුනි. එයින් විශාල ණය ප්‍රමාණයක් දියුණු ආර්ථිකයන් සතු වුවද, නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් කිහිපයක් ද උග්‍ර ණය තිරසාර අවදානම් වලට මුහුණ දී ඇත. ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීම් වඩාත් බහුල වෙමින් පැවති අතර, අවදානම් කළමනාකරණය කිරීම සඳහා බහුපාර්ශ්වික සහාය ඉතා වැදගත් විය. ඉහළ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අවකාශය සීමා වූ අතර, අනාගත කම්පනවලට ප්‍රතිචාර දැක්වීමට රජයන්ට ඇති හැකියාව අඩු විය. ප්‍රතිපත්ති සම්පාදනයේදී, වඩා හොඳ බදු පරිපාලනය සහ වියදම් කාර්යක්ෂමතාව ඇතුළු රාජ්‍ය මූල්‍ය විනය කෙරෙහි අවධානය යොමු කිරීම වැඩි වැඩියෙන් අවධාරණය වේ.

2024 වසරේ දී රාජ්‍යයන් සහ සමාගම් ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 25 ක් ගෝලීය වෙළෙඳපොළ තුලින් ණයට ගෙන ඇති අතර එය 2007 වසරේ දී වාර්තා වූ ණය ප්‍රමාණය මෙන් තුන් ගුණයක් පමණ වේ. ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ගෝලීය ණය ප්‍රමාණය 2023 වසරේ දී සියයට 91.3 ක සිට 2024 වසරේ දී සියයට 92.3 ක් දක්වා සියයට 1 කින් වර්ධනය විය. ගෝලීය ණය ප්‍රමාණය 2025 වසරේ සහ 2026 වසරේ දී පිළිවෙළින් සියයට 95.1 ක් සහ සියයට 96.7 ක් දක්වා තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්හි රාජ්‍ය ණය 2023 වසරේ දී සියයට 108.2 ක සිට 2024 වසරේ දී සියයට 108.5 දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇති අතර 2025 වසරේ දී එය සියයට 110.1 ක් දක්වා

තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය 2023 වසරේ දී සියයට 67.4 ක සිට 2024 වසරේ දී සියයට 69.5 ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම අනුපාතය 2025 වසරේ දී සියයට 73.6 ක් සහ 2026 වසරේ දී සියයට 76.7 ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වගුව 3.5 | මධ්‍යම රජයේ දළ ණය**

ද.දේ.නි. % ලෙස

| | තත්‍ය | | ප්‍රක්ෂේපන | |
|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2026 |
| **ලෝකය** | **91.3** | **92.3** | **95.1** | **96.7** |
| **සංවර්ධිත ආර්ථිකයන්** | **108.2** | **108.5** | **110.1** | **110.9** |
| එක්සත් ජනපදය | 119.0 | 120.8 | 122.5 | 123.7 |
| **යුරෝ කලාපය** | **87.4** | **87.7** | **88.7** | **89.7** |
| ජර්මනිය | 62.9 | 63.9 | 65.4 | 67.0 |
| ප්‍රංශය | 109.7 | 113.1 | 116.3 | 119.1 |
| ඉතාලිය | 134.6 | 135.3 | 137.3 | 138.5 |
| ස්පාඤ්ඤය | 105.0 | 101.8 | 100.6 | 99.0 |
| ජපානය | 240.0 | 236.7 | 234.9 | 233.7 |
| එක්සත් රාජධානිය | 100.4 | 101.2 | 103.9 | 105.4 |
| කැනඩාව | 107.7 | 110.8 | 112.5 | 110.9 |
| **නැගී එන වෙළෙඳපොල ආර්ථිකයන්** | **67.4** | **69.5** | **73.6** | **76.7** |
| නැගී එන හා සංවර්ධනය වන ආසියාව | | | | |
| චීනය | 82.0 | 88.3 | 96.3 | 102.3 |
| ඉන්දියාව | 81.2 | 81.3 | 80.4 | 79.6 |
| ඉන්දුනීසියාව | 39.6 | 40.2 | 41.0 | 41.0 |
| මැලේසියාව | 69.7 | 70.4 | 70.1 | 69.8 |
| තායිලන්තය | 62.3 | 63.2 | 64.5 | 66.0 |
| වියට්නාමය | 34.4 | 32.9 | 33.6 | 34.9 |
| **ලතින් ඇමරිකා** | **74.0** | **70.4** | **71.6** | **72.5** |
| බ්‍රසීලය | 84.0 | 87.3 | 92.0 | 96.0 |
| නැගී එන හා සංවර්ධනය වන යුරෝපය | 33.6 | 34.9 | 37.9 | 40.0 |
| රුසියාව | 19.5 | 20.3 | 21.4 | 22.5 |
| **මැද පෙරදිග, උතුරු අප්‍රිකාව** | **44.0** | **44.6** | **47.4** | **49.8** |
| **උප-සහරානු අප්‍රිකාව** | **56.3** | **56.1** | **55.4** | **53.3** |
| දකුණු අප්‍රිකාව | 73.4 | 76.4 | 79.6 | 81.7 |
| ශ්‍රී ලංකාව | 110.4 | 96.1 | 108.4 | 108.3 |

මූලාශ්‍ර: "World Economic Outlook" , ජාත්‍යන්තර මුල්‍ය අරමුදල, අප්‍රේල් 2025
"IMF Country Report on Sri Lanka" ජාත්‍යන්තර මුල්‍ය අරමුදල, මාර්තු 2025


ලතින් ඇමරිකානු රටවල ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය, 2023 වසරේ දී සියයට 74.0 ක සිට 2024 වසරේ දී සියයට 70.4 ක් දක්වා පහත වැටී ඇති අතර 2025 වසරේ සහ 2026 වසරේ දී පිළිවෙලින් සියයට 71.6 ක් සහ සියයට 72.5 ක් දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත. එසේම, අඩු ආදායම් හා සංවර්ධනය වෙමින් පවතින රටවල ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය 2023 වසරේ දී සියයට 53.7 ක සිට 2024 වසරේ දී සියයට 52.7 ක් දක්වා සුළු වශයෙන් පහත වැටී ඇති අතර 2025 වසරේ සහ 2026 වසරේ දී පිළිවෙලින් සියයට 52.0 ක් සහ සියයට 50.3 ක් දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහළ තීරුබදු සහ වැඩිවන අවිනිශ්චිතතාවය හේතුවෙන් ආදායම් සහ නිමැවුම් පහත වැටීමෙන් රාජ්‍ය ණය මට්ටම් අඛණ්ඩව ඉහළ යා හැකිය. ඉහළ භූ ආර්ථික අවිනිශ්චිතතාවයන් හේතුවෙන් විශේෂයෙන්ම ආරක්ෂක වියදම් වැඩි වීම රාජ්‍ය ණය මට්ටම් ඉහළයාමට හේතුවිය හැක. 2025-2026 වසර වල දී එක්සත් ජනපදය තුල ඇති දැඩි සහ අස්ථාවර මූල්‍ය තත්ත්වය වැඩි වන මූල්‍යයන වියදම් සහ අඩු වන ගෝලීය වෙළෙඳ භාණ්ඩ මිල ගණන් හරහා නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් වෙත ඍජු හා වක්‍ර ලෙස බලපෑ හැක.

## 3.6 විනිමය අනුපාතවල හැසිරීම

2024 වසරේ දී විනිමය වෙළෙඳපොළ මධ්‍යස්ථ විචලනයක් වාර්තා කරන ලදී. එක්සත් ජනපද ඩොලරය, ශක්තිමත් කාල සීමාවකට පසුව පොලී අනුපාත වෙනස පටු වීමත් සමඟ ක්‍රමයෙන් දුර්වල විය. ආයෝජකයන්ගේ විශ්වාසය වැඩිවීම නිසා බැඳුම්කර සහ හිමිකම් තුල ආයෝජන ඉහළ යාම නැගී එන වෙළෙඳපොළ විනිමය ඒකක සඳහා වන ඉල්ලුම වැඩි කිරීමට දායක විය. තවද, තඹ, තෙල් සහ කෘෂිකාර්මික භාණ්ඩ වැනි ප්‍රධාන වෙළෙඳ භාණ්ඩවල ඉහළ මිල ගණන් නැගී එන වෙළෙඳපොළ තුල වෙළෙඳ මිල අනුපාතය ඉහළ නැංවීමට හේතු වූ අතර, එමඟින් ශක්තිමත් ජංගම ගිණුම් ශේෂයන් සහ වෙළඳාමෙන් විදේශ විනිමය ගලා ඒම වැඩි වූ අතර එය විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමට සහාය විය. යුරෝ සහ ජපන් යෙන් යන විනිමය ඒකක යම්තාක් දුරට ශක්තිමත්භාවයක් පෙන්නුම් කළ අතර දුර්වල සාර්ව ආර්ථික මූලධර්ම හෝ දේශපාලන අස්ථාවරත්වය සහිත රටවල විනිමය ඒකක අවදානම් තත්ත්වවල පැවතිනි. කලාපීය විෂමතා දැඩි විය: උදාහරණයක් ලෙස, ලතින් ඇමරිකා විනිමයන් ස්ථාවර වුවද, සමහරක් අප්‍රිකානු විනිමයන් අවප්‍රමාණය වීමේ තර්ජන පැවතුනි.

**රූප සටහන 3.3 | ඇ.ඩොලරයට සාපේක්ෂව විනිමය අනුපාතය ( 2010 අප්‍රේල් 2025)**




මූලාශ්‍රය : www.x-rates.com

## 3.7 ලෝක වෙළෙඳාම

ලෝක වෙළඳාම 2023 වසරේ දී සියයට 1.0 ක සිට 2024 වසරේ දී සියයට 3.8 ක් දක්වා වර්ධනය වූ අතර 2025 වසරේ දී සියයට 1.7 ක් සහ ඉන් පසුව 2026 වසරේ දී සියයට 2.5 ක් ලෙස වර්ධනය වෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. සැපයුම් දාම බාධක ලිහිල් වීම සහ ආසියානු කලාපය තුල ශක්තිමත් ඉල්ලුම් සහායෙන් 2023 වසරේ දී නොවෙනස් වූ ලෝක වෙළඳාමෙහි පරිමාව 2024 වසරේ දී නැවත වර්ධනය විය. පාරිභෝගික භාණ්ඩ වෙළඳාම අභිබවා විශේෂයෙන් සංචාරක හා ඩිජිටල් සේවා ඇතුළු සේවා වෙළඳාම වර්ධනය විය. කෙසේ වෙතත්, සමාගම් දේශපාලනික වශයෙන් අස්ථාවර හෝ විශ්වාස කළ නොහැකි රාජ්‍ය මත රඳා පැවතීම අවම කිරීම සඳහා තම සැපයුම් දාම දේශපාලන වශයෙන් මිත්‍ර රටවලට මාරු කිරීම වැනි ව්‍යුහාත්මක වෙනස් වීම්, තාක්ෂණික විසංයෝජනය සහ ඉහළ යන ආරක්ෂණවාදී ප්‍රතිපත්ති හේතුවෙන්, ගෝලීය වෙළඳ ගතිකත්වය නැවත තීව්‍ර වෙමින් පවතී. ආසියා පැසිෆික් කලාපය ලෝක වෙළඳාමෙහි පරිමාව වර්ධනයේ කේන්ද්‍රස්ථානය ලෙස පවතින අතර, දේශීය ඉල්ලුම මන්දගාමී වීම හේතුවෙන් ලෝක වෙළඳාම කෙරෙහි යුරෝ කලාපයේ දායකත්වය දුර්වලව ඇත.

දියුණු ආර්ථිකයන්හි අපනයන පරිමාව 2023 වසරේ දී සියයට 0.5 ක සිට 2024 වසරේ දී සියයට 0.9 ක් දක්වා වර්ධනය වූ අතර, නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අපනයන පරිමාව 2023 වසරේ දී සියයට 1.1 ක සිට 2024 වසරේ දී සියයට 6.7 ක් දක්වා වර්ධනය විය. ඒ හා සමානව, දියුණු ආර්ථිකයන්හි ආනයන පරිමාව 2023 වසරේ දී වාර්තා කරන ලද සියයට 0.6 සිට 2024 වසරේ දී සියයට 1.4 ක් දක්වා වර්ධනය වූ අතර, නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආනයන පරිමාව 2023 වසරේ දී සියයට 3.1 ක සිට 2024 වසරේ දී සියයට 5.8 ක් දක්වා වර්ධනය විය. දියුණු ආර්ථිකයන්හි අපනයන පරිමාව 2025 වසරේ දී සියයට 1.2 ක් සහ 2026 වසරේ දී සියයට 2.0 ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ හා සමානව, 2025 වසරේ දී නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අපනයන පරිමාව සියයට 1.6 ක් සහ 2026 වසරේ දී සියයට 3.0 ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, දියුණු ආර්ථිකයන්හි ආනයන පරිමාව 2025 වසරේ දී සියයට 1.9 ක් සහ 2026 වසරේ දී සියයට 2.0 ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, නැගී එන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි 2026 වසරේ දී සියයට 3.4 ක් දක්වා වර්ධනය වීමට පෙර 2025 වසරේ දී ආනයන පරිමාව සියයට 2.0 ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.8 ලෝක පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ

### 3.8.1 බලශක්ති මිල ගණන්

බලශක්ති මිල ගණන් පසුගිය වසර කිහිපය තුල සිදුවූ ගෝලීය කැළඹීම් වලින් පසු ස්ථාවර වී ඇත. බලශක්ති මිල දර්ශකය 2023 වසරේ දී 106.9 ක සිට 2024 වසරේ දී 101.5 ක් දක්වා පහත වැටී ඇත. බලශක්ති මිල දර්ශකය 2025 වසර සහ 2026 වසරේ දී පිළිවෙළින් 83.8 ක් සහ 78.9 ක් දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසරේ දී බ්‍රෙන්ට් බොරතෙල් මිල ඇමරිකානු ඩොලර් 80.7 ක් වූ අතර එය 2025 වසරේ දී ඩොලර් 64.0 දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. බනිජ තෙල් අපනයන රටවල සංවිධානය සහ ඒ ආශ්‍රිත රටවල තෙල් නිෂ්පාදනය පුළුල් කිරීම සහ ගෝලීය වෙළෙඳපොළේ ඉල්ලුම් ශේෂය යථා තත්ත්වයට පත් වීම මෙම පහත වැටීමට සාධක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, තෙල් නිෂ්පාදක රටවලට සම්බාධක වැඩි වීම හේතුවෙන් තෙල් අපනයනය අඩු විය හැකි අතර එමඟින් බ්‍රෙන්ට් බොරතෙල් මිල ගණන් ඉහළ යා හැකිය.

**වගුව 3.6 | ලෝක වෙළඳ පරිමාව**

වාර්ෂික ප්‍රතිශතක වෙනස

| | සාමාන්‍ය 2007-2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාණ්ඩ හා සේවා වෙළඳාම | | | | | | | | | | | |
| ලෝක වෙළඳ පරිමාව | 3.4 | 5.5 | 4.0 | 1.2 | -8.4 | 10.9 | 5.7 | 1.0 | 3.8 | 1.7 | 2.5 |
| අපනයන පරිමාව | | | | | | | | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 3.0 | 4.9 | 3.4 | 1.4 | -8.8 | 9.7 | 5.9 | 1.1 | 2.1 | 1.2 | 2.0 |
| නැගී එන වෙළඳපොල හා සංවර්ධනය වන ආර්ථිකයන් | 4.4 | 6.3 | 4.1 | 1.0 | -6.8 | 12.9 | 4.6 | 1.1 | 6.7 | 1.6 | 3.0 |
| ආනයන පරිමාව | | | | | | | | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 2.5 | 4.8 | 3.8 | 2.0 | -8.2 | 10.2 | 7.3 | -0.6 | 2.4 | 1.9 | 2.0 |
| නැගී එන වෙළඳපොල හා සංවර්ධනය වන ආර්ථිකයන් | 5.5 | 7.1 | 5.2 | -0.4 | -9.8 | 12.2 | 4.0 | 3.1 | 5.8 | 2.0 | 3.4 |

මූලාශ්‍ර: “World Economic Outlook” , ජාත්‍යන්තර මුල්‍ය අරමුදල, අප්‍රේල් 2025


වගුව 3.7 | මිල සුචිය (2010=100)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බලශක්ති | 66.1 | 56.0 | 69.4 | 89.4 | 78.3 | 52.7 | 95.4 | 152.6 | 106.9 | 101.5 | 83.8 | 78.9 |
| බලශක්ති නොවන | 81.6 | 79.4 | 83.7 | 85.1 | 81.6 | 84.1 | 112.1 | 122.1 | 110.2 | 112.5 | 108.8 | 105.4 |
| කෘෂිකාර්මික | 87.9 | 87.5 | 87.0 | 86.6 | 83.1 | 87.1 | 107.7 | 119.3 | 110.9 | 115.0 | 114.0 | 110.3 |
| පාන වර්ග | 94.0 | 91.3 | 83.1 | 79.1 | 76.1 | 80.4 | 93.5 | 106.3 | 107.8 | 176.4 | 211.1 | 187.9 |
| ආහාර | 88.5 | 89.6 | 90.2 | 90.5 | 87.0 | 93.1 | 120.9 | 138.1 | 125.4 | 115.8 | 107.7 | 106.8 |
| තෙල් සහ තෙලෝද | 84.4 | 88.3 | 87.6 | 85.0 | 77.5 | 89.8 | 127.1 | 145.2 | 118.9 | 106.9 | 99.6 | 100.0 |
| ධාන්‍ය | 87.1 | 80.7 | 80.6 | 88.8 | 89.0 | 95.4 | 123.8 | 150.4 | 133.0 | 112.9 | 101.0 | 99.9 |
| අනෙකුත් ආහාර | 95.1 | 99.5 | 102.4 | 99.1 | 97.7 | 95.5 | 110.2 | 117.7 | 127.2 | 130.4 | 124.3 | 121.9 |
| අමුද්‍රව්‍ය | 83.3 | 80.2 | 81.0 | 80.9 | 77.3 | 75.8 | 82.9 | 80.3 | 77.1 | 81.6 | 79.8 | 79.4 |
| පොහොර | 98.4 | 77.7 | 74.3 | 82.5 | 81.4 | 74.6 | 152.3 | 235.7 | 153.5 | 117.6 | 126.1 | 124.8 |
| ලෝහ සහ ඛනිජ | 66.9 | 63.0 | 78.2 | 82.5 | 78.4 | 79.2 | 116.4 | 115.0 | 104.0 | 106.7 | 96.2 | 93.3 |
| වටිනා ලෝහ | 90.6 | 97.5 | 97.8 | 97.2 | 105.4 | 133.5 | 140.2 | 136.8 | 174.3 | 180.2 | 239.6 | 237.4 |

මූලාශ්‍රය: "Commodity Markets Outlook," ලෝක බැංකුව, අප්‍රේල් 2025

යුරෝ කලාපය තුල ස්වාභාවික වායු මිල, යුක්‍රේන-රුසියානු ගැටුමට ප්‍රතිචාර වශයෙන් තීව්‍ර විවිධාංගීකරණ ප්‍රයත්න සහ තොග පවත්වා ගෙන යෑම සමනය වීමත් සමඟ මේ වන විට සාමාන්‍ය මට්ටමට ළඟා වී ඇත. යුරෝ කලාපයෙහි ස්වාභාවික වායු මිල 2024 වසරේ දී බ්‍රිතාන්‍ය තාප ඒකක මෙට්‍රික් මිලියනයකට (mmbtu) ඇ.ඩොං. 11.0 ක් වූ අතර එක්සත් ජනපදයෙහි ස්වාභාවික වායු මිල 2024 වසරේ දී බ්‍රිතාන්‍ය තාප ඒකක මෙට්‍රික් මිලියනයකට ඇ.ඩොං. 2.2 ක් විය. කෙසේ වෙතත්, 2025 වසරේ දී යුරෝ කලාපය තුල ස්වාභාවික වායු මිල, බ්‍රිතාන්‍ය තාප ඒකක මෙට්‍රික් මිලියනයකට ඇ.ඩොං. 11.6 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් ජනපදයෙහි ස්වාභාවික වායු මිල ද බ්‍රිතාන්‍ය තාප ඒකක මෙට්‍රික් මිලියනයකට ඇ.ඩොං. 3.3 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය වශයෙන් පුනර්ජනනීය බලශක්ති ආයෝජන වැඩි වෙමින් පවතින අතර, එය මධ්‍ය කාලීනව බොරතෙල් ඉන්ධන ඉල්ලුම කෙරෙහි බලපානු ඇත.

රූප සටහන 3.4 |බොර තෙල් මිල (2018 - අප්‍රේල් 2025)




මූලාශ්‍රය: "Commodity Markets Outlook", ලෝක බැංකුව, අප්‍රේල් 2025

## 3.8.2 කෘෂිකාර්මික මිල ගණන්

අස්වැන්න ඉහළ යාම සහ පොහොර මිල අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී කෘෂිකාර්මික මිල ස්ථාවර විය. ගෝලීය ආහාර සුරක්ෂිතතාව ඉහළ නංවමින් තිරිඟු, බඩ ඉරිඟු සහ සෝයා බෝංචි වැනි ප්‍රධාන භෝග මිල සුළු වශයෙන් පහත වැටිණි. කෙසේ වෙතත්, නැගෙනහිර අප්‍රිකාව සහ අග්නිදිග ආසියාව වැනි අවදානමට ලක්විය හැකි කලාපවල නිෂ්පාදනයට සහ ආහාර මිල ගණන් වලට එල්-නිනෝ වැනි දේශගුණික විපර්යාස තර්ජන එල්ල විය. මීට අමතරව, අයහපත් කාලගුණය හේතුවෙන් සිදුවූ සැපයුම් බාධා, රෝග පැතිරීම සහ ඇතැම් ප්‍රධාන ආහාර පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය භූගෝලීය වශයෙන් ප්‍රදේශ කීපයකට පමණක් සීමා වීම හේතුවෙන් කෘෂිකාර්මික මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් විය.

කෘෂිකාර්මික මිල දර්ශකය 2023 වසරේ දී 110.9 ක සිට 2024 වසරේ දී 115.0 ක් දක්වා වැඩි විය. එම මිල ගණන් 2025 වසරේ දී සියයට 1 කින් සහ 2026 වසරේ දී තවදුරටත් සියයට 3 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2026 වසරේ දී ස්ථාවර වීමට පෙර, කපු සහ දුම්කොළ මිල අඩු වීම හේතුවෙන් 2025 වසරේ දී කෘෂිකාර්මික අමුද්‍රව්‍ය මිල ගණන් සියයට 2 කින් පමණ පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2025-26 වසර වල දී තිරිඟු මිල පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, වෙළෙඳ කම්පනයන් හේතුවෙන් පහළ යන ඉල්ලුම, සැපයුම් තත්ත්වයන් දැඩි වීම හරහා අර්ධ වශයෙන් සමනය වනු ඇත. මෑත කාලීනව වාර්තාගත ලෙස තිරිඟු නිෂ්පාදනය ඉහළ ගිය ද පරිභෝජනය ඉල්ලුම නිෂ්පාදන මට්ටම මදක් අභිබවා යෑම හේතුවෙන්

ගෝලීය තිරිඟු තොග පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. බෝග අස්වැන්නට අහිතකර ලෙස බලපාමින් තාප තරංග තීව්‍ර හා දීර්ඝ වෙමින් පවතින අතර මෙම දේශගුණික විපර්යාස කෘෂිකාර්මික මිල ගණන් මත ඉහළ පීඩනයක් ඇති කරනු ඇත.

### 3.8.3 ලෝහ සහ ඛනිජ මිල ගණන්

තඹ, ලිතියම් සහ නිකල් වැනි ලෝහ සහ ඛනිජ ද්‍රව්‍ය සඳහා බලශක්ති සංක්‍රාන්ති ඉල්ලුම හේතුවෙන් කාර්මික ලෝහ මිල ගණන් ස්ථාවරව පැවතුනි. චීනයේ ඉදිකිරීම් අංශය මන්දගාමී වීම හේතුවෙන් සමහර මූලික ලෝහ සඳහා වන ඉල්ලුම අඩු වුව ද, ගෝලීය වශයෙන් හරිත මූල්‍ය ව්‍යාපෘති මඟින් මූලික ලෝහ සඳහා ශක්තිමත් ඉල්ලුමක් ලැබිණි. ආයෝජන ප්‍රමාද වීම සහ නියාමන තහංචි ඇතුළු සැපයුම් අංශවල සීමාවන් අත්‍යවශ්‍ය ඛනිජ මිල ඉහළ යාමට සාධක විය.

2023 වසරේ දී ලෝහ හා ඛනිජ ද්‍රව්‍ය මිල දර්ශකය 104.0 සිට 2024 වසරේ දී 106.7 දක්වා සියයට 3 කින් පමණ වැඩි විය. මෙම ඉහළ යාමෙන් පසු ලෝහ හා ඛනිජ ද්‍රව්‍ය මිල දර්ශකය 2025 වසරේ දී සියයට 10.5 කින් ද 2026 වසරේ දී සියයට 2.9 කින් ද පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ දී රත්‍රං සහ රිදී මිල ගණන් ඉහළ යාමට භූ දේශපාලනික හා ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා සහ වෙළෙඳපොළ විචල්‍යතා මධ්‍යයේ වුවද, වටිනාකම නොවෙනස්ව පැවතීමට හේතු වී තිබේ. තවද, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවය සහ භූ දේශපාලනික කම්පනයන් තවදුරටත් ඉහළ ගියහොත් රත්‍රං සහ රිදී මිල ගණන් වර්තමාන ඇස්තමේන්තුවට වඩා ඉහළ යා හැකිය. ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතාවය අඩු වීමට පටන් ගනු ඇතැයි යන උපකල්පනය මත, 2026 වසරේ දී තරමක් අඩු වීමට පෙර 2025 වසරේ දී රත්‍රං මිල සියයට 36 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම අඩු වීම සමඟ වුවද, 2025-2026 වසර පුරෝකථන කාලය පුරාම රත්‍රං මිල ගණන් 2015-19 වසර සාමාන්‍යයට වඩා සියයට 155ක් පමණ වැඩිව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වෙළෙඳපොළ විචල්‍යතා මධ්‍යයේ වුවද වටිනාකම නොවෙනස්වන රත්‍රං වෙනුවට රිදී විකල්ප මූල්‍ය වත්කමක් වීම සහ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් සහ අර්ධ සන්නායක වැනි වර්ධනය වන කාර්මික අංශවල යෙදවුමක් වීම හේතුවෙන් රිදී සඳහා ඉල්ලුම 2025-2026 වසර කාලය තුළ අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කැනඩාව, පේරු, රුසියාව සහ එක්සත් ජනපදයෙහි නිෂ්පාදනය වැඩි වීම සහ රිදී ප්‍රතිචක්‍රීය සැපයුම්වල වර්ධනය ශක්තිමත් වීමත් සමඟ ගෝලීය රිදී සැපයුම අඛණ්ඩව වර්ධනය වීමට නියමිතය.

දකුණු අප්‍රිකා සහ උතුරු ඇමරිකාවේ ප්‍රධාන සැපයුම්කරුවන්ගේ නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් ප්ලැටිනම් මිල ගණන් 2025 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සියයට 10 කින් සහ 2026 වසරේ දී තවත් සියයට 2 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.9 ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඉදිරි දැක්ම

2024 වර්ෂයේ ගෝලීය ආර්ථික වර්ධනය, ශ්‍රී ලංකාව සඳහා ඉදිරි අවස්ථා සහ අවදානම් යන ද්විත්වයෙන්ම යුක්ත විය. ශ්‍රී ලංකාවේ ඇඟලුම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ආදී ප්‍රධාන අපනයන්ට ලෝක වෙළඳාම යථා තත්ත්වයට පත්වීම රුකුලක් විය. 2024 වසරේ දී, බලශක්ති හා ආහාර වැනි ගෝලීය පාරිභෝගික භාණ්ඩ මිල පහළ යෑම උද්ධමනකාරී පීඩන සමනය කළ අතර පාරිභෝගික ක්‍රය ශක්තිය වැඩි දියුණු කිරීමට සහාය විය.

ගෝලීය වෙළෙඳ කම්පනයන් තියුණු ලෙස ඉහළ යාමෙන් ගෝලීය ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම පිළිබඳ ගැටළු ඇති වී ඇති අතර ඒ හේතුවෙන්, මෙම වාර්තාව සම්පාදනය කරන අවස්ථාව වන විට කාර්මික වෙළඳ භාණ්ඩ මිල ගණන් පහත වැටී ඇත. ඒ හේතුවෙන්, විශේෂයෙන් කාර්මික යෙදවුම්, නිෂ්පාදන සහ ඇඟලුම් ආදී ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන විදේශ ඉල්ලුම දුර්වල වනු ඇත. 2025 වසරේ දී, ගෝලීය පොලී අනුපාතය අඩු වීම සහ ඩොලරය දුර්වල වීම හේතුවෙන් විදේශ ණය පීඩන අඩු වී මූල්‍ය තත්ත්වය වැඩි දියුණු විය හැක.

2025 වසරේ දී එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවේ අපනයන මත පැනවීමට යෝජිත සියයට 44 ක තීරුබද්ද, විශේෂයෙන් ම අපනයනය ක්ෂේත්‍රයට බලපාමින් රටේ ආර්ථිකයට සැලකිය යුතු පහරක් එල්ල කරනු ඇත. ශ්‍රී ලංකාවේ මුළු අපනයනයෙන් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් වන සහ ශ්‍රමිකයන් 350,000 කට අධික සංඛ්‍යාවක් සේවය කරනු ලබන ඇඟලුම් කර්මාන්තය, අධික තීරුබදු නිසා ශ්‍රී ලංකාවේ ඇඟලුම් සඳහා එක්සත් ජනපද වෙළෙඳපොළ තුළ ඇති තරඟකාරීත්වය අඩු වීම හේතුවෙන්, ඇණවුම් සහ ආදායම සීඝ්‍රයෙන් පහත වැටී දැඩි අභියෝගයකට මුහුණ දෙනු ඇත. මීට අමතරව, රබර්, මුහුදු ආහාර සහ යටිතල පහසුකම් සැපයුම වැනි අනෙකුත් අපනයන අංශවල යෙදවුම් පිරිවැය සහ ප්‍රවාහන අභියෝග තීරුබදු හේතුවෙන් ඉහළ යනු ඇති අතර එමඟින්, රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ප්‍රයත්නයට තවත් පීඩන ඇති කරනු ඇත.

මෙම තීරුබදුවලට ප්‍රතිචාර වශයෙන් එහි බලපෑම අවම කිරීම සඳහා මෙම තීරුබදුවල සමස්ථ බලපෑම තක්සේරු කොට රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් සාකච්ඡා පැවැත්වීම සඳහා ඉහළ පෙළේ කමිටුවක් පිහිටුවීම සහ ආසියාවේ සහ මැදපෙරදිග රටවල් සමඟ නව වෙළඳ ගිවිසුම්වලට එළඹීමේ හැකියාව පරීක්ෂා කිරීම ඇතුළු ක්‍රියාමාර්ග කිහිපයක් ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, මෙම පියවරයන්ගෙන් ප්‍රතිඵල ලබා ගැනීමට යම් කාලයක් ගත වනු ඇත.

ගෝලීය ආර්ථිකයේ වර්තමාන තත්ත්වය, සීමිත අපනයන ගමනාන්ත සහ අපනයන නිෂ්පාදන මත දැඩි ලෙස යැපෙන ශ්‍රී ලංකාව වැනි කුඩා, විවෘත ආර්ථිකයන්හි අවදානම අවධාරනය කරයි. ශ්‍රී ලංකාව මෙලෙස ප්‍රධාන දියුණු ආර්ථිකයන් වැනි සීමිත වෙළඳ හවුල්කරුවන් සමූහයක්

මත රඳා පැවතීම හේතුවෙන් වෙළඳ ප්‍රතිපත්තියේ හදිසි වෙනස්වීම්, ගෝලීය ඉල්ලුමේ උච්චාවචන සහ භූ දේශපාලනික කම්පනයන් ඇතුළු බාහිර කම්පනවලට අසමානුපාතික ලෙස නිරාවරණය වේ. වෙළෙඳ තීරුබදු පැනවීම් හෝ උපායමාර්ගික තරඟකාරීත්වය හේතුවෙන් කරනු ලබන සැපයුම් දාම වෙනස් කිරීම් වැනි මෑත කාලීන ප්‍රවණතා මඟින් අපනයන ඉපැයීම්, විදේශ සංචිත සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වයට සෘජු බලපෑමක් එල්ලවිය හැක. මෙම පසුබිම තුල, ශ්‍රී ලංකාව සහ ඒ හා සමාන ආර්ථිකයන් ගෝලීය අවිනිශ්චිතතාවන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ සීමිත වෙළඳ සබඳතා කිහිපයක් මත අධික ලෙස යැපීමෙන් මිදීම සඳහා තම අපනයන වෙළෙඳපොළ සහ නිෂ්පාදන පදනම යන දෙකම විවිධාංගීකරණය කිරීමේ දැඩි අවශ්‍යතාවය අවධාරණය කරයි.

# II කොටස

## සමස්ත අයවැය තත්ත්වය

# 04

# රාජ්‍ය ආදායම

## 4.1 සමාලෝචනය

2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදයෙන් අනතුරුව අඛණ්ඩව වසර දෙකක් මුළුල්ලේ ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කිරීමත් සමඟ රාජ්‍ය මූල්‍ය අංශය අත් කරගත් ඉහළ කාර්යසාධනය 2024 වසරේ දී ශ්‍රී ලංකාව ළඟා කරගත් ආර්ථික ස්ථාවරත්වය සඳහා ප්‍රධාන වශයෙන්ම දායක විය. 2022 වසරේ දී රජයේ බදු ආදායම ඓතිහාසික මෙන්ම ගෝලීය වශයෙන් අවම අගයක් වූ දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි. යෙන්) සියයට 7.3 දක්වා පහත වැටීම හේතුවෙන් අයවැය හිඟය පුළුල් වීම ආර්ථික අර්බුදය සඳහා බලපෑ ප්‍රධානතම හේතුවක් විය. රජය විසින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද දැඩි ක්‍රියාමාර්ග සහ වියදම් තාර්කිකකරණය කිරීම සඳහා ක්‍රියාවට නංවන ලද ප්‍රයත්නයන්ගෙන් ප්‍රතිලාභ ලබමින්, 2023 වසරේ දී රු. බිලියන 173.3 ක් එනම් ද.දේ.නි.යෙන් සියයට 0.6 ක් වූ ප්‍රාථමික අතිරික්තය 2024 වසරේ දී රු. බිලියන 649.6 ක් එනම් ද.දේ.නි.යෙන් සියයට 2.2 ක් දක්වා වර්ධනය වීමත් සමඟ රාජ්‍ය මූල්‍ය අවකාශය තවදුරටත් පුළුල් විය. 2024 වසරේ දී ප්‍රාථමික අතිරික්තය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ නියම කර ඇති රු. බිලියන 300 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කය ඉක්මවා යන ලදී.

2023 වසරේ අග භාගයේ සිට රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රයත්නයන්හි ද, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය වීමෙහි ද සාධනීය ප්‍රතිඵල පිළිබිඹු කරමින් 2024 වසරේ දී, ප්‍රදාන ද ඇතුළු රජයේ සමස්ත ආදායම, නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එබැවින්, 2024 වසරේ දී ප්‍රදාන ද ඇතුළුව රජයේ සමස්ත ආදායම, වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 99.1 ක් ළඟා කරගෙන ඇති අතර එය ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ඉතිහාසය තුළ ඓතිහාසික වශයෙන් වාර්තා කරන ලද ඉහළම අගය විය. ප්‍රදාන ද ඇතුළුව රජයේ සමස්ත ආදායම නාමික වශයෙන් 2023 වසරේ දී වූ රු.බිලියන 3,074.3 සිට 2024 වසරේ දී රු. බිලියන 4,090.8 දක්වා සියයට 33.1 කින් වර්ධනය විය. ප්‍රදාන හැර රජයේ ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 3,048.8 සිට 2024 වසරේ දී රු. බිලියන 4,030.8 දක්වා සියයට 32.2 කින් වැඩි විය.

එසේම, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස ප්‍රදාන ද ඇතුළු රජයේ ආදායම, 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව සියයට 0.6 කින් ඉක්මවා යමින් 2023 වසරේ දී වූ සියයට 11.2 සිට 2024 වසරේ දී සියයට 13.7 දක්වා වර්ධනය විය. බදු නොවන ආදායම සියයට 0.1 කින් පහළ ගිය ද, ද. දේ. නි. යට බදු ආදායම දක්වන අනුපාතය ප්‍රතිශතාංක 2.5 කින් සියයට 12.4 දක්වා ඉහළ යාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2024 වසරේ දී ද. දේ. නි. යේ ප්‍රතිශතකයක් ලෙස බදු ආදායම 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව වන සියයට 12.1 ප්‍රතිශතාංක 3.0 කින් ඉක්මවා යන ලදී. එය 2015 සහ 2019 කාලය අතර පූර්ව වසංගත වසර පහෙහි සාමාන්‍යය අගය වූ සියයට 11.4 ට වඩා ඉහළ අගයක් විය. 2024 වසරේ දී ද. දේ. නි.යට බදු ආදායම දක්වන අනුපාතය වර්ධනය වීම සඳහා බදු පදනම පුළුල් කිරීම, බදු අනුකූලතාවය සහ ආදායම් පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයන් ඇතුළුව රජය මඟින් රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම ප්‍රතිශතාංක 2.2 කින් වර්ධනය වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම ආදිය හේතු විය. ද.දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස ප්‍රදාන හැර රජයේ ආදායම 2024 වසර සඳහා අපේක්ෂිත වාර්ෂික ඇස්තමේන්තුව වූ සියයට 13.0 ප්‍රතිශතාංක 0.5 කින් ඉක්මවා යමින් 2023 වසරේ දී වූ සියයට 11.1 සිට 2024 වසරේ දී සියයට 13.5 දක්වා ප්‍රතිශතාංක 2.4 කින් වර්ධනය විය.

ඉතිහාසයේ ප්‍රථම වතාවට, ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු.බිලියන 911.4 සිට 2024 වසරේ දී

**වගුව 4.1 | රාජ්‍ය ආදායම් සාරාංශය**

රු. මිලියන

| අයිතමය | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **1,463,810** | **2,012,589** | **3,074,324** | **4,090,808** |
| **මුළු ආදායම** | **1,457,071** | **1,979,184** | **3,048,822** | **4,030,838** |
| බදු ආදායම | 1,298,019 | 1,751,132 | 2,720,563 | 3,704,577 |
| ආදායම් බදු | 302,115 | 534,021 | 911,355 | 1,026,199 |
| භාණ්ඩ හා සේවා මත බදු | 646,068 | 875,995 | 1,420,089 | 2,200,890 |
| විදේශ වෙළෙඳාම මත බදු | 349,836 | 341,116 | 389,118 | 477,488 |
| බදු නොවන ආදායම් | 159,052 | 228,052 | 328,259 | 326,261 |
| **ප්‍රදාන** | **6,740** | **33,405** | **25,502** | **59,970** |
| **ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස** | | | | |
| **ආදායම සහ ප්‍රදාන** | **8.3** | **8.4** | **11.2** | **13.7** |
| **මුළු ආදායම** | **8.3** | **8.2** | **11.1** | **13.5** |
| බදු ආදායම | 7.4 | 7.3 | 9.9 | 12.4 |
| බදු නොවන ආදායම | 0.9 | 0.9 | 1.2 | 1.1 |
| **ප්‍රදාන** | **0.04** | **0.1** | **0.1** | **0.2** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

රු. බිලියන 1,026.2 දක්වා ළඟා වෙමින් රු. ට්‍රිලියනය ඉක්මවා යන ලදී. මෙම කාර්යසාධනය, ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා වන ප්‍රයත්නයන්හි සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් පසුගිය වසරට සාපේක්ෂව සියයට 12.6 ක වර්ධනයක් සහ 2024 වසර සඳහා වූ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 95.0 ක ලඟා කර ගැනීමක් පිළිබිඹු කරයි. මෙම ඉහළ කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ආදායම් බදු පදනම සැළකිය යුතු ලෙස පුළුල් වීම සහ රාජ්‍ය ආදායමෙහි කාර්යක්ෂමතාව වර්ධනය වීම කෙරෙහි බලපෑ, 2023 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දුන් පුළුල් බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මාලාවය. මෙම ප්‍රතිසංස්කරණ මඟින් වඩාත් ප්‍රගතිශීලී, සරල කරන ලද සහ නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට හැකි ආදායම් බදු ක්‍රමයක් කරා ප්‍රවිෂ්ඨ වීම සඳහා වන ක්‍රමෝපායික ප්‍රවේශයේ සැළකිය යුතු පරිවර්තනයක් පෙන්නුම් කරයි. ආදායම් කාර්යසාධනයෙහි කැපී පෙනෙන වර්ධනය මඟින් බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වර්ධනය වීම සහ බදු පරිපාලන කාර්යක්ෂමතාවය වර්ධනය වීම පිළිබිඹු වන අතර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ දී ප්‍රවේශමෙන් සැලසුම් කරන ලද බදු ප්‍රතිපත්තියෙහි තීරණාත්මක කාර්යභාරය අවධාරණය කරනු ලබයි. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2024 වසර තුළ දී 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම්වල සම්පූර්ණ බලපෑම ළඟා කර ගැනීම, රාජ්‍ය හා පෞද්ගලික අංශවල වැටුප් ඉහළ නැංවීම සහ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම ආදිය වේ.

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 694.5 සිට 2024 වසරේ දී රු. බිලියන 1,309.7 දක්වා සියයට 88.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වෙමින් ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. ට්‍රිලියනය ඉක්මවා යන ලදී. 2024 වසරේ දී රාජ්‍ය ආදායම සඳහා එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, නාමික වශයෙන් විශාලතම දායකත්වය දැක්වීය. දේශීය ක්‍රියාකාරකම් මත වන එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 469.1 සිට 2024 වසරේ දී රු. බිලියන 712.2 දක්වා සියයට 51.8 කින් වර්ධනය වී ඇති අතර ආනයන මත වන එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 225.4 සිට 2024 වසරේ දී රු. බිලියන 597.5 දක්වා සියයට 165.1 කින් වර්ධනය විය. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බද්ද සඳහා වන බදු අනුපාතය ඉහළ නැංවීම, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම සහ එකතු කළ අගය මත බද්ද සඳහා බලපෑ නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් ඉවත් කිරීම සහ ආනයන සීමා කිරීම් ක්‍රමයෙන් ඉවත් කිරීම ය. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් තිබියදී වුව ද, මෙම වර්ධනය 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 93.5 ක් පමණක් නියෝජනය කළ අතර, එයින් පැහැදිළි වන්නේ සාධනීය මට්ටමේ කාර්යසාධනයක් පැවතුනේ වුවද, ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා තවමත් යම් ඉඩ ප්‍රස්තාවක් පවතින බවයි. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායමේ සුවිශේෂී වර්ධනය මඟින් සාර්ව ආර්ථිකය පුළුල් ලෙස යථාවත් වීම සහ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම වැටුප් වර්ධනය වීමත් සමඟ ඉහළ ගිය පරිභෝජන ප්‍රවණතා ආදිය හේතුවෙන් එකතු කළ අගය මත බදු පදනම පුළුල් වීමේ ධනාත්මක බලපෑම් පිළිඹිබු කරයි. 2024 වසරේ ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා පහත හෙළීම සහ ආනයන වර්ධනය වීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 216.2 සිට 2024 වසරේ දී රු. බිලියන 250.9 දක්වා සියයට 16.0 කින් වර්ධනය විය.

දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායමෙහි සුළු අඩුවීමක් හැර නිෂ්පාදන/ සුරා බදු අය කළ හැකි සියළුම අයිතමවලින් ලැබෙන ආදායම වර්ධනය වීම හේතුවෙන් නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2023 වසරේ දී වූ සියයට 1.7 සිට 2024 වසරේ දී සියයට 2.0 දක්වා වර්ධනය විය. සියලුම වර්ගවල පෙට්‍රල් සහ ඩීසල් ආනයනයේ ශුද්ධ වැඩිවීම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය වැඩිවීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මත වූ නිෂ්පාදන බද්දෙන් ලද ආදායම වර්ධනය විය. ඇතැම් යෝජනා ක්‍රම යටතේ මෝටර් රථ ආනයනය පුළුල් කිරීම, මත්පැන් මත සුරා බද්ද සඳහා වන බදු අනුපාත ඉහළ නැංවීමේ බලපෑම හේතුවෙන් මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම ඉහළ යාම සහ උද්ධමනයට ගැලපෙන පරිදි නිෂ්පාදන බදු ගැළපීම් ආදිය නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද ආදායම සඳහා බොහෝ දුරට දායක විය.

වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද , විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද , රේගු ආනයන බදු සහ සෙස් බද්ද මඟින් ලද ආදායම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත බද්දෙන් ලද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී වූ සියයට 1.4 සිට 2024 වසරේ දී සියයට 1.6 දක්වා වර්ධනය විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මඟින් ලද ආදායම සාධනීය කාර්යසාධනයක් පෙන්වීය. 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව සියයට 21.3 කින් ඉක්මවා යමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 51.3 සිට 2024 වසරේ දී රු. බිලියන 115.2 දක්වා සියයට 124.4 කින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සීනි සහ අර්තාපල් සඳහා තීරු බදු අනුපාත ඉහළ නැංවීම, ආනයන සීමාවන් ලිහිල් කිරීම, ඉලක්කගත ප්‍රතිපත්ති ගැලපුම් සහ ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟම ඉල්ලුම වර්ධනය වීමයි.

ප්‍රධාන වශයෙන්ම 2024 වසරේ දී රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ලද ලාභ සහ ලාභාංශවලින් වන ලැබීම් සියයට 46 කින් අඩු වීම හේතුවෙන් 2023 වසරේ දී වූ රු. බිලියන 328.3 සිට 2024 වසරේ දී රු. බිලියන 326.3 දක්වා සියයට 0.6 කින් බදු නොවන ආදායම අඩු විය.

**විශේෂ සටහන 4.1 | රජයේ ප්‍රධාන ආදායම් ආයතන විසින් 2024 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු පරිපාලනමය ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය ආදායම් රැස් කිරීමේ ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීම, බදු අනුකූලතාවය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ දූෂණ අවදානම් අවම කිරීම සඳහා ප්‍රධාන පරිපාලනමය ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. 2024 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාමාර්ග:

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව:

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නිර්දේශයන්ට අනුකූලව සහ ජාත්‍යන්තර මුදල් විශුද්ධිකරණය විරෝධී සහ ත්‍රස්ත විරෝධී මූල්‍යයන ගිවිසුම් යටතේ ඇති බැඳීම් අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් බදු සම්බන්ධ වැරදි පිළිබඳව අපරාධ විමර්ශන ආරම්භ කිරීම.
- රැකියා සහ පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින් සඳහා 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සරල කළ පුද්ගල ආදායම් බදු වාර්තා පෝරමයක් හඳුන්වා දීම.
- බදු අනුකූලතා අධීක්ෂණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා විගණන තේරීම් ක්‍රමවේදය අවදානම් පාදක ප්‍රවේශයකට මාරු කිරීම හරහා අවදානම් කළමනාකරණ ඒකකය පුළුල් කිරීම.
- 2025 ඔක්තෝබර් මාසයේදී සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අහෝසි කිරීමෙන් පසු අපනයනකරුවන් සඳහා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් කඩිනම් කිරීම සඳහා ඒ වෙනුවෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඒකකයක් ස්ථාපිත කරමින් අපනයනකරු ආපසු ගෙවීම් ඒකකය ආරම්භ කිරීම.
- බලාත්මක කිරීමේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා 2025 ජනවාරි 20 දින ඒ සඳහාම වෙන්වූ අපරාධ පරීක්ෂණ ඒකකයක් පිහිටුවීම.
- මානව සම්පත් කළමනාකරණ ඒකකයේ යම් යම් කටයුතු සඳහා ආදේශ කරමින්, අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාලනය හා වගවීම පිළිබඳ පිළිගත් භාවිතයන් සමඟ අනුකූල වෙමින්, අභ්‍යන්තර කටයුතු සුපරීක්ෂණය සඳහා 2025 මාර්තු 20 දින අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම.

## ඉදිරි දැක්ම:

බදු පරිපාලනය වැඩිදුරටත් ශක්තිමත් කිරීම සහ බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් උපාය මාර්ගික මූලාරම්භයන් ගණනාවක් වැඩිදියුණු කරමින් පවතී. විගණනය හා ආපසු ගෙවීම් සම්බන්ධ එහි කාර්යභාරය ශක්තිමත් කරමින් සහ එහි මෙහෙයුම් ධාරිතාව හා විශ්ලේෂණාත්මක හැකියාවන් ඉහළ නැංවීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකය වැඩිදියුණු කෙරෙමින් පවතී. අපනයන ආපසු ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා විශේෂිත ඒකක 2ක් වශයෙන් අපනයන ආපසු ගෙවීම් තහවුරු කිරීමේ ඒකකය සහ අපනයන ආපසු ගෙවීම් සැකසුම් ඒකකය ස්ථාපිත කොට ඇත. සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අවලංගු කිරීම හේතුවෙන් මුදල් ආපසු ගෙවීමේ හිමිකම් වැඩිවීමට සූදානම් වීමක් ලෙස, නිවැරදි හා කාලෝචිත ගෙවීම් සහතික කිරීම සඳහා අවදානම් මත පදනම් වූ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ සැකසුම් පද්ධතියක් සංවර්ධනය වෙමින් පවතී. මීට අමතරව, 2025 ඔක්තෝබර් 1 වන දින සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය විධිමත් ලෙස අවලංගු කිරීමට පෙර, 2025 ජූලි 1 වන දින වන විට එකතු කළ අගය මත බදු වාර්තා අනිවාර්ය ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් වන ගොනු කිරීමකට මාරුවීම පහසු කිරීම සඳහා පුළුල් එකතු කළ අගය මත බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ සමඟම, 2024 සිට අලුතින් ලියාපදිංචි වූ බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව වැඩිවෙමින් පවතින බැවින්, ආදායම් බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී.

## ශ්‍රී ලංකා රේගුව:

- ආයතනික දුර්වලතා මහහරවා ගැනීමට සහ බදු පරිපාලනය, වෙළඳ පහසුකම් සැපයීම සහ බලාත්මක කිරීමෙහි තිරසාර වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා ක්‍රියාවට නැංවිය හැකි ක්‍රියාකාරී සැලැස්මක් සහ අධීක්ෂණ පද්ධතියක සහාය ඇතිව 2024–2028 උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම.
- ශ්‍රී ලංකා රේගුව තුළ සිදුවන විෂමාචාර, දූෂණ සහ සදාචාර විරෝධී ක්‍රියාවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමෙන් ආයතනික විශ්වාසනීයත්වය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශයන්ට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ අභ්‍යන්තර කටයුතු ඒකකයක් ස්ථාපිත කිරීම.

**විශේෂ සටහන 4.1 | රජයේ ප්‍රධාන ආදායම් ආයතන විසින් 2024 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු පරිපාලනමය ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම සම්බන්ධයි...**

- "නිවැරදි මිනිසා නිවැරදි වේලාවට නිවැරදි රැකියාවට" පත් කිරීමේ මූලධර්මය හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ සහ ආදායම් කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ ආයතනික ප්‍රමුඛතා සමඟ නායකත්ව භූමිකාවන් උපායමාර්ගිකව පෙළගැස්වීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මාරු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම.
- ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල විසින් සතිපතා වාර්තා කිරීම, ඵලදායී තරඟකාරීත්වයක් වර්ධනය කිරීම, එකතු නිෂ්කාශන කාර්යයන් වේගවත් කිරීම සහ සමස්ත ආදායම් රැස් කිරීම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම තුළින් ආයතනික කාර්ය සාධනය මෙහෙයවීම සඳහා "දින 80 විශිෂ්ටතා වැඩසටහන" දියත් කිරීම.
- නීතිමය නියමයන්ට අනුකූල වෙළඳුන් සඳහා වෙළඳ පහසුකම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරන අතරම, ඉහළ අවදානම් සහිත භාණ්ඩ තොග ඵලදායී ලෙස ඉලක්ක කර ගනිමින් ආදායම් සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සඳහා අවදානම් කළමනාකරණ නිර්ණායක සංශෝධනය කිරීම.
- අනුකූල නොවන ආනයන අනාවරණය කර ගැනීම සඳහා ඉහළ සාර්ථකත්ව අනුපාතයක් ඇති කිරීම සහ අමතර ආදායම වැඩි කිරීම සඳහා බහාලුම් භාණ්ඩ පරීක්ෂණ අධීක්ෂණය වැඩිදියුණු කිරීම.
- නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සපයන අතරම ආදායම උපරිම කිරීම සඳහා ශක්තිමත් ආයතනික කැපවීමක් පිළිබිඹු කරමින් බදු පරිපාලනය සඳහා උපායමාර්ගික කාර්ය සාධනය මත පදනම් වූ සහ අවදානම්-ප්‍රතිචාරාත්මක ප්‍රවේශයක් යොදා ගැනීම.

## ඉදිරි දැක්ම:

ආදායම් පරිපාලනය තුළ කාර්ය සාධනය සහ වගවීමේ සංස්කෘතියක් ඇතුළත් කිරීම සහ ගැඹුරු ප්‍රතිසංස්කරණ කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ක්‍රියාකාරී සැලැස්ම දැඩි ලෙස අධීක්ෂණය කිරීමත් සමඟ 2024–2028 උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ. බදු අනුකූලතාව සහ වෙළඳ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවදානම් මත පදනම් වූ නීති ක්‍රියාත්මක කිරීම සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම වැඩි දියුණු කරනු ලැබේ. මානව සම්පත් ධාරිතාව සහ නවීන තාක්ෂණය භාවිතය ශක්තිමත් කරනු ඇත. මෙම පියවරයන් විනිවිදභාවයෙන් යුතු, ශක්තිමත් සහ ඉහළ කාර්යසාධනයක් සහිත බදු පරිපාලනයක් ගොඩනැගීම අරමුණු කරයි. රේගු කාර්ය පටිපාටි ජාත්‍යන්තර යහ භාවිතයන් සමඟ පෙළගැස්වීම සහ බාධාවකින් තොර විදේශ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමට රේගු ආඥා පනත වෙනුවට නව රේගු පනතක් හඳුන්වාදීමට 2025 අයවැය මඟින් යෝජනා කරන ලදී. මෙම නවීකරණයේ එක් අංශයක් ලෙස, ජාත්‍යන්තර යහ භාවිතාවන් සමඟ යමින් රේගුවේ දිගු කාමරයේ (long room) මුහුණට මුහුණ සිදු කෙරෙන ලේඛන ඇගයීම් කටයුතු වෙනුවට ස්වයංක්‍රීය රේගු දත්ත පද්ධතිය (ASYCUDA) හරහා සිදු කෙරෙන ඩිජිටල් තහවුරු කිරීමේ ක්‍රමවේදයක් ආදේශ කෙරෙනු ඇත.

## සුරාබදු දෙපාර්තමේන්තුව:

- දත්ත හුවමාරු කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගැනීම, අවශ්‍යතා පිරිවිතර ලේඛනය සකස් කිරීම හා ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා විශේෂඥ උපදේශක වරයෙකු පත්කිරීම සමඟින් යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කිරීම.
- බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම, නීතිමය ක්‍රියාමාර්ග සහ නීති විරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා දඬුවම් ලබා දීම තුළින් ආදායම වැඩි කිරීම සඳහා දිවයින පුරා බලපත්‍රලාභී සුරාබදු පරිශ්‍රයන්හි අධීක්ෂණය වැඩිදියුණු කිරීම.
- ගෘහස්ථ හා වාණිජ මට්ටමින් නීති විරෝධී මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ භාවිතය මැඩපැවැත්වීම සඳහා, ප්‍රමිතියෙන් තොර මත්පැන් භාවිතය අඩු කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග හරහා ආදායම වැඩි කිරීම අරමුණු කරගනිමින් දින 100 විශේෂ බලාත්මක කිරීමේ වැඩසටහනක් (2024.05.20 සිට 2024.08.27 දක්වා) ක්‍රියාත්මක කිරීම.
- ආදායම් රැස් කිරීම වැඩි කිරීමට දායක වන නීතිමය ක්‍රියාමාර්ගවලට සහාය දක්වමින් මහජන සහභාගීත්වය ශක්තිමත් කිරීම සහ පුරවැසි පැමිණිලිවලට ප්‍රමුඛතාවය දීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක 1913 හදිසි දුරකථන අංකය දියත් කිරීම.
- මධ්‍යසාර පාන වර්ග සඳහා දැඩි තත්ත්ව පාලනයන් පවත්වා ගැනීම සඳහා මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම සහ එමඟින් නීත්‍යානුකූල නිෂ්පාදන වෙළඳපොළට ඇතුළුවීමට පහසුකම් සපයමින් වැඩිදියුණු කළ නියාමන ක්‍රියාත්මක කිරීම හරහා ආදායම වර්ධනය කිරීම.

**විශේෂ සටහන 4.1 | රජයේ ප්‍රධාන ආදායම් ආයතන විසින් 2024 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන බදු පරිපාලනමය ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම සම්බන්ධිතයි...**

- සුරාබදු ආදායම් එකතු කිරීම හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ එම අවදානම් අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම සහ එමඟින් ආදායම් විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම, පාඩු අවම කිරීම සහ සමස්ත ආදායම් කළමනාකරණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.
- මූල්‍ය අධීක්ෂණය වැඩි දියුණු කිරීම සහ ආදායම් ආශ්‍රිත වංචා සහ නීති විරෝධී ක්‍රියාකාරකම් අනාවරණය කර ගැනීම සහ වැළැක්වීම සඳහා සහාය වීමට මූල්‍ය බුද්ධි ඒකකයක් (FIU) ස්ථාපිත කිරීම.
- අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ දුක්ගැනවිලි කාර්යක්ෂමව හැසිරවීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයක් (IAU) සහ පැමිණිලි කළමනාකරණ සහ විමර්ශන ඒකකයක් පිහිටුවීම සහ එමඟින් ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලීන් සුරක්ෂිත කිරීම.
- ව්‍යාජ නිෂ්පාදන සංසරණය වැළැක්වීම සහ වෙළඳපොලේ සුරාබද්දට යටත් භාණ්ඩවල සත්‍යතාව සහතික කිරීම මගින් සුරාබදු ආදායම ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක සළකුණු සහ ආරක්ෂක සළකුණු කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම.

### ඉදිරි දැක්ම:

නියමානුකූල ලෙස බදු එකතු කිරීම සහතික කරමින් දුම්කොළ බදු පනත සංශෝධනය කිරීම සහ සියලුම බීඩි නිෂ්පාදකයින් නැවත ලියාපදිංචි කිරීම සඳහා සුරාබදු නිවේදන නිකුත් කිරීම මගින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම කෙරෙහි සුරාබදු දෙපාර්තමේන්තුව අවධානය යොමු කරනු ඇත. මත්පැන් බෝතල්වල ආරක්ෂක විශේෂාංග ස්ටිකර් හැඩතල සහ වර්ණ යාවත්කාලීන කිරීම මගින් වැඩිදියුණු කරනු ලබන අතර ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීමට සහ වෙළඳපොලේ ව්‍යාජ නිෂ්පාදන අඩු කිරීමට නව මෘදුකාංග මගින් සිදුකරනු ඇත. ඉහළ නංවන ලද විගණන ක්‍රියාකාරකම් හරහා ආදායම වැඩි කිරීම සඳහා මාසික සමාලෝචන සහිතව සුරාබදු නිලධාරීන් සඳහා ඉලක්ක නියම කරනු ලැබේ. හිඟ බදු අයකර ගැනීමට සහාය දක්වමින් බදු පැහැර හරින අය සඳහා බලපත්‍ර සහ නිෂ්පාදනය අත්හිටුවීමට නීතිමය සංශෝධන මඟින් සිදු කල හැකි වේ. අතිරේකව, අපතය මත අය කෙරෙන බදු කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා සුරාබදු නිවේදන හරහා ප්‍රායෝගික ප්‍රතිශත හඳුන්වා දෙනු ලැබේ.තවද, සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන පද්ධතිය (RASED) මෘදුකාංග සංවර්ධනය කිරීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මාර්ගගත සම්බන්ධතාවය ස්ථාපිත කිරීම සඳහා ටෙන්ඩර් ක්‍රමය හරහා සේවා සපයන්නෙකු තෝරා ගනු ලබන අතර, එමඟින් කාර්යක්ෂමතාව සහ සම්බන්ධීකරණය තවදුරටත් වැඩිදියුණු කෙරේ.

## 4.2 බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

2023 වසරේ ජනවාරි මස 1 වන දින සිට හඳුන්වා දෙන ලද ප්‍රධාන ආදායම් බදු ප්‍රතිසංස්කරණවල සම්පූර්ණ බලපෑම 2024 වසර තුළ දී දක්නට ලැබුණි. ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවයන් සඳහා විසඳුම් සෙවීම අරමුණු කරගත් බදු ප්‍රතිපත්තියේ සැළකිය යුතු වෙනසක් මෙම ප්‍රතිසංස්කරණ මඟින් සනිටුහන් විය. බදු පදනම පුළුල් කිරීම, පුද්ගලික ආදායම් බදු සීමාවන් සහ අනුපාත සංශෝධනය කිරීම සහ නීත්‍යානුකූල ලෙස බලාත්මක කිරීම සඳහා දැඩි පියවරයන් මෙම වෙනස්කම් අතරට ඇතුළත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ දී ආදායම් බදු එකතු කිරීමෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර, එය බදු අනුකූලතාවය ඉහළ නැංවීම සහ පෙර වසරේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල සමුච්චිත බලපෑම පිළිබිඹු කරයි.

2023 වසරේ දී හඳුන්වා දුන් ආදායම් බදු සම්බන්ධ ප්‍රතිසංස්කරණවලට අමතරව, 2024 වසරේ දී එකතු කළ අගය මත බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ නිෂ්පාදන/සුරාබද්ද ආදී බදු සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. එකතු කළ අගය මත බද්ද සඳහා වූ බදු නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් නිදහස් කිරීම සහ එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කරන ලදී. බදු පදනම සැලකිය යුතු ලෙස පුළුල් කරමින්, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි කිරීමේ සීමාව ද වසරකට රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා පහත හෙලන ලදී. එමෙන්ම, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා පහත හෙලන ලද අතර එමඟින් මෙම සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගෙවීම සඳහා වගකිව යුතු ආයතන සංඛ්‍යාව ඉහළ ගිය අතර ආදායම් වර්ධනය සඳහා වූ හැකියාව වැඩි විය. එමෙන්ම මත්පැන් සහ දුම්වැටි සඳහා වූ නිෂ්පාදන/සුරාබදු බදු අනුපාත උද්ධමනය අනුව සකස් කරන ලදී.

**4.2 වගුව | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රඳවා තබා ගැනීමේ බද්ද**

| කාණ්ඩය | අනුපාතය (%) | අවසානාත්මක/ අවසානාත්මක නොවන |
|---|---|---|
| ලාභාංශ | 15 | අවසානාත්මක |
| පොළී හෝ ගෙවනු ලබන වට්ටම් | 5 | අවසානාත්මක නොවන |
| මසකට රු.100,000 ඉක්මවන කුලී ගෙවීම් | 10 | අවසානාත්මක නොවන |
| වෘත්තිකයන් වැනි පුද්ගලයන්ට ගෙවනු ලබන මසකට රු.100,000 ඉක්මවන සේවා ගෙවීම් | 5 | අවසානාත්මක නොවන |
| වෙනත් සියළුම අවස්ථා | 14 | අවසානාත්මක නොවන |


මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**විශේෂ සටහන 4.2 | ශ්‍රී ලංකාවේ ජාතික තීරු බදු ප්‍රතිපත්තිය**


දකුණු ආසියානු කලාපය තුළ සිය ආර්ථිකය සමෘද්ධිමත් කරගැනීම පිණිස වෙළඳ හා මූල්‍ය ලිහිල්කරණය ද ඇතුළුව අපනයනාභිමුඛ විවෘත ආර්ථික ප්‍රතිපත්තිමය රාමුවක් සඳහා අනුගතවීමක් සිදුකළ පළමු රට වනුයේ ශ්‍රී ලංකාවයි. සිය විවෘත ආර්ථික ප්‍රතිපත්තිය තුළින් ප්‍රතිලාභ හිමිකර ගනු ලැබූව ද, වරින් වර බලයට පැමිණි රජයන්හි සමාජ සහ දේශපාලනික මතවාදයන්ට අනුකූලව ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කරගනු ලැබීම හේතුවෙන් සිය අපනයනාභිමුඛ ආර්ථික වර්ධනය තිරසර මට්ටමේ රඳවා ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූ අතර, ඒ තුළින් අවසානයේ දී මෙරට ආර්ථික ප්‍රතිපත්ති උඩු යටිකුරු වීමක් සිදුවී තිබේ.

ශ්‍රී ලංකාවේ දැනට පවතින තීරුබදු ක්‍රමය "අපනයන විරෝධී පදනමකින් යුතු තීරු බදු ක්‍රමයක්" (Anti-Export Bias Duty Regime) වශයෙන් සැලකෙන අතර, එය ව්‍යවසායයන් විසින් අපනයන සිදුකිරීම සඳහා පෙළඹවීමක් ඇති කිරීමට සමත් නොවේ. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 2000 වර්ෂයේ දී සියයට 39ක් වූ අපනයන ආදායම 2021 වර්ෂයේ දී සියයට 18 දක්වා අඩුවී ඇති අතර, මෙය මධ්‍යම ආදායම්ලාභී රටවල් අතර අවම මට්ටමක පවතින අපනයන කාර්යසාධනයකි. 2000 වර්ෂයේ දී, ගෝලීය සමස්ත අපනයන භාණ්ඩවල වටිනාකමින් සෑම ඇ.ඩො. 10,000ක ශ්‍රී ලංකාවේ පංගුකාරිත්වය ඇ.ඩො. 8 ක් විය. ආර්ථික ප්‍රතිපත්තීන්ගේ වෙනස්වීම් ඇතුළුව විවිධ සාධකවල බලපෑම හේතුවෙන් මෙම අපනයන පංගුකාරිත්වය 2021 වර්ෂයේ දී ඇ.ඩො. 5 දක්වා අඩුවී ඇති අතර, එකී කාලපරිච්ඡේදය තුළම වියට්නාමය විසින් ගෝලීය සමස්ත අපනයන භාණ්ඩවල වටිනාකම තුළ සිය පංගුකාරිත්වය ඇ.ඩො. 23 සිට ඇ.ඩො. 123 දක්වා ඉහළ නංවා ගෙන තිබේ.

**ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවෙහි භාණ්ඩ සහ සේවා අපනයනය**




**ගෝලීය වෙළඳපොළ හවුල්කාරිත්වය (ගෝලීය අපනයන ඇ.ඩො. 10,000 ක් තුළ පංගුකාරිත්වය)**




මූලාශ්‍රය: ගෝලීය සංවර්ධන දර්ශක

මෙවැනි පසුබිමක, කලාපය තුළ තරඟකාරී වෙළඳ සහ ආයෝජන ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම සඳහා පාරදෘශ්‍ය සහ දැරිය හැකි තීරු බදු ක්‍රමයක් අපේක්ෂාවෙන් ලෝක බැංකුවේ මහ පෙන්වීම සහ විශේෂඥ දැනුම යටතේ ශ්‍රී ලංකාවේ ජාතික තීරු බදු ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී.

ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඔස්සේ (i) ආනයන බදු තාර්කිකරණය කරමින් සහ ඒවායේ එකිනෙක මත යැපෙන ක්‍රියාදාමයේ ඇති එක් සිද්ධියක සෘණාත්මක බලපෑම් තුලින් ඇතිවන්නා වූ නොපෙන සිද්ධි මාලාවන්හි බලපෑම් (cascading effect) අවම කරමින් දැනට ක්‍රියාත්මක තීරු බදු ක්‍රමයේ අපනයන විරෝධී පදනම අවම කිරීම (ii) දැනට ක්‍රියාත්මක තීරු බදු ක්‍රමයේ සංකීර්ණතාවය සහ අවිනිශ්චිතතාවය ඉවත් කිරීම (iii) තීරු බදු ක්‍රමයේ විනිවිදබව සහ පුරෝකතනය කළ හැකි බව සහතික කිරීම (iv) බලපෑමට ලක්වීමේ විභවයක් පවතින අංශ/ කර්මාන්ත හඳුනාගැනීම සහ ඒවා ස්ථාවරවීමට හා වර්ධනය වීමට යම් කාලසීමාවක් සහාය ලබාදීම සහ ඒ අතරතුර වියැන්වූ සේවකයන් සඳහා නැවත කුසලතා නැංවීම (v) අමුද්‍රව්‍ය, අන්තර් හෝ ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීමේ දී තීරු බදු සහ බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම (vi) සම අවස්ථා ලැබීම සහතික කිරීමට සහ දේශීය ව්‍යවසායන්ගේ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සහ බදු වියදම් අඩු කිරීම සඳහා ක්‍රමිකව අදියර වශයෙන් ආනයන බදු අත්හැරීම් හෝ සහන ප්‍රදානය කිරීම් ඉවත් කිරීම, මඟින් වෙළඳ භාණ්ඩවල මෙතෙක් අනාවරණය කරනොගත් අපනයන විභවය උපයෝගී කරගැනීම සහ සාර්ව ආර්ථික අසමතුලිතතා විසඳීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව, 2024 මැයි 31 දිනැති අංක 24/1072/604/114 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා වූ 2024 ජූනි 11 දිනැති සිය තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය විසින් "ශ්‍රී ලංකාවේ ජාතික තීරුබදු ප්‍රතිපත්තිය" සඳහා අනුමැතිය ලබාදී ඇත.

මෙම ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස, ජාතික තීරු බදු ප්‍රතිපත්ති කමිටුව සඳහා වන යොමු කිරීමේ අනුදේශ (ToR) අමාත්‍ය මණ්ඩලය වෙත 2025 මාර්තු 10 දිනැති අංක 25/0441/804/054 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා වූ අනුමැතිය 2025 මාර්තු 17 දින ලැබී ඇත. ඒ අනුව, ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා 2025 මැයි 15 දින ජාතික තීරු බදු ප්‍රතිපත්ති කමිටුව ස්ථාපනය කරන ලද අතර, එම කමිටුව මේ වනවිට ක්‍රියාත්මක වේ.


2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බද්ද සඳහා හඳුන්වාදෙන ලද බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හේතුවෙන්, 2024 වසරේ දී රාජ්‍ය ආදායමට විශාලතම දායකත්වය සපයන තනි බද්ද ලෙස එකතු කළ අගය මත බද්ද දැකගත හැකි විය. එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 1,309.7 ක් දක්වා සියයට 88.6 කින් වර්ධනය වී ඇති අතර එය ඉතිහාසයේ පළමු වරට රු. ට්‍රිලියනය ඉක්මවා යමින් ආදායම් බද්දෙන් ලද ආදායම් එකතු කිරීම් අභිබවා යන ලදී. මෙම ප්‍රතිසංස්කරණ මඟින් එකතු කළ අගය මත බද්ද සඳහා වන බදු පදනම පුළුල් වූවා පමණක් නොව එකතු කළ අගය මත බද්ද එකතු කිරීමේ කාර්යක්ෂමතාවය ද වැඩි දියුණු විය.

උද්ධමනයට අනුව දර්ශකගත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නිෂ්පාදන/සුරාබදු සඳහා ද බදු ප්‍රතිසංස්කරණ ද හඳුන්වා දෙන ලදී. සියලුම මත්පැන් වර්ග සඳහා මත්පැන් මත සුරාබද්ද සහ පෙට්‍රල් සහ ඩීසල් හැර ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අය කළ හැකි අනෙකුත් සියලුම භාණ්ඩ සඳහා නිෂ්පාදන බද්ද සියයට 14 කින් වැඩි කරන ලදී. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තහවුරු කිරීමේ පුළුල් ප්‍රයත්නයන්ට දායක වන අතරම නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම් මිල වෙනස්වීම්වලට අනුව පවත්වා ගැනීම සහතික කිරීම මෙම ක්‍රියාමාර්ගයන්හි අරමුණ විය. මෙම බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, 2024 වසරේ දී රාජ්‍ය ආදායමෙහි වඩාත් සාධනීය කාර්යසාධනයක් සඳහා ඉවහල් වූ අතර තිරසාර රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා අඛණ්ඩ වශයෙන් දායක වීමද සනිටුහන් කරන ලදී.

## 4.3 රජයේ ආදායම් කාර්යසාධනය

2024 වසරේ දී ප්‍රදාන ඇතුළුව රජයේ සමස්ත ආදායම 2023 දී වූ රු. බිලියන 3,074.3 සිට රු. බිලියන 4,090.8 දක්වා සියයට 33.1 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. බදු නොවන ආදායමේ ආන්තික අඩුවීමක් වුවද, බදු ආදායම 2023 දී වාර්තා වූ රු. බිලියන 2,720.6 සිට 2024 දී රු. බිලියන 3,704.6 දක්වා සියයට 36.2 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

**රූපසටහන 4.1 | රාජ්‍ය ආදායම**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 4.3 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම - 2024**


රු. මිලියන

| අයිතමය | ඇස්තමේන්තුව | තත්‍ය[අ] | අපගමනය |
|---|---|---|---|
| **මුළු ආදායම** | **4,107,000** | **4,030,838** | **-76,161** |
| **බදු ආදායම** | **3,820,000** | **3,704,577** | **-115,423** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | |
| ආදායම් සහ ලාභ මත බදු | 1,080,000 | 1,025,998 | -54,002 |
| එකතු කළ අගය මත බදු - දේශීය (ශුද්ධ) | 740,000 | 712,187 | -27,813 |
| ජාතිය ගොඩනැගීමේ බදු (දේශීය) | – | 130 | 130 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (දේශීය) | 195,000 | 186,477 | -8,523 |
| වෙනත් | 9,443 | 13,043 | 3,600 |
| **මුළු උප එකතුව** | **2,024,443** | **1,937,833** | **-86,609** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | | |
| ආනයන බදු | 175,000 | 111,147 | -63,853 |
| එකතු කළ අගය මත බදු - ආනයන (ශුද්ධ) | 660,000 | 597,493 | -62,507 |
| ජාතිය ගොඩනැගීමේ බදු (ආනයන) | – | 8 | 8 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (ආනයන) | 55,000 | 64,392 | 9,392 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 175,000 | 170,014 | -4,986 |
| සෙස් බදු | 60,000 | 81,129 | 21,129 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහ අනෙකුත් | 95,200 | 115,667 | 20,467 |
| නිෂ්පාදන විශේෂ විධිවිධාන බදු | | | |
| දුම්වැටි | 143,000 | 117,145 | -25,855 |
| ඛනිජ තෙල් | 135,000 | 200,200 | 65,200 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 35,000 | 66,601 | 31,601 |
| **මුළු උප එකතුව** | **1,533,200** | **1,523,794** | **-9,406** |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | | |
| මත්පැන් /දුම්කොළ | 232,000 | 214,584 | -17,416 |
| **මුළු උප එකතුව** | **232,000** | **214,584** | **-17,416** |
| **අනෙකුත්** | | | |
| විදුලි සංදේශ බද්ද | 18,500 | 15,927 | -2,573 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 11,857 | 12,438 | 581 |
| **මුළු උප එකතුව** | **30,357** | **28,366** | **-1,991** |
| **බදු නොවන ආදායම** | **287,000** | **326,261** | **39,261** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
[අ] තාවකාලික

2024 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2023 වසරේ දී වූ සියයට 9.9 සිට සියයට 12.4 දක්වා ප්‍රතිශතාංක 2.5 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, වැටි බද්ද ලියාපදිංචි කිරීමේ සීමාව අඩු කිරීම සමඟින් බදු නිදහස් කිරීම්වලින් බහුතරයක් ඉවත් කිරීම සහ වැට් බදු අනුපාතය වැඩිවීම පිළිබිඹු කරමින් වැට් බද්දෙන් ලැබෙන ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2023 වසරේ දී සියයට 2.5 සිට 2024 වසරේ දී සියයට 4.4 දක්වා සියයට 1.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ යාම මෙම ආදායම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.උද්ධමනයට අනුකූල දර්ශක ගත කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟින් බදු අනුපාත වැඩිවීම හේතුවෙන් 2024 දී නාමික වශයෙන් නිෂ්පාදන බදු/ සුරා බදු ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 469.6 සිට රු. බිලියන 598.5 දක්වා සියයට 27.4 කින් වැඩි වීම සහ බදු නිදහස් සීමාව අඩු කිරීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 2023 වසරේ දී වූ රු. බිලියන 216.2 සිට 2024 වසරේ දී රු. බිලියන 250.9 දක්වා සියයට 16.0 කින් වැඩිවීම බදු ආදායම පුළුල් වීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. ඉහත බදු ප්‍රතිපත්ති වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ දී දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 927.5 සිට රු. බිලියන 1,238.6 දක්වා සියයට 33.5 කින් වැඩි වී ඇත.

**රූපසටහන 4.2 | බදු ආදායමේ සංයුතිය - 2024**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 4.4 | රාජ්‍ය ආදායම**

රු. මිලියන

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **1,216,542** | **1,298,019** | **1,751,132** | **2,720,563** | **3,704,577** |
| ආදායම් බදු | 268,249 | 302,115 | 534,021 | 911,355 | 1,026,199 |
| එකතු කළ අගය මත බදු | 233,786 | 308,213 | 463,072 | 694,460 | 1,309,680 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | 2,351 | 434 | 413 | 328 | 137 |
| නිෂ්පාදන බදු* | 321,970 | 306,898 | 342,563 | 469,622 | 598,529 |
| ආනයන බදු | 114,183 | 64,339 | 50,009 | 105,120 | 111,147 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 115,442 | 154,125 | 180,595 | 175,486 | 170,014 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 82,709 | 55,828 | 40,194 | 51,327 | 115,199 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | – | – | 36,111 | 216,181 | 250,869 |
| අනෙකුත් | 77,852 | 106,067 | 104,154 | 96,683 | 122,804 |
| **බදු නොවන ආදායම** | **151,417** | **159,052** | **228,052** | **328,259** | **326,261** |
| පොලී/කුලී | 19,351 | 11,556 | 13,188 | 33,231 | 64,192 |
| ලාභ සහ ලාභාංශ | 17,624 | 30,591 | 28,092 | 75,701 | 41,080 |
| දඩ, ගාස්තු හා අයකිරීම් | 47,370 | 42,645 | 90,050 | 146,566 | 154,731 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 32,417 | 34,619 | 37,416 | 36,258 | 43,089 |
| මහ බැංකු පැවරුම් | 24,009 | 15,012 | 30,007 | 1,029 | - |
| අනෙකුත් | 10,646 | 24,630 | 29,300 | 35,474 | 23,170 |
| **මුළු ආදායම** | **1,367,960** | **1,457,071** | **1,979,184** | **3,048,822** | **4,030,839** |
| **ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස** | | | | | |
| **බදු ආදායම** | **7.8** | **7.4** | **7.3** | **9.9** | **12.4** |
| ආදායම් බදු | 1.7 | 1.7 | 2.2 | 3.3 | 3.4 |
| එකතු කළ අගය මත බදු | 1.5 | 1.7 | 1.9 | 2.5 | 4.4 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | ... | ... | ... | ... | ... |
| නිෂ්පාදන බදු* | 2.1 | 1.7 | 1.4 | 1.7 | 2.0 |
| ආනයන බදු | 0.7 | 0.4 | 0.2 | 0.4 | 0.4 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 0.7 | 0.9 | 0.8 | 0.6 | 0.6 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 0.5 | 0.3 | 0.2 | 0.2 | 0.4 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | – | – | 0.2 | 0.8 | 0.8 |
| අනෙකුත් | 0.5 | 0.6 | 0.4 | 0.4 | 0.4 |
| **බදු නොවන ආදායම** | **1.0** | **0.9** | **0.9** | **1.2** | **1.1** |
| පොලී/කුලී | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.2 |
| ලාභ සහ ලාභාංශ | 0.1 | 0.2 | 0.1 | 0.3 | 0.1 |
| දඩ, ගාස්තු හා අයකිරීම් | 0.3 | 0.2 | 0.4 | 0.5 | 0.5 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.1 |
| මහ බැංකු පැවරුම් | – | 0.1 | 0.1 | ... | ... |
| අනෙකුත් | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| **මුළු ආදායම** | **8.7** | **8.3** | **8.2** | **11.1** | **13.5** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

... නොගැනිය හැක

-ලැබී නොමැත

*නිෂ්පාදන බදු තුළ දුම්කොළ බද්ද ඇතුළත් වේ.

ආනයන මත පදනම් වූ බදු වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 842.2 සිට 2024 වසරේ දී රු. බිලියන 1,398.1 දක්වා සැලකිය යුතු ලෙස සියයට 66.0 කින් වර්ධනය වී ඇති අතර එය ප්‍රධාන වශයෙන් ආනයන මත වැටි බදු ආදායම සියයට 165.1 කින් සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම සියයට 124.4 කින් වැඩිවීම හේතු වී ඇත.

පොලී ආදායම සහ දඩ, ගාස්තු සහ අය කිරීම් වලින් ලද ආදායම වර්ධනය වුවද, ලාභ සහ ලාභාංශ වලින් ලැබෙන ආදායම පහත වැටීමේ සමස්ත බලපෑම හේතුවෙන් 2023 වසරට සාපේක්ෂව 2024 දී බදු නොවන ආදායම සියයට 0.6 කින් ආන්තික වශයෙන් අඩු වී ඇත.

## ආදායම් බදු

ආදායම් බද්දෙන් ලැබෙන ආදායම 2023 වසරේ දී ලද රු. බිලියන 911.4 සිට 2024 වසරේ රු. බිලියන 1,026.2 ක් දක්වා සියයට 12.6 කින් වර්ධනය විය. ආදායම් බදු ආදායම 2024 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 95.0 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආදායම් බද්ද 2023 වසරේදී වූ සියයට 3.3 සිට 2024 දී සියයට 3.4 දක්වා සියයට 0.1 කින් වැඩි විය. 2023 වසරේ දී රු. බිලියන 753.2 ක් වූ තනි පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු වලින් ලද ආදායම සිට 2024 වසරේ දී රු. බිලියන 862.2 දක්වා සියයට 14.5 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ උපයන විට ගෙවීම් තුළින් ලද ආදායම (PAYE) පෙර වසරට සාපේක්ෂව සියයට 36.3 කින් 2024 වසරේ රු. බිලියන 197.6 ක් දක්වා ඉහළ යාම සහ සංස්ථාපිත නොවන බදු ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 65.8 කින් 2024 වසරේ දී රු. බිලියන 80.5 ක් දක්වා ඉහළ යාමයි. 2023 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පුද්ගල ආදායම් බද්ද සඳහා වාර්ෂික බදු නිදහස් සීමාව රු. මිලියන 3.0 සිට රු. මිලියන 1.2 දක්වා අඩු කිරීමෙන් බදු පදනම පුළුල් කිරීමේ බලපෑමෙන් ආදායමේ වැඩිවීම මෙමඟින් පෙන්නුම් කෙරේ. බද්දට යටත් ආදායමෙන් සියයට 18 සිට සියයට 36.0 දක්වා අනුක්‍රමික බදු අනුපාතය පුළුල් කිරීම ද ඉහත ආදායම් වර්ධනයට ධනාත්මක ලෙස දායක විය. විශේෂයෙන් 2024 වසරේ දෙවන භාගයේදී අඩු පොලී අනුපාත තත්ත්වයක් පැවතුන ද එම වසරේ රඳවා ගැනීමේ බද්දෙන් (WHT) ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 157.9 සිට රු. බිලියන 163.8 දක්වා සියයට 3.7 කින් ඉහළ ගිය අතර එය 2024 සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 102.4 ක ළඟා කර ගැනීමකි. කෙසේ වෙතත්, දේපළ වෙළඳාම් ක්‍රියාකාරිත්වයේ නොවෙනස් තත්ත්වය හේතුවෙන් 2024 වසරේ ප්‍රාග්ධන ලාභ බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී වූ රුපියල් බිලියන 2.7 සිට රුපියල් බිලියන 1.9 දක්වා අඩු විය.

## එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලැබෙන ආදායම නාමික වශයෙන් වාර්ෂිකව වැඩිවීමක් වාර්තා කළ අතර, 2023 වසරේදී වූ රු. බිලියන 694.5 සිට 2024 වසරේ දී රු. බිලියන 1,309.7 දක්වා සියයට 88.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සහ ආනයන මගින් රැස්කරගන්නා ලද එකතු කළ අගය මත බද්ද සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් මෙම කැපී පෙනෙන වර්ධනය සිදු විය. දේශීය ක්‍රියාකාරකම් සඳහා වන එකතු කළ අගය මත බදු ආදායම 2023 වසරේ දී රු. බිලියන 469.1 සිට 2024 වසරේ දී රු. බිලියන 712.2 දක්වා සියයට 51.8 කින් වැඩි විය. ආනයන සඳහා වන එකතු කළ අගය මත බදු ආදායම 2023 වසරේ දී රු. බිලියන 225.4 සිට රු. බිලියන 597.5 දක්වා සියයට 165.1 කින් වැඩි විය. එකතු කළ අගය මත බදු වලින් ලැබෙන ආදායම මෙසේ සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළද, ආනයන සීමා කිරීම් බොහොමයක් 2024 වසරේ වැඩි කාලයක් පුරා ක්‍රියාත්මකව පැවතීම හේතුවෙන්, ආනයන සඳහා වන එකතු කළ අගය මත බදු වල ආදායම් විභවය සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ගැනීමට හැකියාවක් නොලැබුණි.

බදු පරිපාලනයේ සිදුකරන ලද වැඩිදියුණු කිරීම් එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩි වීම සඳහා හේතුවිය. මූල්‍ය සේවා අංශයද ඇතුළුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 2023 වසරේ දී 14,128 සිට 2024 වසරේ දී 21,542 දක්වා සියයට 52.5 කින් වැඩි විය. 2025 පෙබරවාරි අවසානය වන විට, බදු පදනම පුළුල් කිරීමේ උත්සාහයන් වැඩිදියුණු කිරීමත් සමඟ ලියාපදිංචි එකතු කළ අගය මත බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 22,043 දක්වා තවදුරටත් වැඩිවිය. මෙම වැඩිදියුණු කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, එකතු කළ අගය මත බදු ආදායම මුළු බදු ආදායමේ කොටසක් ලෙස 2023 දී සියයට 25.5 සිට 2024 වසරේ දී සියයට 35.4 දක්වා සියයට 38.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. එය රාජ්‍ය මූල්‍ය වඩාත් ශක්තිමත් කිරීමේ උත්සාහයන්හි එකතු කළ අගය මත බදු

**වගුව 4.5 | එකතු කළ අගය මත බදු ආදායම**

රු. මිලියන

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| දේශීය | 275,089 | 150,823 | 185,918 | 292,293 | 469,768 | 712,326 |
| ආනයන | 169,914 | 85,727 | 122,766 | 171,478 | 225,401 | 598,048 |
| **දළ ආදායම** | **445,003** | **236,550** | **308,684** | **463,771** | **695,169** | **1,310,374** |
| ආපසු ගෙවීම | 1,126 | 2,764 | 471 | 699 | 709 | 694 |
| **ශුද්ධ ආදායම** | **443,877** | **233,786** | **308,213** | **463,072** | **694,460** | **1,309,680** |
| **ශුද්ධ ආදායම ද.දේ.නි.% ලෙස** | **2.8** | **1.5** | **1.7** | **1.9** | **2.5** | **4.4** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

**වගුව 4.6 | රජයේ බදු ආදායම - ප්‍රභවයන් අනුව**

රු. මිලියන

| මූලාශ්‍රය | 2023 | 2024(අ) | 2023/2024 වෙනස (%) |
|---|---|---|---|
| **ආදායම් බදු** | **911,355** | **1,026,199** | **12.6** |
| **දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු** | **927,544** | **1,238,560** | **33.5** |
| එකතු කළ අගය මත බදු - දේශීය | 469,107 | 712,187 | 51.8 |
| ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | 68 | 130 | 90.3 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - දේශීය | 164,915 | 186,477 | 13.1 |
| සුරාබදු | 170,260 | 213,390 | 25.3 |
| දුම්වැටි සහ දුම්කොළ මත බදු | 118,481 | 118,339 | -0.1 |
| නිෂ්පාදන බදු - අනෙකුත් | 4,713 | 8,039 | 70.6 |
| **ආනයනය මත පදනම් වූ බදු** | **842,164** | **1,398,143** | **66.0** |
| ආනයන බදු | 105,120 | 111,147 | 5.7 |
| එකතු කල අගය මත බදු - ආනයන | 225,353 | 597,493 | 165.1 |
| ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන | 260 | 8 | -97.1 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - ආනයන | 51,265 | 64,392 | 25.6 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | 175,486 | 170,014 | -3.1 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 51,327 | 115,199 | 124.4 |
| සෙස් බදු | 57,184 | 81,129 | 41.9 |
| නිෂ්පාදන බදු - බනිජ තෙල් | 143,642 | 200,200 | 39.4 |
| නිෂ්පාදන බදු - මෝටර් රථ | 32,526 | 58,562 | 80.0 |
| **බලපත්‍ර සහ අනෙකුත්** | **39,500** | **41,675** | **5.5** |
| විදුලි සංදේශ බදු | 17,304 | 15,927 | -8.0 |
| අනෙකුත් | 22,195 | 25,748 | 16.0 |
| **මුළු බදු ආදායම** | **2,720,563** | **3,704,577** | **36.2** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

වල වර්ධනය වන වැදගත්කම ඉස්මතු කරමින් ද.දේ.නි යේ ප්‍රතිශතයක් ලෙස එකතු කළ අගය මත බදු ආදායම 2023 වසරේ දී සියයට 2.5 සිට 2024 වසරේ දී සියයට 4.4 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය.

## සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2024 වසරේ ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, අනිවාර්ය සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වාර්ෂික පිරිවැටුම් සීමාව රු.මිලියන 120.0 සිට රු.මිලියන 60.0 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, 2024 වසරේ ජනවාරි 01 වන දින සිට, රු.මිලියන 60.0 වාර්ෂික පිරිවැටුම් සීමාව ඉක්මවන ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන්, තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන්ගේ බද්දට යටත් පිරිවැටුම මත සියයට 2.5 ක අනුපාතයකින් මෙම බද්ද අය කෙරේ. මෙම ප්‍රතිපත්ති වෙනස මඟින් වැඩි ව්‍යාපාර ප්‍රමාණයක් බද්දට යටත් කිරීමෙන් බදු පදනම පුළුල් විය. 2023 වසරේ දී රු. බිලියන 216.2 වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2024 වසරේ දී රු. බිලියන 250.9 දක්වා සුළු වශයෙන් වැඩි විය. ලියාපදිංචි විය යුතු වාර්ෂික පිරිවැටුම් සීමාව අඩු කිරීම හේතුවෙන් 2023 වසරේ දී 8,107 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් සංඛ්‍යාව 2024 වසරේ දී 12,097 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

## නිෂ්පාදන/ සුරා බද්ද

2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී නිෂ්පාදන / සුරාබදු මඟින් ලද සමස්ත ආදායම සියයට 27.4 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර එය ප්‍රධාන බදු අය කළ හැකි කාණ්ඩ කිහිපයක් හරහා ශක්තිමත් කාර්යසාධනයක් පිළිබිඹු කරයි. 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද සුරාබදු අනුපාත සංශෝධනවල සහ 2024 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිෂ්පාදන බදු/ සුරාබදු උද්දමනයට ගැළපුම්ගත කරමින් දර්ශකකරන ප්‍රතිපත්තියට අනුව බදු වැඩි කිරීම හේතුවෙන් මත්පැන් සහ මෝටර් රථ වාහනවලින් ලැබුණු ඉහළ ආදායම මෙම වැඩිවීමට බොහෝ දුරට හේතු විය.

**වගුව 4.7 | නිෂ්පාදන / සුරාබදු ආදායම**

රු. මිලියන

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| මත්පැන් | 115,443 | 120,990 | 138,637 | 165,188 | 170,260 | 213,390 |
| දුම්වැටි/ දුම්කොළ | 87,400 | 94,383 | 88,576 | 104,200 | 118,481 | 118,339 |
| මෝටර් වාහන | 130,378 | 48,760 | 18,113 | 14,504 | 32,526 | 58,562 |
| බනිජ තෙල් නිෂ්පාදන | 61,740 | 53,111 | 55,339 | 53,074 | 143,642 | 200,200 |
| අනෙකුත් | 4,549 | 4,727 | 6,234 | 5,598 | 4,713 | 8,039 |
| **එකතුව** | **399,511** | **321,970** | **306,898** | **342,563** | **469,622** | **598,529** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

**විශේෂ සටහන 4.3 | ශ්‍රී ලංකාව තුළ මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම**

වසර පහකට ආසන්න කාලයක් දැඩි ලෙස පැවති තාවකාලික ආනයන සීමා කිරීම්වලින් අනතුරුව, 2024 වසරේ දෙසැම්බර් මස 18 වන දින පොදු මගී ප්‍රවාහනයට යොදාගන්නා වාහන සහ විශේෂ කාර්යයන්ට යොදාගන්නා වාහන සඳහා වූ සීමාවන් ඉවත් කිරීමත් සමඟ මෝටර් රථ ආනයනය නැවත ආරම්භ විය. ඉන් අනතුරුව, 2025 ජනවාරි මස 27 වන දින සිට ව්‍යාපාර කටයුතු සඳහා යොදාගන්නා වාහන ආනයනය සඳහා වූ සීමාවන් ඉවත් කරන ලද අතර, 2025 ජනවාරි මස 31 වන දින සිට පුද්ගලික වාහන ඇතුළුව සියලුම කාණ්ඩවල වාහන සඳහා වූ සීමාවන් ඉවත් කරන ලදී.

2020 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද ආනයන සීමා කිරීම්, රටේ පැවති දැඩි ගෙවුම් ශේෂ අර්බුදය කළමනාකරණය කිරීමට සහ විදේශ අංශයේ කම්පන මධ්‍යයේ විදේශ විනිමය සංචිත ආරක්ෂා කිරීමට හඳුන්වාදුන් කඩිනම් ක්‍රියාමාර්ගවලින් සමන්විත වූ පැකේජයක කොටසක් විය.

දළ නිල සංචිත වර්ධනය වීම, වෙළඳ හිඟය අඩුවීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සහාය ලබා දෙන විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහන යටතේ ලබා ඇති ස්ථාවර ප්‍රගතිය ඇතුළුව සාර්ව ආර්ථික ස්ථායීතාවය පිළිබිඹු කිරීමේ ලකුණු පෙන්නුම් කිරීම හේතුවෙන් වාහන ආනයනය නැවත ආරම්භ කිරීමට තීරණය කර ඇත. විදේශ අංශයට ඇති විය හැකි බලපෑම් හඳුනාගනිමින්, රජය ඒ ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා අදියර වශයෙන්, දැඩි ලෙස නියාමනය කරන ලද ප්‍රවේශයක් අනුගමනය කර තිබේ.

2025 වසරේ දී මෝටර් රථ ආනයනය මඟින් රජය විසින් ආසන්න වශයෙන් ද. දේ. නි. යෙන් සියයට 1.3 ක බදු ආදායමක් රැස්කර ගැනීමේ රාජ්‍ය මූල්‍ය අරමුණ හා අනුගත වෙමින් වාහන ආනයන තහනම ඉවත් කිරීම උපායමාර්ගිකව සිදු කරන ලද අතර, රටේ සංචිත තත්ත්වය පිළිබඳ අවදානම් හඳුණාගත් ප්‍රවේශයක් ද ඊට ඇතුළත් විය.

මෙම ආදායම් අරමුණට සහාය වීම සඳහා 2025 වසරේ දී රාජ්‍ය මූල්‍ය හා නියාමන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කරන ලදී:

- 2025 ජනවාරි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, උද්ධමනයට ගැලපුම් සිදු කරමින් දර්ශකගත කිරීම මඟින් මෝටර් රථ වාහන සඳහා ඒකක අනුපාත පදනමක් මත (රුපියල් අනුව) අය කරනු ලබන නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
- මෝටර් රථ සඳහා සියයට 20 ක තීරු බද්දක් පැනවීම හා එසේ ක්‍රියාත්මක වන තීරු බද්ද සඳහා සියයට 50 ක අධිභාරයක් පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස 2025 පෙබරවාරි මස 1 වන දින සිට සියයට 30 ක මුළු තීරු බද්දක් ක්‍රියාත්මක වීම.
- 2019 වසරේ සිට හඳුන්වා දුන් මෝටර් රථ වාහන සඳහා වන සුඛෝපභෝගී බද්ද, 2025 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් වාහන හැර ඉන්ධන පරිහරණය කරන්නාවූ සෑම වාහන කාණ්ඩයක් සඳහාම රුපියල් මිලියන 1.5 කින් වැඩි කිරීම.
- පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවාහන විසඳුම් සඳහා අඛණ්ඩව සහාය දක්වන අතර විද්‍යුත් වාහන සඳහා වන සමස්ත බදු බර අභ්‍යන්තර දහන එන්ජින් සහිත වාහනවලට වඩා අඩු මට්ටමක පවත්වා ගනිමින් 2025 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් වාහන සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද දෙගුණ කිරීම.
- ආනයනය කිරීමෙන් දින 90 ක් ඇතුළත එසේ ආනයනය කරන ලද වාහන ලියාපදිංචි කිරීම අනිවාර්යය කිරීම. එසේ කිරීමට අපොහොසත් වුවහොත් සියයට 45 ක උපරිමයකට යටත්ව පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු අගයෙන් මාසිකව සියයට 3 බැගින් අය කරනු ලබන ප්‍රමාද ගාස්තුවකට යටත් වේ.
- බදු අනුකූලතාවය හා සොයා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය අනිවාර්යය කිරීම.


ආනයනික මෝටර් රථ සඳහා දැනට අදාළ වන බදු ව්‍යුහය, ආදායම් උත්පාදනය සහ පුළුල් ප්‍රතිපත්තිමය අරමුණු සමඟ අනුකූලවීමට සකසා ඇති තීරුබදු සහ බදු වර්ග කිහිපයකින් සමන්විත වේ. එම ප්‍රධාන බදු වර්ග අතරට:

- නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද
- සියයට 20 ක් වූ තීරු බද්ද
- නිශ්චිත සීමාවන් ඉක්මවා යන විට අය කරනු ලබන මෝටර් වාහන සඳහා වන සුඛෝපභෝගී බද්ද (ඉන්ධන වර්ගය අනුව වෙනස් වේ)
- සියයට 18 ක් වූ එකතු කළ අගය මත බද්ද
- තීරු බද්ද මත පනවනු ලබන සියයට 50 ක් වූ අධිභාරය
- වාහන හිමිකම් බද්ද (අදාළ කාණ්ඩ සඳහා)
- නිෂ්පාදන බද්දට යටත් නොවන වාහන සඳහා පමණක් අදාළ වන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2014 සිට 2023 දක්වා මෝටර් වාහන සඳහා සංයුක්ත නිෂ්පාදන බදු ක්‍රමයක් අදාළ වී තිබුණි. බදු ප්‍රතිසංස්කරණවලින් පසුව බදු ව්‍යුහය සංරචක කිහිපයකට වෙන් කරන ලදී. කෙසේ වෙතත්, මෝටර් වාහන ආනයනයේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය නිෂ්පාදන බද්ද ලෙස සැලකේ.

**විශේෂ සටහන 4.3 | ශ්‍රී ලංකාව තුළ මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම සම්බන්ධිතයි...**

**මෝටර් රථ ආනයනය සංඛ්‍යාත්මක සැසඳීම : පෙබරවාරි - මැයි 2015 - 2019 සහ පෙබරවාරි - මැයි 2025**




ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛන අංශයට අනුව, 2024 දෙසැම්බර් 18 සිට 2025 ජූනි 3 දක්වා කාලය ඇතුලත මෝටර් කාර් රථ 14,047 ක් ඇතුළුව මෝටර් රථ 49,541 ක් පමණ රේගුවෙන් නිදහස් කර ඇති අතර, එමඟින් රජයේ බදු ආදායමට රුපියල් බිලියන 149.1 ක දායකත්වයක් ලැබී ඇත. මෙමඟින් ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය ශක්තිමත් ලෙස පිළිබිඹු කරනු ලබන අතර, මෝටර් රථ ආනයනයෙන් රජය විසින් අපේක්ෂිත වාර්ෂික ආදායම් ඉලක්කය සපුරා ගැනීමට හැකි බව පිළිඹිබු කරයි.

මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම, විවක්ෂණශීලී අන්දමින් විදේශ අංශය කළමනාකරණය කරගනිමින්, ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම, ප්‍රවාහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ රජයේ ආදායම ශක්තිමත් කිරීම යන අරමුණු ප්‍රවේශමෙන් තුලනය කරමින්, ප්‍රතිපත්තිමය වෙනස මැන බැලීමට ඉවහල් වේ. මෙම ප්‍රවේශය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ තිරසාර ලෙස යතා තත්ත්වයට පත් වීමේ අඛණ්ඩ වැඩපිළිවෙල සඳහා දායක වේ.

ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා සුරාබදු මගින් ලද සමස්ත ආදායම 2023 වසරේ දී රු.143.6 සිට 2024 වසරේ දී රු.බිලියන 200.2 දක්වා සියයට 39.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම කැපී පෙනෙන වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023 වසරේ දී සිදුකළ බදු අනුපාත සංශෝධනවල සම්පූර්ණ බලපෑම සහ එම කාලය තුළ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය වැඩි වීමයි.

කෙසේ වෙතත්, සිගරට් වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී රු. බිලියන 117.5 සිට 2024 වසරේ දී රු. 117.1 දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් අඩු විය. මෙම පහත වැටීමට හේතු වූයේ විකුණුම් පරිමාවේ හැකිලීම් හෝ සිගරට් ස්ථර හතරේ කාණ්ඩ අතර පරිභෝජන හැසිරීම් වෙනස් වීම ය. මෝටර් රථ සඳහා නිෂ්පාදන බද්දෙන් ලැබෙන ආදායම 2023 වසරේ දී රු. බිලියන 32.5 සිට 2024 වසරේ දී රු. බිලියන 58.6 දක්වා සියයට 80.0 ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඇතැම් මෝටර් රථ කාණ්ඩ සහ නිශ්චිත අංශ සඳහා තාවකාලික ආනයන සීමාවන් ලිහිල් කිරීමයි.


**වගුව 4.8 | මත්පැන් හා දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන/සුරාබදු ආදායම**

| වර්ෂය | නිෂ්පාදනය/ අලෙවිය | | | | | | නිෂ්පාදන/සුරා බදු ආදායම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැර මත්පැන් (ලීටර මිලියන ) | % වෙනස | බීර නිෂ්පාදනය (ලීටර මිලියන ) | % වෙනස | දුම්වැටි (මිලියන) | % වෙනස | මත්පැන් (රු. බිලියන) | % වෙනස | දුම්වැටි (රු. බිලියන) | % වෙනස |
| 2014 | 43.9 | -0.6 | 124.5 | 3.6 | 3,777 | -6.4 | 69.1 | 4.6 | 57.2 | -2.3 |
| 2015 | 51.8 | 17.9 | 125.8 | 1.0 | 4,116 | 9.0 | 105.9 | 53.3 | 80.0 | 39.9 |
| 2016 | 55.6 | 7.3 | 52.2 | -58.5 | 3,789 | -7.9 | 120.8 | 14.1 | 88.8 | 11.0 |
| 2017 | 46.9 | -15.5 | 71.1 | 36.3 | 3,149 | -16.9 | 113.7 | -5.9 | 86.0 | -3.2 |
| 2018 | 25.3(අ) | -46.1 | 11.4(අ) | -84.0 | 3,150 | 0.0 | 113.9 | 0.2 | 92.2 | 7.2 |
| 2019 | 24.7 | -2.4 | 19.1 | 67.9 | 2,622 | -16.8 | 115.4 | 1.3 | 87.4 | -5.2 |
| 2020 | 22.0 | -10.9 | 11.4 | -40.4 | 2,287 | -12.8 | 121.0 | 4.9 | 94.3 | 8.0 |
| 2021 | 25.0 | 13.6 | 12.5 | 9.6 | 2,384 | 4.3 | 138.6 | 14.6 | 88.5 | -6.2 |
| 2022 | 27.0 | 8.0 | 14.1 | 12.8 | 2,825 | 18.5 | 165.2 | 19.2 | 104.2 | 17.6 |
| 2023 | 20.4 | -24.3 | 13.6 | -3.5 | 2,303 | -18.5 | 170.3 | 3.1 | 117.5 | 12.8 |
| 2024 | 19.2 | -5.8 | 14.2 | 4.9 | 1,923 | -16.5 | 213.4 | 25.3 | 117.1 | -0.3 |

මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව. ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව
(අ) 2017 මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මගින් නිරූපිතය.

මේ අතර, පැණිරස පාන වර්ග, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල ඇතුළු අනෙකුත් බද්දට යටත් කළ හැකි අයිතම සඳහා නිෂ්පාදන බද්දෙන් ලැබෙන ආදායම 2023 වසරේ දී රුපියල් බිලියන 4.7 ට සාපේක්ෂව 2024 වසරේ දී රුපියල් බිලියන 8.0 දක්වා සියයට 70.6 කින් තියුණු ලෙස වර්ධනය විය. මෙම වර්ධනයට බොහෝ දුරට හේතු වූයේ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා ආනයන සීමාවන් සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහ 2024 වසරේ ජනවාරි 1 වන දින සිට බද්දට යටත් කළ හැකි භාණ්ඩ සඳහා උද්ධමනය මත දර්ශකයක් හඳුන්වාදීමයි. මේ අනුව, 2024 වසරේ දී වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කයෙන් සියයට 109.8 ක් ලබා ගනිමින් රජයේ ආදායමට තුන්වන විශාලතම දායකයා ලෙස නිෂ්පාදන/ සුරාබදු බද්ද එහි ස්ථානය තහවුරු කර ගෙන ඇත.


**රූපසටහන 4.3 | දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව

මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 170.3 සිට 2024 වසරේ දී රු. බිලියන 213.4 දක්වා සියයට 25.3 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර එය මුළු නිෂ්පාදන බදු ආදායමට සියයට 35.7 කින් දායක විය. මත්පැන් මත සුරාබදු උද්ධමනයට ගැලපුම්ගත කරමින් දර්ශකකරන ප්‍රතිපත්තියට අනුව 2024 වසරේ ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 14.0 කින් ඉහළ නංවන ලදී. 2024 වසරේ දී මත්පැන් මත සුරා බද්දෙන් ආදායම් ලභාකරගැනීම සියයට 92.8 ක් විය. කෙසේ වෙතත්, මද්‍යසාර නිෂ්පාදනය 2023 වසරේ දී නිරපේක්ෂ ලීටර් මිලියන 34.0 සිට 2024 වසරේ දී නිරපේක්ෂ ලීටර මිලියන 33.6 ක් දක්වා සියයට 1.2 කින් සුළු වශයෙන් අඩු විය.

**රූපසටහන 4.4 | මත්පැන් නිෂ්පාදනය සහ සුරාබදු ආදායම**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව

**වගුව 4.9 | මත්පැන් මත සුරා බද්ද සංශෝධනය කිරීමේ ව්‍යුහය**

| මත්පැන් වර්ගය | නිරපේක්ෂ ලීටරයක් සඳහා පෙර තීරුබදු (රු.) (2024 ජනවාරි 01 න් පසු) | නිරපේක්ෂ ලීටරයකට නව තීරුබදු (රු.) (2025 ජනවාරි 01 න් පසු) |
|---|---|---|
| විශේෂ අරක්කු | 6,840 | 7,244 |
| මොලැසස් / තල් / පොල් අරක්කු | 7,320 | 7,752 |
| රට නිෂ්පාදිත විදේශ මත්පැන් | 7,525 | 7,969 |
| බියර් (සැර - 5% ට අඩු) | 5,415 | 5,735 |
| සැර බියර් (සැර - 5% ට වැඩි හෝ සමාන) | 5,680 | 6,015 |
| වයින් | 5,415 | 5,735 |
| සකේ | 1,480 | 1,567 |
| කිරි පොන්සා | 3,760 | 3,982 |
| සයිඩර් | 4,105 | 4,347 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආරක්ෂක සලකුණු කළමනාකරණ පද්ධතිය (බදු මුද්දර) මුළුමනින්ම ක්‍රියාත්මක කරන ලදී. 2022 ජනවාරි 03 වන දින සිට බලපත්‍රලාභී නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් විසින් ආරක්ෂක සලකුණු සහ කෙසේ වෙතත්, රටේ ඇතැම් ප්‍රදේශවල ව්‍යාජ ආරක්ෂක සලකුණු සොයාගත් අවස්ථා වාර්තා වී ඇත. මෙය ඇස්තමේන්තුගත ආදායම් ළභාකර ගැනීම යම්තාක් දුරකට සීමාකර ඇත. කෙසේ වෙතත්, සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ක්‍රියාත්මක කිරීම හරහා සුරාබදු දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණය ක්‍රියාවලිය ඉදිරියට යමින් පවතියි.

## රේගු ආනයන බද්ද

ප්‍රධාන වශයෙන් බොහෝ ආනයනික භාණ්ඩ සඳහා වූ ආනයන සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 105.1 සිට 2024 වසරේ දී රු. බිලියන 111.1 දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. යෝජිත තීරුබදු නොවන ආනයන බදු පියවර වශයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස 2023 වසරේ මාර්තු මස 29 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බදු අනුපාත සියයට 0, 10, 15 සිට සියයට 0, 15, 20 දක්වා ඉහළ නැංවීම ද රේගු ආනයන බදු ආදායමේ වර්ධනයට දායක විය.

**විශේෂ සටහන 4.4 | වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය**

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම (WTO-TFA) සඳහා අත්සන් තබා ඇති පාර්ශවකරුවෙකු ලෙස, එහි C කාණ්ඩය යටතේ වන බැඳීමක් ලෙස ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව එකඟ වී තිබේ. සියලු නියාමන පියවර සහ නියෝජිතායතන තනි එකිනෙකට සම්බන්ධිත වේදිකාවකට එක් කරමින් සහ දේශසීමා හරහා රටවල් අතර සිදුකරන වෙළඳ කටයුතුවල (ආනයන, අපනයන හා ප්‍රතිනැවිගත කිරීම්) නිරත වෙළඳුන් විසින් ඉදිරිපත් කළ යුතු සියලු ලේඛන ඉදිරිපත් කිරීම සඳහා එක් ස්ථානයක් (single-entry point) සලසාලමින් සහ එකී ස්ථානය හරහාම කාලානුරූපි ආකාරයෙන් අවසන් ප්‍රතිඵල ද වෙළඳුන් වෙත ලබාදීමේ හැකියාව ඇතිකරමින් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය මගින් අන්තර්ජාතික වෙළඳ ප්‍රවාහ සඳහා පහසුකම් සලස්වයි.

ඕස්ට්‍රේලියානු රජයේ මූල්‍ය සහාය සමඟින් ශ්‍රී ලංකාවේ වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය සඳහා නිශ්චිත සැලැස්ම (Blue Print) සකස් කිරීම ලෝක බැංකුව විසින් සිදු කරන ලදී. එසේ වුව ද, මුදල් අමාත්‍යාංශය වෙත වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවේ 2022 වර්ෂයේ දී ය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය අදියර තුනකින් (3), එනම් මූලික අදියර, ක්‍රියාත්මක කිරීමේ අදියර සහ මෙහෙයුම් අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා 2022 ජූනි 20 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි, ප්‍රතිපත්තිමය මට්ටමේ තීරණ ගැනීම පිණිස භාණ්ඩාගාර ලේකම්ගේ සභාපතිත්වය යටතේ ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටුවක් සහ තාක්ෂණික මට්ටමේ තීරණ ගැනීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ සභාපතිත්වය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවක් ස්ථාපිත කිරීම සිදුවිය. එකී කාර්යය සඳහාම වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීම ඔස්සේ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒකාබද්ධ අරමුදලින් මූල්‍යයනය කිරීම සහ ව්‍යාපෘතිය මාස 36 කින් නිම කිරීමේ කාලගත ඉලක්කය සමඟින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ සමස්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය වගකීම දරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් 2024 ඔක්තෝබර් මාසයේ සිට ව්‍යාපෘතියේ මූලික අදියර ආරම්භ කරන ලද අතර, දැනට එහි ක්‍රියාත්මක කිරීමේ අදියරට ළඟා වී ඇත.

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කරගැනීමේ අරමුණින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා විදේශ අරමුදල් සපයන විභව්‍ය නියෝජිතායතන සමඟ සාකච්ඡා සිදුකරන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් ඇතැම් ඉතා වැදගත් කාර්යය පැකේජ සඳහා තාක්ෂණික සහාය ලබාදීමට ඇතැම් විදේශ අරමුදල් සපයන නියෝජිතායතන එකඟ වී ඇත.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහාය ලබාදීම සඳහා එකඟ වූ පරිදි, ඔවුන් විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ අවශ්‍ය කරන තාක්ෂණික සහාය පිළිබඳ අදාළ විෂය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි වූ අධ්‍යයනයක් (scoping study) සහ ශ්‍රී ලංකාවේ සංදර්භය සඳහා යෝග්‍ය තනි කවුළු පද්ධති ආකෘතියක් පිළිබඳ නිර්දේශ යෝජනා කිරීම සඳහා අධ්‍යයනයක් ද තවදුරටත් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයන දෙකෙහිම වාර්තා නුදුරේදීම මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලැබීමට නියමිත ය.

ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණික සහාය යටතේ ලබාදීමට නියමිත නිර්දේශ මත පදනම්ව, ශ්‍රී ලංකාවේ සංදර්භය සඳහා යෝග්‍ය තනි කවුළු පද්ධතියක් මිලදී ගැනීම සහ වැඩිදියුණු කිරීම/ සකස් කිරීම සිදුකරනු ඇති අතර, පළමු අදියර සඳහා තෝරාගෙන ඇති නියෝජිතායතන 18 අතුරින් දේශසීමා ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමන නියෝජිත ආයතනවලින් තෝරාගත් හයක් නියෝජිතායතන (06) නියමු පරීක්ෂණයක් ලෙසට තනි කවුළු මධ්‍ය පද්ධතියට (Single Window Core System) ඒකාබද්ධ කෙරේ. ඉතිරි නියෝජිතායතන 2027 වර්ෂය වනවිට මෙම මධ්‍ය පද්ධතියට ඒකාබද්ධ කිරීමට නියමිත අතර, 2027 වර්ෂය අවසානය වනවිට දේශසීමා ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමන නියෝජිතායතන 18 එකිනෙකට සම්බන්ධ කිරීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට අපේක්ෂිතය.

මීට සමගාමීව, වෙළඳ ජාතික තනි කවුළු පද්ධතිය සඳහා අවශ්‍ය නීත්‍යානුකූලභාවය ලබාදීම සඳහා වන සියලු අවශ්‍ය කරුණු ඇතුළත් එක් පරිපූර්ණ නීතියක් ද ඇතුළුව අවශ්‍ය සියලු නෛතික යටිතල පහසුකම් නියමිත පරිදි සැකසෙනු ඇත.

**විශේෂ සටහන 4.5 | නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම**

**නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම**

ශ්‍රී ලංකා රජය විසින් ආසියානු කලාපය තුළ රටවල් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්/ වරණීය වෙළඳ ගිවිසුම් පහක් (05) පහත සඳහන් කර ඇති පරිදි අත්සන් කර ඇත:

- දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) – ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව මෙම ගිවිසුමට අයත්වන අතර 2006 ජනවාරි 01 වැනි දින සිට බලාත්මක විය.
- ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) – 2000 මාර්තු 01 වැනි දින සිට බලාත්මක විය.
- සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSLFTA) – 2018 මැයි 01 වැනි දින සිට බලාත්මක විය.
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) – 2005 ජූනි 12 වැනි දින සිට බලාත්මක විය.
- ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) – 2024 පෙබරවාරි 03 වැනි දින අත්සන් කරන ලද නමුදු, තවමත් ක්‍රියාත්මක කර නොමැත.

තවත් යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම්/ වරණීය වෙළඳ ගිවිසුම් පහක් (05) සම්බන්ධයෙන් එකඟතාවයන්ට පැමිණීමේ සාකච්ඡා සිදුකරමින් පවතී. එනම්;

- **ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම** (ETCA)

යෝජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමට අදාළ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් එකඟතාවයන්ට එළැඹීමේ සාකච්ඡා දැනට සිදුකරමින් පවතින අතර, 2016 වර්ෂයේ සිට මේ දක්වා දැනට සාකච්ඡා වට 14 ක් පවත්වා ඇත.

යෝජිත ගිවිසුමේ විෂය පථය තුළට පහත සඳහන් පරිච්ඡේද ඇතුළත් වනු ඇත.

i. භාණ්ඩ වෙළඳාම
ii. සේවා වෙළඳාම
iii. ප්‍රභවස්ථාන පිළිබඳ නීති
iv. සනීපාරක්ෂාව සහ ශාක සනීපාරක්ෂාව පිළිබඳ පියවර
v. වෙළඳාම සඳහා තාක්ෂණික බාධා
vi. ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාවය
vii. ආරවුල් නිරවුල් කිරීම සහ නීති කටයුතු

යෝජිත ගිවිසුමෙහි විෂය පථය තුළට ආයෝජන සම්බන්ධිත පරිච්ඡේදයක් ඇතුළත් කිරීමට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව විසින් මූලිකව එකඟ වුව ද, ආයෝජන සම්බන්ධ කටයුතු කඩිනම් කිරීම සඳහා එය ETCA විෂය පථයෙන් බැහැරව කඩිනමින් සාකච්ඡා කිරීම සඳහා තීරණය විය.

- **ශ්‍රී ලංකා - චීන නිදහස් වෙළඳ ගිවිසුම** (CSFTA)

මෙය ශ්‍රී ලංකාව සහ චීනය අතර යෝජිත ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුමක් වන අතර, මේ සම්බන්ධයෙන් වූ සාකච්ඡා වට 06 ක් දැනටමත් පවත්වා ඇති අතර, රටවල් දෙකෙහිම එකඟතාවයෙන් 07 වැනි සාකච්ඡා වාරය පැවැත්වීමට තීරණය කරනු ඇත.

මෙම ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම්වලට අදාළ එකඟතාවයන්ට එළැඹීමේ සාකච්ඡාවල දී, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ වෙළඳාම (තීරු බදු ලිහිල්කරණ වැඩසටහන) සම්බන්ධිත පරිච්ඡේදයේ කාර්යයන්ට සම්බන්ධ වේ.

- **ඉන්දුනීසියා - ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම**

2023 ජූලි 10 දිනැති අංක 23/1248/601/042 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත වරණීය වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කිරීම සඳහා වන පාර්ශකරුවන්ගේ ඒකාබද්ධ ප්‍රකාශයට අනුව, මෙහි පළමු රැස්වීම 2024 අප්‍රේල් 03 සහ 04 යන දිනවල දී මාර්ගගත ආකාරයෙන් පවත්වන ලදී.

දෙවන වෙළඳ සාකච්ඡා වටය (TNC) 2024 ජූලි මස 15 සිට 16 දක්වා කොළඹ දී පැවති අතර, මෙම සාකච්ඡා වාරයේ දී මෙම ගිවිසුමට අදාළව අනුගමනය කළ යුතු යෝජිත පිළිවෙළ (modality) සම්බන්ධයෙන් දෙපාර්ශවයම එකඟතාවයට පැමිණෙන ලදී. එකඟතාවයට පැමිණෙන භාණ්ඩ ලැයිස්තුවක් මත පනවා තිබෙන බදු ඉවත් කිරීම හෝ අඩු කිරීම සම්බන්ධයෙන් පමණක් සීමාවී කටයුතු කිරීමට මෙම යෝජිත වරණීය වෙළඳ ගිවිසුමෙහිදී අවධානය යොමු කෙරේ.

**විශේෂ සටහන 4.5 | නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සම්බන්ධිතයි...**

- **බංගලාදේශ - ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුම**

එවකට සිටි වෙළඳ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ අංක 21/1011/313/034 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ජූනි 14 දිනැතිව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් යෝජිත බංග්ලාදේශ -ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුමට අදාළ සාකච්ඡා ආරම්භ කිරීමට අනුමැතිය ලැබී ඇති අතර, මේ දක්වා සාකච්ඡා වට 03ක් පවත්වා ඇත. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 100කට අදාළ භාණ්ඩ ලැයිස්තුවක් හුවමාරු කරගෙන ඇති නමුදු මේ දක්වා ඒ සම්බන්ධිත කටයුතු අවසන් කර නොමැත.

2024 මැයි 9 සහ 10 දිනැතිව 4 වැනි සාකච්ඡා වටය පැවැත්වීමට නියම කරගෙන තිබුණ ද, එවකට බංග්ලාදේශයේ පැවති වාතාවරණය හේතුවෙන් එම සාකච්ඡා වටය නොපැවැත්වූ අතර, එම 4 වැනි සාකච්ඡා වටය ආරම්භ කිරීම පිළිබඳව රටවල් දෙකම තවමත් එකඟතාවයකට පැමිණ නොමැත.

- **මැලේසියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

යෝජිත ශ්‍රී ලංකා - මැලේසියා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා අතිගරු ජනාධිපති විසින් ඉදිරිපත් කළ 2024 මැයි 31 දිනැති අංක 24/1074/601/069 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූනි 11 දිනැති තීරණය මගින් අනුමැතිය ලබාදී ඇත. එසේ වුව ද, එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා රටවල් දෙකම තවමත් එකඟතාවයකට පැමිණ නොමැත.

භාණ්ඩ වෙළඳාම සම්බන්ධිත එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා මුදල් අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවයෙන් සිදුකරන ලද අතර, එකඟතාවයට එළැඹීමේ සාකච්ඡාවලදී යෝග්‍ය පරිද්දෙන් අදාළ නියෝජනයන් ලබාගැනීම සඳහා වෙළඳ ප්‍රජාවන්, වාණිජ මණ්ඩල සහ කර්මාන්තකරුවන් ආදී පාර්ශව සමඟ බාහිර උපදේශන ප්‍රමාණවත් පරිදි පවත්වන ලදී.

සීනි හෝ වෙනත් පැණි රසකාරක ද්‍රව්‍ය එකතු නොකළ කිරි සහ ක්‍රීම්, තිරිඟු, ලිහිසි තෙල්, තිරිඟු ධාන්‍ය සහ ඔක්ටේන් අංක 95 සහිත පෙට්‍රල් වලින් ඉහළම රේගු ආනයන බදු ආදායම් ලැබුණි. රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2024 වසරේ වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 175.0 න් සියයට 63.5 කි.

## විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

සීනි සහ අර්තාපල් සඳහා වන තීරු බදු අනුපාත ඉහළ නැංවීම සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන පරිමාව වැඩි වීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 51.3 සිට 2024 වසරේ දී රු. බිලියන 115.2 දක්වා සැලකිය යුතු ලෙස සියයට 124.4 කින් වැඩි විය. සහල්, සීනි සහ පොල්තෙල් මඟින් ඉහළම විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අදායම් ලැබුණි. මෙය රු. බිලියන 95.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 121.3 ක ළඟාකර ගැනීමකි.

## වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද

වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 175.5 සිට 2024 වසරේ දී රු. බිලියන 170.0 දක්වා සියයට 3.1 කින් සුළු වශයෙන් අඩු විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, 2024 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යවශ්‍ය අයිතම 26 ක් සඳහා වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු ඉවත් කිරීමේ සහ ලෝක බැංකුවේ සහාය ඇතිව ක්‍රියාත්මක වන සංවර්ධන ප්‍රතිපත්ති ණය වැඩසටහනේ කොටසක් ලෙස 2023 වසරේ අප්‍රේල් 3 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංයෝජිත සංකේතාංක අයිතම 1,631 ක් සඳහා වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු ඉවත් කිරීමේ සම්පූර්ණ බලපෑමයි. 2023 වසරේ සිට සමාන වාරික වශයෙන් වසර පහක කාලයක් තුළ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. 2023 වසර අවසාන වන විට, පෙර වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දට යටත් වූ මුළු අයිතමවලින් සියයට 50 ක් පමණ නියෝජනය කරන සංයෝජිත සංකේතාංක අයිතම 4,100 ක් පමණ නිදහස් කර ඇති අතර එමඟින්, බදු අය කළ හැකි ආනයන පදනම සැලකිය යුතු ලෙස අඩු කර ඇත. 2024 වසරේ දී, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද යටතේ ආදායම් උත්පාදනය කරන ලද ප්‍රධාන අයිතම වූයේ මෝටර් රථ, විශේෂයෙන් දෙමුහුන් සහ විදුලි වාහන, යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික උපකරණ, විදුලි උපකරණ, ප්ලාස්ටික් හා ප්ලාස්ටික් භාණ්ඩ සහ යකඩ හා වානේ නිෂ්පාදන වේ.

## වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)

ආනයන සහ අපනයන මත සෙස් බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 57.2 සිට 2024 වසරේ දී රු. බිලියන 81.1 දක්වා සියයට 41.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම අරමුණු කරගත් සීමාකාරී ප්‍රතිපත්ති ඉවත් කිරීම සහ 2023 වසරේ සිට වසර තුනක කාලයක් තුළ සෙස් (තීරුබදු නොවන ආනයන බදු) ක්‍රමයෙන් ඉවත් කිරීමට රජය ගත් තීරණය මෙම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආනයන මත සෙස් බද්දෙන් රැස් කරන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 55.0 සිට 2024 වසරේ දී රු. බිලියන 79.1 දක්වා සියයට 44.0 කින් වැඩි විය. මේ අතර, අපනයන මත සෙස්

**වගුව 4.10 | ජාත්‍යන්තර වෙළඳ කටයුතු මගින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාර : 2022-2024**

රු. මිලියන

| විස්තරය | 2022 | 2023 | 2024(අ) | විස්තරය | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **2,243** | **2,229** | **1,996** | වාණිජ භෝග සංවර්ධනය | **64,074** | **56,008** | **41,517** |
| තේ - තේ (බදු සහ අපනයන පාලන) පනත,තේ මණ්ඩල නීති යටතේ | 465 | 523 | 415 | තේ | 462 | 686 | 499 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 10 | 7 | 11 | රබර් | 652 | 655 | 514 |
| පොල් - පොල් සංවර්ධන පනත යටතේ | 189 | 186 | 213 | පොල් | 213 | 450 | 500 |
| අ.සං.ම. සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ | 1,579 | 1,513 | 1,357 | කජු | 29 | 47 | 55 |
| **ආනයන මත සෙස් බද්ද** | **68,076** | **54,955** | **79,133** | සුළු අපනයන භෝග (කුරුඳු, කොකෝවා, කෝපි, ගම්මිරිස්) | 241 | 388 | 370 |
| අපනයන සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ | 68,076 | 54,955 | 79,133 | සමස්ත කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා පොහොර සහනාධාරය | 62,477 | 53,782 | 39,579 |
| **එකතුව** | **70,318** | **57,184** | **81,129** | **එකතුව** | **64,074** | **56,008** | **41,517** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

බද්ද 2023 වසරේ දී රු. බිලියන 2.2 සිට 2024 වසරේ දී රු. බිලියන 2 දක්වා සුළු වශයෙන් අඩු විය. අපනයන සෙස් ආදායමට දායක වූ ප්‍රධාන නිෂ්පාදන වූයේ තේ සහ පොල් ය. කෙසේ වෙතත්, රජය 2025 වසරේ දී සෙස් බද්ද මගින් රු. බිලියන 100 ක ආදායමක් බලාපොරොත්තු වේ.

## වෙනත් බදු

### විදුලි සංදේශ බද්ද

විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 17.3 සිට 2024 වසරේ දී රු. බිලියන 15.9 දක්වා සියයට 8.0 කින් අඩු විය. ආර්ථික පීඩනයන්, පරිශීලකයින් වඩාත් දැරිය හැකි පැකේජ වෙත මාරු වීම සහ සීමිත භාවිතය නිසා සාම්ප්‍රදායික විදුලි සංදේශ සේවා සඳහා පාරිභෝගික ව්‍යදම් අඩුවීම මේ සඳහා හේතු විය. එමෙන්ම, සාම්ප්‍රදායික හඬ සහ කෙටි පණිවුඩ සේවාවලින් අන්තර්ජාලය පදනම් කරගත් සන්නිවේදන මාර්ග වෙත අඛණ්ඩව සංක්‍රමණය වීම ද විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම පහත වැටීමට දායක විය. ස්ථාවර ප්‍රවේශ සේවා සම්බන්ධතා 2023 වසරේ දී 2,308,000 සිට 2024 වසරේ දී 2,122,000 දක්වා අඩු වූ අතර, එය සාම්ප්‍රදායික ස්ථාවර දුරකථන සේවා මත යැපීම අඛණ්ඩව අඩුවීමක් පෙන්නුම් කරයි. 2023 වසරේ දී 28,986,000 ක් වූ ජංගම දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 දී 28,820,000 දක්වා පහත වැටුණි. දත්ත මත පදනම් වූ සේවාවන් වෙත සිදුවන සංක්‍රමණය කැපී පෙනෙන ලෙස පෙන්නුම් කරමින්, 2023 වසරේදී 22,864,000 ක් වූ ජංගම අන්තර්ජාල සේවා ඇතුළුව අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයින් සංඛ්‍යාව 2024 වසරේදී 23,149,000 දක්වා වර්ධනය විය.

### අපගමන බද්ද

අපගමන බද්දෙන් එකතු වූ ආදායම 2023 වසරේ දී රු. බිලියන 38.8 සිට 2024 වසරේ දී රු. බිලියන 38.3 දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් අඩු විය. අපගමන බද්දෙන් ලැබෙන ආදායම වැඩි කර ගැනීම සඳහා, අපගමන බද්ද එකතු කරනු ලබන අධිකාරියේ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ශක්තිමත් කිරීමට රජය පියවර ගනිමින් සිටී. තවද, ගුවන්තොටුපළ වෙත වැඩි මගීන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය විසින්, අපගමන බද්දෙන් සියයට 50 ක සහනයක්, එනම් පුද්ගලයෙකු සඳහා අදාළ වන ඇමරිකානු ඩොලර් 60 ක බද්දෙන් ඇමරිකානු ඩොලර් 30 ක සහනයක් කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ-රත්මලාන භාවිතා කරන මගීන් සඳහා 2025 මාර්තු 27 සිට තවත් වසරක කාලයක් සඳහා ලබා දීමටත්, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ භාවිතා කරන මගීන් සඳහා 2025 පෙබරවාරි 01 සිට වසරක කාලයක් සඳහා ලබාදීමටත්, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි නියමිත ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කරන ගුවන් සමාගම් සඳහා 2025 දෙසැම්බර් 28 දක්වා අපගමන බද්දෙන් සම්පූර්ණ සහනයක් ලබා දීමටත් රජය තීරණය කරන ලදී.

### ඔට්ටු ඇල්ලීම හා සූදු බද්ද

සංචාරකයින්ගේ පැමිණීම යථා තත්ත්වයට පත්වීමත් සමඟ විනෝදාස්වාද ක්‍රියාකාරකම් පුළුල් වීම සහ එවැනි ක්‍රීඩා ව්‍යාපාර ස්ථානයකට ඇතුළු වන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා 2023 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රවේශ ගාස්තුවක් පැනවීම පිළිබිඹු කරමින්, 2024 වසරේ ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්දෙන් රැස් කරන ලද ආදායම 2023 වසරේ දී වූ රු. බිලියන 7.4 සිට රු. බිලියන 9.8 දක්වා කැපී පෙනෙන ලෙස සියයට 32.2 කින් වර්ධනය විය.

සූදු හෝ බුකීකරුවෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින්ගෙන් වාර්ෂික බද්දෙන් උපයන ලද බදු ආදායම 2023 වසරේ වූ රු. බිලියන 1.4 සිට 2024 වසරේ දී රු. බිලියන 3.2 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, මෙම කර්මාන්තයට නව ප්‍රවේශ වීම් මෙම වර්ධනයට හේතු වී ඇත. තවද, සූදු හෝ බුකීකරුවෙකු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින්ගෙන් දළ එකතුව මත බදු ආදායම 2023 වසරේ දී රු. බිලියන 3.7 සිට 2024 වසරේ දී රු. බිලියන 4.3 දක්වා සියයට 16.1 කින් වැඩි වී ඇති අතර,

2023 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම බදු අනුපාතය සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීම මේ සඳහා හේතු වී ඇත.

## බදු නොවන ආදායම

බදු නොවන ආදායම නාමික වශයෙන්, 2023 වසරේ දී රු. බිලියන 328.3 සිට 2024 දී රු. බිලියන 326.3 දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් අඩු විය . ලාභ සහ ලාභාංශ සහ අනෙකුත් බදු නොවන ආදායම් වලින් ලැබෙන ආදායම් එකතු කිරීමේ අඩුවීම මෙයින් පිළිබිඹු වේ. කෙසේ වෙතත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2023 වසරේ දී සියයට 1.2 සිට 2024 වසරේ දී සියයට 1.1 දක්වා සියයට 0.1 කින් අඩු විය. මේ අතර, පොලී අනුපාත අඩු වුව ද, පොලී ආදායමෙන් ලැබෙන බදු නොවන ආදායම 2023 වසරේ දී රු. බිලියන 26.2 සිට 2024 වසරේ දී රු. බිලියන 57.8 දක්වා සියයට 120.1 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. දඩ, ගාස්තු සහ අයකිරීම් වලින් ලැබෙන ආදායම ද 2023 දී රු. බිලියන 146.6 සිට 2024 වසරේ දී රු. බිලියන 154.7 දක්වා සියයට 5.6 කින් වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලැබෙන ආදායම 2023 දී රු. බිලියන 36.3 ක් වූ අතර 2024 වසරේ දී එය රු. බිලියන 43.1 ක් දක්වා සියයට 18.8 කින් සුළු වශයෙන් වැඩි විය. මේ අතර, අනෙකුත් බදු නොවන ආදායම් මාර්ග වලින් ලැබෙන ආදායම 2023 වසරේ දී රු. බිලියන 35.5 ක් වූ අතර එය 2024 වසරේ දී රු. බිලියන 23.2 ක් දක්වා සියයට 34.7 කින් අඩු විය.



**වගුව 4.11 | බදු නොවන ආදායම**

රු. මිලියන

| අයිතමය | 2023 | 2024(අ) | 2023/2024 (ප්‍රතිශතක වෙනස) | 2024 (සමස්ථ බදු නොවන ආදායමේ % ලෙස) |
|---|---|---|---|---|
| පොලී/කුලී | 33,231 | 64,192 | 93.2 | 19.7 |
| ලාභ සහ ලාභාංශ | 75,701 | 41,080 | -45.7 | 12.6 |
| විකුණුම් සහ ගාස්තු | 146,566 | 154,731 | 5.6 | 47.4 |
| සමාජ ආරක්ෂණ දායක මුදල් | 36,258 | 43,089 | 18.8 | 13.2 |
| මහ බැංකු ලාභ පැවරීම | 1,029 | – | – | – |
| අනෙකුත් | 35,474 | 23,170 | -34.7 | 7.1 |
| **එකතුව** | **328,259** | **326,261** | **-0.6** | **100.0** |

මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

**වගුව 4.12 | රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය**

රු. බිලියන

| අයිතමය | 2023 | 2024 ඇස්තමේන්තුව | 2024(අ) | විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 911.4 | 1,080.0 | 1,026.2 | 2023 වසර හා සැසඳීමේ දී 2024 වසරේ ආදායම් බදු මගින් ලද ආදායම සියයට 12.6 කින් ඉහළ ගොස් ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 95.0 ක ලභා කරගැනීමක් වේ. 2024 වසරේ ආදායම් බදු මගින් ලද තක්‍ෂ ආදායම, 2024 වසර සඳහා වූ ඇස්තමේන්තුවෙන් ආසන්න වශයෙන් සියයට 5 ක් හෝ රු. බිලියන 53.8 කින් විචලනය වී ඇත.<br>මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>- වසරකට රු. මිලියන 3.0 ක්ව පැවති පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව රු. මිලියන 1.2 දක්වා පහත දැමීම තුළින් පුළුල් වූ බදු පදනමෙහි සමස්ත බලපෑම.<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළයාම.<br>- ආර්ථික ක්‍රියාකාරකම් වල ඇති වූ පුනර්ජීවනය සහ ;<br>- බදු පරිපාලනය ශක්තිමත් කිරීම. |
| එකතුකළ අගය මත බදු | 694.5 | 1,400.0 | 1,309.7 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 93.5 ක් ලභාකරගනිමින් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු මගින් ලද ආදායම රු. බිලියන 1,309.7 දක්වා සියයට 88.6 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. එකතු කල අගය මත බදු ආදායම සැලකියයුතු ලෙස වැඩිවීම සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත.<br>- 2024 ජනවාරි පළමුවන දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ දැමීම.<br>- 2024 වසරේ ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත වූ බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 දක්වා පහත දැමීම.<br>- 2024 වසරේ ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන අයිතමයන් සඳහා පැවති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් අහෝසි කිරීම;<br>- 2023 වසරේ දී එ.ජ.ඩො බිලියන 16.8 ක් වූ සමස්ත ආනයන 2024 වසරේ දී එ.ජ .ඩො බිලියන 18.8 දක්වා සියයට 12.1 කින් ඉහළ යාම සහ ;<br>- ආර්ථික ක්‍රියාකාරකම් වල ඇති වූ පුනර්ජීවනය |

රු. බිලියන

| අයිතමය | 2023 | 2024 ඇස්තමේන්තුව | 2024(අ) | විචලනය සඳහා බලපෑ ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| නිෂ්පාදන / සුරා බද්ද | 469.6 | 545.0 | 598.5 | වාර්ෂික ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 53.5 ක් අභිබවමින් 2024 වසරේ නිෂ්පාදන බදු මගින් ලද ආදායම රු. බිලියන 598.5 දක්වා සියයට 27.4 කින් ඉහළ ගොස් ඇත. මෙම ඉහළ කාර්සාධනය සඳහා පහත සඳහන් හේතු මූලික වශයෙන් බලපා ඇත.<br>- ඒකක අනුපාත සහිත නිෂ්පාදන බද්දට යටත් සියලුම භාණ්ඩ සඳහා වන නිෂ්පාදන බද්ද වැඩිකිරීම සහ උද්දමනයට ගැලපූ දර්ශක ගත කිරීමක් මත පදනම්ව සියලුම මත්පැන් වර්ග සඳහා සුරාබදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීම.<br>- සියලු වර්ග වල පෙට්‍රල් සහ ඩීසල් ආනයනයන් හී ශුද්ධ වශයෙන් වැඩිවීම මත ඛණිජතෙල් මත වූ නිෂ්පාදන බදු අනුපාත ඉහළ දැමීම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වැඩි වීම.<br>- සමහර වාහන කාණ්ඩයන් සඳහා තාවකාලිකව පනවා තිබූ ආනයන සීමා ලිහිල් කිරීම සහ විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන ආනයනය කිරීම සඳහා අවසර දීම හේතුවෙන් මෝටර් රථවාහන සඳහා වූ නිෂ්පාදන බදු ආදායම ඉහළ යාම.<br>- 2023 ජූලි මස සිට ක්‍රියාත්මක වන පරිදි සුරාබදු අනුපාත සංශෝධනය කිරීමේ සමස්ත බලපෑම සමගින් සුරාබදු මගින් ලද ආදායම ඉහළ යාම.<br>කෙසේවුවද, සිගරට් අලෙවිය අඩුවීම හෝ සිගරට් වර්ගයන් අතරේ පරිභෝජන හැසිරීම විකැන්වීම හේතුවෙන් සිගරට් මත වූ නිෂ්පාදන බදු ආදායම ආන්තික ලෙස පහළ ගොස් ඇත. |
| ආනයන බදු | 105.1 | 175.0 | 111.1 | 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ආනයන බදු මගින් ලද ආදායම රු. බිලියන 111.1 දක්වා සියයට 5.7 කින් ආන්තිකව වර්ධනය වී ඇති අතර, 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 63.5 ක් ලභාකරගෙන ඇත. මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>- 2023 මාර්තු මස 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10, සියයට 15 සිට සියයට 0, සියයට 15 හා සියයට 20 දක්වා සංශෝධනය කිරීමෙහි සමස්ත බලපෑම ලභාකරගැනීම.<br>- තිරිගු පිටි සහ කිරිපිටි සඳහා පැවති බදු සහන ඉවත් කිරීම සහ සහල් ආනයන ඉහළ යාම.<br>- 2024 වර්ෂයේ සමස්ත ආනයන සියයට 12.1 කින් ඉහළ යාම. |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද | 175.5 | 175.0 | 170.0 | 2024 වසරේ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු මගින් ලද ආදායම රු. බිලියන 170.0 දක්වා සියයට 3.1 කින් පහළ ගොස් ඇත. මෙම අඩු වීම සඳහා මූලික වශයෙන් පහත හේතු බලපා ඇත.<br>- වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු ක්‍රමිකව ඉවත් කිරීමේ එක් අදියරක් ලෙස 2023 වසරේ අප්‍රේල් මස හතර වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දට යටත්වන අයිතම වලින් සියයට 20 ක් නිදහස් කිරීම;<br>- 2024 මාර්තු 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිංගප්පූරු- ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව සිංගප්පූරුවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ වර්ග 595 ක් වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් ඉවත් කිරීම හා තවත් භාණ්ඩ වර්ග 3,117 ක් සඳහා සහනදායී අනුපාත හදුන්වා දීම.<br>2024 වසරේ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු පදනම පහත දැමීම හමුවේ වුවද, සළුදායී බදු එකතු කිරීමේ යාන්ත්‍රණය හා ශක්තිමත් අනුකූලතාවය පැවතීම හේතුවෙන් 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 97.2 ක් ලභාකරගැනීමට හැකි වී ඇත. |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද | 51.3 | 95.0 | 115.2 | 2024 වසරේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම සියයට 124.4 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. මේ සඳහා ;<br>- අර්තාපල් සහ සීනි සඳහා වූ බදු අනුපාත ඉහළ දැමීම සහ ප්‍රධාන පරිභෝජන භාණ්ඩයන් හී වැඩි වූ ආනයන හේතු වී ඇත.<br>විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු මගින් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 121.3 ක් දක්වා ලභාකරගෙන ඇත. |

රු. බිලියන

| අයිතමය | 2023 | 2024 ඇස්තමේන්තුව | 2024(අ) | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද. | 216.2 | 250.0 | 250.9 | 2024 වසරේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලද ආදායම රු. බිලියන 250.9 දක්වා සියයට 16.0 කින් ඉහළ ගොස් ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත.<br>- 2023 වසරේ දී 8,107 ක් වූ ලියාපදිංචි වූ බදු ගෙවන්නන් ප්‍රමාණය 2024 වර්ෂයේදී 12,097 ක් දක්වා සැලකියයුතු ලෙස ඉහළයාමත් සමගින් බදු අනුකූලතාවය ශක්තිමත් වීම,<br>- ලියාපදිංචිය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දීම<br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා පහත දැමීම සහ ආර්ථික ක්‍රියාකාරකම් වේගවත් වීමත් සමගින් 2024 වසරේ ආනයන සියයට 12.1 කින් ඉහළ යාම.<br>තත්‍ය ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 100.3 ක් ලභා කරගෙන ඇති බැවින් 2024 අයවැය ඇස්තමේන්තුවෙන් සැළකිය යුතු අපගමනයක් නිරීක්ෂණය නොවේ. |
| වෙනත් බදු | 97.0 | 100.0 | 122.9 | වෙනත් බදු මගින් ලද ආදායම රු. බිලියන 122.9 දක්වා සියයට 26.7 කින් සැලකියයුතු ලෙස වැඩි වී ඇත. මේ සඳහා මූලික වශයෙන්;<br>- ආනයන ඉහළ යාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 41.9 කින් ඉහළ යාම<br>- කොටස් ගනුදෙනු බදු, ඔට්ටු හා සූදු ක්‍රීඩා බදු හා සුඛෝපභෝගී මෝටර් රථවාහන බද්ද මගින් උපයන ලද ආදායම වැඩිවීම හේතු වී ඇත.<br><br>විදුලි සංදේශ බද්ද මගින් ලද ආදායම පහළ ගොස් ඇත. කෙසේ වුවද, අනෙකුත් බදු මගින් ලද ආදායම රු. බිලියන 22.9 කින් 2024 වාර්ෂික ඇස්තමේන්තුව ඉක්මවා ඇත. |
| බදු නොවන ආදායම | 328.3 | 287.0 | 326.3 | බදු නොවන මූලාශ්‍ර මගින් ලද ආදායම සියයට 0.6 කින් ආන්තිකව පහළ ගොස් ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් රාජ්‍ය ව්‍යාපාර මගින් ලැබෙන ආදායම් හා ලාභාංශ සියයට 45.7 කින්, කුලී ආදායම් සියයට 8.0 කින් සහ අනෙකුත් බදු නොවන ආදායම් සියයට 7.6 කින් පහළ යාම හේතු වී ඇත. කෙසේ වුවද, දඩ, අයකිරීම් හා ගාස්තු සහ පොළී ආදායම් මගින් ලද ආදායම් බදු නොවන ආදායම් ශක්තිමත් කිරීම සඳහා දායක වී ඇත.<br>බදු නොවන ආදායම් මගින් ලද ආදායම 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 113.7 ලභාකරගෙන ඇත. |
| **එකතුව** | **3,048.8** | **4,107.0** | **4,030.8** | |

මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.
(අ) තාවකාලික

**විශේෂ සටහන 4.6 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2024 වසරේ ජනවාරි සිට 2025 වසරේ අප්‍රේල් දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන** | |
| 2025.04.01 | 2025 අංක 2 දරන දේශීය ආදායම් බදු (සංශෝධන) පනත<br>**(1) පුද්ගල ආදායම් බදු (PIT) අනුපාත ව්‍යුහය**<br>පුද්ගලයෙකු සඳහා ලබා දෙන පුද්ගල ආදායම් බදු සහනය, වසරකට රු. 1,800,000 / - ක් දක්වා ඉහළ නැංවීම සහ පුද්ගලයෙකු සඳහා බදු අය කළ හැකි ආදායම මත අදාළ වන බදු අනුපාත පහත පරිදි සංශෝධනය කිරීම |

**පුද්ගල ආදායම් බදු අනුපාත උපලේඛනය**

| | වාර්ෂික බදු අයවන ආදායම (රු.) | |
|---|---|---|
| ආන්තික බදු අනුපාතය (%) | පෙර පැවති බදු අනුපාත ව්‍යුහය | වත්මන් බදු අනුපාත ව්‍යුහය |
| 0 | මිලියන 1.2 දක්වා | මිලියන 1.8 දක්වා |
| 6 | මිලියන 1.2 – මිලියන 1.7 | මිලියන 1.8 - මිලියන 2.8 |
| 12 | මිලියන 1.7 – මිලියන 2.2 | - |
| 18 | මිලියන 2.2 – මිලියන 2.7 | මිලියන 2.8 - මිලියන 3.3 |
| 24 | මිලියන 2.7 - මිලියන 3.2 | මිලියන 3.3 - මිලියන 3.8 |
| 30 | මිලියන 3.2 – මිලියන 3.7 | මිලියන 3.8 - මිලියන 4.3 |
| 36 | මිලියන 3.7 ට වැඩි | මිලියන 4.3 ට වැඩි |

| | |
|---|---|
| 2024.04.01 | 2024.03.21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනය<br>- රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු නියම කිරීම. |
| **මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2025.04.01 | 2025.03.27 දිනැති අංක 2429/39 දරන ගැසට් නිවේදනය<br>- යම් දේපලක් බද්දට හෝ කුලියට දීමට අදාල යම් සාධන පත්‍රයක් මත පනවනු ලබන මුද්දර ගාස්තුව, කල්බදු හෝ කුලී ගිවිසුමේ (කුලී සින්නක්කර ගිවිසුම් හැර) සම්පූර්ණ කාලපරිච්ඡේදය අධි මිලද ඇතුළුව ගෙවිය යුතු එකතු කල්බද්දේ හෝ කුලියෙහි, සෑම රුපියල් 1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා, රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම. |
| **2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත** | |
| 2024.01.12 | 2024.01.12 දිනැති අංක 2366/33 දරන ගැසට් නිවේදනය<br>- 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ 5 වැනි වගන්තියට ආදේශ කිරීම සහ එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු වනුහයන් සංශෝධනය කරමින් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම. |
| 2024.02.02 | 2024.02.02 දිනැති අංක 2369/42 දරන ගැසට් නිවේදනය<br>- රෙගුලාසියෙහි II වන උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක නිවැරදි කිරීම. |
| 2024.04.22 | 2024.04.22 දිනැති අංක 2381/16 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සහ 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිංහල පරිවර්තන දෝෂ නිවැරදි කිරීම. |
| 2024.05.29 | 2024.05.29 දිනැති අංක 2386/09 දරන ගැසට් නිවේදනය<br>- රෙගුලාසියෙහි II වන උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම. |
| **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත** | |
| 2024.01.01 | 2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත<br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම. |
| **එකතු කළ අගය මත බද්ද (වැට බද්ද) - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2024.01.01 | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත<br>- ප්‍රධාන අයිතම මත අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම. |
| 2024.01.01 | 2023.12.19 දිනැති අංක 2363/22 දරන ගැසට් නිවේදනය<br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම. |
| 2024.01.01 | 2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත<br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම සහ එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම. |
| | 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත |
| 2024.01.01 | 1) 2002 අංක 14 දරන වැට් බදු පනතෙන් බදු නිදහස් කිරීම් ඉවත් කිරීමේ අනපේක්ෂිත බලපෑම් වලක්වා ගැනීම, පනතේ පැහැදිලි බව පවත්වා ගැනීම හා 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් හඳුන්වා දී ඇති එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම. |
| 2025.04.11 | 2) භාණ්ඩ වැට් බද්දෙන් නිදහස් කර ඇති බව හෝ ආනයනකරු/ අපනයනකරු වැට් බදු ලියාපදිංචි සීමාවට පහලින් සිටින බව නොසලකා හැර, වාණිජමය අරමුණින් ආනයන/ අපනයන සිදු කරන විට, ස්ථිර වැට් බදු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම. |
| 2025.04.11 | 3) වැට් බද්දෙන් නිදහස් කරන ලද සැපයුම් /මිලදී ගැනීම් සම්බන්ධයෙන් වැට් බදු වාර්තා ගොනු කිරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම. |

| | |
|---|---|
| 2025.04.11 | 4) දේශීයව නිපදවන දියර කිරි සහ යෝගට් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම. |
| 2025.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි | 5) 2025 ඔක්තෝබර් මස 01 දින සිට නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සිදුකරන සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බදු පැනවීම. |
| 2025.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි | 6) සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) යෝජනා ක්‍රමය 2025 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම. |
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය<br>- ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩවල බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2025.01.11 | 2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශකකරණය මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/42 දරන ගැසට් නිවේදනය<br>- විද්‍යුත් වාහන සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 100 කින් වැඩි කිරීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/04 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සඳහා නිෂ්පාදන බද්ද පැනවීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2024.01.01 | සුරාබදු නිවේදන අංක 04/2023 (2023.12.31 දිනැති අංක 2364/35 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු සඳහා වාර්ෂික උද්ධමන ගැලපීමක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල මත්පැන් සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 01/2024 (2024.01.12 දිනැති අංක 2366/38 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 02/2024 (2024.01.12 දිනැති අංක 2366/39 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 902 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2024.02.01 | සුරාබදු නිවේදන අංක 03/2024 (2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු ගාස්තු හඳුන්වා දීම. |
| 2024.08.14 | සුරාබදු නිවේදන අංක 05/2024 (2024.08.13 දිනැති අංක 2397/22 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 666 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2025.01.11 | සුරාබදු නිවේදන අංක 01/2025 (2025.01.10 දිනැති අංක 2418/42 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව මත්පැන් මත සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| **දුම්කොළ බද්ද - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත** | |
| 2025.04.02 | 2025.04.01 දිනැති අංක 2430/16 දරන ගැසට් නිවේදනය<br>- බීඩි සඳහා අදාළ වන දුම්කොළ බද්ද ඒකකයට රු. 2/- සිට රු. 3/- දක්වා වැඩි කිරීම. |
| **වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/37 දරන ගැසට් නිවේදනය<br>- 2023 වසරේ අයවැය යෝජනා අංක 34.6 (තීරු බදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීම.) අනුව වසර පහක් ඇතුලත වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බැවින් පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 26 ක වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීම. |

| | |
|---|---|
| 2024.03.29 | 2024.03.28 දිනැති අංක 2377/39 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ (SLSFTA) විධිවිධාන අනුව, අයිතම 3,117ක් සඳහා සහනදායී මිල ගණන් යෙදීමට සහ සිංගප්පූරුවෙන් එම භාණ්ඩ ආනයනය කිරීමේදී භාණ්ඩ 595 ක් නිදහස් කිරීම. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2024.01.06 | 2024. 01.04 දිනැති අංක 2365/50 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) ප්‍රකාශයට පත් කිරීම. |
| 2024.09.06 | 2024. 09.05 දිනැති අංක 2400/25 දරන ගැසට් නිවේදනය<br>- 2024.08.12 දිනැති අංක 24/1541/622/002-II දරන අමාත්‍ය මණ්ඩල තීරණ අංක සහ 2024.08.26 දිනැති අංක 24/1709/631/026-I දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සෙස් බද්ද සංශෝධනය කිරීම පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්) - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2024.02.01 | 2024.01.12 දිනැති අංක 2366/34 දරන ගැසට් නිවේදනය<br>- වෙළෙඳපොළ අතරමැදියන් සහ වෙළෙඳපොළ ආයතන සඳහා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම් සංශෝධනය කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්) - 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත** | |
| 2024.12.23 | 2024.12.22 දිනැති අංක 2415/79 දරන ගැසට් නිවේදනය<br>- රක්ෂණකරුවන් සඳහා අදාළ වන වාර්ෂික ගාස්තු රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරිකයෙන් සියයට 0.125 සිට සියයට 0.2 දක්වා වැඩි කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2024.01.06 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 06/2023 (2024.01.04 දිනැති අංක 2365/51 දරන ගැසට් නිවේදනය)<br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,222 ක රේගු ආනයන තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහනේ (TLP) “6” කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් දෙවන වාරිකය ඉවත් කිරීම. |
| 2025.01.28 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2025 (2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනය)<br>- මෝටර් රථ ආනයනය සඳහා සියයට 20 හෝ සියයට 20 ක නිශ්චිත තීරු බදු අනුපාතයක් සමඟ (මිශ්‍ර තීරු බදු අනුපාතය) රේගු ආනයන බද්දක් පැනවීම. |
| 2025.04.29 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2025 (2025.04.28 දිනැති අංක 2434/02 දරන ගැසට් නිවේදනය)<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක (NSD) නිර්මාණය කිරීම. |
| **රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)** | |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/43 දරන ගැසට් නිවේදනය<br>- මෝටර් රථ ආනයනය සඳහා ආනයන බදු මත අධිභාරයක් පැනවීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/03 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක (NSD) සඳහා අධිභාරයෙන් සියයට 50ක් පැනවීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2024.01.02 | 2024.01.02 දිනැති අංක 2365/04 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි මස 02 වැනි දින සිට 2024 ජනවාරි මස 21 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/- ක බදු සහනයක් සැලසීම. |

| | |
|---|---|
| 2024.01.08 | 2024.01.07 දිනැති අංක 2365/84 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.02.20 | 2024.02.19 දිනැති අංක 2372/06 දරන ගැසට් නිවේදනය<br>- බඩ ඉරිඟු, උඳු සහ මුං ඇට ආනයනය මත පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම හා කව්පි සහ කුරක්කන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු.70/- සිට රු. 300/- දක්වා වැඩි කිරීම. |
| 2024.03.02 | 2024.03.01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනය<br>- 2024 අප්‍රේල් මස 11 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/- ක බදු සහනයක් සැලසීම. |
| 2024.03.27 | 2024.03.26 දිනැති අංක 2377/17 දරන ගැසට් නිවේදනය<br>- උත්සව සමය පිළිබඳ සලකා අනෙකුත් එණු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 10/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ සහනදායී බදු අනුපාතයක් අය කිරීම සහ 2024.01.02 සිට 2024.01.21 දක්වා සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/- ක බදු සහනයක් සැලසීම. |
| 2024.05.18 | 2024.05.17 දිනැති අංක 2384/31 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා අයිතම 34ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම. |
| 2024.07.31 | 2024.07.31 දිනැති අංක 2395/32 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලුණු ආනයනය මත තීරුබදු නිදහස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම සහ භාණ්ඩ 6ක් සඳහා වලංගු කාලය දීර්ඝ කිරීම. |
| 2024.10.03 | 2024.10.02 දිනැති අංක 2404/19 දරන ගැසට් නිවේදනය<br>- දේශීය අස්වනු නෙලීමේ කාලය සැලකිල්ලට ගනිමින් අර්තාපල් සහ බොම්බයි එණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළවෙලින් කිලෝ ග්‍රෑමයකට රු.60/-ක් හා රු.30/- ක් වැඩි කිරීම. |
| 2024.10.14 | 2024.10.14 දිනැති අංක 2406/02 දරන ගැසට් නිවේදනය<br>- මාළු, උම්බලකඩ, පරිප්පු, මැන්ගුස් සහ කිවි පලතුරු ආනයනය සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය සහ දේශීය ටින් මාළු කර්මාන්තයේ භාවිතය සඳහා මැකරල් මාළු ආනයනය සඳහා තීරු බදු සහනය 2024 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම. |
| 2024.11.02 | 2024.11.01 දිනැති අංක 2408/15 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා ආනයනික සුදු සීනි මත රු. 50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.12.01 | 2024.11.30 දිනැති අංක 2412/38 දරන ගැසට් නිවේදනය<br>- ආනයනික අර්තාපල් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ 2024 දෙසැම්බර් 31 දක්වා ආනයනික ලොකු එණු සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 30/- සිට රු. 10/- දක්වා අඩු කිරීම. |
| 2025.01.01 | 2024.12.31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය<br>- අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයනික අයිතම 63 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2025 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම. |
| 2025.01.28 | 2025.01.27 දිනැති අංක 2421/03 දරන ගැසට් නිවේදනය<br>- රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2024.01.11 | 2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.01.11 දිනැති අංක 2366/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ වර්ග ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම. |

| | |
|---|---|
| 2024.02.07 | 2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.07 දිනැති අංක 2370/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 12(අ) රෙගුලාසිය සංශෝධනය කිරීම මගින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර දී ඇති කාලය 2024.08.31 දක්වා දීර්ඝ කිරීම.* |
| 2024.02.19 | 2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.19 දිනැති අංක 2372/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම.** |
| 2024.02.29 | 2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.28 දිනැති අංක 2373/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- පිළිගැනීම් මත ලේඛන (DA) සහ ගෙවීම් මත ලේඛන (DP) ගෙවීම් ක්‍රමවල පූර්ව අනුමත කිරීමේ අවශ්‍යතාවයට අදාළ 2022 අංක 07 දරන ආනයන පාලන රෙගුලාසිවල (2024.05.06 දින අංක 2278/21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 6 දරන රෙගුලාසිය ඉවත් කිරීම. |
| 2024.03.19 | 2024 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.03.19 දිනැති අංක 2376/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.04.08 | 2024 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.04.08 දිනැති අංක 2379/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC), ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා භදබිම අධිකාරිය සඳහා 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති උඳු මෙට්‍රික් ටොන් 2,000 ක් ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සංචාරක අංශය සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- තෝරාගත් ආනයනික භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති නියම කිරීම. |
| 2024.06.06 | 2024 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.06 දිනැති අංක 2387/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දින අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති පුවක් ආනයනය කිරීමට අවසර දීම. ** |
| 2024.06.28 | 2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.28 දිනැති අංක 2390/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- ආහාරයට ගත හැකි තෝරාගත් ධාන්‍ය සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම සහ මිනිසුන් රහිත ගුවන් යාත්‍රා සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම. |

| | |
|---|---|
| 2024.07.18 | 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.07.18 දිනැති අංක 2393/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.08.21 | 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (2024.08.21 දිනැති අංක 2398/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවල අර්ථය තුළ බලයලත් පුද්ගලයන්ට විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.09.11 | 2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.09.11 දිනැති අංක 2401/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කරන ලද ගිවිසුම් සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ එකලස් කිරීමේ ව්‍යාපෘති සඳහා නවතම අර්ධ වශයෙන් එකලස් කළ (SKD) කට්ටල ආනයනය කිරීමට අවසර දීම. ** |
| 2024.12.04 | 2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.04 දිනැති අංක 2413/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය, 2024 දෙසැම්බර් 20 වන දින දක්වා ඉවත් කිරීම.* |
| 2024.12.18 | 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.18 දිනැති අංක 2415/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන අයිතම ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.* |
| 2024.12.24 | 2024 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.24 දිනැති අංක 2416/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2024.12.04 දිනැති අංක 2413/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සිදු කරන ලද සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම, 2025 ජනවාරි 10 වන දින දක්වා අඛණ්ඩව සිදු කිරීම.* |
| 2025.01.28 | 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.* |
| 2025.02.01 | 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, සපෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම. |
| 2025.03.19 | 2025 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.03.19 දිනැති අංක 2428/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- භාවිතා කළ මෝටර් රථ සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීමට සියලුම රටවල් සඳහා බලයලත් පරීක්ෂකවරයෙකු ලෙස බියුරෝ වෙරිටාස් ආයතනය පත් කිරීම, සහ අපනයන රටෙහි බැංකුවේ මුද්‍රාව (2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 5 දරන රෙගුලාසිය ප්‍රකාරව අවශ්‍යවන) නොමැතිව ලැබුණු මෝටර් රථවල අපනයන පරීක්ෂණ සහතික මාර්ගගත සත්‍යාපනය හරහා නිකුත් කිරීමට බලපත්‍ර බැංකුවලට බලය පැවරීම. |
| 2025.04.29 | 2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.04.19 දිනැති අංක 2434/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2023.01.01 දිනැති අංක 2312/77 දරන ඇති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවූ අයිතම ලැයිස්තුව සමාලෝචනය කර තෝරාගත් අයිතම එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සහ ඕනෑම රටක ලියාපදිංචි නොකළ (නවතම) විද්‍යුත් යතුරුපැදි ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |

| | |
|---|---|
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2024.02.01 | 2024.02.01 දිනැති අංක 2369/27 දරන ගැසට් නිවේදනය<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින්, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා වන ඇ.ඩො.30 ක සහනදායී අනුපාතය දීර්ඝ කිරීම. |
| 2024.03.07 | 2024.03.06 දිනැති අංක 2374/19 දරන ගැසට් නිවේදනය<br>- 2024 මාර්තු මස 07 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර තුනක පමණ කාලයක් සඳහා ඇ.ඩො. 60 ක අපගමන බද්ද වෙනුවට, මගී යාත්‍රා ප්‍රවාහනය මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.ඩො. 5 ක් ලෙස සහනදායී අනුපාතයක් සහ මගී නෞකාවක් මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.ඩො. 20 ක් ලෙස සහනදායී අනුපාතයක් ප්‍රදානය කිරීම. |
| 2025.01.31 | 2025.01.31 දිනැති අංක 2421/30 දරන ගැසට් නිවේදනය<br>- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, අපගමන බදු නිදහස් කිරීමේ කාලය ජාත්‍යන්තර ගුවන් සේවාවක් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර තුනක කාලයක් සම්පූර්ණ වන දින හෝ 2025.12.28 යන දින දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනය දක්වා දීර්ඝ කිරීම.<br><br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා ඇ.ඩො. 30 ක සහනදායී අපගමන බදු අනුපාතය දීර්ඝ කිරීම. |
| **ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත** | |
| 2025.04.01 | 2025.04.01දිනැති අංක 2430/14 දරන ගැසට් නිවේදනය<br>- පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු සඳහා ගෙවිය යුතු වත්මන් බදු අනුපාතය 2025 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා වසර තුනක් සඳහා දීර්ඝ කිරීම. |
| **මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2024.01.24 | 2024.01.24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය<br>- 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි පිහිටුවීම සහ මෝටර් රථ ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය තව දුරටත් දීර්ඝ කිරීම (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විද්‍යුත් මෝටර් රථවල බදු රහිත සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා වැඩි කිරීම). |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/41 දරන ගැසට් නිවේදනය<br>- විද්‍යුත් මෝටර් රථ හැර, සෑම ඉන්ධන කාණ්ඩයකම මෝටර්රථ සඳහා වන සුඛෝපභෝගී බදු සීමාව රු. මිලියන 1.5 කින් වැඩි කිරීම. |
| 2025.04.29 | 2025.04.28 දිනැති අංක 2434/05 දරන ගැසට් නිවේදනය<br>- බාහිර විද්‍යුත් බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සඳහා සුඛෝපභෝගී බද්ද පැනවීම. |

* දැනට බලනොපැවැත්වේ.

** දැනට වලංගු නොවේ.

# 05

# රාජ්‍ය වියදම

## 5.1 සමාලෝචනය

ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේ දී නිකුත් කරන ලද සංගෘහීත චක්‍රලේඛය මඟින් ප්‍රකාශයට පත් කළ පරිදි, රාජ්‍ය අරමුදල් වැය කිරීමේ දී කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය හා මුදලට සරිලන වටිනාකම ප්‍රශස්ත අන්දමින් පවත්වාගෙන යාම උදෙසා රජය විසින් වියදම් පාලනය කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. එසේ වුව ද, පුනරාවර්තන වියදම් තුළ පවතින අනම්‍ය බව පොදු සංසිද්ධියක් වන අතර එමඟින් දිගු කාලීන ආර්ථික වර්ධනය සඳහා ඉතා වැදගත් වන රාජ්‍ය ආයෝජන සඳහා වන වියදම් කප්පාදු කිරීමට ඇතැම් විට රජයට සිදුවිය. රු.බිලියන 2,689.5 ක් වූ පොළී ගෙවීම් (2024 වසරේ ද.දේ.නි. යෙන් සියයට 9.0 ක්), රු. බිලියන 1,066.0 ක් වූ වැටුප් සහ වේතන (ද.දේ.නි. යෙන් සියයට 3.6 ක්), සහ රු. බිලියන 1,134.8 ක් වූ විශ්‍රාම වැටුප් ඇතුළු කුටුම්බ සඳහා වූ අත්‍යාවශ්‍ය ගෙවීම් (ද.දේ.නි. යෙන් සියයට 3.8 ක්) වැනි අනිවාර්ය ගෙවීම් සිදුකිරීම සඳහා මෙම වියදම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කිරීමට සිදුවූ අතර, මෙම තත්ත්වය වසර ගණනාවක් මුළුල්ලේ පෙන්නුම් කරයි.

පසුගිය වසර කිහිපය මුළුල්ලේ හඳුන්වා දෙනු ලැබූ සියලු ක්‍රියාමාර්ග සංගෘහීත කරමින් ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 ප්‍රකාශයට පත්කරන ලදී. මෙම චක්‍රලේඛය මඟින් අනිකාල ගෙවීම්, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා, රාජ්‍ය උත්සව, සහ අනෙකුත් සම්බන්ධිත ක්ෂේත්‍රවල වියදම්වලට අදාළව විනයානුකූල බවක් ස්ථාපිත විය. උපරිම ඵලදායිතාවයකින් යුතුව රාජ්‍ය සේවා සැපයීම සඳහා අත්‍යාවශ්‍ය භූමිකා අරමුණු කරගනිමින්, මනා පාලනයකින් යුක්තව සේවක සංඛ්‍යා කළමනාකරණය සිදුකරන ලදී. මීට අමතරව, ප්‍රාග්ධන වියදම් වඩාත් විවක්ෂණශීලීව, විශේෂයෙන් ප්‍රමුඛතාගත කරමින් සහ මුදලට සරිලන වටිනාකම සහතික කරමින් කළමනාකරණය කරන ලදී.

රාජ්‍ය මුදල් කළමනාකරණයෙහි විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා වියදම් කළමනාකරණය ඩිජිටල්කරණය කිරීම, ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රයක් ලෙස අඛණ්ඩව පවතී. ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) දියත් කිරීම තවදුරටත් වැඩිදියුණු කරන ලද අතර, මධ්‍යගත බැඳීම් පාලන යාන්ත්‍රණ සැලකිය යුතු ලෙස ශක්තිමත් කර වියදම් නිරීක්ෂණ ක්‍රමවේද වර්ධනය කර ඇත. මිල අනාවරණය කරගැනීම්, විනිවිදභාවය සහ රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන අංශය ද මෙම වර්ෂය තුළ පුළුල් කරන ලදී. ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ රජයේ කාර්යන් තුළ වියදම් අවම කිරීම සඳහා රජයේ සේවා සැපයුම තුළ, පුළුල් ඩිජිටල් ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක විණි.

## 5.2 2024 වර්ෂයේ රජයේ වියදම්

2023 වර්ෂයේ දී රු. බිලියන 5,356.6 ක් වූ රජයේ වියදම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 6,130.7 ක් දක්වා සියයට 14.5 කින් වැඩිවිය. වැටුප් සහ වේතන, පොළී ගෙවීම්, සහනාධාර සහ පැවරීම්, සහ භාණ්ඩ සහ සේවා සඳහා වූ වැයකිරීම් ඉහළ යෑම මීට හේතු විය. 2023 වර්ෂයේ දී රු. බිලියන 4,699.7 ක් වූ පුනරාවර්තන වියදම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 5,339.9 ක් දක්වා සියයට 13.5 කින් වැඩි වූ අතර, 2023 වර්ෂයේ දී රු. බිලියන 656.9 ක් වූ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය ගෙවීම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 790.8ක් දක්වා වැඩි විය.

2023 වර්ෂයේ දී රු. බිලියන 2,455.6 ක් වූ පොළී ගෙවීම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 2,689.5 ක් දක්වා සියයට 9.5 කින් ඉහළ යන ලදී. විදේශීය පොළී ගෙවීම් සියයට 224.5 කින් ඉහළ යෑමේ සහ දේශීය පොළී ගෙවීම් සියයට 1.8 කින් පහළ යෑම අතර ශුද්ධ බලපෑම මීට හේතු විය. 2023 වර්ෂයේ දී රු. බිලියන 2,244.1 ක් වූ පොළී නොවන පුනරාවර්තන වියදම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 2,650.4 ක් දක්වා සියයට 18.1 කින් වැඩි වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හේතුවෙන් වැටුප් සහ වේතන සඳහා වන වියදම්, රු. බිලියන 1,066.0 ක් දක්වා සියයට 13.5 කින් ඉහළ යාම යි.

2023 වර්ෂයේ දී රු. බිලියන 1,004.9 ක් වූ සහනාධාර සහ පැවරීම් සඳහා වූ වියදම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 1,233.5 ක් දක්වා සියයට 22.8 කින් වැඩිවිය. විශ්‍රාම වැටුප් ද ඇතුළුව සුබසාධන ගෙවීම් සහ අනෙකුත් සමාජ සුබසාධන වැඩසටහන් සඳහා වූ ඉහළ ගිය වියදම්, මෙම වැඩිවීම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

2023 වර්ෂයේ දී රු. බිලියන 913.6 ක් වූ ප්‍රාග්ධන වියදම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 776.6 ක් දක්වා සියයට 15 කින් අඩු වී ඇත. එසේ වුව ද, 2023 වර්ෂයේ දී රු. බිලියන -256.7 ක් වූ ශුද්ධ ණය ගෙවීම්, 2024 වර්ෂයේ දී රු. බිලියන 14.2 ක් දක්වා සියයට 105.5 කින් වැඩි වී ඇත.

2023 වර්ෂයේ දී පුනරාවර්තන වියදම්, ද.දේ.නි. යෙන් සියයට 17.1 සිට 2024 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් සියයට 17.9 දක්වා සියයට 0.8 කින් ඉහළ යෑම හේතුවෙන්, රජයේ වියදම 2023 වසරේ දී, ද.දේ.නි. යෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 19.5 සිට 2024 වසරේ දී සියයට 20.5 දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. එසේ වුව ද, පොළී ගෙවීම් 2024 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් සියයට 9.0 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. 2023 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 3.4 කට පැවති රාජ්‍ය ආයෝජන, 2024 වර්ෂයේ දී සියයට 2.7 දක්වා පහළ ගොස් ඇත.

## 5.3 2024 වර්ෂය සඳහා වන විසර්ජන පනත

2023 ඔක්තෝබර් 05 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද 2024 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත, 2023 දෙසැම්බර් මස 13 වැනි දින අනුමත වූ අතර, එය 2023 අංක 34 දරන විසර්ජන පනත ලෙස සම්මත විය. විසර්ජන පනතට අනුව, රජයේ මුළු වියදම රු. බිලියන 7,008.4 ක් ලෙස ඇස්තමේන්තුගත කරන ලද

අතර, මීට පුනරාවර්තන වියදම් සඳහා වූ රු.බිලියන 5,298.7 ක්, ප්‍රාග්ධන වියදම් සඳහා වූ රු. බිලියන 1,709.8 ක්, ණය ආපසු ගෙවීම් සඳහා රු. බිලියන 4,268.4 ක්, සහ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වූ රු. බිලියන 6 ක් ඇතුළත් විය. එම ප්‍රතිපාදන, වැය ශීර්ෂ 185 ක් අතරේ වෙන්කරන ලදි. 2023 අංක 34 දරන විසර්ජන පනතේ ඇතුළත් උපලේඛන තුනෙහි සාරාංශය, 5.1 වගුවේ විස්තරාත්මකව දක්වා ඇත. පනතේ 2 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා රජයේ ණය ගැනීම් සීමාව, රු. බිලියන 7,350 ක් වූ අතර, 2023 වර්ෂයේ දී එය රු. බිලියන 4,979 ක් විය.

## 5.4 පරිපූරක ඇස්තමේන්තු

2024 වර්ෂයේ දී, අවස්ථා 02 ක දී (2024 ජූනි 19 සහ 2024 දෙසැම්බර් 06) පාර්ලිමේන්තුව විසින් සමස්ත මුදල රු. බිලියන 234.6 ක් වූ පරිපූරක ඇස්තමේන්තු 14 ක් අනුමත කර තිබේ. එසේ වුව ද, මෙම පරිපූරක ඇස්තමේන්තුවල ප්‍රතිපාදනවලට සමාන ප්‍රතිපාදන මුදලක් මීට සමගාමීව අවුරා තැබීම හේතුවෙන් සමස්ත ඇස්තමේන්තුවල අගයට බලපෑමක් ඇති නොවිනි. මෙම ප්‍රතිපාදනවල සාරාංශයක් 5.4 වගුවේ දැක්වේ.

**වගුව 5.1 | 2024 විසර්ජන පනතේ උපලේඛන**

රු. බිලියන

| උපලේඛනය | විස්තරය | මුදල |
|---|---|---|
| පළමු උපලේඛනය | වැඩසටහන් අනුව රජයේ සාමාන්‍ය සේවාවන්ට අදාළ වන වියදම් | 4,310.9 |
| දෙවන උපලේඛනය | යම් නීතියක් යටතේ අධිකාරි බලය ලබා දී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන රජයේ වියදම් | 6,966.0 |
| තෙවන උපලේඛනය | අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ වියදම් | 6.0 |
| රජයේ මුළු වියදම | | **11,282.8** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## පරිපූරක ඇස්තමේන්තු ලෙස විශේෂ නීති සේවා අධිකාරී බලපත්‍ර

2023 අංක 34 දරන විසර්ජන පනතේ 2 වැනි උපලේඛනයේ විශේෂ නීති සේවා ලෙස හඳුනාගෙන ඇති රජයේ අතිරේක මුදල් අවශ්‍යතාවය සපුරාලීම පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබාගැනීමට බලය ලබා දෙමින්, විශේෂ නීති සේවා අධිකාරී බලපත්‍ර හතරක් (04) 5.2 වගුවේ දක්වා ඇති පරිදි නිකුත් කරන ලදී.

## 5.5 2024 වසර සඳහා සංශෝධිත අයවැය

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අයවැය ප්‍රතිපාදන, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් විශේෂ නීති සේවා අධිකාරී බලපත්‍ර හතරක් සහ විශේෂ බලපත්‍ර නිකුත් කිරීමත් සමඟ සංශෝධනය කරන ලදී. ඒ අනුව, යථොක්තව සඳහන් කරන ලද විශේෂ නීති සේවා අධිකාරී බලපත්‍ර හතර නිකුත් කිරීම මගින් අයවැය සංශෝධනය සිදුවීමෙන් අනතුරුව, 2024 වර්ෂයේ සමස්ත අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම පහත 5.3 වගුවේ දැක්වේ.

**වගුව 5.2 | රජයේ මුළු වියදම**

| අධිකාරී බලපත්‍ර අංකය | වැය ශීර්ෂ අංකය | වියදම් කිරීමේ ආයතනය | අරමුණ | මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | 010 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමශන කොමිෂන් සභාව | කොමසාරිස්වරුන්ගේ වැටුප් ගෙවීමට | 12,060,000 |
| 2 | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම වැටුප් ගෙවීමට | 3,400,000,000 |
| 3 | 001 | අතිගරු ජනාධිපති | විශ්‍රාම වැටුප් ගෙවීමට | 318,500 |
| 4 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | දේශීය ණය ආපසු ගෙවීම් | 5,600,000,000 |
| | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | දේශීය ණය සඳහා පොලී ගෙවීම් | 102,000,000,000 |
| | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | විදේශීය ණය සඳහා පොලී ගෙවීම් | 362,000,000,000 |
| එකතුව | | | | **473,012,378,500** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**වගුව 5.3 | 2024 වසර සඳහා අදාළ වන සමස්ත අයවැය ප්‍රතිපාදන**

රු.

| බලය ලැබූ මූලාශ්‍රය | පුනරාවර්තන | මූලධන/ණය ආපසු ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| 2023 අංක 34 දරන විසර්ජන පනතේ 1 වන උපලේඛනය | 2,596,422,273,000 | 1,714,424,515,000 | 4,310,846,788,000 |
| විසර්ජන පනතේ 2 වන උපලේඛනය | 2,702,246,712,000 | 4,263,744,700,000 | 6,965,991,412,000 |
| විසර්ජන පනතේ 3 වන උපලේඛනය | | | 6,000,000,000 |
| පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද පරිපූරක ඇස්තමේන්තු | 224,359,000,000 | 10,264,000,000 | 234,623,000,000 |
| පරිපූරක ප්‍රතිපාදන සැලසීම සඳහා අවුරා තබන ලද ප්‍රතිපාදන | (35,822,000,000) | (198,801,000,000) | (234,623,000,000) |
| මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද විශේෂ සේවා අධිකාරී නීති බලපත්‍ර | 111,012,378,500 | 362,000,000,000 | 473,012,378,500 |
| මුදල් රෙගුලාසි ප්‍රකාරව පුනරාවර්තන මඟින් මූලධන වෙත මාරු කරන ලද ප්‍රතිපාදන | (75,533,113,004) | 75,533,113,004 | |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(4) වගන්තිය මඟින් අනුමත කරන ලද ප්‍රතිපාදන | 5,000,000,000 | | 5,000,000,000 |
| සංශෝධිත අයවැය එකතුව | 5,527,685,250,496 | 6,227,165,328,004 | 11,760,850,578,500 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව



## 5.6 අත්තිකාරම් ගිණුම් කටයුතු

රජයේ නිලධාරීන්ට ණය අත්තිකාරම් ලබා දීමත් රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් මෙහෙයවන වාණිජමය ස්වභාවයේ කටයුතු, අත්තිකාරම් ගිණුම් යටතේ වන කටයුතුවලට ඇතුළත් වේ. රජයේ නිලධාරීන් සඳහා ණය අත්තිකාරම් ලබාදීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකමක් වේ. 2024 වර්ෂයේ අත්තිකාරම් ගිණුම් කටයුතුවල ඇස්තමේන්තුගත උපරිම වියදම රු. බිලියන 44.90 ක් වූ අතර සත්‍ය වියදම ලෙස රු. බිලියන 32.22 ක් වාර්තා වී ඇත. ඒ අනුව, 2023 අංක 34 දරන විසර්ජන පනත මඟින් අනුමත මුළු වියදම් සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදුකර ඇත.

2024 වර්ෂයේ දී රු. බිලියන 38.90 ක් අවම ලැබීම් ඉලක්කය ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, සත්‍ය ලැබීම් රු. බිලියන 30.31 ක් විය. එබැවින් අවම ලැබීම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇත. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක අත්තිකාරම් ගිණුම් වැය විෂය අංක 21302 යටතේ වූ අවම ලැබීම් ඉලක්ක සපුරාගැනීමට නොහැකිවීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

## 5.7 රාජ්‍ය වියදම් කළමනාකරණය

### 5.7.1 අරමුදල් මාරු කිරීම

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සම්පූර්ණ වියදම් සීමාව තුළ උපයෝජනය නොකළ ප්‍රතිපාදන 2023 අංක 34 දරන විසර්ජන පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව, මුදල් රෙගුලාසි අංක 66 හි සිට 69 (මු.රෙ. 66 සිට මු.රෙ.69) හි නිශ්චිතව දක්වා ඇති විරමොං පටිපාටිය යටතේ, නැවත වෙන් කිරීමට හෝ මාරු කිරීමට අනුමැතිය ලබාදීමට භාණ්ඩාගාර ලේකම්, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්, සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය ලබා දී ඇත.

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 1 | අතිගරු ජනාධිපති | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීමට අදාළ වියදම් දැරීම පිණිස, "ගාසා ළමා අරමුදල (Children of Gaza Fund)" ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ සංවර්ධන කාර්යයන්ට අදාළ වැය දැරීම පිණිස. | 392,617,000 | 3,000,000,000 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 25,632,000 | - |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,800,000 | - |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 4,080,800 | - |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,130,000 | - |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන සහ මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 12,791,000 | 3,624,00 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමශන කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 77,380,000 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධයෙයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ යුරෝපා සංගමයේ සහයෝගීතාවය මත ක්‍රියාත්මක, ශ්‍රී ලංකාවේ අධිකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන (Sri Lanka Justice Reform Program) යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් ලබා දෙන අතිරේක ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස. | 6,200,000 | 8,000,000 |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 8,099,000 | - |
| 20 | මැතිවරණ කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 61,017,000 | - |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 750,000 | - |
| 25 | සීමා නිර්ණය කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 655,000 | - |
| 101 | බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අමරදේව අසපුව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩ නිම කිරීම සම්බන්ධයෙන් වන වියදම් දැරීම පිණිස, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය මගින් අරමුදල් සපයන ලද "රංගිරි දඹුලු ලෙන් විහාරයේ ලෝක උරුම දේපල පිළිබඳ ව්‍යාපෘතියේ" වියදම් පියවීම පිණිස, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය මගින් අරමුදල් සපයන ලද "සීගිරියේ සර්පිලාකාර පඩිපෙළ සංරක්ෂණ ව්‍යාපෘතියේ" වියදම් පියවා ගැනීම පිණිස. | 119,892,900 | 49,035,690 |
| 102 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | "වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියට අදාළව, ලෝක බැංකුව සමඟ ඇතිකරගත් ණය ගිවිසුම යටතේ ණය මුදල් උපයෝජනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය යටතේ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහනට අනුකූලව මූල්‍ය ස්ථාවරත්ව අරමුදලක් පිහිටුවීම පිණිස, ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය පුනරාවර්තන සහ මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ අත්‍යාවශ්‍ය පුනරාවර්තන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ මුදල් අමාත්‍යාංශයේ අත්‍යාවශ්‍ය පුනරාවර්තන සහ මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස." | 98,682,700 | 8,937,425,000 |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, හදිසි ආපදාවෙන් පීඩාවට පත්වූවන්ගේ ජීවනෝපාය සඳහා ආධාර වශයෙන් මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබුණු ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස, ගංවතුර බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන කටයුතු සඳහා ගෙවීම් කිරීම පිණිස, හදිසි ආපදා තත්ත්වයෙන් හානියට පත් වූ නිවාස සඳහා වන්දි ගෙවීමට සහ හදිසි ආපදා තත්වයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ට ආපදා සහන සැලසීම සඳහා අංක 01/2020 දරන ආපදා කළමනාකරණ චක්‍රලේඛය අනුව වන්දි ගෙවීම උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම පිණිස, ජාත්‍යන්තර ජලවිද්‍යා සංවිධානයට අදාළව ගෙවිය යුතු සාමාජික ගාස්තු ගෙවීමේ ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ 'STRIDE' ව්‍යාපෘතිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලැබී ඇති ප්‍රදානයේ ඉතිරි මුදල් උපයෝජනය කිරීම පිණිස. | 836,924,000 | 243,481,673 |
| 105 | ජනමාධ්‍ය අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ ප්‍රසිද්ධ රාහුම් පාලක මණ්ඩයේ සිනමා ශාලාවෙහි ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 9,495,000 | 10,000,000 |
| 110 | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ (International Organization for Migration-IOM) මූල්‍ය සහාය යටතේ ක්ෂුද්‍ර ප්‍රජා පාදක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස, 2024.08.02 දිනැති අංක CP/24/1676/614/028-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අධිකරණ පියස ව්‍යාපෘතියට අදාළව 2024 වර්ෂය සඳහා වන හිඟ බිල්පත් පියවීම පිණිස සහ 2023.09.25 දිනැති අංක 23/1665//614/016-III දරන සහ 2023.11.06 දිනැති අංක 23/2103/614/016-IV දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, එක්ස්ප්‍රස් පර්ල් භාණ්ඩ නෞකාව හා සම්බන්ධිත සමුද්‍රීය ව්‍යසනයට අදාළව ලබා ගෙන ඇති නෛතික සේවා වෙනුවෙන් වූ වෘත්තීය ගාස්තු ගෙවීම පිණිස. | 545,405,000 | 1,270,917,172 |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 111 | සෞඛ්‍ය අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල (යුනිසෙෆ්) විසින් ප්‍රදානය කළ ටොයෝටා ඩබල් කැබ් රථ 21ක සහ එන්නත් ශීතකරණ තත්ත්ව යටතේ ගෙනයෑමේ ට්‍රක්රථ 10ක වටිනාකම ගිණුම්ගත කිරීම පිණිස, 2023.11.13 දිනැති අංක 23/2114/610/082 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, "ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ" (ශ්‍රී ලංකා රජය-ලෝක බැංකුව) ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, 2024.04.05 දිනැති අංක 23/2121/624/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව චන්දි ගෙවීම පිණිස, ජර්මානු ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහලේ ඉදිකිරීම් කටයුතුවලට අදාළව දේශීය බදු ප්‍රතිපූරණය කිරීම සඳහා ප්‍රතිපාදන සලසනු පිණිස, ශ්‍රී ලංකාවේ ජාතික රෝහලේ බාහිර රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථානයේ (OPD) බාහිර සත්කාරක මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමට අදාළව බදු ප්‍රතිපූරණය කිරීම සඳහා ප්‍රතිපාදන සලසනු පිණිස, 2021.07.05 දිනැති අංක 21/1161/309/068 සහ 2022.07.15 දිනැති අංක 22/0967/512/014TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව, සාර්ක් අරමුදල හරහා මහනුවර, ජාතික රෝහලේ කොවිඩ්-19 වැලඳුන රෝගීන් වෙන් කර තැබීම සඳහා වූ ගොඩනැගිල්ල ස්ථාපනය කිරීමට අදාළව අතැති බිල්පත් පියවීම පිණිස. | 9,623,550,000 | 4,751,434,000 |
| 116 | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 7,295,000 | - |
| 117 | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0399/608/018 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, දැනටමත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති ප්‍රමුඛතා මහාමාර්ග, වාහන ගමන් කළ හැකි මට්ටම දක්වා සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු කාර්යයන් ඉදිකර නිමා කිරීමේ වියදම් දැරීම පිණිස සහ ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවෙන් ලැබී ඇති අරමුදල්වලින් අතැති බිල්පත් පියවීම පිණිස. | 13,025,000 | 730,986,975 |
| 118 | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, 2024.03.18 දිනැති අංක 24/0514/607/061 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2023/24 මහ කන්නයට අදාළව වී මිලදී ගැනීම පිණිස, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය විසින් සලසන ලද ප්‍රදාන ආධාර යටතේ "තේ වල ජාන වැඩිදියුණු කිරීමේ ආධාරක ව්‍යාපෘතිය" සඳහා Benchtop Bioreactor Solaris Jupiter උපකරණවලට අදාළ වටිනාකම ගිණුම් ගත කිරීම සහ අදාළ බදු ගෙවීම පිණිස, වාහනවල හදිසි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය දැරීම පිණිස, 'N Tea' ව්‍යාපෘතියේ වියදම් දැරීම පිණිස, 2024.08.26 දිනැති අංක 24/1660/612/076 දරන කැබිනට් තීරණය ප්‍රකාරව ඉහළ නංවන ලද පොහොර සහනාධාරයට අදාළ ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස සහ 2024.08.12 දිනැති අංක 24/1496/612/046-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2024.10.07 දිනැති අංක 24/1973/706/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආහාර හා කෘෂිකර්ම සංවිධානය (Food and Agriculture Organization- FAO) විසින් පරිත්‍යාග කරන ලද මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර මෙ.ටො. 55,000ට අදාළ වැට බදු පියවීම පිණිස. | 4,574,956,281 | 183,986,375 |
| 119 | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | ඉන්දීය මූල්‍යයනය යටතේ රජයේ ගොඩනැගිලි, අඩු-ආදායම්ලාභී නිවාස, ආගමික ස්ථාන සහ ප්‍රති-ආඝ්‍රාති ක්‍රියාවලිය යොදාගන්නා නිෂ්පාදනාගාර සඳහා වහල මත සවිකරන සූර්ය බලශක්ති පහසුකම් ලබාදීමට අදාළව විනිමය අනුපාතිකය වෙනස් වීම හේතුවෙන් ඇතිවූ ප්‍රතිපාදන ඌනතාවය සපුරාගැනීම පිණිස, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත ලැබී ඇති විදේශ මූල්‍ය ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස සහ "අපද්‍රව්‍ය වෙතින් බලශක්තිය වෙත යන බලශක්ති ව්‍යාපෘතිය" යටතේ විදුලිබලය මිලදී ගැනීමට අදාළව ප්‍රමාද වූ ප්‍රතිපූර්ණ ගෙවීම් මත පොලී ගෙවීම් පියවීම සහ උපදේශක සේවා ගාස්තු පියවීම සඳහා වන ආධාර ප්‍රදානයන් ගිණුම්ගත කිරීම පිණිස. | -<br>- | 5,604,700,000 |
| 122 | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 48,950,000 | - |
| 123 | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 67,900,000 | - |

## වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (Korea International Cooperation Agency-KOICA) ප්‍රධාන අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලයන්හි ඉදිකිරීම් පාඨමාලාවලට අදාළ ධාරිතා ගොඩනැංවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස, 2024.02.09 දිනැතිව පැවති ජාතික මෙහෙයුම් මැදිරි කමිටු රැස්වීමේ දී ගනු ලැබූ තීරණය ප්‍රකාරව, නැහෙනහිර විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ඉදිකිරීම් කටයුතු නිමාකර ඇති ගොඩනැගිලි සංකීර්ණයේ අත්‍යවශ්‍ය උපකරණ හා ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ වාහන අලුත්වැඩියාව කිරීම සඳහා වන ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස. | 5,401,880,000 | 325,930,000 |
| 130 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, 2022.10.17 දිනැති අංක 22/1659/605/020 දරන 2023.09.11 දිනැති අංක 23/1638/605/035-I දරන සහ 2024.05.13 දිනැති අංක 24/0897/605/021-I දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව, වන්දි මුදල් ගෙවීම පිණිස, අත්‍යවශ්‍ය පුනරාවර්තන හා මූලධන වියදම් දැරීම පිණිස සහ අංක 24/0328/605/013 දරන 2024.03.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ [පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ ලෝක බැංකුව)] හිඟ බිල්පත් පියවීම පිණිස. | 466,396,000 | 3,832,400,000 |
| 149 | කර්මාන්ත අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 170,715,484 | - |
| 151 | ධීවර අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, වත්තල ලුනාව මෝය ආශ්‍රිතව ගොඩබසින ස්ථානයේ දියකඩනය ඉදිකිරීමට සහ කඩමැක්ත-දෙහිවල අනතුරු පහත් සංඥාව තැබීම සඳහා කොන්ක්‍රීට් කුළුණ ඉදිකිරීම පිණිස, 2023.12.11 දිනැති අංක 23/2303/606/004-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, එම්.වී.එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය ව්‍යසනය හේතුවෙන් සිය ජීවනෝපාය අහිමි වූ ධීවරයන් සඳහා ගෙවීමට ඉතිරි වන්දි මුදල ගෙවීම සහ එම ව්‍යසනයට අදාළව පරිපාලන කටයුතුවල නිරත වූ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම පිණිස, 2024.04.02 දිනැති බෙරුම්කරණ තීන්දුවට අනුව වැලිකන්ද සෙවනපිටිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළව බෙරුම්කාර ගෙවීම් සිදු කිරීම පිණිස සහ ශ්‍රී ලංකාවේ උතුරු සහ නැහෙනහිර පළාත්වල කුඩා පරිමාණ ධීවරයන් සඳහා චීන රජයෙන් ලැබුණු හදිසි අවස්ථා සඳහා වූ ප්‍රදානයට අදාළව, 2024.06.03 දිනැති අංක 24/0996/606/0110-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ගෙවීම් සිදු කිරීම පිණිස සහ ධීවර යාත්‍රා සඳහා භූමිතෙල් ලබාදීම වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු බෙදා හැරීමේ සහ ප්‍රවාහන ගාස්තු පියවීම පිණිස සහ ඩෙල්ෆ්ට් දූපත වෙත භූමිතෙල් බෙදා හැරීමේ ප්‍රවාහන වියදම් දැරීම පිණිස. | 200,994,005 | 921,407,959 |
| 160 | පරිසර අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, ශ්‍රී ලංකාව තුළ 2024 ජූනි මාසය වන විටවිට "මනා භූමි සැකසුම්, ආහාර සුරක්ෂිතතා, මනා පැවැත්ම සහ පරිසර පද්ධතිවල හිතකර පැවැත්ම ප්‍රවර්ධනය කිරීම උදෙසා සමාජ-පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශවල කෘෂිකාර්මික භූමි සැකසුම කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය" සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස සහ "රසදිය භාවිතය අවම කිරීම සඳහා ජාතික ධාරිතාවය ශක්තිමත් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ රසදිය අඩංගු අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියේ", 2023 වර්ෂයේදී නිමාකරන ලද කාර්යයන් වෙනුවෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම පිණිස. | 112,229,336 | 39,000,000 |
| 161 | වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 2024.06.03 දිනැති අංක CP/24/0988/613/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව "තිරසාර වනාන්තර කළමනාකරණය තුළින් ඉඩම් ගැටළු විසඳීම" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම පිණිස. | - | 53,000,000 |
| 166 | ජල සම්පාදන අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, ඕස්ට්‍රේලියානු ප්‍රදාන සහයෝගිතා වැඩසටහන යටතේ දේශගුණික විපර්යාස සහ ව්‍යාපෘති පිළිබඳ දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමට අදාළ වැඩමුළුවක් පැවැත්වීම සඳහා ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය විසින් සපයන ලද විදේශ ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදාන ආධාර යටතේ ක්‍රියාත්මක යාපනය, කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියට අදාළව පවතින හිඟහිට ඇති ගෙවීම් පියවීම සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 14,764,000 | 8,450,000 |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 171 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, පූර්ව ළමාවිය රැකවරණය සහ සංවර්ධන සතිය - 2024 ක්‍රියාකාරකම්වලට අදාළව 2024 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වෙතින් ලද ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස, අංක 24/1205/601/072 දරන 2024.07.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා වන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස. යුක්තිය සඳහා සහාය (JURE) ව්‍යාපෘතිය යටතේ සැලසුම්කර ඇති ක්‍රියාකාරකම් සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල යටතේ ලබා දී ඇති ප්‍රදානය උපයෝජනය සහ ගිණුම්ගත කිරීම පිණිස, යුනිසෙෆ් සංවිධානය විසින් ලබාදුන් ප්‍රදානය යටතේ 2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අදාළ වියදම් දැරීම පිණිස, සාර්ක් සංවර්ධන අරමුදල යටතේ "පැය 24 පුරා ක්‍රියාත්මක, ගාස්තු රහිත උපකාරක සේවය" ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලෙන් පරිත්‍යාගයක් ලෙස ලැබුණු පරිගණකවල වටිනාකම වාර්තා කිරීම පිණිස සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ කේ.ඒ.ජේ.ප්‍රේමලාල් මහතා වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ප්‍රකාරව හිඟ වැටුප් හා දීමනා ගෙවීම පිණිස. | 254,173,000 | 2,140,440,221 |
| 176 | වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වන වැඩමුළු ගොඩනැගිලි සංකීර්ණයට අදාළව ගෙවීමට ඇති ඉතිරි මුදල පියවීම පිණිස. | - | 400,000,000 |
| 186 | තාක්ෂණ අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 508,000,000 | - |
| 187 | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සඳහා වූ පනත කෙටුම්පත් කිරීමේ කාර්යයේ නෛතික උපදේශන සේවාවලට අදාළව හිඟහිටි ගෙවීම් සිදු කිරීම පිණිස. | 74,267,400 | 850,000 |
| 189 | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 890,245,000 | - |
| 193 | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, ආසියානු ඵලදායිතා සංවිධානයෙන් (Asian Productivity Organization - APO) ලද ප්‍රදානය උපයෝජනය කිරීම සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන වියදම් දැරීම පිණිස. | 102,224,000 | 26,000,000 |
| 194 | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ 2023 වර්ෂයේ ග්‍රාමීය පාසල් සඳහා ක්‍රීඩා පහසුකම් සැපයීමට අදාළ හිඟ බිල්පත් පියවීම පිණිස. | 321,090,000 | 37,150,000 |
| 198 | වාරිමාර්ග අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක වන මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනට අදාළව ප්‍රතිපූරණය කරනු ලබන මූල්‍යයනය යටතේ, අතැති බිල්පත් පියවීම සඳහා ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 390,110,000 | 1,600,000,000 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 66,301,800 | - |
| 202 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, රාමසාන් උපවාසයට අදාළව සෞදි අරාබි රාජධානිය විසින් සෞදි අරාබියේ රාජකීය තානාපති කාර්යාලය හරහා ලබා දෙන ලද ද්‍රව්‍යමය ප්‍රදානය ගිණුම්ගත කිරීම සහ ඊට අදාළ බදු සහ තීරුබදු පියවීම පිණිස සහ 2023 වසරේ දහම් පාසල් විභාග පැවැත්වීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හිඟය පියවීම පිණිස. | 74,172,036 | - |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 4,539,900 | - |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්මේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 12,718,000 | - |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ පුරප්පාඩු පිරවීම සහ සේවකයින් නැවත සේවයේ පිහිටුවීම හේතුවෙන් වැටුප් හා දීමනා ගෙවීමට අදාළ ප්‍රතිපාදනවල හිඟය පියවීම පිණිස. | 12,108,600 | - |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 59,255,800 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 207 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, මහනුවර රජවාසල ගොඩනැගිල්ල හා කෞතුකාගාරය සංරක්ෂණය හා නැවත සැකසීමට අදාළ වියදම් දැරීම පිණිස සහ පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ හා නඩත්තු කිරීමේ කටයුතු සහ බණ්ඩාරවෙල ව්‍යාපෘතියේ කැණීම් කටයුතුවලට අදාළ වියදම් පියවා ගැනීම පිණිස. | 250,183,200 | 86,400,302 |
| 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, ජාතික කෞතුකාගාරයේ පුස්තකාලය සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රදානය කළ ස්වයංක්‍රීය පද්ධතියක් ස්ථාපනය කිරීමේ වියදම් දැරීම පිණිස සහ රත්නපුර, ජාතික කෞතුකාගාරයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලය ප්‍රතිසංස්කරණය කිරීමේ වියදම් පියවීම පිණිස. | 27,957,200 | 25,475,886 |
| 209 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 13,516,600 | - |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 4,880,000 | - |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 97,090,000 | - |
| 212 | විභාග දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 33,720,000 | - |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 5,897,000 | - |
| 214 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යාධාර ගෙවීමට අදාළ ප්‍රතිපාදන හිඟය පියවීම පිණිස. | 1,711,106,000 | - |
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ විභාග ආශ්‍රිත වියදම් ගෙවීම සඳහා අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් උපයෝගී කර ගනිමින් දරන ලද වියදම් වාර්තා කිරීම පිණිස. | 167,790,000 | - |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකායේ සේවකයින්ගේ පුද්ගල පඩිනඩි ගෙවීම සඳහා 2024 ජූලි මාසයේ ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 110,916,010 | - |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 44,620,000 | - |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක CP/24/0980/624/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය කිරීම පිණිස සහ "ආසියානු හොකී සම්මේලනයේ සංවර්ධන ව්‍යාපෘතිය - ටොරින්ටන් හොකී ක්‍රීඩාපිටිය" සඳහා පකිස්තාන ඉස්ලාමීය ජනරජයෙන් ලැබුණු පකිස්තානු රුපියල් මිලියන 52ක ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස. | 24,541,677 | 157,696,384 |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, සීමාවාසික ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සීමාවාසික පුහුණු වැඩසටහනෙහි ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 323,695,000 | - |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 127,000,000 | 7,925,000 |
| 222 | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,075,500,000 | - |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවලට අදාළව හිඟහිටි ගෙවීම් සිදු කිරීම සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන හා මූලධන වියදම් දැරීම පිණිස. | 1,078,380,000 | 7,925,000 |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 9,205,100,000 | - |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ 2018.02.27 දිනැති අංක 17/2628/749/023 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව උසස් මගී තොරතුරු සැකසුම් (APIP) සහ මගී නාම ලේඛන (PNR) පද්ධති සම්බන්ධයෙන් La Société internationale de télécommunication aéronautique - SITA ආයතනය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අතර ඇති කරගත් ගිවිසුම යටතේ වන ගෙවීම්වලට අදාළ හිඟ මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 239,805,000 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 112,455,000 | - |
| 228 | අධිකරණ පරිපාලනය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අත්‍යවශ්‍ය පුනරාවර්තන වියදම් දැරීම පිණිස සහ අධිකරණ පරිපාලන ව්‍යාපෘතියේ හිඟහිට ඇති ගෙවීම් සිදු කිරීමට අදාළ ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස. | 1,302,100,000 | 1,000,000 |
| 229 | නීතිපති දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (KOICA) ප්‍රදානයක් මඟින් අරමුදල් සපයන ලද සර්වර් සහ සර්වර් රාක්ක උපකරණ නිෂ්කාශනය කිරීමේදී දැරීමට සිදුවන රේගු බදු ආවරණය කිරීම පිණිස සහ දණ්ඩණ නීති දාමය තුළ නඩු ගොනු කළමනාකරණය කිරීමේ දී, ප්‍රමාද ගොනු නිෂ්කාශනය සඳහා යටිතල පහසුකම් සහ පුහුණු ඉහළ නැංවීම ද ඇතුළත්ව තාක්ෂණික සහ මූල්‍ය ආධාර සැපයීම උදෙසා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වෙතින් නීතිපති දෙපාර්තමේන්තුවේ ළමා ආරක්ෂක ඒකකය වෙත ලද ප්‍රදානය උපයෝජනය කිරීම පිණිස. | 55,475,000 | 6,955,155 |
| 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 9,360,000 | - |
| 231 | ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,330,000 | - |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/1080/614/046 දරන 2024.06.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව බන්ධනාගාර නිළධාරීන් සඳහා වැඩි කරන ලද දීමනා ගෙවීම් සඳහා වූ ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන ප්‍රතිපාදන දැරීම පිණිස. | 1,237,345,000 | - |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ කොරියානු අන්තර්ජාතික සහයෝගිතා ආයතනය (KOICA) අරමුදල් මඟින් මූල්‍යනය වන "අපරාධ යුක්තියට අදාළව අධිකරණ වෛද්‍ය කටයුතුවලදී ඖෂධ විශ්ලේෂණය පිළිබඳව ධාරිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය" සඳහා ලද උපකරණ සම්බන්ධයෙන් වන තීරුබදු, රේගු ගාස්තු සහ අනිකුත් ගාස්තු ගෙවීම පිණිස. | 28,835,000 | 80,000,000 |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අලුතින් බඳවා ගත් නීති පර්යේෂණ නිලධාරීන්ගේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (PSPF) දායකත්ව මුදල් ගෙවීම පිණිස. | 39,560,000 | - |
| 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,160,000 | - |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 5,475,000 | - |
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අංක 24/0179/604/027 සහ 2024.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ වෙළඳපල සන්ධාන (PALAM/A) ව්‍යාපෘතිය හරහා ස්වාධීනතාවය, සාක්ෂරතාවය සහ සාවධානය ප්‍රවර්ධනය කිරීමේ දෙවන අදියර සඳහා ලැබුණු ප්‍රදානය ගිණුම්ගත කිරීම සහ අදාළ රේගු බදු ගෙවීම පිණිස. | 12,220,000 | 658,792,000 |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා වන ජපන් ආධාර ගිණුම්ගත කිරීම පිණිස. | 6,991,000 | 30,567 |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අත්‍යවශ්‍ය නඩත්තු කටයුතුවලට අදාළ ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස සහ රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය කල්බදුකරණ ක්‍රමය යටතේ ලබාගත් වාහනවලට අදාළ වියදම් දැරීම පිණිස. | 9,521,000 | 16,820,000 |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ ව්‍යයදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය (SACTD) ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, 2024.06.24 දිනැති අංක 24/1192/603/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අදාළව ණය වාරික බෙරුම් කිරීම සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාගැනීම පිණිස, 2023.05.08 දිනැති අංක 23/0768/616/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අදාළ ව්‍යවස්ථාපිත හිඟ මුදල් ගෙවීම පිණිස, 2023.09.04 දිනැති අංක 23/1615/616/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අදාළ ව්‍යවස්ථාපිත හිඟ මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන සැලසීම පිණිස, 2024.08.26 දිනැති අංක 24/1667/628/080 දරන කැබිනට් තීරණය ප්‍රකාරව, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් රාජ්‍ය බැංකු වෙත ගෙවිය යුතු පොළී ගෙවීම් පියවීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 8 කට සමාන ප්‍රතිපාදන සැලසීම පිණිස සහ 2024.03.19 දිනැති අංක 24/0288/607/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දකුණු ආසියානු තාක්ෂණ හා වෛද්‍ය ආයතනය (SAITM) සහ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල (NFTH) රජයට අත්පත් කර ගැනීමේ දෙවන වාරිකය ගෙවීමට අදාල ව්‍යයදම් දැරීම පිණිස. | 3,143,000 | 7,168,960,000 |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 6,310,000 | - |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0155/604/016 හා 2024.01.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2023/2024 මහ කන්නයේ වී මිලදී ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ බැංකු හරහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ 2024.02.26 දිනැති අංක 24/0353/604/040 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණ ගැන්වීම සඳහා උත්තේජකයක් වන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,212,000 | 16,180,000,000 |
| 244 | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 4,465,000 | - |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,950,000 | - |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අත්‍යාවශ්‍ය පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය - TIN සහ පුද්ගලයින් හඳුනාගැනීමේ අංකය - PIN ලබා දීමට අදාළ ලියාපදිංචි කිරීමේ හා නිකුත් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා හිඟ ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 528,478,000 | 59,500,000 |
| 247 | ශ්‍රී ලංකා රේගුව | ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකා රේගුව වෙත ලැබුණු ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන ව්‍යයදම් දැරීම පිණිස. | - | 28,215,900 |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, සුරාබදු නිලධාරීන් වෙත ගෙවීමට අනුමත දිරි දීමනා ගෙවීමට අදාළ ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස සහ මුලතිව්හි සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ අවසන් බිල්පත් ගෙවීම් පියවීම පිණිස. | 104,164,000 | 6,450,686 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 7,472,000 | - |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 6,700,000 | - |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 91,093,000 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 252 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, "පානීය ජලයේ ගුණාත්මක බව සම්බන්ධ ගෘහස්ත සමීක්ෂණය" සිදු කිරීම, "ආර්ථික අර්බුදයේ බලපෑම සම්බන්ධ ගෘහස්ත සංගණනය - 2023" පැවැත්වීම සහ කම්කරු දත්ත රැස්කිරීම සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛනඥයන්ගේ 19 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට අදාළව නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු ප්‍රදානයන් ගිණුම්ගත කිරීම පිණිස, වාර්ෂික වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ 2021 ජන හා නිවාස සංගණනයෙහි ගණන් කිරීමේ අදියරට අදාළව දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් පුහුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) යටතේ ලැබී ඇති ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) අරමුදල් ප්‍රදානයක් යටතේ දියත් කරනු ලැබූ ආසියානු ශාන්තිකර කලාප සඳහා ජාත්‍යන්තර සැසඳුම් වැඩසටහනට අදාළ වියදම් දැරීම පිණිස. | 100,756,000 | 34,810,602 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අංක 24/1992/704/077 දරන 2024.10.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සිවිල් විශ්‍රාමිකයන්ට අදාළ අතුරු දීමනාව සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 9,728,050,000 | - |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 275,980,000 | - |
| 255 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, විද්‍යුත් ජනගහන ව්‍යාපෘතියට පහසුකම් සැලසීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක අත්‍යවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රතිපාදන හිඟය සපුරාලීම පිණිස, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීමට අදාළ හිඟ බිල්පත් පියවීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 751,039,112 | 72,150,000 |
| 256 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අලුතින් ඉදිකරන ලද ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අත්‍යාවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම පිණිස, 2023.10.30 දිනැති අංක 23/2010/605/064/TBR සහ 2024.02.19 දිනැති 24/0232/605/007 දරන කැබිනට් තීරණය ප්‍රකාරව ජා-ඇල සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම් කටයුතු සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 1,104,974,747 | 33,819,000 |
| 257 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, ඊ-ජනගහන ව්‍යාපෘතිය (e-pop project) වෙනුවෙන් අතිරේක තැපැල් ගාස්තු පියවීම සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 690,176,760 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 258 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, 2024.04.01 දිනැති අංක 24/0645/601/038-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.04.04 දිනැති අංක DFD/ 2024-I දරන චක්‍රලේඛය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදා හැරීම සඳහා ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 1,042,634,424 | - |
| 259 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 477,672,145 | - |
| 260 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 718,520,801 | - |
| 261 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 823,899,738 | - |
| 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 697,118,530 | - |
| 263 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට | "වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අලුතින් ඉදිකරන ලද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අත්‍යාවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස" | 560,305,761 | 13,570,000 |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 264 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - යාපනය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 685,722,183 | - |
| 265 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මන්නාරම | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 151,168,416 | - |
| 266 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - වවුනියාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.04.01 දිනැති අංක 24/0645/601/038-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය, 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.04.04 දිනැති අංක DFD/ 2024-I දරන චක්‍රලේඛය, 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 168,883,552 | - |
| 267 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මුලතිව් | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 157,705,664 | - |
| 268 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - කිලිනොච්චි | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ කිලිනොච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතුවලට අදාළ හිඟ ගෙවීම් පියවීම පිණිස. | 154,098,720 | 5,743,810 |
| 269 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - මඩකලපුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අලුතින් ඉදිකළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා අත්‍යාවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම පිණිස. | 746,348,920 | 75,000,000 |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 270 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 733,763,360 | - |
| 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය - ත්‍රිකුණාමලය | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 431,348,355 | - |
| 272 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 1,496,007,987 | - |
| 273 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන වියදම් දැරීම පිණිස. | 630,676,661 | 4,000,000 |
| 274 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස, අත්‍යාවශ්‍ය පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ මහවිලච්චිය නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා ලංකා රාජ්‍ය ජාල (LGN) පහසුකම ලබා ගැනීම උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන සපුරාලීම පිණිස. | 772,971,456 | 28,000,000 |
| 275 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන වියදම් දැරීම පිණිස. | 323,826,054 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 276 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන වියදම් දැරීම පිණිස. | 866,972,924 | 6,935,000 |
| 277 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන වියදම් දැරීම පිණිස. | 528,009,077 | - |
| 278 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන වියදම් දැරීම පිණිස. | 1,071,655,053 | - |
| 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, අංක 24/0549/601/038 දරන 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා හැරීමේ වියදම් දැරීම පිණිස සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම සම්බන්ධයෙන් වන 2024.04.01 දිනැති අංක 24/0645/601/038-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය, 2024.06.03 දිනැති අංක 24/1064/601/038-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024.04.04 දිනැති අංක DFD/ 2024-I දරන චක්‍රලේඛය, 2024.06.04 දිනැති අංක DFD/2024-I(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව, සහල් බෙදා හැරීම සඳහා සහල් මිලදී ගැනීමේ පිරිවැය, ප්‍රවාහන පිරිවැය සහ අනෙකුත් හැසිරවීමේ වියදම් දැරීම උදෙසා ප්‍රතිපාදන සලසනු පිණිස. | 763,731,340 | - |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,398,340,000 | - |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 366,990,000 | - |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 221,868,000 | 25,000,000 |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, කුඩා පරිමාණ කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (ජයිකා) වෙතින් ප්‍රදානය කරන ලද ඩීසල් ජෙනරේටරය සඳහා නියමිත වටිනාකම ගිණුම්ගත කිරීමට සහ අදාළ බදු මුදල් ගෙවීම පිණිස සහ ජාතික ශාක නිරෝධායන සේවය වෙත ප්‍රදානයක් වශයෙන් ලබා දී ඇති රසායනාගාර උපකරණවලට අදාළ බදු ගෙවීම පිණිස. | 808,360,000 | 255,833,600 |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 46,760,000 | - |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 91,822,378 | - |
| 288 | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 350,920,000 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ වියදම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 103,490,000 | - |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, 2024.08.22 දිනැති අංක CM/24/1466/606/018 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට ප්‍රකාරව 'ඩෙවෝන් 5' බහුදින යාත්‍රාවේ මසුන් ඇල්ලීමේ නිරතව සිටියදී මියගිය ධීවරයින්ගේ පවුල් සඳහා දයා පරවශ දීමනාවක් ප්‍රදානය කිරීම පිණිස, 2024.10.14 දිනැති අංක 24/1990/706/002-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ධීවර කර්මාන්තය සඳහා මූල්‍යාධාර සැපයීම පිණිස සහ ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රදානයක් ලෙස ලැබුණු MF/HF SSB Radio-Telephones දෙකක් (02) ආනයනය කිරීමට අදාළ බදු ගෙවීම පිණිස. | 861,988,000 | 2,087,632 |
| 291 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 26,820,000 | - |
| 292 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 36,720,000 | - |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 15,030,000 | 18,198,000 |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 69,840,000 | - |
| 296 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ එක්සත් ජනපද රාජ්‍ය අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂක දෙපාර්තමේන්තුව (EXBS) වෙතින් ලද ප්‍රදානය ගිණුම්ගත කිරීම පිණිස. | 5,631,000 | 19,880,000 |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 15,640,000 | - |
| 298 | මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ 2024.06.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2015(v) ප්‍රකාරව ගෙවිය යුතු දීමනාවට අදාළ ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 29,202,000 | - |
| 301 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමූපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්) | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 760,000 | - |
| 303 | ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 8,770,000 | - |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 32,600,000 | - |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හා සංඥා පද්ධතිය ස්ථාපනය කිරීම සහ පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා දුම්රිය මාර්ගය නැවත ගොඩනැංවීම සඳහා වූ පිරිවැය දැරීම පිණිස. | 1,495,830,000 | 275,000,000 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 86,530,000 | - |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,847,450,000 | - |
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 20,654,000 | - |
| 310 | රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය පුනරාවර්තන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 12,943,000 | - |
| 312 | බස්නාහිර පළාත් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 7,994,740,000 | - |
| 313 | මධ්‍යම පළාත් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 3,169,300,000 | - |
| 314 | දකුණු පළාත් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 5,472,780,000 | - |
| 315 | උතුරු පළාත් සභාව | වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,331,890,000 | - |

**වගුව 5.4 | 2024.01.01 සිට 2024.12.31 දක්වා වැය ශීර්ෂ අනුව අතිරේක ප්‍රතිපාදන සාරාංශය සම්බන්ධිතයි...**

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ විශේෂ ව්‍යයම් ඒකකය | අරමුණ | පුනරාවර්තන | මූලධන |
|---|---|---|---|---|
| 316 | වයඹ පළාත් සභාව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 4,095,930,000 | - |
| 317 | උතුරු මැද පළාත් සභාව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 1,677,430,000 | - |
| 318 | ඌව පළාත් සභාව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 3,014,020,000 | - |
| 319 | සබරගමුව පළාත් සභාව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 3,186,580,000 | - |
| 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,765,211,000 | - |
| 321 | නැගෙනහිර පළාත් සභාව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 3,088,020,000 | - |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 38,400,000 | - |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, නිල ප්‍රවාහන කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු හිඟ ගෙවීම් සඳහා ප්‍රතිපාදන සලසා දීම පිණිස සහ අංක CP/24/119/604/124 දරන 2024.06.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව SC CHC Appeal 35/2013 අංක දරන නඩුවට අදාළ යෝජිත සමථය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපුරාලීම පිණිස. | 40,439,412 | - |
| 324 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,815,000 | 350,000 |
| 325 | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | 10,500,000 | - |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ (UNODC) ව්‍යාපෘතියක් යටතේ ආධාර වශයෙන් ලැබෙන උපකරණ වාර්තා කිරීම/ගිණුම්ගත කිරීම සඳහා සහ එම උපකරණ ලබාගැනීමේ දී ගෙවිය යුතු බදු, රේගු ගාස්තු සහ නිෂ්කාශන ගාස්තු ගෙවීම පිණිස. | 80,145,000 | 54,800,000 |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 41,070,000 | - |
| 328 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 25,640,000 | - |
| 329 | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ අත්‍යාවශ්‍ය මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 3,354,000 | 5,000,000 |
| 331 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 2,065,220,000 | - |
| 332 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 41,855,000 | - |
| 333 | කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය | අත්‍යාවශ්‍ය පුනරාවර්තන සහ මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 50,000 | 215,200 |
| 335 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස. | 130,000 | - |
| 336 | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ඊ-රාජ්‍ය (e-government) පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ "ප්‍රවීණතා සහ මුහුදු යාත්‍රාකරුවන්ගේ අඛණ්ඩ නිදහස් කිරීමේ සහතික" නිකුත්කිරීමට අදාළ මුද්‍රණ යන්ත්‍ර සඳහා සහ ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා සපුරා ගැනීමට අදාළ ගෙවීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඒ සියල්ල සපුරාගැනීම පිණිස. | 19,860,000 | 20,575,000 |
| 337 | කුරුඳු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | අත්‍යාවශ්‍ය මූලධන ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස, කුරුඳු ප්‍රවර්ධනය සඳහා Cinnamon Gate ව්‍යාපෘතිය යටතේ අවසන් කර ඇති මූලික කාර්යයන් සඳහා ගෙවීම් සිදුකිරීම සහ අදාළ බිල්පත් පියවීම පිණිස. | - | 74,000,000 |
| 501 | අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | වැඩි කරන ලද ජීවන ව්‍යයම් දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරාලීම පිණිස සහ 2024.02.12 දිනැති අංක 24/0230/601/018 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, වාණිජ වැවිලි කළමනාකරණය සඳහා වූ ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම පිණිස. | 9,730,000 | 15,000,000 |
| | **එකතුව** | | 117,580,009,259 | **59,967,408,789** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2024 වර්ෂයේ දී, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මු.රෙ. 66 සහ මු.රෙ.69 යටතේ ඉදිරිපත් වූ රු. බිලියන 209.0 ක වටිනාකමකින් යුතු එවැනි මාරු කිරීම් ඉල්ලීම් 1,633 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදි..

### 5.7.2 "පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන නැවත වෙන් කිරීම

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ ක්‍රියාත්මක "පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය මඟින් 2024 වර්ෂයේ දී වැය දරන ආයතනයන්හි පුරෝකථනය කළ නොහැකි, අනපේක්ෂිත හෝ හදිසි අතිරේක අරමුදල් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවල නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව, 2024 වර්ෂය සඳහා පරිපූරක ප්‍රතිපාදන ලෙස රු. බිලියන 177.6 ක් අදාළ වැය දරන ආයතනයන් වෙත නැවත වෙන් කිරීම (මාරු කිරීම) සිදුකරන ලදී. එසේ සිදුකළ ප්‍රතිපාදන වෙන්කිරීම් පිළිබඳව සාරාංශයක් 5.4 වගුවෙහි දක්වා ඇත. මෙම අතිරේක ප්‍රතිපාදනවලට අදාළ වාර්තා, 2023 අංක 34 දරන විසර්ජන පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

### 5.7.3 වියදම් කළමනාකරණය, අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව වක්‍රලේඛ මඟින් නිකුත් කරන ලද නියෝග

2024 වර්ෂයේ අයවැය කළමනාකරණය සඳහා වූ මාර්ගෝපදේශ, අංක 05/2023 දරන ජාතික අයවැය වක්‍රලේඛය මඟින් නිකුතර කරන ලදී. තව ද, මහා භාණ්ඩාගාරය විසින් මීට පෙර නිකුත් කරන ලද වක්‍රලේඛ සංගෘහිත කරමින් අංක 01/2024 දරන ජාතික අයවැය වක්‍රලේඛය නිකුත් කරන ලදී.

## 5.8 රාජ්‍ය වියදමේ සංයුතිය

2024 වසරේ දී මුළු පුනරාවර්තන වියදම්වලින් අඩක්ම (සියයට 50.4 ක්) රු. බිලියන 2,689.5 ක් වූ පොළී ගෙවීම් සඳහා වියදම් විය. විශ්‍රාම වැටුප්, සමාජ ආරක්ෂණ ජාලය සඳහා ගෙවීම්, නොමිලේ ලබාදෙන වෛද්‍ය සැපයුම්, පොහොර සහනාධාර, සහ පෝෂණ වැඩසටහන ඇතුළු කුටුම්භ සඳහා පැවරීම්වල වියදම රු. බිලියන 1,134.8 ක් වූ අතර, මෙය මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 21.25 කි. වැටුප් සහ වේතන සඳහා වූ වියදම මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 19.96 ක්, එනම් රු. බිලියන 1,066.00 කි.



**වගුව 5.5 | 2024.01.01 සිට 2024.12.31 දක්වා පරිපූරක ඇස්තමේන්තුවල සාරාංශය**

රු.මිලියන

| වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/වැය ශීර්ෂය | අරමුණ | මුදල |
|---|---|---|---|
| 001 | අතිගරු ජනාධිපති | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීම | 8,750 |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට මාරු කරන ලද ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් බැංකු වෙත ලබා දීමට නියමිත පොළී සහනාධාර ගෙවීම | 130,000 |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමෙන්තුව | ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් වීම හේතුවෙන් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ නමින් ඇති ඩොලර් ගිණුම්වල පවතින ශේෂය මත ඇති වී ඇති විණිමය අලාභය ගිණුම්ගත කිරීම | 18,000 |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂිත පොළී අනුපාතික ලබා දීමේ දී, බැංකු විසින් දරන ලද අමතර පොළී ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම පිණිස අවශ්‍ය වන ප්‍රතිපාදන | 32,641 |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | චීනය විසින් ප්‍රදානයක් ලෙස ලබා දුන් පාසල් නිල ඇඳුම්වල වටිනාකම ගිණුම්ගත කිරීම | 9,829 |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | ඇමරිකා එක්සත් ජනපදයෙන් ප්‍රදානයක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී ඇති ගුවන් යානා 02 ක වටිනාකම ගිණුම්ගත කිරීම හා බදු ගෙවීම | 8,331 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | වැඩි කරන ලද විශ්‍රාමික දීමනා ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම | 1,400 |
| 102 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළව මූල්‍ය/නීති උපදේශකයන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම | 3,213 |
| 151 | ඩිවර අමාත්‍යාංශය | ඩිවර අමාත්‍යාංශය වෙත චීනයෙන් ප්‍රදානයක් ලෙස උතුරු හා නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණයේ ඩිවරයන් සඳහා සහන සැලසීමට ලැබී ඇති හදිසි ආධාර ගිණුම්ගත කිරීම | 1,533 |
| 111 | සෞඛ්‍ය අමාත්‍යාංශය | සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ජපානයෙන් ප්‍රදානයක් ලෙස සෞඛ්‍ය අංශයේ අවශ්‍යතා සඳහා ලැබී ඇති ඉන්ධන තොගවල වටිනාකම ගිණුම්ගත කිරීම හා තිරු බදු ගෙවීම | 10,826 |
| 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පාසල් පෝෂණ වැඩසටහන සඳහා එක් ශිෂ්‍යයෙකුට දෛනිකව දැරිය යුතු මුදල වැඩි කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය | 1,800 |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය | ආරක්ෂක අමාත්‍යාංශය වෙත ස්වාභාවික ආපදා හේතුවෙන් හානියට පත් වූ දේපල ප්‍රතිසංස්කරණය සඳහා වන්දි | 400 |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත බන්ධනාගාර රැඳවියන් වැඩිවීම සහ ආහාර මිල ඉහළ යාම හේතුවෙන් ආහාරපාන සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ යාම | 1,400 |
| 102 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | පාසල් වයසේ ළමුන්ට ලිපිද්‍රව්‍ය ලබා ගැනීම සඳහා දීමනාවක් ලබා දීම | 6,500 |
| **එකතුව** | | | **234,623** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**වගුව 5.6 | රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ**

| චක්‍රලේඛ අංකය | දිනය | විෂයය |
|---|---|---|
| 01/2024 | 10-01-2024 | රාජ්‍ය වියදම් පාලනය |
| 02/2024 | 12-08-2024 | 2025 වසර සඳහා අයවැය කැඳවීම (2025 - 2027 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ 2025 වාර්ෂික වැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ) |
| 03/2024 | 30-09-2024 | අංක 2403/53 දරන 2024.09.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව විෂයයන් බෙදා වෙන් කරන ලද නව අමාත්‍යාංශවල ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා 2023 අංක 34 දරන විසර්ජන පනත මගින් 2024 වර්ෂය සඳහා සම්මත වී ඇති ප්‍රතිපාදන යොදා ගන්නා ආකාරය |
| 03/2024 උපලේඛන 01 | 30-09-2024 | 2023 අංක 34 දරණ විසර්ජන පනත මගින් සම්මත වී ඇති අයවැය ප්‍රතිපාදන 2024.09.27 දිනැති අංක 2403/53 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව නිශ්චය කර ඇති නව අමාත්‍යාංශවලට යළි බෙදා හැරීම |
| 03/2024 උපලේඛන 02 | 30-09-2024 | අත්තිකාරම් ගිණුම් කටයුතු |
| 03 /2024–(i) | 04-12-2024 | අංක 2412/08 දරන 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව විෂයයන් බෙදා වෙන් කරන ලද නව අමාත්‍යාංශවල ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා 2023 අංක 34 දරන විසර්ජන පනත මගින් 2024 වර්ෂය සඳහා සම්මත වී ඇති ප්‍රතිපාදන යොදා ගන්නා ආකාරය |
| 03/2024–(i)සංශෝධිත උපලේඛන 01 | 04-12-2024 | 2023 අංක 34 දරන විසර්ජන පනත මගින් සම්මත වී ඇති අයවැය ප්‍රතිපාදන 2024.11.25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව නිශ්චය කර ඇති නව අමාත්‍යාංශවලට යළි බෙදා හැරීම |
| 03/2024–(i) සංශෝධිත උපලේඛන 02 | 04-12-2024 | අත්තිකාරම් ගිණුම් කටයුතු |
| 04/2024 | 03-12-2024 | 2025 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය |
| 05/2024 | 24-12-2024 | 2025 අතුරු සම්මත ගිණුම අනුව වියදම් දැරීම සඳහා බලය දීම |
| 05/2024-පළමුවන උපලේඛනය | 24-12-2024 | පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල් |
| 05/2024-දෙවන උපලේඛනය | 24-12-2024 | අත්තිකාරම් ගිණුම්වල සීමා |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## 5.8.1 වැටුප්, වේතන හා දීමනා

2024 වසරේ පළාත් සභා, ත්‍රිවිධ හමුදාව සහ පොලිසියේ සේවයේ නියුතු වුවන් ඇතුළු රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වේතන හා දීමනා (පුද්ගල පඩිනඩි) සඳහා වූ වියදම රු. බිලියන 1,066.0 ක් වූ අතර එය 2023 වසරේ වියදම වූ රු. බිලියන 939.5 ට සාපේක්ෂව සියයට 13.5 ක වැඩිවීමකි. 2023 වසරේ රු. බිලියන 300.2 ක් වූ පළාත් සභාවල පුද්ගල පඩිනඩි සඳහා වන වියදම 2024 වසරේ දී රු. බිලියන 372.8 දක්වා සියයට 24.2 කින් වැඩි වී ඇත. 2024 දී සියලුම රාජ්‍ය සේවකයින්ට ලබා දුන් ජීවන වියදම් දීමනාව වැඩිවීම මේ සඳහා හේතු විය.

සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම් 2023 වසරේ රු. බිලියන 372.4 ක සිට 2024 වසරේදී රු. බිලියන 395.7 දක්වා සියයට 6.3 කින් වැඩි වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් විශ්‍රාමිකයින්ට ජීවන වියදම් දීමනාව වැඩි කිරීම සහ 2024 ඔක්තෝබර් මස සිට අන්තර්කාලීන දීමනාව ගෙවීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය හේතු විය.

**වගුව 5.7 | වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම**

රු. මිලියන

| වියදම් කාණ්ඩය | 2023 | 2024 සංශෝධිත ඇස්තමේන්තුව | 2023 (අ) |
|---|---|---|---|
| මුළු වියදම | **5,356.6** | **6,527.8** | **6,130.7** |
| පුනරාවර්තන | **4,699.7** | **5,277.0** | **5,339.9** |
| වැටුප් හා වේතන | 939.5 | 1,126.9 | 1,066.0 |
| භාණ්ඩ හා සේවා | 299.7 | 341.2 | 350.9 |
| පොළී ගෙවීම් | 2,455.6 | 2,651.0 | 2,689.5 |
| සහනාධාර හා පැවරීම් | 1,004.9 | 1,158.0 | 1,233.5 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් | **656.9** | **1,250.8** | **790.8** |
| රාජ්‍ය ආයෝජන | 932.7 | 1,259.8 | 817.1 |
| වෙනත් | -275.8 | -9.0 | -26.3 |
| **ද.දේ.නි % ක් ලෙස** | | | |
| සමස්ත වියදම | **19.5** | **20.7** | **20.5** |
| පුනරාවර්තන වියදම | **17.1** | **16.8** | **17.9** |
| පොළී වියදම | 9.0 | 8.4 | 9.0 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් | **2.4** | **4.0** | **2.6** |
| එයින්, රාජ්‍ය ආයෝජනයෙන් | 3.4 | 4.0 | 2.7 |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

**වගුව 5.8 | වැටුප්, වේතන හා දීමනා සඳහා වියදම්**

රු.මිලියන

| අංශය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(a) |
|---|---|---|---|---|---|---|
| රජය | 240,329 | 270,521 | 297,349 | 367,467 | 327,290 | 371,017 |
| පළාත් සභා* | 179,971 | 239,034 | 256,142 | 268,864 | 300,210 | 372,795 |
| ආරක්ෂක | 189,508 | 199,474 | 205,542 | 222,996 | 217,868 | 190,375 |
| පොලිසිය හා මහජන ආරක්ෂාව | 76,644 | 85,129 | 86,646 | 96,884 | 94,127 | 131,861 |
| එකතුව | **686,452** | **794,158** | **845,680** | **956,210** | **939,495** | **1,066,048** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික
(* රජයේ ප්‍රදාන පමණක් ඇතුළත් වේ.)
සටහන: මෙම වියදම මඟින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ, පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වැටුප් හා වේතන නියෝජනය වේ.

### 5.8.2 රාජ්‍ය මූල්‍ය විමධ්‍යගතකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට අනුව, රජය විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ මුදල් කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය මඟින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා පළාත් සභා වෙත අරමුදල් වෙන්කර දෙනු ලැබේ.

ඒ අනුව, රජය විසින් රු. බිලියන 439.4 ක් එනම් රු. බිලියන 409.4 ක් පුනරාවර්තන වියදම් සඳහා සහ රු. බිලියන 30 ක් මූලධන වියදම් සඳහා සෘජුවම පළාත් සභා වෙත ලබා දී ඇත. මීට අමතරව මූලධන වියදම් සඳහා රු. බිලියන 8.3 ක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා ලබා දෙන ලදී. ඒ අනුව 2024 වසරේ මූලධන වියදම් සඳහා රු. බිලියන 38.2 ක් පළාත් සභා වෙත පැවරිණි. 2023 වසරේ දී රු. බිලියන 346 ක සිට 2024 වසරේ දී පුනරාවර්තන වියදම් සඳහා පැවරීමේ ඉහළයාම සියයට 18.3 කි. පුනරාවර්තන වියදම් වැඩිවීමට වාර්ෂික වැටුප් වර්ධක සහ ජීවන වියදම් දීමනා වැඩි වීමේ බලපෑම හේතු විය. 2023 දී රුපියල් බිලියන 34.6 ක් වූ ප්‍රාග්ධන වියදම් මාරු කිරීම 2024 දී සියයට 10.4 කින් වැඩි වී ඇත.

**වගුව 5.9 | 2024 දී පළාත් සභා සඳහා වන මාරු කිරීම්**

රු.මිලියන

| පළාත් සභා | මාරු කිරීම් 2024 | |
|---|---|---|
| | පුනරාවර්තන | මූලධන |
| බස්නාහිර | 70,507 | 2,363 |
| මධ්‍යම | 51,028 | 3,259 |
| දකුණ | 54,922 | 3,272 |
| උතුර | 37,088 | 3,671 |
| වයඹ | 48,652 | 3,153 |
| උතුරු මැද | 29,141 | 3,068 |
| ඌව | 35,170 | 3,799 |
| සබරගමුව | 39,882 | 3,507 |
| නැගෙනහිර | 43,042 | 3,859 |
| රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | 7 | 8,295 |
| **මුළු එකතුව** | **409,439** | **38,246** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

## 5.9 රාජ්‍ය වියදමේ ආංශික වර්ගීකරණය


### 5.9.1 මානව සම්පත් කළමනාකරණය

#### සෞඛ්‍ය

#### සෞඛ්‍ය සේවා සඳහා ආයෝජන

2024 වසරේ දී, රට පුරා නොමිලේ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා මධ්‍යම රජය සහ පළාත් සභා එක්ව රු. බිලියන 463.6 ක පිරිවැයක් දරන ලදී. මෙය 2023 වසරේ වියදම වන රු. බිලියන 423.8 ට සාපේක්ෂව සියයට 9 ක වැඩිවීමකි.

**රූප සටහන 5.1 සෞඛ්‍ය සඳහා රජයේ වියදම**




මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

#### සත්කාරක සෞඛ්‍ය සේවා

හෘද වාහිනී රෝග, පිළිකා, දියවැඩියාව සහ වකුගඩු රෝග වැනි බෝ නොවන රෝගවල වර්ධනයක් සමඟ රජය සත්කාරක සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමට කැපවී සිටී. අත්‍යවශ්‍ය ඖෂධ සැපයීමට මෙන්ම, ජෛව වෛද්‍ය උපකරණ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් 2024 වසරේ දී රු. බිලියන 146.3 ක් වැය කරන ලදී. එයින් රු. බිලියන 143.3 ක් වෛද්‍ය සැපයුම් සඳහා වැය කර ඇති අතර රු. බිලියන 3 ක් ජෛව වෛද්‍ය උපකරණ සඳහා වැය කර ඇත.

2024 වසරේ දී රෝග විනිශ්චය මෙන්ම ප්‍රතිකාර ධාරිතාව ද ශක්තිමත් කරමින් කුරුණෑගල ශික්ෂණ රෝහලේ මහල් අටක මාතෘ සංකීර්ණය, කළුබෝවිල ශික්ෂණ රෝහලේ මිලේනියම් වාට්ටු සංකීර්ණය සහ පරිපූරක වෛද්‍ය සේවා ගොඩනැගිල්ල සහ කරාපිටියේ නව මාතෘ රෝහල නිම කිරීම ඇතුළු ප්‍රධාන රෝහල් හි යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව නිම කරන ලදී. එසේම බදුල්ලේ MRI ස්කෑන් ඒකකය සහ කරාපිටිය ජාතික රෝහලේ මහල් නවයකින් යුත් වකුගඩු රෝග සම්බන්ධයෙන් වන රුධිර කාන්දුකරණ සහ බද්ධ කිරීමේ ඒකකය නිම කරන ලදී.

කළුතර පිහිටි සිවි මහල් පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන අදියර, සීමාවාසික වෛද්‍යවරුන්ගේ නිල නිවාසය ඇතුළු පරිපාලන සහ අනෙකුත් සහායක සේවා පහසුකම් කිහිපයක් ද නිම කිරීමේ ඉලක්කයන් කරා ළඟා වුණි. පයාගල පිහිටි දෙමහල් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) කාර්යාලය සහ කඹුරුගමුව පිහිටි ජාතික හෙද පුහුණු පාසල (NTS) දේශන ශාලාව ද නිම කරන ලදී.

වැල්ලවාය මූලික රෝහලේ නිදන්ගත වකුගඩු රෝග මධ්‍යස්ථානය ඉදි කිරීම සහ කාන්තාවන් සඳහා වෙන් කරන ලද ද සොයිසා රෝහලේ අධි විශේෂිත මාතෘ ඒකකය සහ වාට්ටු සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතු අනෙකුත් කැපී පෙනෙන නිම කිරීම් අතරට ඇතුළත් විය. කරාපිටිය රෝහල් සංවර්ධන වැඩසටහන යටතේ, දෙමහල් ආඝාත ඒකකයේ පළමු අදියර අවසන් කරන ලද අතර, දෙවන අදියර සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී. තවද, ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් පාලන ඒකකය සඳහා සායන ප්‍රදේශයේ ඉතිරි ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලදී.

2024 වසරේ දී, ප්‍රාදේශීය වශයෙන් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සඳහා ද ප්‍රමුඛතාවය දෙන ලදී. අලුත්ගම ප්‍රාදේශීය රෝහලේ මෙන්ම රිකිල්ලගස්කඩ, වලස්මුල්ල, මහියංගනය, පදවිය, මැදිරිගිරිය, සමන්තුරෙයි, එරාවුර් සහ පොතුවිල් යන මූලික රෝහල්වල ඉදිකිරීම් අවසන් කරන ලදී. ප්‍රාදේශීය පහසුකම් ධාරිතාව වැඩි දියුණු කරමින් සෞඛ්‍ය සේවා විමධ්‍යගත කිරීමට සහ ප්‍රධාන රෝහල්වල තදබදය අඩු කිරීමට ගත් පුළුල් උත්සාහයක කොටසක් වශයෙන් මෙම සංවර්ධන කටයුතු ක්‍රියාත්මක විය.

## නිවාරණ සෞඛ්‍ය සේවා

නිවාරණ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය තුළ, ඩෙංගු, ජලභීතිකා රෝගය සහ ක්ෂය රෝගය වැනි බෝවන රෝග සහ අධි රුධිර පීඩනය, දියවැඩියාව සහ වකුගඩු ආශ්‍රිත රෝග ඇතුළු බෝ නොවන රෝග කෙරෙහි රජයේ අවධානය යොමු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. 2024 වසරේ දී නිවාරණ සෞඛ්‍ය සේවා සඳහා වූ මුළු රාජ්‍ය ආයෝජනය රු. මිලියන 4,016.3 දක්වා ඉහළ ගියේය. රජයේ ප්‍රධාන පෝෂණ වැඩසටහන වන

**වගුව 5.10 | සත්කාරක සෞඛ්‍ය සේවා සඳහා වූ ප්‍රධාන මූලධන ආයෝජන**

රු. මිලියන

| ආයෝජන අංශයන් | 2003 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රෝහල් සංවර්ධන ව්‍යාපෘති | 440 | 1,757 | 3,920 | 3,194 | 7,775 | 8,117 | 11,431 | 15,429 | 10,373 | 10,649 | 14,654 | 8,196 | 31,058 | 18,657 | 24,143 | 11,135 | 11,819 |
| රෝහල් සංවර්ධන ව්‍යාපෘති | 1,077 | 1,627 | 1,633 | 2,051 | 1,828 | 2,754 | 3,403 | 4,206 | 3,735 | 4,814 | 6,513 | 6,381 | 3,734 | 5,067 | 2,595 | 7,602 | 6,308 |
| වෛද්‍ය උපකරණ හා යන්ත්‍රෝපකරණ | 1,136 | 1,683 | 1,338 | 2,306 | 1,969 | 3,880 | 3,208 | 5,068 | 4,093 | 4,732 | 4,438 | 5,481 | 3,949 | 4,590 | 1,484 | 2,280 | 4,092 |
| ඇඳන් හා ලී බඩු | 52 | 80 | 88 | 119 | 114 | 127 | 200 | 224 | 325 | 243 | 352 | 346 | 235 | 230 | 125 | 246 | 210 |
| රෝහල් සඳහා ගිලන් රථ | - | 195 | 2 | 20 | 69 | 250 | 5 | | | | | | | | 1,608 | - | - |
| **එකතුව** | **2,705** | **5,342** | **6,981** | **7,690** | **11,755** | **15,128** | **18,242** | **24,927** | **18,527** | **20,438** | **25,957** | **20,404** | **38,976** | **28,544** | **29,954** | **21,263** | **24,099** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

සටහන: මධ්‍යම රජයේ වියදම් පමණක් අන්තර්ගත වේ

ජාතික ත්‍රිපෝෂ වැඩසටහන 2024 වසරේ දී ද රු. මිලියන 2,450 ක වියදමක් දරමින් අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, ගර්භනී සහ කිරි දෙන මව්වරුන් සහ අවුරුදු තුනේ සිට පහ දක්වා ළමුන් ඇතුළත්ව ලියාපදිංචි ප්‍රතිලාභීන් 611,280 ක් ආවරණය කරන ලදී. ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් සඳහා පෝෂණ ප්‍රතිඵල වැඩි දියුණු කිරීමේදී මෙම වැඩසටහන තවමත් තීරණාත්මක සන්ධිස්ථානයක පවතී.

## දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම


දේශීය වෛද්‍ය ක්‍රම ජාතික සෞඛ්‍ය පද්ධතියට ඒකාබද්ධ කිරීම ප්‍රමුඛතාවයක් ලෙස පැවතුනි. දේශීය වෛද්‍ය විද්‍යාව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ මුළු ආයෝජනය 2024 වසරේ දී රු. මිලියන 3,117 දක්වා වැඩි කරන ලදී. . ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමය ගෝලීය ප්‍රමිතීන් දක්වා ඉහළ නැංවීම අරමුණු කරගත් සංරක්ෂණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සමඟ ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ ශක්තිමත් කිරීමට ප්‍රයත්න දරන ලදී.

## අධ්‍යාපනය

### සාමාන්‍ය අධ්‍යාපනය

2024 වසරේදී රජය විසින් පාසල් අධ්‍යාපනය සඳහා වැය කළ මුළු මුදල රු. බිලියන 377.2 ක් විය, එය 2023 වසරේ රු. බිලියන 320.2 ට සාපේක්ෂව සියයට 17.8 ක වැඩි වීමක් වේ. එයට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ වියදම රු. බිලියන108.5 ක් වූ අතර, මධ්‍යම රජය විසින් පළාත් සභා 9 කට ලබා දුන් මුදල රු. බිලියන 268.7 ක් විය. 2024 වසරේ පුනරාවර්තන වියදම රු. බිලියන 359.3 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 16.1 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**රූප සටහන 5.2 පාසල් අධ්‍යාපනය සඳහා දරණ ලද වියදම (2012 - 2024)**




මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## විශ්වවිද්‍යාල අධ්‍යාපනය

විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා රජය විසින් දරන ලද මුළු වියදම රු. බිලියන 97.4 ක් වූ අතර, එය 2023 වසරට සාපේක්ෂව සියයට 12.3 ක වැඩිවීමකි. රු. බිලියන

### වගුව 5.11 | 2023-2024 පාසල් අධ්‍යාපනය සඳහා දරණ ලද වියදම

රු. මිලියන

| | 2023 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 92,088 | 5,570 | 97,658 | 98,390 | 10,127 | 108,517 |
| පළාත් සභා*(අ) | 217,354 | 5,254 | 222,608 | 260,898 | 7,776 | 268,674 |
| **එකතුව** | **309,442** | **10,824** | **320,266** | **359,288** | **17,903** | **377,191** |

මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මූල්‍ය කොමිෂන් සභාව

* පළාත් සභා වෙත මධ්‍යම රජය මඟින් සිදුකළ මුදල් මාරු ඇතුළත්ය.

(අ) තාවකාලික

### වගුව 5.12 | සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්

රු. මිලියන

| | 2024 |
|---|---|
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | 1,384 |
| තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය | 2,382 |
| තාක්ෂණ විෂය ධාරාව සඳහා අධ්‍යාපන විද්‍යාපීඨයක් ස්ථාපනය කිරීම (ශ්‍රී ලංකා රජය/ කොයිකා) | 1,789 |
| ද්විතියික පාසල් 1000ක පහසුකම් වැඩිදියුණු කිරීම | 373 |
| ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජය/ඒඩීබී) | 1,077 |

මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### වගුව 5.13 | ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා දරණ ලද වියදම

රු. මිලියන

| වැඩසටහන | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් පෝෂණ වැඩසටහන* | 3,916 | 4,434 | 5,325 | 5,063 | 2,299 | 1,685 | 3,308 | 12,500 | 21,185 |
| පෙළ පොත් මුද්‍රණය | 5,415 | 4,281 | 4,161 | 4,599 | 4,550 | 2,609 | 1,650 | 22,967 | 20,000 |
| පාසල් නිල ඇඳුම් සැපයීම | 2,157 | 2,479 | 1,073 | 3,789 | 2,877 | 2,492 | 2,355 | 2,539 | 12,373 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් ළමුන් සඳහා පාවහන් යුගලයක් ලබා දීමේ වැඩසටහන | 480 | 640 | 220 | 640 | 492 | 901 | 967 | 1,838 | 1,350 |
| ශිෂ්‍යත්වය - 5 ශ්‍රේණිය | 613 | 602 | 605 | 607 | 872 | 791 | 855 | 880 | 938 |
| "සුරක්ෂා" රක්ෂණ යෝජනා ක්‍රමය | - | 2,700 | 33 | 1,833 | 1,500 | 3,331 | 993 | 1,128 | 2,000 |

මූලාශ්‍රය: අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

* 2014 සිට පළාත් සභා ජාතික පාසල් සඳහා පාසල් පෝෂණ ආහාර වැඩසටහනේ ගෙවීම් ඇතුළත් වේ

(අ) තාවකාලික

### වගුව 5.14 | ප්‍රධාන සුභසාධන වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලැබූ ශිෂ්‍යයින්

| වැඩසටහන | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් පෝෂණ වැඩසටහන* | 973,245 | 1,105,605 | 1,089,705 | 1,067,465 | 1,079,097 | 1,082,136 | 1,078,238 | 2,161,000 | 1,438,254 |
| පෙළ පොත් මුද්‍රණය | 4,345,491 | 4,355,101 | 3,628,951 | 3,642,528 | 4,180,000 | 4,180,000 | 4,180,000 | 2,683,888 | 3,872,276 |
| පාසල් නිල ඇඳුම් සැපයීම | 4,341,581 | 4,326,951 | 4,357,797 | 4,725,445 | 4,180,000 | 4,180,000 | 4,180,000 | 4,559,420 | 4,559,420 |
| ශිෂ්‍යත්වය 5 ශ්‍රේණිය | 140,297 | 144,739 | 130,000 | 135,000 | 130,457 | 103,800 | 145,000 | 112,118 | 125,000 |
| "සුරක්ෂා" රක්ෂණ යෝජනා ක්‍රමය | - | - | 40,978 | 74,328 | 100,000 | 34,778 | 35,906 | 28,968 | 2,838 |

මූලාශ්‍රය: අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා, මූල්‍ය කොමිෂන් සභාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

* 2014 සිට පළාත් සභා ජාතික පාසල් සඳහා පාසල් පෝෂණ ආහාර වැඩසටහනෙන් ප්‍රතිලාභ ලැබූ ශිෂ්‍යය සංඛ්‍යාව ඇතුළත් වේ

(අ) තාවකාලික

68.6 ක් වූ පුනරාවර්තන වියදමෙන් රු. බිලියන 55.3 ක් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් 24,220 කගේ වැටුප් හා වේතන ගෙවීම සඳහා වැය කරන ලදී.

2023 වසරේ රු. බිලියන 28.8 ට සාපේක්ෂව 2024 වසරේ මුළු මූලධන ආයෝජනය රු. බිලියන 25.3 දක්වා වැඩි වී ඇත. මෙම ප්‍රාග්ධන ආයෝජනය වත්කම් ඉදිකිරීම්, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම්, ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම්, මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ පර්යේෂණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා උපයෝජනය කරන ලදී. 2024 වර්ෂය වන විට විශ්වවිද්‍යාල තුළ ඉදිකිරීම් ව්‍යාපෘති 73 ක් සිදු කෙරෙමින් පැවති අතර එයින් ව්‍යාපෘති 35ක් විවිධ විශ්වවිද්‍යාලවල තවදුරටත් ඉදිකෙරෙමින් පවතින අතර, ව්‍යාපෘති 8ක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත. එයින් ව්‍යාපෘති 30 ක අවසන් බිල්පත් සකස් කරමින් පවතියි. 2024 වසරේ අත්පත් කරගත් ජයග්‍රහණ අතරට රු. මිලියන 701 ක පිරිවැයක් දරා ත්‍රිකුණාමල මණ්ඩපයේ සන්නිවේදන සහ ව්‍යාපාර අධ්‍යයන පීඨය ඉදිකිරීමත් රු. මිලියන 520 ක පිරිවැයක් දරා සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික පීඨය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමත් රු. මිලියන 312 ක පිරිවැයක් දරා වවුනියා විශ්වවිද්‍යාලයේ පුස්තකාල ගොඩනැගිල්ල සඳහා තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමත් ඇතුලත් වේ.

අධ්‍යයන අවස්ථා පුළුල් කිරීම සහ ආයතනික සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2024 වසරේදී වවුනියා විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයක් හා ඊට අමතරව අධ්‍යනාංශ 04 ක් විශ්වවිද්‍යාල දෙකක පිහිටුවා ඇත.

2023 උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් විශ්වවිද්‍යාල සඳහා වාර්ෂික ඇතුළත් කරගැනීම් (2023/2024 ඇතුලත් කරගැනීම්) මේ වනවිටත් සිදුවෙමින් පවතින අතර එම සිසුන් සංඛ්‍යාව 42,282 ක් විය. ඒ අනුව 2023/2024 අධ්‍යයන වසර සඳහා 2024 වසරේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගැනීමට නියමිත සිසුන් සංඛ්‍යාව 43,500 ක් පමණ වේ.

2024 වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නව උපාධි අපේක්ෂක පාඨමාලා වැඩසටහන් දෙකක් උපාධි අපේක්ෂක විශේෂ උපාධි වැඩසටහන් හතරක් පශ්චාත් උපාධි වැඩසටහන් දහයක් බාහිර උපාධි වැඩසටහන් දෙකක් ඇතුළුව අධ්‍යයන වැඩසටහන් මාලාවක් හඳුන්වා දී අනුමත කර ඇත.

**වගුව 5.16 | ඇතුළත් කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව**

| අධ්‍යයන වසර | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 2018/2019 | 31,902 |
| 2019/2020 | 41,669 |
| 2020/2021 | 43,927 |
| 2021/2022 | 43,568 |
| 2022/2023 | 44,005 |
| 2023/2024 | 42,282 (අ) |

මූලාශ්‍රය : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(අ) තාවකාලික

**වගුව 5.15 | උසස් අධ්‍යාපනය සඳහා ආයෝජනය (2018-2024)**

රු.මිලියන

| වසර | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 37,457 | 47,323 | 51,506 | 54,734 | 57,351 | 61,313 | 68,633 |
| මූලධන | 24,420 | 23,512 | 22,615 | 21,884 | 18,289 | 25,344 | 28,793 |
| **එකතුව** | **61,877** | **70,835** | **74,121** | **76,618** | **75,640** | **86,657** | **97,426** |

මූලාශ්‍රය : රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව / ජාතික අයවැය දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

## මහපොළ සහ ශිෂ්‍යාධාර

රු. 500,000 ට අඩු වාර්ෂික ආදායමක් සහිත කුටුම්භවල විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්ට මූල්‍ය ආධාර සැපයීම සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම අඛණ්ඩව සිදු කරන ලදී.

**වගුව 5.17 | විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා මූල්‍යාධාර**

රු.මිලියන

| වසර | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|
| මහපොළ | 1,304 | 1,269 | 1,366 | 1,138 | 952 | 1,192 | 1,141 |
| ශිෂ්‍යාධාර | 521 | 695 | 759 | 862 | 873 | 1,023 | 1,459 |
| **එකතුව** | **1,825** | **1,964** | **2,125** | **2,000** | **1,825** | **2,215** | **2,600** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**වගුව 5.18 | මූල්‍යාධාර වැඩසටහන් යටතේ ප්‍රතිලාභ ලැබූ විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව**

| වසර | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|
| මහපොළ | 51,652 | 55,491 | 57,773 | 62,891 | 63,224 | 63,026 | 65,832 |
| ශිෂ්‍යාධාර | 22,450 | 22,923 | 23,494 | 29,491 | 33,842 | 32,292 | 36,040 |
| **එකතුව** | **74,102** | **78,414** | **81,267** | **92,382** | **97,066** | **95,318** | **101,872** |

මූලාශ්‍රය : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(අ) තාවකාලික

## රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනය සඳහා සහාය


රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින සීමිත අවස්ථා සැලකිල්ලට ගෙන උසස් පෙළ සුදුසුකම් ලත් සිසුන් වෙනුවෙන් රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපන

අවස්ථා ඉහළ නැංවීම සඳහා වන පොලී රහිත ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2024 වසරේ දී රු. මිලියන 1,829 ක් අයෝජනය කරන ලදි. ඒ අනුව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 18 ක් මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා 110 ක් හැදෑරීම සඳහා සිසුන් 3,871 දෙදෙනෙකුට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වසර තුළ අවස්ථා ලබා දෙන ලදි. එසේම වර්තමානය වන විට 14,603 ක ශිෂ්‍යයින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 18 ක අධ්‍යාපනය හදාරමින් සිටින අතර මේ වන විට ශිෂ්‍යයින් 4,053 ක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උපාධිය සම්පූර්ණ කර ඇත.

## නිපුණතා සංවර්ධනය

2024 වර්ෂයේ දී නිපුණතා සංවර්ධනය වෙනුවෙන් රු. මිලියන 8,779ක් පුනරාවර්තන වියදම් වශයෙන් ද මූලධන වියදම් සඳහා රු. මිලියන 2,286 ක් ද ලෙස රු. මිලියන 11,061 ක වියදමක් දරන ලදි.

**රූප සටහන 5.3 | නිපුණතා සංවර්ධන අංශයේ වියදම් - (2023 - 2024)**




මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**වගුව 5.19 | 2024 වර්ෂයේදී නිපුණතා සංවර්ධනය පිළිබඳව ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති**

රු.මිලියන

| විස්තරය | 2024 වියදම |
|---|---|
| ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ලබා දීම (ශ්‍රී ලංකා රජය/ ජර්මන් - ජීඅයිඉසෙඩ්) | 616 |
| යූ ලීඩ් වැඩසටහන (ශ්‍රී ලංකා රජය/යූඑස්එයිඩ්) | 214 |
| සමස්ත වර්ධනය සඳහා කුසලතා (එස්4අයිජී) අදියර 2 (ශ්‍රී ලංකා රජය/ඕස්ට්‍රේලියාව) | 145 |
| ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/කොයිකා) | 44 |
| නියාගම ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම (ශ්‍රී ලංකා රජය/කොරියා) | 107 |
| තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු (TVET) ක්ෂේත්‍රයේ රැකියා සැලසීමේ පසුබිමක් සකස් කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/කොයිකා) | 31 |
| නිපුණතා සිසු දිරිය | 533 |
| වෘත්තීය අධ්‍යාපනය නහා සිටුවීම | 97 |
| ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක වැඩසටහන | 69 |
| තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල 7ක් නවීකරණය කිරීම | 159 |
| වෘත්තීය හා තාක්ෂණික පුහුණු සංවර්ධනය | 102 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## පර්යේෂණ හා නව නිපැයුම් සංවර්ධනය

2024 වර්ෂයේදී පර්යේෂණ හා නව නිපැයුම් සඳහා සමස්ත වියදම රු. මිලියන 1,551 ක් වූ අතර මූලධන ආයෝජනය රු. මිලියන 359 ක් වූ අතර පුනරාවර්තන වියදම රු. මිලියන 1,192 ක් විය.

පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම, නිසරු පස දියුණු කිරීම, ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය ගිවිසුම් සහ අනෙකුත් රටවල් සමඟින් විද්‍යා හා තාක්ෂණ සහයෝගිතාවය සහ පාසල් විද්‍යා සංගම් වැනි වැඩසටහන් මෙම අංශයේ ප්‍රධාන ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කරන ලදි.

**වගුව 5.20 | 2024 වර්ෂයේදී පර්යේෂණ හා නව නිපැයුම් පිළිබඳව ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති**

රු. මිලියන

| විස්තරය | 2024 වියදම |
|---|---|
| පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම | 1 |
| නිසරු පස වැඩි දියුණු කිරීම | 12 |
| ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය ගිවිසුම් සහ අනෙකුත් රටවල් සමඟින් විද්‍යා හා තාක්ෂණ සහයෝගිතාවය | 5 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

# 5.9.2 ප්‍රවාහන

## බස් ප්‍රවාහනය

2024 වර්ෂයේ දී බස් ප්‍රවාහන අංශය සඳහා රජය විසින් කරන ලද වියදම රු. බිලියන 19.2 ක් වේ. එයින් රු. බිලියන 16.0ක් හා රු. බිලියන 3.2 ක් පිළිවෙලින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. පුනරාවර්තන වියදම් යටතේ පාසල් සහ උසස් අධ්‍යාපන ශිෂ්‍ය වාර ප්‍රවේශපත්‍ර ලබාදීම වෙනුවෙන් රජය රු. බිලිනය 10.5 ක් වැය කර ඇත. මේ අතර ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන මාර්ගයන්හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ලංගම) බස් රථ ධාවනය කිරීම, සමාජීය වශයෙන් අත්‍යවශ්‍ය බස් සේවාවක් පවත්වාගෙන යාම සහ සන්නද්ධ සේවාවන්ට බස් අවසරපත් ලබාදීම යන සෙසු සහන සේවාවන් වෙනුවෙන් ද රු. බිලියන 3.9 ක් වැය කර ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ඇණිය වැඩි දියුණු කිරීම හා රියදුරු බලපත්‍ර මුද්‍රණය ඇතුලත්ව ප්‍රාග්ධන වියදම් ලෙස රු. බිලියන 3.4 ක් වැය කර ඇත.

## ප්‍රවාහන පර්යන්ත සංවර්ධනය

මහනුවර නගර ප්‍රදේශය තුළ පොදු ප්‍රවාහනයට පහසුකම් සපයන සහ ප්‍රදේශයේ රථවාහන තදබදය අඩු කරන මහනුවර බහුමාධ්‍ය ප්‍රවාහන පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා රජය රු. මිලියන 4,134 ක් වියදම් කර ඇත.

## දුම්රිය

2024 වර්ෂයේ දී දුම්රිය අංශය සඳහා රජය විසින් කරන ලද වියදම රු. බිලියන 46.3 ක් වේ. මහජනතාව වෙනුවෙන් පහසු හා අඛණ්ඩ දුම්රිය සේවාවක් පවත්වාගෙන යාමේ අරමුණින් 2024 වර්ෂයේ දී රු. බිලියන 28.0 ක පුනරාවර්තන වියදමක් සහ කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු

කිරීමේ ව්‍යාපෘතිය හා මහව- ඕමන්ත දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ සංඥා පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියද ඇතුලත්ව රු. බිලියන 18.3 ක ප්‍රාග්ධන වියදමක් සිදු කර ඇත.

**වගුව 5.21 | පොදු ප්‍රවාහනය සඳහා 2024 දී දියත් කරන ලද ප්‍රධාන ව්‍යාපෘති**

රු.මිලියන

| විස්තරය | 2024 වියදම |
|---|---|
| රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම | 1,198 |
| පොල්ගහවෙල -කුරුණෑගල දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් කිරීම, මහව- ඕමන්ත දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම | 200 |
| මගී දුම්රිය මැදිරි පුනරුත්ථාපනය කිරීම | 478 |
| නව රේල් පීලි සහ සිල්පර යොදා ස්ථිර මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 3,996 |
| කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 6,728 |
| පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර සඳහා සහනාධාර සහ සන්නද්ධ සේවා බස් අවසරපත් | 10,780 |
| ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන මාර්ගයන්හි ලංගම බස් රථ ධාවනය | 2,000 |
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඇණිය වැඩි දියුණු කිරීම | 1,500 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## වරාය

2024 වසරේ වරාය, නාවික හා සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සඳහා රජය විසින් කරන ලද වියදම රු. මිලියන 1,966 ක් වේ. එයින් රු. මිලියන 798ක් පුනරාවර්තන වියදම් හා හිඟුරක්ගොඩ ජාත්‍යන්තර ගුවන් තොටුපොල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියද ඇතුලත්ව රු. මිලියන 1,168 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. 2023 වර්ෂයේ රු. මිලියන 1,816ක් වූ සමස්ථ වියදමට සාපේක්ෂව 2024 වර්ෂයේ වියදම සියයට 8.2 න් වැඩි වී ඇත.

**වගුව 5.22 | වරාය හා නාවික කටයුතු සඳහා 2024 දී දියත් කරන ලද ප්‍රධාන ව්‍යාපෘති**

රු.මිලියන

| විස්තරය | 2024 වියදම |
|---|---|
| කුළුණු මතින් ඉදිවෙන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපාතියට අදාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 282 |
| හිඟුරක්ගොඩ ජාත්‍යන්තර ගුවන් තොටුපොල සංවර්ධනය | 500 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## මාර්ග සංවර්ධනය

2024 සඳහා මාර්ග සංවර්ධනයේ වියදම් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ මාර්ග පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම, දැනට ක්‍රියාත්මක වන මාර්ග ව්‍යාපෘතිවල තීරණාත්මක ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම, මාර්ග ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීමට අදාළ හිඟ බිල්පත් පියවීම සහ අධිවේගී මාර්ග සංවර්ධනයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ය. 2024 වර්ෂය තුළ මුළු වියදම රු. බිලියන 235 ක් පමණ විය.

අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රු. මිලියන 46,246 ක් වෙන් කර ඇත. මේ යටතේ පොතුහැර සිට

**වගුව 5.23 | 2024 වර්ෂය තුළ සිදු කල ප්‍රධාන මාර්ග සංවර්ධන ව්‍යාපෘති**

රු.මිලියන

| ව්‍යාපෘතියේ නම | 2024 සත්‍ය වියදම |
|---|---|
| **අධිවේගී මාර්ග** | **46,246** |
| එයින්, මධ්‍යම අධිවේගී මාර්ගය | 28,411 |
| කුළුණු මත ඉදි කෙරෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය | 12,318 |
| නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදි කෙරෙන අධිවේගී මාර්ගය | 485 |
| කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය | 3,129 |
| **මහාමාර්ග සංවර්ධනය** | **153,245** |
| එයින්, ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන | 8,623 |
| බස්නාහිර පළාත් ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය | 671 |
| A 17 මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (රක්වාන - සූරියකන්ද) | 1,748 |
| පේරාදෙණිය - බදුල්ල - වෙන්කල්අඩි මාර්ගයේ බදුල්ල සිට වෙන්කල්අඩි දක්වා කොටස පුනරුත්ථාපනය කිරීම | 2,060 |
| ගාලු පාරට සමාන්තර සමුද්‍රීය මාර්ගය (මැරින් ඩ්‍රයිව්) පානදුර දක්වා දීර්ඝ කිරීම | 15 |
| කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 1,759 |
| ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම | 36,074 |
| අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය | 7,294 |
| ග්‍රාමීය මාර්ග පුණර්ජීවන වැඩසටහන (මග නැඟුම) | 7,141 |
| **නඩත්තු කිරීම** | **28,005** |
| මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සහ මාර්ග නඩත්තුව | 22,379 |
| පළාත් මාර්ග නඩත්තු කිරීම | 5,626 |
| **පාලම් සහ ගුවන් පාලම්** | **8,038** |
| එයින්, ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම | 212 |
| ජාතික මාර්ග පද්ධතියෙහි අබලන් වූ පාලම් ප්‍රතිසංස්කරණය | 208 |
| දෙවෙනි නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 4,132 |
| පැරණි පාලම් උපාංග යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල පාලම් ඉදිකිරීම | 788 |
| කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් සැලසුම් කොට ඉදිකිරීම | 254 |
| කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල සහ උත්තරානන්ද මාවතෙහි දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම | 1,747 |
| **මුළු එකතුව** | **235,534** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

රඹුක්කන දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයේ 3 කොටස සහ වරාය ප්‍රවේශ කුළුණු මතින් දිවෙන අධිවේගී මාර්ගය පසුගිය වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘති වේ. මේ අතර මුදල් නිදහස් කිරීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් මධ්‍යම අධිවේගී මාර්ගය කඩවත - මීරිගම කොටසේ 2024 දී සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගැනීමට නොහැකි වී ඇත.


මීට අමතරව, අනෙකුත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. මිලියන 153,245 ක් වැය කර ඇත. මේ යටතේ රටේ ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය කිරීම අරමුණු කරගත් මගනැගුම සහ අන්තර්ගතිකව සහ සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී. තවද, දැනට ආරම්භ කර ඇති ඒකාබද්ධ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ සහ රථවාහන තදබදය ලිහිල් කිරීම අරමුණු කරගත් ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග ජාලයක් සංවර්ධනය කිරීම යන ව්‍යාපෘතියේ මාර්ග රථවාහන ගමන් කළ හැකි මට්ටමට වැඩිදියුණු කිරීම සඳහා අත්‍යාවශ්‍ය තීරණාත්මක ක්‍රියාකාරකම් ද අඛණ්ඩව සිදු කරන ලදී.

මාර්ග නඩත්තුව, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 28,000 ක් පමණ වැය කළ අතර පාලම් නඩත්තුව සහ සංවර්ධනය සඳහා රු. මිලියන 8,040 ක් පමණ වැය කර ඇත.

**විශේෂ සටහන 5.1 | උපායමාර්ගික රාජ්‍ය ආයෝජන හරහා ජාතික සංවර්ධනය මෙහෙයවීම**

රාජ්‍ය ආයෝජනය, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන යාන්ත්‍රණයක් ලෙස භාවිත වන අතර එමගින් රාජ්‍ය සම්පත් මධ්‍ය කාලීන සංවර්ධන ප්‍රමුඛතා වෙත ව්‍යුහගතව හා උපායමාර්ගික ව යොමු කිරීම සඳහා දිශානතියක් සපයනු ලැබේ.

රාජ්‍ය ආයෝජන වැඩසටහන විවිධ අංශ සඳහා ආයෝජනය කළ හැකි සම්පත් විදහා දක්වන අතර රජයේ සංවර්ධන දැක්ම සහ ප්‍රමුඛතා සමඟ අනුගත වීමද පෙන්නුම් කරනු ලැබේ. එය රටෙහි ජාතික ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් පදනම ලෙස ක්‍රියා කරන අතර, එහි දිගුකාලීන දැක්ම, ක්‍රියාකාරී සහ අරමුදල් සපයන මුලපිරීම් බවට පරිවර්තනය කරයි. යටිතල පහසුකම් සංවර්ධන අංශ වෙත සම්පත් යොමු කිරීම මගින් රාජ්‍ය ආයෝජන වැඩසටහන ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම අතර සබඳතාවයක් ගොඩනගනු ලැබේ.




**2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා වන නියාමන රාමුව**

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සෘජුවම පාලනය කරන මූල්‍ය නීති, අධීක්ෂණ යාන්ත්‍රණ සහ සැලසුම් ක්‍රියාවලි සඳහා පදනමක් සපයනු ලැබේ. විනිවිදභාවයෙන්යුත් කාර්ය සාධනය මත පදනම් වූ මූල්‍ය රාමුවක් තුළ රාජ්‍ය ආයෝජන වැඩසටහන ඇතුළත් කිරීම මගින්, රාජ්‍ය ආයෝජන ජාතික ප්‍රමුඛතා සමඟ සමපාත වීම, මූල්‍යමය වශයෙන් තිරසර වන බව තහවුරු කිරීම හා මැනිය හැකි සංවර්ධන ප්‍රතිඵල ලබා දීම මෙම පනත හරහා සහතික කරනු ලැබේ.

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ඇතුළුව සියලුම රාජ්‍ය-ආයෝජන ව්‍යාපෘති, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 2 වන වගන්තියෙහි දක්වා ඇති අරමුණු වලට අනුකූල වීම, III වන කොටසේ මූල්‍ය වගකීම් රාමුවට අනුකූල වීම සහ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව, ආංශික සැලසුම් සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන සමඟ සමපාත වීම අවශ්‍ය වේ.

**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ මූල්‍ය නීති**

**ප්‍රාථමික වියදම් සීමාව:**

- අදාළ මූල්‍ය වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම් නාමික දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 කට සීමා වේ.
- මූල්‍ය වර්ෂයට අදාල ණය සේවා ඇතුළත් නොවේ.

**විශේෂ සටහන 5.1 | උපායමාර්ගික රාජ්‍ය ආයෝජන හරහා ජාතික සංවර්ධනය මෙහෙයවීම සම්බන්ධයි...**

**වියදම් සඳහා පාදක**

- ව්‍යාපෘති සඳහා වන රජයේ වියදම් සහ පොලී නොවන වියදම් සාමූහිකව මෙම සීමාව තුළ තිබිය යුතුය.
- මූල්‍ය විනය ස්ථාපිත කිරීම තුළින් තිරසර රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහතික කිරීම.

**උපායමාර්ගික රාජ්‍ය ආයෝජන තුළින් ජාතික සංවර්ධනය ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය ආයෝජන වැඩසටහන, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය මෙවලමක් වන අතර එය සාමාන්‍යයෙන් වාර්ෂිකව රටෙහි දළ දේශීය නිෂ්පාදිතයෙන් 4-6 ප්‍රතිශතයක් වේ. සම්පත් උපායමාර්ගිකව යොමු කිරීම මගින් රාජ්‍ය ආයෝජන වැඩසටහන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ඇතුළත් ප්‍රධාන කුළුණු හතර (පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්, ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්, නවීන ජීවිතයක් - පොහොසත් රටක්, අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්) සමඟ සමීපව අනුගත වන අතර එම ආයෝජන ධනාත්මක බලපෑමක් සහිතව අරමුණු සහගත වන බව සහතික කරයි.

**ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන කුළුණු හතර අනුව වර්ගීකරණය කරන ලද 2025 රාජ්‍ය ආයෝජන පිළිබඳ දළ විශ්ලේෂණය**

**1. පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්**

මානව සංවර්ධනය, සෞඛ්‍ය, නිවාස සහ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කරන සමාජ යටිතල පහසුකම් සඳහා ප්‍රමුඛත්වය දෙමින්, මුළු රාජ්‍ය ආයෝජනවලින් ආසන්න වශයෙන් 31-32 ක ප්‍රතිශතයක් මේ යටතේ වෙන් කර ඇත.

**2. ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්**

මෙම කුළුණ යටතේ මුළු රාජ්‍ය ආයෝජනවලින් ආසන්න වශයෙන් 1.5-2 ප්‍රතිශතයක් වෙන් කරන අතර, ආරක්ෂිත සහ සියලු ජන කොටස් ඇතුළත් සමාජයක් ගොඩනැගීම සඳහා සමාජ ආරක්ෂණය, තාක්ෂණය සහ ජාතික ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කරයි.

**3. නවීන ජීවිතයක් - පොහොසත් රටක්**

මුළු ආයෝජනවලින් ආසන්න වශයෙන් 49-50 ප්‍රතිශතයක් මෙම කුළුණ සඳහා යොමු කෙරෙන අතර, මෙමගින් යටිතල පහසුකම්, බලශක්ති, කෘෂිකර්මාන්තය සහ නවෝත්පාදනය තුළින් ආර්ථික සංවර්ධනය සඳහා දිශානතියක් ලබා දෙයි.

**4. අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්**

මුළු රාජ්‍ය ආයෝජනවලින් ආසන්න වශයෙන් 17-18 ප්‍රතිශතයක් මෙම කුළුණ සඳහා යොමු කෙරෙන අතර, මෙමගින් දිගුකාලීන ජාතික ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා ආයතනික රාමුව පාලනය, ආයතනික ශක්තිමත් කිරීම සහ ඒ සඳහා වන රජයේ විභවය අවධාරණය කරයි.

මෙම විධිමත් රාජ්‍ය ආයෝජනය තුළින්, ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි දැක්ම, තිරසර සංවර්ධන ප්‍රතිඵල බවට ඵලදායීව පරිවර්තනය කරන බව සහතික කරයි. කෙසේ වෙතත්, මෙම ආයෝජන ප්‍රමාණයන් රජයෙහි පවතින උපායමාර්ගික ප්‍රමුඛතා සහ රටේ මූල්‍ය තත්ත්වය මත වෙනස් විය හැක.

### 5.9.3 සමාජ සුබසාධනය හා සමාජ ආරක්ෂණය

සමාජ සුභසාධනය සහ සමාජ ආරක්ෂණය සඳහා රජයේ වියදම 2024 දී රු. බිලියන 956 ක් වූ අතර එය 2023 දී රු. බිලියන 890 ට සාපේක්ෂව සියයට 7.4 ක වැඩිවීමකි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අස්වැසුම නිවාස මුදල් ප්‍රදාන වැඩසටහන, වැඩිහිටි පුද්ගලයින්, වකුගඩු රෝගීන් සහ ආබාධිත පුද්ගලයින් සඳහා මාසික ගෙවීම් වැඩිවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වැඩි වීමයි. ඒ අනුව, අස්වැසුම වැඩසටහන යටතේ ගෘහස්ථ මුදල් ප්‍රදාන සඳහා රු. බිලියන 145.6 ක්, වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා දීමනාව සඳහා රු. බිලියන 20.6 ක්, වකුගඩු රෝගීන් සඳහා දීමනා සඳහා රු. බිලියන 3.6 ක් සහ ආබාධිත පුද්ගලයින් සඳහා දීමනාව සඳහා රු. බිලියන 9.8 ක් රජය විසින් දරනු ලැබ ඇත. තවද, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ යෝජනා ක්‍රමයක් සඳහා රජය රුපියල් බිලියන 52.6 ක් වියදම් කළේය. තවද, ගැබිනි මව්වරුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගනිමින් පෝෂණ ආහාර පැකේජ වැඩසටහන යටතේ පෝෂණ මල්ල සඳහා රු. 45,000 ක දීමනාවක් ලබා දී ඇත.

**විශේෂ සටහන 5.2 | ඉලක්කගත සහන සහ සවිබලගැන්වීම සඳහා සමාජ ආරක්ෂණය**

ඉලක්කගත සමාජ ආරක්ෂණ පියවරයන් සහ සහනාධාර හරහා සමාජයේ අවදානමට ලක්විය හැකි කොටස් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව දැඩි ලෙස කැපවී සිටී. දුප්පතුන් සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් කෙරෙහි ඇතිවන ආර්ථික අභියෝගවල බලපෑම අවම කිරීමට සමාජ ආරක්ෂණ ජාලය (SSN) ශක්තිමත් කිරීම සඳහා, රජය විසින් සමාජ සුභසාධනය සහ ආරක්ෂාව වෙනුවෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන වැඩිකරමින් ජනතාවට බෙහෙවින් අවශ්‍ය සහන ලබා දීම සහ ඔවුන් බලගැන්වීම වෙනුවෙන් පියවර රාශියක් ගෙන ඇත.

ආර්ථික අර්බුදයෙන් දුප්පතුන්ට සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ට ඇති වන බලපෑම අවම කිරීම සඳහා සමාජ ආරක්ෂණ ජාලය (SSN) ශක්තිමත් කිරීම සඳහා, රජය 2023 ජූලි මාසයේදී "අස්වැසුම" නව සහන පියවරක් ආරම්භ කළේය.

"අස්වැසුම" විශේෂයෙන් සමාජ කාණ්ඩ හතරක් ඉලක්ක කරයි; එනම් සංක්‍රාන්ති, අවදානමට ලක් වූ, දුප්පත්, සහ අන්ත දිළිඳු වශයෙනි. රජය සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා වන වියදම් වැඩි කළ අතර (වැඩසටහන මගින්) ආවරණය වන ප්‍රතිලාභීන් සංඛ්‍යාව වැඩි කිරීම. ඇතුළත් කිරීමේ සහ බැහැර කිරීමේ දෝෂ අඩු කිරීම සහ ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත ළඟා වීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් ලියාපදිංචි දත්ත පද්ධතිය (SRIS) ස්ථාපිත කිරීම සඳහා ද පියවර ගෙන ඇත. රජය 2024 දී සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා රු. බිලියන 186.4 ක් වැය කර ඇත. තවද, 2025 දී රජය මේ වෙනුවෙන් අයවැය ප්‍රතිපාදන රු. බිලියන 237 දක්වා වැඩි කර ඇත.

තවද, රජය දැනටමත් සමාජ කණ්ඩායම් දෙකක් සඳහා; දුප්පත් සහ අන්ත දිළිඳු මාසික ප්‍රතිලාභ දීමනාව වැඩි කිරීමට පියවර ගෙන ඇත. දුප්පත් කාණ්ඩය සඳහා දීමනාව රු. 8,500 සිට රු.10,000 දක්වා වැඩි කර ඇති අතර, අන්ත දිළිඳු කාණ්ඩය සඳහා දීමනාව රු. 15,000 සිට රු. 17,500 දක්වා වැඩි කර ඇති අතර එය 2025 ජනවාරි මස සිට ක්‍රියාත්මක වේ.

තවද, වකුගඩු රෝගීන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසික දීමනාව රු. 7,500 සිට රු. 10,000 දක්වා වැඩි කර ඇති අතර, වැඩිහිටි පුද්ගලයින් සඳහා වන දීමනාව රු .3,000 සිට රු. 5,000 දක්වා වැඩි කර ඇත. එය 2025 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වේ. රජය, ආර්ථිකය නැවත ගොඩනැඟීම සඳහා දක්වන කැපවීම තිරසාර සහ ස්ථාවර ආර්ථික වර්ධනයක් පෙරදැරිව ක්‍රියාත්මක වන අතර, එමඟින් ශ්‍රී ලාංකීය සමාජයේ සියලුම කාණ්ඩ වෙත වාසි සලසමින් අසමානතා අවම කරමින් තිරසාර හා සාධාරණ සංවර්ධනයක් හිමි කර දීමට අපේක්ෂා කෙරේ.

**සමාජ ආරක්ෂණයේ ජීවන චක්‍ර ප්‍රවේශය**




| ගැබිණි සහ මුල් ළමාවිය | පාසල් අවධිය | තරුණයින් | වැඩ කරන වයස | මහලු වයස |
|---|---|---|---|---|
| **අවස්ථාව:** පෙර පාසැල්, සෞඛ්‍ය | **අවස්ථාව:** නිදහස් අධ්‍යාපනය | **අවස්ථාව:** ව්‍යාපාරයකත්ව වැඩසටහන්, කුසලතා සහ පුහුණුව | **අවස්ථාව:** සේවා නියුක්තිය, ව්‍යවසායකත්වය, පුහුණු සහ කුසලතා | **අවස්ථාව:** විදී ආර්ථිකය |
| **සාධාරණත්වය:** මව් උපකාරක වැඩසටහන්, ළමා දීමනා | **සාධාරණත්වය:** ළමා දීමනා, ශිෂත්ව | | **සාධාරණත්වය:** අවම වයස | **සාධාරණත්වය:** සමාජ විශ්‍රාම වැටුප් |
| | | | **ඔරොත්තු දීමේ හැකියාව:** විරැකියාව, රක්ෂණය | **ඔරොත්තුදීමේ හැකියාව:** වැඩිහිටි වැටුප, ආබාධිත රක්ෂණය |

මූලාශ්‍රය: ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, (2024): ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය

**විශේෂ සටහන 5.2 | ඉලක්කගත සහන සහ සවිබලගැන්වීම සඳහා සමාජ ආරක්ෂණය සම්බන්ධිතයි...**

රජයේ ප්‍රතිපත්තියට අනුව, රජයේ සහ විදේශීය අරමුදල් හරහා "අස්වැසුම" ප්‍රතිලාභීන් මිලියන 1.2 ක් සවිබලගන්වනු ලැබේ. නියමු වැඩසටහනේ කොටසක් ලෙස, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල සහාය ඇතිව සවිබලගැන්වීම සඳහා පවුල් 25,000 ක් පමණ තෝරාගෙන ඇත. ඉතිරි සුදුසුකම් ලත් පවුල් දේශීය අරමුදල් භාවිතයෙන් ක්‍රමයෙන් සවිබලගැන්වීමට අපේක්ෂා කෙරේ. සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා රුපියල් බිලියන 4.6 ක් වෙන් කර ඇත.

එපමණක් නොව, සමාජ ආරක්ෂණය සඳහා රටේ පළමු පුළුල් රාමුව ලෙස, 'ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (NSPP)' සකස් කර එළිදක්වා ඇත. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා, ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගය දැනට සකස් කරමින් පවතී. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රධාන කුළුණු හතරක් මත; එනම් සමාජ සහනාධාර, සමාජ රැකවරණය, සමාජ රක්ෂණය සහ ශ්‍රම වෙළඳපොළ, සහ නිෂ්පාදන අන්තර්කරණය කිරීමේ වැඩසටහන්, ගොඩනගා ඇත. සමාජ ආරක්ෂණය යනු පුද්ගලයන්ට සහ සමාජයන්ට අවදානම් සහ අස්ථිරතා කළමනාකරණය කිරීමට, දුගීභාවයෙන් සහ අසමානත්වයෙන් ආරක්ෂා වීමට සහ ජීවන චක්‍රයේ සෑම අදියරකදීම ආර්ථික අවස්ථා ලබා ගැනීම පහසු කිරීමට අරමුණු කරගත් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සමුදායක් ලෙස අර්ථකථනය කළ හැකිය.



## 5.9.4 කෘෂිකර්මය

රජය විසින් 2024 වර්ෂයේ දී කෘෂිකාර්මික අංශය සඳහා රු. බිලියන 121 ක වියදමක් දරා ඇති අතර එය 2023 ට සාපේක්ෂව සියයට 10.5 ක අඩුවීමකි.

### කෘෂිකර්මය - ආහාර බෝග

වී සහ අනෙකුත් ආහාර බෝග නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම, පෙර සහ පසු අස්වනු හානි කළමනාකරණය, බීජ සහතික කිරීම සහ ශාක ආරක්ෂණය, ගොවි සවිබල ගැන්වීම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය, අවදානම් අවම කිරීම සහ සූදානම ප්‍රධාන වශයෙන් ඇතුළත්ව රු. බිලියන 94.7ක වියදමක් ආහාර බෝග අංශය සඳහා 2024 වර්ෂයේදී රජය විසින් දරා ඇති අතර ඒ අතරින් රු. බිලියන 39.6ක් පොහොර සහනාධාරය වෙනුවෙන් වියදම් කර තිබේ.

2024 වසරේ දී, කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය මෙන්ම පර්යේෂණ හා සංවර්ධනය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට ව්‍යාපෘති සහ වැඩසටහන් කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක විය. තෝරාගත් භෝග සඳහා ඵලදායිතාව ඉහළ නැංවීම, වාණිජකරණය, අගය එකතු කිරීම සහ වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය සහ කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. බිලියන 12.8 ක් වැය කරන ලදී. ගොවි රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රජයේ දායකත්වය රු. බිලියන 5.01 ක් පමණ විය.

### වැවිලි

සහන මිලට ව්‍යාප්ති සේවා සහ රෝපණ ද්‍රව්‍ය සැපයීම තුළින් තේ, රබර්, පොල් සහ අනෙකුත් අපනයන භෝග වගා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා 2024 දී රජය විසින් රු. බිලියන 9.0 ක් ආයෝජනය කර ඇත. මීට අමතරව, වැවිලි භෝගවල අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම, නැවත වගා කිරීම සහ නව රෝපණ කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයීම රජය විසින් අඛණ්ඩව සිදු කරන ලදී. 2024 වසරේ දී කුරුඳු, ගම්මිරිස්, එනසාල්, කරාබු නැටි, සාදික්කා, කෝපි, කොකෝවා, වැනිලා, බුලත්, පැඟිරි, ඉඟුරු, කහ, පුවක් වැනි බහු වාර්ෂික අපනයන භෝග නිෂ්පාදනය සහ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා රු. බිලියන 1.4 ක් වැය කර ඇත.

### ධීවර

2024 වසරේ දී ධීවර කර්මාන්තය සඳහා රජයේ වියදම රුපියල් බිලියන 3.27 ක් වූ අතර එයින් රු. බිලියන 2.9 ක් සමුද්‍ර ධීවර අංශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ධීවර වරායන් සහ නැංගුරම් පොළවල් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වැය කරන ලදී. එසේම මත්ස්‍ය අභිජනනය සහ මිරිදිය ජලාශයන් වෙතට මත්ස්‍ය පැටවුන් මුදා හැරීම මඟින් මිරිදිය ධීවර අංශය සංවර්ධනය කිරීම සඳහා 2024 වසරේ දී රු. 200 ක් පමණ යොදා ගන්නා ලදී.

### පශු සම්පත්

අභිජනන ගොවිපලවල්, කෘතිම සිංචනය මගින් සත්ව අභිජනනය, රෝග පාලනය, එන්නත් නිෂ්පාදනය, පශු සම්පත් පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් ඇතුළු පශු සම්පත් අංශය සඳහා 2024 වර්ෂයේ රජයේ වියදම රු.බිලියන 1.6 ක් වේ.

## 5.9.5 වාරිමාර්ග

2024 වසරේ වාරිමාර්ග ක්ෂේත්‍රය සඳහා රජයේ මුළු වියදම රු. බිලියන 62 කි. 2024 වසරේ දී, පැවති ව්‍යාපෘති මනාව ක්‍රියාත්මක කිරීම, කුඩා වැව් සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ පවතින මධ්‍යම හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. ප්‍රධාන, මධ්‍යම සහ සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය

**5.24 වගුව | 2024 වර්ෂයේ කෘෂිකාර්මික අංශයේ වියදම**

රු.මිලියන

| විස්තරය | 2024 (අ) පුනරාවර්තන වියදම | 2024 (අ) මූලධන වියදම | 2024 (අ) මුළු වියදම |
|---|---|---|---|
| ආහාර බෝග | 26,574 | 28,502 | 94,655 |
| පොහොර සහනාධාරය | 39,579 | - | |
| වැවිලි කර්මාන්ත | 4,519 | 4,489 | 9,008 |
| පශු සම්පත් සංවර්ධනය | 825 | 772 | 1,597 |
| ධීවර හා ජලජ සම්පත් | 1,949 | 3,279 | 5,228 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | 6,861 | 3,804 | 10,666 |
| මුළු එකතුව | **80,308** | **40,846** | **121,154** |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

කිරීම 2024 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. විශේෂයෙන්ම, ඉහළ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා ජල මූලාශ්‍ර සුරක්ෂිත කිරීම සහ ජලාශවල රොන්මඩ ඉවත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය , උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය හා පහළ මල්වතුඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය වැනි යෝජනා ක්‍රම කිහිපයක් ද 2024 වසරේ දී, අඛණ්ඩව ක්‍රියාත්මක විය.

## 5.9.6 නිවාස සහ පොදු පහසුකම්

### නිවාස සංවර්ධනය

නිවාස ඉදිකිරීම් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2024 වර්ෂයේ දී රජය විසින් කරන ලද වියදම රු. බිලියන 18.06 කි. නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ නිවාස ව්‍යාපෘති ගණනාවක් අවසන් වීම හේතුවෙන්, 2024 වර්ෂයේ නිවාස සංවර්ධනය සඳහා කරන ලද වියදම 2023 වර්ෂයේ රු. බිලියන 20.4 ක් වූ සමස්ත වියදමට සාපේක්ෂව සියයට 11.5 ක අඩු වීමකි. කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස නැවත පදිංචි කිරීම සඳහා වූ නාගරික පුනර්ජීවන වැඩසටහන, උතුරු හා නැගෙනහිර පළාත්වල අඩු පහසුකම් සහිත පවුල් සඳහා ස්ථිර නිවාස ලබාදීම හා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන අඩු අදායම්ලාභීන් ඉලක්ක කර ගත් නිවාස වැඩසටහන යන ප්‍රධාන නිවාස ව්‍යාපෘති පෙර වර්ෂවල මෙන්ම 2024 වර්ෂයේ ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.

### නාගරික සංවර්ධනය

2024 වර්ෂයේ දී නාගරික සංවර්ධන හා අපද්‍රව්‍ය කළමනාකරණ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා රජය කරන ලද වියදම රු. බිලියන 21.8 කි. එයින් රු. බිලියන 15.8 ක් නාගරික සංවර්ධන අංශය හා රු. බිලියන 6.0 ක් අපද්‍රව්‍ය කළමනාකරණ සහ පරිසර ආරක්ෂාව ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා වැය කර ඇත. මේ අතර ඝන අපද්‍රව්‍ය වලින් පරිසරයට සිදුවන හානිය පාලනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක විය.

**වගුව 5.25 | නිවාස හා නාගරික සංවර්ධනය සඳහා 2024 දී දියත් කරන ලද ප්‍රධාන ව්‍යාපෘති**

රු.මිලියන

| විස්තරය | 2024 වියදම |
|---|---|
| මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 253 |
| නාගරික පුනර්ජීවන වැඩසටහන | 10,838 |
| සියක් නගර /නාගරික යටිතල පහසුකම් හා නගර සංවර්ධනය වැඩසටහන | 776 |
| ගැටුම් වලින් පීඩනයට පත් වූ පවුල් සඳහා ස්ථිර නිවාස / නැවත පදිංචි කිරීම | 2,088 |
| "සැමට නිවහන" නිවාස ව්‍යාපෘතිය (ඔබට ගෙයක් රටට හෙටක්) | 2,041 |
| අඩු අදායම්ලාභීන් සඳහා නිවාස ඒකක 2,000ක් ඉදිකිරීම (චීන අධාර) | 2,934 |
| උපාය මාර්ගික නගර සංවර්ධනය - යාපනය (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 53 |
| මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 1,895 |
| උපාය මාර්ගික නගර සංවර්ධනය - අනුරාධපුර (ශ්‍රී ලංකා රජය/ප්‍රංශ සං. නියෝජිතායතනය) | 303 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### පානීය ජලය සහ සනීපාරක්ෂාව

2024 වර්ෂයේ ජලසම්පාදන අංශය සඳහා රජය විසින් කරන ලද මුළු වියදම රු. බිලියන 31.4 කි. එයින් රු. මිලියන 619 ක් පුනරාවර්තන වියදම් ලෙස වැය කර ඇති අතර රු. බිලියන 30.8 ක් ප්‍රාග්ධන වියදම් ලෙස වැය කර ඇත. මහ කොළඹ ජලය සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘති අදියර 2 & 3, ජල සැපයුම හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය හා යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතියද ඇතුලත් ව්‍යාපෘතිවල ප්‍රධාන වැඩ කොටස් අවසන් වීම හේතුවෙන් 2023 වර්ෂයේ රු. බිලියන 47.8 ක් වූ මුළු වියදමට සාපේක්ෂව 2024 වර්ෂයේ මුළු වියදම සියයට 34 න් අඩු වීමකි.

**වගුව 5.26 | 2024 දී දියත් කරන ලද ප්‍රධාන ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති**

රු. මිලියන

| විස්තරය | 2024 වියදම |
|---|---|
| නුවර උතුර සහ පාතදුම්බර ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/චීනය) | |
| ධාරිතා වැඩිදියුණු කිරීම් සහ බෙදාහැරීම් පුළුල් කිරීම ව්‍යාපෘතිය | 4,497 |
| මහ කොළඹ ජලය සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 1,2,3 (ශ්‍රී ලංකා රජය/ආසියානු සංවර්ධන බැංකුව) | 3,664 |
| ජල සැපයුම හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | |
| යාපනය,කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ආසියානු සංවර්ධන බැංකුව) | 6,685 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1 & 2 (ශ්‍රී ලංකා රජය/ජපානය) | 635 |
| අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම සහ බල ශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ප්‍රංශය) | 1,387 |
| රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය(ශ්‍රී ලංකා රජය/ කොරියාව) | 1,532 |
| ප්‍රජා ජල අභිමන් ජල සැපයුම් යෝජනා ක්‍රමය | 663 |
| අන්තර් පළාත් ව්‍යාපෘති/වැඩසටහන | 192 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## 5.9.7 පරිසරය

පරිසර ආරක්ෂණය සඳහා රජය විසින් සැලකිය යුතු වැදගත්කමක් ලබා දී ඇත. 2024 වසරේ දී, අත්‍යාවශ්‍ය පාරිසරික ගැටළු විසඳීමට සහ විවිධ පාරිසරික වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 286 ක් වැය කර ඇත. විශේෂයෙන්, වනාන්තර හා වනජීවී සංරක්ෂණය මෙන්ම සත්ත්වෝද්‍යාන සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

### වන සංරක්ෂණය

රජය විසින් වන සංරක්ෂණය හා වන ආවරණය පුළුල් කිරීම සඳහා රු. මිලියන 633 ක් වැය කර ඇත. ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීම සඳහා ප්‍රතිස්ථාපිත වනාන්තර ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම, වාණිජ වන වගා සහ කෘෂි වන වගා ප්‍රවර්ධනය කිරීම, ගෙවතු වගාව සංවර්ධනය, කඩොලාන සංරක්ෂණය, පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සහ ලැව් ගිනි වැළැක්වීම වැනි වන ආරක්ෂණ ප්‍රයත්නයන් දැරීම එහි ඇතුළත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

### වනජීවී සංරක්ෂණය

වනජීවී සංරක්ෂණය යටතේ අලි මිනිස් ගැටුම අවම කිරීමට ප්‍රමුඛත්වය ලබාදුන් අතර ඒ සඳහා. 2024 වසරේදී රු. මිලියන 326 ක් වැය කර ඇත. තවද, රු. මිලියන 124 ක් විදුලි වැට ඉදිකිරීම සඳහා වෙන් කර ඇති අතර, වනජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය සඳහා රු. මිලියන 77 ක් වැය කර ඇත. ඊට අමතරව රු. මිලියන 20 ක් ජාතික වනෝද්‍යානයන්හි මාර්ග පද්ධති වැඩිදියුණු කිරීමට යොදවා ඇති අතර, සත්ත්වෝද්‍යාන සංවර්ධනය හා නවීකරණය සඳහා රු. මිලියන 80 ක් වැය කරන ලදී.

**විශේෂ සටහන 5.3 | ආයතනිකකරණ ඇගයීම: සංවර්ධන කාර්යක්ෂමතාව කරා පරිවර්තනයක්**

සංවර්ධන මාර්ග ශක්තිමත් කිරීම අරමුණු කරගත් රටවල් සඳහා ඇගයීම ඉතා වැදගත් උපායමාර්ගික මෙවලමක් ලෙස මතු වේ. එය, වගවීම, විනිවිදභාවය සහ ප්‍රතිඵල දිශානතිය වැනි යහපාලන මූලධර්ම කොතරම් දුරට සපුරා ඇත්දැයි තක්සේරු කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. නිරන්තර අභියෝග හඳුනා ගැනීම, විවිධ මැදිහත්වීම්වල ඵලදායීතාවය තීරණය කිරීම සහ අනාගතයේ ලබන ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තීරණ දැනුම් දීම ආදී වශයෙන් ඇගයීම, තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. පුද්ගලයන් හෝ ආයතනවල වැරදි පෙන්වාදීමේ ක්‍රියාවලියක් වීමට වඩා ඇගයීමක් තුලින් මූලික වශයෙන් සාක්ෂි මත පදනම් වූ අවබෝධයක් බිහි කරයි. එය සාර්ථකත්වයන් සහ අඩුපාඩු යන දෙකම අනාවරණය කර ගැනීමට නිර්මාණය කර ඇති අතර, රාජ්‍ය ආයෝජන චක්‍රය සඳහා භාවිතා කළ හැකි ඉතා වටිනා පාඩම් ඉදිරිපත් කරයි.

මෙම සන්දර්භය තුළ, 2023 වර්ෂයේ දී රජය විසින් සිය ආයතනික ක්‍රියාවලීන් තුළට ඇගයීම් කාර්යය විධිමත් ලෙස ඒකාබද්ධ කිරීමෙන් ප්‍රධාන පියවරක් ගනු ලැබීය. මෙම පියවර රාජ්‍ය ආයෝජනවල කාර්යක්ෂමතාව සහ බලපෑම වැඩි දියුණු කිරීම අරමුණු කරගත් පරිවර්තනීය වෙනසක් නියෝජනය කරයි. පවතින ප්‍රතිපත්ති ඒවායේ ප්‍රකාශිත අරමුණු සමඟ අනුකූලව පවතින්නේද සහ ඒවා ජාතියේ සංවර්ධන න්‍යාය පත්‍රයට ඵලදායී ලෙස කටයුතු කරන්නේද යන්න ක්‍රමානුකූලව පරීක්ෂා කිරීම සඳහා ඇගයීම් වටිනා මෙවලමක් ලෙස සේවය කරයි. ගැඹුරු විශ්ලේෂණයක් හරහා, ඇගයීම් මඟින් පෙළගැස්ම දුර්වල වූ හෝ තොරතුරු නොමැති ක්ෂේත්‍ර හඳුනාගත හැකි අතර, එමඟින් ප්‍රතිසංස්කරණන් සඳහා ක්‍රියාකාරී අවබෝධයක් ලබා දෙයි. තවද, රාජ්‍ය අරමුදල් කළමනාකරණයේ විනිවිදභාවය සහ වගවීම සම්බන්ධ අභියෝග, නව සංවර්ධන මූලපිරීම් සැලසුම් කිරීම සහ සැලසුම් කිරීම සඳහා අතීත අත්දැකීම් තුලින් ඉගෙන ගත් පාඩම් ප්‍රමාණවත් ලෙස ඒකාබද්ධ නොකිරීම සහ ක්‍රමානුකූල හා ආයතනික ඇගයීම් පිළිවෙත් නොමැතිකම හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ සුමට හා කාර්යක්ෂමව ලබා දීම සහතික කිරීමට නොහැකි වී ඇත. අඛණ්ඩ අධීක්ෂණය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා රාජ්‍ය අංශ කළමනාකරණයේ අනිවාර්ය අංගයක් ලෙස ඇගයීම ආයතනිකකරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම ඉතා වැදගත් වේ.

**විශේෂ සටහන 5.3 | ආයතනිකකරණ ඇගයීම: සංවර්ධන කාර්යක්ෂමතාව කරා පරිවර්තනයක් සම්බන්ධිතයි...**

**ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය**

ඉහත දක්වා ඇති ගැටළු විසඳීමටත්, සංවර්ධන මූලපිරීම්වල අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමටත් සහ ශ්‍රී ලංකාව තුළ ඇගයීම් සංස්කෘතියක් ඇති කිරීමත් සඳහා රජය විසින් පුළුල් ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් (NEP) සහ ඊට අනුරූප ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුවක් (NEPIF) හඳුන්වා දී ඇත. මෙම ඇගයීම් ප්‍රතිපත්ති රාමුව මගින් රජයේ පරිපාලන ව්‍යුහය තුල ක්‍රමානුකූලව ඇගයීම ඒකාබද්ධ කිරීමට අදහස් කරන අතර, එය රාජ්‍ය අංශයේ පාලනයේ සහ තීරණ ගැනීමේ මූලික අංගයක් බවට පත් කරයි.

ජාතික ඇගයීම් ලේකම් කාර්යාලය ලෙස, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ඇගයීම් ප්‍රමිතීන් සහ භාවිතයන් ආරක්ෂා කිරීම සඳහා ආයතනික රාමු සම්බන්ධීකරණය කිරීම සහ සහාය දීම සඳහා කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරයි. මෙම කාර්යභාරයට අනුකූලව, දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා පුහුණු සහ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන් මාලාවක් සාර්ථකව දියත් කරන ලද අතර, එමඟින් මධ්‍යම මට්ටමේ රාජ්‍ය නිලධාරීන් 702 දෙනෙකුගේ ඇගයීම් සාක්ෂරතාවය සහ තාක්ෂණික කුසලතා වැඩි දියුණු කරන ලදී. මීට අමතරව, රාජ්‍ය අංශය තුළ ඇගයීම් ධාරිතාව තවදුරටත් ගොඩනැගීම සඳහා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් 147 දෙනෙකු සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහනක් ද පවත්වන ලදී.

ආයතනික ක්‍රියාවලිය විධිමත් කිරීම සහ වගවීම සහතික කිරීම වෙනුවෙන්, "ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතනවල කාර්යභාරයන් සහ වගකීම්" යන මැයෙන් අංක 01/2024 දරන ඇගයීම් චක්‍රලේඛය හරහා සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත සවිස්තරාත්මක මග පෙන්වීමක් නිකුත් කර ඇත. මෙම චක්‍රලේඛය ප්‍රමුඛතා ඇගයීම් හඳුනා ගැනීම, ඇගයීම් න්‍යාය පත්‍ර සැකසීම සහ යෝජිත මූලපිරීම් සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටි ගෙනහැර දක්වයි.

2024 වර්ෂයේ දී සිදුකළ ඇගයීම් යෝජනා කැඳවීමට අනුව, රේඛීය අමාත්‍යාංශ දහතුනක් සහ පළාත් සභා හයක් විසින් 2025 දී ක්‍රියාත්මක කිරීම සඳහා ඇගයීම් යෝජනා 23 ක් ඉදිරිපත් කරන ලදී. මෙම ඇගයීම් යෝජනා, ඇගයීම් සම්බන්ධයෙන් සහ රාජ්‍ය අංශයේ සැලසුම්කරණය පිළිබඳ විශේෂඥතාවක් ඇති නිලධාරීන්ගෙන් සමන්විත ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව විසින් සමාලෝචනය කර තක්සේරු කරන ලදී.

එලෙස පුළුල් ඇගයීම් ක්‍රියාවලියකින් පසුව, පළාත් සභාවන්ගෙන් ඉදිරිපත් කළ යෝජනා තුනක් ඇතුළුව ව්‍යාපෘති යෝජනා 14 ක් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලදී. මේ අතරින්, ආසියානු සංවර්ධන බැංකුව (ADB) ව්‍යාපෘති තුනක් සඳහා අරමුදල් ප්‍රදාන සැපයීමට එකඟ වී ඇත. පළාත් සභා යෝජනා තුනෙහි ඇගයීම් අදාළ පළාත් සභා විසින්ම සිදු කරනු ලබන අතර, ඒ සඳහා විශේෂයෙන් වෙන් කර ඇති අරමුදල් භාවිතා කරයි. ඉතිරි ඇගයීම් යෝජනා අට ක්‍රියාත්මක කිරීම සඳහා, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්ෂික අයවැය ප්‍රතිපාදන හරහා මූල්‍ය සහාය ලබා දී ඇත. ජාතික මෙහෙයුම් කමිටුවේ තීරණය අනුව, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව රජයෙන් අරමුදල් සපයන ඇගයීම් අටෙන් දෙකක් සහ ආසියානු සංවර්ධන බැංකුව සහාය දක්වන ව්‍යාපෘතිවලින් එකක් සෘජුවම ක්‍රියාත්මක කරයි.

ආයතනික ධාරිතාවය ගොඩනැගීම සහ තෝරාගත් ඇගයීම් 14 ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇගයීම් කටයුතුවලට සම්බන්ධ රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා නිලධාරීන් 49 දෙනෙකු සඳහා "ඇගයීම් කළමනාකරණය" යන මාතෘකාව යටතේ දින දෙකක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ඇගයීම් විශේෂඥයින්ගේ සැලකිය යුතු දායකත්වයක් සහිතව එම පුහුණුව ලබා දුන් අතර තෝරාගත් සියලුම ආයතන හරහා සාර්ථක කළමනාකරණය සහ ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම අරමුණු කර ගන්නා ලදී.

මේ අතර, අඛණ්ඩ ඇගයීම් ක්‍රියාවලියේ කොටසක් ලෙස, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2026 දී ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභාවලින් නව ඇගයීම් යෝජනා කැඳවීම ආරම්භ කර ඇත. මේ දක්වා, සලකා බැලීම සඳහා යෝජනා 08 ක් ලැබී ඇත.

ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව (NEPIF) දියත් කිරීමෙන් පසුව, 2023 දී ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නියමු ඇගයීම් දෙකක් සිදු කරන ලදී. මේ සඳහා "කෑගල්ල දිස්ත්‍රික්කයේ නායයෑම්වලින් පීඩාවට පත් පවුල් සඳහා සහ ඉහළ අවදානම් සහිත ප්‍රදේශවල පදිංචිකරුවන් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය" සහ "පළාත් පාලන රජයේ වැඩිදියුණු කිරීමේ අංශ ව්‍යාපෘතිය" යන දෙකම ඇතුළත් විය. 2024 වර්ෂයේදී, දකුණු පළාත් සභාව මගින් කළ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින්, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දේශීය අරමුදල් උපයෝගී කරගනිමින් "දක්ෂිණ පෝෂණ සුරක්ෂා වැඩසටහන" සඳහා ඇගයීමක් ද සිදු කරන ලදී. මීට අමතරව, 2022 වර්ෂයේදී ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද "වී ගොවීන් සඳහා පොහොර බෙදා හැරීමේ වැඩසටහන" සඳහා සිදු කළ ඇගයීම් ක්‍රියාවලියේ කොටසක් ලෙස ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෑතකදී ක්ෂේත්‍ර සමීක්ෂණයකට සහභාගී විය.

# 06

# මූල්‍ය ප්‍රවාහ කළමනාකරණය, අයවැය හිඟය මූල්‍යනය හා රාජ්‍ය ණය

## 6.1 සමාලෝචනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද දැඩි ආදායම් පාදක මූල්‍ය ප්‍රතිසංස්කරණ හේතුවෙන් භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය මුදල් හිඟයකින් මුදල් ස්වාරක්ශකයක් බවට සැලකිය යුතු ලෙස පරිවර්තනය වී ඇත. වැඩි වූ ආදායමේ සහ පුනරාවර්තන වියදම් පාලනය කිරීමේ ඒකාබද්ධ බලපෑමත් සමඟ මුදල් ගලා ඒම් වැඩිදියුණු විය.

2023 සැප්තැම්බර් මාසයේදී නව මහ බැංකු පනත ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද මුදල් මූල්‍යකරණය අත්හිටුවීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළට ඇති විය හැකි පොලී අනුපාත අවදානම් සහ අනෙකුත් බලපෑම් අවම කිරීම සඳහා, රු. බිලියන 79 ක වෙළෙඳපොළ ණය ගැනීම් හරහා නිර්මාණය කරන ලද මුදල් ස්වාරක්ෂකය ඇතුළුව රු. බිලියන 599.5 ක ධනාත්මක මුදල් ශේෂයකින් 2024 මූල්‍ය වර්ෂය ආරම්භ විය. මුදල් ප්‍රවාහ කාර්ය සාධනය මඟින් වසර තුළ රු. බිලියන 3,852.5 ක මුළු මුදල් ගලා ඒමක් පෙන්නුම් කරන අතර එම කාල සීමාව සඳහා පිටතට ගලා යාම රු. බිලියන 5,966.5 කි. රු. බිලියන 2,102.8 ක සමස්ත හිඟය ප්‍රධාන වශයෙන් දේශීය ණය ගැනීමේ ප්‍රභවයන් හරහා මූල්‍යකරණය කරන ලදී. වසර තුළ ආදායම් කාර්යසාධනය වැඩිදියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොළ ණය ගැනීම් හරහා ජනනය කරන ලද මුදල් ස්වාරක්ශකය හරහා ණය සේවා ගෙවීම් සඳහා මූල්‍යකරණය කිරීමට භාවිතා කරන ලද රු. බිලියන 79 ට අමතරව, භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයෙන් ණය සේවා ගෙවීම් සඳහා රු. බිලියන 381 ක් ලබා දෙන ලදී.

## 6.2 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය

රජයේ වියදම් සුමටව සහ අනුමත අයවැයට අනුකූලව මූල්‍යකරණය කිරීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රියාවලියට මූල්‍ය වර්ෂය පුරා ප්‍රශස්ත ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගැනීම සඳහා මුදල් ගලා ඒම් සහ පිටතට ගලායාමේ කාලය සහ ප්‍රමාණය පුරෝකථනය වැදගත් වේ. භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය මඟින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය, ආදායම් එකතු කිරීම්, ණය ගැනීම් සහ වියදම් බැඳීම් සමඟ අනෙකුත් ගලා ඒම් පෙළගස්වන ප්‍රායෝගික මුදල් ප්‍රවාහ සැලැස්මක් බවට පරිවර්තනය කරනු ලැබේ. මුදල් ගලා ඒම් ප්‍රධාන වශයෙන් බදු ආදායම්, ප්‍රදාන සහ ණය ගැනීම් වැනි විවිධ ප්‍රභවයන්ගෙන් ලැබෙන අතර, පිටතට ගලායාමට මෙහෙයුම් වියදම්, වැටුප්, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, ණය සේවාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි ප්‍රාග්ධන ව්‍යාපෘති ඇතුළත් වේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, පසුගිය දත්ත, වත්මන් ආදායම් ප්‍රවණතා සහ අපේක්ෂිත අනාගත ගලා ඒම් මත පදනම්ව සවිස්තරාත්මක මුදල් ප්‍රවාහ පුරෝකථනයන් භාණ්ඩාගාර නිලධාරීන් සකස් කරයි. එමඟින් නියමිත කාලපරිච්ඡේදයට අදාලව අතිරික්තයක් ද හිඟයක්ද යන්න පුරෝකථනය කිරීමට ඔවුනට ඉඩ සලසයි. සැබෑ මුදල් විචලනයන් තත්‍ය කාලීනව නිරීක්ෂණය කිරීම මඟින්, වියදම් සැලසුම් හෝ ණය ගැනීමේ උපාය මාර්ග කාලෝචිත ලෙස සකස් කිරීමට හැකිවන අතර එමඟින් මුදල් හිඟය හෝ අක්‍රිය අතිරික්ත අරමුදල් වළක්වා ගැනීමට උපකාරී වේ. වැටුප්, ණය ගෙවීම් සහ අත්‍යවශ්‍ය සේවා වැනි තීරණාත්මක බැඳීම් පළමුව සපුරා ගැනීම සහතික කරමින් ගෙවීම් ප්‍රමුඛතාකරණය ඉතා වැදගත්ය. ප්‍රමාණවත් ද්‍රවශීලතා සංචිත පවත්වා ගැනීම මඟින් අනපේක්ෂිත මූල්‍ය අවශ්‍යතා හෝ ආදායම් හිඟයන්ට එරෙහිව ස්වාරක්ෂකයක් සපයයි. ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ ව්‍යාපෘති කාලසටහන් සමඟ බෙදාහැරීම් පෙළගැස්වීම සහතික කිරීම සඳහා රජයේ ආයතන හරහා සම්බන්ධීකරණයක් තිබීම වැදගත් වේ. ඊට අමතරව භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය මඟින් අධික වියදම් පාලනය සහ විනිවිදභාවය සහතික කිරීමට මූල්‍ය රෙගුලාසි සහ මූල්‍ය විනය සමඟ දැඩි ලෙස අනුකූල වීම සිදුවේ. මුදල් ප්‍රවාහය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මඟින්, භාණ්ඩාගාරය රජයේ මූල්‍ය ස්ථාවරත්වයට සහාය වීම, මූල්‍ය වගවීම වැඩි දියුණු කිරීම සහ වසර පුරා රාජ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කරයි.

2022 අප්‍රේල් මැද භාගයේ සිට ක්‍රියාත්මක වන ඇතැම් ණය සේවා බැඳීම් උපායමාර්ගිකව අත්හිටුවීම මඟින් ණය සේවාකරණය, මුදල් ප්‍රවාහ තිරසාරභාවය කෙරෙහි ඇති කරන බලපෑම අවම කර ඇති අතර එමඟින් භාණ්ඩාගාරයේ ද්‍රවශීලතා තත්ත්වය වැඩිදියුණු කර ඇත. විශේෂයෙන් භාණ්ඩාගාර බිල්පත් අංශය තුළ පොලී අනුපාතවල අඛණ්ඩ පහළ යාමත් සමඟ වඩාත් හිතකර මූල්‍යකරණ පරිසරයක් නිර්මාණය කිරීමට දායක වී තිබීමය. කෙසේ වෙතත් කෙටිකාලීන පොලී අනුපාතවල පහත වැටීමක් තිබියදීත්, රජයේ පොලී වියදම් ආසන්න වශයෙන් සියයට 3 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ සැලකිය යුතු ණය ආශ්‍රිත ගෙවීම් ඇතුළත් වූ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ ප්‍රතිව්‍යුහගත කිරීම හා සම්බන්ධ අසාමාන්‍ය මුදල් ගලා යාමයි. එමඟින් සැලකිය යුතු ණය ආශ්‍රිත ගෙවීම් සිදු වූ අතර, ප්‍රතිව්‍යුහගත කිරීමේ පිරිවැය සහ මුදල් උච්චාවචනයන් හේතුවෙන් ගෙවීම්වලට බලපා ඇති ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය සේවාකරණය ද අන්තර්ගත විය.

සාරාංශයක් ලෙස, 2024 මූල්‍ය අගයන් විශ්ලේෂණය කිරීමේදී සංකීර්ණ සාර්ව ආර්ථික පරිසරයක් මධ්‍යයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා ආදායම් උත්පාදනය, වියදම් පාලනය සහ උපායමාර්ගික ණය කළමනාකරණ මුලපිරීම් අතර තිරසාර සම්බන්ධතාවක් පවත්වාගන්නා ලදී.

2024 වසර අවසන් වන විට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයට සැලකිය යුතු සහනයක් ලබා දුන් අතර එමඟින් අමතර මූල්‍ය අවකාශය නිදහස් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පුළුල් ආර්ථික ස්ථාවරත්වය සහ සංවර්ධන අරමුණු සඳහා සහාය වෙමින් අත්‍යවශ්‍ය පොදු භාණ්ඩ හා සේවා සඳහා වන වියදම් වැඩි කිරීමට රජය වඩා හොඳින් ස්ථානගත විය.

මූල්‍ය වර්ෂය තුල, රජය ප්‍රධාන වශයෙන් මූල්‍ය හිඟය අවම කිරීම සඳහා උපායමාර්ගික දේශීය ණය ගැනීම් සහ සූක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණ මූලපිරීම් ඒකාබද්ධ කරන ලද ඒකාබද්ධ ප්‍රවේශයක් භාවිතා කරන ලදී. සමස්ත ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 2,102.8 ක් ලෙස වාර්තා වූ අතර, භාණ්ඩාගාර කළමනාකරණ රාමු තුළ ක්‍රියාත්මක කරන ලද මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ද්‍රවශීලතා ප්‍රශස්තිකරණ පියවර හරහා රු. බිලියන 381 ක් ජනනය කල අතර ඉතිරි

මූල්‍ය අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් විවිධාංගීකරණය වූ ණයගැනීමේ උපකරණ මඟින් සපුරා ගන්නා ලද අතර එය මූලික වශයෙන් පරිණත දේශීය ණය සුරැකුම්පත් නැවත නිකුත් කිරීම සහ ආපසු හැරවීම් මඟින් සිදුවිය.

මෙම ණය සේවාකරණ උපාය මාර්ගයට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වැනි රජයේ සුරැකුම්පත් ක්‍රමානුකූලව ප්‍රාග්ධන වෙළෙඳපොළට නැවත නිකුත් කිරීම ඇතුළත් වූ අතර, කල්පිරීමේදී නියමිත ආපසු ගෙවීම සහ පොලී ඵලදායී ලෙස ගෙවීම ඇතුළත් විය. එවැනි ප්‍රවේශයක් අඛණ්ඩ ද්‍රවශීලතා ප්‍රවාහයන් සහතික කිරීම පමණක් නොව, උච්චාවචනය වන පොලී අනුපාත සහ වෙළෙඳපොළ තත්ත්වයන් හා සම්බන්ධ ප්‍රතිමූල්‍යකරණ අවදානම් කළමනාකරණය කිරීමට ද පහසුකම් සැලසීය. රජයේ සුරැකුම්පත් ක්‍රමානුකූලව ප්‍රාග්ධන වෙළෙඳපොළට නැවත නිකුත් කිරීම, පවතින වෙළෙඳපොළ ඵලදාව සහ ආයෝජකයින්ගේ රුචිකත්වයට අනුකූල වන පරිදි, නැවත නිකුත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රවේශමෙන් පෙළගස්වන ලද අතර, එමඟින් ආපසු හැරීමේ අවදානම අවමකර ණය සේවාකරණ පිරිවැය ස්ථාවර කරන ලදී.

තවද, මෙම ණය ගැනීමේ ක්‍රමවේදය, ප්‍රධාන වශයෙන් මූල්‍යකරණ උපකරණ මත රඳා පැවතුනු අතර ණය නිරසාරභාවය පිළිබඳ පුළුල් රාමුව තුළ වෙළෙඳපොළ පදනම් කරගත් ආයෝජක විශ්වාසය සහ වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් පවත්වා ගැනීම සිදු කරනු ලැබීය. ණය ආපසු ගෙවීමේ සහ නැවත නිකුත් කිරීමේ යාන්ත්‍රණයන්හි උපායමාර්ගික භාවිතය හා උච්චාවචනය වන පොලී අනුපාත ආයෝජකයන්ගේ හැඟීම් වර්ධනය වීම මඟින් පරිණාමය වන සාර්ව ආර්ථික සීමාවන් තුළ, කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා එම කාලපරාසය තුල රජය කැපවූ අතර ස්ථීර ප්‍රවේශය අඛණ්ඩ සාර්ව ආර්ථික ගැලපීම් මධ්‍යයේ ණය ව්‍යුහය කල් පිරෙන විවිධ කාල සීමා අනුව ප්‍රශස්ත කිරීම සහ අඛණ්ඩ සාර්ව ආර්ථික ගැලපීම් මධ්‍යයේ ප්‍රතිමූල්‍යකරණ පිරිවැය අවම කිරීම අරමුණු කරගත් නවීන මූල්‍ය කළමනාකරණය සිදුකරන ලදී. දේශීය මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ යන දෙකෙහිම ද්‍රවශීලතා

**වගුව 6.1| භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ ක්‍රියාකාරිත්වය - 2024**

රු. බිලියන

| අයිතමය | 2022 | 2023 | 2024 | |
|---|---|---|---|---|
| | තත්‍ය | තත්‍ය | සංශෝධිත ඇස්තමේන්තු | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය (ජනවාරි 1 දිනට) | -831.6 | -84.2 | 599.5 | 599.6 |
| **ආදායම සහ අනෙකුත් ලැබීම් වශයෙන්** | **1,876.8** | **3,114.3** | **4,120.3** | **3,852.6** |
| බදු ආදායම් | 1,701.9 | 2,661.2 | 3,820.0 | 3,645.2 |
| බදු නොවන ආදායම් | 174.7 | 452.16 | 266.1 | 204.0 |
| ප්‍රදාන | 0.2 | 0.9 | 34.2 | 3.3 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ගලා යෑම්** | **-3,220.4** | **-4,397.1** | **-5,082.3** | **-4,835.0** |
| පුද්ගල පඩිනඩි | -1,081.7 | -1,064.5 | -1,300.2 | -1,219.5 |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | -290.4 | -364.4 | -402.2 | -393.9 |
| සමෘද්ධි සහනාධාර | -84.6 | -145.0 | -205.0 | -147.1 |
| පොහොර සහනාධාර | -46.7 | -34.2 | -36.1 | -37.9 |
| වෙනත් | -350.8 | -523.2 | -753.7 | -701.2 |
| පොළී ගෙවීම් | -1,366.2 | -2,265.8 | -2,385.2 | -2,335.3 |
| **ප්‍රාග්ධන කටයුතු සඳහා මුදල් ගලායාම්** | **-1,013.0** | **-1,762.8** | **-1,780.7** | **-1,131.6** |
| ප්‍රාග්ධන කටයුතු | -1,000.9 | -881.4 | -1,399.4 | -810.4 |
| ප්‍රදාන | -3.5 | -865.6 | -61.6 | -6.4 |
| රාජ්‍ය නිලධාරීන් සඳහා අත්තිකාරම් ගෙවීම් | -8.6 | -5.5 | -18.3 | -13.4 |
| ව්‍යාපෘති ගෙවීම් | | -10.3 | -301.5 | -301.5 |
| **ශුද්ධ මුදල් අතිරික්තය/(හිඟය)** | **-2,356.6** | **-2,164.2** | **-2,742.7** | **-2,114.1** |
| **පාරිභෝජනය කරන ලද දළ ණය ගැනීම්** | **4,410.5** | **8,136.9** | **3,692.9** | **3,680.7** |
| **ණය ආපසු ගෙවීම්** | **-1,449.2** | **-5,330.8** | **-1,263.8** | **-1,435.2** |
| **පාරිභෝජනය කරන ශුද්ධ ණය ගැනීම්** | **2,961.3** | **2,806.0** | **2,429.1** | **2,245.5** |
| **පසුගිය වසරේ ස්වෛරීත්ව බැඳුම්කර /විදේශ ව්‍යවහාර කාලීන මූල්‍ය පහසුකම් ශේෂය** | **4.6** | **–** | **–** | **-** |
| තාවකාලික ශේෂ ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ ශුද්ධ තැන්පතු යනාදිය)) | 138.1 | 41.9 | – | 74.2 |
| **අවසාන මුදල් ශේෂය ( දෙසැම්බර් 31 දිනට)** | **-84.2** | **599.5** | **285.9** | **805.1** |

මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

සීමාවන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ පවතින වෙළෙඳපොළ පොලී අනුපාතවල ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා, කල් පිරෙන ණය බැඳීම්වලින් උපායමාර්ගික කොටසක් මුදල් මූල්‍යකරණය හරහා පියවන ලදී. මෙම ප්‍රවේශය මඟින් මූල්‍ය පද්ධතියට සෘජුවම ද්‍රවශීලතාවය එකතු කිරීමෙන් කෙටි කාලීන සහනයක් ලබා දුන් අතර එමඟින් වෙළෙඳපොළ අනුපාත මත බලපෑම අවම කර හදිසි විචලනවලින් තොරව ණය සේවාකරණය අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරන ලදී.

කෙසේවෙතත්, මුදල් මූල්‍යකරණය මත යැපීම හා සම්බන්ධ ආවේනික අවදානම් හඳුනාගැනීම, විශේෂයෙන් ඉහළ පොලී අනුපාත අස්ථාවරත්වය හා ද්‍රවශීලතා අවදානම් සඳහා ඇති හැකියාව, එවැනි ආධාර හදිසියේ නැවැත්වීම නිසා මෙම අවදානම් ක්‍රියාකාරී ලෙස අවම කර ඇත. මෙය සාක්ෂාත් කරගනු ලැබුවේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ මෙහෙයුම් වලින් උපයන ආදායම විචක්ෂණ ලෙස භාවිත කිරීම හරහා වන අතර එය කම්පන අවශෝෂණය කරගැනීම හා මූල්‍ය උපකරණ මත යැපීම අඩුකිරීමට ස්වාරක්ෂයක් ලෙස ක්‍රියා කරන ලදී.

භාණ්ඩාගාර මුදල් අතිරික්තයන් උපයෝගී කර ගැනීම මඟින් කෙටි කාලීන ද්‍රවශීලතා කළමනාකරණය සහ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා අතර සමතුලිතතාවයක් පවත්වා ගනු ලැබූ අතර, එමඟින් උද්ධමන පීඩන අවධානම අවම කිරීම සහ තිරසාර ණය සේවාකරණ උපාය මාර්ග සහතික කිරීම අරමුණු කරන ලදී. මෙම ද්විත්ව ප්‍රවේශය මඟින් ක්ෂණික ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමට හැකිවූ අතර එමඟින් සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සිදුකරන ලදී.

2024 වසර අවසන් වන විට රාජ්‍ය බැංකු දෙකෙහි සැලකිය යුතු ධනාත්මක මුදල් ශේෂයක් රැස් කර ගැනීම සඳහා තිරසාර වියදම් කළමනාකරණය සමඟ වැඩිදියුණු වූ ආදායම් තත්වය උපයෝගී විය. මෙම ශක්තිමත් මුදල් තත්ත්වය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම හා වැඩිදියුණු කළ ආදායම් එකතුකිරීමේ උපායමාර්ග, සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වයට දායකවීම පිළිබිඹු කරයි.

තවද, භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයට විදේශ මුදල් ගලා ඒම ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම වැඩසටහන හරහා සිදු වූ අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව ඇතුළු විවිධ බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් විසින් ලබා දෙන ලද ණය පහසුකම් ද ඊට ඇතුළත් විය. මෙම බාහිර ගලා ඒම් වසර පුරා විදේශ මුදල් ණය සේවා බැඳීම් සපුරාලීම සඳහා උපායමාර්ගිකව වෙන් කරන ලද අතර එමඟින් විදේශ විනිමය සංචිත මත බලපෑම අඩු කර බාහිර ණය කළමනාකරණ අරමුණු වලට සහය විය.

මෙම විදේශ ගලා ඒම් විචක්ෂණශීලීව යෙදවීම මඟින් අවධාරණය කරනුයේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා බහුපාර්ශ්වික සහයෝගීත්වය උපයෝගී කර ගනිමින් බාහිර මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම ට රජය දක්වන කැපවීමය. අඛණ්ඩ සාර්ව ආර්ථික ගැලපීම් මධ්‍යයේ වුවද, මෙම සම්බන්ධීකරණ ප්‍රවේශය මඟින් සමස්ත මූල්‍ය හා බාහිර අංශයේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීමට උපකාරී වී ඇත.

## 6.3 රජයේ ණය ගැනීමේ වැඩසටහන - 2024

2024 දී, පාර්ලිමේන්තුව විසින් රු. බිලියන 7,350 ක ණය ගැනීමේ සීමාවක් නියම කළ අතර, එය 2024 අංක 43 දරන විසර්ජන පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ බැංකු නැවත ප්‍රාග්ධනීකරණය සඳහා වන ප්‍රතිපාදන ඇතුළත් වේ. මෙම රාමුව යටතේ, වසර සඳහා රජයේ සැබෑ දළ ණය ගැනීම රු. බිලියන 3,627.8 දක්වා ළඟා වූ අතර එය අවසර ලත් සීමාව තුළ හොඳින් පවතී. ඊට අමතරව, මූල්‍ය අවශ්‍යතා සඳහා සහාය වීමට රජයේ මුදල් ප්‍රවාහ සංචිතවලින් රු. බිලියන 381 ක් ලබා ගන්නා ලදී.

ණය ගැනීම්වලින් වැඩි ප්‍රමාණයක් දේශීයව ලබා ගත් ඒවා වන අතර, රු. බිලියන 3,049.8 ක් නව දේශීය ණය මෙවලම් හරහා රැස් කරන ලදී. ඉතිරි රු. බිලියන 578 ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ණය ඇතුළු විදේශීය මූල්‍ය ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇත. මෙම ණය ගැනීමේ උපායමාර්ගය, මූල්‍ය විනය පවත්වා ගනිමින් ප්‍රමාණවත් අරමුදල් සැපයීම සහතික කරමින් රජයේ සමබර ප්‍රවේශය ඉස්මතු කරයි.

## 6.4 අයවැය මූල්‍යයනය

ආර්ථික වර්ගීකරණයට අනුව, 2024 වසරේ රු. බිලියන 2,040.0 ක සමස්ත අයවැය හිඟය රු. බිලියන 1,706.7 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.7 ක් වූ ශුද්ධ දේශීය මූලාශ්‍ර හරහා මූල්‍යයනය කරන ලද අතර රු. බිලියන 333.2 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.1 ක් ශුද්ධ විදේශ මූලාශ්‍ර හරහා මූල්‍යයනය කරන ලදී. ශුද්ධ දේශීය මූල්‍යයනය 2023 වසරේ දී වූ රු. බිලියන 1,787.6 ට සාපේක්ෂව සියයට 4.5 කින් අඩු වූ අතර ශුද්ධ විදේශ මූල්‍යයනය 2023 වසරේ දී වූ රු. බිලියන 494.7 ට සාපේක්ෂව සියයට 32.6 කින් අඩු විය.

### විදේශ මූල්‍යන එකඟතා

ශ්‍රී ලංකා රජය විසින් 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ විදේශ මූල්‍යන එකඟතා ගිවිසුම් 19ක් මඟින් ඇ.ඩො. මිලියන 1,211.4 ක එකඟතා ඇතිකරගෙන ඇති අතර, එයින් ඩොලර් මිලියන 1,154.7 ක් ණය වශයෙන් ලබාගෙන ඇත. මෙම ණය අතරින් ඇ.ඩො. මිලියන 593 ක් හා ඇ.ඩො. මිලියන 511 ක් ලෙස පිළිවෙළින් ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව මඟින් ලබා ගෙන ඇත.

ණය ගිවිසුම් වලට අමතරව, 2024 වර්ෂයේදී ජපානය, ඔස්ට්‍රේලියාව, නෙදර්ලන්තය හා යුරෝපා සංගමය යන විදේශ සංවර්ධන ප්‍රදායකයින් සමඟ නිල සංවර්ධන ප්‍රදාන එකඟතා ගිවිසුම් 9ක් මඟින් ඇ.ඩො. මිලියන 56.7 ක එකඟතා ඇති කරගෙන ඇත.

### වගුව 6.2 | විදේශ මූල්‍යන එකඟතා 2024, සංවර්ධන පාර්ශ්වකරු අනුව

ඇ.ඩො. මිලියන

| සංවර්ධන පාර්ශ්වකරු | | ණය | ප්‍රධාන | එකතුව |
|---|---|---|---|---|
| දිවිපාර්ශික | | - | 54.5 | 54.5 |
| | ඔස්ට්‍රේලියාව | - | 27.8 | 27.8 |
| | ජපානය | – | 20.9 | 20.9 |
| | නෙදර්ලන්තය | – | 5.8 | 5.8 |
| බහුපාර්ශ්වික | | 1,154.7 | 2.2 | 1,156.8 |
| | ආසියානු සංවර්ධන බැංකුව | 593.0 | | 593.0 |
| | ලෝක බැංකුව | 511.7 | – | 511.7 |
| | යුරෝපා සංගමය | – | 2.2 | 2.2 |
| | ඔපෙක් අරමුදල | 50.0 | – | 50.0 |
| එකතුව | | 1,154.7 | 56.7 | 1,211.4 |

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

විවිධ මුදල් ඒකකයන්වලින් කළ මූල්‍ය ගනුදෙනු, එක් එක් ගිවිසුම් දිනයේ පැවති දෛනික සම්මත විනිමය අනුපාත අනුව ඇ.ඩො. සහ ශ්‍රී ලංකා රුපියල් ලෙස පරිවර්තනය කර ඇත.

### වගුව 6.3 | 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යන එකඟතා , අයවැය මූල්‍යකරණය හා ප්‍රතිපත්ති ණය අදාල මූල්‍ය කොන්දේසි සමඟ

| සංවර්ධන පාර්ශවකරු /ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදාන | එකඟතා ගිවිසුම් අත්සන් කල දිනය (දින/මාස/වර්ෂය) | ව්‍යාපෘතිය /වැඩසටහන/හෝ ණය | මූල්‍යන එකඟතා (මිලියන ) | | | මූල්‍ය කොන්දේසි පොලිය | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කල විනිමය | රුපියල් | ඇ.ඩොලර් | වර්ගය | වාර්ෂික අනුපාතය (%) | මෙවැනි ගාස්තු | සහන කාලය (වසර) | පරිහරණ කාලය/උපයෝජන කාලය (ගිවිසුම් /ක දිනයේ) |
| ද්විපාර්ශ්වික | | | | | | | | | | | | |
| ඕස්ට්‍රේලියාව | ප්‍රදාන | 30/01/2024 | සංවර්ධනය සඳහා යහපාලනය | ඇ.ඩො. | 30.0 | 6,307.2 | 19.8 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 3 |
| ඕස්ට්‍රේලියාව | ප්‍රදාන | 30/01/2024 | වෙළඳපල සංවර්ධන පහසුකම් වැඩසටහනේ අදියර 2 | ඇ.ඩො. | 12.1 | 2,543.9 | 8.0 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 3 |
| ජපානය | ප්‍රදාන | 14/02/2024 | ශ්‍රී ලංකාවේ රෝහල්වල පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් විදුලිබල සැපයුම ස්ථාවර කිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,230.0 | 2,560.6 | 8.2 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 3 |
| ජපානය | ප්‍රදාන | 18/03/2024 | උතුරු පළාතේ ප්‍රධාන රෝහල්වල මාතෘ සහ ළමා සත්කාර සඳහා ආධාරක උපකරණ | ජපන් යෙන් | 404.0 | 827.2 | 2.7 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 3 |
| ජපානය | ප්‍රදාන | 18/03/2024 | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ තෙල් කාන්දු ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම. | ජපන් යෙන් | 1,000.0 | 2047.6 | 6.7 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 1 |
| ජපානය | ප්‍රදාන | 18/03/2024 | උතුරු සහ නැගෙනහිර පළාත්වල ධීවරයින්ගේ ආරක්ෂාව සඳහා ආධාරක උපකරණ | ජපන් යෙන් | 200.0 | 409.5 | 1.3 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 3 |
| ජපානය | ප්‍රදාන | 19/07/2024 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය | ජපන් යෙන් | 304.0 | 587.1 | 1.9 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 7 |
| නෙදර්ලන්තය | ප්‍රදාන | 14/03/2024 | නෙදර්ලන්තයේ මූල්‍ය ආධාර යටතේ ග්‍රාමීය පාලම් ඉදිකිරීම (වැඩිදියුණු කිරීම) | යුරෝ | 5.3 | 1787.0 | 5.8 | අදාළ නොවේ | | | අදාළ නොවේ | 7 |

**වගුව 6.3 | 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ඇතිකර ගත් විදේශ මුල්‍යන එකඟතා , අයවැය මූල්‍යකරණය හා ප්‍රතිපත්ති ණය අදාල මූල්‍ය කොන්දේසි සමඟ**

| සංවර්ධන භාර්යාවකරු /ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදාන | එකඟතා ගිවිසුම් අත්සන් කල දිනය (දින/මාසය/වර්ෂය) | ව්‍යාපෘතිය /වැඩසටහන/හෝ ණය | මුල්‍යන එකඟතා (මිලියන ) | | | මූල්‍ය කොන්දේසි පොලිය | | වෙනත් කොන්දේසි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කල විනිමය | රුපියල් | ඇ.ඩො. | වර්ගය | වාර්ෂික අනුපාතය (%) | වෙනත් ගාස්තු | සහන කාලය (වසර) | පරිනත කාලය/උපයෝජන කාලය (ගිවිසුම් /ක දිනයේ) |
| **බහුපාර්ශ්වික** | | | | | | | | | | | | |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **ණය** | 2024-05-08 | **විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ වැඩසටහන (උප වැඩසටහන 1)** | ඇ.ඩො. | 100.0 | 30,208.9 | 100.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| ආසියානු සංවර්ධන බැංකුව | **ණය** | 27/11/2024 | **මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ - උප වැඩසටහන 2** | ඇ.ඩො | 200.0 | 58,229.4 | 200.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| යුරෝපා සංගමය | **ප්‍රදාන** | 2024-12-08 | **සමාජ සහජීවනය සහ සාමය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම (SCOPE)** | යුරෝ | 2.0 | 656.2 | 2.2 | අදාළ නොවේ | | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | 5 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | **ණය** | 31/01/2024 | මූල්‍ය අංශයේ ආරක්ෂක ජාල ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | SDR වි.ගැ.හි | 112.8 | 47,614.7 | 150.0 | ස්ථාවර | 1.25 | | පොරොන්දු ගාස්තු **0.5%** සේවා ගාස්තු **0.75%** | 5 | 30 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | **ණය** | 2024-10-09 | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Credit A) | SDR වි.ගැ.හි | 38.0 | 15,368.1 | 51.2 | ස්ථාවර | 1.25 | | පොරොන්දු ගාස්තු **0.5%** සේවා ගාස්තු **0.75%** | 5 | 30 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | **ණය** | 2024-07-10 | දෙවන ප්‍රත්‍යාස්ථ ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන | SDR වි.ගැ.හි | 150.6 | 61,149.4 | 208.1 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | පොරොන්දු ගාස්තු **0.5%** සේවා ගාස්තු **0.75%** | 5 | 30 |
| ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | **ණය** | 2024-10-09 | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ණය B-SML) | SDR වි.ගැ.හි | 75.9 | 30,695.8 | 102.3 | පොලි රහිත | | | පොරොන්දු ගාස්තු **0.5%** | 6 | 12 |
| ඔපෙක් සංවිධානය | **ණය** | 19/12/2024 | දෙවන ප්‍රත්‍යාස්ථ ස්ථාවර හා ආර්ථික හැරවුම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන | ඇ.ඩො | 50.0 | 14,564.1 | 50.0 | ස්ථාවර | 2.50% | අදාළ නොවේ | පොරොන්දු ගාස්තු **0.25%** | 5 | 20 |
| **එකතුව** | | | | | | **364,689.8** | **1,211.4** | | | | | | |


මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන :

සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතය (SOFR = Secured Overnight Financing Rate)


එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයන් ඇ.ඩො. හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත. විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො. හා රුපියල් බවට හැරවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.

**රූප සටහන 6.1 | විදේශ මූල්‍යන එකඟතා සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො. මිලියනවලින්)**




මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

**රූප සටහන 6.2 | විදේශ මූල්‍යන එකඟතා ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඩො. මිලියනවලින්)**




මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
වෙනත් - විදුලිබල හා බලශක්ති, අධ්‍යාපන හා පුහුණු, ධීවර, නාවික, ග්‍රාමීය සංවර්ධන, සංචාරක, යුක්තිය හා පාලනය

රටේ පවතින වත්මන් ආර්ථික තත්වය යටතේ, සමස්ත මූල්‍යන එකඟතා වලින් ප්‍රතිශතයක් ලෙස සියයට 54 ක් වන ඩොලර් මිලියන 658 ක් අයවැය මූල්‍ය කරණය සඳහා භාවිතා කර ඇත.

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා, සංවර්ධන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1915.8 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ.ඩො. මිලියන 1887.7 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ.ඩො. මිලියන 28.1 ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

**වගුව 6.4 | 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි, සංවර්ධන පාර්ශ්වකරු අනුව**

| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **61.5** | **7.1** | **68.6** |
| ජපානය | 35.3 | 2.0 | 37.3 |
| සෞදි අරමුදල | 19.0 | – | 19.0 |
| ජර්මනිය | | 4.6 | 4.6 |
| නෙදර්ලන්තය | 2.9 | – | 2.9 |
| කොරියා | 4.3 | – | 4.3 |
| ප්‍රංශය | – | 0.44 | 0.44 |
| **බහුපාර්ශ්වික** | **1,828.2** | **21.5** | **1,849.7** |
| ආසියානු සංවර්ධන බැංකුව | 859.8 | 2.3 | 862.1 |
| ලෝක බැංකුව | 545.7 | 19.2 | 564.9 |
| ** ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 334.0 | – | 334.0 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 51.9 | – | 51.9 |
| ඔපෙක් අරමුදල | 20.3 | – | 20.3 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 16.4 | – | 16.4 |
| **එකතුව** | **1,889.7** | **28.5** | **1,918.2** |


මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

සටහන : * තාවකාලික. ප්‍රාග්ධනීකරණය කරන ලද නොගෙවූ පොලිය සහ ප්‍රතිව්‍යුහගතකරන ලද ණය කොටසේ නොගෙවා පැහැර හරින ලද පොලියේ එකතුව වන ඇ.ඩො. මිලියන 557.2 ක මුදල මෙහි ඇතුලත් නොවේ. ඒක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයන් ඇ.ඩො. බවට හැරවීමේදී එක් එක් ප්‍රතිලබ්ධින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් භාවිතාකර ඇත.

** විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ. ඩො. හා රුපියල් බවට හැරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද පෙර මාසයේ අවසානයේ පැවැති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.


2023 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 45ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් ලෝක බැංකුව (සියයට 30) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (සියයට 17) සමග අත්සන් කරන ලද ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

**රූප සටහන 6.3 | ප්‍රතිලබ්ධි 2024 සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො.මිලියන)**




මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
*වෙනත් - කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල, ජර්මනිය, නෙදර්ලන්තය, කොරියාව, ප්‍රංශය

**රූප සටහන 6.4 | ප්‍රතිලබ්ධි 2024 ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඩො.මිලියන)**




මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

මෙම වර්ෂයේ සිදුවූ ප්‍රතිලබ්ධිවලින් සියයට 49 කට ආසන්න ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණය සඳහා යොදවා ඇති අතර, අනතුරුව සියයට 8 ක් වන ප්‍රමාණයක් ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයේ ව්‍යාපෘතිවල ද, සියයට 5 බැගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන අංශයට සහ මූල්‍ය අංශයට යොදවා ඇත.

## එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට පළ කර ඇති එකඟතා අනුව විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2024 දෙසැම්බර් 31 දින වනවිට ඇ. ඩො. බිලියන 5.1 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය (24%) විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ඉන්දියාව (17%), ජපානය (16%), ලෝක බැංකුව (13%) සහ ආසියානු සංවර්ධන බැංකුව (10%) විසින් ලබා දීමට නියමිතය.


එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ශේෂයෙන් සියයට 23.8 ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 15.2ක ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 11 ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද එකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

**වගුව 6.5 | 2024 දෙසැම්බර් 31 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය - ප්‍රධාන ආර්ථික අංශ අනුව**

| ආර්ථික අංශ | එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය ඇ.ඩො. මිලියන* |
|---|---|
| මාර්ග හා පාලම් | 1,219 |
| ජලසම්පාදනය හා සනීපාරක්ෂාව | 777 |
| ප්‍රවාහනය | 566 |
| වෙළඳ | 529 |
| අධ්‍යාපන හා පුහුණු | 333 |
| සෞඛ්‍යය හා සමාජ සුබසාධනය | 282 |
| විදුලිබල හා බලශක්ති | 201 |
| වාරිමාර්ග | 196 |
| අනෙකුත් ** | 1,015 |
| **Total** | **5,118** |

මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
තාවකාලික - ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය අනුව බලපෑමට ලක්විය

**රූප සටහන 6.5 | 2024 දෙසැම්බර් 31 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො.මිලියන)**





මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
තාවකාලික - ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය අනුව බලපෑමට ලක්විය

## 6.5 මධ්‍යම රජයේ ණය

මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය, නාමික වශයෙන් 2023 වසර අවසානයේ දී පැවති රු. බිලියන 28,695.9 ට සාපේක්ෂව 2024 වසර අවසාන වන විට රු. බිලියන 28,738.7 ක් දක්වා සියයට 0.15 කින් සුළු වශයෙන් වැඩි විය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී දේශීය ණය සියයට 7.4 කින් වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, නාමික වශයෙන් ද.දේ.නි.ය වැඩි වීම හා ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීමත් සමඟ විදේශ ණය අඩු වීම නිසා සමස්ත ණය නොගය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2023

වසර අවසානයේ සියයට 104.7 සිට 2024 වසර අවසාන වන විට සියයට 96.1 ක් දක්වා ප්‍රතිශතාංක 8.6 කින් අඩු විය. 2024 වසරේ දී ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන් විදේශ ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස වූ සියයට 42.5 ට සාපේක්ෂව 2024 වසර අවසානයේ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 34.9 ක් දක්වා අඩු විය. දේශීය ණය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2023 වසර අවසානයේ පැවති සියයට 62.2 ට සාපේක්ෂව 2024 වසර අවසානයේ සියයට 61.7 දක්වා ප්‍රතිශතාංක 1.6 කින් ආන්තික වශයෙන් අඩු විය.

**රූප සටහන 6.6 | මධ්‍යම රජයේ ණය**




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහා බැංකුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

සමස්ත ණය ප්‍රමාණයෙන් දේශීය ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවති රු. බිලියන 17,051.9 සිට 2024 වසර අවසානයේ දී රු. බිලියන 18,309.7 ක් දක්වා සියයට 7.4 කින් වැඩි වූ අතර, විදේශ ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවති රු. බිලියන11,644.1 සිට 2024 වසර අවසානයේ දී රු. බිලියන 10,429.0 ක් දක්වා සියයට 10.4 කින් අඩු විය. විදේශ ණය පහත වැටීම මධ්‍යයේ දේශීය ණය වැඩිවීම, සීමිත විදේශ මූල්‍ය ලැබීම් හේතුවෙන් සීමා වූ මූල්‍ය අවකාශය තුළ රජයට මුහුණ පෑමට සිදු වූ තීරණාත්මක මූල්‍ය අවශ්‍යතා ඉස්මතු කරන ලදී. එසේම, 2024 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වාරික දෙකක් ඇතුළුව බහුපාර්ශ්වික ආයතනවලින් අරමුදල් ලැබීම විදේශ ණය තොගයේ රුපියලේ අගය පහත වැටීමට අර්ධ වශයෙන් හේතු විය. සමස්ත ණය තොගයෙන් දේශීය ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ වාර්තා වූ සියයට 59.4 සිට 2024 වසර අවසානයේ දී සියයට 63.7 ක් දක්වා වැඩි විය. ඊට වෙනස්ව, සමස්ත ණය තොගයෙන් විදේශ ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවති සියයට 40.6 සිට 2024 වසර අවසානයේ දී සියයට 36.3 ක් දක්වා අඩු විය.

නොපිය වූ කෙටි කාලීන දේශීය ණය තොගය 2023 වසර අවසානයේ පැවති රු. බිලියන 3,616.2 සිට 2024 වසර අවසන් වන විට රු. බිලියන 3,220.1 ක් දක්වා සියයට 11.0 කින් සැලකිය යුතු ලෙස අඩු විය. භාණ්ඩාගාර බිල්පත් තොගය 2023 වසර අවසන් වන විට වාර්තා වූ රු. බිලියන 4,017.0 ට සාපේක්ෂව 2024 වසර අවසන් වන විට රු. බිලියන 4,061.6 ක් දක්වා සියයට 1.1 කින් වැඩි විය. සමස්ත දේශීය ණය තොගයෙන් කෙටි කාලීන ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ වාර්තා වූ සියයට 21.2 සිට 2024 වසර අවසානයේ දී සියයට 17.6 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. තවද, සමස්ත දේශීය ණය තොගයෙන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවති සියයට 23.6 සිට 2024 වසර අවසානයේ දී සියයට 22.2 ක් දක්වා අඩු විය.

මධ්‍ය කාලීන හා දිගුකාලීන දේශීය ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ වාර්තා වූ රු. බිලියන 13,435.6 සිට 2024 වසර අවසන් වන විට රු. බිලියන 15,089.6 දක්වා සියයට 12.3 කින් වැඩි විය. තවද, සමස්ත දේශීය ණය තොගයෙන් මධ්‍ය කාලීන හා දිගුකාලීන ණය තොගය 2023 වසර අවසානයේ පැවති සියයට 78.8 සිට 2024 වසර අවසානයේ සියයට 82.4 ක් දක්වා වැඩි විය. එසේම, සමස්ත දේශීය නොපියවූ ණය තොගයෙන් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවති සියයට 70.4 සිට 2024 වසර අවසන් වන විට සියයට 76.9 ක් දක්වා වැඩි විය. දළ මූල්‍යන අවශ්‍යතා හේතුවෙන් හට ගන්නා පීඩනය අවම කරමින් රජයට සහාය වීමට ණය තොගයේ කල් පිරීමේ කාලය දීර්ඝ කිරීම මඟින් දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය යටතේ රජයට භාණ්ඩාගාර බිල්පත් රඳවා තබා ගැනීම සහ මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර බවට පත් කිරීමත් සමඟ මෙය මූලික වශයෙන් සිදු විය.

වාණිජ බැංකුවලට ගෙවිය යුතු ණය ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් බැංකු අංශයේ ණය 2023 වසරේ දී පැවති රු. බිලියන 9,102.8 සිට 2024 වසර අවසානයේ දී රු. බිලියන 9,411.2 ක් දක්වා සියයට 3.4 කින් වැඩි විය. මේ අතර, බැංකු නොවන අංශයේ ණය ප්‍රමාණය ද 2023 වසර අවසානයේ පැවති රු. බිලියන 7,506.3 ට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී රු. බිලියන 8,158.6 ක් දක්වා සියයට 8.7 කින් වැඩි විය. මුළු දේශීය ණය ප්‍රමාණයෙන් බැංකු අංශයේ ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවති සියයට 53.4 සිට 2024 වසර අවසන් වන විට සියයට 51.4 ක් දක්වා අඩු වූ අතර, ණය මෙවලම / ආයතනය අනුව බැංකු නොවන අංශයේ ණය ප්‍රමාණය 2023 වසර අවසන් වන විට සියයට 44.0 සිට 2024 වසර අවසන් වන විට සියයට 44.6 ක් දක්වා වැඩි වී ඇත.


## 6.5.1 දේශීය ණය

අනේවාසිකයින් සඳහා නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර හැර, නොපියවූ දේශීය ණය ප්‍රමාණය 2023 දී රු. බිලියන 17,052 ක් වාර්තා වූ අතර එය 2024 අවසානයේ දී රු. බිලියන 18,310 දක්වා සියයට 7.38 කින් වැඩි විය. දේශීය ණයෙහි කෙටි කාලීන කොටස 2023 දී රු. බිලියන 3,616 සිට 2024 දී රු. බිලියන 3,220 දක්වා අඩු වූ අතර මධ්‍ය කාලීන සහ දිගු කාලීන කොටස 2023 දී රු. බිලියන 13,436 සිට රු. බිලියන 15,090 දක්වා වැඩි විය. 2022.12.31 දිනට ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් රජයට පවරා ගන්නා ලද ඇ.ඩො. මිලියන 2,435 ක් වූ රජය විසින් ඇපවූ විදේශ ණය මුදල 2024 අවසානයේ දී ලංකා බැංකුවට හා මහජන බැංකුවට ගෙවිය යුතු නව කාලීන ණය මුදල් බවට

සහ ශ්‍රී ලංකා රුපියල් වලින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීමෙන් ප්‍රතිව්‍යුහගත කරන ලදී.

## ණය ස්වරූපය අනුව සංයුතිය

**රූප සටහන 6.7 | දේශීය ණය සංයුතිය - ස්වභාවය අනුව**




මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව


2024 අවසානය වන විට, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්, දේශීය ණය ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 76.9 ක් සහ සියයට 22.2 ක් විය. දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන්, 2024 දී භාණ්ඩාගාර බැඳුම්කර තොගය රු. බිලියන 14,079 ක් දක්වා සියයට 17.3 කින් වැඩිවූ අතර ඒ යටතේ ලංකා බැංකුවට ගෙවිය යුතු උපචිත පොලිය සහිත ඇ. ඩො. මිලියන 240 ක විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) ණය ශ්‍රී ලංකා රුපියල් වලින් යුත් දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී.

තවද, රජයට මාරු කරන ලද ලංකා ඛනිජ තෙල් සංස්ථා ණයෙන් කොටසක් සහ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලින් කොටසක් වසර තුළ ශ්‍රී ලංකා රුපියල් වලින් යුත් දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. 2024 අවසානයේදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත් තාවකාලික අත්තිකාරම් සහ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය (ව්‍යාපෘති නොවන) යටතේ හිග ණය නොතිබුණි. 2023 වසරට සාපේක්ෂව භාණ්ඩාගාර බිල්පත් තොගය සියයට 1.1 කින් සුළු වශයෙන් ඉහළ ගොස් රු. බිලියන 4,062 ක් බවට පත්විය.

## කල්පිරීම් අනුව සංයුතිය

අනේවාසික ආයෝජකයින් සතුව ඇති කොටස ඇතුළුව, මුළු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර තොගයෙන් වසරක් ඇතුළත පරිණත වූ දේශීය ණය කොටස සියයට 27.6 ක් නියෝජනය කළ අතර ඉතිරි සියයට 72.4 , 2025 වසරින් ඔබ්බට කල්පිරීමට නියමිතය.

**රූප සටහන 6.8 | දේශීය ණය පරිණතවීමේ ව්‍යූහය**




මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 6.6 ණය සේවාකරණ ගෙවීම්

දේශීය හා ජාත්‍යන්තර මූලාශ්‍ර දෙකෙන්ම ලබාගත් ණය ආපසු ගෙවීම් සහ ඒ සඳහා වන පොලිය තුළින් සමස්ත ණය සේවාකරණ ගෙවීමේ වගකීම පිළිබිඹු කරයි. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වීමට ආසන්න තත්ත්වයක් පෙන්නුම් කරමින් 2024 වසරේ දී විදේශ පොලී ගෙවීම් රු. බිලියන 400.4 දක්වා ළඟා වන ලදී. මේ අතර, දේශීය පොලී ගෙවීම 2023 වසරේ දී වූ රු. බිලියන 2,323 ට සාපේක්ෂව 2024 වසරේ දී රු. බිලියන 2,289 දක්වා සියයට 1.5 කින් අඩු විය. මෙමඟින් අදාළ වසරේ රජයේ සුරැකුම්පත් වෙළඳපොලේ පැවති අඩු පොලී අනුපාතයන් පෙන්නුම් කරයි. ඒ අනුව, සමස්ත පොලී ගෙවීම පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 2,455.6 ට සාපේක්ෂව 2024 වසරේ දී රු. බිලියන 2,689.5 දක්වා සියයට 9.5 කින් වැඩි විය.

සමස්ත දේශීය ආපසු ගෙවීම්, 2023 වසරේ දී රු. බිලියන 1,469.9 සිට 2024 වසරේ දී රු. බිලියන 984.8 ක් දක්වා සියයට 33.0 කින් කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. කෙසේ වුවද, 2024 වසරේ මූල්‍ය ප්‍රකාශ අනුව විදේශ ණය ආපසු ගෙවීම් රු. බිලියන 3,634.1 ක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව, මුළු ණය සේවා ගෙවීම රු. බිලියන 7308.3 ක් දක්වා වැඩි වූ අතර, එයට දේශීය ණය සේවා කරණය සඳහා රු. බිලියන 3,273.8 ක් සහ විදේශ ණය සේවා කරණය සඳහා රු. බිලියන 4,034.5 ක් ඇතුළත් වේ.

## 6.6.1 දේශීය ණය සේවා ගෙවීම්

2024 දී දේශීය ණය සේවා ගෙවීම් රු. බිලියන 3,274 දක්වා සියයට 13.7 කින් අඩු වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 2024 දී දේශීය ණය ආපසු ගෙවීම් රු. බිලියන 985 දක්වා සියයට 33 කින් අඩුවීමක් සහ පොළී ගෙවීම් රු. බිලියන 2,289 දක්වා සියයට 1.5 කින් අඩුවීමක් පිළිබිඹු කරනු ලැබේ.

2023 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දේශීය ණය සේවා ගෙවීම සියයට 13.8 ක් වූ අතර එය 2024 දී සියයට 11 දක්වා අඩුවිය. රජයේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස දේශීය ණය සේවා ගෙවීම 2023 දී සියයට 124 හා සැසඳීමේදී 2024 හිදී ඒය සියයට 81.2ක් ලෙස වාර්තා විය.


**වගුව 6.6 | දේශීය ණය සේවා ගෙවීම්**

රු. මිලියන

| වර්ෂය | ණය ආපසු ගෙවීම් | පොළී ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| 2014 | 449,554 | 327,934 | 777,488 |
| 2015 | 523,824 | 394,289 | 918,113 |
| 2016 | 572,442 | 484,182 | 1,056,624 |
| 2017 | 642,875 | 570,623 | 1,213,498 |
| 2018 | 921,881 | 639,482 | 1,561,363 |
| 2019 | 546,315 | 652,795 | 1,199,110 |
| 2020 | 455,899 | 710,113(අ) | 1,166,012(අ) |
| 2021 | 799,695 | 794,124(අ) | 1,593,819(අ) |
| 2022 | 1,073,712 | 1,436,078(අ) | 2,509,790(අ) |
| 2023 | 1,469,938 | 2,322,919 | 3,792,857 |
| 2024 | 984,762(ආ) | 2,289,083(ආ) | 3,273,845(ආ) |


මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
(අ) සංශෝධික
(ආ) තාවකාලික

**රූප සටහන 6.9 | දේශීය ණය සේවා කරණ ගෙවීම් 2014-2024**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**රූප සටහන 6.10 | දේශීය ණය සේවා ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ සහ මුළු රජයේ ආදායමේ %ක් ලෙස: 2014- 2024**





මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 6.6.2 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2024 දෙසැම්බර් 31 වන විට රජය විසින් ලබාගත් විදේශ ණය මූල්‍යයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 36.68 කි[1].

ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීම් සහ කාලීන ණය පහසුකම් ඇතුළත් වාණිජ ණය මධ්‍යම රජයේ මුළු විදේශ ණයවලින් සියයට 36 ක ප්‍රමාණයක් නියෝජනය කරන අතර, ඉතිරිය පිළිවෙලින් බහුපාර්ශ්වික ණය සියයට 35 සහ ද්විපාර්ශ්වික ණය සියයට 29 මඟින් නියෝජනය වේ. වාණිජ කාණ්ඩයේ ණයෙන් සියයට 81 ක් පමණ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් වලින් සමන්විත වූ අතර ඉතිරිය කාලීන මූල්‍ය පහසුකම් (සින්ඩිකේටඩ් ණය) වලින් සමන්විත විය.

**රූප සටහන 6.11 | 2024 දෙසැම්බර් 31 දින වනවිට මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය (ඇ.ඩො.මිලියන)**





මූලාශ්‍රය රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
සටහන: තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතර කිරීමේ අතුරු ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතු වූ නොගෙවූ ණය වාරික ද ඇතුළුව ඇති මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.

තවද, 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද ණය සේවාකරණය ඇ.ඩො. මිලියන 1,673.6 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 924.8 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා

1. තාවකාලික අගයයන්, මධ්‍යම රජයේ නොපියවූ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.
- ණය සේවාකරණය තාවකාලිකව නතර කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතු වූ නොගෙවූ ණය වාරික ද ඇතුළත් වේ.
- භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරයන්හි විදේශ ආයෝජන ඇතුළත් නොවේ.
- ජාත්‍යන්තර සෛවරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණය එහි හිමිකාරීත්වයේ නේවාසික/අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැත.

**රූප සටහන 6.12 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීමේ ව්‍යුහය**





මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමණාකරන කාර්යාලය
සටහන : ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ඉතිරි බැඳුම්කර වටිනාකම ඇ.ඩො. මිලියන 269ක් 2022 වසරට ඇතුළත් වේ.
2022 වර්ෂය තුල දේශීය/විදේශීය වර්තමාන හිමිකාරිත්වය අනුව බැඳුම්කර වර්ගීකරණය කර නොමැත.

යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 748.8 ක ප්‍රමාණය පොලී ගෙවීම් සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 අප්‍රේල් 12 වන දින සිට ආරම්භ වන පරිදි අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, දෙසැම්බර් 31 දින දක්වා නොගෙවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,639.5 ක්ද, පොලී ප්‍රමාණය ඇ. ඩො. මිලියන 390.11 ක් ද විය. මෙම නොගෙවූ ණය පිළිබඳව ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී අදාළ ණයහිමියන් සමඟ සාකච්ඡා කිරීමට රජය විසින් පියවර ගනු ඇත.

**රූප සටහන 6.13 | මුදල් ඒකක අනුව විදේශ ණය සංයුතිය**




මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමණාකරන කාර්යාලය

## ණය ප්‍රතිව්‍යුහගත කිරීම

2022 අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ණය සේවා තාවකාලිකව අත්හිටුවීමෙන් පසු ශ්‍රී ලංකාව සිය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. 2023 නොවැම්බර් මාසයේදී, ශ්‍රී ලංකාව නිල ණයහිමියන්ගේ කමිටුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොන්දේසි පිළිබඳ ප්‍රතිපත්තිමය එකඟතාවයකට එළඹුණු අතර එහි මුළු ණය තොගය ඇ.ඩො. බිලියන 5.9 කි. ඒ අනුව 2024 ජූලි 29 වන දින ශ්‍රී ලංකාව සහ OCC සාමාජිකයින් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකාව සහ චීන එක්සිම් බැංකුව අතර සංශෝධන ණය ගිවිසුම් 2024 ජූලි 21 වනදා අත්සන් කරමින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කළහ. ඒ අනුව, ශ්‍රී ලංකාව විසින් චීන එක්සිම් බැංකුවට සාමාන්‍ය ණය සේවාව නැවත ආරම්භ කර ඇත.

ඊට අමතරව, 2024 දෙසැම්බර් 24 වනදා සංශෝධිත ගිවිසුම් අත්සන් කිරීම මඟින් චීන සංවර්ධන බැංකුව සමඟ වූ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියද සාර්ථකව නිමා කරන ලදී.

2024 අවසානය වනවිට ශ්‍රී ලංකා රජය විසින් අනෙක් බහුපාර්ශ්වික හවුල්කරුවන් වෙත ද තම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රජය දැනට නිල ණයහිමියන්ගේ කමිටු සාමාජික රටවල් 17 ට අදාල බලධාරීන් සමඟ ද ද්විපාර්ශ්වික ගිවිසුම් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

මෙම වර්ධනයන් ආර්ථිකය ස්ථාවර කිරීමට සහ එහි ණය බැඳීම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකාව දරන උත්සාහයේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ගෙවීම් නැවත ආරම්භ කිරීම මඟින් රටේ ණය සුදුසුකම් වැඩි දියුණු කිරීමට සහ ජාත්‍යන්තර ණයහිමියන් සමඟ වැඩිදියුණු කළ සබඳතා වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

බාහිර වාණිජ ණයහිමියන් සම්බන්ධයෙන් ගත් කල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ණයහිමියන්ගේ කමිටුව වෙතින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් ඉලක්ක සමඟ අනුකූල වීම සහ ප්‍රතිකාර සංසන්දනය කිරීම සම්බන්ධයෙන් තහවුරු කිරීමෙන් පසුව, 2024 ඔක්තෝබර් 8 වන දින HSBC සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් ගිවිසුමකට එළඹුණි. මීට අමතරව, 2024 අවසානයේ චීන කාර්මික හා වාණිජ බැංකුව සහ ඩොයිෂ් බැංකුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදුවෙමින් පැවතුනි.

**වගුව 6.7 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර විස්තර**

| බැඳුම්කර හුවමාරු නාමය | නිකුත් කළ දිනය (දිනය/මාසය/වර්ෂය) | 2024 වසර අවසානයට ගෙවීමට ඇති ශේෂය (ඇ.ඩො. මිලියන) | කාලය (වර්ෂය) | කල්පිරීමට නියමිත දිනය (දිනය/මාසය/වර්ෂය) |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 2012- ඇ.ඩො. මිලියන 1000 | 25/07/2012 | 269 | 10 | 25/07/2022 |
| ශ්‍රී ලංකා ආර්ථික කාර්ය සාධනය හා බැඳුන බැඳුම්කර - 2030 (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 1,087 | 6 | 1/15/30 |
| ශ්‍රී ලංකා ආර්ථික කාර්ය සාධනය හා බැඳුන බැඳුම්කර - 2033 (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 2,132 | 9 | 3/15/33 |
| ශ්‍රී ලංකා ආර්ථික කාර්ය සාධනය හා බැඳුන බැඳුම්කර - 2036 (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 999 | 12 | 5/15/36 |
| ශ්‍රී ලංකා ආර්ථික කාර්ය සාධනය හා බැඳුන බැඳුම්කර - 2038 (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 1,999 | 14 | 2/15/38 |
| ශ්‍රී ලංකා යහපාලනය හා බැඳුන බැඳුම්කර - 2035 (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 1,440 | 11 | 6/15/35 |
| ශ්‍රී ලංකා ක්‍රමයෙන් වැඩිවන තැන්පත් පොලී අනුපාතික සහිත එ.ජ.ඩොලර් බැඳුම්කර - 2038 (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 1,126 | 14 | 6/15/38 |
| **ශ්‍රී ලංකා උපචිත පොලී සඳහා බැඳුම්කර (ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර - 2024 ප්‍රතිව්‍යුහගත) | 12/20/24 | 1,533 | 4 | 4/15/28 |
| **එකතුව** | | 10,585 | | |

මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමණාකරන කාර්යාලය

* ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ඉතිරි බැඳුම්කර වටිනාකම

** ඇ.ඩො.මිලියන 115.341ක් 2024/12/20 දින ගෙවා ඇත.

මේ අතර, 2024 සැප්තැම්බර් 19 වන දින ණය ප්‍රතිකාර නියමයන් පිළිබඳ ප්‍රතිපත්තිමය ගිවිසුමක් ඇති කර ගත් අතර, ජාත්‍යන්තර සහ දේශීය ණය හිමියන් නියෝජනය කරන සහ හිඟ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වලින් සියයට 50 කට වඩා හිමි ස්වෛරී බැඳුම්කර හිමියන්ගේ නියෝජිත කමිටු දෙකක් ඇත. නව බැඳුම්කර සඳහා හිඟ ස්වෛරී බැඳුම්කර හුවමාරුව 2024 දෙසැම්බර් 20 වන දින හුවමාරුවට ඉතා ඉහළ සහභාගීත්වයක් සහිතව අවසන් කරන ලද අතර, එමඟින් ශ්‍රී ලංකාවේ පැහැර හරින ලද බැඳුම්කරවලින් සියයට 98 කට ආසන්න ප්‍රමාණයක් නව ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර බවට හුවමාරු කර ගැනීමට ඉඩ සැලසේ.

**වගුව 6.8 | ප්‍රදාන ප්‍රතිලබ්ධීන් 2024**

| සංවර්ධන පාර්ශ්වකරු | විස්තරය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (මිලියන) | | | |
|---|---|---|---|---|---|
| | | ව්‍යවහාර මුදල | ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. |
| **ද්විපාර්ශ්වික** | | | | | |
| ප්‍රංශය | නාගරික සෞඛ්‍යාරක්ෂණ සහ සනීපාරක්ෂණ ව්‍යාපෘතිය පළමු අදියර | යුරෝ | 0.4 | 131.1 | 0.4 |
| ජපානය | ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ධීවර කර්මාන්තය සඳහා ආධාරක උපකරණ ලබා දීම. | ජපන් යෙන් | 200.00 | 401.7 | 1.3 |
| | බෝවන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන ආධාර | ජපන් යෙන් | 104.1 | 199.3 | 0.7 |
| ජර්මනිය | ගාල්ල මානෑ රෝහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම | යුරෝ | 4.3 | 1,383.9 | 4.6 |
| **බහුපාර්ශ්වික** | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | විදුලිබල සැපයුම් පුනරුත්ථාපන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට සහාය වීම | ඇ.ඩො | 0.1 | 24.7 | 0.1 |
| | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො | 0.5 | 161.6 | 0.5 |
| | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය | ඇ.ඩො | 0.4 | 119.5 | 0.4 |
| | ආහාර සුරක්ෂිතකාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය | ඇ.ඩො | 1.3 | 385.5 | 1.3 |
| ලෝක බැංකුව (IBRD) | කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යකරණය | යුරෝ | 8.3 | 2,731.1 | 9.0 |
| | යුරෝපීය සංගමය (IBRD/IDA) විසින් අරමුදල් සපයන ලද දේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය | යුරෝ | 9.4 | 3,038.8 | 10.2 |
| | | | ඒකතුව | **8,577.2** | **28.5** |

මූලාශ්‍රය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන - * කාවකාලික
විවිධ මුදල් වර්ග වලින් කරන ලද ගෙවීම් ඇ.ඩො. බවට පරිවර්තනය කිරීම සඳහා, එක් එක් ගෙවීම් දිනයේ පැවති විනිමය අනුපාත භාවිතා කර ඇත.

**ඇමුණුම 6.1 | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ණය යටතේ ලද ප්‍රතිලබ්ධි උපයෝජනය වූ ව්‍යාපෘති/වැඩසටහන්, ඒවා ලබාගත් මූල්‍යයන නියමයන් සමග ***

| සංවර්ධන සහකරු/ ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (මිලියන) | | | | වාර්ෂික පොලී අනුපාතය | | | සහන කාලය (වසර) | පරිණත කාලය/ උපයෝජනය කළ යුතු කාලය (ගිවිසුම් ගත දිනයේ සිට) (වසර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඒකීය | ඒකීයයෙන් ලබා ගත් ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. | ෆ්ලෝට් වර්ගය | සීමාන්තිකය අනුපාතය (පදනම් අංක 100) | | | |
| **ද්විපාර්ශ්වික** | | | | | | | | | | | |
| ජපාන රජය | 2010016 | මහනුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 192.34 | 376.09 | 1.26 | ස්ථාවර | T1- 0.65% & T2- 0.01% | අදාළ නොවේ | T1 - කැපවීමේ ගාස්තුව 0.1% | 10 | 40 |
| | 2012006 | හබරණ-වෙයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය | ජපන් යෙන් | 789.55 | 1,634.75 | 5.43 | ස්ථාවර | T1- 0.3% & T2- 0.01% | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.1% | 10 | 40 |
| | 2013020 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර I) | ජපන් යෙන් | 182.68 | 367.93 | 1.22 | ස්ථාවර | T1- 1.4% & T2- 0.01% | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.1% | 7 | 25 |
| | 2014003 | කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 2,013.25 | 4,105.16 | 13.65 | ස්ථාවර | T1- 0.1% & T2- 0.01% | අදාළ නොවේ | - | 10 | 40 |
| | 2015018 | ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,045.02 | 2,003.23 | 6.83 | ස්ථාවර | T1- 0.3% & T2- 0.01% | අදාළ නොවේ | T1 - මූලික ගාස්තුව -යෙන් මිලියන 49.86 | 10 | 40 |
| | 2016037 | අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර 2) | ජපන් යෙන් | 5.55 | 11.36 | 0.04 | ස්ථාවර | T1- 1.4% & T2- 0.01% | අදාළ නොවේ | T1 -- මූලික ගාස්තුව -යෙන් මිලියන 46.27 | 7 | 25 |
| | 2017015 | නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ජපන් යෙන් | 470.80 | 905.01 | 3.06 | ස්ථාවර | T1- 1.4% & T2- 0.01% | අදාළ නොවේ | T1 -මූලික ගාස්තුව -යෙන් මිලියන 25.91 | 7 | 25 |
| | 2017016 | කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (I) | ජපන් යෙන් | 137.02 | 279.71 | 0.93 | Fixed | T1- 1.4% & T2- 0.01% | අදාළ නොවේ | T1 - මූලික ගාස්තුව -යෙන් මිලියන 63.60 | 7 | 25 |
| | 2018032 | සෞඛ්‍ය සහ වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 19.23 | 37.90 | 0.13 | ස්ථාවර | T1- 0.1% & T2- 0.01% | අදාළ නොවේ | T1 - - මූලික ගාස්තුව - යෙන් මිලියන 21.278 | 12 | 40 |
| | 2019011 | කොළඹ සැහැල්ලු දුම්රිය ප්‍රවාහන ව්‍යාපෘති පද්ධතිය ස්ථාපිත කිරීම | ජපන් යෙන් | 399.88 | 828.25 | 2.75 | ස්ථාවර | T1- 0.1% & T2- 0.01% | අදාළ නොවේ | T1 - මූලික ගාස්තුව - යෙන් මිලියන 60.08 | 12 | 40 |
| කොරියානු රජය | 2014039 | රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | ද.කොං. වොන් | 5.86 | 1,280.77 | 4.25 | ස්ථාවර | 0.15% | අදාළ නොවේ | - | 10 | 40 |
| කොරියානු රජය | 2012025 | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය-(සවුදි අරමුදල) | සෞදි රියාල් | 0.27 | 22.43 | 0.07 | ස්ථාවර | 2% | අදාළ නොවේ | - | 5 | 20 |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා සෞදි අරමුදල | 2015026 | පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ග ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම | සෞදි රියාල් | 3.19 | 250.61 | 0.84 | ස්ථාවර | 2% | අදාළ නොවේ | - | 5 | 25 |
| | | වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය | සෞදි රියාල් | 18.07 | 1,446.92 | 4.73 | ස්ථාවර | 2% | අදාළ නොවේ | - | 5 | 25 |

**ඇමුණුම 6.1 | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ණය යටතේ ලද ප්‍රතිලබ්ධි උපයෝජනය වූ ව්‍යාපෘති/වැඩසටහන්, ඒවා ලබාගත් මූල්‍යයන නියමයන් සමඟ ***

| සංවර්ධන සහකරු/ ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (මිලියන) | | | | වාර්ෂික පොලී අනුපාතය | | | ඩොක් ගෙවීම් | සහන කාලය (වසර) | පරිණත කාලය/ උපයෝජනය කාලය (ගිණුම් ගත දිනයේ සිට) (වසර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඒකීය | ඒකීයයෙන් ලබා ගත් ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. | පොලී වර්ගය | අනුපාතය | සීමාන්තිකය (පදනම් අංක 100) | | | |
| | | කළු-ගඟ සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍ය | සෞදි රියාල් | 4.00 | 321.96 | 1.00 | ස්ථාවර | 2% | අදාළ නොවේ | - | 5 | 25 |
| | 2019043 | සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | සෞදි රියාල් | 47.29 | 3,743.65 | 12.37 | ස්ථාවර | 2% | අදාළ නොවේ | - | 5 | 25 |
| නෙදර්ලන්තයේ Co-op Centrale Raiffeisen ආයතනය | 2019047 | නෙදර්ලන්තයේ මූල්‍ය ආධාර යටතේ ග්‍රාමීය පාලම් ඉදිකිරීම | යුරෝ | 2.72 | 881.83 | 2.94 | විචල්‍ය | EURIBOR -6 Month | 1.45 | කැපවීමේ ගාස්තුව 0.25%, සැකසුම් ගාස්තුව යුරෝ 104,493.2 | 5 | 15 |
| **බහුපාර්ශ්වික** | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | 2011001 | යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | ඇ.ඩො. | (0.13) | (38.14) | (0.13) | විචල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.3 | කැපවීමේ ගාස්තුව 0.15% | 6 | 24.8 |
| | 2011002 | යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | වි.ගැ.හි. (SDR) | (0.14) | (56.72) | (0.18) | ස්ථාවර | උපලබ්ධි කාලය තුළ 1%, ආපසු ගෙවීමේ කාලය තුළ 1.5% | අදාළ නොවේ | - | 8 | 31.8 |
| | 2014030 | මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය-2 | වි.ගැ.හි. (SDR) | 0.004 | 1.72 | 0.006 | ස්ථාවර | 0.02 | අදාළ නොවේ | - | 4 | 24 |
| | 2014036 | හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි. (SDR) | 2.07 | 827.68 | 2.75 | ස්ථාවර | 0.02 | අදාළ නොවේ | - | 5 | 24.5 |
| | 2014037 | හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 35.65 | 10,800.34 | 35.66 | විචල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.5 | කැපවීමේ ගාස්තුව 0.15% | 5 | 20 |
| | 2015024 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1 | වි.ගැ.හි. (SDR) | 12.25 | 4,928.39 | 16.24 | ස්ථාවර | 0.02 | අදාළ නොවේ | - | 5 | 25 |
| | 2015025 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1 | ඇ.ඩො. | 11.03 | 3,421.02 | 11.04 | විචල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.5 | කැපවීමේ ගාස්තුව 0.15% | 5 | 26 |
| | 2016033 | කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3 | වි.ගැ.හි. (SDR) | 1.80 | 741.71 | 2.41 | ස්ථාවර | 0.02 | අදාළ නොවේ | - | 5 | 24 |
| | 2017038 | යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය | ඇ.ඩො. | 12.80 | 3,908.06 | 12.80 | ස්ථාවර | 2% | අදාළ නොවේ | - | 6 | 25 |

**ඇමුණුම 6.1 | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ණය යටතේ ලද ප්‍රතිලබ්ධි උපයෝජනය වූ ව්‍යාපෘති/වැඩසටහන්, ඒවා ලබාගත් මූල්‍යයන නියමයන් සමඟ ***

| සංවර්ධන සහකරු/ ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (මිලියන) | | | වාර්ෂික පොලී අනුපාතය | | | ගෙවීම් වෙනත් ගෙවීම් | සහන කාලය (වසර) | පරිණත කාලය/ උපයෝජන කාලය (ග්‍රේස් සහ දිනයේ සිට) (වසර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මුදල් | මුදල්වලින් ලබා ගත් ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. | පොලී වර්ගය | අනුපාතය | සීමාන්තිකය (පදනම් අංක 100) | | |
| | 2017039 | යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය | ඇ.ඩො. | 8.96 | 2,661.43 | 8.96 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 7 | 30 |
| | | කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3 (OCR) | ඇ.ඩො. | 4.95 | 1,533.59 | 4.96 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.5 | කැපවීමේ ගාස්තුව 0.15% | 5 | 25 |
| | 2017040 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - 4 වන කොටස | ඇ.ඩො. | 1.46 | 448.02 | 1.46 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 7 | 30 |
| | 2018018 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - දෙවන අදියර | ඇ.ඩො. | 11.34 | 3,398.97 | 11.33 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 5 | 20 |
| | 2018045 | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 2.98 | 900.83 | 2.98 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | 5 | 25 |
| | 2019007 | තාක්ෂණික සහාය ණය ගිවිසුම (නාගරික ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම) | ඇ.ඩො. | (0.04) | (10.67) | (0.04) | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | 5 | 24 |
| | 2019012 | දකුණු ආසියානු උප කලාපීය ආර්ථික සහයෝගිතා වරාය ප්‍රවේශ උස් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (SSADSEC) | ඇ.ඩො. | 41.47 | 12,512.31 | 41.46 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 8 | 28 |
| | 2019029 | විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 19.45 | 5,826.63 | 19.45 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | 5 | 25 |
| | 2019030 | විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 8.13 | 2,440.28 | 8.13 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.7 | කල්පිරීමේ වාරිකය ඇ.ඩො. 166,040 සහ කැපවීමේ ගාස්තුව 0.15% | 8 | 29 |
| | 2019040 | දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 22.11 | 6,609.67 | 22.12 | Variable | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 9 | 29 |
| | | ද්විතියික අධ්‍යාපන අංශ වැඩිදියුණු කිරීමේ වැඩසටහන-ප්‍රතිඵල මත පදනම් වූ ණය දීම | ඇ.ඩො. | 37.93 | 11,035.38 | 37.93 | විවල්‍ය | ඇ.ඩො. සඳහා SOFR -6 මාසයක් | 0.82 | කල්පිරීමේ වාරිකය ඇ.ඩො. 400,000 සහ කැපවීමේ ගාස්තුව 0.15% | 5 | 25 |
| | 2021029 | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය | ඇ.ඩො. | 14.03 | 4,197.19 | 14.03 | විවල්‍ය | | 0.5 | කැපවීමේ ගාස්තුව 0.15% | 8 | 29 |

ඇමුණුම 6.1 | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ණය යටතේ ලද ප්‍රතිලබ්ධි උපයෝජනය වූ ව්‍යාපෘති/වැඩසටහන්, ඒවා ලබාගත් මූල්‍යයන නියමයන් සමග *

| සංවර්ධන සහකරු/ ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (මිලියන) | | | | වාර්ෂික පොලී අනුපාතය | | | මෙවැනි ගෙවීම් | සහන කාලය (වසර) | පරිණත කාලය/ උපයෝජනය කාලය (ගිවිසුම් ගත දිනයේ සිට) (වසර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මුදල් ඒකකය | මුදල් ඒකකයෙන් ලබා ගත් ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. | පොලී ධර්යය | අනුපාතය | සීමාන්තිකය (පදනම් අංක 100) | | | |
| | 2022026 | ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය | ඇ.ඩො. | 4.31 | 1,349.71 | 4.31 | විවල්‍ය | විවල්‍ය | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 8 | 32 |
| | 2023016 | දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර - 4 | ඇ.ඩො. | 17.93 | 5,232.95 | 17.93 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | 5 | 25 |
| | 2024002 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය | ඇ.ඩො. | 100.00 | 29,988.63 | 100.00 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| | 2024003 | විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ වැඩසටහන (උප වැඩසටහන 1) | ඇ.ඩො. | 100.00 | 30,113.43 | 100.00 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| | 2024004 | ජල සම්පාදන හා සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන - උප වැඩසටහන 1 | ඇ.ඩො. | 100.00 | 29,378.19 | 100.00 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| | 2024005 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 3 වන අදියර | ඇ.ඩො. | 86.43 | 25,311.81 | 86.41 (පළමු කොටස) | විවල්‍ය | | 0.7 | කැපවීමේ ගාස්තුව 0.15% | 8 | 29 |
| | 2024009 | මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ - උප වැඩසටහන 2 | ඇ.ඩො. | 200.00 | 58,059.26 | 200.00 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 2019019 | අවම කිරීමේ පියවර ව්‍යාපෘති මඟින් නායයෑම් අවදානම් අඩු කිරීම | ඇ.ඩො. | 26.94 | 8,039.21 | 26.94 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | 1.3 | මූලික ගාස්තුව ඇ.ඩො. 200,000, කැපවීමේ ගාස්තුව 0.25% | 6 | 30 |
| | 2019020 | කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘති සඳහා සහාය | ඇ.ඩො. | 25.00 | 7,643.46 | 25.00 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | 1.4 | මූලික ගාස්තුව ඇ.ඩො. 500,000, කැපවීමේ ගාස්තුව 0.25% | 9 | 30 |
| ලෝක බැංකුව (IBRD) | 2017019 | උසස් අධ්‍යාපන ව්‍යාප්ති සහ සංවර්ධන මෙහෙයුම් (AHEAD) වැඩසටහන වේගවත් කිරීම | ඇ.ඩො. | (0.11) | (33.03) | (0.11) | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | 1.34 | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 167,500 | 10 | 24 |
| | 2019001 | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 26.28 | 7,945.34 | 26.25 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 500,000 | 6 | 32 |
| | | COVID 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම [IBRD අරමුදල්] | ඇ.ඩො. | (2.66) | (792.78) | (2.66) | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 87,500 | 5 | 25 |
| | | COVID 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම [IBRD අරමුදල්] | ඇ.ඩො. | (2.98) | (911.02) | (2.98) | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො.135,000 | 5 | 25 |

**ඇමුණුම 6.1 | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ණය යටතේ ලද ප්‍රතිලබ්ධි උපයෝජනය වූ ව්‍යාපෘති/වැඩසටහන්, ඒවා ලබාගත් මූල්‍යයන නියමයන් සමග ***

| සංවර්ධන සහකරු/ ණය දෙන ආයතනය | ව්‍යාපෘතිය | | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (මිලියන) | | | වාර්ෂික පොලී අනුපාතය | | | ගෙවීම් ගෙවීමේ කොන්දේසි | සහන කාලය (වසර) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම් ගත දිනයේ සිට) (වසර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | විනිමය | විනිමයෙන් ලබා ගත් ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. | පොලී වර්ගය | අනුපාතය | සීමාන්තිකය (පදනම් අංක 100) | | |
| | 2021025 | දේශගුණික ඔරොත්තු දීමේ බහුඅදියර වැඩසටහන් ප්‍රවේශය | ඇ.ඩො. | 6.35 | 1,883.32 | 6.35 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 230,000 | 5 | 30 |
| | 2021030 | ජල සම්පාදන හා ඝනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යකරණය | ඇ.ඩො. | 18.19 | 5,643.63 | 18.19 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 100,000 | 5 | 17 |
| | 2021031 | COVID 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම සඳහා තුන්වන අතිරේක මූල්‍යකරණය | ඇ.ඩො. | (0.005) | (1.67) | (0.005) | Variable | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 250,000 | 5 | 18 |
| | 2021032 | ඇතුළත් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 34.05 | 10,303.37 | 34.05 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | කැපවීමේ ගාස්තුව 0.25%, මූලික ගාස්තුව ඇ.ඩො. 1,250,000 | 10 | 28 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 2015028 | ජල සම්පාදන හා ඝනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 0.06 | 27.31 | 0.09 | Fixed | 1.25% | අදාළ නොවේ | සේවා ගාස්තුව 0.75%, කැපවීමේ ගාස්තුව 0.50%% | 5 | 25 |
| | 2015030 | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය | වි.ගැ.හි (SDR) | (0.003) | (1.42) | (0.005) | Fixed | 1.25% | අදාළ නොවේ | සේවා ගාස්තුව 0.75%, කැපවීමේ ගාස්තුව 0.50% | 5 | 25 |
| | 2017001 | කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි (SDR) | 13.97 | 5,566.54 | 18.56 | Fixed | 1.25% | අදාළ නොවේ | සේවා ගාස්තුව 0.75% | 5 | 24 |
| | 2017023 | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි (SDR) | 4.52 | 1,816.80 | 5.98 | Fixed | 1.25% | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.5%, සේවා ගාස්තුව 0.75% | 4 | 24 |
| | 2018033 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | ඇ.ඩො. | 26.18 | 7,935.35 | 26.17 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | කැපවීමේ ගාස්තුව 0.25% | 6 | 22 |
| | 2019021 | දේශගුණික සුහුරු වාරිමාර්ග කෘෂිකර්ම ව්‍යාපෘතිය | ඇ.ඩො. | 17.00 | 5,207.70 | 17.00 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | මූලික ගාස්තුව ඇ.ඩො. 312,500, කැපවීමේ ගාස්තුව 0.25% | 12 | 27 |
| | 2019027 | ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය | ඇ.ඩො. | 8.32 | 2,474.25 | 8.32 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | මූලික ගාස්තුව ඇ.ඩො. 175,000, කැපවීමේ ගාස්තුව 0.25% | 12 | 25 |
| | | මහනුවර බහුමාධ්‍ය ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - සහනදායී පදනම මත | | 5.36 | 2,148.07 | 7.11 | ස්ථාවර | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.5% , සේවා ගාස්තුව 0.75% | | |
| | 2021016 | මහනුවර බහුමාධ්‍ය ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - සහනදායී නොවේ. | ඇ.ඩො. | 4.53 | 1,390.79 | 4.53 | විවල්‍ය | LIBOR - ඇ.ඩො. සඳහා මාස 6 | - | මූලික ගාස්තුව ඇ.ඩො. 12,500, කැපවීමේ ගාස්තුව 0.25% | 4 | 9 |

**ඇමුණුම 6.1 | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ණය යටතේ ලද ප්‍රතිලබ්ධි උපයෝජනය වූ ව්‍යාපෘති/වැඩසටහන්, ඒවා ලබාගත් මූල්‍යයන නියමයන් සමග ***

| සංවර්ධන සහකරු/ ණය දෙන ආයතනය | | ව්‍යාපෘතිය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (මිලියන) | | | | වාර්ෂික පොලී අනුපාතය | | | ගෙවන් ගෙවීම් ඛෙනත් | සහන කාලය (වසර) | පරිණත කාලය/ උපයෝජන කාලය (ගිණුම් ගත දිනයේ සිට) (වසර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මුදල් ඒකකය | මුදල් ඒකකයෙන් ලබා ගත් ප්‍රමාණය | රුපියල් | ඇ.ඩො. | පොලී වර්ගය | සීමාන්තිකය අනුපාතය (පදනම් අංක 100) | | | | |
| | 2023015 | සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය | වි.ගැ.හි (SDR) | 50.97 | 20,122.42 | 67.53 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.5% , සේවා ගාස්තුව 0.75% | 5 | 30 |
| | 2024001 | මූල්‍ය අංශයේ ආරක්ෂක ශුද්ධ ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි (SDR) | 75.94 | 29,990.70 | 100.10 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.5% , සේවා ගාස්තුව 0.75% | 5 | 30 |
| | 2024008 | දෙවන ඔරොත්තු දීමේ හැකියාව, ස්ථාවරත්වය සහ ආර්ථික පෙරළිය සංවර්ධන ප්‍රතිපත්ති මූල්‍යකරණය | වි.ගැ.හි (SDR) | 150.60 | 58,811.15 | 200.25 | ස්ථාවර | 1.25% | අදාළ නොවේ | කැපවීමේ ගාස්තුව 0.5% , සේවා ගාස්තුව 0.75% | 5 | 30 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 2016016 | ශ්‍රී ලංකා කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STARR) | වි.ගැ.හි (SDR) | 0.10 | 43.73 | 0.14 | ස්ථාවර | 2.00% | අදාළ නොවේ | - | 5 | 25 |
| | 2017014 | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව (SAP) වැඩසටහන ක්‍රියාත්මක කිරීම ණය අංක 2000001843 | ඇ.ඩො. | 13.29 | 3,890.04 | 13.29 | ස්ථාවර සහ විචල්‍ය | T1 සහ T3 - 2%, T2 - SOFR | T - 2 සඳහා 1.06 | - | 5 | 24 |
| | 2021011 | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (SARP) | ඇ.ඩො. | 3.00 | 892.04 | 3.00 | විචල්‍ය | SOFR Overnight Index | - | - | 11 | 27 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන 23-26 | 2023008 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාවේ 2023-26 විස්තීර්ණ අරමුදල් පහසුකම් (EFF) සැකසුම් | වි.ගැ.හි (SDR) | 254.00 | 101,488.54 | 334.03 | විචල්‍ය | SDR පොලී අනුපාතය | 1 | අනෙක් ගෙවීම් SDR මිලියන 3.8 | 5 | 11 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 2012024 | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය (OPEC අරමුදල) | ඇ.ඩො. | 0.71 | 213.76 | 0.71 | ස්ථාවර | 3.10% | අදාළ නොවේ | Service Fee 1% | 5 | 20 |
| | 2013023 | කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය | ඇ.ඩො. | 1.68 | 499.93 | 1.67 | ස්ථාවර | 4.60% | අදාළ නොවේ | - | 5 | 20 |
| | 2015014 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩො. | 0.16 | 45.09 | 0.16 | ස්ථාවර | 2.60% | අදාළ නොවේ | Service Fee 1% | 5 | 20 |
| | 2015015 | බදුල්ල සිට චෙන්කලඩි ව්‍යාපෘතිය දක්වා A 05 මාර්ග කොරිඩෝව ප්‍රතිසංස්කරණය කිරීම | ඇ.ඩො. | 4.07 | 1,236.85 | 4.05 | ස්ථාවර | 2.50% | අදාළ නොවේ | Service Fee 1% | 5 | 20 |
| | 2018023 | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන | ඇ.ඩො. | 8.14 | 2,445.16 | 8.11 | ස්ථාවර | 2.50% | අදාළ නොවේ | Service Fee 1% | 5 | 20 |
| | 2019045 | A017 මාර්ග කොරිඩෝ ව්‍යාපෘතිය (රක්වාන-සූරියකන්ද) ප්‍රතිසංස්කරණය කිරීම | ඇ.ඩො. | 5.60 | 1,676.08 | 5.57 | ස්ථාවර | 2.50% | අදාළ නොවේ | Service Fee 1% | 5 | 20 |
| **මුලු එකතුව** | | | | | **564,266.54** | **1,889.69** | | | | | | |

මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විවිධ මුදල් වර්ගවලින් කරන ලද ප්‍රතිලබ්ධි අගයන් ඇ.ඩො. බවට පරිවර්තනය කිරීම සඳහා, එක් එක් ගෙවීම් දිනයේදී පැවති විනිමය අනුපාත භාවිතා කර ඇත

* තාවකාලික

LIBOR = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය, EURIBOR = යුරෝපීය අන්තර් බැංකු අර්පණ අනුපාතය, SOFR = Secured overnight Financing Rate ඍණ අගයන් සටහන් වනුයේ ලබා ගත් අත්තිකාරම් ආපසු ගෙවීම හේතුවෙනි.

**විශේෂ සටහන 6.1 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම සහ ඉදිරි ගමන්මග – ණය කළමනාකරණය තුළින් සමෘද්ධිමත් හෙට දවසක්**

රජයේ ණය ගැනීම් සහ ණය විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීම සහ සාර්ව ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ තීරණාත්මක පියවරක් ලෙස, 2024 වසරේ ජුනි මස 18 වන දින 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්මත කර 2024 වසරේ නොවැම්බර් මස 25 වන දින සිට බලාත්මක වන බව ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව, 2024 වසරේ දෙසැම්බර් මස 2 වන දින මුදල් අමාත්‍යාංශය තුළ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. මෙම සන්ධිස්ථානීය ප්‍රතිසංස්කරණය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේහි විස්තීර්ණ ණය පහසුකම මඟින් සහාය දක්වන රජයේ පුළුල් ආර්ථික පරිවර්තන න්‍යාය පත්‍රයේ කේන්ද්‍රීය අංගයක් වන අතර එය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණ පද්ධතියේ දිගුකාලීන ව්‍යුහාත්මක දුර්වලතා සඳහා පිළියම් ඉදිරිපත් කරයි.

2022 වසරේ දී ලෝක බැංකුව විසින් පවත්වන ලද ණය කළමනාකරණ කාර්ය සාධන ඇගැයීම තුලින් ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණ රාමුවේ තීරණාත්මක අඩුපාඩු හඳුනාගෙන ඇති අතර විසිරි පැවති ආයතනික වගකීම් යල් පැන ගිය සහ නොගැලපෙන නීතිමය පදනම සහ ස්වෛරීත්ව ඇපකර හා උපණය සඳහා මධ්‍යගත අධීක්ෂණයක් නොමැතිවීම, මෙන්ම ණය විනිවිදභාවයේ ඌනතාවයද ඒ අතර වේ.

ඒ සඳහා ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාව විසිරුණු සහ ප්‍රතික්‍රියාශීලී ආකෘතියේ සිට මධ්‍යගත වූ මෙන්ම රීති මත පදනම් වූ ණය කළමනාකරණ ව්‍යුහයකට මාරු වෙමින් සැලකිය යුතු පරිවර්තනයක් සිදු කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ ප්‍රධාන කුළුණු දෙකක්, එනම් (I) පුළුල් නීතිමය රාමුවක් - 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත; සහ (II) මධ්‍යගත ආයතනික රාමුවක් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මත පදනම් ව ගොඩ නැගී ඇත.

2026 වසරේ ජනවාරි මස සිට මෙහෙයුම් කටයුතු පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය දැනට සංක්‍රාන්තික අවධියේ කාර්යාල කටයුතු සිදු කරමින් ඇත. මීට පෙර මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවටත් පැවරී තිබූ ණය කළමනාකරණයට අදාළ වගකීම් මෙමඟින් ඉටු කරනු ඇත.

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙහි ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වනුයේ දැනට ශ්‍රී ලංකා මහා බැංකුවෙහි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන රජයේ ණය සුරැකුම්පත් නිකුත් කිරීමේ සහ වෙන්දේසි කිරීමේ ක්‍රියාවලියට අදාල කාර්යයන් ඉටු කිරීමය. මෙම සංක්‍රාන්තිය ප්‍රතිසංස්කරණයෙහි වඩාත්ම සංකීර්ණ හා තාක්ෂණිකව වැදගත් අංගයන් වේ. කෙසේ නමුත්, මෙය උපාය මාර්ග සකස් කිරීම තහවුරු කරමින් ඒකාකරීව ක්‍රියාත්මක කිරීමේ සහ වැඩිදියුණු කළ සම්බන්ධීකරණයන් සහතික කරමින් සියලුම ණය කළමනාකරණ කාර්යයන් එකම වහලක් යටතට ගෙන ඒමේ ප්‍රධාන අරමුණු සඳහා අත්‍යවශ්‍ය වේ.

රජයේ ණය ගැනීමේ මෙහෙයුම් කළමනාකරණය කිරීමට අමතරව, ණය ඇපකර සහ උපණය ලබා දීමේ විධිවිධාන අධීක්ෂණය කිරීම, ණය අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ වගකීම වේ. තවද, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ණය සංඛ්‍යා ලේඛනවල විනිවිදභාවය, නිරවද්‍යතාවය සහ ප්‍රවේශ්‍යතාව වර්ධනය කිරීම සඳහා, විශේෂිත වෙබ් අඩවියක් ඔස්සේ ප්‍රචාරය කළ හැකි පරිපූර්ණ රාජ්‍ය ණය දත්ත ගබඩාවක් පවත්වාගෙන යනු ඇත. ආයෝජක පදනම පුළුල් කිරීම, ආයෝජක සබඳතා ශක්තිමත් කිරීම සහ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ සම්බන්ධ වීම, ආයෝජක ප්‍රජාව තුළ විශ්වාසය ගොඩනැඟීම සඳහා උපකාරී වීම මඟින්, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම යන කාර්යය ද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරී ඇත.

මීට පෙර අනුගමනය කරන ලද සැලසුම් සහගත නොවූ ක්‍රියාවලියෙන් බැහැරව මධ්‍ය කාලීන, උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කිරීම මඟින්, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ සහාය ලබන ආර්ථික වැඩසටහනේ ප්‍රධාන අරමුණක් වන ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම උදෙසා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවා ඇත. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම තුලින් පිරිවැය අවම කිරීම සහ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අරමුණු කර ගෙන රාජ්‍ය අංශයේ මූල්‍ය අවදානම් අඩුකිරීමට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය අරමුණු කරයි.

ශක්තිමත් සහ ඒකාබද්ධ ණය කළමනාකරණයකට මග පාදන මෙම පුළුල් ප්‍රතිසංස්කරණය මඟින් ශ්‍රී ලංකාවේ දිගුකාලීන රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය සහ ආර්ථික කම්පනයන්ට ඔරොත්තු දීම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇත.

# III කොටස

## සමතුලිත සහ සැමට ප්‍රතිලාභ හිමිවන ආර්ථික වර්ධනය සඳහා සංවර්ධන මූල්‍ය

# 07

# සංවර්ධන මූලාශ

## 7.1 සමාලෝචනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශය තවදුරටත් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දිශානතිය තීරණය කිරීමට විශාලතම දායකත්වය සපයන ක්ෂේත්‍රය ලෙස පිලිගැනෙන අතර රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52 ක්, රැකියා අවස්ථා වලින් සියයට 45ක් සහ අපනයන ආදායමෙන් සියයට 20 ක දායකත්වයක් දක්වයි. එබැවින් පසුබෑමට ලක්වූ ආර්ථිකය නැවත නගා සිටුවීම, අපනයන විවිධාංගීකරණය, ප්‍රාදේශීය ආර්ථික විෂමතා අඩු කිරීම සහ අසරණ ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශයට අවශ්‍ය සහාය ලබාදීම ඉතා වැදගත් වේ. නැතහොත් ආර්ථික කම්පනයන්ට ලක්වීම නිසා සුළු හා මධ්‍ය පරිමාණ අංශය තවදුරටත් ඉතා දුර්වල තත්වයේම පැවතිය හැක.

ශ්‍රී ලංකා රජය සංවර්ධන පාර්ශවකරුවන්ගේ හා බලපත්‍රලාභී බැංකුවල සහය ඇතිව රජයේ ණය යෝජනා ක්‍රම, සහනදායී අරමුදල් හා ණය යෝජනා ක්‍රම යන විවිධ යෝජනා ක්‍රමයන් හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය අරමුදල් ලබා දී ඇත. තවද ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය නැවත සවිබල ගැන්වීම සඳහා රු. බිලියන 16 ක ප්‍රතිපාදන සහිත ප්‍රතිලාභ පැකේජයක් හඳුන්වා දුන් අතර ක්‍රියාකාරී ණය කාණ්ඩය යටතේ ව්‍යාපාර 1,163 කට රු. බිලියන 12.60ක් සහ අක්‍රිය ණය කාණ්ඩය යටතේ රු. මිලියන 45.5 ක් ලබා දීමට කටයුතු කර ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය ණය යෝජනා ක්‍රමය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ඒ යටතේ රු. මිලියන 7,088 සහ රු. මිලියන 5,609ක් පමණ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායන් වෙත ලබා දී ඇත. මෙහිදී කාන්තා ව්‍යාවසායන් සහ ව්‍යවසායන්හි දේශගුණික මූල්‍යකරණය සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී. කුඩා තේවතු හිමියන්ගේ ණය පහසුකම සහ දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල් ප්‍රදානය යටතේ පිළිවෙළින් කුඩා තේවතු හිමියන් 3,865 ක් සහ 2,688 ක් සඳහා ණය වශයෙන් රු. මිලියන 6,066 ක් සහ ප්‍රදාන වශයෙන් රු. මිලියන 381 ක් ලබාදෙන ලදී. ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ, අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා 2025 මාර්තු වන විට ඩොලර් මිලියන 479 ක් භාවිතා කර තිබේ.

ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණය කිරීමට රජය ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර. විස්තීර්ණ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය පිහිටුවීමේ පනත් කෙටුම්පත සමාලෝචනය කරමින් පවතී. තවද, ප්‍රමාණවත් මූල්‍ය සේවා පහසුකම් නොලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය සඳහා වන ප්‍රවේශය වැඩිදියුණු කිරීමට සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය ක්‍රියාත්මක කරන ලද අතර, 2025 වර්ෂය තුලදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 1,800කට පමණ රු. බිලියන 4.2 ක පමණ වටිනා ඇපකර ලබාදීමට බලාපොරොත්තු වේ.

2024 වර්ෂයේදී, අවම සහනික මිල පවත්වා ගැනීම, උපරිම සිල්ලර මිල නියාමනය කිරීම, විශේෂ භාණ්ඩ බදු සංශෝධනය කිරීම සහ අඩු ආදායම්ලාභී පවුල් වලට සෘජුවම සහල් බෙදා හැරීම ඇතුළුව රටේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ, වී අලෙවි මණ්ඩලය මගින් මෙන්ම, බැංකු හරහා ක්‍රියාත්මක කරන ලද ඔඩපණ ණය යෝජනා ක්‍රමය හරහා රු. මිලියන 7,100 ක් පමණ වැය කර වී මෙට්‍රික් ටොන් 66,146 ක් මිලදී ගන්නා ලදී. ඊට සමගාමීව, මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 12,790 ක් වැය කරමින්, අඩු ආදායම්ලාභී පවුල් මිලියන 3.3 ක් වෙත සහල් මෙට්‍රික් ටොන් 66,524 ක් බෙදා දෙන ලදී.

කෘෂිකාර්මික ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, වී වගාවට අමතරව අනෙකුත් ක්ෂේත්‍ර බෝග සඳහාද පොහොර සහනාධාර වැඩසටහන රු. බිලියන 36ක ප්‍රතිපාදන සමග පුළුල් කරන ලදී. පොහොර සහනාධාරය 2023/24 මහ කන්නයේ සිට අදාල වී ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත මුදල් ප්‍රදානයක් ලෙස ලබා දෙන ලදී. මෙම පහසුකම 2024 යල කන්නය තුළ ක්‍රියාත්මක වූ අතර අනෙකුත් ක්ෂේත්‍ර බෝග සහ වී සඳහා පිලිවෙළින් හෙක්ටයාර දෙකක් දක්වා හෙක්ටයාරයකට රු.15,00 0ක් සහ රු. 25,000 ක සහනාධාරයක් 2024/25 මහ කන්නය සඳහා ලබා දී ඇත. තවද අනිවාර්ය බෝග රක්ෂණ ක්‍රමය යටතේ පිලිවෙළින් ගොවීන් 76,671 ක් සහ 7,583 ක් සඳහා වන්දි ගෙවීමට 2023/24 මහ කන්නයේදී රු. මිලියන 1,748 ක් සහ 2024 යල කන්නයේදී රු.මිලියන 142 ක් වැය කරන ලදී. තේ, රබර් සහ පොල් කුඩා වතු හිමියන් 572 ක් සඳහා සහනාධාර ලෙස රු. මිලියන 1,034 ක් ද ලබා දී ඇත.

## 7.2. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍ය සහය

### 7.2.1 බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍ය සහාය සැලසීම

රජයේ මූල්‍ය හා මූල්‍ය නොවන යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දුන් සහයෝගයට අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින්ගේ අරමුදල් අවශ්‍යතාවලින් බහුතරයක් සඳහා මූල්‍ය සම්පාදනය කරන ලද්දේ වාණිජ හා විශේෂිත බැංකු විසින් ඔවුන්ගේ අරමුදල් උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනාක්‍රම හරහා වේ. 2024 වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ඔවුන්ගේම ණය යෝජනාක්‍රම හරහා ආසන්න වශයෙන් රු. මිලියන 1,090,161 ක වටිනාකමකින් යුක්ත ණය ලබා දී තිබේ. (වගුව 7.1)

රාජ්‍ය සහ පෞද්ගලික බැංකු දහසයක් (16) මඟින් 2024 වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය 163,279 කි. ලබා දී ඇති මුළු ණය මුදලින්, සියයට 51 ක ප්‍රමාණයක් කර්මාන්ත අංශයට ලබා දී ඇති අතර සියයට 13 ක ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය හා සේවා අංශ සඳහා සමානව ලබා දී ඇත. (රූප සටහන 7.1)


මීට අමතරව, 2024 වර්ෂය තුළ බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ලබා දී ඇති මුළු ණයවලින් සියයට 48 ක් කාලීන ණය ලෙසද, සියයට 18 ක් අපනයන සඳහා වෙළඳ ණය ලෙසද, සියයට 15 ක් බැංකු අයිරා ලෙසද, සියයට 10 ක් වක්‍රීය ණය පහසුකම් ලෙසද ලබා දී ඇත. (වගුව 7.2)

**වගුව 7.1 | වාණිජ සහ විශේෂිත බැංකු මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අරමුදල් ප්‍රදානය - 2024**

| සහභාගිත්ව මූල්‍ය ආයතනය | කෘෂිකාර්මික | | සේවා | | කර්මාන්ත | | අනෙකුත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු.මිලියන) |
| ලංකා බැංකුව | 3,968 | 39,092 | 1,307 | 4,187 | 3,658 | 22,153 | 3,162 | 15,621 | 12,095 | 81,053 |
| මහජන බැංකුව | 484 | 2,307 | 596 | 3,147 | 6,593 | 31,200 | 1,086 | 4,187 | 8,759 | 40,841 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 7,215 | 8,585 | 5,212 | 9,094 | 5,266 | 9,036 | 923 | 3,002 | 18,616 | 29,716 |
| සණස සංවර්ධන බැංකුව | 1,365 | 3,135 | 347 | 1,288 | 957 | 2,865 | 1,247 | 3,258 | 3,916 | 10,545 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 13 | 42 | 0 | 0 | 7 | 38 | 14 | 365 | 34 | 445 |
| ජාතික සංවර්ධන බැංකුව | 494 | 540 | 488 | 1,132 | 1,738 | 3,484 | 13,786 | 9,462 | 16,506 | 14,618 |
| ඩී එෆ් සී සී බැංකුව | 3569 | 8,271 | 235 | 3,144 | 1,508 | 11,580 | 3,776 | 31,366 | 9,088 | 54,362 |
| කොමර්ෂල් බැංකුව | 2,085 | 33,499 | 2,314 | 27,455 | 26,705 | 266,853 | 374 | 3,139 | 31,478 | 330,945 |
| සම්පත් බැංකුව | 647 | 4,460 | 1,470 | 24,847 | 10,336 | 77,949 | 719 | 2,850 | 13,172 | 110,107 |
| සෙලාන් බැංකුව | 1,510 | 25,756 | 2,123 | 16,445 | 4,591 | 53,774 | 6,101 | 56,395 | 14,325 | 152,370 |
| හැටන් නැෂනල් බැංකුව | 2,919 | 15,412 | 3,419 | 21,135 | 5,735 | 45,915 | 15,484 | 90,580 | 27,557 | 173,042 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 355 | 3,965 | 920 | 7,259 | 1,072 | 11,458 | 52 | 3,231 | 2,399 | 25,913 |
| ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 0 | 0 | 29 | 1,436 | 282 | 10,557 | 64 | 149 | 375 | 12,142 |
| පෑන් ඒෂියා බැංකුව | 103 | 1,543 | 293 | 4,691 | 1,028 | 8,383 | 567 | 7,994 | 1,991 | 22,611 |
| යුනියන් බැංකුව | 150 | 1,033 | 286 | 12,200 | 67 | 1,584 | 2,266 | 14,305 | 2,769 | 29,122 |
| කාර්ගිල්ස් බැංකුව | 13 | 221 | 32 | 537 | 84 | 802 | 70 | 769 | 199 | 2,329 |
| **එකතුව** | **24,890** | **147,861** | **19,071** | **137,996** | **69,627** | **557,632** | **49,691** | **246,673** | **163,279** | **1,090,161** |

මූලාශ්‍රය: අදාළ බැංකු ආයතන

**රූප සටහන 7.1 | ආංශික වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ප්‍රදානය**




මූලාශ්‍රය: අදාළ බැංකු ආයතන

## 7.2.2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ණය යෝජනා ක්‍රම

### 7.2.2.1. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණ ගැන්වීම සඳහා වන ණය යෝජනා ක්‍රමය

#### ද්විත්ව සංරවක ණය සහය

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා විශේෂිත වූ පුනර්ජීවන ණය යෝජනා ක්‍රමයක් 2024 ජූලි 18 වන දින නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙම යෝජනාක්‍රමය සැලසුම් කර ඇත්තේ ශක්‍යතාවක් සහිත ව්‍යාපාරිකයින් සඳහා ඉලක්කගත මූල්‍ය ආධාර සැපයීම සඳහා වන අතර, මූලික සංරවක දෙකක් යටතේ එනම්, ක්‍රියාකාරී ණය කාණ්ඩය යටතේ ආයෝජන ණය ද අක්‍රිය ණය කාණ්ඩය යටතේ කාරක ප්‍රාග්ධන ණය ද ලබා ගැනීමට පහසුකම් සපයා ඇත. ක්‍රියාකාරී ණය සංරවකය යටතේ ආයෝජන ප්‍රාග්ධන සහිත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින්ට ඔවුන්ගේ මෙහෙයුම් පුළුල් කිරීම සඳහා සහය වන අතර, අක්‍රිය ණය සංරවකය යටතේ ආර්ථික පසුබෑම හේතුවෙන් තාවකාලික මූල්‍ය දුෂ්කරතා අත්විඳින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් සඳහා කාරක ප්‍රාග්ධන සහය ලබා දෙනු ලබයි. මෙම ක්‍රියාකාරී හා අක්‍රිය කාණ්ඩ දෙකට සහය දීමෙන් මූල්‍ය අංශය ශක්තිමත් කිරීමට සහ දේශගුණික විපර්යාස ඇතුළුව ඔවුන්ගේ ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්කම් මගින් එල්ල වන අභියෝගවලට අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම ද මෙම ණය යෝජනාක්‍රමයේ අරමුණුයි.

කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, නිෂ්පාදන, තාක්ෂණය සහ අපනයන දිශාභිමුඛ කර්මාන්ත වැනි ප්‍රධාන අංශවල ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මෙම වැඩසටහන ප්‍රමුඛතාව ලබා දෙනු ලබයි. මූල්‍ය ප්‍රවේශයේදී කාන්තාවන් විවිධ බාධකවලට මුහුණදෙන බැවින් ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

**වගුව 7.2 | වාණිජ සහ විශේෂිත බැංකු මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අරමුදල් ප්‍රදානය ණය කාණ්ඩ වශයෙන්**

| ණය කාණ්ඩය | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | % |
|---|---|---|---|
| කාලීන ණය | 44,701 | 329,908 | 30.3 |
| කෙටි කාලීන ණය | 28,349 | 198,559 | 18.2 |
| ලීසිං | 14,386 | 76,885 | 7.0 |
| වක්‍රීය පහසුකම් | 16,701 | 109,607 | 10.0 |
| අයිරා | 22,422 | 158,657 | 14.6 |
| වෙළඳ බිල්පත් - අපනයනය / ආනයනය | 906 | 7,530 | 0.7 |
| වෙළඳ ණය - අපනයනය / ආනයනය | 32,852 | 194,049 | 17.8 |
| අනෙකුත් | 2,962 | 14,967 | 1.4 |
| **එකතුව** | **163,279** | **1,090,161** | **100.0** |

මූලාශ්‍රය: අදාළ බැංකු ආයතන

මෙම ණය යෝජනාක්‍රමය පුළුල් ප්‍රවේශයක් තහවුරු කිරීම සඳහා සහයෝගය අවශ්‍ය සහ වර්ධනය වීමට හැකියාව පෙන්නුම් කරන, කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන ලද ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහනදායී පොලී අනුපාත යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන 15ක් හරහා ණය ලබා දෙනු ලබයි.

2024 වර්ෂයේ දී මෙම පුනර්ජීවන ණය යෝජනා ක්‍රමය සඳහා ආසන්න වශයෙන් රු.මිලියන 20,000 ක් අනුමත කරන ලද අතර ක්‍රියාකාරී ණය සහ අක්‍රිය ණය යන කාණ්ඩ දෙකම ආවරණය වන පරිදි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භයේදී රු. මිලියන 16,000 ක් වෙන් කරන ලදී.

### 7.2.3 සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් අරමුදල් සපයනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනාක්‍රම

#### 7.2.3.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනාක්‍රම (SMELoC) ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය ණය යෝජනා ක්‍රමය මූලික සංරචක තුනක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, (I) කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ප්‍රදානය (We-Fi) සමඟ සම්බන්ධ වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය, (II) දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල් ප්‍රදානය (JFPR) සමඟ සම්බන්ධ වූ තේ නව වගාව, නැවත වගාව, පාළු සිටුවීම, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණය ආදී කටයුතු සඳහා කුඩා තේ වතු හිමියන් සඳහා ලබාදෙන ආයෝජන ණය යෝජනා ක්‍රමය, (III) කොවිඩ් - 19 වසංගතය සහ ආර්ථික පසුබෑම හේතුවෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර ,සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත බලගැන්වීම සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා හදිසි ප්‍රතිචාර සංරචකය (ERC) වේ.

ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, ඩීඑෆ්සීසී බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, පෑන් ඒෂියා බැංකුව, යුනියන් බැංකුව සහ සණස සංවර්ධන බැංකුව යන මූල්‍ය ආයතන දහතුන විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය ලබා දේ.

#### i. සංරචකය I - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය (SME Credit Line)

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය (ආයෝජන ණය සංරචකය) යටතේ සමානුපාතිකව රු. මිලියන 8,000 ක් රු. මිලියන 4,000 බැගින් වූ කොටස් දෙකක් (02) ක් ලෙස සමානුපාතිකව සුදුසුකම් ලත් බැංකු දොළහක් (12) අතර, 2024 වර්ෂයේ ජනවාරි සහ ජූලි මාසවල දී ප්‍රතිපාදන ලෙස බෙදා දෙන ලදී. ඒ අතුරින් 2024 වර්ෂය තුළදී රු. මිලියන 7,088 ක පමණ මුදලක් ආයෝජන ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 569 ක් සඳහා ලබා දී ඇත. වගු අංක 7.4 හි එම විස්තරාත්මක ප්‍රගතිය දක්වා ඇත.

**වගුව 7.3 | සංරචක I ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2024 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී ණය**

| බැංකුවේ නම | අනුමත ණය සංඛ්‍යාව | | | | ප්‍රතිමූල්‍යකරණය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන රු. මිලියන | ණය සංඛ්‍යාව | අනුමත ණය මුදල රු. මිලියන | % මුළු ණය සංඛ්‍යාව | ප්‍රතිපාදනය % | අනුමත ණය මුදල % | ණය මුදල රු. මිලියන | ප්‍රතිපාදනය % | අනුමත ණය මුදල % |
| ලංකා බැංකුව | 1,005.0 | 117 | 1,005.0 | 10.1 | 100.0 | 9.2 | 985.0 | 98.0 | 98.0 |
| සම්පත් බැංකුව | 1,000.0 | 81 | 986.5 | 7.0 | 98.7 | 9.0 | 986.5 | 98.7 | 100.0 |
| සෙලාන් බැංකුව | 765.0 | 66 | 759.1 | 5.7 | 99.2 | 6.9 | 612.0 | 80.0 | 80.6 |
| කොමර්ෂල් බැංකුව | 1,000.0 | 68 | 781.9 | 5.8 | 78.2 | 7.1 | 781.9 | 78.2 | 100.0 |
| ඩී.එෆ්.සී.සී බැංකුව | 1,034.0 | 90 | 1,034.0 | 7.7 | 100.0 | 9.4 | 1,000.0 | 96.7 | 96.7 |
| ජාතික සංවර්ධන බැංකුව | 750.0 | 56 | 718.6 | 4.8 | 95.8 | 6.6 | 646.2 | 86.2 | 89.9 |
| හැටන් නැෂනල් බැංකුව | 850.0 | 89 | 846.1 | 7.7 | 99.5 | 7.7 | 831.6 | 97.8 | 98.3 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 852.2 | 166 | 852.2 | 14.3 | 100.0 | 7.8 | 766.8 | 90.0 | 90.0 |
| මහජන බැංකුව | 750.0 | 69 | 750.0 | 5.9 | 100.0 | 6.8 | 750.0 | 100.0 | 100.0 |
| යුනියන් බැංකුව | 774.0 | 59 | 774.0 | 5.1 | 100.0 | 7.1 | 759.6 | 98.1 | 98.1 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව | 786.2 | 61 | 786.2 | 5.2 | 100.0 | 7.2 | 662.3 | 84.2 | 84.2 |
| පෑන් ඒෂියා බැංකුව | 769.3 | 64 | 769.3 | 5.5 | 100.0 | 7.0 | 617.8 | 80.3 | 80.3 |
| සණස සංවර්ධන බැංකුව | 764.9 | 155 | 764.9 | 13.3 | 100.0 | 7.0 | 720.8 | 94.2 | 94.2 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 750.0 | 14 | 57.4 | 1.2 | 7.7 | 0.5 | 30.4 | 4.1 | 53.0 |
| කාර්ගිල්ස් බැංකුව | 750.0 | 8 | 78.5 | 0.7 | 10.5 | 0.7 | 78.1 | 10.4 | 99.4 |
| **එකතුව** | **12,600.6** | **1,163** | **10,963.7** | **100.0** | **87.0** | **100.0** | **10,228.9** | **81.2** | **93.3** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**විශේෂ සටහන 7.1 | ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණ ගැන්වීම සඳහා වන ණය යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්ම අංශයක් වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය කලාපීය සංවර්ධනය, රැකියා නියුක්තිය සහ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා දායක වී ඇත. එහෙත් රජයේ සහ සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ මූල්‍ය පහසුකම් පැවතියද රට තුළ ඇති වූ මෑතකාලීන ආර්ථික පසුබෑම හේතුවෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය දැඩි පසුබෑමකට ලක්ව ඇත. එම අර්බුදයට විසඳුම් ලෙස සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් 2024 ජූලි මාසයේදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා පුනර්ජීවන පැකේජයක් හඳුන්වා දෙන ලද අතර ඒ සඳහා පහත පරිදි අරමුදල් වෙන් කරන ලදී.

- සංරචකය I (ක්‍රියාකාරී ණය) : පවතින ව්‍යාපාරය පුළුල් කිරීම හෝ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ආයෝජන ප්‍රාග්ධන අවශ්‍ය වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා

- සංරචකය II (අක්‍රිය ණය) : තාවකාලිකව පීඩාවට පත් කාරක ප්‍රාග්ධන අවශ්‍ය වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා

**ණය යෝජනාක්‍රමය පිළිබඳ විස්තර**

| විස්තරය | සංරචකය I ( ක්‍රියාකාරී ණය ) | සංරචකය II (අක්‍රිය ණය ) |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ප්‍රතිපාදන සීමාව (රු.) | මිලියන 20,000 (ක්‍රියාකාරී ණය - මිලියන15,000 , අක්‍රිය ණය - මිලියන 5,000) | |
| වෙන් කළ මුදල (රු.) | මිලියන 16,000 | |
| උපරිම ණය මුදල (රු.) | මිලියන 15 | මිලියන 5 |
| ණය කාලසීමාව (උපරිම) | අවුරුදු 10 | අවුරුදු 5 |
| පොලී අනුපාතය (%) | 7% | 8% |
| සහනදායී පොලී අනුපාතය (%) | 3% වාර්ෂික | 4% වාර්ෂික |
| ණය වර්ගය | ආයෝජන ණය | කාරක ප්‍රාග්ධන ණය |
| සහභාගීත්ව මූල්‍ය ආයතන | 15 | |

**2024.12.31 දිනට ප්‍රගතිය**

මෙම ණය යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන පහළොවක් සමඟ ගිවිසුම් අත්සන් කරන ලද අතර, ඒ එක් එක් බැංකුවට ඔවුන්ගේ ඉල්ලීම සහ ධාරිතාව මත පදනම්ව අරමුදල් වෙන් කරන ලදී. ක්‍රියාකාරී ණය සංරචකය යටතේ රු. මිලියන 750 සිට රු. මිලියන 1,000 දක්වා අරමුදල් වෙන් කරන ලදී. මුළු ප්‍රතිපාදනවලින් ණය 1,163 ක් සඳහා රු. මිලියන 10,963.7 ක් අනුමත කරන ලද අතර ප්‍රතිමූල්‍යකරණය කරන ලද මුළු ණය මුදල රු. මිලියන 10,228.9 කි. ඊට අමතරව, අක්‍රිය ණය සංරචකය යටතේ එක් එක් බැංකු සඳහා රු.මි. 200 ක් වෙන් කරන ලද අතර, රු. මිලියන 45.5 ක් අනුමත කර එම මුදලම ප්‍රතිමූල්‍යකරණය කර ඇත.

| විස්තරය | සංරචකය I ( ක්‍රියාකාරී ණය ) | සංරචකය II (අක්‍රිය ණය ) |
|---|---|---|
| අනුමත ණය මුදල (රු. මිලියන) | 10,963.7 | 45.5 |
| අනුමත ණය (ප්‍රමාණය) | 1,163 | 11 |
| ප්‍රතිමූල්‍යකරණය කළ මුදල(රු. මිලියන) | 10,228.9 | 45.5 |

### ii. සංරචකය II - කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනා ක්‍රමය සහ දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල් ප්‍රදානය (JFPR)

කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ තේ නව වගාව, නැවත වගාව, පාළු සිටුවීම, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණය ආදී කටයුතු සඳහා රු. මිලියන 6,066 ක් තේ වතු හිමියන් 3,865 දෙනෙකු වෙත ආයෝජන ණය ලෙස ලබා දෙන ලදී. ඒ අතුරින් කුඩා තේ වතු හිමියන් 2,688 දෙනෙක් සඳහා තේ නව වගාව සහ නැවත වගාව වෙනුවෙන් රු. මිලියන 380 කට ආසන්න මුදලක්, දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල් ප්‍රදානය (JFPR) ආයෝජන ණය සමඟ මුසුකරමින් ලබා දී ඇත. තවද, රු. මිලියන 6,066 අතරින් සියයට 45 ක ප්‍රතිශතයක් තේ නැවත වගාව වෙනුවෙන් හා සියයට 46 ක ප්‍රතිශතයක් තේ නව වගාව වෙනුවෙන් ලබා දී ඇත. (වගුව 7.5)

### 7.2.3.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය (SMELoC2)

ආසියානු සංවර්ධන බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩි දියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය යටතේ ඇ.ඩො. මිලියන 100 ක් ලබා දුන් අතර, එයින් ඇ.ඩො. මිලියන 50 ක් SMELOC2 ව්‍යාපෘතිය යටතේ, පසුගිය වසර කිහිපය තුළ ආර්ථිකයට ඇති වූ හදිසි කම්පන හේතුවෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සඳහා තවදුරටත් සහාය වීමට යොදවන ලදී. ඉතිරි ඇ. ඩො. මිලියන 50 ක මුදල, ජාතික ණය සුරැකුම් ආයතනයේ (NCGIL) මූලික ආයෝජනය සඳහා වෙන් කරන ලදී. මීට අදාල ණය ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් 2024 මාර්තු 25 වන දින අත්සන් කරන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩි දියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය යටතේ, පළමු අත්තිකාරම ලෙස රු. මිලියන 6,826 කට ආසන්න මුදලක් සහභාගිත්ව මූල්‍ය ආයතන දහතුනක් (13) ක් සඳහා වෙන් කරන ලද අතර ඉන් රු. මිලියන 5,609 ක් කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, කර්මාන්ත, තාක්ෂණය සහ අපනයන ප්‍රමුඛ අංශවල නියැලී සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ලබා දෙන ලදී. එයින්, වෙළඳාම, ලීසිං සහ කුලියට දීමේ ව්‍යාපාර හැර අනෙකුත් සියලුම අංශවලට අදාලව කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායන් සඳහා රු. මිලියන 1,930 ක් පමණ ණය ලබා දෙන ලද අතර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හි දේශගුණික මූල්‍යකරණ (Climate Finance) ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 1,397 කට ආසන්න ණය ලබා දෙන ලදී. තවද, 2024 නොවැම්බර් මසදී දෙවන අත්තිකාරම ලෙස සුදුසුකම් ලත් මූල්‍ය ආයතන දහය (10)ක් අතර රු. මිලියන 8,000 කට ආසන්න මුදලක් බෙදාහරින ලදී. (වගුව 7.6)

### 7.2.3.3 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (ICL) ඇ.ඩො. මිලියන 1,000 ණය පහසුකම

ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට ඇ.ඩො. මිලියන 1,000 ක ණය පහසුකමක් ලබා ගැනීම සඳහා, ශ්‍රී ලංකා රජය (GoSL) සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව (SBI) අතර ණය ගිවිසුමක් 2022 මාර්තු 17 වන දින අත්සන් කරන ලදී. ආර්ථික අර්බුදයක් දැඩිව පැවති කාලය තුළ ආහාර, ඖෂධ සහ කාර්මික යෙදවුම් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ අඛණ්ඩව සැපයීම සහතික කිරීම මෙම ගිවිසුමේ මූලික අරමුණ විය.

තවදුරටත් ඖෂධ ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා තිබූ අවශ්‍යතාවය සහ ඒ වන විටත් ඉතිරිව තිබූ අරමුදල් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, ඉතිරි අරමුදල් භාවිතා කිරීමේ අවසාන දිනය, 2024 මාර්තු 16 දක්වා දීර්ඝ කිරීමට ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින් එකඟ විය. එක් එක් අංශයේ අවශ්‍යතාවයන්, ආනයන ඉල්ලීම් අවලංගු කිරීම් සහ ප්‍රතික්ෂේප කිරීම්

**වගුව 7.4 | 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකයේ ප්‍රගතිය**

| සහභාගිත්ව මූල්‍ය ආයතනය | ප්‍රතිපාදිත ණය මුදල (රු. මිලියන) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය | | |
|---|---|---|---|---|
| | | ලබා දුන් ණය | | % |
| | | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ලබා දුන් ණය |
| ලංකා බැංකුව | 1,145.0 | 132 | 1,021.3 | 89.0 |
| මහජන බැංකුව | 717.4 | 55 | 671.0 | 94.0 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 342.3 | 14 | 31.5 | 9.0 |
| සණස සංවර්ධන බැංකුව | 395.1 | 74 | 315.4 | 80.0 |
| සම්පත් බැංකුව | 600.0 | 30 | 582.5 | 97.0 |
| හැටන් නැෂනල් බැංකුව | 794.7 | 65 | 740.7 | 93.0 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 830.7 | 44 | 744.4 | 90.0 |
| කොමර්ෂල් බැංකුව | 1,263.4 | 50 | 1,183.4 | 94.0 |
| ජාතික සංවර්ධන බැංකුව | 470.0 | 22 | 470.0 | 100.0 |
| සෙලාන් බැංකුව | 371.0 | 12 | 351.5 | 95.0 |
| යුනියන් බැංකුව | 371.0 | 24 | 336.0 | 91.0 |
| ඩී එෆ් සී සී බැංකුව | 699.4 | 47 | 640.5 | 92.0 |
| **එකතුව** | **8,000.0** | **569** | **7,088.2** | **89.0** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**වගුව 7.5 | කුඩා තේ වතු හිමියන් සඳහා ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| සහභාගිත්ව මූල්‍ය ආයතනය | ප්‍රතිපාදිත ණය මුදල (රු. මිලියන) | ලබා දුන් ණය | | | ප්‍රතිපාදිත ණය මුදල (රු. මිලියන) | දරිද්‍රතාවය අවම කිරීම සඳහා ජපන් අරමුදල් ප්‍රදානය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ලබා දුන් ණය % | | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ලබා දුන් ණය % |
| ලංකා බැංකුව | 873.2 | 867 | 873.2 | 100 | 54.0 | 608 | 54.0 | 100 |
| මහජන බැංකුව | 596.7 | 416 | 596.7 | 100 | 31.7 | 294 | 31.7 | 100 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 1,079.6 | 1,051 | 1,079.6 | 100 | 69.0 | 622 | 69.0 | 100 |
| සණස සංවර්ධන බැංකුව | 159.8 | 104 | 159.8 | 100 | 6.6 | 49 | 6.6 | 100 |
| සෙලාන් බැංකුව | 442.6 | 196 | 442.6 | 100 | 42.3 | 179 | 42.3 | 100 |
| සම්පත් බැංකුව | 233.6 | 68 | 233.6 | 100 | 13.2 | 50 | 13.2 | 100 |
| ජාතික සංවර්ධන බැංකුව | 442.6 | 87 | 442.6 | 100 | 20.7 | 49 | 20.7 | 100 |
| හැටන් නැෂනල් බැංකුව | 537.9 | 297 | 537.9 | 100 | 37.0 | 244 | 37.0 | 100 |
| ඩී එෆ් සී සී බැංකුව | 409.3 | 206 | 409.3 | 100 | 28.6 | 189 | 28.6 | 100 |
| යුනියන් බැංකුව | 362.0 | 94 | 362.0 | 100 | 25.3 | 66 | 25.3 | 100 |
| කොමර්ෂල් බැංකුව | 560.0 | 388 | 560.0 | 100 | 36.8 | 276 | 36.8 | 100 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 208.7 | 27 | 208.7 | 100 | 2.7 | 7 | 2.7 | 100 |
| පැන් ඒෂියා බැංකුව | 160.3 | 64 | 160.3 | 100 | 12.9 | 55 | 12.9 | 100 |
| **එකතුව** | **6,066.3** | **3,865** | **6,066.3** | **100** | **380.8** | **2,688** | **380.8** | **100** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**වගුව 7.6 | 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතියේ (SMELoC2) ප්‍රගතිය**

| සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම | ප්‍රතිපාදිත ණය මුදල (රු. මිලියන) | ලබා දුන් ණය | | | කාන්තා මූලික ව්‍යවසාය | | දේශගුණික මූල්‍යකරණය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ලබා දුන් ණය % | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) |
| ලංකා බැංකුව | 593.6 | 87 | 568.6 | 96 | 16 | 84.0 | 10 | 87.1 |
| මහජන බැංකුව | 593.6 | 79 | 553.0 | 93 | 14 | 71.5 | 13 | 82.5 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 593.6 | 260 | 537.5 | 91 | 122 | 182.0 | 89 | 241.6 |
| සණස සංවර්ධන බැංකුව | 296.8 | 59 | 296.8 | 100 | 21 | 75.8 | 17 | 84.5 |
| සම්පත් බැංකුව | 593.6 | 60 | 528.8 | 89 | 7 | 51.5 | 8 | 69.5 |
| හැටන් නැෂනල් බැංකුව | 593.6 | 78 | 574.0 | 97 | 14 | 91.2 | 37 | 286.5 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 593.6 | 55 | 510.5 | 86 | 16 | 148.5 | 13 | 125.0 |
| කොමර්ෂල් බැංකුව | 593.6 | 64 | 563.6 | 95 | 15 | 124.9 | 13 | 118.0 |
| ජාතික සංවර්ධන බැංකුව | 593.6 | 64 | 593.6 | 100 | 16 | 140.0 | 16 | 152.0 |
| සෙලාන් බැංකුව | 593.6 | 20 | 156.5 | 26 | 3 | 30.0 | 8 | 68.5 |
| යුනියන් බැංකුව | 296.8 | 0 | 0.0 | 0 | 0 | 0.0 | 0 | 0.0 |
| ඩී එෆ් සී සී බැංකුව | 593.6 | 67 | 552.0 | 93 | 12 | 901.5 | 9 | 67.1 |
| පැන් ඒෂියා බැංකුව | 296.8 | 19 | 174.0 | 59 | 3 | 30.0 | 2 | 15.0 |
| **එකතුව** | **6,826.4** | **912** | **5,609.3** | **82** | **259** | **1,930.9** | **235** | **1,397.3** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

සමාලෝචනය කිරීමෙන් පසු ණය පහසුකම් යටතේ වෙන් කරන ලද මුදල, අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ඇ.ඩො. මිලියන 100 ක්, ඖෂධ සඳහා ඇ.ඩො. මිලියන 360 ක්, කාර්මික අමුද්‍රව්‍ය සඳහා ඇ.ඩො. මිලියන 70 ක් සහ ඉන්ධන සඳහා ඇ.ඩො. මිලියන 200 ක් ලෙස සංශෝධනය කරන ලදී. ඉතිරිය අනාගතයේ ඇති විය හැකි අවශ්‍යතා සපුරාලීම සඳහා වෙන් කරන ලදී.

මේ යටතේ ඇ.ඩො. මිලියන 481 ක් වටිනා භාණ්ඩ ආනයනය කිරීමට පහසුකම් සැලසූ අතර එයින් ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 479 ක් සඳහා අපනයනකරුවන්ට ගෙවීම් සහතික කරමින් ගෙවීම් නිර්දේශ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය (HCI) වෙත නිකුත් කර ඇත.

ආනයනය කරන ලද භාණ්ඩ වෙනුවෙන් ඉන්දියානු අපනයනකරුවන්ට ගෙවීම් සහතික කිරීම සඳහා, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හරහා ඉන්දියානු රාජ්‍ය බැංකුව වෙත ගෙවීම් නිර්දේශ නිකුත් කිරීමට 2025 මාර්තු 31 දක්වා තවදුරටත් අවසර ලබා දුන් අතර ඒ අනුව ණය පහසුකම් උපයෝජනය කිරීමට අදාළව 2025 මාර්තු 31 දිනට ප්‍රගතිය පහත වගු අංක 7.7 මඟින් දැක්වේ.

වගුව 7.7 | ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ 2025 මාර්තු 31 දිනට ප්‍රගති සාරාංශය

| අනු අංකය | විස්තරය | | (ඇ.ඩො. මිලියන) |
|---|---|---|---|
| 1 | එකඟ වූ මුළු මුදල | | 1,000.0 |
| 2 | උපයෝජනය කළ මුළු මුදල | | 481.0 |
| 3 | භාවිත කළ මුළු මුදල (ගෙවීම් නිර්දේශ නිකුත් කළ) | | 479.1 |
| | අත්‍යවශ්‍ය භාණ්ඩ | 78.4 | |
| | ඖෂධ | 139.9 | |
| | කාර්මික අමුද්‍රව්‍ය | 43.8 | |
| | ඉන්ධන | 200.0 | |
| | සූර්ය පැනල ව්‍යාපෘතිය | 17.0 | |
| 4 | 2025.03.31 දිනට උපයෝජන ගිණුමේ ඉතිරි මුදල | | 1.9 |

මූලාශ්‍රය: ඉන්දියානු ණය පහසුකම් සම්බන්ධීකරණ ඒකකය

## 7.2.4 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා සහය වන මූල්‍ය නොවන යෝජනාක්‍රම

### 7.2.4.1 සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය

අමාත්‍ය මණ්ඩල අනුමැති සහිතව 2023 වර්ෂයේදී පොදු සීමිත සමාගමක් ලෙස පිහිටුවන ලද සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට ස්ථාපිත කර ඇත. කොටස්හිමි මූල්‍ය ආයතන විසින් නිකුත් කරන බැංකු ණය සඳහා ණය ඇපකර ලබා දීමෙන් ඌන සේවා ලත් ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රවේශය පහසු කිරීම සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි අරමුණයි.

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතිය යටතේ ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජය සහ බලපත්‍රලාභී බැංකු 10 ක් සහ බලපත්‍රලාභී බැංකු නොවන මූල්‍ය ආයතන 3 ක් ඇතුළු කොටස් හිමියන්ගේ මූල්‍ය ආයතන 13 ක් සහය ලබා දෙනු ලැබේ. එහි මූල්‍ය ආකෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ සහය ඇතිව ඇ.ඩො. මිලියන 50 ක් ආයෝජනය කර ඇති අතර එය සියයට 90 ක කොටස් හිමිකමක් වන අතර ඉතිරි සියයට 10 සඳහා කොටස් හිමියන්ගේ මූල්‍ය ආයතන 13 ඔවුන්ගේ ප්‍රාග්ධනය යොදවනු ලැබේ.

### 2024 වර්ෂයේදී ලැබූ ප්‍රවර්ධනයන්

ආයතනික සංධිස්ථාන: 2024 ජූනි මාසයේදී ශ්‍රී ලංකා රජයෙන් සහ කොටස් හිමි මූල්‍ය ආයතන 13 කින් ඇ.ඩො. මිලියන 55.37 ක් සමස්ත ප්‍රාග්ධන අරමුදල් ලෙස සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය වෙත ලබා දෙන ලදී.

පාලනය සහ මෙහෙයුම්: ඇපකර නිකුතුව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණ කණ්ඩායම ඇතුළු පාලන ව්‍යුහය ද අනෙකුත් යටිතල පහසුකම් ද නියමිත ලෙස ස්ථාපනය කරන ලදී. සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයේ මෙහෙයුම් ආරම්භ කිරීමට පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය මෙහෙයුම් ආකෘතිය සහ මාර්ගෝපදේශන සමන්විත ගිවිසුම අත්සන් කරන ලද අතර මේ සඳහා සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය කොටස්හිමි මූල්‍ය ආයතන 13 සමඟ ගිවිසුම් ගතවිය.

### උපායමාර්ගික ඉදිරි දැක්ම

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ අන්තර්කරණ ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා සිය කාර්යභාරය ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහි අන්තර්ගත මූලික ප්‍රමුඛතා ලෙස

- කාර්යසාධන රාමු ශක්තිමත් කිරීම
- කාර්යක්ෂම අවදානම් බෙදාගැනීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම
- ආයතනික තිරසරභාවය තහවුරු කිරීම
- ණය අවභිරතා සහිත ව්‍යවසායන් සඳහා මූල්‍ය විසඳුම් ලබා දීම

යනාදිය ඇතුළත් වේ.

මෙම ක්‍රියාමාර්ග තුළින් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පද්ධතියට තිරසාර සංවර්ධනය සඳහා විශ්වාසදායක ජාතික පහසුකම් සපයන්නා බවට පත්වීමත්, එමගින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය ප්‍රවේශයට ඇති බාධක ඉවත් කිරීමත්, සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි අරමුණ වේ.

ප්‍රමුඛතා අංශ සහ කාන්තා ව්‍යාපාර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් රට පුරා සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහය වීමට සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය සැලසුම් කර ඇති අතර බස්නාහිර පළාතෙන් පිටත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් කොටස්හිමි මූල්‍ය ආයතන 13 ම ආවරණය වන පරිදි මුළු වටිනාකම රු. මිලියන 4,200 ක් වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 1,800 ක් 2025 වර්ෂය සඳහා ඉලක්ක කර ඇත. සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය විසින් කොටස්හිමි මූල්‍ය ආයතන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇති අතර මෙම නව වැඩසටහන ඔවුනට හොඳින් අවබෝධ වන තුරු හා සහයෝගය ලබා ගැනීමට අවශ්‍ය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගන්නා තුරු එම දැනුවත් කිරීමේ කටයුතු ඉදිරියටත් ක්‍රියාත්මක කරනු ලබයි. වෙළඳ සංවිධාන, වාණිජ මණ්ඩල, අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ මුද්‍රිත මාධ්‍ය, ඩිජිටල් අලෙවිකරණය හරහා මෙම වැඩසටහන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ළඟාවීම සඳහා සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය කටයුතු කර ඇති අතර 2025 ජනවාරි 3 වන සතිය තුළ ඇපකර මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතව තිබුණි.

### 7.2.4.2 ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා විස්තීර්ණ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම

2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතින් ආවරණය නොවූ අංශ ආවරණය කිරීම සඳහා නව නියාමන රාමුවක් ලෙස යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත, අමාත්‍ය මණ්ඩලය විසින් 2023 ඔක්තෝබර් 09 වන දින අනුමත කරන ලදුව 2023 ඔක්තෝබර් 30 වන දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. එය 2024 ජනවාරි 09 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර පසුව එය විවිධ පාර්ශවකරුවන් විසින් අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කෙරිණ.

අනතුරුව, ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුව විසින් පනත් කෙටුම්පත හා සම්බන්ධිත විවිධ පාර්ශවකරුවන් කැඳවා කෙටුම්පත සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර පිළිබඳ කිහිපවරක් සාකච්ඡා කළ අතර, 2024 පෙබරවාරි 09 වන දින පැවති කමිටු තීරණය අනුව, පවතින ගැටලු අධ්‍යයනය කර පනත් කෙටුම්පත නැවත සංශෝධනය කිරීම සඳහා 2024 පෙබරවාරි 16 වන දින සමාලෝචන කමිටුවක් පත් කරන ලදී. එම කමිටුව විසින් කෙටුම්පත සංශෝධනය සඳහා තවදුරටත් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය දක්වමින් 2024 පෙබරවාරි 26 දින අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, පාර්ශ්වකරුවන්ගේ ගැටලු අධ්‍යයනය කර කෙටුම්පත සංශෝධනයට නිර්දේශ ලබා දීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් සහ මෙහෙයුම් කමිටුවක් පිහිටුවනු ලැබිණ. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ක්‍රියාකාරී කමිටුව සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වූ අතර, කමිටුව විසින් පනත් කෙටුම්පත සඳහා සංශෝධන යෝජනා කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පෙන්සම් සඳහා ලබාදුන් තීරණ සහ ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධානවල පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම් ප්‍රධාන වශයෙන් සලකා බලා ඇත. ක්‍රියාකාරී කමිටුව විසින් නිර්දේශිත යෝජනා, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (සම සභාපති), නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සම සභාපති) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සාමාජික) යන නිලධාරීන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලැබිණ.

2025 මාර්තු 31 දින වන විට, ක්‍රියාකාරී කමිටුව සහ මෙහෙයුම් කමිටුව සිය කාර්යභාරය අවසන් කර මෙහෙයුම් කමිටු නිර්දේශ අනුව පනත් කෙටුම්පත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

## 7.2.5 කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සහාය වන යෝජනා ක්‍රම

### 7.2.5.1 පොහොර සහනාධාර වැඩසටහන

මූල්‍ය බාධක වලට ප්‍රතිචාර වශයෙන් මෙන්ම කෘෂිකර්මාන්තය දිරිගැන්වීමේ වැදගත්කම ද සලකමින්, වී ගොවීන් සඳහා සහනාධාර ලබා දීමේදී සෘජු මූල්‍ය ප්‍රදාන ක්‍රමයකට මාරුවෙමින්, ශ්‍රී ලංකා රජය පොහොර සහනාධාර වැඩසටහන අඛණ්ඩව මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී. මෙම සෘජු මූල්‍ය ප්‍රදාන ක්‍රමය, 2023/24 මහ කන්නයේ සිට හෙක්ටයාරයකට රු. 15,000 ක උපරිමයකට යටත්ව හෙක්ටයාර දෙකක් දක්වා වන සේ ගොවීන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම තැන්පත් කරමින් ආරම්භ කෙරිණ. මෙම ක්‍රමවේදය, 2024 යල කන්නයේදී ද, 2024/25 මහ කන්නය සඳහා සහනාධාරය හෙක්ටයාරයකට රු. 25,000 ක උපරිමයකට (හෙක්ටයාර දෙකක් දක්වා) ඉහළ නංවමින් ද ක්‍රියාත්මක කරනු ලැබිණ.

සෘජු මූල්‍ය ප්‍රදාන ක්‍රමවේදයට යොමු වීමෙන්, සාම්ප්‍රදායික පොහොර බෙදා හැරීම හා සම්බන්ධ මෙහෙයුම්, සැපයුම් සහ පරිපාලන වියදම් අවම කර ගනිමින් සහනාධාර වැඩසටහනේ සැලකිය යුතු කාර්යක්ෂමතාවයක් ලබා ගැනීමට හැකි විය. 2024 යල කන්නය දක්වා සහනාධාර වැඩසටහන, වී වගාව පමණක් මූලික කර ගනිමින් ක්‍රියාත්මක වූ අතර, අනෙකුත් ක්ෂේත්‍ර භෝග බැහැර කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා වන පොහොර අවශ්‍යතාවය, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සැපයුම්කරුවන් මගින් වෙළඳපොළ මත පදනම්ව සපුරා ගන්නා ලදී. 2024/25 මහ කන්නයේදී, පැවති රාජ්‍ය ප්‍රතිපත්තිය සංශෝධනය කරමින්, ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම අරමුණු කර ගනිමින්, කුඹුරු ඉඩම්වල අනෙකුත් ක්ෂේත්‍ර භෝග වගා කරන ගොවීන්ට, හෙක්ටයාරයකට රු. 15,000 ක උපරිමයකට යටත්ව හෙක්ටයාර දෙකක් දක්වා මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට පියවර ගනු ලැබිණ.

**වගුව 7.8 | කුඩා පරිමාණ වැවිලි ක්ෂේත්‍රයේ කාර්ය සාධනය 2021-2024**

| වර්ෂය | තේ | | | රබර් | | | පොල් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වගා කරන ලද භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑ. මිලියන) | නිෂ්පාදනයේ මුළු වටිනාකම (රු. මිලියන) | වගා කරන ලද භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑ. මිලියන) | නිෂ්පාදනයේ මුළු වටිනාකම (රු. මිලියන) | වගා කරන ලද භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑ. මිලියන) | නිෂ්පාදනයේ මුළු වටිනාකම (රු. මිලියන) |
| **2021** | 157,971 | 299 | 196,198 | 138,622 | 77 | 33,920 | 456,137 | 3,382 | 166,034 |
| **2022** | 267,000 | 252 | 411,055 | 98,584 | 71 | 44,971 | 456,137 | 3,391 | 262,934 |
| **2023** | 267,000 | 256 | 428,292 | 98,393 | 64 | 36,607 | 480,215 | 3,169 | 228,720 |
| **2024** | 269,000 | 262 | 433,473 | * | 69 | 55,835 | 484,677 | 2,792 | 257,921 |

මූලාශ්‍රය:වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

*වගාකරන ලද රබර් භූමි ප්‍රමාණය - 2024 වසර සඳහා වන සමීක්ෂණයෙන් පසුව තීරණය වේ.

ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව ආනයනය කරනු ලැබූ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) ඉතිරි පොහොර තොගය සෘජු සහ මිශ්‍ර පොහොර ලෙස අලෙවි කිරීමට පියවර ගත් අතර, පවත්නා සම්පත් උපරිම ලෙස උපයෝජනය කිරීම එහි අරමුණ විය. එසේම, ලෝක ආහාර වැඩසටහන වෙතින්, මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර මෙට්‍රික් ටොන් 55,000 ක ප්‍රදානයක් ශ්‍රී ලංකාවට ලැබුණු අතර මෙම තොගයෙන් සියයට 50 ක් වී සහ අනෙකුත් භෝග සඳහා ද ඉතිරි සියයට 50 පොල් වගාව සඳහා ද වෙන් කරන ලදී.

ඵලදායීතාව ඉහළ නැංවීම, නිරසාර ගොවිතැන ප්‍රවර්ධනය සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ තිර පැවැත්ම සහතික කිරීමේ රජයේ වගකීම සහතික කරමින්, 2024 වර්ෂයේ දී, රජය පොහොර සහනාධාර වැඩසටහන සඳහා රු. මිලියන 36,000 ක් වෙන් කරන ලදී.

### 7.2.5.2 කුඩා වතු වගාකරුවන් සඳහා සහය වීම

කුඩා වතු වගාකරුවන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම තුළින් ප්‍රධාන අපනයන භෝගයන්හි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා තේ, රබර් සහ පොල් කුඩා වතු හිමියන්ට නව වගාකිරීම, නැවත වගා කිරීම, ඉඩම් සකස් කිරීම, පැළ සංරක්ෂණය සහ අනෙකුත් අවශ්‍යතා ආවරණය වන පරිදි රජය විසින් සහනාධාර ලබාදේ. ඒ අනුව, 2024 වර්ෂයේ දී රු. මිලියන 1,034.46 ක් තේ, රබර් සහ පොල් කුඩා වතු හිමියන් 572 දෙනෙකු වෙත ලබා දී ඇති අතර, ඒ අතුරින් රු. මිලියන 663.46 ක් තේ වගාකරුවන් 531 දෙනෙකු සඳහාද රු. මිලියන 367.9 ක් රබර් වගාකරුවන් සඳහාද ලබා දෙන ලදී. මීට අමතරව, මෙම සහනාධාර වැඩසටහන යටතේ පොල් වගාකරුවන් 41 දෙනෙකු සඳහා රු. මිලියන 3.1 ක් ලබා දී ඇත. (වගුව 7.8)

### 7.2.5.3 කුකුළු ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන අංශයේ සංවර්ධනය

කුකුළු මස්, කිරි සහ බිත්තර ශ්‍රී ලංකාවේ වඩාත්ම විශ්වාසදායක සහ පහසුවෙන් සපයා ගතහැකි ප්‍රෝටීන් ප්‍රභවයන් අතර වේ. කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැයෙන් සියයට 80ක් 90 ක් පමණම සත්ත්ව ආහාර පිරිවැය වන අතර, සත්ත්ව ආහාර වල මිල ඉහළ යාම කුකුළු ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයට දැඩි ලෙස බලපාන ලදී. ගුණාත්මක සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවම වශයෙන් අමුද්‍රව්‍ය වලින් 40% ක පමණ ප්‍රමාණයක් බඩ ඉරිහු විය යුතු වේ.

මිල හැසිරවීම් වළක්වමින් සත්ත්ව ආහාර අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා, 2024 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ බඩ ඉරිහු මෙට්‍රික් ටොන් 300,000 ක් ආනයනය කිරීමට රජය අනුමැතිය ලබා දෙන ලදී. නියාමන රාමුවක් යටතේ දේශීය වෙළඳපොළ ආරක්ෂා කෙරෙන පරිදි ආරක්ෂිත පියවරයන් ද සහිතව ආනයන බලපත්‍ර නිකුත් කරන ලද අතර බලපත්‍රලාභී පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන හරහා ආනයනය සිදු කරන ලදී.

බිත්තර මිල ඉහළ යාම කළමනාකරණය කරමින් දැරිය හැකි මිලකට ප්‍රෝටීන් ප්‍රභවයන් ලබා ගැනීම සහතික කිරීම සඳහා, 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ බිත්තර මිලියන 60 ක් දක්වා ආනයනය කිරීමට ද රජය විසින් අවසර ලබා දෙන ලදී. එසේම, උත්සව සමයේ ඉහළ ගිය බිත්තර ඉල්ලුම සමනය කිරීමේ අරමුණින්, 2024 අප්‍රේල් 20 වන දින දක්වා තවත් බිත්තර මිලියන 30 ක් ආනයනය කිරීමට ද අනුමැතිය දෙන ලදී. ඒ අනුව, මෙම කාලය තුළ ඉන්දියාවෙන් ආසන්න වශයෙන් බිත්තර 65,180,160 ක් ආනයනය කර ඇත.

**වගුව 7.9 | 2024 සිට 2025 දක්වා බඩ ඉරිහු ආනයනය කිරීමේ ප්‍රගතිය**

| විස්තරය | ප්‍රමාණය (මෙ.ටො) |
|---|---|
| ආනයනය කිරීමට අනුමත කරන ලද ප්‍රමාණය (2024 ජූලි - දෙසැම්බර්) | 300,000.00 |
| ආනයනය කරන ලද ප්‍රමාණය (2024 අගෝස්තු – 2025 පෙබරවාරි) | 255,426.39 |

ආනයනය කරන ලද්දේ :

පෞද්ගලික සත්ත්ව ආහාර නිෂ්පාදකයින්, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

මූලාශ්‍රය: ආනයනික බඩ ඉරිහු නිෂ්කාශන වාර්තාව – සත්ත්ව නිරෝධායන කාර්යාලය, කොළඹ

කුකුළු ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන අංශය ස්ථාවර කිරීම, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ මහජනතාවට ප්‍රෝටීන් ප්‍රභවයන් අඩු වියදමකින් අඛණ්ඩව ලබා ගැනීම සහතික කිරීම සඳහා මෙම උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කරන අතර එමඟින් යෙදවුම් පිරිවැය උච්ඡාවචනයන් මහහරවා ගැනීමට දේශීය පශු සම්පත් නිෂ්පාදකයින්ට සහායක් වෙමින් ජාතියේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමට මහ පාදනු ලබයි.

**වගුව 7.10 | 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා බිත්තර ආනයන ප්‍රගතිය**

| මාසය | බිත්තර ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 944,640 |
| පෙබරවාරි | 32,117,760 |
| මාර්තු | 30,700,800 |
| අප්‍රේල් | 1,416,960 |
| එකතුව | 65,180,160 |

මූලාශ්‍රය: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

### 7.2.5.4 අනිවාර්ය භෝග රක්ෂණය

වී සහ අනෙකුත් වාණිජ භෝග වන බඩඉරිහු, සෝයා බෝංචි, ලොකු එෑණු, අර්තාපල් සහ මිරිස් සඳහා වන හානි සඳහා පුළුල් රක්ෂණ ආවරණයක් ලබාදීමේ අරමුණින් අනිවාර්ය භෝග රක්ෂණ ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය මඟින් නියඟය, ගංවතුර සහ වන අලි නිසා සිදු වන හානි ආවරණය කරනු ලබන අතර අක්කරයකට රු. 40,000 ක් වන පරිදි වී අක්කර පහක් (5) සහ අනෙකුත් වාණිජ භෝග සඳහා අක්කර 2.5 ක් දක්වා වූ උපරිම භූමි ප්‍රමාණයක් සඳහා රක්ෂණ ආවරණය හිමිවේ. මෙම යෝජනා ක්‍රමය ගොවීන් සඳහා නොමිලේ ක්‍රියාත්මක කරනු ලබන අතර රජය විසින්

**වගුව 7.11 | 2024 වර්ෂයේ අනිවාර්ය භෝග රක්ෂණ ආවරණයේ ප්‍රගතිය**

| අංකය | දිස්ත්‍රික් කාර්යාලය | 2024 යල | | 2023/24 මහ | |
|---|---|---|---|---|---|
| | | ගොවීන් සංඛ්‍යාව | වන්දි මුදල (රු. මිලියන) | ගොවීන් සංඛ්‍යාව | වන්දි මුදල (රු. මිලියන) |
| 1 | අම්පාර | 308 | 7.8 | 15,912 | 349.2 |
| 2 | අනුරාධපුරය | 451 | 8.9 | 6,015 | 127.2 |
| 3 | බදුල්ල | 325 | 5.7 | 1,828 | 35.5 |
| 4 | මඩකලපුව | 101 | 3.1 | 17,439 | 466.8 |
| 5 | කොළඹ | 23 | 0.3 | - | - |
| 6 | ගාල්ල | 2,567 | 28.6 | 452 | 4.6 |
| 7 | ගම්පහ | 363 | 3.9 | 2,891 | 26.2 |
| 8 | හම්බන්තොට | 66 | 2.3 | 1,901 | 41.5 |
| 9 | යාපනය | 0 | 0.0 | – | 0.0 |
| 10 | කළුතර | 680 | 5.5 | 632 | 6.5 |
| 11 | නුවර | 53 | 0.8 | 175 | 1.5 |
| 12 | කෑගල්ල | 0 | 0.0 | 461 | 1.5 |
| 13 | කිලිනොච්චිය | 0 | 0.0 | 870 | 27.4 |
| 14 | කුරුණෑගල | 1,045 | 25.8 | 1,091 | 15.6 |
| 15 | මන්නාරම | 7 | 0.2 | 3,048 | 76.8 |
| 16 | මාතලේ | 60 | 0.7 | 320 | 3.0 |
| 17 | මාතර | 17 | 0.4 | 1,180 | 14.6 |
| 18 | මොණරාගල | 106 | 2.8 | 2,427 | 56.0 |
| 19 | මුලතිව් | 8 | 0.1 | 2,439 | 52.5 |
| 20 | නුවරඑළිය | 43 | 0.4 | 47 | 0.5 |
| 21 | පොළොන්නරුව | 841 | 36.7 | 5,025 | 180.4 |
| 22 | පුත්තලම | 146 | 4.3 | 3,169 | 77.0 |
| 23 | රත්නපුර | 332 | 2.8 | 784 | 6.3 |
| 24 | ත්‍රිකුණාමලය | 34 | 0.6 | 7,058 | 138.3 |
| 25 | වවුනියාව | 7 | 0.3 | 1,507 | 39.1 |
| **එකතුව** | | **7,583** | **142.0** | **76,671** | **1,748.0** |

මූලාශ්‍රය: කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

වාරික දායකත්වය ලබා දෙනු ලැබේ. පළිබෝධ සහ රෝග, වෙනත් සත්ත්ව ප්‍රහාර සහ ගින්නෙන් සිදුවන හානි සඳහා ගොවීන් විසින් වාරිකයක් ගෙවීමෙන් අතිරේක ආවරණ ලබා ගත හැකිය. එසේම, අතිරේක වගා බිම් සඳහා රක්ෂණ ආවරණයක් ද අදාල වාරික ගාස්තුවක් ගෙවීමෙන් වගා පිරිවැය දක්වා ඉහළ රක්ෂණ මුදලක් ද ලබා ගත හැකිය. ඒ අනුව, 23/24 මහ කන්නය තුළ අක්කර 60,848.33 ක බිම් ප්‍රමාණයක වගා හානි සඳහා ගොවීන් 76,671 දෙනෙකුට රු. මිලියන 1,748 ක් වන්දි මුදල ලෙස ගෙවා ඇත.


මීට අමතරව, 2024 යල කන්නය සඳහා රු. මිලියන 142 ක් ගොවීන් 7,583 දෙනෙකු වෙත වගා බිම් අක්කර 32,141.67 ක් සඳහා වගා හානි වන්දි ලෙස ලබා දෙන ලදී. 2024 වර්ෂයේ දී මෙම කටයුතු සඳහා මහා භාණ්ඩාගාරය විසින් කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට (AAIB) රු. මිලියන 1,000 ක් ලබා දී ඇත. (වගුව 7.11)

### 7.2.5.5 ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

රටේ කෘෂිකාර්මික සංවර්ධනයට දායක වූ වැඩිහිටි ගොවීන්ගේ සුරක්ෂාව වෙනුවෙන් කෘෂිකර්ම හා ගොවිජන යෝජනාක්‍රමය යටතේ ගොවීන් 959,250 ක් පමණ ලියාපදිංචි වී ඇති අතර 2024 වර්ෂයේ දී, මෙම යෝජනාක්‍රමය යටතේ මාසික විශ්‍රාම වැටුප ලෙස ගොවීන් 179,382 දෙනෙකු අතර රු. මිලියන 4,737.96 ක් ලබා දී ඇත. මෙම යෝජනාක්‍රමය ගොවීන්ගේ දායකත්වය මත පමණක් ක්‍රියාත්මක වන ස්වයං මූල්‍ය යෝජනාක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බැවින් මහා භාණ්ඩාගාරය විසින් ඊට අවශ්‍ය අතිරේක අරමුදල් කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත වාර්ෂිකව ලබා දෙනු ලැබේ. ඒ අනුව, 2024 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 4,762 ක් ලබා දී ඇත.

2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද උපදෙස් පරිදි, දැනට පවතින ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ සුභසාධන යෝජනාක්‍රමය ස්වයං මූල්‍ය යෝජනාක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයක් 2022 ඔක්තෝබර් 31 වන දින සිට නැවත ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂය තුළ මෙම නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ගොවීන් 5,099 ක් ලියාපදිංචි කර ඇත. (රූප සටහන 7.2)

**රූප සටහන 7.2 | 2024 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයේ ප්‍රගතිය**





මූලාශ්‍රය: කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## 7.2.5.6 ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ස්වයං ආදායම් උත්පාදන හා දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයක් ලෙස ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර මේ යටතේ ධීවරයින් 69,049 කට ආසන්න සංඛ්‍යාවක් 2024 වසර අවසානයේදී ලියාපදිංචි වී ඇත. 2024 වසර තුල දී ධීවරයින් 6,056 දෙනෙකු අතර ඔවුන්ගේ මාසික විශ්‍රාම වැටුප ලෙස රු. මිලියන 91.71 ක් ලබා දී ඇත.

පවතින යෝජනාක්‍රමය යටතේ ධීවරයෙකුගේ අවම සහ උපරිම මාසික විශ්‍රාම වැටුප පිළිවෙළින් රු. 1,000 ක් සහ රු.4,000 ක් වේ. වර්තමාන ජීවන වියදම හා සසඳන විට මෙම මුදල ප්‍රමාණවත් නොවන බැවින් ධීවරයින්ගේ තිරසාර බව සහතික කිරීම සඳහා ධීවරයින් සඳහා වන නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් එනම් 'ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය' ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය විසින් 2025.03.19 දිනැති අංක 2428/13 දරන ගැසට් පත්‍රයෙන් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නව විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය 2025 වසරේ සිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සමඟ එක්ව ඉහල ප්‍රතිලාභ සහිත සහ ස්වයං මූල්‍ය යෝජනාක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කෙරේ. (රූප සටහන 7.3)

**රූප සටහන 7.3 | 2024 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයේ ප්‍රගතිය**




මූලාශ්‍රය: කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

## 7.2.6 විශේෂ පොළී සහනාධාර යෝජනා ක්‍රම

### 7.2.6.1 ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ පොළී සහනාධාර යෝජනා ක්‍රමය

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට ස්ථාවර සහ සුරක්ෂිත විශ්‍රාම දිවියක් ලබාදීම සඳහා ඔවුන්ගේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් සියයට 15 ක විශේෂ පොළී අනුපාතයක් ලබාදීමට මෙම යෝජනාක්‍රමය සකස් කරන ලද අතර සියයට 15 ක ස්ථාවර පොළී අනුපාතය හා සාමාන්‍ය ස්ථාවර තැන්පතු පොළී අනුපාතය අතර පරතරය මහා භාණ්ඩාගාරය විසින් අදාළ බලපත්‍රලාභී බැංකු වෙත ගෙවනු ලැබේ.

වෙළඳපොළ තුළ ඉහළ ස්ථාවර තැන්පතු පොළී අනුපාත පැවති අතර, එමඟින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තම ස්ථාවර තැන්පතු සඳහා බලපත්‍රලාභී බැංකු හරහා සියයට 15 කට වඩා වැඩි පොලියක් උපයා ගැනීමට හැකි වීම සහ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයට අනාගතයේ ඇති විය හැකි මූල්‍ය බර අවම කිරීමේ අරමුණින්, මෙම යෝජනාක්‍රමය 2022 ඔක්තෝබර් 01 වන දින සිට අත්හිටුවන ලදී.

2024 වර්ෂය තුළ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව සහ වාණිජ බැංකුව යන බැංකු අට (08) සඳහා ගෙවිය යුතු හිඟ පොළී සහනාධාරයෙන් කොටසක් පියවීම වෙනුවෙන් රු. මිලියන 52.64 ක් ගෙවා ඇත. (වගුව 7.12)

**වගුව 7.12 | ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා අදාළ පොළී සහනාධාර ගෙවීම, 2015 - 2024**

රු. මිලියන

| වර්ෂය | පියවන ලද මුළු පොළී සහනාධාර මුදල | පියවීමට තිබෙන මුළු පොළී සහනාධාර මුදල |
|---|---|---|
| 2015 | 3,661.1 | 0 |
| 2016 | 14,617.9 | 0 |
| 2017 | 13,462.2 | 0 |
| 2018 | 13,579.4 | 0 |
| 2019 | 18,082.7 | 0 |
| 2020 | 31,151.8 | 0 |
| 2021 | 63,950.6 | 0 |
| 2022 | 25,626.5 | 47,362.7 |
| 2023 | 549.7 | 8,365.7 |
| **එකතුව** | **184,681.9** | **55,728.4** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 7.2.6.2 විශේෂ තැන්පතු ගිණුම් (SDA) සඳහා බලයලත් නියෝජිතයින් විසින් ගෙවන ලද අතිරේක පොළී මුදල ප්‍රතිපූරණය කිරීම

2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ 29 සහ 7 වගන්තිවලට අනුව, රෙගුලාසි 2020.04.08 දිනැති අංක 2170/4, 2020.11.17 දිනැති අංක 2202/7, 2021.06.30 දිනැති අංක 2234/19 සහ 2022.03.28 දිනැති අංක 2273/06 යන ගැසට් පත්‍රවල ප්‍රකාශයට පත් කරන ලද අතර, පිළිවෙලින් මාස 06, මාස 12, මාස 24 සහ මාස 36 ක කාලයක් සඳහා විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට අවසර දෙන ලදී. අනුව, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පදිංචි ශ්‍රී ලාංකික පුද්ගලයින්, ද්විත්ව පුරවැසියන්, ශ්‍රී ලංකා සම්භවයක්

ඇති වෙනත් රාජ්‍යවල පුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත/ලියාපදිංචි අරමුදල්, සංගම් සහ ශ්‍රී ලංකාවේ සුභ සිද්ධිය අරමුණු කරගත් වෙනත් ඕනෑම පාර්ශවයක් ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට බලයලත් නියෝජිතයන්ට අවසර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස බලයලත් නියෝජිතයින් එම තැන්පතු කල්පිරීමේදී ඉහත සඳහන් විශේෂ තැන්පතු ගිණුම් සඳහා සියයට 2 ක අමතර වාර්ෂික පොලී අනුපාතයක් ගෙවනු ලැබේ.

ඒ අනුව, 2024 වර්ෂයේ දී විශේෂ තැන්පතු ගිණුම් සඳහා බලයලත් නියෝජිතයන් විසින් ගෙවන ලද අතිරේක පොලිය ප්‍රතිපූරණය සඳහා රු. මිලියන 2,593 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත (CBSL) ගෙවන ලදී. එයින්, රු. මිලියන 1,916.4 ක් 2023 වර්ෂයට අදාලව ගෙවිය යුතු පොලී සහනාධාරය ප්‍රතිපූරණය කිරීමට වන අතර සහ රු. මිලියන 676.5 ක් 2024 වර්ෂයට අදාලව හිඟ හිටි පොලී සහනාධාර මුදලින් කොටසක් පියවීම සඳහා වේ. (වගුව 7.13)

**වගුව 7.13 | විශේෂ තැන්පතු ගිණුම් සඳහා අදාළ පොලී සහනාධාර ගෙවීම, 2022-2024**

රු. මිලියන

| වර්ෂය | පියවන ලද මුළු පොලී සහනාධාර මුදල | පියවීමට තිබෙන මුළු පොලී සහනාධාර මුදල |
|---|---|---|
| 2022 | 636.7 | 0 |
| 2023 | 1,916.4 | 0 |
| 2024 | 676.6 | 1,995.3 |
| **එකතුව** | **3,229.7** | **1,995.3** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 7.2.6.3 "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා පොලී සහනාධාර" ණය වැඩසටහන

එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන 2017 වසරේ සිට 2020 වසර දක්වා කාලය තුල ක්‍රියාත්මක කරන ලද අතර ලබා දුන් ණය

**වගුව 7.14 | " එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන" සඳහා පොලී සහනාධාරය ගෙවීම - 2024**

| සහභාගිත්ව මූල්‍ය ආයතන | ගෙවන ලද මුළු පොලී සහනාධාරය (රු. මිලියන) |
|---|---|
| ලංකා බැංකුව | 327.8 |
| මහජන බැංකුව | 266.0 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 87.7 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 128.8 |
| ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 2.0 |
| හැටන් නැෂනල් බැංකුව | 331.3 |
| සම්පත් බැංකුව | 11.8 |
| සෙලාන් බැංකුව | 25.4 |
| යුනියන් බැංකුව | 4.3 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 60.9 |
| නේෂන්ස්ට්‍රස්ට් බැංකුව | 1.9 |
| පෑන් ඒසියා බැංකුව | 0.06 |
| කොමර්ෂල් බැංකුව | 269.7 |
| **මුළු එකතුව** | **1,518.3** |

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

සඳහා පොලී සහනාධාර ගෙවීම මහා භාණ්ඩාගාරය විසින් කල යුතු වේ. ඒ අනුව, 2024 වර්ෂයේදී බැංකු සඳහා පොලී සහනාධාර ලෙස රු. මිලියන 1,518.31 ක් ගෙවා ඇත.

### 7.2.6.4 බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩ උකස් කර ඇති පුද්ගලයන්ට සහන සැලසීම

විශේෂයෙන් සාම්ප්‍රදායික බැංකු ණය සඳහා සුදුසුකම් නිර්ණායක සපුරා ගැනීමට නොහැකි අඩු ආදායම්ලාභී පවුල් අතර, රන් භාණ්ඩ උකස් කිරීම බහුලව භාවිතා වන ණය ක්‍රමක් වේ. මෙම ණය අත්තිකාරම් සාමාන්‍යයෙන් පරිභෝජන අවශ්‍යතා, කෘෂිකාර්මික කටයුතු සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් සඳහා මූල්‍යකරණයට යොදා ගනී.

උකස් අත්තිකාරම් ලබා ගන්නා ණය ගැණුම්කරුවන් තම ණය ආපසු ගෙවීමේදී අත්විඳින දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ,රජය 2024 අගෝස්තු 1වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉලක්ක ගත සහන වැඩසටහනක් හඳුන්වා දෙන ලදි. මේ යටතේ අස්වැසුම ප්‍රතිලාභීන් විසින් බලපත්‍රලාභී බැංකු මගින් ලබාගන්නා ලද උකස් අත්තිකාරම් සඳහා පොළී සහනාධාරයක් ලබා දේ. මෙම යෝජනා ක්‍රමය යටතේ රු.100,000 නොයික්මවන උකස් අත්තිකාරම් සඳහා වාර්ෂිකව සියයට 10 දක්වා පොලී සහනාධාරයක් ලබා දෙනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂයේ දී පොලී සහනාධාරය ලෙස දළ වශයෙන් රු. 16,077 ක මුදලක් අදාල බැංකු වෙත ගෙවා ඇත.

## 7.3. ආහාර සුරක්ෂිතතාව


### 7.3.1. රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන

රටේ ප්‍රධාන ආහාරය සහල් වන බැවින් වී ගොවිතැන සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. පොහොර සහනාධාරය, බීජ වී, ව්‍යාප්ති සේවා, වාරිමාර්ග පහසුකම් සහ වී සඳහා සහතික මිලක් ලබා දීම සහතික කිරීමට රජය හිතකර ක්‍රියාමාර්ග ගත් අතර 2024 වසරේදී මුළු වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.7 ක් විය. එය 2023 වසරට සාපේක්ෂව සියයට 5 ක පමණ වැඩිවීමක් පෙන්නුම් කරයි.

ගොවීන්ට වී සඳහා සාධාරණ මිල ගණන් සහ පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට සහල් ලබා ගැනීම සහතික කිරීම සඳහා රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් ශක්තිමත් කිරීමට ද කටයුතු කරන ලදී. ඒ අනුව, මෙවර වී මිලදී ගැනීමේ වැඩසටහන වී අලෙවි මණ්ඩලය හරහා මෙන්ම, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්, වී තොග රැස්කරන්නන් සහ වී ගබඩා හිමියන් සඳහා වන ඔඩපණ ණය යෝජනා ක්‍රමය හරහා ක්‍රියාත්මක කරන ලදී. මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද අරමුදල් භාවිතා කරමින් 2024 වසරේ දී වී අලෙවි මණ්ඩලය විසින් වී මෙට්‍රික් ටොන් 2,758 ක් මිලදී ගෙන ඇති අතර, රාජ්‍ය සහ පෞද්ගලික බැංකු විසින් සපයන ලද අරමුදල් භාවිතා කරමින් 2024 වසරේ දී ඔඩපණ ණය යෝජනා ක්‍රමය යටතේ වී මෙට්‍රික් ටොන් 63,388 ක් මිලදී ගන්නා ලදී.

වී සඳහා කතිපයාධිකාරී වෙළඳපොළක් පවතින බැවින්, ප්‍රමුඛ පෙලේ වී මෝල් හිමියන් විසින් වෙළඳපොලේ වී මිල පහසුවෙන් හසුරුවනු ලැබේ. එබැවින්, ගොවීන් ආරක්ෂා කිරීම සඳහා වෙළඳපොළ තරහකාරිත්වය සුරක්ෂිත කරමින් අදාළ කන්නයේ නිෂ්පාදන පිරිවැය සැලකිල්ලට ගෙන වී සඳහා සහතික මිල ප්‍රකාශයට පත් කිරීමෙන් රජය වී සහ සහල් වෙළඳපොළ ක්‍රියාදාමයට මැදිහත් විය.

**රූප සටහන 7.4 | වාර්ෂික මුළු වී නිෂ්පාදනය 2014-2024**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 7.3.2. වී මිලදී ගැනීම සඳහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ට වෙළඳපොලේ සහල් අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රතිශතයක් ආවරණය කිරීමට ඇති හැකියාව සහ වෙළඳපොලේ පවතින ඉහළ පොලී අනුපාතය යටතේ මූල්‍ය පහසුකම් සඳහා ඇති අඩු ප්‍රවේශය සැලකිල්ලට ගනිමින්, 2023 යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා රාජ්‍ය බැංකු හරහා සහනදායී පොලී අනුපාතයක් යටතේ ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් 2023/24 මහ කන්නයේ දී රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල සහභාගීත්වයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අවම මිලදී ගැනීමේ මිලට ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ට, වී ගබඩා හිමියන්ට සහ වී තොග රැස්කරන්නන්ට ණය ලබා දීමට කටයුතු කරන ලද අතර, 2024 යල කන්නයේදීත් එම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2023/24 මහ කන්නයේ පැවති සියයට 15 ක වාර්ෂික සළුල පොලී අනුපාතයෙන්, අදාළ ණය ගැණුම්කරුවන් විසින් ගෙවන ලද පොලිය සියයට 11 ක් වූ අතර ඉතිරි සියයට 4 රජය විසින් දරන ලදී. ඒ අනුව, 2023/24 මහ කන්නයේ දී සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්

**වගුව 7.15 | රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මිලදී ගත් වී ප්‍රමාණය, 2023-2024**

| කන්නය | | වී වර්ගය | | | |
|---|---|---|---|---|---|
| | | නාඩු (මෙ.ටො.) | සම්බා (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) | වටිනාකම (රු. මිලියන) |
| මහ 2022/23 | වී අලෙවි මණ්ඩලය | - | - | - | - |
| | දිස්ත්‍රික් ලේකම්වරුන් | 100,895 | 0 | 100,895 | 11,750 |
| | ඔඩපණ ණය | - | - | - | - |
| | අනු එකතුව | **100,895** | **0** | **100,895** | **11,750** |
| යල 2023 | වී අලෙවි මණ්ඩලය | 2,151 | 3 | 2,154 | 205 |
| | දිස්ත්‍රික් ලේකම්වරුන් | - | - | - | - |
| | ඔඩපණ ණය | 4,964 | 0 | 4,964 | 467 |
| | අනු එකතුව | **7,115** | **3** | **7,118** | **672** |
| **එකතුව - 2023** | | **108,010** | **3** | **108,013** | **12,422** |
| යල 2023/24 | වී අලෙවි මණ්ඩලය | 2,631 | 7 | 2,638 | 277 |
| | දිස්ත්‍රික් ලේකම්වරුන් | - | - | - | - |
| | ඔඩපණ ණය | 15,537 | 6,283 | 21,820 | 2,417 |
| | අනු එකතුව | **18,168** | **6,290** | **24,458** | **2,694** |
| යල 2024 | වී අලෙවි මණ්ඩලය | - | 120 | 120 | 16 |
| | දිස්ත්‍රික් ලේකම්වරුන් | - | - | - | - |
| | ඔඩපණ ණය | 30,379 | 11,189 | 41,568 | 4,393 |
| | අනු එකතුව | **30,379** | **11,309** | **41,688** | **4,409** |
| **එකතුව - 2024** | | **48,547** | **17,599** | **66,146** | **7,103** |

මූලාශ්‍රය : වී අලෙවි මණ්ඩලය, අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ බැංකු

**වගුව 7.16 | වී සඳහා වන රජයේ සහතික මිල, 2020 – 2024**

| කන්නය | | සහතික මිල (කිලෝවකට රු.) | | |
|---|---|---|---|---|
| | | නාඩු | සම්බා | කිරී සම්බා |
| මහ 2019/20 | | 50 | 50 | 50 |
| යල 2020 | | 50 | 50 | 50 |
| මහ 2020/21 | | 56.5 | 56.5 | 56.5 |
| යල 2021 | | 55 | 52 | 55 |
| මහ 2021/22 | | 90 | 92 | 95 |
| යල 2022 | | 120 | 125 | 130 |
| මහ 2022/23 | | 100 | - | - |
| යල 2023 | | 95 | - | - |
| මහ 2023/24 | වී අලෙවි මණ්ඩලය | 105 | 120 | 130 |
| | ඔඩපණ ණය | 105 | 120 | 130 |
| යල 2024 | වී අලෙවි මණ්ඩලය | 105 | 115 | 130 |
| | ඔඩපණ ණය | 110 | 120 | 135 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව සහ වී අලෙවි මණ්ඩලය

හිමියන්, වී ගබඩා හිමියන් සහ වී තොග රැස්කරන්නන් සඳහා බැංකු විසින් රු. මිලියන 2,417 ක ඔඩපණ ණය නිකුත් කරන ලදි. 2024 යල කන්නයේ දී ණය ගැණුම්කරුවන් සඳහා රු. මිලියන 4,393 ක ණය පහසුකම් ලබා දෙන ලදී. එම කන්නයේදී ණය සඳහා පැවති සියයට 13 ක වාර්ෂික සළු පොළී අනුපාතයෙන්, අදාළ ණය ගැණුම්කරුවන් විසින් සියයට 9 ක පොලී අනුපාතයක් පමණක් ගෙවන ලද අතර, රජය විසින් බැංකු වෙත සියයට 4 ක පොලී සහනාධාරයක් ගෙවන ලදී. මෙම වැඩසටහන යටතේ, 2024 වර්ෂය තුළ රජය පොලී සහනාධාරය ලෙස බැංකු වෙත රු. මිලියන 62 ක් ගෙවා ඇත.

**වගුව 7.17 | ඔඩපණ ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය, 2023 - 2024**

| හැඳින්වීම | කන්නය | | | |
|---|---|---|---|---|
| | 2023 යල | 2023/24 මහ | 2024 යල | එකතුව |
| ලියාපදිංචි ණය සංඛ්‍යාව | 30 | 159 | 259 | 448 |
| ලියාපදිංචි ණය මුදල (රු.මි.) | 585 | 3,213 | 5,486 | 9,284 |
| මුදාහල ණය මුදල (රු.මි) | 467 | 2,417 | 4,393 | 7,277 |
| ගෙවූ පොළී සහනාධාරය (රු.මි) | 7 | 30 | 32 | 69 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## 7.3.3. පෞද්ගලික අංශයේ වී මිලදී ගැනීම

රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හරහා වී මිලදී ගැනීමට රජය මැදිහත් වුවද, පෞද්ගලික අංශය වී මිලදී ගැනීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එම අංශය විසින් වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය බැංකු විසින් ස්වකීය අරමුදල් භාවිතා කරමින් දැරිය හැකි පොළී අනුපාතයකට සපයන ලදී. 2023 වසරට සාපේක්ෂව, වී මිලදී ගැනීම සඳහා බැංකු විසින් ලබා දුන් මුළු ණය ප්‍රමාණය 2024 වසරේදී රු.මිලියන 86,812 දක්වා සියයට 90 කින් පමණ වැඩි වී ඇත.

**වගුව 7.18 | පෞද්ගලික අංශය මඟින් වී මිලදී ගැනීම සඳහා ණය ලබා දීමේ ප්‍රගතිය, 2023-2024**

| මූල්‍ය ආයතනය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | ණය මුදල (රු. මිලියන) |
| මහජන බැංකුව | 68 | 3,919.0 | 170 | 9,159.0 |
| ලංකා බැංකුව | 236 | 13,751.0 | 725 | 34,983.0 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 73 | 231.0 | 12 | 79.5 |
| **උප එකතුව - රාජ්‍ය බැංකු** | **377** | **17,901.0** | **907** | **44,221.5** |
| කොමර්ෂල් බැංකුව | 620 | 4,197.0 | 430 | 8,385.0 |
| සම්පත් බැංකුව | 45 | 3,461.0 | 51 | 7,037.0 |
| සී.එච්.සී.සී.බැංකුව | 54 | 967.0 | 7 | 63.0 |
| සෙලාන් බැංකුව | 102 | 835.0 | 235 | 7,677.0 |
| පැන් එෂියා බැංකුව | 33 | 28.0 | 8 | 119.0 |
| අමානා බැංකුව | 516 | 3,260.0 | 391 | 4,677.0 |
| ජාතික සංවර්ධන බැංකුව | 166 | 7,982.0 | 179 | 9,795.0 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 112 | 3,423.0 | 85 | 1,803.0 |
| හැටන් නැෂනල් බැංකුව | 68 | 848.0 | 55 | 887.0 |
| කාර්ගිල්ස් බැංකුව | 52 | 2682.0 | 21 | 2,148.0 |
| **උප එකතුව - පෞද්ගලික බැංකු** | **1,768** | **27,683.0** | **1,462** | **42,591.0** |
| **මුළු එකතුව** | **2,145** | **45,584.0** | **2,369** | **86,812.5** |

මූලාශ්‍රය: අදාළ බැංකු

## 7.3.4. අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම

2023 වර්ෂය ආරම්භයේ සිට රටේ පැවති දුෂ්කර ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින්, අඩු ආදායම්ලාභී කණ්ඩායම් අර්බුදයේ අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ පෝෂණ තත්ත්වය පවත්වාගෙන යාම සඳහා සහල් ලබා දීමට රජය විසින් කටයුතු කරන ලදී. 2024 වර්ෂයේ දී ද රජය විසින් එක් පවුලක් සඳහා මසකට කිලෝග්‍රෑම් 10 ක් බැගින් මාස 2 ක කාලයක් සඳහා සහල් ලබා දෙමින් මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

දිවයින පුරා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් ඇතුළුව සහල් සැපයුම්කරුවන්ගේ සහභාගීත්වයෙන් සහල් බෙදා හැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, මෙම වැඩසටහන යටතේ එක් පවුලක් සඳහා කිලෝග්‍රෑම් 20 බැගින් දිස්ත්‍රික්ක 25 ක අඩු ආදායම්ලාභී පවුල් 3,322,754 ක් අතර සහල් මෙට්‍රික් ටොන් 66,524 ක් පමණ බෙදා හරින ලදී. අඩු ආදායම්ලාභී පවුල් අතර බෙදා හැරීමට අවශ්‍ය සහල් තොග විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගෙන් මිලදී ගෙන ඔවුන් ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී.

රු. මිලියන 12,790 ක රජයේ අරමුදල් උපයෝගී කරගනිමින් වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර අඩු ආදායම්ලාභී කණ්ඩායම්, වී ගොවීන්, සහල් සැපයුම්කරුවන් සහ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හට මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි විය.

### 7.3.5 කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා රජයේ ගබඩා පහසුකම්

ලෝක බැංකු සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතා කරමින් රජය නවීන තාක්ෂණයෙන් සහ නව නිපැයුම් පද්ධතියකින් යුත් ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථාන පහක් ඉදිකර ඇත. එම ගබඩා පහසුකම් අනුරාධපුරය, මොණරාගල, මන්නාරම, කිළිනොච්චිය සහ පොළොන්නරුව යන ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කවල පිහිටා ඇත. මෙම ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථාන පහ තුල වී, බඩඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස්, රටකජු සහ අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා කරන අතර, අස්වනු නෙලන සමයේදී ධාන්‍යවල මිල පහළ යන බැවින් නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලැබෙන තුරු අති නවීන උසස් තත්ත්වයේ ගබඩා පහසුකම් ගොවීන් වෙත සපයනු ලබයි. මෙම ගබඩා පහේ ඒකාබද්ධ ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 17,200 ක් පමණ වේ. ඒවා ගබඩා පහසුකමට අමතරව ධාන්‍ය වියළීම, ධාන්‍ය පිරිසිදු කිරීම සහ ධාන්‍ය තත්ත්ව පරීක්ෂා කිරීම ඇතුළු පුළුල් පරාසයක අතිරේක පහසුකම් සපයයි. වඩාත්ම ආකර්ෂණීය අංගය වන්නේ ගොවීන්ට ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ පහසුකම් සැපයීමයි. එමඟින් ඔවුන්ගේ අස්වැන්න ඇපකරයක් ලෙස සහනදායී අනුපාතයකට ණයක් ලබාගැනීමට හැකියාවක් පවතී.

2024 වර්ෂයේදී රජය විසින් දරනු ලැබූ මෙහෙයුම් පිරිවැය රු.මිලියන 23 ක් පමණ වන අතර එය 2023 වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 2 ක වැඩිවීමකි. මෙම ව්‍යාපෘති පහේම මෙහෙයුම් ආදායම 2024 වර්ෂයේ දී රු.මිලියන පහකින් පමණ අඩු වී ඇත. ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ පහසුකම යටතේ 2024 වර්ෂයේදී රු. මිලියන 257 ක කැපිපෙනෙන සහනදායී මූල්‍ය පහසුකම් ධාන්‍ය ගබඩා කල ගොවීන් වෙත ලබාදී ඇත. එය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 79 ක වැඩිවීමකි.

### 7.3.6 ආහාර සුරක්ෂිතතාවය

ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කරන අතරම, සෑම පුරවැසියෙකුගේම අවම ආහාර අවශ්‍යතාවය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව දැරිය හැකි මිලකට සපුරාලීම සඳහා ආරක්ෂිත ආහාර සැපයීම රජයට ඇති ප්‍රමුඛ අභියෝගයකි. ජනගහනයේ ආහාර අවශ්‍යතා සහ මනාපයන් සපුරාලන ප්‍රමාණවත්, ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර නිෂ්පාදනයක් ජනනය කිරීම මෙන්ම නිෂ්පාදන ස්ථානයේ සිට එහි පරිභෝජන ස්ථානය දක්වා ජාලයේ සියලුම අදියර නියාමනය කිරීම අරමුණු කරගත් බිම් මට්ටමේ ප්‍රවේශයන් සහ යාන්ත්‍රණයන් හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීම ඉතා වැදගත් බව නව රජය හඳුනාගෙන තිබේ. ඒ අනුව, 2024.11.28 දිනැති අංක 24/2089/801/003 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2024.12.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් රටේ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා දත්ත පදනම් කරගත් විශ්ලේෂණයක් හරහා ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් ලබා දීම සඳහා ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව පිහිටුවන ලදී.

### 7.3.7 සහල් ආනයනය කිරීම

දේශීය වෙළඳපොලේ සහල් හිඟය සහ සහල්වල ඉහළ මිල සැලකිල්ලට ගනිමින්, රජය විසින් රාජ්‍ය අංශයේ ආයතන සහ පෞද්ගලික අංශය මඟින් සහල් ආනයනය කිරීම දිරිමත් කරන ලදී. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ලංකා සතොස සමාගම, විවිධ සේවා සමුපකාර සමිති සහ සුපිරි වෙළඳසැල් හරහා බෙදා හැරීම සඳහා සහල් මෙට්‍රික් ටොන් 10,400 ක් ආනයනය කරන ලදී. තවද, 2024 දෙසැම්බර් 20 වන දින හෝ ඊට පෙර ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා නොමැතිව සහල් ආනයනය කර විවෘත වෙළඳපොලේ බෙදා හැරීමට පුද්ගලික අංශයේ ආනයනකරුවන්ට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

**වගුව 7.19 | ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රගතිය 2023-2024**

| විස්තරය | ධාන්‍ය ගබඩා | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බුත්තල | | පොළොන්නරුව | | අනුරාධපුරය | | කිළිනොච්චිය | | මන්නාරම | | එකතුව | |
| | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 |
| මෙහෙයුම් ආදායම (රු. මිලියන) | 5.1 | 3.7 | 4.2 | 3.4 | 3.0 | 2.3 | 10.4 | 7.4 | 3.0 | 3.8 | 25.7 | 20.6 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 2.9 | 4.6 | 4.3 | 3.7 | 3.1 | 5.6 | 7.3 | 4.7 | 3.9 | 4.8 | 21.5 | 23.4 |
| වාර්ෂික ධාන්‍ය ගබඩා කිරීම (මෙ.ටො.) | 890.7 | 1,168.0 | 175.0 | 482.0 | 1,148.0 | 719.0 | 1,068.0 | 1,356.0 | 591.7 | 812.0 | 3,873.3 | 4,537.0 |
| ලියාපදිංචි ගොවීන් සංඛ්‍යාව | 1,266 | 1,500 | 158 | 182 | 1,136 | 1,152 | 451 | 380 | 656 | 683 | 3,667 | 3,897 |
| ගුදම් කුවිතාන්සි මූල්‍යකරණය (රු. මිලියන) | 49.3 | 78.8 | 4.1 | 20.5 | 36.9 | 67.7 | 26.6 | 44.1 | 26.9 | 46.8 | 143.8 | 257.9 |

මූලාශ්‍රය: ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

**වගුව 7.20 | 2024 වර්ෂයේ ජීවන වියදම පාලනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග**

| වෙළඳ භාණ්ඩය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (වි.වෙ.බ)/උපරිම සිල්ලර මිල (උ.සි.මි) පිළිබඳ විස්තරය | බලාත්මක දිනය |
|---|---|---|
| ලොකු ඵෑණු | වි.වෙ.බ කිලෝග්‍රෑමයකට රු. 10/- සිට රු. 30/- දක්වා වැඩි කරන ලද අතර එය 2024.11.30 දක්වා වලංගු වේ. | 2024.10.03 |
| | වි.වෙ.බ කිලෝග්‍රෑමයකට රු. 30/- සිට රු. 10/- දක්වා අඩු කරන ලද අතර එය 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.12.01 |
| මයිසූර් පරිප්පු | වි.වෙ.බ කිලෝග්‍රෑමයකට ශත 25 ක අගය 2024.12.31 දක්වා දිර්ඝ කරන ලදී. | 2024.10.14 |
| සහල් (දේශීය) | පහත පරිදි උ.සි.මි. සංශෝධනය කරන ලදී. | |
| කීරි සම්බා | කිලෝග්‍රෑමයකට රු.260/- (එලෙසම පවත්වාගෙන යන ලදී) | |
| සුදු/රතු සම්බා | කිලෝග්‍රෑමයකට රු.240/- | 2024.12.09 |
| සුදු/රතු නාඩු | කිලෝග්‍රෑමයකට රු.230/- | |
| සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයකට රු.220/- | |
| සහල් | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට රු.65/- ක් ලෙස දිගටම ක්‍රියාත්මක වූ අතර 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.05.18 |
| සහල් | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය වන සහල් ආනයනය කිරීමේදී පනවා ඇති කිලෝ ග්‍රෑමයක් සඳහා රු.65 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත කිලෝග්‍රෑමයක් සඳහා රු.1ක් අයකර ගෙන ඉතිරි වටිනාකම අත්හැරීම 2024.01.02 සිට 2024.01.21 දක්වා සිදු කිරීම. | 2024.01.02 |
| කව්පි | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට රු. 70/- සිට රු. 300/- දක්වා වැඩි කරන ලද අතර එය 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.02.20 |
| මුං ඇට | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට කිලෝග්‍රෑමයකට රු.300/- ක් ලෙස දිගටම ක්‍රියාත්මක වූ අතර 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.02.20 |
| අල | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට රු.50/- ක් ලෙස දිගටම ක්‍රියාත්මක වූ අතර 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.01.04 |
| | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට රු. 50/- සිට රු. 60/- දක්වා වැඩි කරන ලද අතර එය 2024.11.30 දක්වා වලංගු වේ. | 2024.10.03 |
| | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට රු.60/- ක් ලෙස දිගටම ක්‍රියාත්මක වූ අතර 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.12.01 |
| උඳු -සම්පූර්ණ | වි.වෙ.බ. කිලෝග්‍රෑමයකට රු. 200/- සිට රු. 300/- දක්වා වැඩි කරන ලද අතර එය 2024.12.31 දක්වා වලංගු වේ. | 2024.02.19 |

මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු අධිකාරිය සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පසුව, 2024/25 මහ කන්නයේ සහල් සිල්ලර වෙළඳපොළ වෙත ළඟා වන තෙක් දැරිය හැකි මිලකට සහල් ලබා ගැනීම සහතික කිරීම සහ දේශීය වෙළඳපොළ ස්ථාවර කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආනයනකරුවන්ට 2025 ජනවාරි 10 වන දින දක්වා සහල් ආනයනය අඛණ්ඩව සිදුකර ගෙන යාමට රජය විසින් අවසර ලබා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික අංශයේ ආනයනකරුවන් 2025.01.10 වන දින දක්වා සහල් මෙට්‍රික් ටොන් 173,357 ක් ආනයනය කළ අතර, රජයේ ආයතන සහ පෞද්ගලික අංශයේ ආනයනකරුවන් සහල් මෙට්‍රික් ටොන් 183,757 ක් ආනයනය කරන ලදී. එය කැකුළු සහල් මෙට්‍රික් ටොන් 67,120 ක් සහ නාඩු සහල් මෙට්‍රික් ටොන් 116,637 කින් සමන්විත විය.

# 08

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය

## 8.1 සමාලෝචනය

රාජ්‍ය ව්‍යවසායයන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සුවිශේෂී භූමිකාවක් ඉටු කරමින් බලශක්ති, වරාය, බැංකු හා රක්ෂණ සහ ජලය ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍රයන්හි ව්‍යාප්ත වී පවතී. 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද කාලානුරූපී නිවැරදි කිරීමේ පියවර හා ප්‍රතිස්ථාපනය වූ සාර්ව ආර්ථික ස්ථායීත්වය සමඟ, 2025 වර්ෂයේ දී සහ ඉන් ඉදිරියට රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රය ආකර්ෂණීය වර්ධන මාවතකට හැරවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදුලිය හා ඉන්ධන සඳහා පිරිවැය ආවරණය වන මිලකරණය ක්‍රියාත්මක කිරීම, ජලය සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීම, තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන්හි කල් ගත වූ ණය රජයේ ශේෂ පත්‍රයට මාරු කිරීම හරහා ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම, ආයතන අතර ඇති වගකීම් පියවීම සහ ආයතනික වැඩිදියුණු කිරීම් සිදු කිරීම වැනි දැඩි රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි මෙහෙයුම් හා මූල්‍ය කාර්ය සාධනය වර්ධනය සඳහා සුවිශේෂී ලෙස දායක වී ඇත. ඒ අනුව, මෙම ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි සමස්ත ලාභය 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 445.3 හා සැසඳීමේදී 2024 වර්ෂයේ දී රු. බිලියන 534.1 ක් දක්වා සියයට 19.9 කින් ඉහළ ගොස් ඇත. විශේෂයෙන්ම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා බැංකුව පිළිවෙලින් රු. බිලියන 144.4 ක් සහ රු. බිලියන 106.9 ක් වශයෙන් රාජ්‍ය ව්‍යවසායයන් 52 හි මුළු ලාභයට සියයට 47 ක දායකත්වයක් දක්වා ඇත. රජය සතු ව්‍යවසායයන් බැංකු මත රඳා පැවතීම අඩු වීම මත මෙම කාර්ය සාධනය විශේෂයෙන් රාජ්‍ය බැංකු ඇතුළු බැංකු අංශයේ ද්‍රවශීලතාවය වර්ධනය සඳහා හේතු වී ඇති අතර, එම අරමුදල් ආර්ථිකයේ වෙනත් ඵලදායී ක්ෂේත්‍ර වෙත යොමු කිරීමට හැකි වී ඇත.

2024 වර්ෂයේ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක විය. ලංවිමයෙහි විදුලි නිෂ්පාදනය, විදුලි සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා වඩා වැඩි මෙහෙයුම් හා මූල්‍ය ස්වාධීනත්වයක් සලසා දෙන අතර, බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය, විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීම වෙනුවෙන් එම කාර්යයන් සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වයට ඉඩ සලසන වඩාත්ම වැදගත් නීතිමය ප්‍රතිසංස්කරණය වශයෙන් 2024 අංක 36 දරණ විදුලිබල පනත ජූනි මාසයේදී සම්මත කිරීම සඳහන් කළ හැක. 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත විදුලිබල පනත නැවත සමාලෝචනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කළ අතර, එම කමිටුවේ නිර්දේශ මත එම පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලැබී ඇත. දේශීය ඛනිජතෙල් වෙළෙඳපොළ ලිහිල්කරණය කිරීමත් සමඟ වෙළඳපොළ ක්‍රියාකරුවන් සංඛ්‍යාව 2023 වර්ෂයේ සිටි තිදෙනෙකු සිට 2024 වර්ෂය අවසානය වන විට පහක් දක්වා වැඩි විය. මෙම ප්‍රතිසංස්කරණය මගින් තියුණු තරහකාරීත්වයක් ඇති කර ඒ තුළින් එම අංශයේ ඵලදායිතා වාසි ගෙන එනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය බැංකුවල ව්‍යාපාර ආකෘති, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, පාලනය සහ අවදානම් කළමනාකරණ ආකෘති සම්බන්ධ ගැටළු විසඳීම වෙනුවෙන් රාජ්‍ය බැංකු ප්‍රතිව්‍යුහගත කිරීමේ පුළුල් ප්‍රතිපත්තියක් 2024 වර්ෂයේ අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග මගින් ක්‍රියාවලීන් විධිමත් කිරීම, පාලනය ඉහළ නැංවීම සහ නවීන බැංකු පරිවයන් හඳුන්වා දීම තුළින් වෙළෙඳපොළ තුළ රාජ්‍ය බැංකු වඩාත් තරහකාරී බවට පත් කිරීම අපේක්ෂා කෙරේ. තවද, රාජ්‍ය බැංකු ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති යටතේ සියළුම රාජ්‍ය බැංකු අධීක්ෂණය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ විශේෂිත ඒකකයක් පිහිටුවන ලද අතර, එම ඒකකය රාජ්‍ය බැංකුවල රජයේ කොටස් හිමිකම් කළමනාකරණය කිරීම, ඒවායේ කාර්ය සාධන අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා වගකිව යුතු වේ.

ශ්‍රීලංකන් ගුවන් සමාගම පෞද්ගලීකරණය නොකර ඒ සඳහා ගැළපෙන විකල්ප ආකෘතියක් හඳුනාගෙන එය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් වන රජයේ තීරණයට අනුකූලව 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංශෝධිත ව්‍යාපාර සැලැස්මක් අනුමත කළ අතර, එහි ශක්‍යතාවය පිළිබඳව රජය තවදුරටත් සාකච්ඡා කරමින් සිටී.

ජල ගාස්තු ප්‍රතිපත්තිය සහ ගාස්තු සඳහා වන සූත්‍රය 2024 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. තවද, ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති මූලික ණය මුදලක් යටතේ වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මහා භාණ්ඩාගාරය සහ ජලසම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් වන සාමූහික අභිලාශ ප්‍රකාශය 2024 වර්ෂයේ ජූලි මාසයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අත්සන් තබන ලදී. මෙම සාමූහික අභිලාශ ප්‍රකාශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා කාර්ය සාධන දර්ශක මගින් ඉලක්ක නියම කර ඇත.

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය රජය විසින් සමාලෝචනය කර අනුමත කරන තෙක් 2024 වර්ෂය අවසන් වන විට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය විසින් සිදු කළ ක්‍රියාකාරකම් තාවකාලිකව නවතා ඇත.

රාජ්‍ය ව්‍යවසාය අංශයේ වර්ධනය වූ මූල්‍ය කාර්ය සාධනයක් පැවතියද, ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබුණු අයබදු අඩුවීම හේතුවෙන් 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 75.7 හා සැසඳීමේදී 2024 වර්ෂයේ දී අයබදු හා ලාභාංශ වලින් රැස් කළ මුදල රු. බිලියන 41.1 ක් දක්වා අඩු වී ඇත.

## වගුව 8.1 | ප්‍රධාන ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය

රු. මිලියන

| අංශය | රාජ්‍ය ව්‍යවසායයන් ගණන | මුළු ආදායම (අ) 2024 | බදු පෙර ලාභය/ (බදු පෙර අලාභය)(ආ) 2023 | බදු පෙර ලාභය/ (බදු පෙර අලාභය)(ආ) 2024 |
|---|---|---|---|---|
| බලශක්තිය | 2 | 1,538,461 | 177,979 | 177,659 |
| ජලය | 1 | 84,027 | 5,235 | 23,945 |
| වරාය | 1 | 98,289 | 40,359 | 43,810 |
| පොදු ප්‍රවාහනය | 1 | 75,712 | 2,189 | 547 |
| ගුවන් | 2 | 350,821 | 37,510 | 20,582 |
| ඉදිකිරීම් | 3 | 11,701 | -4,222 | -2,129 |
| බැංකු සහ මූල්‍ය | 7 | 1,182,321 | 126,985 | 241,528 |
| රක්ෂණ | 4 | 42,652 | 39,772 | 17,565 |
| ලොතරැයි | 2 | 66,302 | 4,361 | 5,890 |
| පශු සම්පත් | 2 | 20,854 | -606 | 244 |
| වැවිලි | 6 | 6,575 | 652 | 342 |
| පුනර්ජනනය නොවන සම්පත් | 3 | 2,146 | 4,442 | 416 |
| සෞඛ්‍ය | 4 | 99,462 | 3,963 | 6,277 |
| මාධ්‍ය | 3 | 4,295 | -1,093 | -402 |
| අලෙවි සහ බෙදාහැරීම් | 11 | 93,171 | 7,826 | -2,135 |
| **එකතුව** | **52** | **3,676,789** | **445,352** | **534,139** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(ආ) බදු පෙර ලාභය/(බදු පෙර අලාභය) - තාවකාලික

## වගුව 8.2 | රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ ලාභාංශ ආදායම

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **අයබදු** | **14,769** | **24,442** | **22,004** | **60,497** | **33,190** |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 1,000 | 3,500 | - | - | - |
| ලංකා බැංකුව | 1,250 | 1,500 | - | - | - |
| මහජන බැංකුව | 2,500 | 500 | 441 | – | - |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 5,000 | 8,500 | 13,200 | 23,000 | 9,000 |
| රාජ්‍ය දැව සංස්ථාව | – | 100 | 320 | 641 | - |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | – | 100 | 100 | 300 | 300 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 782 | 1,824 | 1,608 | 2,000 | 2,919 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - | 2,000 | 1,000 | 2,000 | 1,468 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | 15 | 35 | 390 | 25 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 156 | - | 416 | 533 | 928 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | - | 900 | 361 | 1,000 | 1,060 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | - | 10 | 40 | 13 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | - | 25 | 50 | 620 | 300 |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | - | 25 | - | - | - |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | - | - | - | 500 | 500 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | - | 50 | 1,000 | 4,000 | 750 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - | - | 350 | - | 100 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | - | 110 | 290 | 150 | 850 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | - | - | 1,200 | 7,000 | - |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | - | - | 10 | 300 | 250 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | - | - | - | 75 | - |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | - | - | - | 500 | - |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - | - | 1,015 | 8,066 | 607 |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 81 | 147 | 400 | 646 | 880 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 4,000 | 4,000 | – | 75 | 1,749 |

### වගුව 8.2 | රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ ලාභාංශ ආදායම සම්බන්ධිතයි...

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | - | 1,100 | – | 350 | 15 |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | - | 25 | 50 | 200 | - |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | - | 16 | 33 | 115 | 85 |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | - | 5 | – | - | 5 |
| පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය | - | - | 90 | 25 | 4 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | - | - | 25 | 7,971 | 11,381 |
| **ලාභාංශ** | **2,854** | **4,672** | **6,087** | **15,204** | **7,890** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 60 | 30 | - |
| ලංකා බැංකුව | 346 | 346 | 346 | 173 | - |
| මහජන බැංකුව | 316 | 316 | 316 | 158 | – |
| ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | 1 | - | 2 |
| සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 695 | 899 | 1,511 | 2,272 | 1,271 |
| සීමා සහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | - | - | 500 | 5,500 | 1,286 |
| සීමා සහිත ලංකා බණිජ වැලි සමාගම | – | 700 | 759 | 2,500 | 158 |
| සීමා සහිත ලංකා පොස්ෆේට් සමාගම | – | 20 | 20 | 220 | 75 |
| සීමා සහිත ලංකා ලේලන්ඩ් සමාගම | 2 | 3 | 13 | 6 | – |
| සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | – | – | – | 125 | 75 |
| සීමා සහිත මන්නායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම) | 2 | 15 | – | 120 | – |
| සීමා සහිත ලංකා පොහොර සමාගම | 304 | 29 | 15 | 22 | 15 |
| සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | – | – | 10 | 60 | 30 |
| සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගම | 10 | 3 | 50 | 305 | 131 |
| ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | – | – | 11 | 150 | 50 |
| සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 947 | 1,331 | 1,805 | 223 | – |
| සීමා සහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | – | 345 | 313 | – | 1,324 |
| සීමා සහිත ලංකා විදුලිබල සමාගම | – | 327 | 218 | 697 | 436 |
| සීමා සහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | 82 | – | 174 | 98 |
| සීමා සහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 77 | 95 | 24 | 167 | 202 |
| වැවිලි සමාගම් | 12 | 98 | 95 | 554 | 559 |
| සීමා සහිත ලංකා සීනි සමාගම | – | – | – | 1,597 | – |
| ලංකා ත්‍රිපෝෂ සමාගම | – | – | 10 | 75 | 100 |
| වෙනත් | – | 2 | 10 | 75 | 2,078 |
| **එකතුව** | **17,623** | **29,114** | **28,091** | **75,701** | **41,080** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

### වගුව 8.3 | ප්‍රධාන ව්‍යවසායයන්හි වත්කම් පදනම

රු. මිලියන

| අංශය | රාජ්‍ය ව්‍යවසායයන් ගණන | 2023.12.31 දිනට මුළු වත්කම්(අ) | 2024.12.31 දිනට මුළු වත්කම්(අ) | වර්ධනය (%) |
|---|---|---|---|---|
| බලශක්තිය | 2 | 1,476,097 | 1,448,166 | -1.89 |
| ජලය | 1 | 990,754 | 1,005,739 | 1.51 |
| වරාය | 1 | 737,243 | 761,490 | 3.29 |
| පොදු ප්‍රවාහනය | 1 | 55,291 | 54,580 | -1.29 |
| ගුවන් | 2 | 390,997 | 407,493 | 4.22 |
| ඉදිකිරීම් | 3 | 37,917 | 36,660 | -3.32 |
| බැංකු සහ මූල්‍ය | 7 | 10,087,935 | 11,071,574 | 9.75 |
| රක්ෂණ | 4 | 70,170 | 88,996 | 26.83 |
| ලොතරැයි | 2 | 15,744 | 16,504 | 4.83 |
| පශු සම්පත් | 2 | 28,160 | 27,593 | -2.01 |
| වැවිලි | 6 | 8,677 | 8,948 | 3.12 |
| පුනර්ජනනය නොවන සම්පත් | 3 | 11,962 | 11,302 | -5.52 |
| සෞඛ්‍ය | 4 | 90,871 | 91,491 | 0.68 |
| මාධ්‍ය | 3 | 5,451 | 5,182 | -4.93 |
| අලෙවි සහ බෙදාහැරීම් | 11 | 84,711 | 78,402 | -7.45 |
| **එකතුව** | **52** | **14,091,980** | **15,114,120** | **7.25** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(අ)තාවකාලික

## 8.2 බලශක්ති

### 8.2.1. ලංකා විදුලිබල මණ්ඩලය


පිරිවැය ආවරණය වන ගාස්තු ගැළපීම් ක්‍රියාත්මක කිරීමත් සමඟ ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) 2024 වර්ෂයේ දී අබණ්ඩව දෙවන වර්ෂයටත් ලාභදායීව පැවතුනි. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2024 මාර්තු මස සියයට 21.9 කින් සහ 2024 ජූලි මස සියයට 22.5 කින් විදුලි ගාස්තු අඩු කිරීම් දෙකක් අනුමත කර තිබියදීත්, 2023 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 57,632 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 144,394 ක ශුද්ධ ලාභයක් වාර්තා කරමින් ලංවිම කැපී පෙනෙන මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. තවද, 2025 ජනවාරි 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද නවතම විදුලි ගාස්තු සංශෝධනය සමඟ අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව සාමාන්‍ය වශයෙන් සියයට 20 කින් අඩු කරන ලදී.

2024 වර්ෂයේ දී ක්‍රියාත්මක වූ විදුලි ගාස්තු සංශෝධනයන් දෙක මගින් විදුලි ගාස්තුව අඩු කර තිබුණද, විදුලි පරිභෝජනය ගිගාවොට් පැය 15,235 ක් දක්වා සියයට 7.6 කින් ඉහළ යාමත් සමඟ, 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 606,627 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු.මිලියන 547,010 ක විදුලි අලෙවි ආදායමක් ලංවිම වාර්තා කර ඇත. කෙසේ වුවද, 2024 වර්ෂයේ දෙවන භාගයේ පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් ඍජු විදුලි ජනන පිරිවැය 2023 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 407,173 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී සියයට 25.7 කින් රු. මිලියන 302,400 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩුවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 118,533 ක මෙහෙයුම් ලාභයට සාපේක්ෂව ලංවිම 2024 වර්ෂය අවසානයේදී රු. මිලියන 162,620 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. මෙම මෙහෙයුම් ලාභය තුළ 2024 වර්ෂයේ දී සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගම වෙත කොටස් විකිණීමෙන් ලද රු. මිලියන 26,038 ක ලාභයද ඇතුළත් වේ.

2023 වර්ෂයේ වාර්තා වූ ජනන සංයුතිය වන පිළිවෙලින් තාප (ගල් අඟුරු): ජල : සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය, සුළං සහ වහළ මත සවිකල සූර්ය බල ශක්තිය: තාප (ඉන්ධන) සියයට 30: 29:21:20 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ජනන සංයුතිය පිළිවෙලින් සියයට 33: 32: 21:14 ක් ලෙස වාර්තා කර ඇත. තාප (ඉන්ධන) විදුලි ජනනය 2023 වර්ෂයේ පැවති සියයට 20 සිට 2024 වර්ෂයේ දී සියයට 14 ක් දක්වා පහළ ගොස් ඇති අතර, ප්‍රධාන වශයෙන් හිතකර කාලගුණික තත්ත්වයන් සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ ගල් අඟුරු මිල පහත වැටීම හේතුවෙන් ජල සහ ගල් අඟුරු මූලාශ්‍ර මගින් එම අඩුවීම සම්පූර්ණ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේ කි.වො. පැයකට රු. 41.18 ක් ලෙස පැවති විකුණුම් ස්ථානයේ ඒකකයක පිරිවැය 2024 වර්ෂයේ දී කි.වො. පැයකට රු. 30.89 ක් දක්වා අඩු වී ඇත. විදුලිබල ජනනයෙන් සියයට 70 ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලබා ගැනීමේ ජාතික ඉලක්කයට අනුකූලව, 2024 වර්ෂයේ දී පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 600 කට ආසන්න ප්‍රමාණයක් ලංවිම මගින් ජාතික පද්ධතියට එකතු කර ඇත.

පිරිවැය ආවරණය වන ගාස්තු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ලංවිම වාර්තා කළ ලාභය එහි ගෙවීමට තිබූ දිගුකාලීන ණය පියවීම සඳහා යොදා ගැනීම හේතුවෙන් ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත 2023 වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ණය ප්‍රමාණය වූ රු. බිලියන 85.5 ට සාපේක්ෂව 2024 වර්ෂයේ අවසානයේදී ගෙවිය යුතු ණය ප්‍රමාණය රු. බිලියන 14.3 ක් විය.

**රූප සටහන 8.1 | මූලාශ්‍ර අනුව උත්පාදන සංයුති ප්‍රතිශතය 2015 - 2024**




මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය

**වගුව 8.4 | ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථාපිත ධාරිතාව සහ විදුලි ජනනය - 2022 - 2024**

| | 2022 | | | 2023 | | | 2024(අ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | විදුලි ජනනය සමස්ත විදුලි ජනනයේ ප්‍රතිශතයක් ලෙස (%) | ගි.වො.පැ. | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | විදුලි ජනනය සමස්ත විදුලි ජනනයේ ප්‍රතිශතයක් ලෙස (%) | ගි.වො.පැ. | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | විදුලි ජනනය සමස්ත විදුලි ජනනයේ ප්‍රතිශතයක් ලෙස (%) | ගි.වො.පැ. |
| ජලවිදුලිය | 1,413 | 34 | 5,364 | 1,413 | 29 | 4,573 | 1,413 | 32 | 5,426 |
| තාප විදුලිය - ලංවිම ඉන්ධන | 654 | 9 | 1,339 | 801 | 13 | 1,975 | 801 | 9 | 1,570 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන්-ඉන්ධන | 270 | 7 | 1,128 | 386 | 7 | 1,160 | 482 | 5 | 768 |
| තාප විදුලිය - ගල් අඟුරු | 900 | 32 | 5,174 | 900 | 30 | 4,646 | 900 | 33 | 5,482 |
| සුළං - ලංවිම | 104 | 2 | 362 | 104 | 3 | 391 | 104 | 2 | 383 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය | 743 | 13 | 2,061 | 776 | 14 | 2,211 | 794 | 13 | 2,236 |
| පියසි මත ඉදිකරන සූර්ය පැනල | 535 | 3 | 528 | 652 | 4 | 632 | 1,141 | 6 | 864 |
| **එකතුව** | **4,619** | **100** | **15,956** | **5,032** | **100** | **15,588** | **5,635** | **100** | **16,729** |

මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය
(අ) තාවකාලික

**වගුව 8.5 | ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් සංඛ්‍යා දත්ත සහ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024[අ] |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් තත්ත්වය** | | | | | |
| **ආදායම** | **249,066** | **261,373** | **321,432** | **640,438** | **615,019** |
| විදුලි අලෙවිය | 238,911 | 248,776 | 308,457 | 606,628 | 547,010 |
| වෙනත් ආදායම් | 10,155 | 12,597 | 12,975 | 33,810 | 41,971 |
| කොටස් අයිතිය බැහැර කිරීමේ ලාභය | - | - | - | - | 26,038 |
| **වියදම** | **309,552** | **295,512** | **524,933** | **582,805** | **470,625** |
| **සෘජු උත්පාදන පිරිවැය** | **183,213** | **157,374** | **325,245** | **407,173** | **302,400** |
| ස්වාධීන විදුලි සැපයුම්කරුවන්ගෙන් විදුලිය මිලදී ගැනීම් (සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ඇතුළුව) | 110,213 | 85,690 | 121,244 | 128,004 | 112,206 |
| ලංවිම - ඉන්ධන පිරිවැය (ඉන්ධන සහ ගල් අඟුරු) | 73,000 | 71,684 | 204,001 | 279,169 | 190,194 |
| නිෂ්පාදන, සම්ප්‍රේෂණ, බෙදාහැරීම්, මෙහෙයුම් හා නඩත්තු පිරිවැය | 67,701 | 76,189 | 85,615 | 65,109 | 95,545 |
| ආයතනික වියදම් | 7,009 | 8,047 | 38,458 | 12,034 | 14,273 |
| ණය පොළී සහ ප්‍රමාද ගෙවීම් | 19,522 | 20,431 | 41,850 | 63,131 | 21,771 |
| ක්ෂයවීම් | 32,107 | 33,471 | 33,765 | 35,357 | 36,635 |
| **මෙහෙයුම් ලාභ/ (අලාභ)** | **-60,486** | **-34,139** | **-203,501** | **57,633** | **144,394** |
| විනිමය ලාභ / (අලාභ) | - | - | -94,689 | - | - |
| **ශුද්ධ ලාභ / (අලාභ)** | **-60,486** | **-34,139** | **-298,189** | **57,633** | **144,394** |
| නිශ්චිත සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත අය ගණන ලාභය / අලාභය | -8,677 | -504 | -11,059 | -3,154 | 4,182 |
| **වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම / (වියදම)** | **-69,164** | **-34,643** | **-309,248** | **-54,479** | **148,576** |
| **ද්‍රවශීලතා තත්ත්වය** | | | | | |
| බැංකු වලින් ණය ලබා ගැනීම් | 49,681 | 32,701 | 78,181 | 48,348 | 36,580 |
| බැංකු ණය ගෙවීම් | 20,568 | 26,938 | 34,108 | 47,537 | 34,641 |
| නොපියවූ බැංකු ණය | 416,143 | 428,300 | 220,743 | 263,510 | 253,692 |
| කාලීන ණය | 96,650 | 89,417 | 102,012 | - | - |
| පරිත්‍යාගශීලී නියෝජිතායතන මඟින් අරමුදල් සපයන ව්‍යාපෘති ණය | 223,415 | 282,733 | 54,452 | - | - |
| බැංකු මඟින් ලබා ගත් ව්‍යාපෘති ණය | 43,155 | 56,150 | 64,279 | - | - |
| ණයකර | - | - | 20,000 | 20,000 | 20,000 |
| ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සහ ස්වාධීන විදුලි සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම් | 137,762 | 100,630 | 176,989 | 235,727 | 175,332 |
| ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සහ ස්වාධීන විදුලි සැපයුම්කරුවන්ට ගෙවීම් | 147,122 | 96,598 | 152,790 | 364,818 | 246,849 |
| ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සහ ස්වාධීන විදුලි සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ණය | 128,883 | 141,094 | 192,619 | 85,526 | 14,293 |
| **මෙහෙයුම් සංඛ්‍යා දත්ත** | | | | | |
| අලෙවි කළ ඒකක (ගි.වො.පැ.) | 14,285 | 15,214 | 14,520 | 14,153 | 15,235 |
| උත්පාදනය කළ ඒකක (ගි.වො.පැ.) | 16,392 | 17,378 | 15,942 | 15,588 | 16,728 |
| ඒකකයක පිරිවැය (රු.) | 21.67 | 19.42 | 36.15 | 41.18 | 30.89 |
| ඒකකයක අලෙවිය (රු.) | 16.72 | 16.35 | 21.24 | 42.86 | 35.90 |

මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය

[අ]තාවකාලික

විදුලිබල ක්ෂේත්‍රයට පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් 2024 ජූනි මසදී 2024 අංක 36 දරණ විදුලිබල පනත බලාත්මක කරන ලදී. එම පනත මඟින් ජාතික විදුලිබල උපදේශක සභාව (NEAC) සහ ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) පිහිටුවන ලද අතර, විදුලිබල කර්මාන්තයේ කටයුතු බෙදා වෙන් කිරීම, වෙළෙඳපොළ තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සහ විදුලිබල කර්මාන්තයට නව ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. කෙසේ වෙතත්, දැනට සිදුකරන විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී හඳුනාගත් ගැටළු විසඳීම සඳහා විදුලිබල පනත නැවත සලකා බැලීමේ යෝජනාව සඳහා 2024 දෙසැම්බර් මසදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, විශේෂඥ කමිටු වාර්තාව මත පදනම්ව විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී ඇත.

මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් ගිවිසුමෙහි සඳහන් ව්‍යුහාත්මක මිණුම් දඬු අනුව ලංවිමයෙහි රු. මිලියන 181,706 ක කල්පවත්නා ණය පියවීමේ යෝජිත සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ණය සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර ඇති අතර, ලංවිමයෙහි ගෙවීමට ඇති ණය රජයට අමතර වැය බරක් නොවන අයුරින් මීළඟ විදුලි ගාස්තු සංශෝධනයත් සමඟ ආපසු ගෙවීම ආරම්භ කිරීම සඳහා වන සාකච්ඡාවන් මේ වනවිට සිදුකරමින් පවතී.

## 8.2.2 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා වන රජයේ පුළුල් ප්‍රතිසංස්කරණවලට අනුකූලව, ජාත්‍යන්තර තෙල් සමාගම් තුනක්, එනම් චීනයේ සිනොපෙක්, ඕස්ට්‍රේලියාවේ යුනයිටඩ් පෙට්‍රෝලියම් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ආර්.එම්. පාර්ක්ස්, වෙත සිල්ලර ඉන්ධන වෙළෙඳපොළ බලපත්‍ර නිකුත් කිරීමෙන් ඛනිජ තෙල් අංශය ලිහිල් කිරීම සඳහා ශ්‍රී ලංකාව සුවිශේෂී පියවරක් තැබීය. 2024 වන විට මෙම සමාගම් ඔවුන්ගේ පැවැත්ම සැලකිය යුතු ලෙස පුළුල් කරගෙන තිබුණි. ඔවුන්ගේ ප්‍රවේශය තුළින් සේවා සැපයීම ඉහළ නැංවීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

සහ දේශීය ඉන්ධන වෙළෙඳපොළේ තරහකාරී මිල ගණන් හඳුන්වා දීම අපේක්ෂා කෙරේ.

2023 වර්ෂයේ දී බැරලයකට ඇමෙරිකානු ඩොලර් 82.22 ක් වූ සාමාන්‍ය බ්‍රෙන්ට් බොරතෙල් මිල 2024 වර්ෂයේ දී බැරලයකට ඇමෙරිකානු ඩොලර් 79.79 ක් දක්වා සියයට 3 කින් පහත වැටුණද, 2024 වර්ෂයේ දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සැලකිය යුතු මූල්‍ය පසුබෑමකට මුහුණ දුන්නේය. 2023 වර්ෂයේ දී රු. බිලියන 1,263.6 ක් වූ ආදායම සියයට 26.9 කින් රු. බිලියන 923.4 ක් දක්වා අඩුවී ඇත. නව ජාත්‍යන්තර ඉන්ධන ක්‍රියාකරුවන්ගේ පැමිණීමෙන් පසු වෙළෙඳපොළ කොටස අඩුවීම මෙම පහත වැටීමට විශාල වශයෙන් හේතු වූ අතර, 2023 වර්ෂයේ දී ලීටර් මිලියන 4,184 ක් වූ විකුණුම් පරිමාව ලීටර් මිලියන 286 කින් ලීටර් මිලියන 3,898 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩුවීමෙන් එය සනාථ වේ. සංස්ථාවේ දළ ලාභය 2024 වර්ෂයේ දී රු. බිලියන 75.6 ක් දක්වා සියයට 53.4 කින් පහත වැටුණි.

රාජ්‍ය ව්‍යවසායයන්හි ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම් වලින් පසුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ශේෂ පත්‍රයේ ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙතින් ලැබියයුතු සැලකිය යුතු ණයගැති ශේෂයන් නොමැති වීම හේතුවෙන්, ණයගැතියන් මත දඩ පොළී ආදායම 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 14,564.3 සිට 2024 වර්ෂයේ දී රු. මිලියන 1.68 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. පෙර අනුගමනය කරන ලද ණය කොන්දේසි මත ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත ඉන්ධන සැපයීම වෙනුවට මුදල් පදනම මත ඉන්ධන සැපයීමේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තීරණය හරහා මෙම වෙනස් වීම තවදුරටත් සවිගන්වා ඇත. මෙම ගැළපීම් හමුවේ වුවද, 2024 වර්ෂය අවසානය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි රාජ්‍ය ආයතනවලින් වෙළෙඳ ලැබිය යුතු අගය රු. බිලියන 10 ක් විය.

2023 වර්ෂය අවසානයේ දී වූ රු. මිලියන 22,086.8 සිට 2024 වර්ෂය අවසානය වන විට රු. මිලියන 279 ක් දක්වා බැංකු අයිරා සැලකිය යුතු ලෙස අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය වියදම් රු. මිලියන 1,175 ක් දක්වා සියයට 84.2 කින් පහත වැටුනද, වෙළෙඳපොළ පොළී අනුපාත අඩුවීමට ප්‍රතිචාර වශයෙන් මූල්‍ය ආදායම සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන්, ශුද්ධ මූල්‍ය ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 2,459.4 ක් දක්වා සියයට 75.3 කින් අඩු විය.

මෙහෙයුම් අංශයෙන්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාවේ අඩුවීමක් වාර්තා කළේය. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය 2023 වර්ෂයේ දී වූ මෙට්‍රික් ටොන් මිලියන 2,467 සිට 2024 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් මිලියන 1,890 ක් දක්වා සියයට 23.4 කින් පහත වැටී ඇත. ඒ හා සමානව, බොරතෙල් ආනයනය 2023 වර්ෂයේ දී වූ මෙට්‍රික් ටොන් මිලියන 12.6 සිට 2024 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් මිලියන 11.6 ක් දක්වා පහත වැටුණි. ඊට අනුරූපව, ලංකා ඛනිජතෙල්

**වගුව 8.6 | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන


| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **530,878** | **613,733** | **1,193,274** | **1,291,967** | **928,321** |
| ඔක්ටේන් 92 | 178,196 | 215,754 | 405,061 | 437,388 | 295,698 |
| ඔක්ටේන් 95 | 21,085 | 23,491 | 23,182 | 15,384 | 9,405 |
| ඩීසල් | 188,937 | 218,286 | 488,831 | 475,443 | 305,105 |
| සුපිරි ඩීසල් | 8,949 | 10,809 | 27,096 | 13,877 | 8,818 |
| දැවිතෙල් 800 cc | – | – | – | 3 | 1 |
| දැවිතෙල් 1500 cc | 18,525 | 16,807 | 62,345 | 42,583 | 23,453 |
| දැවිතෙල් 3500 cc / සුපිරි තෙල් | 49,444 | 19,982 | 6,662 | 26,984 | 31,406 |
| අවම සල්ෆර් ප්‍රතිශතයක් සහිත දැවිතෙල් | 1,852 | 12,387 | 28,756 | 57,143 | 31,640 |
| නැප්තා | 11,260 | 15,216 | 6,468 | 36,365 | 24,308 |
| භූමිතෙල් | 15,162 | 17,928 | 19,561 | 27,560 | 37,633 |
| ජෙට් - ඒ - 1 | 19,401 | 30,721 | 82,127 | 121,335 | 119,919 |
| වෙනත් නිෂ්පාදන | 6,060 | 12,452 | 4,360 | 9,538 | 36,056 |
| වෙනත් ආදායම් | 12,007 | 19,900 | 38,825 | 28,364 | 4,879 |
| **මුළු වියදම** | **528,507** | **695,549** | **1,810,862** | **1,171,621** | **895,056** |
| විකුණුම් පිරිවැය | 454,880 | 588,823 | 1,108,952 | 1,101,488 | 847,862 |
| විකුණුම් සහ බෙදාහැරීම් | 15,782 | 29,108 | 39,495 | 51,378 | 42,626 |
| පරිපාලන වියදම් | 3,683 | 6,991 | 5,106 | 29,006 | 15,259 |
| මූල්‍ය පිරිවැය | 20,911 | 25,645 | 119,537 | 7,454 | 1,175 |
| ක්ෂයවීම් | 2,670 | 2,684 | 2,647 | 2,635 | 2,435 |
| වෙනත් පිරිවැය (නිෂ්පාදන බදු හා ජාතිය ගොඩනැගීමේ බදු) | 8,740 | 9,079 | 5,648 | – | – |
| විනිමය අනුපාත විචලනයන් | 21,841 | 33,220 | 529,477 | -20,340 | -14,301 |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **2,371** | **-81,816** | **-617,588** | **120,346** | **33,265** |
| **බැංකු සඳහා ඇති ණය** | **529,187** | **693,040** | **87,749** | **59,020** | – |

මූලාශ්‍රය: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

(අ)තාවකාලික

නීතිගත සංස්ථාවේ තෙල් ආනයන බිල ද 2023 වර්ෂයේ දී වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 2,798 සිට 2024 වර්ෂයේ දී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,118.6 ක් දක්වා සියයට 24.3 කින් අඩුවී ඇත.

**රූප සටහන 8.2 | ආංශික ලාභදායිත්වය**




| | ප්‍රවාහනය | විදුලිබල උත්පාදනය | ගුවන් සේවා | කාර්මික | ගෘහස්ථ | කෘෂි කාර්මික | අපනයන |
|---|---|---|---|---|---|---|---|
| ■ ලාභය /(අලාභය) 2023 | 82,695 | 16,330 | 4,781 | 3,241 | 2,299 | 246 | 0 |
| ■ ලාභය /(අලාභය) 2024 | 27,531 | 1,110 | 3,148 | 1,349 | 1,160 | 11 | -5,900 |

මූලාශ්‍රය: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව


පිරිවැය පිළිබිඹු කරන මිලකරණ සූත්‍රයක් අඛණ්ඩව භාවිතා කිරීම සහ වර්ෂය තුළ ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂ වශයෙන් ශක්තිමත් වීම මත පදනම්ව, 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 120.3 ක ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. බිලියන 33.3 ක ශුද්ධ ලාභයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාර්තා කර ඇත.

2024 වර්ෂය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ එක් එක් අංශ අනුව ලාභදායිතාවය සලකා බැලීමේ දී, ප්‍රවාහන අංශයේ අඛණ්ඩ වැදගත්කම කැපීපෙනෙන අතර, එය ලාභයෙන් රු. මිලියන 27,531 ක් විය. අනෙකුත් කැපී පෙනෙන දායකත්වයන් අතර ගුවන් සේවා අංශයෙන් රු. මිලියන 3,148 ක්, විදුලිබල උත්පාදනයෙන් රු. මිලියන 1,110 ක්, කර්මාන්ත අංශයෙන් රු. මිලියන 1,349 ක්, දේශීය අංශයෙන් රු. මිලියන 1,160 ක් සහ කෘෂිකාර්මික අංශයෙන් රු. මිලියන 11 ක් ඇතුළත් විය. කෙසේ වෙතත්, අපනයන සහ නැව් තෙල් අංශයෙන් සංස්ථාව රු. මිලියන 5,900 ක සැලකිය යුතු අලාභයක් වාර්තා කර ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ශේෂ පත්‍රයේ ද කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු විය. සංස්ථාවේ ශුද්ධ හිමිකම 2023 වර්ෂය අවසානයේ වූ රු. බිලියන 36.6 සිට 2024 වර්ෂය අවසානයේ දී රු. බිලියන 69.7 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. කොටස් හිමියන්ගේ වටිනාකමෙහි මෙම වර්ධනයට හේතු වී ඇත්තේ විවක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය සහ පසුගිය වර්ෂ කිහිපය තුළ සිදු කරන ලද ඵලදායී ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාමාර්ගයන්ය. අඛණ්ඩ මූල්‍ය වගකීමට සාක්ෂියක් ලෙස, ජාතික ආර්ථිකයට දායක වන්නෙකු සහ වගකිවයුතු රාජ්‍ය අංශයේ ව්‍යාවසායයක් ලෙස එහි කාර්යභාරය නැවත තහවුරු කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඒකාබද්ධ අරමුදලට රු. බිලියන 10 ක් ප්‍රේෂණය කරන ලදී.

ඉදිරිය දෙස බලන විට, ඛනිජ තෙල් ආඝන්න කාලයේදී ශ්‍රී ලංකාවේ බලශක්ති මිශ්‍රණයේ මූලිකව පවතින අතර, වෙනස්වන ගෝලීය බලශක්ති සන්දර්භය තුළ ඉදිරි දැක්මකින් යුතු උපායමාර්ගයක් අවශ්‍ය වේ. පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් සහ තාක්ෂණයන්හි වැඩි ආයෝජන සමඟින් බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට රජය අපේක්ෂා කරනු ලබයි. ඒ සමඟම, පොදු ප්‍රවාහන පද්ධති නවීකරණය කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට දරන උත්සාහයන්, විශේෂයෙන් ප්‍රවාහන හා විදුලිබල උත්පාදන අංශවල, ඉන්ධන පරිභෝජනය සීමා කිරීමේදී තීරණාත්මක වනු ඇත. ශ්‍රී ලංකාව සඳහා දිගුකාලීන බලශක්ති සුරක්ෂිතතාව, ආර්ථික ස්ථාවරත්වය සහ පාරිසරික තිරසාරභාවය සහතික කිරීමේදී මෙම උපායමාර්ගික වෙනස්කම් අත්‍යවශ්‍ය වනු ඇත.

**රූප සටහන 8.3 | නිෂ්පාදිත කළඹේ සංයුතිය**




මූලාශ්‍රය: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

## 8.3 රාජ්‍ය බැංකු

2024 වර්ෂයේ දී අභියෝගාත්මක පරිසරයක කටයුතු කළද, බැංකු ක්ෂේත්‍රය එම තත්ත්වයට ඔරොත්තු දෙමින් සහ යථා තත්ත්වයට පත්වීමේ මාවතක අඛණ්ඩව ගමන් කරමින් සිටී. විශේෂයෙන්ම, ඉහළ ශුද්ධ පොළී ආදායම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සාර්ථකව ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් ජනිත වූ ණය හානිකරණ ගාස්තු ආපසු හැරවීම මුල්කොට ක්ෂේත්‍රයේ ලාභදායිත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. අක්‍රිය ණය අනුපාතය තවදුරටත් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතියද, එය වසර තුළ අඩු වීමත් සමඟ ණය අවදානම් දර්ශකවල සුළු දියුණුවක් පෙන්නුම් කෙරුනි.

වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ සහායයෙන් 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 62 ට සාපේක්ෂව රාජ්‍ය බැංකුවල සමස්ත ලාභදායිත්වය 2024 වර්ෂයේ දී රු. බිලියන 178.4 ක් දක්වා සියයට 187.5 කින් ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත බැංකු අංශය (බලපත්‍රලාභී වාණිජ හා බලපත්‍රලාභී විශේෂිත බැංකු ඇතුළත්ව) 2024 වර්ෂය තුළ වාර්තා කරන ලද ලාභය සඳහා රාජ්‍ය බැංකු විසින් සියයට 32 ක දායකත්වයක් දක්වා ඇත. බැංකු ක්ෂේත්‍රය සතු වත්කම් සඳහා සියයට 47.3 ක දායකත්වයක් දක්වමින් රාජ්‍ය බැංකු තවදුරටත් ප්‍රමුඛස්ථානයේ රැඳී සිටී. මෙම බැංකු සියල්ලක්ම පාහේ තම ගනුදෙනුකරුවන් වෙත සේවා සැපයීම සඳහා ඩිජිටල් මාධ්‍යයන් වෙත අනුගත වූ අතර, 2024 වර්ෂයේ දී අලුතින් ආරම්භ කරන ලද නව ශාඛා 75 ත් සමඟ රාජ්‍ය බැංකු සතු සේවා සපයන ඒකක ඇතුළුව සමස්ත ශාඛා ජාලය 2,003 ක් දක්වා පුළුල් කර ඇත.

**වගුව 8.7 | ප්‍රධාන රාජ්‍ය බැංකුවල මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය**

| | බැංකු අංශය | ලංකා බැංකුව | | මහජන බැංකුව | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | |
|---|---|---|---|---|---|---|---|
| | | වටිනාකම | ප්‍රතිශතය (%) | වටිනාකම | ප්‍රතිශතය (%) | වටිනාකම | ප්‍රතිශතය (%) |
| වත්කම් (රු. බිලියන) | 22,176 | 4,985 | 22 | 3,298 | 15 | 1,752 | 8 |
| තැන්පතු (රු. බිලියන) | 17,969 | 4,209 | 23 | 2,855 | 16 | 1,556 | 9 |
| බදු පෙර ලාභය (රු. බිලියන) | 563 | 107 | 19 | 42 | 7 | 26 | 5 |
| බදු පසු ලාභය (රු. බිලියන) | 310 | 64 | 21 | 25 | 8 | 16 | 5 |
| ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය (%) | - | 13 | - | 10.9 | - | 23.4 | - |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය (%) | - | 17 | - | 16.5 | - | 25.9 | - |
| බදු පෙර වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | - | 2 | - | 1.3 | - | 1.5 | - |
| පොළී ආන්තිකය (%) | - | 4 | - | 3.0 | - | 4.2 | - |

මූලාශ්‍ර: රාජ්‍ය බැංකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව

තවද, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් සමස්ත පාලනය ඉහළ නැංවීම, අවදානම් කළමණාකරණය හා සුපරීක්ෂණ සම්බන්ධයෙන් වන තීරණාත්මක ප්‍රතිසංස්කරණ ගණනාවක් රජය විසින් ආරම්භ කර ඇත. මෙම ආයතනවල කාර්යක්ෂමතාව, ඵලදායීතාවය සහ මූල්‍ය ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙහි මූලාරම්භයක් ලෙස, රාජ්‍ය බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහා පත්කිරීම් කුසලතා, ස්වාධීනත්වය සහ විනිවිදභාවය මත පදනම්ව සිදු කරන බව සහතික කරමින් ඒ සඳහා ප්‍රමිතිගත රාමුවක්, රජය විසින් සම්මත කර ප්‍රකාශයට පත් කර ඇත. අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කිරීම, පාලන ව්‍යුහයන් සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම සහ බැංකු මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා මෙම පියවර සැලසුම් කර ඇති අතර, එමගින් මූල්‍ය අංශය තුළ රජය සතු ව්‍යාපාරවල තරහකාරිත්වය වැඩි කිරීම අපේක්ෂා කෙරේ.

තවද, මෙම ප්‍රතිසංස්කරණ මගින් රජය මත ඇති මූල්‍ය බර ලිහිල් කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සහ රාජ්‍ය මූල්‍ය ආයතනවල කළමනාකරණයේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

## 8.3.1 ලංකා බැංකුව

ලංකා බැංකුව විශාලතම වත්කම් පදනම සමඟ විශාලතම තැන්පතු පදනම සහිත බැංකුව ලෙස තවදුරටත් රැඳී සිටී. 2024 වර්ෂය අවසානය වන විට ලංකා බැංකුවේ සමස්ත වත්කම් සියයට 13 කින් ඉහළ ගොස් ඇති අතර, එය බැංකු අංශයේ සාමාන්‍ය වර්ධන වේගය වන සියයට 8.7 ට වඩා ඉහළ වර්ධන වේගයක් වේ. ඒ අතර, බැංකුවේ තැන්පතු පදනම 2024 වර්ෂය අවසානය වන විට සියයට 8.4 කින් ඉහළ ගොස් ඇති අතර, එය බැංකු අංශයේ සාමාන්‍ය වර්ධන වේගය වන සියයට 8.1 ට වඩා සාපේක්ෂව ඉහළ අගයක් වේ.

තවද, 2023 වර්ෂයේ දී රු. බිලියන 40.3 ක් වූ ලංකා බැංකුවෙහි ලාභදායීත්වය 2024 වර්ෂයේ දී රු. බිලියන 106.9 ක් දක්වා සියයට 165 කින් ඉහළ ගොස් ඇත. ණය සහ රජයේ සුරැකුම්පත් සඳහා අඩු ඉපැයීමක් ලබා දෙන වඩාත් ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හේතුවෙන් ශුද්ධ පොළී ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 12 කින්

**වගුව 8.8 | ලංකා බැංකුවෙහි මූල්‍ය තත්ත්වය**


රු.මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **247,164** | **290,362** | **513,149** | **542,187** | **485,405** |
| පොළී ආදායම | 226,311 | 260,513 | 456,267 | 524,798 | 461,114 |
| පොළී වියදම | 151,535 | 149,261 | 329,921 | 433,610 | 293,561 |
| **ශුද්ධ පොළී ආදායම** | **74,776** | **111,252** | **126,346** | **91,188** | **167,552** |
| වෙනත් ආදායම් | 20,853 | 29,848 | 57,686 | 33,002 | 55,700 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **72,077** | **97,911** | **153,055** | **83,848** | **116,348** |
| සේවක වියදම් | 18,190 | 24,982 | 28,991 | 29,818 | 40,287 |
| වෙනත් වියදම් | 53,887 | 72,929 | 124,064 | 54,030 | 76,061 |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **23,552** | **43,190** | **30,977** | **40,342** | **106,904** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ආයෝජන | 785,832 | 1,125,018 | 1,601,082 | 1,752,179 | 2,357,161 |
| තැන්පතු | 2,474,775 | 2,866,894 | 3,334,774 | 3,882,232 | 4,208,603 |
| ණය සහ අත්තිකාරම් | 1,988,409 | 2,413,762 | 2,325,594 | 2,209,062 | 2,177,708 |
| අක්‍රිය අත්තිකාරම් (දළ) | 98,564 | 251,158 | 324,630 | 311,863 | 372,818 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 0.9 | 1.3 | 0.76 | 0.92 | 2.30 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 11.9 | 21.0 | 14.06 | 10.55 | 23.20 |
| අක්‍රිය ණය අනුපාතය (%) | 4.8 | 4.4 | - | - | - |
| ණය අපහායනය (අදියර III) අනුපාතය (%) | - | 5.08 | 5.27 | 5.07 | 7.20 |

මූලාශ්‍රය: ලංකා බැංකුව

සැලකිය යුතු ලෙස අඩු වුවද, 2024 වර්ෂයේ දී බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය සැලකිය යුතු ලෙස වැඩි දියුණු විය. මෙයට ප්‍රධාන හේතුව ලෙස, ආදායමේ පහත වැටීමේ අනුපාතයට වඩා ඉහළ අගයකින් පොළී වියදම සියයට 32 කින් අඩුවීම දැක්විය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකා බැංකුව විසින් අභියෝගාත්මක ආර්ථික පරිසරයක් තුළ, ඵලදායී ලෙස පිරිවැය කළමනාකරණය කර ලාභදායීතාවය වැඩි දියුණු කරගැනීම පිළිබිඹු කරමින් ශුද්ධ පොළී ආදායමේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

**රූප සටහන 8.4 | පාරිභෝගිකයින්ට ණය සහ අත්තිකාරම් - නිෂ්පාදිත අනුව (ලංකා බැංකුව)**




මූලාශ්‍රය: ලංකා බැංකුව

2023 වර්ෂය අවසානයේදී රු. බිලියන 2,209 ක් වූ ගනුදෙනුකරුවන් සඳහා ලබා දෙන ලද මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 2024 වර්ෂය අවසානය වන විට රු. බිලියන 2,178 ක් දක්වා සියයට 1.4 කින් පහළ ගොස් ඇති අතර, එය බැංකු අංශයේ සාමාන්‍ය වර්ධන වේගය වූ සියයට 4.1 ට සාපේක්ෂව පහළ අගයකි.

ණය අයකර ගැනීම සම්බන්ධයෙන් බැංකු ක්ෂේත්‍රයේ අපහසුතාවයන් පැවතියද, 2024 වර්ෂය අවසානය වන විට සියයට 7.20 ක් ලෙසට අදියර - III ණය අනුපාතය ලංකා බැංකුව විසින් පවත්වාගෙන ගිය අතර, එහි බැංකු අංශයේ සාමාන්‍ය සියයට 12.3 ක් විය. රට තුළ මූල්‍ය අන්තර්ගතභාවයට සහාය දෙමින් ලංකා බැංකුවේ ශාඛා ජාලය දිවයින පුරා පිහිටි ශාඛා 654 කින් (සීමිත සේවා ශාඛා ඇතුළුව) සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර 1,493 කින් සමන්විත වේ. මේ අතර, ලංකා බැංකුවේ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඩිජිටල් සහ අතථ්‍ය සේවා වේදිකා පුළුල් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

2024 සහ 2025 කාලය තුළ ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ලංකා බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීම් අවස්ථා දෙකකදී ඉහළ නංවන ලදී. 2024 දෙසැම්බර් මාසයේ දී, ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ලංකා බැංකුවේ කල්පවත්නා විදේශ මුදලින් නිකුතු සිදුකරන්නගේ පැහැර හැරීමේ ශ්‍රේණිගතකිරීම "සිසි" ශ්‍රේණියේ සිට "සිසිසි-" ශ්‍රේණිය දක්වා ඉහළ නංවන ලද අතර, 2025 ජනවාරි මාසයේ දී එය "සිසිසි-" සිට "සිසිසි+" ශ්‍රේණිය දක්වා තවදුරටත් ඉහළ නංවන ලදී.

2024 වර්ෂයේ දී ලොව විශිෂ්ඨතම බැංකු 1000 අතර ස්ථානයක් ලබා ගනිමින් සහ එක්සත් රාජධානියේ "ද බෑන්කර්" සඟරාව මගින් 2024 වසරේ බැංකුව ශ්‍රී ලංකා යන කීර්තිමත් නාමය ලබා ගනිමින් ලංකා බැංකුව සිය ගෝලීය ස්ථාවරත්වය නැවත වරක් තහවුරු කර ගන්නා ලදී. ස්ථාවර සන්නාම නායකත්වය පෙන්නුම් කරමින්, රටේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ සිය වැදගත් කාර්යභාරය නැවත වරක් තහවුරු කරමින් අඛණ්ඩව 15වන වර්ෂය සඳහාත් බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ලංකා විසින් පිරිනමනු ලබන ලංකාවේ අංක 1 බැංකු සන්නාමය ලෙසද ලංකා බැංකුව පිළිගැනීමට ලක් විය.

## 8.3.2 මහජන බැංකුව

වත්කම් සහ තැන්පතු පදනම සැලකිල්ලට ගත් කල ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම බලපත්‍රලාභී වාණිජ බැංකුව වන මහජන බැංකුව ශ්‍රී ලංකාවේ බැංකු අංශය සතු වත්කම් පදනමේ සිදුවූ සියයට 8.7 ක වර්ධනයට සාපේක්ෂව 2024 වර්ෂය අවසානය වන විට වත්කම් පදනම සියයට 8.5 කින්

**වගුව 8.9 | මහජන බැංකුවෙහි මූල්‍ය තත්ත්වය**


රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **190,982** | **207,250** | **357,229** | **422,242** | **367,978** |
| පොළී ආදායම | 179,717 | 197,330 | 321,936 | 394,795 | 349,292 |
| පොළී වියදම | 118,784 | 114,869 | 246,178 | 340,473 | 242,050 |
| **ශුද්ධ පොළී ආදායම** | **60,934** | **82,461** | **75,758** | **54,321** | **107,242** |
| වෙනත් ආදායම් | 10,781 | 11,265 | 35,293 | 27,447 | 18,686 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **50,487** | **63,339** | **89,712** | **65,459** | **83,586** |
| සේවක වියදම් | 19,722 | 22,772 | 26,603 | 24,494 | 35,835 |
| වෙනත් වියදම් | 30,765 | 40,567 | 63,109 | 40,965 | 47,751 |
| **බදු පෙර ලාභය /(අලාභය)** | **21,227** | **30,387** | **21,338** | **15,345** | **41,584** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ආයෝජන | 410,041 | 603,472 | 934,978 | 990,395 | 1,467,917 |
| තැන්පතු | 1,835,099 | 2,071,533 | 2,371,519 | 2,653,106 | 2,854,704 |
| ණය සහ අත්තිකාරම් (දළ) | 1,723,466 | 1,835,697 | 1,783,107 | 1,709,458 | 1,521,965 |
| ක්‍රීය අත්තිකාරම් | 53,745 | 59,995 | 79,335 | 81,091 | 79,028 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) | 1.0 | 1.2 | 0.8 | 0.5 | 1.3 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) | 14.4 | 19.9 | 12.2 | 6.6 | 17.7 |
| ක්‍රීය ණය අනුපාතය (%) | 3.2 | 3.2 | - | - | 0.0 |
| ණය අපහායනය (අදියර III) අනුපාතය (%) | 3.5 | 4.0 | 12.8 | 9.0 | 10.3 |

මූලාශ්‍රය: මහජන බැංකුව

රු. බිලියන 3,297.8 ක් දක්වා ඉහළ නංවාගෙන ඇත. 2024 වර්ෂය අවසානය වන විට මහජන බැංකුවේ තැන්පතු පදනම රු. බිලියන 2,854.7 ක් දක්වා සියයට 7.6 කින් ඉහළ ගොස් ඇති අතර, එය බැංකු අංශයේ සියයට 8.1 ක වර්ධනයක් ලෙස වාර්තා වී ඇත. ගනුදෙනුකරුවන්ට ණය ලබා දීම බැංකු අංශයේ සියයට 4.1 කින් ඉහළ යාමට සාපේක්ෂව මහජන බැංකුවේ සියයට 11කින් රු. බිලියන 1,521.9 ක් දක්වා 2024 වර්ෂය අවසානය වන විට අඩු වී ඇත.

රූප සටහන 8.5 | පාරිභෝගිකයන්ට ණය සහ අත්තිකාරම් - නිෂ්පාදිතය අනුව (මහජන බැංකුව)




මූලාශ්‍රය: මහජන බැංකුව

2024 වර්ෂයේ දී පොළී ආදායම සියයට 12 කින් පහළ යාම ට සාපේක්ෂව පොළී වියදම සියයට 29 කින් පහළ යාම හේතුවෙන් මහජන බැංකුවෙහි ශුද්ධ පොළී ආදායම රු. බිලියන 107.2 ක් දක්වා සියයට 97 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. පොළී වියදම් කැපී පෙනෙන ලෙස පහළ යාමට හේතුව කාලීන තැන්පතු අඩු පොළී අනුපාතවලට ප්‍රතිමිලකරණය වූ නිසාය. 2023 වර්ෂයේ වාර්තා කරන ලද රු. බිලියන 15.3 ක් වූ බදු පෙර ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. බිලියන 41.6 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට බැංකුවට හැකියාව ලැබී ඇත.

2024 වර්ෂය අවසානය වන විට බැංකු අංශයේ පැවැති සියයට 12.3 ක අදියර III ණය අනුපාතයට සාපේක්ෂව මහජන බැංකුවේ අදියර III ණය අනුපාතය සියයට 10.3 ක් විය. මහජන බැංකුවේ අදියර I ප්‍රාග්ධනය සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 2024 වර්ෂය අවසානය වන විට සියයට 10.9 ක් වූ අතර, එය නියම කරන ලද අවම අවශ්‍යතාවය වන සියයට 9.5 ට වඩා ඉහළ අගයකි. 2024 වර්ෂයේ දී මහජන බැංකුවේ ශාඛා ජාලය බැංකු ශාඛා 751 කින් (සේවා මධ්‍යස්ථානද ඇතුලුව) සහ රට පුරා ස්ථාපිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 839 කින් සමන්විත වේ.

## 8.3.3 ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ජාතික ඉතිරි කිරීමේ බැංකුව ශක්තිමත් ශාඛා ජාලයකින් සමන්විත වන අතර, දිවයින පුරා ශාඛා 262 ක් සහ තැපැල් කාර්යාල / උප තැපැල් කාර්යාල 4,006 ක් හරහා ක්‍රියාත්මක වේ. 2024 වර්ෂය අවසානය වන විට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වත්කම් පදනම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 4 කින් රු. බිලියන 1,752.4 ක් දක්වා ඉහළ ගොස් ඇත. එසේම තැන්පතු පදනම සහ ණය කළඹ 2024 වර්ෂය අවසානය වන විට පිළිවෙළින්, රු. බිලියන 1,556.3 ක් හා රු. බිලියන 532.4 ක් ලෙස 2023 ට සාපේක්ෂව පිළිවෙලින්, සියයට 5 කින් සහ සියයට 1 කින් ඉහළ ගොස් ඇත.

2023 වර්ෂයේ දී රු. බිලියන 4.3 ක් වූ බදු පෙර ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 26.4 ක් දක්වා සියයට

වගුව 8.10 | ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි මූල්‍ය තත්ත්වය

රු. මිලියන


| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **127,547** | **134,939** | **174,638** | **232,064** | **207,637** |
| පොළී ආදායම | 122,512 | 131,438 | 173,021 | 226,967 | 203,748 |
| පොළී වියදම | 87,622 | 76,809 | 140,477 | 197,402 | 130,966 |
| **ශුද්ධ පොළී ආදායම** | **34,890** | **54,630** | **32,544** | **29,565** | **72,782** |
| වෙනත් ආදායම් | 4,881 | 3,293 | 2,614 | 5,097 | 3,889 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **24,126** | **29,368** | **30,649** | **30,376** | **50,241** |
| සේවක වියදම් | 9,967 | 12,867 | 13,791 | 16,110 | 20,306 |
| වෙනත් වියදම් | 14,159 | 16,501 | 16,858 | 14,266 | 29,935 |
| **බදු පෙර ලාභය** | **15,645** | **28,555** | **4,510** | **4,287** | **26,431** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ශාඛා ගණන | 259 | 261 | 262 | 262 | 262 |
| තැපැල්/උප තැපැල් ශාඛා ගණන | 4,063 | 4,064 | 4,064 | 4,064 | 4,006 |
| ආයෝජන | 798,811 | 980,672 | 978,772 | 1,030,689 | 1,120,903 |
| තැන්පතු | 1,237,124 | 1,428,467 | 1,476,740 | 1,482,532 | 1,556,271 |
| ණය සහ අත්තිකාරම් | 516,795 | 538,942 | 578,648 | 526,521 | 532,379 |
| අක්‍රීය අත්තිකාරම් | 14,532 | 16,282 | 22,985 | 25,177 | 52,330 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 1.24 | 1.93 | 0.28 | 0.26 | 1.54 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 20.67 | 33.92 | 3.40 | 9.36 | 18.07 |
| අක්‍රීය ණය අනුපාතය (%) | 2.79 | 2.97 | - | - | |
| ණය අපහායනය (අදියර III) අනුපාතය (%) | - | 2.54 | 2.83 | 2.41 | 5.18 |

මූලාශ්‍රය: ජාතික ඉතිරි කිරීමේ බැංකුව

517 කින් ඉහළ ගොස් ඇති අතර, මෙයට ප්‍රධාන වශයෙන් 2023 වර්ෂය ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී පොළී වියදම සියයට 34 කින් අඩුවීම හේතු වී ඇත.

2024 වර්ෂය අවසානය වන විට බැංකුවේ ණය කළඹ සඳහා කාලීන ණය සියයට 68 කින් දායකත්වයක් දක්වා ඇති අතර, උකස් ණය දෙවන වැඩිම දායකත්වය දක්වා ඇත.

රූප සටහන 8.6 | පාරිභෝගිකයන්ට ණය සහ අත්තිකාරම් - නිෂ්පාදිතය අනුව (ජාතික ඉතිරි කිරීමේ බැංකුව)




මූලාශ්‍රය: ජාතික ඉතිරි කිරීමේ බැංකුව

## 8.3.4 නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස අරමුණු සඳහා ණය පහසුකම් සැපයීම සිදු කරන අතර, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිතුගත කර ඇති එකම රාජ්‍ය බැංකුව වේ. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ශාඛා 39 කින් යුතු ජාලයක් සමඟ ක්‍රියාත්මක වේ.

ශුද්ධ පොළී ආන්තිකය සියයට 20.4 ක් දක්වා මධ්‍යස්ථ ලෙස වැඩි වුවද, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි බදු පෙර ලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 64 ක් දක්වා සියයට 97 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. ලාභයේ මෙම සැලකිය යුතු අඩුවීමට ප්‍රධාන වශයෙන් 2023 වර්ෂයේ දී රු. මිලියන 3,134 ක් වූ අනෙකුත් ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 337 ක් දක්වා සියයට 89 කින් කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේ දී සියයට 17.7 ක්වූ හිමිකම මත ප්‍රතිලාභය 2024 වර්ෂයේ දී සෘණ සියයට 2.4 ක් විය. බැංකුවේ කොටසකට ශුද්ධ වත්කම් රු 119.19 ක් දක්වා අඩු වුවද, 2024 දෙසැම්බර් මස අවසානයේ දී කොටසක මිල රු. 48.60 ක් විය.

2024 වර්ෂය අවසානය වන විට නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ණය කළඹ, බැංකු අංශයේ සියයට 4.1 ක වර්ධනයට සාපේක්ෂව රු. බිලියන 40.1 ක් දක්වා සියයට 2 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, 2023 වර්ෂය අවසානය වන විට සියයට 40.9 ක්වූ බැංකුවේ අදියර III ණය අනුපාතය 2024 වර්ෂය අවසානය වන විට සියයට 45.9 ක් දක්වා වැඩි විය. බැංකුවේ තැන්පතු පදනම 2023 වර්ෂය අවසානයේ පැවති රු. බිලියන 53.6 ට සාපේක්ෂව 2024 වර්ෂය අවසානයේ රු. බිලියන 52 ක් දක්වා සියයට 3 කින් අඩු වූ අතර, එහි බැංකු අංශයේ සාමාන්‍ය වර්ධනය සියයට 8.1 ක් විය.

## 8.3.5 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1931 වර්ෂයේ සිට නිවාස හා නිවාස ආශ්‍රිත අරමුණු සඳහා උකස් ණය ලබා දීමේ නිරතව සිටී. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ශාඛා 25 කින් යුත් ශාඛා ජාලයක් සමඟ ක්‍රියාත්මක වේ.

2023 වර්ෂය අවසානය වන විට රු. බිලියන 52.1 ක් ලෙස පැවති බැංකුවෙහි තැන්පතු පදනම 2024 වර්ෂය අවසානය වන විට රු. බිලියන 48.2 ක් දක්වා සියයට 7.5 කින් පහළ

වගුව 8.11 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුවෙහි මූල්‍ය තත්ත්වය

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **7,856** | **7,004** | **8,877** | **14,329** | **8,507** |
| පොළී ආදායම | 7,456 | 6,612 | 8,425 | 11,195 | 8,170 |
| පොළී වියදම | 4,475 | 3,556 | 5,679 | 8,884 | 5,388 |
| **ශුද්ධ පොළී ආදායම** | **2,981** | **3,056** | **2,746** | **2,311** | **2,782** |
| වෙනත් ආදායම | 400 | 392 | 452 | 3,134 | 337 |
| **සමස්ත වියදම** | **2,313** | **2,570** | **2,895** | **3,411** | **3,054** |
| සේවක වියදම් | 1,174 | 1,387 | 1,544 | 1,584 | 1,646 |
| වෙනත් වියදම් | 1,139 | 1,183 | 1,351 | 1,827 | 1,408 |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **1,068** | **878** | **303** | **2,034** | **64** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ආයෝජන | 17,406 | 18,709 | 17,181 | 23,978 | 22,437 |
| තැන්පතු | 47,947 | 49,813 | 50,245 | 53,613 | 52,005 |
| ණය සහ අත්තිකාරම් | 41,192 | 41,837 | 42,630 | 41,010 | 40,130 |
| අක්‍රිය අත්තිකාරම් | 13,134 | 13,190 | 16,187 | 18,948 | 21,029 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 2.36 | 1.93 | 0.97 | 3.11 | 0.10 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 12.99 | 9.02 | 4.99 | 17.70 | -2.43 |
| සේ.අ.අ. ඇතුළුව (අදියර III) ණය අනුපාතය (%) | 33.03 | 32.44 | - | - | - |
| ණය අපහායනය (අදියර III) අනුපාතය (%) | - | - | 37.97 | 40.47 | 45.92 |

මූලාශ්‍රය: නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව

වගුව 8.12 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි මූල්‍ය තත්ත්වය

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **6,260** | **5,425** | **7,517** | **9,600** | **8,173** |
| පොළී ආදායම | 6,077 | 5,253 | 7,402 | 9,324 | 7,591 |
| පොළී වියදම | 3,960 | 2,951 | 5,463 | 8,733 | 5,392 |
| **ශුද්ධ පොළී ආදායම** | **2,117** | **2,302** | **1,939** | **592** | **2,198** |
| වෙනත් ආදායම් | 183 | 172 | 115 | 276 | 582 |
| **සමස්ත වියදම** | **1,728** | **2,069** | **2,143** | **2,032** | **2,622** |
| සේවක වියදම් | 873 | 1,084 | 1,090 | 1,015 | 1,229 |
| වෙනත් වියදම් | 855 | 985 | 1,053 | 1,017 | 1,393 |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **572** | **405** | **-89** | **-1,165** | **158** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ආයෝජන | 14,248 | 13,792 | 15,577 | 15,721 | 11,927 |
| තැන්පතු | 45,388 | 45,738 | 49,140 | 52,137 | 48,161 |
| ණය සහ අත්තිකාරම් | 36,857 | 38,102 | 39,267 | 38,603 | 41,730 |
| අක්‍රිය අත්තිකාරම් | 8,412 | 7,598 | 7,954 | 10,659 | 14,738 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 1.15 | 0.76 | -0.16 | -2.15 | 0.28 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 6.10 | 4.11 | 3.17 | -20.25 | 0.59 |
| සේ.අ.අ. ඇතුළුව (අදියර III) ණය අනුපාතය (%) | 22.94 | 19.84 | – | – | – |
| ණය අපහායනය (අදියර III) අනුපාතය (%) | – | – | 20.26 | 26.00 | 33.00 |

මූලාශ්‍රය: රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ගොස් ඇත. 2024 වර්ෂයේ දී ශුද්ධ පොළී ආදායම රු. මිලියන 2,198 ක් දක්වා පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 1,606 කින් තියුණු ලෙස වැඩිවීම හේතුවෙන්, 2023 වර්ෂයේ දී රු. මිලියන 1,165 ක බදු පෙර අලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව රු. මිලියන 158 ක බදු පෙර ලාභයක් වාර්තා කළේය.

2024 වර්ෂය අවසානය වන විට බැංකුවෙහි මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 56 ක් දක්වා සියයට 6 කින් පහළ ගොස් ඇත. 2023 වර්ෂයේ දී රු. බිලියන 38.6 ක් ලෙස පැවති බැංකුවෙහි ණය කළඹ 2024 වර්ෂය අවසානය වන විට සියයට 8 කින් ඉහළ ගොස් රු. බිලියන 41.7 ක් ලෙස පැවති අතර, මෙය බැංකු අංශයෙහි සාමාන්‍ය වර්ධනය වූ සියයට 4.1 කට වඩා ඉහළ අගයකි. බැංකුවෙහි අදියර III ණය අනුපාතය 2023 වර්ෂය අවසානය වන විට පැවති සියයට 26 සිට 2024 වර්ෂය අවසානය වන විට සියයට 33 ක් දක්වා වැඩිවීමෙන් බැංකුවෙහි වත්කම්වල ගුණාත්මකභාවයෙහි පිරිහීමක් පෙන්නුම් කෙරේ.

## 8.3.6 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රවේශ විය හැකි හා දැරිය හැකි ණය පහසුකම් ලබාදෙමින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ශාඛා 272 ක ජාලයක් සමගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ක්‍රියාත්මක වේ.

වගුව 8.13 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි මූල්‍ය තත්ත්වය

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **24,354** | **24,497** | **36,203** | **47,586** | **39,552** |
| පොළී ආදායම | 23,182 | 23,555 | 35,273 | 46,232 | 37,922 |
| පොළී වියදම | 12,294 | 9,806 | 19,640 | 29,290 | 18,368 |
| **ශුද්ධ පොළී ආදායම** | **10,888** | **13,749** | **15,634** | **16,942** | **19,554** |
| වෙනත් ආදායම් | 900 | 942 | 929 | 1,589 | 2,866 |
| **සමස්ත වියදම** | **10,775** | **13,915** | **16,204** | **17,349** | **19,211** |
| සේවක වියදම් | 5,983 | 7,325 | 8,740 | 9,551 | 11,945 |
| වෙනත් වියදම් | 4,792 | 6,590 | 7,465 | 8,498 | 7,266 |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **1,013** | **776** | **359** | **1,183** | **3,210** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ආයෝජන | 55,400 | 60,630 | 71,213 | 86,967 | 68,148 |
| තැන්පතු | 172,883 | 184,392 | 210,301 | 226,080 | 253,664 |
| දළ ණය සහ අත්තිකාරම් | 167,099 | 187,438 | 198,008 | 194,425 | 227,168 |
| අක්‍රිය අත්තිකාරම් | 16,658 | 16,322 | 14,057 | 29,426 | 26,338 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 0.21 | 0.27 | 0.71 | 0.4 | 1.03 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 2.72 | 2.07 | 5.07 | 5.07 | 5.83 |
| අදියර III ණය අනුපාතය (%) | 10.11 | 8.71 | 7.1 | 8.8 | 6.25 |

මූලාශ්‍රය: ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

දළ ණය හා අත්තිකාරම් 2024 වර්ෂය අවසානය වන විට රු. බිලියන 227.2 ක් වූ අතර, එය 2023 වර්ෂය අවසානය වන විට පැවති රු. බිලියන 194.4 ට සාපේක්ෂව සියයට 17 ක තියුණු වර්ධනයක් වාර්තා කරයි. 2023 වර්ෂය අවසානය වන විට රු. බිලියන 226.1 ක් ලෙස පැවති ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි තැන්පතු පදනම 2024 වර්ෂය අවසානය වන විට රු. බිලියන 253.7 ක් ලෙස සියයට 12.2 කින් වර්ධනය වී ඇත.

බැංකු අංශයෙහි අදියර III ණය අනුපාතය සියයට 12.3 ක සාමාන්‍ය දක්වා අඩු වීමත් සමඟ බැංකුවෙහි අදියර III ණය අනුපාතය 2023 වර්ෂය අවසානය වන විට පැවති සියයට 8.8 සිට 2024 වර්ෂය අවසාන වන විට සියයට 6.3 ක් දක්වා අඩු වී ඇත. විශේෂයෙන්, හානි කරන ගාස්තු ආපසු හැරවීම හේතුවෙන් 2023 වර්ෂයේ දී රු. බිලියන 1.2 ක් ලෙස පැවති බදු පෙර ලාභය 2024 වර්ෂයේ දී රු. බිලියන 3.2 ක් දක්වා කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත.

## 8.3.7. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවන ලද්දේ එහි සාමාජිකයින්ට ප්‍රතිලාභ රැසක් හරහා සමාජ ආරක්ෂණය ලබා දීමේ අරමුණින් ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි සාමාජිකත්වය රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා හිමිකම් නොලබන සහ පුද්ගලික අංශයේ හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයින්ගෙන් සමන්විත වේ. සංක්‍රමණික සහ ස්වයං රැකියා අංශයේ සේවකයින්ට ද අරමුදලට නිශ්චිත අවම දායකත්වයක් ගෙවීමෙන් ස්වේච්ඡාවෙන් සාමාජිකයින් විය හැකිය. සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත දායකත්වය සපයනු ලබන්නේ සේවා යෝජකයා විසින් පමණක් වන අතර, එය සේවකයාගේ දළ ඉපැයීම් වලින් සියයට 3 කි. මෙය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයක් වේ.

2024 වර්ෂය අවසානය වන විට, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි සාමාජිකයින් සංඛ්‍යාව මිලියන 2.5 කි. තවද, සේවා යෝජකයින්ගෙන් ලැබුණු මුළු දායකත්වය 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 37 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. බිලියන 42 ක් දක්වා සියයට 13.5 කින් වර්ධනය වී ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි සාමාජිකයින්ට සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම අටක් පිරිනමන අතර, එයට පූර්ණ සෞඛ්‍ය රක්ෂණාවරණය, නිවාස අවශ්‍යතා සහ සාමාජිකයින්ගේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර ඇතුළත් වේ. ස්ථාපිත විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහා ප්‍රවේශය නොමැති සේවකයින් සඳහා විශ්‍රාමික ජීවිතයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුදලේ මූලික අරමුණට අනුකූලව, ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින් සහ සංක්‍රමණික සේවකයින් අතර ස්වේච්ඡා සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

2024 වර්ෂයේ දී මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 121.6 ක්ද ඇතුළුව රු. මිලියන 452.7 ක් සාමාජික ප්‍රතිලාභ හිමිකම් වශයෙන් ගෙවා ඇත. එසේම, ලාභාංශ සහ පොළිය සමඟ ගිණුමේ තිබෙන ශේෂය, සේවයන් අවසන් කිරීමේදී/ විශ්‍රාම යාමේදී සාමාජිකයින්ට ගෙවනු ලැබේ. ඒ අනුව, 2024 වර්ෂයේ දී ආපසු ගෙවීමේ ඉල්ලීම් ක්‍රියාවලියේ 195,896 කට අදාළව කටයුතු සිදු කර සකස් කර ඇති අතර, ආපසු ගෙවා ඇති මුළු මුදල රු. බිලියන 33.4 කි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් කරන ලද ආයෝජනවලින් වැඩි ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල තැන්පත් කර ඇති අතර, එමගින් ස්ථාවර සුරක්ෂිත ප්‍රතිලාභ ප්‍රවාහයක් තහවුරු කෙරේ. 2023 වර්ෂයේ රු. බිලියන 514.7 ක්වූ ආයෝජන කළඹ රු. බිලියන 580.6 ක් දක්වා සියයට 12.8 කින් වැඩි වී ඇත. තවද, 2024 වර්ෂයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි මුළු ආදායම රු. බිලියන 66 ක් වූ අතර, එය බොහෝ දුරට පොළී ආදායමෙන් සමන්විත වේ. 2024 වර්ෂයේ දී අරමුදල රු. බිලියන 63.2ක ශුද්ධ ලාභයක් උපයමින් ලාභාංශ සහ පොළී ලෙස එකතුව සියයට 10 ක අනුපාතිකයක් සියලුම සාමාජිකයින් සඳහා ප්‍රකාශයට පත් කරන ලද අතර, එහි වටිනාකම රු. බිලියන 51.3 කි.

**වගුව 8.14 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **34,729** | **35,490** | **46,122** | **67,793** | **65,988** |
| ආයෝජන ආදායම (ශුද්ධ) | 33,697 | 35,202 | 45,677 | 67,119 | 65,354 |
| වෙනත් ආදායම් | 1,032 | 288 | 445 | 674 | 634 |
| **මුළු වියදම** | **2,229** | **2,330** | **2,694** | **2,834** | **2,811** |
| මෙහෙයුම් වියදම් | 1,776 | 1,836 | 2,120 | 2,129 | 2,220 |
| සාමාජික වියදම් | 453 | 494 | 575 | 705 | 591 |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **32,345** | **33,159** | **43,428** | **64,959** | **63,177** |
| බෙදාහැරීම් ලාභය | 28,007 | 28,569 | 36,978 | 55,942 | 54,499 |
| **සාමාජික මුදල් මත පොළී ප්‍රතිශතය 3%** | **10,423** | **11,553** | **12,679** | **13,758** | **15,391** |
| ලාභාංශ | 17,371 | 9,627 | 24,302 | 32,103 | 35,911 |
| සමස්ත පොළී හා ලාභාංශ ප්‍රතිශතය % | 8 | 7.25 | 8.75 | 10.00 | 10.00 |

මූලාශ්‍රය: සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

(අ)තාවකාලික

## 8.4 ජලය

### 8.4.1 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂාව සහතික කිරීමේ ඉලක්ක සපුරා ගනිමින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2023 වර්ෂයේ දී සියයට 97.3 ක් වූ ආරක්ෂිත පානීය ජල ආවරණය 2024 වර්ෂය තුළ දී සියයට 98.8 ක් දක්වා අඛණ්ඩව වැඩිදියුණු කරන ලදී. මේ අතර, ජල සම්බන්ධතා 120,000 කට ආසන්න ප්‍රමාණයක් පද්ධතියට එකතු කිරීමෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සිය නල ජල ආවරණය 2024 වර්ෂය අවසානයේ දී මුළු සම්බන්ධතා මිලියන 3.14 ක් දක්වා පුළුල් කළ අතර, ඒ අනුව නල ජල ආවරණය පසුගිය වර්ෂයේ සියයට 61.6 ට සාපේක්ෂව සියයට 63.1 ක් දක්වා වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, නල මලාපවහන සම්බන්ධතා 2024 වර්ෂය අවසානයේ දී සියයට 2.08 ක් ලෙසම නොවෙනස්ව පැවතුනි.

2023 අගෝස්තු මාසයේ සැලකිය යුතු ලෙස ඉහළ ගිය ගාස්තු සංශෝධනය, 2024 වර්ෂයේ දී ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනයෙහි ප්‍රමාණාත්මක දියුණුව සඳහා හේතු වූ අතර, 2024 වර්ෂයේ දී ජල අලෙවියේ ඉහළ යාම සහ මීටර් මිලියන 626 ක් දක්වා සියයට 4 ක් වුවද, 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 61,852 ට සාපේක්ෂව මුළු ආදායම රු. මිලියන 84,026 ක් දක්වා සියයට 36 කින් ඉහළ ගොස් ඇත. මේ අතර, විදුලි ගාස්තු අඩු කිරීමෙන් පසුව 2024 වර්ෂයේ අගෝස්තු මාසයේදී ගෘහස්ථ, රෝහල්, පාසල් සහ ආගමික ස්ථාන යන කාණ්ඩ සඳහා පාරිභෝගික ගාස්තුව සියයට 5.94 ක සාමාන්‍ය අගයකින් අඩු කරන ලදී.

2024 වර්ෂයේ දී ජල නිෂ්පාදනය ඝන මීටර් මිලියන 832 ක් දක්වා සියයට 4 කින් සුළු වශයෙන් වැඩිවීම හේතුවෙන්, මෙම කාල සීමාව තුළ නිෂ්පාදන පිරිවැය සුළු වශයෙන් රු. මිලියන 37,225 ක් දක්වා සියයට 2 කින් වැඩි වී ඇත. කෙසේ වෙතත්, ගාස්තු ඉහළ නැංවීමේ බලපෑමත් සමඟ 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රු. මිලියන 46,801 ක දළ ලාභයක් වාර්තා කළ අතර, එය සියයට 85.6 ක සැලකිය යුතු වැඩිවීමකි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභය වන රු. මිලියන 5,234 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 23,945 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. ආදායම් නොලබන ජල ප්‍රතිශතය 2023 වර්ෂයේ දී වූ සියයට 25.32 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී සියයට 24.80 ක් දක්වා පහත වැටී ඇත.

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද "ජල සැපයුම් සහ සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන" සඳහා වන ප්‍රතිපත්ති පාදක ණය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම සහ පිරිවැය පිළිබිඹු වන පරිදි ගාස්තු නියම කිරීම අරමුණු කරගත් ජල ගාස්තු ප්‍රතිපත්තිය ද ඇතුළුව ප්‍රතිපත්ති ලේඛන සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2024 වර්ෂයේ කෙටුම්පත් කරන ලදී. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් ගාස්තු ප්‍රතිපත්තිය සහ ගාස්තු සූත්‍රය සඳහා අනුමැතිය ලබා දෙන ලදී. තවද, උක්ත ආසියානු සංවර්ධන බැංකුවෙහි ප්‍රතිපත්ති පාදක ණය යටතේ සඳහන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් එකක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශක හරහා අභිලාෂ ඉලක්ක සමඟ මහා භාණ්ඩාගාරය, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ ජාතික ජල

**වගුව 8.15 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **27,761** | **28,935** | **35,464** | **61,852** | **84,026** |
| ජලය | 25,608 | 25,735 | 33,122 | 57,657 | 77,539 |
| ජලය ආශ්‍රිත ආදායම | 2,154 | 3,200 | 2,342 | 4,195 | 6,487 |
| විකුණුම් පිරිවැය | 16,754 | 19,163 | 23,145 | 36,634 | 37,226 |
| **දළ ලාභය** | **11,007** | **9,772** | **12,319** | **25,218** | **46,800** |
| වෙනත් ආදායම් | 1,482 | 1,796 | 1,289 | 4,284 | 1,994 |
| පරිපාලන වියදම් | 12,035 | 13,715 | 14,052 | 11,102 | 12,976 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 839 | 998 | 347 | 1,338 | 1,768 |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | **-385** | **-3,145** | **-791** | **17,062** | **34,050** |
| මූල්‍ය ආදායම් | 1,571 | 843 | 2,007 | 3,121 | 2,273 |
| මූල්‍ය වියදම් | 677 | 752 | 3,917 | 14,948 | 12,378 |
| **ශුද්ධ ලාභය/(අලාභය)** | **509** | **-3,054** | **-2,701** | **5,235** | **23,945** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| සම්බන්ධතා (ගණන මිලියන) | 2.6 | 2.8 | 2.9 | 3.0 | 3.1 |
| ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන) | 782 | 815 | 818 | 803 | 832 |
| ජල අලෙවිය (ඝන මීටර් මිලියන) | 597 | 605 | 614 | 600 | 626 |
| ආදායම් නොවන ජලය (ප්‍රතිශතය) | 24.63 | 25.82 | 25.24 | 25.20 | 24.80 |
| ජල සම්පාදන ව්‍යාප්ති ප්‍රමාණය (ගණන) | 331 | - | - | - | - |
| ආරක්ෂිත පානීය ජල සැපයුම් ආවරණය (ප්‍රතිශතය) | 93 | 94.4 | 96 | 97.3 | 98.8 |

මූලාශ්‍රය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

(අ)තාවකාලික

සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2024 ජූලි 25 දින ත්‍රෛපාර්ශවික ගිවිසුමක් වන සාමූහික අභිප්‍රාය ප්‍රකාශය අත්සන් කරන ලදී.

තවද, අයවැය සභාය යටතේ ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීම පහසු කිරීම වෙනුවෙන් තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය, ගම්පහ, අත්තනගල්ල, මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, අලුත්ගම, මතුගම සහ අගලවත්ත ජල සම්පාදන ව්‍යාපෘතිය සහ මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිය වැනි කෙරීගෙන යන ප්‍රධාන ව්‍යාපෘතිවල වගකීම් පියවීම සඳහා සහ දේශීය බැංකු, විදේශීය බැංකුවල ණය ආපසු ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 2024 වර්ෂයේ දී රු. බිලියන 28.8 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත.

## 8.5 වරාය

### 8.5.1 ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන වරාය සහ දකුණු ආසියාවේ ප්‍රමුඛතම වරාය කේන්ද්‍රස්ථානය වන කොළඹ වරාය, සිය පිහිටීම මත වර්ධන විභවතාවන් උකහා ගනිමින් උප මහද්වීපික වරාය කර්මාන්තයේ ව්‍යාප්තියට සහාය දෙනු ලබයි. ලෝක නාවික කවුන්සිලය විසින්, ප්‍රධාන ගෝලීය ප්‍රතිනැවිගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කොළඹ වරාය ලොව හොඳම වරායන් අතර 25 වන ස්ථානයෙහි ලා ශ්‍රේණිගත කර ඇත. ජාතියේ වරාය මෙහෙයුම්කරු ලෙසින්, වරාය, නාවික සහ සමුද්‍රීය කර්මාන්ත සඳහා ශ්‍රී ලංකා වරාය

වගුව 8.16 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්වය

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම්** | **50,245** | **57,765** | **90,954** | **84,200** | **98,289** |
| නාවුක | 10,957 | 10,793 | 18,395 | 21,146 | 20,477 |
| බහාලුම් හැසිරවීම් | 17,847 | 20,441 | 28,901 | 27,400 | 33,901 |
| වාප්පු මෙහෙයුම් | 5,318 | 6,260 | 8,014 | 8,000 | 9,098 |
| වරාය පහසුකම් | 3,444 | 6,176 | 9,250 | 4,445 | 7,951 |
| වෙනත් | 1,365 | 1,785 | 3,848 | 2,849 | 3,558 |
| **වෙනත් ආදායම්** | **11,314** | **12,310** | **22,546** | **20,360** | **23,304** |
| **මුළු වියදම** | **29,716** | **32,899** | **43,744** | **47,292** | **54,591** |
| මෙහෙයුම් වියදම් | 16,300 | 16,812 | 22,338 | 25,000 | 29,311 |
| අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | 5,646 | 7,048 | 8,382 | 9,088 | 9,774 |
| පරිපාලන වියදම් | 7,770 | 9,039 | 13,024 | 13,204 | 15,506 |
| **පොළී හා බදු පෙර ඉපැයීම්** | **20,529** | **24,866** | **47,210** | **36,908** | **43,698** |
| ගනුදෙනු මත විනිමය හුවමාරු ලාභය/(අලාභය) | – | – | 288 | -579 | -418 |
| ශුද්ධ මූල්‍ය ආදායම | 850 | 2,005 | 5,626 | 5,334 | 1,315 |
| විදේශ විනිමය හුවමාරු ලාභය/ (අලාභය) | -1,051 | -1,270 | 3,903 | -1,305 | -785 |
| **මහා භාණ්ඩාගාරයට අයබදු ගෙවීමට පෙර ලාභය/ (අලාභය)** | **20,328** | **25,601** | **57,027** | **40,358** | **43,810** |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | – | – | -1,000 | -8,674 | -607 |
| **මහා භාණ්ඩාගාරයට අයබදු ගෙවීමට පසු ලාභය/ (අලාභය)** | **20,328** | **25,601** | **56,027** | **31,685** | **43,203** |
| ආදායම් බදු | -2,603 | -2,676 | -13,261 | -5,565 | -7,064 |
| විලම්බිත බදු | 1,015 | -2,230 | -445 | -6,181 | -1,200 |
| **වාර්ෂික ලාභය/ අලාභය** | **18,740** | **20,695** | **42,321** | **19,940** | **34,938** |
| නොපියවූ බැංකු ණය | 9,322 | 7,355 | 6,411 | 2,798 | 2,469 |
| විදේශයන්ට හෝ රජයට ඇති නොපියවූ ණය | 55,907 | 52,896 | 87,811 | 71,101 | 58,124 |
| ණය මත පොළිය | 1,532 | 800 | 2,400 | 4,218 | 3,546 |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| මෙහෙයවූ අඩි විස්සේ බහාලුම් ඒකක සංඛ්‍යාව (මිලියන) | 6.85 | 7.25 | 6.82 | 6.94 | 7.79 |
| පැමිණි යාත්‍රා (සංඛ්‍යාව) | 4,762 | 4,603 | 4,537 | 5,155 | 3,426 |
| කොළඹ (සංඛ්‍යාව) | 4,335 | 4,411 | 4,366 | 4,926 | 3,305 |
| ගාල්ල (සංඛ්‍යාව) | 248 | 54 | 41 | 70 | 25 |
| ත්‍රිකුණාමලය (සංඛ්‍යාව) | 179 | 138 | 130 | 159 | 96 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය
(අ)තාවකාලික

**වගුව 8.17 | කොළඹ වරාය විසින් මෙහෙය වූ සමස්ත අඩි විස්සේ බහාලුම් ඒකක**


| | වරාය අධිකාරිය | එස්.ඒ.ජී.ටී | සී.අයි.සී.ටී | කොළඹ වරාය |
|---|---|---|---|---|
| 2024 මෙහෙය වූ සමස්ත අඩි විස්සේ බහාලුම් ඒකක | 2,413,162 | 2,025,840 | 3,353,067 | 7,792,069 |
| 2023 මෙහෙය වූ සමස්ත අඩි විස්සේ බහාලුම් ඒකක | 1,965,131 | 1,763,863 | 3,220,918 | 6,949,912 |
| වෙනස (%) | 22.8 | 14.9 | 4.1 | 12.1 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

අධිකාරිය විසින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනයට දායක වනු ලැබේ.

රටෙහි වරාය සේවාවන් සංවර්ධනය, කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම වැනි කාර්යභාරයන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉටුකරනු ලබයි. නැගෙනහිර බහාලුම් පර්යන්තය සහ කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය වැනි ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවල දියුණුවත් සමඟ, දැනට අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 8.5 ක් හසුරවනු ලබන කොළඹ වරායේ ධාරිතාව අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 14 ක් දක්වා වැඩි කිරීමට නියමිතය.

රූප සටහන 8.7 | කොළඹ වරාය මෙහෙයවූ අඩි විස්සේ බහාලුම් ඒකක සංඛ්‍යාව




මූලාශ්‍රය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

2023 වර්ෂයේ දී 5,155 ක් වූ මුළු නෞකා පැමිණීම් සංඛ්‍යාව 2024 වර්ෂයේ දී 3,426 ක් දක්වා සියයට 33.5 කින් පහත වැටීමක් සිදු වුවද, ප්‍රධාන පර්යන්තවල බහාලුම් ප්‍රතිදානයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. රතු මුහුදේ අර්බුදය හේතුවෙන් ගෝලීය නාවික ගමනාගමන රටාවන්හි සිදු වූ වෙනස්කම් මෙම වර්ධනය සඳහා බොහෝ දුරට හේතු වී ඇත. 2024 වර්ෂයේ දී වරාය අධිකාරිය විසින් අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 2.4 ක් කළමනාකරණය කරන ලද අතර, එය 2023 වර්ෂයේ දී හසුරවන ලද අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 2 ට සාපේක්ෂව සියයට 22.8 ක වැඩිවීමකි. මේ අතර, 2024 වර්ෂයේ දී සමස්තයක් ලෙස කොළඹ වරායෙහි බහාලුම් හැසිරවීම අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 7.8 ක් දක්වා සියයට 13 කින් ඉහළ ගොස් ඇත.

2024 වර්ෂයේ දී භාණ්ඩ හැසිරවීම ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් භාණ්ඩ මෙට්‍රික් ටොන් මිලියන 46.5 ක් මෙහෙයවමින් පෙර වසර හා සැසඳීමේදී සියයට 28 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2024 වර්ෂයේ දී කොළඹ වරාය මගින් හසුරවන ලද භාණ්ඩ ධාරිතාවය මෙට්‍රික් ටොන් මිලියන 117.2 ක් දක්වා සියයට 15.3 කින් වැඩි වී ඇත.

මූල්‍ය කාර්ය සාධනය සැලකීමේ දී, 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය රු. මිලියන 98,289 ක මුළු ආදායමක් උපයා ඇති අතර, එය 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 84,200 ට සාපේක්ෂව සියයට 16.7 ක වැඩිවීමකි. 2023 වර්ෂයේ දී රු. මිලියන 47,292 ක් වූ අධිකාරියේ වියදම, 2024 වර්ෂයේ දී රු. මිලියන 54,591 ක් දක්වා සියයට 15.4 කින් ඉහළ ගොස් තිබේ. එසේ තිබියදී ද, 2023 වර්ෂයේ දී රු. මිලියන 40,359.2 ක් වූ බදු පෙර ලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 43,809.8 ක් දක්වා සියයට 8.5 කින් ඉහළ ගොස් ඇත.

## 8.6 රක්ෂණය

රක්ෂණ ක්ෂේත්‍රය (දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශ ඇතුළුව) දේශීය රක්ෂණ සමාගම් 23 කින් සහ විදේශීය සමාගම් 6 කින් සමන්විත වේ. සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සංස්ථාව, සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සංස්ථාව සහ ජාතික රක්ෂණ භාර අරමුදල යන ආයතන මගින් රක්ෂණ ක්ෂේත්‍රය සඳහා වන රාජ්‍ය දායකත්වය නිරූපනය වේ. ඒ හැරුණු විට, රජය සතු ව්‍යාවසායයන් වන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ද බෝග රක්ෂණ, අපනයන රක්ෂණ වැනි රටේ විවිධ රක්ෂණ අවශ්‍යතා ඉටු කරමින් රක්ෂණ ව්‍යාපාරයේ නිරත වේ.

දළ ලිඛිත වාරික වටිනාකමේ 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ සමස්ත වැඩිවීමක් සමඟ, රක්ෂණ ක්ෂේත්‍රය මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. විශේෂයෙන්, දිගු කාලීන රක්ෂණ අංශයෙහි දළ ලිඛිත වාරික වටිනාකම සියයට 20.4 කින් වර්ධනය වී ඇති අතර, සාමාන්‍ය රක්ෂණ අංශයෙහි දළ ලිඛිත වාරික වටිනාකම සියයට 11.7 කින් වර්ධනය වී ඇත. දිගු කාලීන රක්ෂණ ක්ෂේත්‍රයෙහි ඉහළ වත්කම් පදනම හේතුවෙන්, සමස්ත රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී සියයට 7.9 කින් වර්ධනය වී ඇත.

### 8.6.1 සී/ ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධන) පනතේ දක්වා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව, සී/ ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම්, සී/ ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම සහ සී/ ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම ලෙස එහි පූර්ණ පරිපාලිත සමාගම්වලට වෙන් කිරීම 2024 වර්ෂයේ ජනවාරි මස වන විට සම්පූර්ණ කරන ලදී.

2024 වර්ෂය අවසානය වන විට සී/ ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගමෙහි සහ සී/ ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගමෙහි වත්කම් පදනම පිළිවෙලින් රු. බිලියන 238.6 ක් සහ රු. බිලියන 51.13 කි. තවද, 2024 වර්ෂය අවසානය වන

**වගුව 8.18 | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) | |
|---|---|---|---|---|---|---|
| | | | | | සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම | සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම |
| **ආදායම** | **52,614** | **64,062** | **63,917** | **64,194** | **49,730** | **20,199** |
| දළ ලිඛිත වාරික | 39,421 | 43,231 | 41,272 | 44,225 | 24,531 | 23,571 |
| ශුද්ධ ඉපැයුම් වාරික | 34,206 | 38,397 | 37,024 | 36,862 | 23,569 | 16,561 |
| ප්‍රතිලාභ,පාඩු හා වියදම් | -34,888 | -42,255 | -34,292 | -43,571 | -39,852 | -9,703 |
| ආයෝජන ආදායම් | 16,511 | 23,392 | 13,794 | 28,444 | 25,770 | 3,988 |
| වෙනත් ආදායම් | 1,897 | 2,273 | 13,100 | -1,112 | 390 | -350 |
| මෙහෙයුම් හා පරිපාලන වියදම් | -9,755 | -10,082 | -6,131 | -9,920 | -5,501 | -6,922 |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **7,972** | **11,725** | **23,494** | **10,704** | **4,377** | **3,573** |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **5,788** | **10,041** | **21,564** | **7,779** | **2,642** | **2,661** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | | |
| හිමිකම් අනුපාතය - සාමාන්‍ය (%) | 51 | 60 | 63 | 61 | – | 57 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය - ජීවිත (%) | 459 | 490 | 316 | 427 | 565 | – |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය - සාමාන්‍ය (%) | 223 | 240 | 244 | 225 | – | 277 |
| ජීවිත රක්ෂණ අරමුදල | 134,013 | 152,585 | 156,719 | 183,784 | 213,228 | - |

මූලාශ්‍රය: සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම සහ සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම
(අ)තාවකාලික

විට රු. බිලියන 216.8 ක රක්ෂණ කර්මාන්තයේ විශාලතම ජීවිත රක්ෂණ අරමුදල සී/ ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම සතුවිය. සී/ ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම 2024 වර්ෂයේ දී රු. බිලියන 49.7 ක ආදායමක් වාර්තා කළ අතර, සී/ ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම 2024 වර්ෂයේ දී රු. බිලියන 20.2 ක ආදායමක් වාර්තා කර ඇත. 2024 වර්ෂයේ දී ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික වටිනාකම රු. බිලියන 24.5 ක් වූ අතර, ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරයෙහි 2024 වර්ෂයේ දී දළ ලිඛිත වාරික වටිනාකම රු. බිලියන 23.6 ක් විය.

2024 වර්ෂයේ සී/ ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම විසින් රු. බිලියන 29 ක ලාභයක් වාර්තා කර ඇති අතර, සී/ ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම 2024 වර්ෂය සඳහා රු. බිලියන 3.6 ක ලාභයක් වාර්තා කර ඇත. ඒ අතර, 2024 වර්ෂයේ ප්‍රකාශිත ලාභාංශ අගය රු. බිලියන 1.3 කි. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි අනුබද්ධිත සමාගමක් වන කැන්විල් හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමෙහි රු. බිලියන 10.5 ක අගයකින් යුතු කොටස් 2024 වර්ෂයේ දී මහා භාණ්ඩාගාර ලේකම් වෙත පවරන ලදී.

## 8.6.2 ජාතික රක්ෂණ භාර අරමුදල

ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය, කෘෂිකාර්මික ණය සුරක්ෂණ රක්ෂණ යෝජනා ක්‍රමය, අස්වනු

**වගුව 8.19 | ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **18,862** | **18,969** | **25,972** | **29,226** | **33,291** |
| දළ ලිඛිත වාරික | 9,818 | 10,631 | 12,201 | 12,544 | 22,364 |
| අග්‍රහාර දායකත්වය | 5,469 | 6,283 | 6,809 | 6,804 | 6,988 |
| භෝග රක්ෂණ බදු | 1,627 | 2,194 | 2,573 | 3,115 | 3,851 |
| ශුද්ධ ඉපැයුම් වාරික ආදායම | 17,475 | 17,379 | 20,884 | 21,893 | 27,662 |
| වෙනත් ආදයම් | 1,387 | 1,590 | 5,088 | 7,333 | 5,629 |
| නවතා දැමූ ප්‍රතිරක්ෂණ | -1,102 | -590 | -684 | 7 | -717 |
| රක්ෂණ හිමිකම් හා ප්‍රතිලාභ | -7,955 | -10,761 | -14,693 | -11,911 | -10,927 |
| ප්‍රතිරක්ෂණ හා අත් කර ගැනීමේ වියදම් | -1,615 | -1,864 | -2,162 | -1,902 | -4,105 |
| **මුළු වියදම්** | **-427** | **-408** | **-587** | **-2,085** | **-1,467** |
| සේවක පිරිවැය | 226 | 225 | 245 | 269 | 316 |
| පරිපාලන හා වෙනත් වියදම් | 201 | 183 | 342 | 1,816 | 1,150 |
| **අතිරික්තය** | **8,866** | **5,936** | **8,530** | **13,329** | **16,793** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| අග්‍රහාර හිමිකම් ලැබීම් (ගණන) | 218,422 | 226,639 | 243,812 | 249,159 | 194,393 |
| අග්‍රහාර හිමිකම් ගෙවීම් (ගණන) | 209,108 | 212,646 | 173,820 | 221,706 | 164,732 |
| අග්‍රහාර වාරික ලැබීම් | 5,469 | 6,283 | 6,809 | 6,804 | 6,988 |
| අග්‍රහාර වාරික ගෙවීම් | 4,173 | 6,380 | 6,247 | 7,334 | 6,170 |

මූලාශ්‍රය: ජාතික රක්ෂණ භාර අරමුදල
(අ)තාවකාලික

රක්ෂණ යෝජනා ක්‍රමය සහ සාමාන්‍ය රක්ෂණ - (මෝටර් රථ සහ මෝටර් රථ නොවන අංශයේ රක්ෂණාවරණ) ඇතුළු රක්ෂණ ක්‍රම රැසක් ක්‍රියාත්මක කරමින් රක්ෂණ ක්ෂේත්‍රයේ නිරත වේ. තවද, ජාතික රක්ෂණ භාර අරමුදල රක්ෂණ කර්මාන්තයේ ඕනෑම සාමාන්‍ය රක්ෂණ සමාගමක ප්‍රතිරක්ෂණ වගකීමෙන් සියයට 30ක ප්‍රතිරක්ෂකයා ලෙස ක්‍රියා කරන අතර, වැඩ වර්ජන,කැරලි කෝලාහල, මහජන අරමුදල් හා ත්‍රස්තවාදී ක්‍රියා රක්ෂණ අරමුදල පවත්වාගෙන යනු ලබයි.

දළ ලිඛිත වාරික වටිනාකම රු. බිලියන 9.8 කින් වැඩිවීම හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි 2023 වර්ෂයේ දී රු. බිලියන 29.2 ක් වූ ආදායමට සාපේක්ෂව 2024 වර්ෂයේ ආදායම රු. බිලියන 33.3 ක් දක්වා සියයට 14 කින් වර්ධනය වී ඇත. 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 12.5 හා සසඳනවිට 2024 වර්ෂයේ දී දළ ලිඛිත වාරික වටිනාකම රු. බිලියන 22.4 ක් විය. පරිපාලනය සහ අනෙකුත් වියදම් අඩුවීමත්, දළ ලිඛිත වාරික වටිනාකම වැඩිවීමත් හේතුවෙන් 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 13.3 හා සසඳන විට ජාතික රක්ෂණ භාර අරමුදලෙහි බදු පෙර ලාභය 2024 වර්ෂයේ දී රු. බිලියන 16.8 ක් දක්වා සියයට 26 කින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, 2024 වර්ෂයේ දී මෝටර් රථ රක්ෂණ යෝජනා ක්‍රමය සහ මෝටර් රථ නොවන රක්ෂණ යෝජනා ක්‍රමය පිළිවෙලින් රු. මිලියන 85 ක හා රු. මිලියන 130.9 ක අලාභයක් වාර්තා කර ඇත.

## 8.7 මගී ප්‍රවාහනය

### 8.7.1 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකාවේ රජය සතු මගී ප්‍රවාහන සේවා සපයන්නෙකු වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) දිවයින පුරා සාධාරණ, දැරිය හැකි සහ ප්‍රවේශ විය හැකි සංචලනයන් තහවුරු කරමින් තිරණාත්මක කාර්යභාරයක් ඉටු කර කරනු ලබයි. දිනකට බස් රථ 4,600 ක් පමණ යොදවමින් සහ 26,000 කට අධික සේවක සංඛ්‍යාවක් සමඟ, ශ්‍රී ලංගම ප්‍රධාන ඩිපෝ 107 ක්, උප ඩිපෝ 9 ක්, ප්‍රාදේශීය කාර්යාල 12 ක්, පළාත් වැඩ අංගන 12 ක් සහ රියදුරු පුහුණු පාසල් 21 ක් ඇතුළත් විශාල යටිතල පහසුකම් ජාලයක් හරහා ක්‍රියාත්මක වේ.

පවත්නා සම්පත් සීමිත වීම හා පැරණි බස් රථ ඇණියක් පැවතීම වැනි අභියෝග හමුවේ වුව ද, ශ්‍රී ලංගමය විසින් පෞද්ගලික අංශයේ සහභාගිත්වය සීමිත ආර්ථිකමය නොවන මාර්ග ඇතුළුව අත්‍යවශ්‍ය ප්‍රවාහන සේවා සැපයීම සඳහා වන සිය මෙහෙවරෙහි නොසැලී රැඳී සිටියි. 2024 වර්ෂය තුළ දී ශ්‍රී ලංගමය විසින් ගැමි සැරිය යටතේ බස් රථ 300 ක් යොදවන ලද අතර, එමගින් ග්‍රාමීය සබඳතාවය ශක්තිමත් කිරීම සහ දුෂ්කර ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම්

**වගුව 8.20 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **31,128** | **26,817** | **70,379** | **77,241** | **75,712** |
| මෙහෙයුම් ආදායම | 17,996 | 14,565 | 58,504 | 61,858 | 60,190 |
| වෙනත් ආදායම් | 13,132 | 12,252 | 11,875 | 15,383 | 15,522 |
| **වියදම** | **31,787** | **28,686** | **67,319** | **75,325** | **75,616** |
| වැටුප | 18,274 | 16,174 | 21,154 | 21,776 | 24,509 |
| ඉන්ධන | 9,535 | 8,026 | 37,344 | 41,465 | 39,131 |
| වෙනත් ධාවන පිරිවැය | 3,085 | 2,808 | 6,868 | 9,829 | 9,724 |
| පොදු කාර්යය | 629 | 1,475 | 1,750 | 2,133 | 2,213 |
| මූල්‍ය පිරිවැය | 264 | 203 | 203 | 122 | 39 |
| **භාණ්ඩාගාර මූල්‍ය සහයට පෙර ලාභය/ (අලාභය)** | **-659** | **-1,869** | **3,060** | **1,916** | **96** |
| රජයේ මූල්‍ය සහය | 1,127 | 1,217 | 642 | 1,391 | 1,769 |
| **මුදල් ලාභය** | **468** | **-652** | **3,702** | **3,307** | **1,865** |
| ක්ෂය | 2,507 | 2,355 | 2,184 | 1,025 | 1,290 |
| නිෂ්පාදන අලාභය | 66 | 47 | 97 | 93 | 28 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **-2,105** | **-3,054** | **1,421** | **2,189** | **547** |
| මහා භාණ්ඩාගාරයට ගෙවූ අයබදු | - | - | - | 145 | 330 |
| **බදු පසු ලාභය** | **–** | **–** | **–** | **2,044** | **217** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| කිලෝමීටරයකට ඉන්ධන පිරිවැය | 30.93 | 33.01 | 104.54 | 109.23 | 102.68 |
| බස් රථයක් සඳහා සේවක සංඛ්‍යාව | 7 | 8 | 6 | 5 | 5 |
| දිනකට ධාවනය වන සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව | 3,961 | 3,232 | 4,330 | 4,550 | 4,607 |
| ධාවනය කළ කිලෝ මීටර් මිලියන | 308 | 237 | 351 | 370 | 371 |
| බස් රථ ඇණිය පිළිබඳ වයස් විශ්ලේෂණය | | | | | |
| අවුරුදු 5 ට අඩු | 1,001 | 740 | 521 | 857 | 657 |
| අවුරුදු 5 > 10 | 2,420 | 2,273 | 2,467 | 2,377 | 1,527 |
| අවුරුදු 10 > 15 | 2,155 | 1,830 | 1,326 | 1,120 | 1,904 |
| අවුරුදු 15 ට වැඩි | 1,382 | 951 | 2,775 | 2,760 | 3,047 |
| **මුළු එකතුව** | **6,958** | **5,794** | **7,089** | **7,114** | **7,135** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
(අ)තාවකාලික

වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මීට අමතරව, සිසු සැරිය වැඩසටහන මගින් බස් රථ 103 ක් හඳුන්වා දෙන ලද අතර, එමගින් පාසල් 320 ක පාසල් ළමුන් 6,000 කට පමණ ප්‍රතිලාභ ලබා දෙමින් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පුළුල් කරමින් සිසුන් සඳහා වඩාත් ආරක්ෂිත හා විශ්වසනීය ප්‍රවාහන පහසුකම් සැපයීමක් සිදු වේ. මෙම කටයුතු මගින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ ප්‍රාදේශීය සංචලන විෂමතා අවම කිරීම සඳහා වන ශ්‍රී ලංගමයේ කැපවීම අවධාරණය කරයි.

2023 වර්ෂයේ දී කිලෝමීටර මිලියන 370 ක් වූ ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය 2024 වර්ෂයේ දී මිලියන 371 ක් දක්වා වැඩි විය. මෙම වර්ධනයට, 2023 වර්ෂයේ දී ධාවනයට යෙදවූ බස් රථ 4,550 සිට 2024 වර්ෂයේ දී ධාවනයට යෙදවූ බස් රථ සංඛ්‍යාව 4,607 ක් දක්වා වැඩි කිරීම දායක වූ අතර, එය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 1.3 ක වර්ධනයකි.


ධාවනය කරන ලද කිලෝමීටර් ප්‍රමාණය වැඩි වූ නමුත්, ශ්‍රී ලංගමයෙහි මුළු ආදායම 2023 වර්ෂයේ වූ රු. මිලියන 77,241 ක් හා සැසඳීමේදී 2024 වර්ෂයේ දී රු. මිලියන 75,712 ක් දක්වා ආන්තිකව අඩු වී ඇති අතර, මෙයට ප්‍රධානම හේතුව වී ඇත්තේ බස් රථ ගාස්තුව සියයට 10 ක සාමාන්‍ය අගයකින් 2024 වර්ෂයේ ජූලි සහ ඔක්තෝබර් මාස වලදී අඩු කිරීමය.

ශ්‍රී ලංගමයෙහි වැටුප් වියදම් ඉහළ යාම හේතුවෙන් 2023 වර්ෂයේ රු. මිලියන 75,325 ට සාපේක්ෂව 2024 වර්ෂයේ මුළු වියදම රු. මිලියන 75,616 ක් දක්වා වැඩි විය. ඒ අනුව, 2023 වර්ෂයේ රු. මිලියන 2,189 ට සාපේක්ෂව ශුද්ධ ලාභය 2024 වර්ෂයේ දී රු.මිලියන 547 ක් දක්වා සියයට 75 කින් අඩු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංගමය විසින් 2023 වර්ෂයේ ගෙවූ රු.මිලියන 145 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයට රු. මිලියන 330 ක් අයබදු වශයෙන් ගෙවා ඇත. ජාතික පොදු ප්‍රවාහනයේ ශ්‍රී ලංගමයෙහි තීරණාත්මක භූමිකාව හඳුනාගෙන රජය විසින් ලබා දුන් මූල්‍ය සහාය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, 2024 වර්ෂයේ දී මේ සඳහා රු.මිලියන 12,500 ක් වෙන් කළ අතර, මෙය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 4.5 ක වර්ධනයකි.

ශ්‍රී ලංගමය හරහා රජය විසින් පොදු සේවා වගකීම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් වාර ප්‍රවේශපත්‍ර වලට සහනාධාර ලබා දීම සඳහා සහ ආර්ථික නොවන මාර්ග සඳහා 2023 වර්ෂයේ දී පිළිවෙලින් ලබා දුන් රු. මිලියන 8,000 සහ රු. මිලියන 3,960 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී පිළිවෙලින් රු. මිලියන 10,500 ක් හා රු. මිලියන 2,000 ක් ලබා දී ඇත.

2024 වර්ෂය වන විට මුළු බස් රථ ඇණියෙන් සියයට 43 ක් පමණ වර්ෂය 15 කට වඩා පැරණි බස් රථ වීම ශ්‍රී ලංගමයෙහි ප්‍රධාන අභියෝගයන්ගෙන් එකක් වන අතර, ඒ හේතුවෙන් නිරන්තර යාන්ත්‍රික බිඳ වැටීම්, ඉහළ නඩත්තු පිරිවැය හා මගී සේවාවන්ට බාධාවන් ඇති වීම සිදු වේ. මෙම ගැටළුවට විසඳුමක් ලෙස ශ්‍රී ලංගමය විසින් යාන්ත්‍රික විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම හා මෙහෙයුම් ආයුකාලය දීර්ඝ කිරීම සඳහා 2024 වර්ෂයේ දී බස් රථ 69 ක නව එන්ජින් ස්ථාපනය කිරීම සමඟ අලුත්වැඩියා කිරීම ඇතුළුව විවිධ නවීකරණ ක්‍රියාමාර්ග සිදු කරන ලදී. මීට අමතරව, සේවා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් බස් රථ 500 ක් ඇණියට එක් කර ඇති අතර, මෙහිදී ඌණ සේවා සහිත ග්‍රාමීය ප්‍රදේශ සහ පාසල් ප්‍රවාහන සේවා සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. ශ්‍රී ලංගමයේ සේවාවන්හි දීර්ඝකාලීන තිරසාරභාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා යටිතල පහසුකම් සහ බස් රථ ඇණි නවීකරණය වෙනුවෙන් ආයෝජනය කිරීම උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

රූප සටහන 8.8 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්යසාධනය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## 8.8 ගුවන් සේවා

### 8.8.1 ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ, විශේෂයෙන් යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක කර්මාන්තය සහ විදේශ විනිමය ඉපැයීම් සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සම්පූර්ණයෙන්ම රජය සතු ආයතනයක් ලෙස රටෙහි ජාත්‍යන්තර ගුවන්තොටුපොළවල්, එනම් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, මඩකලපුව ගුවන්තොටුපොළ සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සිදු කරයි. ශ්‍රී ලංකාව පුරා ගුවන් ගමනාගමන පාලනය, ගුවන් සේවා ආරක්ෂාව සහ ආශ්‍රිත සේවාවන් සඳහා ද සමාගම වගකිව යුතුය. ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය සඳහා සැලකිය යුතු ලෙස දායක වෙමින් සහ කලාපීය ගුවන් සේවා ක්ෂේත්‍රයේ තරඟකාරී මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කරමින් සමාගම සතු ඔරොත්තු දීමේ හැකියාව සහ උපායමාර්ගික දූරදර්ශීභාවය ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි 2024 කාර්ය සාධනය මගින් ඉස්මතු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ මගී සංචලන සංඛ්‍යාව තවමත් පූර්ව කොවිඩ් කාලයෙහි පැවති මට්ටමට ආපසු පැමිණ නොමැති වුවද, මගී සංචලනයන් හි ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. 2023 වර්ෂයේ දී සමාගම විසින් මිලියන 7.5 ක මගීන් සංඛ්‍යාවක් හසුරවා ඇති අතර, 2024 වර්ෂයේ දී හසුරවන ලද මගී සංඛ්‍යාව මිලියන 8.9 ක් දක්වා සියයට 18.6 කින් ඉහළ ගොස් ඇත. එම ප්‍රවණතාවය අනුව යමින්, 2023 වර්ෂයේ දී

**වගුව 8.21 | ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **11,523** | **10,792** | **32,258** | **48,804** | **51,639** |
| ගගන නාවික | 2,291 | 2,299 | 6,195 | 7,575 | 7,768 |
| ගගන නාවික නොවන | 5,486 | 5,087 | 19,812 | 30,671 | 35,982 |
| වෙනත් ආදායම් | 81 | 85 | 114 | 130 | 147 |
| පොළී ආදායම් | 3,665 | 3,321 | 6,137 | 10,428 | 7,742 |
| **වියදම** | **12,622** | **11,654** | **14,941** | **19,061** | **24,006** |
| කාර්යය මණ්ඩල පිරිවැය | 7,415 | 7,305 | 10,001 | 10,993 | 14,293 |
| ආයතනික හා පරිපාලන වියදම | 2,088 | 1,347 | 2,097 | 4,066 | 4,609 |
| ක්ෂයවීම් | 2,853 | 2,648 | 2,367 | 2,121 | 3,834 |
| අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 266 | 354 | 476 | 1,880 | 1,269 |
| **පොළී හා බදු පෙර ඉපැයීම්** | **-1,099** | **-862** | **17,317** | **29,743** | **27,633** |
| ගනුදෙනු මත හුවමාරු ලාභය/ (අලාභය) | 153 | 408 | 1,526 | -162 | -234 |
| පොළී වියදම | -1,289 | -1,140 | -1,854 | -2,225 | -2,515 |
| ණය සහ ස්ථාවර තැන්පතු පරිවර්තනය මත විදේශ විනිමය ලාභය/ (අලාභය) | -1,498 | 634 | -10,555 | 6,283 | 4,098 |
| **බදු පෙර ශුද්ධ ලාභය/ (අලාභය)** | **-3,733** | **-960** | **6,434** | **33,639** | **28,982** |
| බදු | 1,228 | -1,122 | -1,630 | -5,517 | -7,638 |
| **බදු පසු ශුද්ධ ලාභය/ (අලාභය)** | **-2,505** | **-2,082** | **4,804** | **28,122** | **21,344** |
| මුළු වත්කම් | 103,216 | 126,844 | 179,530 | 191,542 | 222,684 |
| මුළු වගකීම් | 66,233 | 85,530 | 134,273 | 123,931 | 132,149 |
| මුළු හිමිකම | 36,983 | 41,314 | 45,257 | 67,611 | 90,535 |
| මුළු ණය ගැනීම් | 46,773 | 64,725 | 106,273 | 89,914 | 95,807 |
| වසර තුළ ණය ගැනීම් | 684 | 19,833 | 2,544 | 321 | 20,469 |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ගුවන් යානා සංචලන (ගණන) | 38,145 | 47,391 | 59,451 | 74,239 | 84,789 |
| ගුවන් මගීන් සංචලන (ගණන) | 2,375,056 | 1,505,479 | 5,503,198 | 7,548,646 | 8,896,029 |
| භාණ්ඩ සංචලන (මෙට්‍රික් ටොන්) | 151,141 | 201,680 | 175,086 | 160,420 | 193,873 |

මූලාශ්‍රය: ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

(අ)තාවකාලික

74,239 ක් වූ ගුවන් යානා සංචලනයන් ද 2024 වර්ෂයේ දී 84,789 ක් දක්වා ඉහළ ගොස් ඇත. සමාගම 2023 වර්ෂයේ දී භාණ්ඩ මෙට්‍රික් ටොන් 160,420 ක් හසුරුවන ලද අතර, 2024 වර්ෂයේ දී එය සියයට 20.8 ක වර්ධනයක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 193,873 ක භාණ්ඩ හසුරුවා ඇත. මෙයට ප්‍රතිවිරුද්ධව, අඛණ්ඩව පස්වන වසරටත් සාංක්‍රමණික මගීන්ගේ අඩුවීමක් පෙන්නුම් කරමින් 2019 වර්ෂයේ දී වූ 1,733,649 සිට 2024 වර්ෂයේ දී 758,681 ක් දක්වා එම සංඛ්‍යාව පහත වැටී ඇත.

2024 වර්ෂයේ දී ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමෙහි මූල්‍ය කාර්ය සාධනය තුළින් ආදායම් වර්ධනය සහ ලාභදායිතා අභියෝගවල සංකලනයක් පෙන්නුම් කරයි. 2023 වර්ෂයේ දී රු. බිලියන 38.2 ක්ව පැවති සමාගමෙහි ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලින් ලද ආදායම 2024 වර්ෂයේ දී රු. බිලියන 43.7 ක් දක්වා සියයට 14.4 ක වැඩිවීමක් වාර්තා කර ඇත. 2023 වර්ෂයේ දී රු. බිලියන 7.6 ක් වූ ගුවන් යානා ආදායම 2024 වර්ෂයේ දී රු. බිලියන 7.8 ක් දක්වා සියයට 2.6 කින් ඉහළ ගොස් ඇති අතර, 2023 වර්ෂයේ දී රු. බිලියන 30.7 ක්ව පැවති ගුවන් යානා නොවන ආදායම 2024 වර්ෂයේ දී රු. බිලියන 36 ක් දක්වා සියයට 17.3 කින් ඉහළ ගොස් ඇත.

ආදායමේ වර්ධනයක් පෙන්නුම් කළ ද, සමාගමෙහි වියදම් සියයට 30 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, 2023 වර්ෂයේ දී දී රු. බිලියන 11 ක් වූ කාර්ය මණ්ඩල පිරිවැය 2024 වර්ෂයේ දී රු. බිලියන 14.3 ක් දක්වා ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. පිරිවැයෙහි මෙම තියුණු ඉහළ යාම සමාගමෙහි ලාභදායිතාවය මත පීඩනය එල්ල කරමින් ආදායම් වර්ධනයෙහි සමස්ත බලපෑම සීමා කර ඇත.

2023 වර්ෂයේ දී රු. බිලියන 19.3 ක් වූ මෙහෙයුම් ලාභය 2024 වර්ෂයේ දී රු. බිලියන 19.9 ක් දක්වා සුළු වර්ධනයක් වාර්තා කිරීමට සමත් වී ඇත. කෙසේ වෙතත්, මූල්‍ය පිරිවැය සියයට 65.4 කින් අඩු වුව ද, සමාගමේ මූල්‍ය ආදායම සියයට 25.8 කින් සීඝ්‍ර ලෙස අඩු වී ඇති අතර, මෙය ආයෝජන වලින් ලැබෙන ප්‍රතිලාභ අඩු වීම හේතුවෙන් 2024 වර්ෂයේ දී ශුද්ධ මූල්‍ය ආදායම රු. බිලියන 9.1 ක් දක්වා සියයට 36.5 කින් අඩු වීමට හේතු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ දී රු. බිලියන 33.6 ක් වූ බදු පෙර ලාභය 2024 වර්ෂයේ දී රු බිලියන 29 ක් දක්වා සියයට 13.7 කින් අඩු වී ඇත.

## 8.8.2. ශ්‍රීලංකන් ගුවන් සමාගම

ජාතික ආර්ථිකයට ගුවන් සේවයේ සැලකිය යුතු දායකත්වය සැලකිල්ලට ගනිමින්, ගුවන් සේවය පෞද්ගලීකරණය කිරීම වෙනුවට, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා හොඳම විකල්ප ආකෘතිය සොයා බැලීම මගින් ශ්‍රීලංකන් ගුවන් සමාගමට සහාය දීමට රජය තීරණය කර ඇත.

**වගුව 8.22 | ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020/21 | 2021/22 | 2022/23 | 2023/24 | 2024/25(අ) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම** | **71,847** | **134,274** | **372,533** | **335,811** | **299,182** |
| ගුවන් මගීන් | 16,328 | 77,999 | 293,329 | 276,250 | 234,386 |
| ගුවන් භාණ්ඩ | 27,328 | 43,975 | 51,060 | 31,225 | 32,189 |
| අමතර ගුවන් මලු | 197 | 1,157 | 3,067 | 2,364 | 2,546 |
| වෙනත් ආදායම් | 27,469 | 10,504 | 23,857 | 25,260 | 29,319 |
| මූල්‍ය ආදායම් | 525 | 639 | 1,221 | 711 | 742 |
| **මුළු වියදම** | **74,511** | **132,398** | **330,569** | **324,576** | **275,606** |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | 10,569 | 42,759 | 155,559 | 115,119 | 91,647 |
| සේවක පිරිවැය | 16,206 | 15,970 | 24,341 | 29,845 | 30,980 |
| ගුවන් තොටුපොළ, ගුවන් නාවික හා මගී පිරිවැය | 7,440 | 19,272 | 48,474 | 46,714 | 45,701 |
| ගුවන්යානා නඩත්තු සහ අලුත්වැඩියා පිරිවැය | 13,695 | 23,088 | 42,199 | 51,931 | 45,082 |
| ගුවන් යානා කල්බදු කුලී | 2,265 | 44 | 504 | 10,723 | 3,426 |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | 2,034 | 7,180 | 24,628 | 22,078 | 20,482 |
| ගුවන්යානා කාර්යය මණ්ඩල වියදම් | 1,680 | 3,231 | 7,661 | 9,701 | 9,454 |
| වෙනත් මෙහෙයුම් පිරිවැය | 4,325 | 6,665 | 12,516 | 24,596 | 13,430 |
| ක්ෂය වීම් හා ක්‍රමක්ෂය | 16,296 | 14,188 | 14,685 | 13,869 | 15,403 |
| **බදු හා පොළිවලට පෙර ඉපැයීම්** | **-2,664** | **1,877** | **41,965** | **11,234** | **23,577** |
| ගනුදෙනු මත විනිමය ලාභය/ (අලාභය) | -6,895 | -37,812 | -25,560 | 3,261 | 1,011 |
| පොළී වියදම | -22,339 | -22,339 | -51,395 | -37,312 | -37,087 |
| ණය සහ ස්ථාවර තැන්පතු පරිවර්තනය මත විනිමය ලාභය/ (අලාභය) | -13,334 | -107,621 | -38,274 | 26,688 | 4,099 |
| **බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය)** | **-45,231** | **-165,895** | **-73,264** | **3,871** | **-8,400** |
| බදු | – | – | -357 | – | – |
| **බදු පසු ශුද්ධ ලාභය /(අලාභය)** | **-45,231** | **-165,895** | **-73,621** | **3,871** | **-8,400** |
| **මුළු වත්කම්** | **154,381** | **178,144** | **199,455** | **194,258** | **183,850** |
| ජංගම නොවන වත්කම් | 122,471 | 122,686 | 132,773 | 131,499 | 127,848 |
| ජංගම වත්කම් | 31,910 | 55,459 | 66,682 | 62,759 | 56,003 |
| **මුළු වගකීම්** | **253,219** | **358,161** | **708,630** | **594,793** | **586,497** |
| ජංගම නොවන වගකීම් | 190,428 | 257,020 | 210,323 | 187,903 | 157,500 |
| ජංගම වගකීම් | 253,219 | 358,161 | 498,307 | 406,890 | 428,996 |
| **හිමිකම** | **82,468** | **100,468** | **103,201** | **207,079** | **213,250** |
| **සමුච්චිත අලාභය** | **-371,734** | **-537,505** | **-612,376** | **-607,614** | **-615,897** |
| තදබල ප්‍රාග්ධන පාඩුව | ඔව් | ඔව් | ඔව් | ඔව් | ඔව් |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ගුවන් මගී ප්‍රවාහනය (RPK මිලියන) | 748 | 4,969 | 11,794 | 12,199 | 11,572 |
| ගුවන් යානා ඇණිය (ගණන) | 24 | 24 | 23 | 21 | 22 |
| මගී ධාරිතාව (ASK මිලියන) | 3,816 | 10,144 | 15,188 | 15,425 | 14,715 |
| මුළු ආදායම මත ඉන්ධන පිරිවැය ප්‍රතිශතය (%) | 0.21 | 0.32 | 0.43 | 38 | 35 |
| මගී පැටවුම් සාධකය | 20 | 49 | 78 | 79 | 79 |

මූලාශ්‍රය: ශ්‍රීලංකන් ගුවන් සමාගම

(අ)තාවකාලික

මගී පැටවුම් සාධකය සියයට 79 ක් ලෙස නොවෙනස්ව පැවතුනද, ප්‍රවාහනය කරන ලද මුළු මගීන් සංඛ්‍යාව 2023/24 වර්ෂයේ දී ආදායම් මගී කිලෝමීටර මිලියන 12,199 ක සිට 2024/25 වර්ෂයේ දී ආදායම් මගී කිලෝමීටර මිලියන 11,572 ක් දක්වා සියයට 5.1 කින් අඩු විය. 2023/24 වර්ෂයේ දී ලබා ගත හැකි ආසන කිලෝමීටර මිලියන 15,425.5 ක මගී ධාරිතාව 2024/25 වර්ෂයේ දී ලබා ගත හැකි ආසන කිලෝමීටර මිලියන 14,714.8 ක් දක්වා සියයට 4.6 කින් අඩු විය. ඒ අනුව, ශ්‍රීලංකන් ගුවන් සමාගම 2024/25 වර්ෂයේ දී රු. බිලියන 299.2 ක මුළු ආදායමක් වාර්තා කළ අතර, එය 2023/24 වර්ෂයේ දී මගී, භාණ්ඩ, අතිරික්ත ගමන් මලු සහ අනෙකුත් ආදායම් මාර්ගවලින් ලැබුණු රු. බිලියන 335.8 ට සාපේක්ෂව සියයට 10.9 ක අඩුවීමකි.

2023/24 වර්ෂයේ දී රු. බිලියන 324.6 ක් වූ ශ්‍රීලංකන් ගුවන් සමාගමේ වියදම 2024/25 වර්ෂයේ දී රු. බිලියන 275.6 ක් දක්වා සියයට 15.1 කින් අඩු වූ අතර, ගුවන් යානා ඉන්ධන පිරිවැය, බදු පදනම මත ලබා ගත් ගුවන් යානා සඳහා කුලී සහ ගුවන් යානා නඩත්තු සහ අලුත්වැඩියා වියදම් පිළිවෙලින් සියයට 20.4 , සියයට 68 සහ සියයට 13.2 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, 2023/24 වර්ෂයේ දී වාර්තා කළ රු. බිලියන 3.9 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024/25 වර්ෂයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම රු. බිලියන 8.4 ක බදු පසු ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. දිගුකාලීන මෙහෙයුම් අකාර්යක්ෂමතා සහ රු. බිලියන 586.5 ක් වූ අතීත ණය බර, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නොකඩවා පවතින මුදල් ප්‍රවාහ ගැටළු වලට මූලික හේතුව වන අතර, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන කොටස්හිමියා

වශයෙන් මෙමගින් රජයට බරපතල ප්‍රාග්ධන අභිමිවීම් සිදු වීමට ඉඩ ඇත.

ජාතික ගුවන් සේවය ආරක්ෂා කිරීමේ උත්සාහයක් ලෙස, සමාගමෙහි පවතින මුදල් ප්‍රවාහ ගැටළු වලට සහාය දීම සඳහා 2024 වර්ෂයේ දී රජය විසින් ශ්‍රීලංකන් ගුවන් සමාගමට රු. බිලියන 9.8 ක හිමිකම් දායකත්වයක් ලබා දී ඇත. මීට අමතරව, රජය ඇමෙරිකානු ඩොලර් මිලියන 175 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සහාය වීමට ඉදිරිපත් වී ඇති අතර, ඒ අනුව, සමාගමේ ආයතනික බැඳුම්කර හිමියන් සමඟ සාකච්ඡා කිරීම සඳහා රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූල්‍ය උපදේශක තවදුරටත් ශ්‍රීලංකන් ගුවන් සමාගම සමඟ රඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

තවත් පියවරක් ඉදිරියට තබමින්, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ දීර්ඝ කාලීන නොගෙවූ ණය සේවා බැඳීම් පියවීමට රජය එකඟ වූ අතර, ඒ අනුව ණය සේවා කිරීම සඳහා 2025 අයවැය මගින් රු. බිලියන 20 ක ප්‍රතිපාදන අනුමත කර ඇත. මෙම දීර්ඝ කාලීන නොගෙවූ ණය සේවාකරණ පිරිවැය පියවීමෙන් අනතුරුව සමාගමේ මෙහෙයුම් ලාභදායීතාවය සහතික කිරීම, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ පූර්ණ වගකීමක් බව රජය විසින් අවධාරණය කර ඇත. ඒ අනුව, නව මධ්‍ය කාලීන උපායමාර්ගික සැලැස්මක් නිර්මාණය කිරීමෙන් මෙම ඉලක්කය සපුරා ගැනීමට සමාගම විසින් කටයුතු කරමින් සිටී.

## 8.9 ඉදිකිරීම්

ඉදිකිරීම් කර්මාන්තයේ රජයේ කොන්ත්‍රාත් බොහොමයක් සිදු කරනු ලබන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් ත්‍රිත්වය වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සහ රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාවේ මුළු පිරිවැටුම 2023 වර්ෂයේ දී වාර්තා කරන ලද රු. මිලියන 8,989 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී මුළු පිරිවැටුම රු. මිලියන 11,701 ක් දක්වා සියයට 30 කින් වර්ධනය වී ඇත.

කෙසේ වෙතත්, ද්‍රවශීලතා සීමාවන්, රජයේ කොන්ත්‍රාත්තු අත්හිටුවීම සහ අවසන් කිරීම, ඉදිකිරීම් කර්මාන්තයේ දැඩි තරහකාරිත්වය, මෙහෙයුම් පිරිවැය ඉහළ යාම සහ පළපුරුදු තාක්ෂණික ව්‍යක්තිකයන් රට හැර යාම නිසා ඇති වූ අභියෝග 2024 වර්ෂයේ දී ද පැවතීම හේතුවෙන් මෙම ආයතන තුනට පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීමට බාධා එල්ල විය.

### 8.9.1 රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ගාල්ල සහ තෙල්දෙණිය අධිකරණ සංකීර්ණය, කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ මිලේනියම් වාට්ටුව සහ පයාගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඇතුළුව එකතුව රු. මිලියන 2,167 ක රජයේ ව්‍යාපෘති 2024 වර්ෂයේ දී සම්පූර්ණ කර ඇත. කෙසේ වෙතත්, 2023 වර්ෂයේ දී රු. මිලියන 1,920 ක් වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 1,475 ක් දක්වා සියයට 23 කින් පහත වැටී ඇත. එසේම, 2023 වර්ෂයේ දී ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (VRS) ක්‍රියාත්මක කිරීමෙන් පසු ව්‍යවස්ථාපිත ගෙවීම් අඩු වීම හේතුවෙන් මුළු වියදම සියයට 45.6 කින් පහත වැටී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2023 වර්ෂයේ රු. මිලියන 2,709 ක්වූ අලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 1,041 ක් දක්වා සියයට 62 කින් අඩුවී ඇත.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2023 වර්ෂය අවසන් වන විට රු. මිලියන 6,820 ක්ව පැවති මුළු ලැබිය යුතු මුදල් 2024 වර්ෂය අවසන් වන විට රු. මිලියන 6,881ක් දක්වා සියයට 1 කින් වර්ධනය වී ඇති අතර, ඉන් සියයට 75 ක් පමණ වර්ෂ තුනකට වඩා පැරණි ලැබිය යුතු මුදල් වේ. 2023 වර්ෂය අවසන් වන විට රු. මිලියන 11,745 ක් වූ බැංකු ණය හැර ගෙවිය යුතු මුදල් 2024 වර්ෂය අවසන් වන විට රු. මිලියන 12,231 ක් දක්වා වර්ධනය වීමට ද්‍රවශීලතා අර්බුදයද හේතු වී ඇත. සීමිත මුදල් ප්‍රවාහය හේතුවෙන්, මහජන බැංකුවේ ණය පමණක් ගෙවීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හැකි වූ අතර, එමගින් 2023 වර්ෂය අවසන් වන විට රු. මිලියන 3,101 ක්ව පැවති මුළු බැංකු ණය ප්‍රමාණය 2024 වර්ෂය අවසන් වන විට රු. මිලියන 2,996 ක් දක්වා අඩු කරගත හැකි වී ඇත.

**වගුව 8.23 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021(අ) | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **2,164** | **2,955** | **2,526** | **1,920** | **1,475** |
| ඉදිකිරීම් | 1,608 | 2,594 | 2,088 | 1,596 | 1,182 |
| උපදේශන | 156 | 338 | 413 | 225 | 190 |
| අනෙකුත් ආදායම් | 400 | 23 | 25 | 99 | 103 |
| **වියදම්** | **3,229** | **4,036** | **3,795** | **4,629** | **2,516** |
| මෙහෙයුම් වියදම් | 1,147 | 1,574 | 1,369 | 1,317 | 1,222 |
| සේවක පිරිවැය | 1,594 | 1,923 | 1,773 | 936 | 604 |
| මූල්‍ය පිරිවැය | 406 | 440 | 557 | 646 | 580 |
| අනෙකුත් වියදම් | 82 | 99 | 96 | 1,730 | 110 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **-1,065** | **-1,081** | **-1,269** | **-2,709** | **-1,041** |
| **නොපියවූ බැංකු ණය** | **2,261** | **2,261** | **2,868** | **3,101** | **2,996** |
| **ලැබිය යුතු මුදල්** | **5,385** | **5,928** | **5,966** | **6,820** | **6,881** |

මූලාශ්‍රය : රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
(අ)තාවකාලික - ජාතික යන්ත්‍රෝපකරණ ආයතන හැර

### 8.9.2 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය 2016 වර්ෂයේ සිට උපදේශන සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව කටයුතු කරන අතර, එහි පූර්ණ හිමිකාරිත්වය ඇති ඉදිකිරීම් පරිපාලිත සමාගමක් වන මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම සමඟ එක්ව ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ ඉංජිනේරු උපදේශන ක්ෂේත්‍රයේ වෙළෙඳපොළ ප්‍රමුඛයෙකු ලෙස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය, සූර්ය බලශක්තිය වැඩි දියුණු කිරීම සහ ජල විදුලි ව්‍යාපෘති ඇතුළු තිරසාර බලශක්ති ව්‍යාපාර දක්වා උපායමාර්ගිකව විවිධාංගීකරණය වී ඇති අතර, එහි විදේශීය මෙහෙයුම් විශේෂයෙන් නැගෙනහිර අප්‍රිකාවේ පුළුල් කර ඇත.

2024 වර්ෂයේ දී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය විසින් අරුවක්කාලු හි මෙට්‍රෝ කොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය, දකුණු සුඩානයේ ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධති ඉංජිනේරු, පෙකෝ මංපෙත සංවර්ධනය සහ දකුණු සුඩානයේ ගුවන් තොටුපොළ සංවර්ධනය සඳහා උපදේශන සේවා ඇතුළු ඉහළ පෙළේ ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කරන ලදී. කාර්යාංශය විසින් 2024 වර්ෂය තුළ රු. මිලියන 687 ක් වටිනා ව්‍යාපෘති සම්පූර්ණ කරන ලද අතර, ඉන් රු. මිලියන 665 ක් රජයේ කොන්ත්‍රාත් වලින් ලැබී තිබුණි. ඊට අමතරව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය සතුව රු. මිලියන 2,163 ක් වටිනා අනාගත වැඩ කළඹක් පැවති අතර, එයට බටහිර බහාලුම් පර්යන්තය - II, කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සහ ලේඩි රිජ්වේ රෝහලේ හෘද හා දැඩි සත්කාර සංකීර්ණය වැනි ප්‍රධාන ව්‍යාපෘතිද ඇතුළත් වේ.

මූල්‍යමය වශයෙන්, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය 2023 වර්ෂයේ දී රු. මිලියන 6,609 ක් වූ ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 9,560 ක් දක්වා සියයට 45 ක වර්ධනයක් අත්කර ගත් අතර, 2023 වර්ෂයේ දී රු. මිලියන 5,861 ක් වූ වියදමද රු. මිලියන 8,953 ක් දක්වා සියයට 53 කින් වර්ධනය වී ඇත. ඉහළ මෙහෙයුම් පිරිවැයෙන්වූ ආන්තික පිඩනය 2023 වර්ෂයේ රු. මිලියන 748 ක්ව පැවති ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ ශුද්ධ ලාභය රු. මිලියන 607 ක් බවට පත් වීමට හේතු විය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, කාර්යාංශය පසුගිය වර්ෂ පහ තුළ එහි මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කරමින්, 2023 වර්ෂය අවසානය වන විට රු. මිලියන 8,781 ක්ව පැවති හිඟ ලැබිය යුතු මුදල් 2024 වර්ෂය අවසන් වන විට රු. මිලියන 8,308 ක් දක්වා සියයට 5.4 කින් අඩු කරගෙන ඇත. කෙසේ වෙතත්, මෙම ලැබිය යුතු මුදල් වලින් ආසන්න වශයෙන් සියයට 50 ක් වර්ෂ තුනකට වඩා කාලයක් හිඟව පැවත ඇත.

### 8.9.3 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් 2024 වර්ෂයේ දී රු. මිලියන 265 ක් වටිනා රජයේ ව්‍යාපෘති සම්පූර්ණ කරන ලද අතර, වර්ෂය තුළ ලබාගත් රු. මිලියන 1,904 ක් වටිනා නව ව්‍යාපෘතිද ඇතුළුව රු. මිලියන 1,978 ක් වටිනා ක්‍රියාකාරී ව්‍යාපෘති කළඹක් පවත්වා ගෙන යන ලදී. සංස්ථාව මිශ්‍ර මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කළ අතර, 2023 වර්ෂයේ දී රු. මිලියන 461 ක් වූ මුළු ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 666 ක් දක්වා සියයට 44 කින් වර්ධනය වී ඇත. සංස්ථාවේ වියදම් රු. මිලියන 2,362 ක් දක්වා සියයට 13 කින් පහත ගියද, මෙහෙයුම් අභියෝගයන් පියවා ගැනීමට මෙම පියවරයන් ප්‍රමාණවත් නොවූ බැවින් 2024 වර්ෂයේදී රු. මිලියන 1,696 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, එය 2023 වර්ෂයේ දී වාර්තා කරන ලද රු. මිලියන 2,261 ක වූ අලාභයට සාපේක්ෂව වර්ධනයකි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය කළමනාකරණයේ ප්‍රගතියක් අත්කර දෙමින්, වැඩිදියුණු කළ හිඟ මුදල් එකතු කිරීමේ ක්‍රමවේදයන් හරහා 2024 වර්ෂය අවසන් වන විට හිඟ මුදල රු. මිලියන 847 ක් දක්වා සියයට 39 කින් පහත දැමීමට හැකි වී ඇත. කෙසේ වෙතත්, සංස්ථාව අඛණ්ඩව සැලකිය යුතු ද්‍රවශීලතා පීඩනයන්ට මුහුණ දුන් අතර, ප්‍රධාන වශයෙන් නොපියවූ බැංකු ණය හේතුවෙන් 2023 වර්ෂය අවසානය වන විට රු. මිලියන 2,106 ක් වූ හිඟ බැංකු ණය 2024 වර්ෂය අවසන් වන විට රු. මිලියන

**වගුව 8.24 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **6,557** | **6,361** | **5,105** | **6,609** | **9,560** |
| ඉදිකිරීම් | 4,124 | 3,947 | 2,748 | 4,009 | 7,157 |
| උපදේශන | 2,008 | 2,117 | 1,748 | 1,494 | 1,777 |
| අනෙකුත් ආදායම් | 162 | 121 | 228 | 209 | 183 |
| මූල්‍ය ආදායම් | 263 | 176 | 381 | 897 | 443 |
| **මුළු වියදම** | **6,296** | **6,314** | **5,035** | **5,861** | **8,953** |
| මෙහෙයුම් වියදම් | 4,548 | 4,620 | 3,441 | 4,494 | 7,102 |
| සේවක පිරිවැය | 1,743 | 1,689 | 1,591 | 1,363 | 1,847 |
| මූල්‍ය පිරිවැය | 5 | 5 | 4 | 4 | 4 |
| අනෙකුත් වියදම් | – | – | – | – | – |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **261** | **48** | **69** | **748** | **607** |
| නොපිය වූ බැංකු ණය | – | – | – | – | – |
| **ලැබිය යුතු මුදල** | **10,743** | **9,683** | **9,446** | **8,781** | **8,308** |
| **උපචිත වියදම් බැංකු ණය හැර** | **12,528** | **11,278** | **10,990** | **10,551** | **9,581** |
| **ආයෝජන** | **3,420** | **3,223** | **3,314** | **4,068** | **4,415** |

මූලාශ්‍රය : ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය

(අ)තාවකාලික

**වගුව 8.25 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **1,782** | **4,483** | **2,730** | **460** | **666** |
| ඉදිකිරීම් | 1,449 | 4,216 | 2,546 | -299 | 238 |
| උපදේශන | 10 | 6 | 9 | 5 | 3 |
| අනෙකුත් ආදායම් | 323 | 261 | 176 | 754 | 425 |
| **මුළු වියදම** | **2,039** | **4,386** | **2,704** | **2,721** | **2,362** |
| මෙහෙයුම් වියදම් | 1,338 | 3,812 | 2,182 | 818 | 889 |
| සේවක පිරිවැය | 161 | 109 | 214 | 522 | 510 |
| මූල්‍ය පිරිවැය | 209 | 259 | 122 | 387 | 168 |
| අනෙකුත් වියදම් | 331 | 206 | 185 | 994 | 795 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **-257** | **96** | **27** | **-2,261** | **-1,696** |
| **නොපියවූ බැංකු ණය** | **1,854** | **1,989** | **1,848** | **2,106** | **2,274** |
| **ලැබිය යුතු මුදල්** | **333** | **557** | **578** | **1,392** | **847** |

මූලාශ්‍රය: රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

(අ)තාවකාලික

2,274 ක් දක්වා සියයට 8 කින් ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය අර්බුදය තවදුරටත් වර්ධනය කරමින් එහි මෙහෙයුම් කෙරෙහි බලපෑම් එල්ල කර ඇත.

2024 වර්ෂයේ දී ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ වයස අවුරුදු 55 ට අඩු සේවකයින් 206 දෙනෙකු සඳහා වන්දි සහ ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත රු. මිලියන 651 ක හිමිකම් ප්‍රග්ධනයක් ලබා දෙන ලදී. සංස්ථාවට ප්‍රාග්ධනය ලබා දීම කම්කරු රෙගුලාසි සමඟ අනුකූලවීම තහවුරු කරමින් ආයතනය ප්‍රතිව්‍යුහගතකරණයට සහාය වීමක් වේ.

## 8.10 ලොතරැයි

ශ්‍රී ලංකාව තුළ ලොතරැයි කර්මාන්තය ඉතා මැනෙවින් නියාමනය වී ඇති අතර, එය පුළුල් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ වැදගත් අංශයක් නියෝජනය කරනු ලබයි. ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි කර්මාන්තයේ තරඟකරුවන් වේ. පුළුල් පරාසයක විහිදුනු ලොතරැයිපත් නිර්මාණය, බෙදාහැරීම හා කළමනාකරණය සඳහා වූ වගකීම මෙම රාජ්‍ය ව්‍යවසායයන් දෙක විසින් දරනු ලබයි. ජාතික ලොතරැයි මණ්ඩලය සියයට 55.6 ක් වූ වෙළෙඳපොළ කොටසක හිමිකාරත්වය දරනු ලබන අතර, ඉතිරි සියයට 44.4 ක වෙළෙඳපොළ කොටස සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හිමි වී ඇත. ජාතික ලොතරැයි මණ්ඩලයේ නිෂ්පාදිත කළඹ ලොතරැයිපත් නවයකින් සමන්විත වන අතර, එයට දිනුම් ඇදීමේ ලොතරැයිපත් හතක් සහ ක්ෂණික ලොතරැයිපත් දෙකක් ඇතුළත් වේ. මේ අයුරින්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ද ලොතරැයිපත් සන්නාම නවයක නිෂ්පාදිත කළඹක් ඉදිරිපත් කරයි. ඒ අතර, දිනුම් ඇදීමේ ලොතරැයිපත් අටක් සහ ක්ෂණික ලොතරැයිපත් එකක් ඇත. ශ්‍රී ලංකාවේ ලොතරැයි කර්මාන්තයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ එමගින් ජාතික සංවර්ධනය සඳහා ලබා දෙන දායකත්වයයි. ලොතරැයිපත් අලෙවිය තුළින් ලැබෙන අරමුදල් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා හා යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු විවිධ මහජන සුබසාධන කාර්යයන් වෙත වෙන් කරනු ලැබේ. ජාතික ලොතරැයි මණ්ඩලය සෘජුවම ඒකාබද්ධ අරමුදලට දායකත්වය ලබා දෙන අතර, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලෙහි ප්‍රධාන දායකයා වන අතර, එම අරමුදල්වලින් කොටසක් මහපොළ උසස් අධ්‍යාපන භාරකාර අරමුදල වෙත ද වෙන්කරනු ලබයි.

2024 වර්ෂය සඳහා වාර්තාගත සමස්ථ ලොතරැයිපත් අලෙවි ආදායම රු.බිලියන 68 ක් වූ අතර, එය පෙර වර්ෂය ට වඩා සියයට 16.5 ක ඉහළයාමක් පෙන්නුම් කරයි. මේ අතර, ආයතන දෙක විසින් 2024 වර්ෂයේ දී රු. බිලියන 35 ක් පමණ වටිනා ත්‍යාග ප්‍රකාශයට පත් කර ඇති අතර, එය 2023 වර්ෂය හා සැසඳීමේදී සියයට 17.2 ක වර්ධනයකි.

සම්ප්‍රදායික මුද්‍රිත ලොතරැයිපත් අලෙවිය තවදුරටත් වෙළෙඳපොළ තුළ ප්‍රවලිතව පවතින අතරම, රජයේ ඩිජිටල්කරණ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි ඩිජිටල්කරණය වෙත ද ක්‍රමිකව යොමු වෙමින් පවතී. වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම හා වර්ධනය කිරීම සඳහා සහ පාරිභෝගිකයන්ගේ පහසුව සඳහා මෙම ආයතන දෙක විසින්ම මාර්ගගත අවකාශයන් හා ජංගම දුරකථන පාදක කරගත් සේවාවන් හඳුන්වා දී ඇත.

### 8.10.1 ජාතික ලොතරැයි මණ්ඩලය

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2024 වර්ෂයේ ආදායම රු. බිලියන 37 ක් දක්වා ඉහළගොස් ඇති අතර, එය 2023 වර්ෂය හා සැසඳීමේදී සියයට 19 ක වර්ධනයකි. ප්‍රකාශිත මුළු ත්‍යාගවල වටිනාකම රු. බිලියන 19.6 ක් දක්වා අඛණ්ඩව ඉහළ ගොස් ඇති අතර, එය 2023 වර්ෂය හා සැසඳීමේදී සියයට 17.7 ක ඉහළ යාමකි. ඒකාබද්ධ අරමුදල සඳහා 2023 වර්ෂයේ දී රු. බිලියන 3.8 ක් වූ දායකත්වය 2024 වර්ෂයේ දී රු. බිලියන 4.5 ක් දක්වා සියයට 17.4 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2023 වර්ෂයේ දී රු. මිලියන 844 ක් වූ ජාතික ලොතරැයි මණ්ඩලයෙහි ශුද්ධ ලාභය 2024 වර්ෂයේ දී රු. බිලියන 1.7 ක් දක්වා දෙගුණයකට ආසන්නව වැඩි විය. 2023 වර්ෂයේ මැද භාගයේදී ටිකට්පත් මිල රු. 20 සිට රු. 40 දක්වා දෙගුණ වුවද, ලොතරැයි අලෙවි ආදායමේ කැපී පෙනෙන වර්ධනය මෙලෙස ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 8:26 | ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **18,034** | **17,299** | **21,696** | **31,573** | **36,544** |
| ලොතරැයි අලෙවි ආදායම | 18,041 | 17,292 | 21,209 | 32,014 | 37,983 |
| අඩු කිරීම් සෘජු බදු - නිෂ්පාදන බදු | – | – | – | – | |
| අඩු කිරීම් වක්‍ර බදු - එකතු කළ අගය මත බදු | 430 | 409 | 641 | 1,165 | 1,659 |
| - සමාජ ආරක්ෂණ දායකත්ව බදු | – | – | 120 | 598 | 719 |
| වෙනත් ආදායම් | 423 | 416 | 1,248 | 1,322 | 939 |
| **වියදම** | **16,599** | **16,295** | **20,306** | **30,729** | **34,851** |
| ප්‍රධාන නියෝජිත හා නියෝජිත කොමිස් | 3,607 | 3,458 | 4,315 | 6,527 | 7,597 |
| ප්‍රකාශිත ත්‍යාග | 8,668 | 8,352 | 10,741 | 16,671 | 19,618 |
| ලොතරැයිපත්‍ර මුද්‍රණ පිරිවැය | 443 | 425 | 874 | 1,187 | 837 |
| බෙදා හැරීම, විකුණුම් සහ අලෙවිකරණය | 893 | 1,074 | 921 | 1,408 | 1,158 |
| පරිපාලන වියදම් | 773 | 812 | 840 | 1,057 | 1,128 |
| මූල්‍ය පිරිවැය | 10 | 12 | 6 | 37 | 3 |
| ඒකාබද්ධ අරමුදලට සහ ජාතික වකුගඩු අරමුදලට දායක වීම | 2,205 | 2,162 | 2,609 | 3,842 | 4,510 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **1,435** | **1,004** | **1,390** | **844** | **1,693** |
| ආදායම් බදු | 352 | 43 | 305 | 194 | 189 |
| **බදු පසු ලාභය/ (අලාභය)** | **1,083** | **961** | **1,085** | **650** | **1,504** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| නියෝජිතායතන සහ අලෙවි නියෝජිත ජාලය | 3,607 | 3,257 | 3,145 | 3,182 | 2,845 |
| **ඒකාබද්ධ අරමුදලට දායක වීම ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස (%)** | **12** | **12** | **12** | **12** | **12** |

මූලාශ්‍රය : ජාතික ලොතරැයි මණ්ඩලය

(අ)තාවකාලික

දිවයින පුරා විවිධ භූගෝලීය වෙළෙඳපොළ කොටස් වෙත කඩිනමින් ළඟා වීමට හැකිවන පරිදි අලෙවිකරුවන්, නියෝජිතයින් සහ කෙටි පණිවිඩ සේවා අලෙවිකරුවන්ගෙන් සමන්විත පුළුල් ජාලයක් පවත්වා ගනිමින් ජාතික ලොතරැයි මණ්ඩලය එහි වෙළෙඳපොළ ප්‍රමුඛතාවය තවදුරටත් තහවුරු කර ගෙන ඇත. සම්ප්‍රදායික අලෙවි නියෝජිත මාර්ගවලට අමතරව, දිනුම් ඇදීමේ ලොතරැයිපත් කෙටි පණිවිඩ සේවා අලෙවිකරුවන් හරහා ද බෙදාහරිනු ලබන අතර, එමගින් පාරිභෝගිකයන් වෙත ළඟා වීම පුළුල් කරනු ලබයි. මූලික ව්‍යාපාරික උපායමාර්ගවලට අනුකූල වෙමින් විවිධාංගීකරණය වූ නිෂ්පාදිත කළඹක් සංවර්ධනය කිරීම හා එහි වෙළෙඳපොළ කොටස පුළුල් කිරීම කෙරෙහි ජාතික ලොතරැයි මණ්ඩලය නිරන්තරයෙන් අවධානය යොමු කරයි.

## 8.10.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලය

2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අලෙවි ආදායම රු. බිලියන 30 ක් වූ අතර, එය 2023 වර්ෂයට

**වගුව 8:27 | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **15,522** | **15,816** | **19,839** | **26,354** | **29,758** |
| ලොතරැයි අලෙවි ආදායම | 15,400 | 15,730 | 19,754 | 26,608 | 30,314 |
| අඩු කිරීම් වක්‍ර බදු -එකතු කළ අගය මත බදු | 367 | 366 | 683 | 1,166 | 1,434 |
| වෙනත් ආදායම් | 158 | 110 | 321 | 435 | 248 |
| ත්‍යාග නැවත ගෙවීම් | 331 | 342 | 447 | 477 | 630 |
| **වියදම** | **12,528** | **12,863** | **16,572** | **22,838** | **25,561** |
| නියෝජිත කොමිස් | 2,884 | 2,947 | 3,701 | 4,989 | 5,684 |
| ප්‍රකාශිත ත්‍යාග | 7,703 | 7,866 | 9,884 | 13,451 | 15,701 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 510 | 542 | 751 | 826 | 911 |
| ලොතරැයි පත්‍ර මුද්‍රණ පිරිවැය | 451 | 434 | 844 | 1,148 | 833 |
| බෙදා හැරීම, විකුණුම් සහ අලෙවිකරණය | 473 | 537 | 787 | 1,716 | 1,636 |
| පරිපාලන වියදම් | 507 | 537 | 605 | 708 | 796 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **2,994** | **2,953** | **3,267** | **3,516** | **4,197** |
| ආදායම් බදු | -11 | -83 | -56 | 106 | -111 |
| **බදු පසු ලාභය/ (අලාභය)** | **2,983** | **2,870** | **3,211** | **3,622** | **4,086** |
| **ජනාධිපති අරමුදලට දායකත්වය** | **2,297** | **2,305** | **3,211** | **3,622** | **4,086** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| නියෝජිතායතන සහ අලෙවි නියෝජිත ජාලය | 2,810 | 2,946 | 2,605 | 2,456 | 2,640 |
| **ජනාධිපති අරමුදලට දායක වීම ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස (%)** | **17.90** | **18.20** | **16.80** | **14.00** | **13.50** |

මූලාශ්‍රය: සංවර්ධන ලොතරැයි මණ්ඩලය

(අ)තාවකාලික

සාපේක්ෂව සියයට 14 ක වැඩිවීමකි. ජනාධිපති අරමුදලට ප්‍රධාන දායකත්වයක් ලබා දෙන ආයතනයක් ලෙස, 2023 වර්ෂයේ දී රු. බිලියන 3.6 ක් වූ දායකත්වය 2024 වර්ෂයේ දී රු. බිලියන 4 ක් දක්වා සියයට 12.8 කින් වැඩි කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2024 වර්ෂයේ දී රු. බිලියන 4.1 ක ලාභයක් වාර්තා කළ අතර, ලාභ උපනතිය තවදුරටත් පැවතෙමින් සහ පෙර වසරට සාපේක්ෂව සියයට 19.4 ක වර්ධනයක් පිළිබිඹු කරමින් මෑත වර්ෂවල ලබා ගත් ඉහළම ලාභය මෙම වර්ෂයේ දී සනිටුහන් කර ඇත. මෙම වර්ෂයේ දී ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග බෙදාහැරීම් රු. බිලියන 15.7 ක් වූ අතර, එය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 17 ක වැඩිවීමකි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මාර්ගගත ලොතරැයි අලෙවිය ඉහළ නැංවීමේ අරමුණින් ඩිජිටල් ප්‍රවේශ හරහා විවිධ වූ වෙළෙඳපොළ කොටස් අත්පත් කර ගැනීම සඳහා උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම සියළු ප්‍රයත්නයන්, ජනාධිපති අරමුදලෙහි සහ මහපොළ උසස් අධ්‍යාපන හාරකාර අරමුදලෙහි ප්‍රධාන අරමුදල් සම්පාදකයා ලෙස එහි භූමිකාව ශක්තිමත් කිරීමට සහ එමගින් රට පුරා සිටින ආර්ථික දුෂ්කරතාවයන්ට ලක් වූ ප්‍රජාවන්ගේ සමාජීය යහපැවැත්මට දායකවීමේ මණ්ඩලයේ අරමුණු සමඟ අනුගත වේ.

## 8.11 පශු සම්පත් හා කිරි නිෂ්පාදන

2024 වර්ෂයේ දී ජාතික දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.4 ක පමණ අගයක පවතින පශු සම්පත, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය තුළ පෝෂණ සුරක්ෂිතතාවය, තිරසාර පරිභෝජනය හා ග්‍රාමීය ජීවනෝපායන් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරක් ඉටුකරනු ලබයි. පශු සම්පත් තුළ පවතින උප අංශ අතුරින්, කිරි නිෂ්පාදන අංශය සමාජ ආර්ථික සංවර්ධනයේ ජාතික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම සන්දර්භය තුළ, කිරි ආශ්‍රිත නිෂ්පාදිත, නිෂ්පාදනය සහ අලෙවි කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් ලෙස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ මිල්කෝ පුද්ගලික සමාගම විසින් සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි දත්තවලට අනුව, 2024 වර්ෂයේ දී වාර්ෂික කිරි නිෂ්පාදිතයෙහි අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබන අතරම, මෙරට පවත්නා මුළු කිරි ප්‍රමාණයෙන් සියයට 44 ක් පමණක් දේශීය නිෂ්පාදනයෙන් සපුරාගෙන ඇත. 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාව එළකිරි ලීටර් මිලියන 325.8 ක් සහ මී කිරි ලීටර් මිලියන 54.2 ක් නිෂ්පාදනය කර ඇති අතර, වර්ෂය තුළ කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ඉහළ පිරිවැයක් දරා ඇත.

### 8.11.1 මිල්කෝ පුද්ගලික සමාගම

දේශීය කිරි ගොවීන්ගේ ජීවනෝපාය ශක්තිමත් කරමින්, කිරි ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මිල්කෝ පුද්ගලික සමාගමෙහි පූර්ණ හිමිකාරීත්වය රජය සතු වේ. 2024 වර්ෂයේ දී මිල්කෝ පුද්ගලික සමාගම විසින් මෙරට සමස්ත කිරි නිෂ්පාදනයෙන් සියයට 12.8 ක ප්‍රමාණයක් එකතු කර ඇත.

සමාලෝචිත වර්ෂයේ දී කිරි නිෂ්පාදනවල මිල ඉහළ යාම හේතුවෙන්, මිල්කෝ පුද්ගලික සමාගමෙහි ආදායම 2023 වර්ෂයේ දී වූ රු. බිලියන 15.3 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. බිලියන 16 ක් දක්වා සියයට 4.5 කින් වර්ධනය වී ඇත. දළ ලාභය වැඩිවීම සහ මූල්‍ය පිරිවැය අඩුවීම හරහා ලද ප්‍රතිලාභයක් ලෙස, 2023 වර්ෂයේ දී වාර්තා කරන ලද රු. මිලියන 470 ක් වූ අලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 36 ක අලාභයක් වාර්තා කරමින් මිල්කෝ පුද්ගලික සමාගමෙහි අලාභය සියයට 92 කින් අඩුකර ගෙන ඇත. කෙසේ වෙතත්, 2023 වර්ෂය අවසානය වන විට පැවති රු. මිලියන 1,553 ක බැංකු ණය ප්‍රමාණයට සාපේක්ෂව 2024 වර්ෂය අවසානය වන විට බැංකු ණය ප්‍රමාණය රු. මිලියන 1,744 ක් දක්වා සියයට 12 කින් වර්ධනය වී ඇත.

**වගුව 8.28 | මිල්කෝ පුද්ගලික සමාගමේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **11,191** | **12,620** | **13,975** | **15,300** | **16,048** |
| කිරි නිෂ්පාදන විකුණුම් | 11,105 | 12,479 | 13,164 | 15,075 | 15,872 |
| වෙනත් ආදායම් | 86 | 141 | 811 | 225 | 176 |
| **වියදම** | **10,965** | **12,584** | **14,434** | **15,770** | **16,084** |
| සෘජු වියදම් | 9,703 | 11,293 | 12,730 | 13,551 | 14,140 |
| අලෙවි සහ බෙදාහැරීම් වියදම් | 336 | 428 | 510 | 467 | 449 |
| පරිපාලන වියදම් | 799 | 826 | 1,033 | 1,278 | 1,224 |
| මූල්‍ය වියදම් | 120 | 29 | 157 | 435 | 242 |
| වෙනත් වියදම් | 7 | 8 | 4 | 39 | 29 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **226** | **36** | **-459** | **-470** | **-36** |
| බැංකු සඳහා නොපියවූ ණය | 753 | 227 | 1,619 | 1,553 | 1,744 |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| කිරි එකතු කිරීම (ලීටර් මිලියන) | 67 | 68 | 48 | 40 | 49 |
| කොටසක් සඳහා ඉපැයීම (රු.) | 7.07 | -5.07 | -0.56 | -0.59 | -0.04 |

මූලාශ්‍රය: මිල්කෝ පුද්ගලික සමාගම

(අ)තාවකාලික

ප්‍රමාණවත් නොවන කිරි සැපයුම් දාමය හේතුවෙන් මිල්කෝ පුද්ගලික සමාගම විසින් 2024 වර්ෂයේ දී කිරිපිටි මෙට්‍රික් ටොන් 3,011 ක් පමණක් නිෂ්පාදනය කර ඇති අතර, එම ප්‍රමාණයට වඩා සතර ගුණයකින් වැඩි නිෂ්පාදනයක් කිරීමට අඹේවෙල කර්මාන්ත ශාලාවට වාර්ෂික ධාරිතාවයක් ඇති බැවින්, 2024 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද කිරිපිටි ප්‍රමාණය ආයතනයේ විභවයට වඩා බෙහෙවින් අඩු අගයකි. කෙසේ වෙතත්, ව්‍යාපාරික තිරසාරත්වය සහතික වන අයුරින් වෛළඳපොළ අවශ්‍යතාවයට සරිලන පරිදි නැවුම් කිරි සැපයුම් දාමයන් හඳුනාගැනීම හරහා කිරිපිටි නිෂ්පාදනය ඉහළ නැංවීමට ඇති හැකියාව සොයා බැලීමට සමාගම කටයුතු කළ යුතුය.

## 8.11.2 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

පශු සම්පත් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදිතවල සැපයුම්කරුවන් අතර ප්‍රමුඛයෙකු වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය එම ක්ෂේත්‍රයේ වැදගත් කාර්යභාරය හඳුනාගෙන තත්ත්වයෙන් උසස් සත්ත්ව අභිජනන ද්‍රව්‍ය, පශු සම්පත් සහ කෘෂි භෝග නිපදවීම තුළින් ජනතාවගේ සාමාජීය හා ආර්ථික මට්ටම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, පශු සම්පත් හා පොල් ඒකාබද්ධ ගොවිපොළ 32 කින් සමන්විතව පවත්වාගෙන යනු ලබන අතර, දිගන ප්‍රදේශයේ පිහිටි පුහුණු මධ්‍යස්ථානය හරහා ගොවීන්ට අවශ්‍ය පශු සම්පත් පිළිබඳ දැනුම ලබා දීම සිදු කෙරේ.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි ගොවිපොළවල එළ ගවයින්, මී ගවයින්, ඌරන්, එළුවන්, බැටළුවන්, හාවුන්, මවිපිය පරම්පරාවේ කුකුළන්, වාණිජ මට්ටමේ කුකුළන්, තාරාවුන්, කළුකුම් සහ වටුවන්ගේ නුමුහුම් හා දෙමුහුම් කාණ්ඩවලට අයත් අභිජනන සත්ත්ව කණ්ඩායම් පවත්වාගෙන යනු ලබන අතර, මණ්ඩලය සතු කිරි අලෙවිසැල් 37 කින් හා ගොවිපොළ නිෂ්පාදන විකුණුම් මධ්‍යස්ථාන 18 කින් යුත් අලෙවි ජාලයකින් සමන්විතය. මීට අමතරව, 2024 වර්ෂයේ දී පොල් ගෙඩි නිෂ්පාදනය මිලියන 10.8 ක් වූ පොල් ත්‍රිකෝණයට අයත් ගොවිපොළවල් 10 ක් පවත්වාගෙන යනු ලබන හෙක්ටයාර 3,908 කින් සමන්විත වන පොල් වගාවක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් වන අතර, එම පොල් නිෂ්පාදනයෙන් කොටසක් පොල්තෙල් බවට පත්කර දේශීය පාරිභෝගිකයන් හට ලබා දී ඇත.

2024 වර්ෂයෙහි සමස්ත වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 380 ක් වූ අතර, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් එම ජාතික නිෂ්පාදිතයට දක්වනු ලබන මුළු දායකත්වය සියයට 1.3 ක් පමණ වේ. 2024 වර්ෂයේ දී වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 4.84 ක් දක්වා සියයට 12 කින් අඩු වුවද, 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 136 ක අලාභයට සාපේක්ෂව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් 2024 වර්ෂයේ දී රු. මිලියන 280 ක ලාභයක් වාර්තා කර ඇත්තේ ප්‍රධාන වශයෙන් විකුණුම් මිල ඉහළ යාමත් සමඟ 2023 වර්ෂයේ දී රු. මිලියන 4,558 ක් වූ ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 4,806 ක් දක්වා සියයට 5.4 කින් වැඩිවීම සහ සෘජු වියදම් හා පරිපාලන වියදම් පිළිවෙලින් සියයට 3.6 කින් සහ සියයට 4 කින් අඩුවීම හේතුවෙනි.

## 8.12 අලෙවිකරණය සහ බෙදාහැරීම

### 8.12.1 සීමා සහිත ලංකා සතොස සමාගම

සීමා සහිත ලංකා සතොස සමාගම යනු පාරිභෝගිකයින්ට අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය දැරිය හැකි මිලකට ලබාදීමට කැපවී සිටින මෙරට විශාලතම රජය සතු සිල්ලර වෛළඳසැල් ජාලයයි. අලෙවිසැල් 448 ක් සහ 3,600 කට අධික සේවක පිරිසක් සිටින ලංකා සතොස සමාගම, ශ්‍රී ලංකාවේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල තීරකයා වීමේ දැක්මක් ඇතිව දේශීය සිල්ලර වෛළඳාමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. දැනට වෛළෙඳපොළ කොටසින්

**වගුව 8.29 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **3,352** | **3,719** | **4,716** | **4,558** | **4,806** |
| **වියදම** | **3,361** | **3,561** | **4,597** | **4,694** | **4,526** |
| සෘජු වියදම් | 2,258 | 2,452 | 3,310 | 3,294 | 3,176 |
| පරිපාලන වියදම් | 1,035 | 1,056 | 1,223 | 1,319 | 1,266 |
| බෙදාහැරීමේ පිරිවැය | 26 | 19 | 27 | 31 | 33 |
| වෙනත් වියදම් | 16 | 18 | 25 | 36 | 32 |
| මූල්‍ය වියදම් | 26 | 16 | 12 | 14 | 19 |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **-9** | **158** | **119** | **-136** | **280** |
| බැංකු සඳහා නොපියවූ ණය | 216 | 112 | 84 | 114 | 94 |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| එළකිරි (ලීටර් '000) | 12,027 | 9,774 | 6,433 | 4,875 | 4,149 |
| මී කිරි (ලීටර් '000) | 582 | 587 | 629 | 678 | 691 |
| එළුකිරි (ලීටර් '000) | 15 | 14 | 12 | 10 | 17 |
| මුදවන ලද කිරි (ලීටර් '000) | 420 | 431 | 348 | 403 | 380 |
| යෝගට් (මි.ලි. 80) (සංඛ්‍යාව '000) | 415 | 644 | 591 | 616 | 689 |

මූලාශ්‍රය: ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

(අ)තාවකාලික

**වගුව 8:30 | ලංකා සතොස සමාගමේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **36,799** | **41,458** | **57,519** | **59,403** | **53,659** |
| විකුණුම් | 35,579 | 40,473 | 56,852 | 58,179 | 52,648 |
| වක්‍ර ආදායම් | 1,220 | 985 | 667 | 1,224 | 1,011 |
| **මෙහෙයුම් වියදම්** | **37,682** | **41,936** | **57,112** | **58,908** | **54,113** |
| විකුණුම් පිරිවැය | 31,806 | 36,217 | 50,157 | 51,037 | 46,014 |
| වෙනත් වියදම් | 5,876 | 5,719 | 6,955 | 7,871 | 8,099 |
| **මෙහෙයුම් ලාභය / (අලාභය)** | **-883** | **-478** | **407** | **495** | **-454** |
| මූල්‍ය වියදම් (ශුද්ධ) | 503 | 403 | 1,094 | 1,190 | 643 |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **-1,386** | **-880** | **-687** | **-695** | **-1,097** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| අලෙවිසැල් සංඛ්‍යාව | 416 | 437 | 440 | 445 | 448 |

මූලාශ්‍රය: ලංකා සතොස සමාගම
(අ)තාවකාලික

සියයට 5 කට ආසන්න ප්‍රමාණයක් ලංකා සතොස සමාගම සතු වන අතර, පෞද්ගලික අංශයේ සුපිරි වෙළෙඳපොළ දාමවල ශීඝ්‍ර ව්‍යාප්තිය සමාගමේ වෙළෙඳපොළ කොටසේ වර්ධනයට අභියෝගයක් වී ඇත.

2024 වර්ෂයේ දී ලංකා සතොස සමාගම වාර්තා කළ මුළු ආදායම රු. බිලියන 53.6 ක් වූ අතර, 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. බිලියන 59.4 හා සංසන්දනය කිරීමේදී එය සියයට 9.7ක පසුබෑමකි. මෙම ආදායම් අඩුවීම සඳහා ප්‍රධාන හේතුව වන්නේ විකුණුම් සියයට 9.5කින් අඩුවීමයි. විකුණුම් අඩු වුවද, ලංකා සතොස සමාගමට එහි දළ ලාභ අනුපාතය 2023 වර්ෂයේ දී වූ සියයට 12.3 සිට 2024 වර්ෂයේ දී සියයට 12.6ක් දක්වා සුළු වශයෙන් වැඩිකර ගැනීමට හැකිවී ඇත. කෙසේ වුවද, 2023 වර්ෂයට සාපේක්ෂව අනෙකුත් වියදම් සියයට 3කින් වැඩිවීමත්, අනෙකුත් ආදායම් සියයට 17.4කින් අඩුවීමත් හේතුවෙන්, 2023 වර්ෂයේ දී රු. මිලියන 495ක් වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 454ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත.

ලංකා සතොස සමාගම 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 1,190 සිට මූල්‍ය වියදම් (ශුද්ධ) 2024 වර්ෂයේ දී රු. මිලියන 643ක් දක්වා සැලකිය යුතු ලෙස සියයට 46කින් අඩු කරගෙන ඇත. කෙසේවුවද, ලංකා සතොස සමාගම 2024 වර්ෂය සඳහා රු. මිලියන 1,097ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇති අතර, එය 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 695ක ශුද්ධ අලාභයට සාපේක්ෂව සියයට 58ක වැඩිවීමකි. සමස්ත හිඟය අවම කිරීම අරමුණු කරගත් පිරිවැය කළමනාකරණය කිරීමේ අඛණ්ඩ උත්සාහයන් සහ විවිධ මූල්‍ය ගැළපීම් හමුවේ වුවද, විකුණුම් කාර්යය සාධනයේ අඛණ්ඩ අභියෝග මෙම අලාභය ඉහළ යෑම තුළින් පෙන්නුම් කරයි.

## 8.13 වැවිලි

ජාතික ආර්ථිකයට රාජ්‍ය වැවිලි අංශයෙහි දායකත්වය ශක්තිමත් කිරීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවන ලදී. එම ආයතනවල හිමිකාරිත්වය යටතේ තිබූ වතුයායන්ගෙන් බහුතරයක් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 කට බදු ලෙස පවරා ඇති අතර, සෑම ප්‍රාදේශීය වැවිලි සමාගමකම ස්වර්ණමය කොටස් හිමිකාරිත්වය රජයට ලබා ගන්නා ලදී. ජාතික ආර්ථිකයට දායකත්වය ලබා දීම වෙනුවෙන් කුරුණෑගල වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම, ඇල්කඩුව වැවිලි සමාගම සහ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමෙහි හිමිකාරිත්වය රජය සතුව පවත්වා ගන්නා ලදී.

ප්‍රධාන වශයෙන් වර්ෂය පුරාම ඉහළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් පැවතීම හේතුවෙන්, සුදු මැස්සා රෝගයෙහි බලපෑම මත පොල්ගෙඩි නිෂ්පාදනයෙහි පහත වැටීමක් පෙන්නුම් කළද, කුරුණෑගල වැවිලි සමාගමෙහි සමස්ත ආදායම 2023 වර්ෂයේදී වාර්තා කළ රු. මිලියන 1,010 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු.මිලියන 1,284 ක් වූ අතර, එය සමස්ත ආදායමෙහි සියයට 27 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. කෙසේවෙතත්, 2023 වර්ෂයේ දී සියයට 44 ක් වූ දළ ලාභ අනුපාතිකය 2024 වර්ෂයේ දී සියයට 38 ක් දක්වා අඩුවී ඇති අතර, මූල්‍ය ආදායමද රු. මිලියන 101 ක් දක්වා සියයට 52 කින් අඩුවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කුරුණෑගල වැවිලි සමාගම 2023 වර්ෂයේ දී වාර්තා කළ ශුද්ධ ලාභය වන රු. මිලියන 534 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 415 ක ශුද්ධ ලාභයක් වාර්තා කරමින් සියයට 22 ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

2023 වර්ෂයේ දී රු. මිලියන 885 ක් වූ හලාවත වැවිලි සමාගමෙහි සමස්ත ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 962 ක් දක්වා සියයට 8.7 කින් වැඩිවී ඇති අතර, ප්‍රධාන වශයෙන් මෙයට හේතු වී ඇත්තේ 2023 වර්ෂයේ දී හෙක්ටයාරයකට ඵලදාව පොල් ගෙඩි 3,368 සිට 2024 වර්ෂයේ දී පොල් ගෙඩි 2,915 ක් දක්වා සියයට 13 ක අඩුවීමක් වාර්තා කළද, 2024 වර්ෂය පුරාම ඉහළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් පැවතීමයි. කෙසේ වෙතත්, 2024 වර්ෂයේ මූල්‍ය ආදායම රු.මිලියන 118 ක් දක්වා සියයට 50 කින් අඩුවීම හේතුවෙන් හලාවත වැවිලි සමාගම 2023 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 303 ක් වූ ශුද්ධ ලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 219 ක් දක්වා සියයට 28 කින් අඩුවී ඇත.

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී විකුණුම් පිරිවැය රු. මිලියන 481 ක් දක්වා සියයට 22.39 කින් වැඩිවීම

හේතුවෙන් ඇල්කඩුව වැවිලි සමාගම විසින් 2024 වර්ෂයේ දී වාර්තා කළ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 187 ක් වූ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 40.6 ක සැලකිය යුතු අඩුවීමකි. කෙසේවෙතත්, රසායනික පොහොර නිසි ලෙස යෙදීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී සමස්ත අමු දළු නිෂ්පාදනය සහ හෙක්ටයාරයකට ඵලදාවද (අමු දළු) ඉහළ ගොස් ඇත.

මූලික වශයෙන්, නිමි තේ වල ශුද්ධ විකුණුම් සාමාන්‍යය පහත වැටීම හේතුවෙන් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම නිමි තේ නිෂ්පාදනයෙන් උපයන ලද ආදායම 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 1,802 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 1,660 ක් වූ අතර, එය සියයට 7.8 ක අඩුවීමකි. ඒ අනුව, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම විසින් 2023 වර්ෂයේ දී වාර්තා කරන ලද රු. මිලියන 69 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 14 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ හෙක්ටයාර 4,200 ක භූමි ප්‍රමාණයකින් යුත් තේ වතු 15 ක් හා රබර් වත්තක්ද, ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ හෙක්ටයාර 3,572 ක භූමි ප්‍රමාණයකින් යුත් තේ වතු 15 ක් හා රබර් වතු 02 ක්ද කළමනාකරණය කරනු ලබයි. ප්‍රධානතම භෝගය ලෙස, ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි තේ නිෂ්පාදනය 2024 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 1,092 ක් ලෙස වැඩිවීමට හේතුවූයේ 2023 වර්ෂයේ දී කිලෝග්‍රෑම් 375 ක් වූ හෙක්ටයාරයකට ඵලදාව 2024 වර්ෂයේ දී කිලෝග්‍රෑම් 403 ක් දක්වා ඉහළ යාමය. 2023 වර්ෂයේ දී කිලෝග්‍රෑම් 452 ක් වූ හෙක්ටයාරයකට ඵලදාව 2024 වර්ෂයේ දී කිලෝග්‍රෑම් 439 ක් දක්වා පහත වැටීම හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි තේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,032 ක් දක්වා අඩු විය. 2022 වර්ෂය හැර පසුගිය කාලය පුරාම පාඩු ලැබීමේ ප්‍රවණතාවයක් අඛණ්ඩව පෙන්නුම් කළ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2024 වර්ෂයේ දී ද පිළිවෙලින් රු. මිලියන 223 ක හා රු. මිලියන 69 ක අලාභයක් වාර්තා කර ඇත.

අමාත්‍ය මණ්ඩල අනුමත කළ පරිදි, කෘෂිකාර්මික අපනයන ශක්තිමත් කිරීම සඳහා බෝග වගා කිරීම සහ පශු සම්පත් ගොවිපොළවල් ස්ථාපිත කිරීම උදෙසා භාවිතයට

**වගුව 8.31 | රාජ්‍ය වැවිලි අංශයන් හි මූල්‍ය තත්ත්වයන්**

| | | 2020 | 2021 | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| සී/ස කුරුණෑගල බැඩ්ලී සමාගම | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) | 11 | 15 | 15 | 13 | 10 |
| | රබර් නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්) | 107,088 | 91,545 | 95,572 | 85,350 | 108,868 |
| | හෙක්ටයාරයකට ඵලදාව - පොල් (ගෙඩි) | 3,284 | 5,142 | 5,163 | 4,244 | 3,388 |
| | - රබර් (කිලෝ ග්‍රෑම්) | 655 | 561 | 626 | 544 | 693 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 685 | 932 | 1,065 | 1,010 | 1,284 |
| | පොල් විකුණුම් | 583 | 798 | 875 | 811 | 800 |
| | රබර් විකුණුම් | 30 | 37 | 54 | 43 | 73 |
| | මුළු විකුණුම් පිරිවැය | 409 | 412 | 549 | 563 | 795 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | 214 | 468 | 511 | 534 | 415 |
| | ලාභාංශ | 50 | 75 | 110 | 115 | - |
| සී/ස හලාවත බැඩ්ලී සමාගම | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) | 12 | 15 | 15 | 12 | 10 |
| | හෙක්ටයාරයකට ඵලදාව - (ගෙඩි) | 3,854 | 4,454 | 4,499 | 3,368 | 2,915 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 673 | 1,050 | 975 | 885 | 962 |
| | පොල් විකුණුම් | 592 | 802 | 882 | 770 | 869 |
| | මුළු විකුණුම් පිරිවැය | 398 | 521 | 521 | 657 | 722 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | 283 | 511 | 514 | 303 | 219 |
| | ලාභාංශ | 50 | 80 | 125 | 90 | - |
| සී/ස ඇල්කඩුව බැඩ්ලී සමාගම | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | තේ දළු (මෙ.ටො) | 2,519 | 2,108 | 1,768 | 1,685 | 1,780 |
| | පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) | 0.83 | 1.06 | 1.36 | 1.13 | 1.00 |
| | රබර් නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්) | 104,231 | 124,590 | 109,666 | 94,112 | 100,138 |
| | හෙක්ටයාරයකට ඵලදාව | | | | | |
| | - තේ දළු (කිලෝ ග්‍රෑම්) | 609 | 595 | 505 | 492 | 530 |
| | - පොල් (ගෙඩි) | 3,116 | 3,695 | 4,768 | 3,970 | 3,200 |
| | - රබර් (කිලෝ ග්‍රෑම්) | 334 | 454 | 400 | 343 | 355 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 311 | 324 | 425 | 447 | 441 |
| | තේ විකුණුම් | 321 | 209 | 285 | 309 | 305 |
| | පොල් විකුණුම් | 39 | 52 | 62 | 70 | 53 |
| | රබර් විකුණුම් | 31 | 54 | 65 | 50 | 67 |
| | මුළු විකුණුම් පිරිවැය | 334 | 366 | 348 | 393 | 481 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | 36 | 318 | 553 | 315 | 187 |
| | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | – | – | - | – | – |

**වගුව 8.31 | රාජ්‍ය වැවිලි අංශයන් හි මූල්‍ය තත්ත්වයන් සම්බන්ධිතයි...**

| | | 2020 | 2021 | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | හෙක්ටයාරයකට ඵලදාව | 160 | 140 | 140 | 100 | 206 |
| | සාමාන්‍ය මිල (රු./ කි.ග්‍රෑම්) | 280 | 360 | 450 | 575 | 625 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 109 | 139 | 135 | 176 | 262 |
| | ශුද්ධ කෘෂි විකුණුම් | 109 | 139 | 135 | 176 | 225 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | -11 | -20 | 17 | -5 | 14 |
| | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | 60 | 65 | 78 | 80 | 92 |
| | - ප්‍රාග්ධන | 85 | 64 | 29 | 47 | 55 |
| ශ්‍රීමති බණ්ඩාරනායක මණ්ඩලය | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | තේ දළු නිෂ්පාදනය (මෙ.ටොන්) | 1,486 | 1,636 | 1,210 | 1,046 | 1,092 |
| | රබර් නිෂ්පාදනය (මෙ.ටොන්) | 444 | 404 | 364 | 315 | 330 |
| | හෙක්ටයාරයකට ඵලදාව - තේ දළු (කිලෝ ග්‍රෑම්) | 535 | 583 | 432 | 375 | 403 |
| | - රබර් (කිලෝ ග්‍රෑම්) | 826 | 793 | 697 | 595 | 653 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 1,134 | 1,480 | 1,371 | 1,239 | 1,416 |
| | නිෂ්පාදන පිරිවැය | 1,484 | 1,970 | 1,357 | 1,315 | 1,635 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | -350 | -490 | 20 | -156 | -223 |
| | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | - | 30 | - | 190 | 360 |
| ශ්‍රී ලංකා රාජ්‍ය බැඩිලි සංස්ථාව | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | තේ දළු නිෂ්පාදනය (මෙ.ටොන්) | 1,742 | 1,803 | 1,436 | 1,135 | 1,032 |
| | රබර් නිෂ්පාදනය (මෙ.ටොන්) | 29 | 19 | 15 | 3 | 5 |
| | හෙක්ටයාරයකට ඵලදාව - තේ දළු (කිලෝ ග්‍රෑම්) | 601 | 634 | 536 | 452 | 439 |
| | - රබර් (කිලෝ ග්‍රෑම්) | 474 | 272 | 363 | 162 | 272 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 767 | 845 | 1,070 | 1,012 | 991 |
| | නිෂ්පාදන පිරිවැය | 865 | 1,028 | 935 | 915 | 969 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | -149 | -232 | 19 | -92 | -69 |
| | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | - | - | - | 64 | 170 |
| | - ප්‍රාග්ධන | - | 14 | 178 | - | - |
| ශ්‍රී ලංකා බෲක්බෝන්ඩ්‍රියාන තේ සංස්ථාගත සමාගම | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | නිමි තේ නිෂ්පාදනය (මෙ.ටොන්) | 1,716 | 1,508 | 1,548 | 1,302 | 1,294 |
| | විකුණුම් ප්‍රමාණය (මෙ.ටොන්) | 1,704 | 1,512 | 1,539 | 1,331 | 1,231 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 1,175 | 1,041 | 2,635 | 1,802 | 1,660 |
| | නිෂ්පාදන පිරිවැය | 1,141 | 1,036 | 2,285 | 1,747 | 1,661 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | -15 | -3 | 346 | 69 | -14 |
| | ලාභාංශ | - | - | – | 30 | – |
| සම්බාහිර ලංකා සීනි සමාගම | **මෙහෙයුම් කාර්ය සාධනය** | | | | | |
| | සීනි නිෂ්පාදනය (මෙ. ටොන්) | 39,696 | 48,177 | 36,738 | 41,863 | 39,719 |
| | ස්ප්‍රිතු නිෂ්පාදනය (ලීටර් '000) | 8,819 | 13,037 | 11,790 | 7,059 | 5,145 |
| | **මූල්‍ය කාර්ය සාධනය (රු. මිලියන)** | | | | | |
| | මුළු ආදායම | 8,978 | 12,284 | 19,287 | 16,095 | 10,858 |
| | සීනි විකුණුම් | 3,882 | 5,994 | 9,326 | 10,025 | 7,001 |
| | ස්ප්‍රිතු විකුණුම් | 4,739 | 6,272 | 9,948 | 5,612 | 3,813 |
| | බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) | 937 | 1,250 | 6,045 | 2,835 | -1,893 |
| | ලාභාංශ | - | - | – | 1,597 | – |

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන්
(අ) තාවකාලික

නොගත් ඌණ උපයෝජිත ඉඩම් හඳුනාගැනීම වෙනුවෙන් විද්වත් කමිටුවක් පත් කර ඇත. එපමණක් නොව, වතු කම්කරුවන්ගේ ජීවනෝපායයන් ඉහළ නැංවීමට සහ වතු ශ්‍රම බලකාය අඩුවීමේ අභියෝගයට මුහුණ දීම සඳහා තීරණාත්මක පියවරක් ලෙස වතු අංශයේ සේවකයින් සඳහා රු. 1,350/= ක දෛනික අවම වැටුපක් ලබා දීමට තීරණය කරන ලදී.

## 8.14. සෞඛ්‍ය

### 8.14.1 රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෛද්‍ය සැපයුම් අංශය වෙත සාමාන්‍ය භාවිතයට ගනු ලබන ඖෂධ වර්ග 620 ක් පමණ සැපයීම සඳහා වන ප්‍රධාන ආනයනකරු ලෙස කටයුතු කරයි.

වගුව : 8.32 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **63,122** | **80,300** | **50,919** | **74,695** | **62,087** |
| වෛද්‍ය සැපයුම් අංශය | 54,324 | 70,853 | 40,973 | 62,948 | 51,018 |
| ඔසුසල | 8,798 | 9,447 | 9,946 | 11,747 | 11,069 |
| **වියදම්** | **60,173** | **76,616** | **50,252** | **70,757** | **58,706** |
| මෙහෙයුම් | 57,457 | 73,491 | 46,214 | 67,550 | 55,138 |
| පාලන | 1,754 | 1,967 | 2,059 | 2,480 | 2,890 |
| වෙනත් | 962 | 1,158 | 1,979 | 727 | 678 |
| **වෙනත් ආදායම්** | **287** | **89** | **107** | **612** | **844** |
| **ශුද්ධ මූල්‍ය ආදායම්** | **-690** | **-573** | **-3,058** | **-3,282** | **-1,751** |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **2,546** | **3,199** | **-2,285** | **1,268** | **2,474** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| ප්‍රසම්පාදන ගණන | 7,269 | 5,336 | 3,741 | 3,079 | 2,686 |
| ඔසුසල් ගණන | 45 | 50 | 52 | 53 | 64 |
| බෙදාහරින්නන් ගණන | 53 | 51 | 51 | 51 | 57 |
| වරලත් නියෝජිතයන් ගණන | 4 | 5 | 5 | 11 | 11 |
| බලයලත් ඔසුසල් ගණන | 104 | 94 | 111 | 112 | 127 |

මූලාශ්‍රය: රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
(අ)තාවකාලික

එය රජයේ රෝහල් වෙත ගුණාත්මකභාවයෙන් යුතු ඖෂධ සහ සෞඛ්‍ය සත්කාර අයිතමයන් නියමිත වේලාවට හා අඛණ්ඩව සපයන බවට තහවුරු කරනු ලබයි. එසේම, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඔසුසල අලෙවිසැල් 64 ක්, බලයලත් ඔසුසැල් 127 ක්, බලයලත් සිල්ලර වෙළෙඳසල් 11 ක් සහ බෙදාහරින්නන් 57 ක් හරහා විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු දිවයින පුරා සිදු කරනු ලබයි.

2023 වර්ෂය ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී, වෛද්‍ය සැපයුම් අංශයට සිදුකළ විකුණුම් සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ විවෘත වෙළෙඳපොළ කටයුතුවල විකුණුම් පිළිවෙලින් සියයට 19 කින් සහ සියයට 6 කින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි සමස්ත ආදායම 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 74,695 සිට 2024 වර්ෂයේ දී රු. මිලියන 62,087 ක් දක්වා සියයට 17 කින් අඩු වී ඇත. රුපියල අතිප්‍රමාණය වීමට සමගාමීව මිල පහළ යාම සහ වෛද්‍ය සැපයුම් අංශයට සිදුකළ ඖෂධ සැපයුම්වල පහළ යාම සංස්ථාවේ ආදායම පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

ඊට අනුරූපව, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි 2023 වර්ෂයේ දී රු. මිලියන 67,550 ක් වූ මුළු විකුණුම් පිරිවැය, 2024 වර්ෂයේ දී රු. මිලියන 55,138 ක් දක්වා සියයට 18 කින් පහළ යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ ලාභ ආන්තිකය 2023 වර්ෂයේ දී පැවති සියයට 9.6 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී සියයට 11.2 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය වී ඇත. දේශීය පොළී අනුපාතවල පහළ යාම පෙන්නුම් කරමින් 2023 වර්ෂයේ දී රු. මිලියන 3,290 ක් වූ මූල්‍ය පිරිවැය 2024 වර්ෂයේ දී රු. මිලියන 1,759 ක් දක්වා සියයට 47 කින් සැලකිය යුතු ලෙස පහළ යන ලදී. මෙම වාසි සහගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2023 වර්ෂයේ දී රු. මිලියන 1,268 ක් වූ බදු පෙර ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී බදු පෙර ලාභය රු. මිලියන 2,474 විය.

2024 වර්ෂය අවසන් වන විට වෛද්‍ය සැපයුම් අංශයෙන් සංස්ථාවට ලැබිය යුතු මුළු හිඟ මුදල රු. මිලියන 38,318 ක් වූ අතර, එයින් රු. මිලියන 24,954 ක් සහ රු. මිලියන 18,310 ක් පිළිවෙලින් වසර 5 කට වඩා වැඩි සහ වසර 3-4 අතර කාල පරාසයක් තුළ හිඟව පැවතුණි. මෙම දිගුකාලීන ලැබිය යුතු ශේෂයන් සංස්ථාවට සැලකිය යුතු ලෙස මුදල් ප්‍රවාහ අභියෝග ඇති කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සිය ද්‍රවශීලතා ගැටළු කළමනාකරණය කිරීම සඳහා කෙටිකාලීන මූල්‍යකරණ ක්‍රම මත යැපීමට සිදුවූ බැවින්, පසුගිය වසර කිහිපය තුළ සැලකිය යුතු පොළී වියදමක් දරා ඇති අතර, මෙම තත්ත්වය සංස්ථාවේ මූල්‍ය තත්ත්වයට අහිතකර බලපෑම් ඇති කර තිබේ. මෙම මුදල් ප්‍රවාහ දුෂ්කරතා මධ්‍යයේ වුවද, 2024 වර්ෂය තුළදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයට අයබදු ලෙස රු. මිලියන 232 ක් ලබා දී ඇත.

ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව සංස්ථාව තුළ තිරසාර මෙහෙයුම් විශිෂ්ටත්වයක් ළඟා කර ගැනීම සහ මූල්‍ය යහපාලනය ශක්තිමත් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ ආයතනික සම්පත් සැලසුම්කරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මුල පුරා ඇත. ඊට අමතරව, තත්ත්ව සහතික රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීමට සහ සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනවල මිල සහ ගුණාත්මක පැතිකඩ කෙරෙහි අවධානය යොමු කරමින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සැලසුම් කර ඇත.

## 8.14.2 රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව බ්‍රිතාන්‍ය සහ ඇමෙරිකා එක්සත් ජනපදය අනුගමනය කරනු ලබන ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව ඖෂධ නිෂ්පාදන 99 ක් සඳහා නිෂ්පාදන සූත්‍ර වැඩි දියුණු කර ඇත. පෙනිසිලීන් නිෂ්පාදන ඒකකයේ නවීකරණ කටයුතු සඳහා එම ඒකකයේ නිෂ්පාදන කටයුතු 2024 වර්ෂය තුළදී තාවකාලිකව වසා දැමුවද, 2023

**වගුව 8.33 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මූල්‍ය තත්ත්වය**

රු. මිලියන

| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|
| **ආදායම** | **7,648** | **8,539** | **16,620** | **29,332** | **28,202** |
| වෛද්‍ය සැපයුම් අංශය | 6,639 | 6,963 | 13,928 | 26,696 | 26,288 |
| ඔසුසල | 7 | 94 | 108 | - | - |
| වෙනත් | 1,002 | 1,482 | 2,584 | 2,636 | 1,914 |
| **මෙහෙයුම් වියදම්** | **6,588** | **7,465** | **15,383** | **27,737** | **25,713** |
| විකුණුම් පිරිවැය | 6,281 | 7,102 | 14,559 | 26,382 | 25,200 |
| පාලන වියදම් | 247 | 244 | 336 | 396 | 418 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 49 | 109 | 473 | 937 | 82 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 11 | 10 | 19 | 22 | 13 |
| **වෙනත් ආදායම්** | **7** | **14** | **16** | **14** | **12** |
| ශුද්ධ මූල්‍ය ආදායම් | 94 | 147 | 333 | 564 | 580 |
| **බදු පෙර ලාභය / (අලාභය)** | **1,161** | **1,235** | **1,586** | **2,173** | **3,081** |
| **මූලික කාර්ය සාධන දර්ශක** | | | | | |
| නිෂ්පාදන ප්‍රමාණය - පෙති/කරල් (මිලියන) | 3,015 | 3,043 | 3,302 | 3,559 | 3,175 |

මූලාශ්‍රය: රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
(අ)තාවකාලික

වර්ෂයේ දී නිෂ්පාදනය කළ පෙති සහ කරල් මිලියන 3,559 ට සාපේක්ෂව පෙති සහ කරල් මිලියන 3,175 ක සමස්ත නිෂ්පාදනයක් 2024 වර්ෂයේදී වාර්තා කිරීමට සංස්ථාව සමත් වී ඇත.

තවද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව කොටස්කාර ගිවිසුම් මගින් ඇති කර ගත් බද්ධ ව්‍යාපාර සමාගම් හයක් සමඟ එක්ව ඖෂධ නිෂ්පාදන සැපයීම සිදු කරයි. රජයේ රෝහල් හා දේශීය වෙළෙඳපොළ වෙත දැරිය හැකි මිලකට ඖෂධ සැපයීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ එහි දේශීය නිෂ්පාදන හවුල්කරුවන් විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

2023 වර්ෂයේ දී රු. මිලියන 29,332 ක් වූ සංස්ථාවේ මුළු ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 28,202 ක් දක්වා සියයට 4 කින් සුළු වශයෙන් පහළ ගොස් ඇත. 2024 වර්ෂයේ දී රුපියල අතිප්‍රමාණය වීමට ප්‍රතිචාර ලෙස සිදුවූ මිල සංශෝධනයන් මෙම පසුබෑමට ප්‍රධාන ලෙස බලපා ඇත. 2024 වර්ෂයේ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මුළු ආදායමට ප්‍රධාන වශයෙන් රු. මිලියන 26,288 ක් වූ වෛද්‍ය සැපයුම් අංශයට සිදුකළ විකුණුම් දායක වී ඇති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 93 ක් විය. විකුණුම් පිරිවැය සහ විකුණුම් හා බෙදාහැරීමේ වියදම් හි පහළ යාම හේතුවෙන් මෙහෙයුම් වියදම 2023 වර්ෂයේ දී පැවති රු. මිලියන 27,737 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 25,712 ක් දක්වා සියයට 7 කින් පහළ ගොස් ඇත. 2023 වර්ෂයේ දී වෛද්‍ය සැපයුම් අංශයට සිදුකළ සැපයුම්වල ප්‍රමාදයන් මත දඩ මුදල් ගෙවීම සඳහා වූ ප්‍රතිපාදන 2024 වර්ෂයේ දී ඉවත් කිරීම 2023 වර්ෂයේ දී රු. මිලියන 937 ක් වූ විකුණුම් හා බෙදාහැරීමේ වියදම 2024 වර්ෂයේ දී රු. මිලියන 83 ක් දක්වා පහළ යාමට හේතු විය. වර්ෂය තුළ රුපියලේ අගය අතිප්‍රමාණය වීමේ වාසිය හේතුවෙන් ශුද්ධ මූල්‍ය ආදායම 2023 වර්ෂයේ වූ රු. මිලියන 564 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 580 ක් දක්වා සියයට 3 කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.

සමස්තයක් ලෙස, 2023 වර්ෂයේ දී රු. මිලියන 2,173 ක් වූ බදු පෙර ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 3,081 ක් දක්වා සියයට 42 ක වර්ධනයක් සහිතව බදු පෙර ලාභය වාර්තා කිරීමට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමත් විය. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයට රු. මිලියන 300 ක අයබදු 2024 වර්ෂයේ දී ලබා දී ඇත. අනාගත අවස්ථාවන්ට මුහුණ දිය හැකි පරිදි ශක්තිමත් ස්ථාවර මූල්‍ය තත්ත්වයක් පවත්වාගෙන යාමට සංස්ථාව සමත්ව ඇත.

ලෝක බැංකු අරමුදල් මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පෙනිසිලින් නිෂ්පාදන ඒකකයේ නවීකරණයන් සාර්ථකව අවසන් කිරීමට සමත් වූ අතර, උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය කිරීමට අදාළ ව්‍යුහගත රාමුවක් සපයන අංග සම්පූර්ණ තත්ත්ව පාලන කළමනාකරණ පද්ධතියක් දියත් කරන ලදී. නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට සහ වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් සහිත සහ මිල අධික ඖෂධ ඉලක්ක කර ගනිමින් ඖෂධ නිමවුම් වර්ග පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් ලෝටස් ෆාමා ව්‍යාපෘතිය නමින් නව නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට පියවර ගෙන ඇත. මෙමගින් ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලතාවය ආනයනික ඖෂධ මත වන ඉහළ යැපීම අවම කිරීමට මෙම උපායමාර්ගික මුල පිරීම් මගින් අපේක්ෂා කෙරේ.

**වගුව 8.34 | අනෙකුත් රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය**

| විස්තරය | මූලික කාර්යයන් | කාර්යසාධනය | සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|---|
| **රක්ෂණය** | | | |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | අපනයනකරුවන් වෙත අපනයන ණය රක්ෂණාවරණයන් හා ණය ඇපකර සේවාවන් සපයමින් අපනයන ක්ෂේත්‍රය වෙත උපකාරක සේවා සැපයීම.. | 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 433.8 ට සාපේක්ෂව සමස්ත මෙහෙයුම් ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 604.2 ක් දක්වා සියයට 39 කින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ආයෝජන ආදායමේ සැලකිය යුතු අඩුවීම හේතුවෙන් 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 1,055.6 ක් හා සසඳනවිට බදු පසු ලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 852 ක් දක්වා සියයට 19 කින් පහත වැටී ඇත. | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සිය මූල්‍ය තත්ත්වය ශක්තිමත් කර ගනිමින් දේශීය අපනයන කර්මාන්තය සඳහා සහය වීමට නව උපායමාර්ගික මුලපිරීම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරයි. | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගොවි සහ ධීවර රක්ෂණ යෝජනා ක්‍රම යටතේ ප්‍රධාන වශයෙන් 2024 වර්ෂයේ දී සිදුකළ වන්දි ගෙවීම් රු. මිලියන 1,780.7 ක් දක්වා සියයට 16.7 කින් පහළයාම හේතුවෙන්, 2023 වර්ෂයේ රු. මිලියන 3,884.5 ක් වූ ශුද්ධ හිඟය හා සසඳනවිට 2024 වර්ෂයේ ශුද්ධ හිඟය රු. මිලියන 3,182.2 ක් දක්වා සියයට 18 කින් අඩු වී ඇත. | රක්ෂණ වාරික සහ රක්ෂණ ගෙවීම්වල ගලා ඒම සහ පිටතට ගලා යාමේ නොගැළපීම හේතුවෙන් ජාතික අයවැය මත අධික ලෙස යැපීම. |
| **පුනර්ජනනීය නොවන සම්පත්** | | | |
| ලංකා ඛනිජ වැලි සමාගම | රළු ඛනිජ වැලි කැණීම, සැකසීම සහ විකිණීම. | රළු ඛනිජ අපනයනය අඩුවීම හේතුවෙන් 2023 වර්ෂයේ දී රු. මිලියන 6,219 ක් වූ ලංකා ඛනිජ වැලි සමාගමෙහි ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 1,142 ක් දක්වා සැලකිය යුතු ලෙස සියයට 82 කින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 4,051 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව ලංකා ඛනිජ වැලි සමාගම 2024 වර්ෂයේ දී රු. මිලියන 77 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. | ලංකා ඛනිජ වැලි සමාගම විසින් මිලකරණය සහ විකුණුම් ආශ්‍රිත ගැටළු විසඳා ගත යුතු අතර, ජාත්‍යන්තර වෙළෙඳපොළවල ඉල්ලුම් උපයෝගී කර ගනිමින් රටට වැඩි ප්‍රතිලාභ සහ විදේශ විනිමය ලබා ගැනීම සඳහා අමුද්‍රව්‍ය ආකාරයෙන් අපනයනය කිරීමට වඩා අගය එකතු කිරීම සඳහා නව අපනයන වෙළෙඳපොළවල් සහ යාන්ත්‍රණ සොයා බැලිය යුතුය. |
| ලංකා පොස්පේට් සමාගම | තේ, රබර් සහ පොල් වැනි බහු වාර්ෂික කෘෂිකාර්මික භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරන රොක් පොස්පේට් කැණීම, සැකසීම සහ විකිණීම. | 2023/24 වර්ෂයේ දී රු. මිලියන 1,203 ක් වූ ලංකා පොස්පේට් සමාගමෙහි ආදායම 2024/25 වර්ෂයේ දී රු. මිලියන 1,317 ක් දක්වා වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා පොස්පේට් සමාගමෙහි ශුද්ධ ලාභය 2023/24 වර්ෂයේ දී වූ රු. මිලියන 363 ට සාපේක්ෂව 2024/25 වර්ෂයේ දී රු. මිලියන 462 ක් දක්වා සියයට 27 කින් වැඩි වී ඇත. | දේශීය හා අපනයන වෙළෙඳපොළ අත්පත් කර ගැනීම සඳහා ලංකා පොස්පේට් සමාගම තමාගේ ආයෝජන හරහා හෝ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) හරහා නව නිෂ්පාදන සංවර්ධනය කිරීමේ හැකියාවන් පිළිබඳ ගවේෂණය කළ යුතුය. |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | කාර්මික අමුද්‍රව්‍ය ලෙස ග්‍රැෆයිට් කැණීම, සැකසීම සහ විකිණීම. | 2024/25 වර්ෂයේ දී කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමෙහි ආදායම 2023/24 වර්ෂයේ දී වූ රු. මිලියන 141.7 ට සාපේක්ෂව රු. මිලියන 155 ක් දක්වා සියයට 9 කින් වැඩි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමෙහි ශුද්ධ ලාභය 2023/24 වර්ෂයේ දී වූ රු. මිලියන 28 ට සාපේක්ෂව 2024/25 වර්ෂයේ දී රු. මිලියන 31 ක් දක්වා වැඩි වී ඇත. | කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) හරහා අගය එකතු කළ මිනිරන් නිෂ්පාදන සංවර්ධනය කළ යුතු අතර, එහි විකුණුම් ප්‍රමාණය වැඩි කිරීමට නව වෙළෙඳපොළ ගවේෂණය සඳහා අවධානය යොමු කළ යුතුය. |
| **සෞඛ්‍ය** | | | |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ මූලික අරමුණු වන්නේ ගුණාත්මක ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා බෙදාහැරීමයි. සංස්ථාව විසින් ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු ඖෂධ වර්ග 179ක් නිෂ්පාදනය කර රජයේ ආයුර්වේද රෝහල්,ආයුර්වේද වෛද්‍යවරුන් සහ පෞද්ගලික අංශය වෙත සපයනු ලබයි. | රාජ්‍ය අංශයේ ආයතනවලට සිදුකළ සැපයීම් ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2023 වර්ෂයේ රු. මිලියන 1,215 ක් වූ ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 1,520 ක් දක්වා සියයට 25 කින් ඉහළ ගොස් ඇත. කෙසේවුවද, ඉහළ අමුද්‍රව්‍ය පිරිවැය හේතුවෙන් 2023 වර්ෂයේ දී රු. මිලියන 756 ක් වූ විකුණුම් පිරිවැය 2024 වර්ෂයේ දී රු. මිලියන 1,079 ක් දක්වා සියයට 43 කින් ඉහළ ගොස් ඇත. ප්‍රධාන වශයෙන් නව සේවක බඳවා ගැනීම හේතුවෙන් 2023 වර්ෂයේ දී රු. මිලියන 177 ක් වූ පරිපාලන වියදම 2024 වර්ෂයේ දී රු. මිලියන 211 ක් දක්වා සියයට 19 කින් වැඩිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ දී වාර්තා වූ සංස්ථාවේ රු. මිලියන 218 ක් වූ බදු පෙර ලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 170 ක් දක්වා පහත ගොස් ඇත. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව තම මෙහෙයුම් කාර්යසාධනය ඉහළ නංවා ගැනීම සඳහා නව යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමත්, සේවක කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමත්, සංස්ථාවේ ඔසු උයන්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමත්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීමත්, නව ව්‍යාපාරික ප්‍රවර්ධන උපාය මාර්ග සිදුකිරීමත් තුළින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ කොටස වර්ධනය කරගැනීමට කටයුතු කළ යුතුය. |

**වගුව 8.34 | අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය සම්බන්ධිතයි...**

| විස්තරය | මූලික කාර්යයන් | කාර්යසාධනය | සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල | ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල රට තුළ ගාස්තු අය කර ප්‍රතිකාර ලබාදෙන රජය සතු රෝහලක් ලෙස පරිපූර්ණ මට්ටමේ සායනික හා අතුරු වෛද්‍ය සේවා සපයයි. තවද, ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධිධාරී වෛද්‍ය සිසුන් සහ හෙදියන් සඳහා පුහුණු පහසුකම් ලබාදෙන කේන්ද්‍රයක් වශයෙන් ද ක්‍රියාකරයි. | 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 4,025 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රෝහල් සත්කාර ආදායම රු. මිලියන 4,502 ක් දක්වා සියයට 14 කින් වර්ධනය වී ඇත.<br>2024 වර්ෂයේ දී රු. මිලියන 2,928 ක පුනරාවර්තන අයවැය ප්‍රතිපාදන දායකත්වයන් සමඟ 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 304 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 552 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. | ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල පෞද්ගලික අංශය සමඟ තරඟ කළ හැකි පරිදි නවීන සෞඛ්‍ය සේවාවක් ලබාදිය හැකි යටිතල පහසුකම් ඉහළ නංවාගැනීමටත්, පුළුල් අලෙවිකරණ උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීමටත්, රෝහල් තොරතුරු කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමටත්, වැඩි විශේෂඥ වෛද්‍ය වෘත්තිකයන් සංඛ්‍යාවක් ආකර්ශණය කර ගැනීමටත්, අන්තර්ජාතික මට්ටමේ ගුණාත්මක රෝගී සත්කාර සේවාවක් ලබාදීමටත් කටයුතු කළ යුතුය. |
| **මාධ්‍ය** | | | |
| ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, ශ්‍රී ලංකාවේ පුරෝගාමී රූපවාහිනී නාලිකාව වන අතර, ස්වාධීන රූපවාහිනී සේවය, වසන්තම් ටීවී, අයිටීඑන් එෆ්එම්, වසන්තම් එෆ්එම් හරහා ප්‍රවෘත්ති, ටෙලිනාට්‍ය, වාර්තා වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන්, ළමා විනෝදාත්මක වැඩසටහන්, යථාර්ථවාදී (රියැලිටි) වැඩසටහන්, ආගමික වැඩසටහන් ඇතුළු විවිධ වැඩසටහන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් නිෂ්පාදනය කර විකාශය කරනු ලබයි. | ගුවන් කාලය විකිණීමෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් 2023 වර්ෂයේ දී රු. මිලියන 1,466 ක් වූ ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 1,756 ක් දක්වා සියයට 20 කින් ඉහළ ගොස් ඇත.<br>2024 වර්ෂය තුළ සමාගමේ ආදායමේ වර්ධනය සහ අලෙවිකරණ ව්‍යදම සියයට 36 කින් පහළ යාම හේතුවෙන් 2023 වර්ෂයේ දී වාර්තා වූ රු. මිලියන 226 ක් වූ මෙහෙයුම් අලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 52 ක මෙහෙයුම් ලාභයක් වාර්තාකර ඇත. ශුද්ධ මූල්‍ය ආදායම 2023 වර්ෂයේ දී රු. මිලියන 71 ක් වූ අතර, එය වෙළෙඳපොළේ පොළී අනුපාතවල පහළ යාම හේතුවෙන් 2024 වර්ෂයේ දී රු. මිලියන 13 ක් දක්වා අඩුවී ඇත.<br>මෙහි ප්‍රතිඵලයක් ලෙස, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 205 ක අලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 3 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. එසේම, ස්වේච්ඡා විශ්‍රාම වන්දි ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහ සමාගමේ යටිතල පහසුකම් නවීකරණය කිරීමට රු. මිලියන 110 ක හිමිකම් ප්‍රාග්ධන දායකත්වයක් මහා භාණ්ඩාගාරය විසින් 2024 වර්ෂය තුළදී ලබාදී ඇත. | ඉහළ ප්‍රේක්ෂක පිරිසක් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩසටහන්වල ගුණාත්වය ඉහළ නැංවීමටත්, මෙහෙයුම් විශිෂ්ඨතාවය වෙනුවෙන් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා වීම සඳහා ශ්‍රේණිගත කිරීම් වර්ධනය කර ගැනීමට සහ සමාජ මාධ්‍ය ජාලාවල නිරත වීම් වැඩි කිරීම් සඳහා ආයතනයේ ව්‍යාපාරික සැලසුම මගින් හඳුනාගත් උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | කාලීන තොරතුරු, අධ්‍යාපනික සහ විනෝදාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර රූපවාහිනී, වැනල් අයි සහ නේත්‍රා ටීවී යන නාලිකා ඔස්සේ විකාශය කරනු ලබයි. | 2023 වර්ෂයේ දී වාර්තා වූ රු. මිලියන 1,472ක් වූ සංස්ථාවේ ආදායම, 2024 වර්ෂයේ දී රු. මිලියන 1,542 ක් දක්වා සියයට 5 කින් සුළු වශයෙන් වර්ධනය වී ඇත. 2023 වර්ෂයේ දී රු. මිලියන 1,779 ක් වූ සමස්ත මෙහෙයුම් ව්‍යදම 2024 වර්ෂයේ දී රු. මිලියන 1,763 ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත.<br>එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ දී වාර්තා වූ රු. මිලියන 360 ක ශුද්ධ අලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 247 ක් දක්වා සියයට 30 කින් අඩු වී ඇත.<br>2024 වර්ෂය තුළදී සංස්ථාවේ යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහාත්, සේවකයන්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීම සඳහාත්, රු. මිලියන 240 ක අයවැය ප්‍රතිපාදන හිමිකම් ප්‍රාග්ධනය යටතේ රූපවාහිනී සංස්ථාව වෙත මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත. | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් සිය වැඩසටහන්වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමටත්, ආවරණ කලාපය පුළුල් කිරීමත්, නවීන තාක්ෂණික යටිතල පහසුකම් වර්ධනය කිරීමත්, අදාළ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සහ අවම වශයෙන් ලාභ සමවිඡේද ලක්ෂ්‍ය කරා හෝ ළඟාවීමට පියවර ගත යුතු වේ. |

**වගුව 8.34 | අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය සම්බන්ධිතයි...**

| විස්තරය | මූලික කාර්යයන් | කාර්යසාධනය | සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | ශ්‍රී ලංකාවේ පැරණිතම ගුවන් විදුලි මධ්‍යස්ථානය ලෙස ජාතික නාලිකා 06 ක් (සිංහල ස්වදේශීය සේවය, දෙමළ ස්වදේශීය සේවය, වෙළෙඳ සේවය, සිටි එෆ්. එම්, තෙන්බුල් සේවය, ඉංග්‍රීසි සේවය) හා ප්‍රාදේශීය නාලිකා 6ක් (රජරට එෆ්.එම්., කඳුරට එෆ්.එම්., රුහුණු එෆ්.එම්., පිරෙයි එෆ්.එම්., යාල් එෆ්.එම්. වයඹ සේවය) සහ එක් ප්‍රජා ගුවන් විදුලි සේවාවක් (දඹාන) ඔස්සේ ලංකාවේ ප්‍රමුඛතම ගුවන් විදුලි විකාශන ජාලය ලෙසට සේවා සැපයීම අරමුණු කොට ගනිමින් විකාශන කටයුතු වල නිරත වී සිටී. | 2023 වර්ෂයේ දී පැවති රු. මිලියන 1,057 ක ආදායම 2024 වර්ෂයේ දී රු. මිලියන 997 ක් දක්වා සියයට 6 කින් සුළු වශයෙන් අඩුවී ඇත.<br>2023 වර්ෂයේ ක්‍රියාත්මක වූ සේවක ස්වේච්ඡා විශ්‍රාම වන්දි ක්‍රමය හේතුවෙන් මෙහෙයුම් වියදම්ද 2023 වර්ෂයේ දී වාර්තා වූ රු. මිලියන 1,224 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 1,146 ක් දක්වා සියයට 6 කින් අඩුවී ඇත.<br>2023 වර්ෂයේ දී වාර්තාවූ රු. මිලියන 528 ක ශුද්ධ අලාභය හා සැසඳීමේදී ශුද්ධ අලාභය 2024 වර්ෂයේ දී රු. මිලියන 158 ක් දක්වා අඩුවී ඇත.<br>සංස්ථාවේ පුනරාවර්තන වියදම් දැරීම සඳහා 2024 වර්ෂය තුළදී රු. මිලියන 200 ක හිමිකම් ප්‍රාග්ධනය අයවැය ප්‍රතිපාදන ලෙස සංස්ථාව වෙත මහා භාණ්ඩාගාරය විසින් ලබාදී ඇත. | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් අවම වශයෙන් ලාභ සමව්‍යේද ලක්ෂ්‍ය කරා හෝ ළඟාවීමට සිය වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමටත්, ආවරණ කලාපය වර්ධනය කිරීමටත්, මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් උපායමාර්ග ක්‍රියාත්මක කළ යුතුයි. |
| **අලෙවිකරණය සහ බෙදාහැරීම** | | | |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | ලක්සල වෙළඳ නාමය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය දිවයින පුරා අලෙවිසැල් 10 කින් යුත් රටේ විශාලතම සම්ප්‍රදායික සිහිවටන සහ ත්‍යාග සඳහා වන සිල්ලර වෙළෙඳාම් දාමය වේ. එය ශ්‍රී ලංකාවේ අනර්ඝ සංස්කෘතික උරුමය ලෝකයට පිළිබිඹු කරන අතරම, දේශීය ශිල්පීන්ගේ ජීවනෝපායයන් ඉහළ නැංවීම සඳහා ද දායක වේ. දේශීයව නිෂ්පාදනය කරන ලද අත්කම් නිෂ්පාදන සඳහා කැපවූ අලෙවිකරණ මාධ්‍යයක් ලෙස සේවය කිරීමෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය දේශීය ශිල්පීන්ට සහාය වන අතර, ඔවුන්ට තිරසර ආදායම් මාර්ගයක් ද සපයයි. ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් සංචාරක කර්මාන්තය සමඟ සමීපව සම්බන්ධ වී ඇති හෙයින් එය ප්‍රධාන වශයෙන් විදේශීය සංචාරකයින් මගින් සිය විකුණුම් ආදායමෙන් සැළකිය යුතු කොටසක් උපයා ගනී. | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙහි ආදායම 2023 වර්ෂයේ දී වූ රු. මිලියන 638 සිට 2024 වර්ෂයේ දී රු. මිලියන 905 ක් දක්වා සියයට 42 කින් ඉහළ ගොස් ඇති අතර, එය දිගු කාලයක් තිස්සේ පැවති මන්දගාමී කාර්ය සාධනයකින් පසු සංචාරක ව්‍යාපාරයට අදාළ ක්‍රියාකාරකම්වල ක්‍රමානුකූල පුනර්ජීවනය පිළිබිඹු කරයි. මේ අතර, මණ්ඩලය 2024 වර්ෂයේ දී රු. මිලියන 75 ක අලාභයක් වාර්තා කළ අතර, එය 2023 වර්ෂයේ දී වාර්තා වූ රු. මිලියන 65 ක ලාභයට සාපේක්ෂව සියයට 142 ක සැළකිය යුතු පහත වැටීමකි. දේශීයව නිෂ්පාදනය කරන ලද අත්කම් භාණ්ඩ තරහකාරී මිල ගණන් යටතේ සැපයීමේ උත්සාහයක් ලෙස පාරිභෝගිකයන්ගෙන් අය නොකළ වැට් බදු 2024 වර්ෂයේ විකුණුම් ආදායම මත ගණනය කිරීම මෙම අලාභය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. | ගෝලීය වෙළෙඳපොළ වෙත සිය ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීමේ තරහකාරී වාසියක් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සතු අතර, ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සහ විශේෂ උත්සව සඳහා සහභාගී වීමට අවස්ථාවන් මේ තුළින් ඔවුනට ලැබේ. මෙම විභවයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා, ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වීමට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය නව්‍ය ප්‍රවේශයක් අනුගමනය කළ යුතු වේ. එහි සුවිශේෂ සහ විවිධාකාර නිෂ්පාදිත කළඹ සමගින් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට ගෝලීය වෙළෙඳපොළ තුළ තම නිෂ්පාදිත වෙන්කර හඳුන්වා දීමට සහ ශක්තිමත් පැවැත්මක් ස්ථාපිත කිරීමට ඉතා හොඳ අවස්ථාවක් පවතී. |
| රාජ්‍ය දැව සංස්ථාව | වනාන්තරවලින් දැව කපා ඉවත් කිරීම, දැව මිලදී ගැනීම සහ ඒවා වටිනාකමින් යුතු නිෂ්පාදන බවට පත් කිරීම. දැව කඳන්, ඉරු දැව සහ නිමි භාණ්ඩ විකිණීම, ප්‍රති වන රෝපණය | 2023 වර්ෂයේ වූ රු.මිලියන 4,202 හා සැසඳීමේදී ආදායම 2024 වර්ෂයේදී රු.මිලියන 4,114 ක් දක්වා ආන්තිකව අඩු වී ඇත. කෙසේ වෙතත්, 2023 වර්ෂයේ දී රු. මිලියන 1, 273.7 ක්ව පැවති බදු පෙර ලාභය 2024 වර්ෂයේදී මූල්‍ය ආදායම් පහළ යාම නිසා රු. මිලියන 824.7 ක් දක්වා සියයට 35 කින් පහළ ගොස් ඇත. | නව වෙළෙඳපොළ අත්පත් කර ගැනීම සඳහා නවීන තාක්ෂණයෙන් යුතු තරහකාරී භාණ්ඩ නිෂ්පාදනය කිරීමට රාජ්‍ය දැව සංස්ථාව විසින් අවධානය යොමු කළ යුතුය. |

**වගුව 8.34 | අනෙකුත් රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය සම්බන්ධිතයි...**

| විස්තරය | මූලික කාර්යයන් | කාර්යසාධනය | සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වාණිජ (විවිධ) නීතිගත සංස්ථා සමාගම | ශ්‍රී ලංකා වාණිජ (විවිධ) නීතිගත සංස්ථා සමාගම විසින් සිල්ලර වෙළෙඳාම, රසායනික ද්‍රව්‍ය සහ ආශ්‍රිත නිෂ්පාදන සැපයීම, කාර්යාල සැපයුම්, ඉදිකිරීම් ද්‍රව්‍ය, කෘෂිකාර්මික නිෂ්පාදන, මෝටර් සයිකල්, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ ටයර් යනාදිය සහ ගෘහ උපකරණවල සිට කාර්මික යන්ත්‍රෝපකරණ දක්වා විහිදුනු සේවාවන් පිරිනැමීම සිදුකරයි. | ප්‍රධාන වශයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික සහ ආහාර වල අලෙවිය අඩුවීම හේතුවෙන්, 2023/24 වර්ෂයේ දී රු. මිලියන 1,501 ක් වූ ශ්‍රී ලංකා වාණිජ (විවිධ) නීතිගත සංස්ථා සමාගමේ ලාභය 2024/25 වර්ෂයේ දී රු. මිලියන 367 ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. | වත්මන් වෙළෙඳපොළ අවශ්‍යතාවලට අනුව ශ්‍රී ලංකා වාණිජ (විවිධ) නීතිගත සංස්ථා සමාගම තම නිෂ්පාදන කළඹ වැඩි දියුණු කරන අතරම, සිය ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග අඛණ්ඩව පවත්වා ගත යුතුය. |
| රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මූලික වශයෙන් පාසල් පෙළ පොත්, අභ්‍යාස පොත් සහ ලොතරැයි ටිකට්පත් මුද්‍රණයේ යෙදී සිටියි. | ප්‍රධාන වශයෙන් මුද්‍රණය කරන ලද පෙළ පොත් ප්‍රමාණය අඩුවීම හේතුවෙන්, 2023 වර්ෂයේ දී රු.මිලියන 8,432 ට සාපේක්ෂව ආදායම 2024 වර්ෂයේ දී රු.මිලියන 2,848 ක් දක්වා සියයට 66 කින් තියුණු ලෙස පහත වැටී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ දී රු.මිලියන 2,792ක් වූ ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ ශුද්ධ ලාභය රු.මිලියන 284 ක් ලෙස වාර්තා කර ඇත. | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් වෙළෙඳපොළ අත්පත් කර ගැනීම උදෙසා අභ්‍යාස පොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ආයෝජනය කිරීම මගින් තම මෙහෙයුම් තව දුරටත් පුළුල් කර ගත යුතුය. |
| හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම සත්කාරක ව්‍යාපාරයේ නිරත වේ. | 2023 වර්ෂයේ දී වාර්තා කළ රු. මිලියන 784 ක අලාභය හා සැසඳීමේදී 2024 වර්ෂයේ දී අලාභය රු. මිලියන 268 ක් දක්වා සැලකිය යුතු පහළ යාමක් වාර්තා කර ඇත. මෙම ප්‍රවණතාවය සඳහා හේතු වූයේ කාමර පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නවීකරණය කිරීම සහ සංචාරක කර්මාන්තයේ පුනර්ජීවනයත් සමඟ හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගමේ ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු ආදායම 2024 වර්ෂයේ දී සියයට 24 කින් රු. මිලියන 5,393 ක් දක්වා ඉහළ යාමයි. | 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා තෙක් නතර කර ඇත. හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගමේ කාර්යසාධනය වැඩි දියුණු කරගැනීම සඳහා පහසුකම්වල ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ ඉහළ නැංවීම, මිල ප්‍රශස්තිකරණය, පුළුල් වූ වෙළෙඳ ප්‍රචාරණ වැඩසටහන්, සේවා විවිධාංගීකරණය, කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා ආයෝජනය කෙරෙහි අවධානය යොමු කිරීම කළ යුතුය. |
| **ධීවර** | | | |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | ලංකා ධීවර වරාය සංස්ථාව විසින් ධීවර ප්‍රජාවට යටිතල පහසුකම් සහ ධීවර වරායන් හා සම්බන්ධ සේවාවන් රට පුරා පැතිරී ඇති වරායන් හරහා සපයයි. | ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයේ ලද පුනරාවර්තන ප්‍රදාන සහ වරාය මෙහෙයුම් ලාභය පිළිවෙලින් සියයට 46 කින් සහ සියයට 74 කින් පහළ යෑම හේතුවෙන්, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව 2023 වර්ෂයේ දී ලද රු. මිලියන 640 ක ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 85.3 ක අලාභයක් වාර්තා කර ඇත. | ධීවර වරායන්හි ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගනිමින් දළ දේශීය නිෂ්පාදිතයට වත්මන් දායකත්වය වැඩි කළ යුතුය. ඊට අමතරව, මසුන් ඇල්ලීමේ ප්‍රමිතිය ඉහළ නැංවීම, දැනට පවතින අයකිරීම් සහ ගාස්තු වෙනස් කිරීම සහ මෙහෙයුම් සඳහා ස්කැනිං පහසුකම් ක්‍රියාත්මක කිරීම දිගුකාලීනව ආයතනයේ ආදායම ඉහළ නැංවීමේ තීරණාත්මක පියවරයන් වේ. |
| ලංකා ධීවර සංස්ථාව | මාළු මිල ස්ථාවරව තබා ගැනීම සඳහා ධීවරයින්ගෙන් මාළු මිල දී ගෙන වෙළඳපොළට විකිණීම ලංකා ධීවර සංස්ථාව විසින් සුවිශේෂීව සිදුකරනු ලබයි. | 2024 වර්ෂයේ දී මූල්‍ය පිරිවැය සියයට 42 කින් අඩු වීමේ සහ දළ ලාභය සියයට 8.7 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ලංකා ධීවර සංස්ථාව 2023 වර්ෂයේදී වාර්තා කල රු. මිලියන 25.2 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 2.7 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. | ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේදී සහ පවත්වා ගෙනයාමේදී ඇති විය හැකි ඉල්ලුම සලකා බලා, වෙළෙඳපොළ සාධක මත මිල තීරණය කිරීමට මිල කමිටුවට ඉඩ දීම සහ වෙරළේදීම මාළු මිලදී ගැනීමට මිලදී ගැනීමේ නිලධාරීන් දිරිමත් කිරීම. මධ්‍යගත ගෙවීම් හා රැස්කිරීමේ බැංකු පද්ධතියක් හඳුන්වාදීම සහ මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම දිගුකාලීනව ආයතනයේ ආදායම ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය පියවරයන් වේ. |

**වගුව 8.34 | අනෙකුත් රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය සම්බන්ධිතයි...**

| විස්තරය | මූලික කාර්යයන් | කාර්යසාධනය | සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|---|
| **පොහොර** | | | |
| ලංකා පොහොර සමාගම | ලංකා පොහොර සමාගම දිවයින පුරා ප්‍රධාන වාණිජ භෝග සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම, ඇසුරුම් කිරීම සහ එහි ප්‍රාදේශීය ගබඩා සහ බලයලත් අලෙවි නියෝජිත ජාලය හරහා බෙදාහැරීම සිදු කරන විශාලතම රාජ්‍ය පොහොර සමාගම වේ. | ලංකා පොහොර සමාගමෙහි 2022/23 වර්ෂයේ රු. මිලියන 536 ක් වූ ආදායම 2023/24 වර්ෂයේ දී රු. මිලියන 347 ක් දක්වා ආසන්න වශයෙන් සියයට 35 කින් පහත වැටුණි. කෙසේ වුවද, පොළී ආදායම රු. මිලියන 740.8 ක් දක්වා සියයට 18 කින් ඉහළ යෑමත් සමඟ පොළී වියදම 2023/24 දී රු. මිලියන 78.5 ක් දක්වා සියයට 64 කින් පහළ යෑම හේතුවෙන් ශුද්ධ ලාභය රු. මිලියන 117.8 ක් දක්වා 2022/23 දී වූ රු. මිලියන 113 ට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. | 2022 ජනවාරි 24 දිනැති අංක 22/0077/323/003 සහ 2022 ජූනි 06 දිනැති අංක 22/0706/514/001 දරණ අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූලව, අමාත්‍ය මණ්ඩලය විසින් රජය සතු පොහොර සමාගම් දෙක ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 ජූලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය පොහොර සමාගම සංස්ථාපනය කරන ලදී. පරිපාලන පිරිවැය අවම කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණෙන් සමාන කාර්යයන් ඉටු කරන රාජ්‍ය ආයතන විධිමත් කිරීමේ පුළුල් ප්‍රතිපත්තිමය මූලපිරීමක කොටසක් ලෙස මෙම තීරණය ගෙන ඇත. ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, සමාගම් දෙකෙහි සේවකයන් සඳහා අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | ආදායම සැලකිල්ලට ගත් විට දෙවන විශාලතම රාජ්‍ය පොහොර සමාගම වන කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් භෝග සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා බෙදා හැරීම කන්න පදනම මත සිදු කිරීමේ කටයුතු වල නිරත වේ. | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 2022/23 වර්ෂයේ දී රු. මිලියන 207.2 ක් වූ ආදායම 2023/24 වර්ෂයේ දී රු. මිලියන 260.5 ක් දක්වා සියයට 25.7 කින් ඉහළ ගොස් ඇත. 2022/23 වර්ෂයේ දී වූ රු. මිලියන 501 ට සාපේක්ෂව 2023/24 වර්ෂයේ දී ශුද්ධ ලාභය රු. මිලියන 555 ක් දක්වා වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023/24 දී පොළී ආදායම රු. මිලියන 566 දක්වා සියයට 42.5 කින් ඉහළ යාමත් සමඟ පොළී වියදම රු. මිලියන 4.5 ක් දක්වා සියයට 83.6 කින් පහත වැටීමය. | අනිවාර්ය විශ්‍රාම ගැන්වීම යටතේ කැමැත්ත පළ කර සේවකයන් 267 දෙනෙකු විශ්‍රාම යන ලදී . සමාගම් දෙකම ස්වකීය අරමුදල් භාවිතා කරමින් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය ආසන්න වශයෙන් රු. මිලියන 844 ක මුළු පිරිවැයක් දරමින් ක්‍රියාත්මක කරන ලදී. 2024 ජූලි 01 වන දින සිට 2025 මාර්තු 31 දක්වා සී/ස රාජ්‍ය පොහොර සමාගම විසින් පොහොර මෙට්‍රික් ටොන් 52,863 ක් පමණ බෙදා හැර ඇත.<br>රජයේ රසායන පොහොර තහනම ඉවත් කළ ද, ගෝලීය වෙළෙඳපොළ සැපයුම් අංශයේ බාධාවක් පැවති හෙයින් 2024 වර්ෂය තුළ රසායනික පොහොර ආනයනය සීමා විය. රජයේ ප්‍රතිපත්තියට අනුකූලව 2024 වර්ෂය තුළ ආසියානු සංවර්ධන බැංකුව, ලෝක ආහාර වැඩසටහන හා ලෝක බැංකුවේ සහාය යටතේ ලැබුණු MOP සහ යූරියා වැනි පොහොර තොග බෙදාහැරීමට අදාළ කටයුතුවල රාජ්‍ය පොහොර සමාගම නිරත විය. |

### ඇමුණුම 8.1 | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි 52 හි ලාභදායිත්වය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යාපාර | බදු පෙර ලාභය/(අලාභය) | | | ව්‍යාපාර පිරිවැටුම | අයවැය ප්‍රතිපාදන 2024 | |
|---|---|---|---|---|---|---|---|
| | | 2022 | 2023(අ) | 2024(අ) | 2024(අ) | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| 1 | ලංකා බැංකුව(ආ) | 30,977 | 40,342 | 106,904 | 485,405 | 89,861 | – |
| 2 | මහජන බැංකුව(ආ) | 21,338 | 15,345 | 41,584 | 367,978 | 32,058 | – |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,510 | 4,287 | 26,431 | 207,637 | - | – |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | -89 | -1,165 | 158 | 7,591 | - | – |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 303 | 2,034 | 64 | 8,170 | - | – |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 359 | 1,183 | 3,210 | 39,552 | - | – |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 43,428 | 64,959 | 63,177 | 65,988 | - | – |
| 8 | සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව(ඇ) | 23,494 | 29,272 | 3,102 | 4,743 | - | – |
| 9 | ජාතික රක්ෂණ භාර අරමුදල | 8,530 | 13,329 | 16,793 | 33,291 | - | – |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 711 | 1,056 | 852 | 604 | - | – |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 2,651 | -3,885 | -3,182 | 4,014 | 5,012 | – |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -298,189 | 57,633 | 144,394 | 615,019 | - | – |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | -617,588 | 120,346 | 33,265 | 923,442 | - | – |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 57,027 | 40,359 | 43,810 | 98,289 | - | – |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | -2,701 | 5,235 | 23,945 | 84,027 | - | 28,829* |
| 16 | සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික)සමාගම | 6,434 | 33,639 | 28,982 | 51,639 | - | – |
| 17 | සීමා සහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම (ඇ) | -73,264 | 3,871 | -8,400 | 299,182 | - | 9,789* |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 1,421 | 2,189 | 547 | 75,712 | 12,630 | 1,500 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,269 | -2,709 | -1,041 | 1,475 | - | – |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 69 | 748 | 608 | 9,560 | - | – |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 27 | -2,261 | -1,696 | 666 | - | 769* |
| 22 | සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | -459 | -470 | -36 | 16,048 | | |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 119 | -136 | 280 | 4,806 | - | – |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 19 | -93 | -69 | 991 | 170 | – |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 20 | -156 | -223 | 1,416 | 360 | – |
| 26 | සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම | 511 | 534 | 415 | 1,284 | - | – |
| 27 | සීමා සහිත හලාවත වැවිලි සමාගම | 514 | 303 | 219 | 962 | - | – |
| 28 | සීමා සහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව (ඇ) | 346 | 69 | -14 | 1,660 | - | – |
| 29 | ශ්‍රී ලංකා කෂ්‍ය සංස්ථාව | 17 | -5 | 14 | 262 | 92 | 55 |
| 30 | සීමා සහිත ලංකා ඛනිජ වැලි සමාගම | 6,160 | 4,051 | -77 | 674 | - | – |
| 31 | සීමා සහිත ලංකා පොස්පේට් සමාගම (ඇ) | 61 | 363 | 462 | 1,317 | - | – |
| 32 | සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම (ඇ) | 57 | 28 | 31 | 155 | - | – |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 3,267 | 3,516 | 4,197 | 29,758 | - | – |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,390 | 845 | 1,693 | 36,544 | - | – |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,586 | 2,173 | 3,081 | 28,202 | - | – |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | -26 | 218 | 170 | 1,520 | - | – |
| 37 | රාජ්‍ය ඖෂධ නීතගත සංස්ථාව | -2,285 | 1,268 | 2,474 | 62,087 | - | – |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 247 | 304 | 552 | 7,653 | 2,890 | 38 |
| 39 | සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -370 | -205 | 3 | 1,756 | - | 110* |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -541 | -360 | -247 | 1,542 | - | 240* |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -235 | -528 | -158 | 997 | - | 200* |
| 42 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | -99 | 65 | -75 | 905 | - | – |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 1,016 | 1,274 | 825 | 4,114 | - | – |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (ඇ) | 735 | 1,501 | 367 | 8,693 | - | – |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම | -687 | -695 | -1,097 | 53,659 | - | 2,578 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -380 | 2,792 | 284 | 2,848 | - | – |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -193 | -25 | 3 | 5,367 | - | – |
| 48 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 364 | 640 | -85 | 835 | 350 | 50 |
| 49 | සීමා සහිත ලංකා පොහොර සමාගම (ඉ) | 113 | 61 | -154 | 266 | - | – |
| 50 | සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම (ඉ) | 501 | 162 | -41 | 232 | - | – |
| 51 | සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | -633 | -784 | -268 | 5,393 | - | – |
| 52 | සීමා සහිත ලංකා සීනි සමාගම | 6,045 | 2,835 | -1,894 | 10,859 | - | – |
| | **එකතුව** | **-774,641** | **445,352** | **534,139** | **3,676,789** | **143,423** | **44,158** |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

*හිමිකම් ප්‍රාග්ධන ආයෝජන

(අ)තාවකාලික

(ආ)ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය දේශීය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් ඇති වූ අලාභය සඳහා වන පොළී සහනාධාර පුනරාවර්තන අයවැය සහය මඟින් පෙන්නුම් කෙරේ.

(ඇ)සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - පරිපාලක සමාගමේ ලාභය පමණක් පෙන්නුම් කෙරේ.

(ඈ)මූල්‍ය වර්ෂය මාර්තු 31 න් අවසන් (එනම් 2024/25; 2024 සඳහා )

(ඉ)2024 අප්‍රේල් - ජූනි

ඇමුණුම 8.2 | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම

| | | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | √ | √ | √ | √ | √ |
| 2 | මහජන බැංකුව | √ | √ | √ | √ | √ |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | √ | √ | √ | √ | √ |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | √ | √ | √ | √ | √ |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | √ | √ | √ | √ | √ |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | √ | √ | √ | X | X |
| 7 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | √ | √ | √ | √ | √ |
| 8 | සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | √ | √ | √ | √ | X |
| 9 | ජාතික රක්ෂණ භාර අරමුදල | √ | √ | √ | √ | X |
| 10 | ලංකා විදුලිබල මණ්ඩලය | √ | √ | √ | √ | X |
| 11 | ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව | √ | √ | √ | √ | X |
| 12 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | √ | √ | √ | √ | √ |
| 13 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | √ | √ | √ | √ | X |
| 14 | සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | √ | √ | √ | √ | √ |
| 15 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම | √ | √ | √ | √ | X |
| 16 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | √ | √ | √ | √ | X |
| 17 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | X | X | X | X | X |
| 18 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | √ | √ | √ | √ | √ |
| 19 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | √ | √ | √ | X | X |
| 20 | සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | √ | √ | X | X | X |
| 21 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | √ | X | X | X | X |
| 22 | ලංකා ධීවර සංස්ථාව | X | X | X | X | X |
| 23 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | √ | √ | √ | √ | X |
| 24 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | √ | √ | √ | √ | √ |
| 25 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | √ | √ | √ | √ | √ |
| 26 | රාජ්‍ය ඖෂධ නීතගත සංස්ථාව | √ | √ | √ | √ | √ |
| 27 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | √ | √ | √ | √ | X |
| 28 | සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය | √ | √ | √ | √ | X |
| 29 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | √ | √ | √ | X | X |
| 30 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | √ | √ | √ | √ | X |
| 31 | සීමා සහිත ලංකා පොහොර සමාගම | √ | √ | √ | X | X |
| 32 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | √ | √ | √ | √ | X |
| 33 | රාජ්‍ය දැව සංස්ථාව | √ | √ | √ | √ | X |
| 34 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | √ | √ | √ | √ | X |
| 35 | සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | √ | √ | √ | √ | √ |
| 36 | සීමා සහිත ලංකා සීනි සමාගම | √ | √ | √ | √ | X |
| 37 | සීමා සහිත ලංකා සතොස සමාගම | √ | √ | √ | √ | X |
| 38 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | √ | √ | √ | √ | √ |
| 39 | ජාතික ලොතරැයි මණ්ඩලය | √ | √ | √ | √ | √ |
| 40 | සීමා සහිත ලංකා බනිජ වැලි සමාගම | √ | √ | √ | √ | X |
| 41 | සීමා සහිත ලංකා පොස්පේට් සමාගම | √ | √ | √ | √ | √ |
| 42 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | √ | √ | √ | √ | X |
| 43 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | √ | √ | √ | √ | √ |
| 44 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | √ | √ | √ | √ | X |
| 45 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | √ | √ | √ | √ | X |
| 46 | සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම | √ | √ | √ | X | X |
| 47 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | X | X | X | X | X |
| 48 | සීමා සහිත හලාවත වැවිලි සමාගම | √ | √ | √ | X | X |
| 49 | සීමා සහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | √ | √ | √ | √ | X |
| 50 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | √ | √ | X | X | X |
| 51 | සීමා සහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | √ | √ | √ | √ | X |
| 52 | සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | √ | √ | √ | X | X |

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# 09

# රාජ්‍ය මුදල් කළමනාකරණය

## 9.1 සමාලෝචනය

රාජ්‍ය සම්පත් ඵලදායී ලෙස භාවිත කිරීම තහවුරු කිරීම, මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ අත්‍යවශ්‍ය සේවා සැපයීමේ දී රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කෙසේ වෙතත්, වසර ගණනාවක් පුරා ශක්තිමත්, විනිවිද පෙනෙන සහ වගකිවයුතු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති හඳුන්වාදීමේදී ශ්‍රී ලංකාව පසුගාමී තත්වයක පසුවූ අතර එය මහජන මුදල් වගකීමෙන් යුතුව ව්‍යදම් කරමින් ඵලදායී රාජ්‍ය සේවා සැපයීමට අහිතකර විය.

මෙම අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම අරමුණු කරගත් ප්‍රතිසංස්කරණවල වැදගත් සන්ධිස්ථානයක් ලෙස 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ශ්‍රී ලංකාව විසින් බලාත්මක කරන ලදී. මෙම පනත මගින් ශක්තිමත් මූල්‍ය නීති හඳුන්වා දීම, රාජ්‍ය ආයෝජන කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ පෙර පැවති නීති සම්පාදනයන්හි දිගුකාලීන අකාර්යක්ෂමතා සඳහා විසඳුම් හඳුන්වාදෙනු ලැබේ. එමගින් ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් කළමනාකරණය විධිමත් කිරීමට ද නියෝග ලබා දෙමින් ඒවායේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමට මහා භාණ්ඩාගාරයට බලය පවරා ඇත. උක්ත පනත ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි සහ චක්‍රලේඛ සකස් කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ලැබේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ප්‍රතිසංස්කරණය විය යුතු තවත් ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස රාජ්‍ය ප්‍රසම්පාදනය හඳුනාගෙන ඇති අතර එහිදී රාජ්‍ය ප්‍රසම්පාදනයේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය යාවත්කාලීන කර යොදවා ඇත. මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් පැවතිය ද, පද්ධතිය මගින් රාජ්‍ය ප්‍රසම්පාදන දහස් ගණනක් සඳහා පහසුකම් සපයා ඇති අතර සැලකිය යුතු විකුණුම්කරුවන් සහ ආයතන ගණනාවක් ඒකාබද්ධ කර ඇත.

විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ ආයතන විසින් සේවා සහ භාණ්ඩ ඇතුළු විවිධ ආකාරයේ ප්‍රසම්පාදන සඳහා රාජ්‍ය අරමුදල්වලින් සැලකිය යුතු කොටසක් වැය කරනු ලැබේ. එබැවින්, ප්‍රසම්පාදන කටයුතුවල කාර්යක්ෂමතාවයන් අත්කර ගැනීමෙන් රජයේ ව්‍යදම් සැලකිය යුතු ලෙස අඩු කර ගත හැකිය. මෙම සන්දර්භය තුළ, රාජ්‍ය ප්‍රසම්පාදනයේ හොඳම භාවිතයන් සහතික කිරීම සඳහා රටක් තුළ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියක් තිබීම අතිශය වැදගත් වේ.

එමෙන්ම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රෙගුලාසි හඳුන්වාදීම සහ විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරන ලද ව්‍යුහාත්මක මිණුම් සලකුණු ලෙස ද හඳුනාගෙන ඇත.

## 9.2 නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ

දශක ගණනාවක් තිස්සේ රට තුළ දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 අගෝස්තු 08 වන දින පාර්ලිමේන්තුව මගින් බලාත්මක කරන ලදී.

තවද, මෑත කාලීනව රට මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා විසඳීම සඳහා තීරණාත්මක වන පූර්ව අවශ්‍යතා ලෙස හඳුනාගෙන ඇති, නෛතිකව ශක්තිමත් සහ දැඩි ලෙස බලාත්මක කළ හැකි මූල්‍ය රීති රාමුවක් පැවතීම සහ රාජ්‍ය ආයෝජන කළමනාකරණ යාන්ත්‍රණයක් පැවතීම වැනි නව ක්ෂේත්‍ර සඳහා විධිවිධාන සැලසීම කෙරෙහි ද මෙම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ විශේෂ අවධානය යොමු කර ඇත. මේ අනුව, දැනට ක්‍රියාත්මක වන 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අවලංගු කළ අතර එම පනතේ වැදගත් අංග මූල්‍ය රීති ආකාරයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට ඇතුළත් කර ඇත. තවද, අනෙකුත් රාජ්‍ය අස්ථීත්වයන් සමඟ රජය සතු ව්‍යාපාරයන් පාලනය කරන පුළුල් නීතිමය රාමුවක අවශ්‍යතාවය හඳුනා ගනිමින්, 1971 අංක 38 දරන මුදල් පනතේ 08 සහ 14 වගන්ති අවලංගු කර යාවත්කාලීන කරන ලද විධිවිධාන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට ඇතුළත් කරන ලදී.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2024.08.15 දිනැතිව "2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 3/2024 නිකුත් කර ඇත. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, මහා භාණ්ඩාගාරය විසින් නියෝජ්‍ය ලේකම්වරුන්ගේ මග පෙන්වීම සහ මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු, පවතින මුදල් රෙගුලාසිවලට විශේෂ රෙගුලාසි ඇතුළත් කර ඇති රාජ්‍ය ආයතන, ආසියානු සංවර්ධන බැංකුව විසින් සේවයේ යොදවා ඇති දේශීය උපදේශකයින් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ විශේෂඥයින්ගේ සහාය ඇතිව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රෙගුලාසි කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියෙහි නියැලී සිටින අතර, එය 2025 දෙසැම්බර් මස අවසානය වන විට නිම කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතාවයක් වේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව, ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විධිමත් කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට සුවිශේෂ කාර්යභාරයක් පැවරී ඇත. එකී පනතට අනුව, භාණ්ඩාගාර ලේකම් සියලුම ව්‍යවස්ථාපිත අරමුදල් සුපරීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම කරනු ලැබිය යුතු අතර එවැනි කාරණා සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් විධිවිධාන සලසා නොමැති විට ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කළ හැකිය. තවද, මෙම පනත ක්‍රියාත්මකවීමේ දින සිට වර්ෂයක් ඇතුළත ඕනෑම ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් විසුරුවා හරිනු ලැබිය යුතු වේ. කෙසේ නමුත්, ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා, භාණ්ඩාගාර ලේකම්වරයාගෙන්

විමසා, ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් දිගටම පවත්වාගෙන යා යුතු බවට තීරණය කළහොත්, එම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කළ හැකිය. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා, ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල්වල කටයුතු විධිමත් කිරීම සඳහා විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල නිලධාරීන් නිසි පරිදි දැනුවත් කිරීම හා නිසි මහ පෙන්වීම් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

## 9.3 ප්‍රසම්පාදන කළමනාකරණය

මුදලට නිසි වටිනාකමක් සහ සාධාරණ ගනුදෙනුවක් සහතික කරනු ලබන කඩිනම් සහ කාර්යක්ෂම රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සහතික කිරීමේදී, මහජන යහපත ආරක්ෂා කිරීම සඳහා සෑම මට්ටමකින්ම හොඳම ප්‍රසම්පාදන පිළිවෙත් පිළිපැදීම අවධාරණය කර ඇත. විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ මුදලට සරිලන වටිනාකම සහතික කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම වසර තුළ, වෙළඳපොල මිල සෑදෙනුම් ක්‍රමය යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනය හැඹිරවිය හැකි විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියේ වැඩි දියුණු කරන ලද සංස්කරණයක් භාවිතයට යොදවන ලදී. පාර්ශ්වකරුවන්ගෙන් ලද යෝජනා මත පදනම්ව වසර පුරා බොහෝ වෙනස් කිරීම් විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට සිදු කරන ලදී. මේ අතරතුර, ලෝක බැංකුවේ තාක්ෂණික හා මූල්‍ය සහාය ඇතිව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සඳහා අවශ්‍ය මෘදුකාංග යටිතල පහසුකම් ප්‍රසම්පාදනය කරන ලදී. මෙයට ඉහළ මට්ටමේ ක්ලවුඩ් (Cloud) පහසුකමක් සහ ස්වාධීන තෙවන පාර්ශව සහතිකකරුවෙකු සම්බන්ධ කර ගැනීම ඇතුළත් විය.

මේ අතර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, පද්ධතියේ සංවර්ධනයට සහාය වීම සඳහා තාක්ෂණික උපදේශකයින් 13 දෙනෙකුගේ සේවය ලබා ගනිමින් විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය සවිමත් කරන ලදී. භාණ්ඩ හා වැඩ සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම සහ ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම ඇතුළු අනෙකුත් ආකාරයන්හි ප්‍රසම්පාදන සඳහා විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සෑම උත්සාහයක්ම ගන්නා ලදී. කෙසේ වෙතත්, පද්ධති ක්‍රියාත්මක කිරීමේ හවුල්කරු විසින් බාර දිය යුතු නිමැවුම් ප්‍රමාද වීම සහ අපේක්ෂිත ප්‍රමිතීන් සපුරාලීමට අපොහොසත් වීම හේතුවෙන්, දෙපාර්තමේන්තුවට මුලින් එකඟ වූ කාලරාමුව කිහිප වතාවක් සංශෝධනය කිරීමට සිදුවිය.

තවද, ශ්‍රී ලංකා ටෙලිකොම් "රේන්බෝ ජේජස්" හි ලියාපදිංචි විකුණුම්කරුවන් විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියට ඒකාබද්ධ කිරීමෙන් විකුණුම්කරුවන් සංචිතය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ටෙලිකොම් "රේන්බෝ ජේජස්" සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. එම පද්ධති දෙක සඳහාම අවශ්‍ය සංවර්ධන කටයුතු දැනට සිදු කරමින් පවතී.

මේ වන විට, විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය මඟින් ප්‍රසම්පාදන ආයතන 700 ක් සහ විකිණුම්කරුවන් 4,350ක් පමණ පද්ධතියට ලියාපදිංචි කිරීමට පහසුකම් සලසා ඇති අතර, විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කරමින් විද්‍යුත් ප්‍රසම්පාදන 30,900 ක් ක්‍රියාත්මක කර ඇත. විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන වේදිකාව ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රශංසනීය ප්‍රගතියත් සමඟ, ප්‍රධාන ප්‍රසම්පාදන පිළිබඳ තොරතුරු මහජනතාවට විනිවිදභාවයකින් දැනගැනීමට හැකිවන පරිදි විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි උඩුගත කරන ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වයන්ට උපදෙස් දී ඇත.

තවද, මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 200 ඉක්මවන ප්‍රසම්පාදන ඇතුළු සියලුම කාණ්ඩ ආවරණය වන ප්‍රසම්පාදන දැන්වීම් සඳහා මහජනතාවට ප්‍රවේශ විය හැකි අතර, රු. මිලියන 200 ඉක්මවන කොන්ත්‍රාත් ප්‍රදානයන් පිළිබඳ විස්තර 2022 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන වෙබ් අඩවියෙහි දක්වා ඇත.

### විශේෂ සටහන 9.1 | රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

රජයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු නිසි පරිදි පවත්වා නොගැනීම, එම වත්කම් නිසි පරිදි නඩත්තු නොකිරීම හා භාවිතා නොකිරීම, අකාර්යක්ෂමතාවයන් සහ පාඩු සඳහා හේතු වී ඇති බැවින්, මෙම කාර්යය සඳහා වෙන් වූ කේන්ද්‍රගත ආයතනයක් මගින් මෙම වත්කම් පිළිබඳව ජාතික වත්කම් ලේඛණයක් සම්පාදනය කරමින්, මෙම වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සහ විධාන ලබා දීම අවශ්‍යතාවයක් වී ඇත. රජයේ සංවර්ධන රාමුව ශක්තිමත් කිරීම සඳහා, මෙම වත්කම් ඵලදායීව උපයෝජනය කිරීම හා අපහරණයෙන් ලැබිය යුතු ආදායම උපයා ගැනීම දිරි ගන්වමින් මෙම වත්කම් නිසි පරිදි ආරක්ෂා කර ගැනීම, මෙමඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් නිකුත් කරන ලද Government Finance Statistical manual 2014 අනුව ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කරමින් මෙම වත්කම් පළමු අදියරේදී වාහන, ගොඩනැගිලි, ඉඩම්, ඉදිකිරීම්, පිරියත හා යන්ත්‍රෝපකරණ සහ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ලෙස වර්ගීකරණය කරමින් සියළුම රාජ්‍ය ආයතන, එනම්, රජයේ ආයතන (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල), රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන මගින් තොරතුරු ලබා ගැනීමට ප්‍රථමයෙන් කටයුතු කරන ලදී. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස් වලට රාජ්‍ය ආයතන විසින් අනුගත වීමේ ගැටළු තිබියදීත්, 2021 වර්ෂය අවසන් වන විට, මෝටර් වාහන 84,247 ක්, අයිතිය සතු / කුළී / බදු පදනම් යටතේ වර්ග මීටර් මිලියන 60.8 ක ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයක් සහ හෙක්ටයාර් මිලියන 1.49 ක ඉඩම් ප්‍රමාණයක් රාජ්‍ය ආයතන විසින් වාර්තා කරන ලදී.

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය මනාව සිදු කිරීම සඳහා පහසුකම් සැපයීමට, වෙබ් පාදක (web-based) තත්‍ය කාලීන දත්ත වාර්තා කරනු ලබන තොරතුරු කළමනාකරණ පද්ධතියක් වන, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) ස්ථාපිත කිරීම, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින් එහි පළමු මොඩියුලය (වාහන මොඩියුලය ) 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කරමින් සිදුකර ඇත. මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි අනෙකුත් මොඩියුල පියවරෙන් පියවර ක්‍රියාත්මක කරන අතර, ඉදිකිරීම්, ගොඩනැගිලි සහ ඉඩම් මොඩියුල සකස් කිරීම දැනටමත් අවසන් කර ඇත. මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි වාර්තා කර ඇති පරිදි, 2025 මැයි 30 දින වන විට, රාජ්‍ය ආයතනවල වාහන සංඛ්‍යාව 93,378ක් වේ.

රජයට අයත් සමස්ත වාහන සංඛ්‍යාවේ වයස් විශ්ලේෂණය - 2025.05.30 දිනට


| වාහන වර්ග* | වසර 0 - 5 | වසර 6 - 10 | වසර 11 - 15 | වසර 15ට වඩා පැරණි | එකතුව |
|---|---|---|---|---|---|
| යතුරු පැදි | 752 | 4,135 | 4,382 | 6,638 | 15,907 |
| කාර් | 717 | 1,962 | 4,852 | 5,282 | 12,813 |
| ද්විත්ව කාර්යය වාහන | 246 | 1,668 | 2,662 | 5,679 | 10,255 |
| බස් | 565 | 1,095 | 2,848 | 2,988 | 7,496 |
| මෝටර් ලොරි | 284 | 1,449 | 1,335 | 3,713 | 6,781 |
| ඉඩම් වාහන | 199 | 987 | 1,571 | 3,192 | 5,949 |
| ඩබල් කැබ් | 168 | 1,001 | 1,519 | 2,256 | 4,944 |
| ත්‍රිරෝද රථ | 2,031 | 422 | 745 | 1,168 | 4,366 |
| ට්‍රැක්ටර් | 358 | 512 | 1,178 | 1,787 | 3,835 |
| මෝටර් කෝච් | 43 | 397 | 738 | 1,288 | 2,466 |
| ට්‍රැක්ටර් ට්‍රෙලර් / බවුසර් | 901 | 687 | 1,086 | 1,802 | 4,476 |
| ගිලන් රථ | 154 | 680 | 444 | 884 | 2,162 |
| වෑන් | 90 | 563 | 572 | 867 | 2,092 |
| සිංගල් කැබ් | 80 | 453 | 404 | 504 | 1,441 |
| විශේෂ කාර්ය වාහන | 177 | 692 | 297 | 251 | 1,417 |
| ට්‍රක් | 272 | 126 | 401 | 527 | 1,326 |
| අනෙකුත් වාහන | 644 | 1,168 | 1,132 | 2,708 | 5,652 |
| **එකතුව** | **7,681** | **17,997** | **26,166** | **41,534** | **93,378** |

*වාහනයේ වර්ගය (අනෙකුත් වාහන හැර), මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාහන ලියාපදිංචි සහතිකයේ දක්වා ඇති වර්ගීකරණය මත පදනම් වන අතර මෙහි සඳහන් කාර්, ද්විත්ව කාර්යය වාහන හා අනෙකුත් වාහන වර්ගවලට වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි සඳහන් සුඛෝපභෝගී කාණ්ඩයේ වාහන ද ඇතුලත් වේ.


මූලාශ්‍රය : කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

**විශේෂ සටහන 9.1 | රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙනි...**

වාහන වර්ගය අනුව වාහන සංඛ්‍යාව




**සමස්ත වාහන සංඛ්‍යාවේ වයස් විශ්ලේෂණය**




**වටිනාකම තක්සේරු කිරීම :** වාහන, ඉදිකිරීම්, ගොඩනැගිලි, ඉඩම්, පිරියත හා යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ වටිනාකම තක්සේරු කිරීම සඳහා වන ප්‍රතිපත්තිය සකස්කිරීම වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, අංක 02/2019 සහ අංක 05/2021 නිකුත්කරමින් සිදුකර ඇත. මෙම චක්‍රලේඛ මගින් වාහන වටිනාකම තක්සේරු කිරීම පිළිබඳ ලබා දී තිබූ උපදෙස් ඇතුලත් කරමින් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024 නිකුත් කර ඇත.

**වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කරගැනීම :** වාහන වල ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන්වන උපදෙස් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හා අංක 03/2018 මගින් ලබාදී ඇත. 2024 වර්ෂයේ දී සහ 2025 මැයි 30 දින වන විට වාහන 334 ක ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කර ඇත.

**අස්ථානගත වීම/ඌන උපයෝජනය වැළැක්වීම සහ මූල්‍ය නොවන වත්කම් ආරක්ෂා කිරීම :** රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ තනතුරු වෙනස්වීම් හෝ රාජ්‍ය ආයතන වෙනස් වීම / අහෝසි වීම / වසා දැමීම වැනි අවස්ථාවන්හිදී අදාළ මූල්‍ය නොවන වත්කම් නිසි ලෙස භාරදීම / පවරා ගැනීම පිළිබඳ අවශ්‍ය උපදෙස් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2022 මගින් ලබා දී ඇත. ඊට අමතරව, රජයේ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම හෝ අවසන් කිරීමේදී ඊට අදාලව, එම ව්‍යාපෘති සඳහා භාවිතා කරන ලද වත්කම් නැවත වෙනත් කාර්යයන් සඳහා යෙදවීම හෝ අපහරණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා, කොමිස්ජෙනරාල් කාර්යාලය වෙත එම වත්කම් පිළිබඳ තොරතුරු නිවැරදිව වාර්තා කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2024 මගින් උපදෙස් ලබා දී ඇත.

ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද ආදායම (රු. මිලියන)

| විස්තරය | 2021 | 2022 | 2023 | 2024 | 2025 (2025.04.30 දිනට) |
|---|---|---|---|---|---|
| වාහන | 128.3 | 226.4 | 329.6 | 136.0 | 536.6 |
| අනෙකුත් වත්කම් | 60.1 | 357.8 | 186.3 | 974.1 | 413.5 |
| **එකතුව** | **188.4** | **584.2** | **515.9** | **1,110.1** | **950.1** |

මූලාශ්‍රය: කොමිස්ජෙනරාල් කාර්යාලය

**වාහන අපහරණය කිරීම :** වාහන අපහරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020, 04/2022 සහ 05/2024 නිකුත් කිරීම මගින් ලබා දී ඇත.

**ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද ආදායම :** 2024 වර්ෂය තුළ සහ 2025 අප්‍රේල් 30 දින වන විට ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ඉපයූ ආදායම රු. මිලියන 2,060.2 ක් වේ.

# 10

# මානව සම්පත් කළමනාකරණය

## 10.1 සමාලෝචනය

2024 වර්ෂය තුළ බහුවිධ අංශවලින් සැලකිය යුතු අන්දමේ ආර්ථික සංවර්ධනයක් අත් කර ගැනීම මධ්‍යයේ, සේවක සංඛ්‍යා කළමනාකරණය විවක්ෂණ සහ උපාය මාර්ගික අධීක්ෂණයක් අවශ්‍ය ක්ෂේත්‍රයක් ලෙස මතු විණි. මෙම වර්ෂයේදී වැටුප් සහ වේතන මත දරන වියදම් ඵලදායීව කළමනාකරණය කර ගන්නා අතරම ප්‍රශස්ත සේවක මට්ටමක් පවත්වා ගෙන යාමට රජය විසින් දරන ලද ප්‍රයත්නයන් තුළින් අත් කර ගත් ප්‍රතිඵල රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයෙහි සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.

ආර්ථික වෘද්ධිය සහ තිරසර සංවර්ධනයද ඇතුළත් පුළුල් ජාතික සන්දර්භයම සාකච්ඡා වන අයුරින්, රාජ්‍ය අංශයෙන් ඔබ්බට විහිදෙන, මානව සම්පත් ප්‍රශස්තව උපයෝජනය කිරීම පිළිබඳ පුළුල් සංවාදයකට 2024 වර්ෂයේදී මුල පිරුණි. නව බඳවා ගැනීම් වෙනුවෙන් ලැබෙන ඉල්ලීම් සහ තනතුරු සංඛ්‍යාව ඉහළ නැංවීම වෙනුවෙන් කරන යෝජනා දැඩි ඇගයීමට ලක් කෙරුණු අතර රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවලදී වැටුප් සහ වේතන සඳහා දරන වියදම් හේතුවෙන් ජාතික අයවැය මත අනවශ්‍ය පීඩනයක් ඇති වීම වැළැක්වීම පිණිස සේවක සංඛ්‍යා ව්‍යුහයන් ප්‍රශස්ත කිරීමේ වැදගත්කම නිරන්තරයෙන් අවධාරණය කෙරිණි.

නව රජයේ ක්‍රියාමාර්ගයන්ට අනුකූලව රාජ්‍ය සේවා සැපයීමේ ඵලදායී බව සහ කාර්යක්ෂම බව වැඩිදියුණු කිරීම පිණිස විද්‍යාත්මක සහ තාර්කික ක්‍රියාවලියක් අනුගමනය කරමින් නව අමාත්‍යාංශ ස්ථාපිත කරන ලදී. ඒ අනුව, පෙර පැවති අමාත්‍යාංශවලට පවරා තිබූ විෂයයන් සහ කාර්යයන් සඳහා තවත් කාර්යයන් එකතු කිරීම, යටපත් කිරීම හෝ ඒකාබද්ධ කිරීම මගින් විෂයයන් සහ කාර්යයන් ප්‍රතිසංවිධානයට ලක් කෙරිණි. 2024 සැප්තැම්බර් 21 දින පැවති ජනාධිපතිවරණයෙන් සහ 2024 නොවැම්බර් 14 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු අලුතින් ස්ථාපිත කරන ලද අමාත්‍යාංශවලින් කාර්යක්ෂම ලෙස සේවා සැපයීම සහතික කරනු පිණිස අවශ්‍ය වන ප්‍රශස්ත සේවක සංඛ්‍යාව සූක්ෂ්ම ලෙස හඳුනා ගන්නා ලදී. මෙහිදී එක් එක් අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කර සේවා අවශ්‍යතා පුළුල් ලෙස තක්සේරු කිරීම සිදු කෙරුණි. මෙම තක්සේරුව සහ පිරිවැය ප්‍රතිලාභ සලකා බැලීම් පිළිබඳව සිදු කළ සවිස්තරාත්මක ඇගයීමක්ද පදනම් කර ගනිමින් නව අමාත්‍යාංශ සඳහා අවශ්‍ය තනතුරු විධිමත් පරිදි අනුමත කරන ලදී. කෙටි කාල සීමාවන් ඇතුළත අමාත්‍යාංශ සංඛ්‍යාව සහ විෂය පථයන් නිරන්තරව වෙනස්වීම ප්‍රශස්ත කාර්ය මණ්ඩල කළමනාකරණය සහ ස්ථාවර සේවා සැපයුම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, තාර්කික සහ සාධනීය ප්‍රවේශයක් අනුව අමාත්‍යාංශවලට විෂයයන් වෙන් කිරීම මෙන්ම එය දිගු කාල පරිච්ඡේදයක් පුරා අඛණ්ඩව රඳවා ගැනීමද අත්‍යවශ්‍ය වේ.

ප්‍රාථමික මට්ටමේ සේවා නියුක්තිය හා සම්බන්ධ අභියෝගයන්ට පිළියමක් වශයෙන් පෙරදී ස්ථාපිත කර තිබූ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසුරුවා හැරීමට රජය තීරණය කරන ලද අතර මෙම ක්‍රියාමාර්ගය තුළින් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් 30,000කට ආසන්න සංඛ්‍යාවක් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුළ ප්‍රාථමික සේවා කාණ්ඩවල හඳුනා ගත් තනතුරු පුරප්පාඩුවල සේවා නියුක්ත කිරීමට පියවර ගන්නා ලදී. මෙම උපායමාර්ගික ප්‍රතිනියුක්ත කිරීම මගින් තුලිත කාර්ය මණ්ඩල ව්‍යුහයක් පවත්වා ගනිමින් රාජ්‍ය අංශයේ සමස්ත සේවක සංඛ්‍යාව පුළුල් කිරීමේ අවශ්‍යතාව බැහැර කිරීමට හැකි විය. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය සඳහා අරම්භයේදී අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව 100,000ක් වුවද සේවයේ නියුක්ත කරන ලද තත්‍ය සේවක සංඛ්‍යාව 30,000කට ආසන්න සංඛ්‍යාවක් විය. රජයේ කාර්ය මණ්ඩල සම්පාදනය පිළිබඳ සංශෝධිත උපායමාර්ගයට අනුකූලව, බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙනුවෙන් පෙර අනුමත කරන ලද තනතුරු 100,000 විධිමත් අයුරින් යටපත් කරන ලදී. එමෙන්ම, බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීම මගින් දැනට අනියම්, ආදේශක හෝ කොන්ත්‍රාත් තනතුරුවල සේවයේ නියුක්ත පුද්ගලයින්ට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවලට පත්වීමට පැවති ඉඩ ප්‍රස්ථා ඇහිරී ඇති බව නිරීක්ෂණය වී ඇත.

2024 වර්ෂය අවසානය වන විට රාජ්‍ය අංශයේ නියුතු සමස්ත සේවක සංඛ්‍යාව 1,336,147ක් වූ අතර මුළු විශ්‍රාමිකයින් සංඛ්‍යාව 725,119ක් විය. සමස්ත රාජ්‍ය වියදමෙන් හතරෙන් එකකට ආසන්න ප්‍රමාණයක් වැටුප්, වේතන සහ විශ්‍රාම වැටුප් වෙනුවෙන් වැය වී ඇති අතර, එම ප්‍රමාණය 2024 වර්ෂයේ රාජ්‍ය ආදායමෙන් සියයට 36කි.

පවත්නා සීමිත මූල්‍ය අවකාශය තුළ විශේෂයෙන්ම, වැටුප් හා වේතන කළමනාකරණය අභියෝගාත්මක කාර්යයක් බවට පත්ව තිබීම හේතුවෙන් රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය වඩා සංකීර්ණ වී ඇත. අනෙකුත් රටවලට සාපේක්ෂව, රජයේ සේවක සංඛ්‍යාවේ අසමානුපාතික විශාලත්වය සහ දායකත්ව නොවන විශ්‍රාම වැටුප් ක්‍රමය හේතුවෙන් ඇතිව තිබෙන දීර්ඝ කාලීන බැඳීම් රාජ්‍ය මූල්‍ය කෙරෙහි සැලකිය යුතු වැය බරක් අඛණ්ඩව ජනනය කරයි. එමෙන්ම, විවිධ සේවක කණ්ඩායම් තුළ රැකියාවට අවශ්‍ය නිපුණතා නොමැති වීම, වෘත්තීය සමිති සහ සේවක කණ්ඩායම්වලින් මතු වන සංවිධානාත්මක ප්‍රතිරෝධය සහ දිගු කලක් පුරා ස්ථාපිතව පවතින සමාජ හා සංස්කෘතික බාධක රජයේ සේවක සංඛ්‍යාව ප්‍රශස්ත මට්ටමට ගැනීමට දරන ප්‍රයත්න සඳහා බාධාකාරී වී ඇත. මෙම අභියෝග රාජ්‍ය අංශය තුළ දශකයකට ආසන්න කාලයක් පුරා පැවතී ඇති අතර තත්‍ය කාර්ය මණ්ඩල සම්පාදන අවශ්‍යතා පිළිබඳ පුළුල් හා ක්‍රමානුකූල තක්සේරුවක් නොමැති වීම හමුවේ, එවැනි ගැටලු ඉදිරියටත් පැවතිය හැකිය.

මෙම සන්දර්භය තුළ, ප්‍රමුඛතාව දිය යුතු බවට හඳුනා ගත් අංශ සහ සියලු පළාත් සභා ඇතුළත් වන සේ සමස්ත රාජ්‍ය සේවය සඳහාම පුළුල් කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කිරීම සම්බන්ධ මූලික සාකච්ඡාවන්ට මුල පුරා ඇත. රාජ්‍ය අංශයේ ශ්‍රම බලකාය තාර්කික කිරීම පිණිස අනුගමනය කරන ප්‍රධාන උපායමාර්ග අතරට තනතුරු යටපත් කිරීම හා

**වගු අංක 10.1 | රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා සංයුතිය 2015-2024**

| පරිපාලන මට්ටම | | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | වැඩි වීමේ / අඩු වීමේ % 23/24 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික (ත්‍රිවිධ හමුදා ඇතුළත්ව) | අනුමත | 858,680 | 874,046 | 880,971 | 892,509 | 906,264 | 1,006,276 | 1,013,419 | 1,018,019 | 1,030,672 | 961,390 | -6.7 |
| | තත්‍ය | 722,950 | 754,548 | 756,339 | 742,960 | 740,574 | 805,802 | 792,317 | 783,238 | 751,227 | 736,246 | -2.0 |
| පළාත් සභා සහ පළාත් පාලන ආයතන | අනුමත | 394,812 | 412,560 | 428,433 | 440,560 | 444,348 | 444,174 | 446,025 | 441,748 | 463,078 | 463,365 * | 0.1 |
| | තත්‍ය | 374,330 | 372,033 | 385,311 | 392,528 | 400,897 | 390,061 | 389,105 | 398,528 | 395,758 | 400,950* | 1.3 |
| **සමස්ත රාජ්‍ය සේවය** | **අනුමත** | **1,253,492** | **1,286,606** | **1,309,404** | **1,333,069** | **1,350,612** | **1,450,450** | **1,459,444** | **1,459,767** | **1,493,750** | **1,424,755** | -4.6 |
| | **තත්‍ය** | **1,097,280** | **1,126,581** | **1,141,650** | **1,135,488** | **1,141,471** | **1,195,863** | **1,181,422** | **1,181,766** | **1,146,985** | **1,137,196** | -0.9 |
| රාජ්‍ය ව්‍යවසාය | අනුමත | 244,800 | 234,220 | 242,194 | 248,625 | 251,419 | 251,440 | 255,545 | 255,650 | 254,559 | 255,678 ** | 0.4 |
| | තත්‍ය | 219,583 | 226,695 | 233,849 | 235,145 | 236,293 | 227,253 | 219,838 | 212,117 | 206,875 | 198,951 ** | -3.8 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **අනුමත** | **1,498,292** | **1,520,826** | **1,551,598** | **1,581,694** | **1,602,031** | **1,701,890** | **1,714,989** | **1,715,417** | **1,748,309** | **1,680,433** | -3.9 |
| | **තත්‍ය** | **1,316,863** | **1,353,276** | **1,375,499** | **1,370,633** | **1,377,764** | **1,423,116** | **1,401,260** | **1,393,883** | **1,353,860** | **1,336,147** | -1.3 |
| අනුමත සේවක සංඛ්‍යා උපයෝජන අනුපාතය (%) | | 88 | 89 | 89 | 87 | 86 | 84 | 82 | 81 | 77 | 80 | |
| සමුච්චිත විශ්‍රාමිකයින් සංඛ්‍යාව | | 564,472 | 579,414 | 585,670 | 617,386 | 639,984 | 660,934 | 672,196 | 676,430 | 704,795 | 725,119 | 2.9 |

මූලාශ්‍රය: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

අනුමත - අනුමත සේවක සංඛ්‍යාව

තත්‍ය - තත්‍ය සේවක සංඛ්‍යාව

* පළාත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවක සංඛ්‍යාව ඇතුළුව

** පළාත් රාජ්‍ය ව්‍යවසායන්හි සේවක සංඛ්‍යාව හැර

අවශ්‍යතා පාදක කර ගත් අනුමැතීන් මගින් අනුමත සේවක සංඛ්‍යාව ප්‍රතිනියුක්ත කිරීම, තෝරා ගත් අංශ සහ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම, ඩිජිටල්කරණ විසඳුම් ඒකාබද්ධ කිරීම, මූලික නොවන තාක්ෂණික සහ වෘත්තීමය කාර්යයන් බාහිර පාර්ශ්ව ලවා ඉටු කරවා ගැනීම, ආයතනික ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කර ක්‍රියාවට නැංවීම සහ කාර්යය මණ්ඩල සංචිත පවත්වා ගැනීම වැනි සම්පත් බෙදා හැරීමේ යන්ත්‍රණ අන්තර්ගත වේ.


## 10.2 2024 වර්ෂයේ සේවක සංඛ්‍යා කළමනාකරණය

රාජ්‍ය අංශය අමාත්‍යාංශ, විශේෂ වියදම් ඒකක, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා, ත්‍රිවිධ හමුදා සහ රජය සතු ව්‍යවසායවලින් සමන්විත වේ.

2024 වර්ෂය අවසානය වන විට, රාජ්‍ය අංශයේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 1,680,433ක් වූ අතර එය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 3.9ක සැලකිය යුතු පහත වැටීමක් සනිටුහන් කරයි. මෙම පහළ යෑමෙන් රාජ්‍ය අංශයේ ස්ථාවර සේවක සංඛ්‍යාවක් පවත්වා ගෙන යාම පිණිස රජය විසින් අනුගමනය කළ උපායමාර්ගික ක්‍රියාමාර්ග මූලික වශයෙන් පිළිබිඹු වේ. නව තනතුරු ඇති කිරීම සීමා කිරීම සහ අත්‍යවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීම මෙම ප්‍රධාන පියවර අතරට ඇතුළත් විය. විශේෂයෙන්ම, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසුරුවා හැරීමට රජය විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණයට අනුව බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුරු 100,000 විධිමත් පරිදි යටපත් කිරීම ද මෙම පහත වැටීමට හේතු විය.

එයට සමගාමීව, 2023 වර්ෂයේ 1,353,860 සිට 2024 වර්ෂයේ 1,336,147ක් බවට පත් වූ රාජ්‍ය අංශයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව ද සියයට 1.3ක සුළු පහත වැටීමක් පෙන්නුම් කළේය. නව බඳවා ගැනීම් අත්හිටුවීම, නව තනතුරු ඇති කිරීම සීමා වීම සහ සේවක විශ්‍රාම ගැනීම් මෙම පහත වැටීමට හේතු විය. ඒ අනුව, අනුමත මුළු තනතුරු සංඛ්‍යාවට සාපේක්ෂ සේවක උපයෝජන අනුපාතය 2023 වර්ෂයේ සියයට 77ක අගයේ සිට 2024 වර්ෂය අවසානය වන විට සියයට 80ක අගයක් දක්වා වර්ධනය විය.

රූප සටහන 10.1 | රාජ්‍ය අංශයේ මුළු සේවක සංඛ්‍යාව (2015-2024)




මූලාශ්‍රය: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 10.3. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා උපයෝජනය - 2024

වගු අංක 10.2 | රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා උපයෝජනය - 2024

| ආයතන කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යා උපයෝජන අනුපාතය |
|---|---|---|---|
| අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක සහ ත්‍රිවිධ හමුදා | 961,390 | 736,246 | 77% |
| පළාත් සභා | 463,365 | 400,950 | 87% |
| රාජ්‍ය ව්‍යවසාය | 255,678 | 198,951 | 78% |
| **එකතුව** | **1,680,433** | **1,336,147** | **80%** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 10.4. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ආංශික ව්‍යාප්තිය (ත්‍රිවිධ හමුදා සහ පළාත් සභා හැර)

2024 වර්ෂය අවසාන වන විට, රාජ්‍ය සේවය තුළ පවතින, අමාත්‍යාංශ සඳහා අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 213,825ක් විය. මෙම අනුමත මුළු තනතුරු සංඛ්‍යාවෙන් සියයට 86.7ක්ම සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වේ. එමෙන්ම, අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 101,654ක් එනම් සියයට 47.5ක් දේශීය වෛද්‍ය අංශය ද ඇතුළුව සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වේ. මෙයට වෛද්‍ය නිලධාරීන්, හෙද නිලධාරීන් සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ඖෂධවේදීන්, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන් වැනි අතුරු වෛද්‍ය හා වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්හි කාර්ය මණ්ඩල සහ සෞඛ්‍ය කාර්ය සහායකයින් වැනි විවිධ වෘත්තික පිරිස් මෙන්ම රෝහල්, සෞඛ්‍ය සේවා ඒකක, ආයතන සහ මහජන සෞඛ්‍ය වැඩසටහන්වල සේවයේ නිරත සෙසු පිරිස් ද ඇතුළත්ය.


එයට අමතරව, අධ්‍යාපන අමාත්‍යාංශය 83,770ක අනුමත තනතුරු සංඛ්‍යාවකින් සමන්විත වේ. මෙයට ජාතික පාසල්වල සේවය කරන විදුහල්පතිවරු, ගුරුවරු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල, පිරිවෙන්වල පරිවේණාධිපතිවරු සහ පරිවේණාචාර්යවරු මෙන්ම අධ්‍යාපන විද්‍යා පීඨ සහ ගුරු විද්‍යාලවලට අනුබද්ධ කාර්ය මණ්ඩල ඇතුළත් වේ.

මූලිකවම, සංවර්ධන නිලධාරීන්ගේ අතිරික්තය හේතුවෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමහරක කාර්ය මණ්ඩල මට්ටම් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ගොස් තිබෙන අතර අතිරේක කාර්ය මණ්ඩල අවශ්‍ය ආයතන හඳුනා ගැනීමට සහ ඒ අනුව එම අතිරික්ත නිලධාරීන් සේවයේ ප්‍රතිනියුක්ත කිරීමට පහසුකම් සැලසීමට දැනට පියවර ගනිමින් පවතී.

## 10.5. සේවා මට්ටම අනුව රාජ්‍ය සේවයේ තනතුරු ව්‍යාප්තිය (ත්‍රිවිධ හමුදා සහ රජය සතු ව්‍යවසායන් හැර)

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය, සපයනු ලබන සේවාවේ ස්වභාවය පදනම් කර ගත් වර්ගීකරණයක් මත ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික සහ ජ්‍යෙෂ්ඨ වශයෙන් ධුරාවලි මට්ටම් හතරකට ව්‍යුහගත කර ඇත. පිළිගත් කළමනාකරණ සහ පරිපාලන මූලධර්ම අනුව, සේවා නියුක්ති ධුරාවලිය පිරමීඩාකාර ව්‍යුහයක ස්වරූපයක් ගැනීම අපේක්ෂා කෙරේ. කෙසේවුවද, වත්මන් ප්‍රවණතා මෙම ආකෘතියෙන් සැලකිය යුතු අපගමනයක් පෙන්නුම් කරයි. විශේෂයෙන්ම, රාජ්‍ය සේවා ශ්‍රම බලකායෙන් සියයට 67.2ක් ද්විතීයික මට්ටම තුළ සංකේන්ද්‍රණය වී ඇති අතර පහළම ස්තරය නියෝජනය කරන ප්‍රාථමික මට්ටම තුළ සියයට 24.9ක සේවක පිරිසක් ඇතුළත්ව සිටිති.

රූප සටහන 10.2 | රාජ්‍ය සේවයේ සේවක සංඛ්‍යා ව්‍යාප්තිය




මූලාශ්‍රය: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

වගු අංක 10.3 | 2024.12.31 දිනට රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලය (ත්‍රිවිධ හමුදා සහ පළාත් සභා හැර)

| ආයතනය | අනුමත කාර්ය මණ්ඩලය | % | තත්‍ය කාර්ය මණ්ඩලය | % | පුරප්පාඩු සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ | 213,825 | 32.7 | 174,698 | 34.0 | 39,127 | 18.3 |
| දෙපාර්තමේන්තු | 364,926 | 55.9 | 274,375 | 53.4 | 90,551 | 24.8 |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 54,533 | 8.4 | 55,242 | 10.7 | -709 | |
| විශේෂ වියදම් ඒකක | 19,690 | 3.0 | 9,759 | 1.9 | 9,931 | 50.4 |
| **සමස්ත කාර්ය මණ්ඩලය** | **652,974** | **100** | **514,074** | **100** | **138,900** | **21.3** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

අධ්‍යාපන සහ සෞඛ්‍ය වැනි ප්‍රධාන අංශ බහුතර වශයෙන් ද්විතීයික මට්ටමට අයත් ගුරුවරුන්, කළමනාකරණ සේවා නිලධාරීන්, හෙද නිලධාරීන්, අතුරු වෛද්‍ය හා පරිපූරක වෘත්තීය සේවාවල නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත වේ. රාජ්‍ය සේවයේ ධුරාවලිය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ප්‍රාථමික සහ ද්විතීයික යන මට්ටම් දෙකෙහිම සැලකිය යුතු ප්‍රසාරණයක් සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ තිරසරබව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම පිණිස මෙම සේවා මට්ටම් දෙකෙහි කාර්ය මණ්ඩල සංයුතිය පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කිරීම වැදගත් වේ.

**වගු අංක 10.4 | වෘත්තිය අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව - 2024.12.31 දිනට**

| වෘත්තිය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| පරිපාලන | 3,224 | 2,266 | 958 |
| අධ්‍යාපන පරිපාලන | 2,492 | 1,420 | 1,072 |
| ගණකාධිකාරී | 2,078 | 1,463 | 615 |
| සැලසුම් | 1,283 | 793 | 490 |
| විද්‍යාත්මක සේවා | 689 | 415 | 274 |
| වාස්තු විද්‍යාඥ | 70 | 56 | 14 |
| ඉංජිනේරු | 1,532 | 1,080 | 452 |
| සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය | 1,028 | 697 | 331 |
| ආයුර්වේද වෛද්‍ය | 2,913 | 2,299 | 614 |
| මිනින්දෝරු | 1,300 | 822 | 478 |
| කෘෂිකර්ම | 1,185 | 670 | 515 |
| වෛද්‍ය | 27,799 | 26,429 | 1,370 |
| **දීප ව්‍යාප්ත සේවාවල කාර්ය මණ්ඩලය** | **45,593** | **38,410** | **7,183** |
| හෙද නිලධාරී | 43,144 | 39,798 | 3,346 |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | 11,758 | 8,600 | 3,158 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 2,733 | 2,068 | 665 |
| ගුරු | 267,970 | 235,615 | 32,355 |
| විදුහල්පති (ශ්‍රී ලංකා විදුහල්පති සේවය/ශ්‍රී ලං.අ.ප.සේ.) | 16,393 | 10,968 | 5,425 |
| සංවර්ධන නිලධාරී | 77,796 | 102,681 | 0 |
| කළමනාකරණ සේවා නිලධාරී | 48,549 | 39,078 | 9,471 |
| ග්‍රාම නිලධාරී (පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරද ඇතුළත්ව) | 14,379 | 11,451 | 2,928 |
| සමෘද්ධි සංවර්ධන නිලධාරී | 20,137 | 17,678 | 2,459 |
| කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර | 10,400 | 6,764 | 3,636 |
| ආරක්ෂක සේවාවල සිවිල් කාර්ය මණ්ඩලය (දීප ව්‍යාප්ත සේවා සහ ඒකාබද්ධ සේවා හැර) | 14,173 | 8,768 | 5,405 |
| පොලිස් නිලධාරී/විශේෂ කාර්ය බලකාය (නිල ඇඳුම් කාර්ය මණ්ඩලය) | 113,027 | 83,819 | 29,208 |
| ග්‍රාමාරක්ෂක/සිවිල් ආරක්ෂක | 29,790 | 25,122 | 4,668 |
| තැපැල් (දෙපාර්තමේන්තුගත) | 26,634 | 20,337 | 6,297 |
| රියදුරු සේවය | 11,416 | 8,865 | 2,551 |
| කාර්යාල සේවක සේවය | 24,049 | 21,600 | 2,449 |
| දුම්රිය (දෙපාර්තමේන්තුගත) | 16,719 | 13,266 | 3,453 |
| ත්‍රිවිධ හමුදා (නිල ඇඳුම් කාර්ය මණ්ඩලය) | 290,684 | 211,064 | 79,620 |
| වෙනත් | 334,922 | 227,962 | 106,960 |
| **රජයේ සහ පළාත් සභාවල සමස්ත කාර්ය මණ්ඩලය** | **1,420,266** | **1,133,914** | **286,352** |
| රාජ්‍ය ව්‍යවසායන්හි කාර්ය මණ්ඩලය | 260,167 | 202,233 | 57,934 |
| **රජය + පළාත් සභා + රාජ්‍ය ව්‍යවසාය සමස්ත කාර්ය මණ්ඩලය** | **1,680,433** | **1,336,147** | **344,286** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

වෘත්තිය සහ සේවා කාණ්ඩය අනුව රාජ්‍ය සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පිළිබඳව සිදු කරන විශ්ලේෂණයකින් රාජ්‍ය සේවයේ වත්මන් ව්‍යාප්තිය පිළිබඳව මනා අවබෝධයක් ලැබේ. ප්‍රශස්ත සේවක සංඛ්‍යා කළමනාකරණය පිළිබඳ තීරණවලට එළඹීමේ දී එම තොරතුරු පාදක කර ගැනීම සුදුසු වේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය වැටුප් කේත 62කට අධික සංඛ්‍යාවක් යටතේ වර්ගීකරණය කරන ලද පුළුල් තනතුරු මාලාවකින් සමන්විත වේ. මෙම වර්ගීකරණයන් තුළ දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා, දෙපාර්තමේන්තුගත සේවා සහ තෝරා ගත් විශේෂ සේවා ආදිය ඇතුළත් වේ.

## 10.6. රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය ප්‍රශස්ත කිරීම හා සැබැඳි අභියෝග සහ උපායමාර්ගික පියවර

රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායී අයුරින් කළමනාකරණය කිරීමේදී අඛණ්ඩව අභියෝග රාශියකට මුහුණ දී ඇත. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ සමාජ සුබසාධනය වැනි අත්‍යවශ්‍ය සේවා බොහෝ අවස්ථාවලදී සහනාධාර වශයෙන් හෝ නොමිලේ සැපයීමේ මූලික වගකීම රජය දරන බැවින් මෙම කාර්යයන් පවත්වා ගෙන යාම සඳහා සැලකිය යුතු ශ්‍රම බලකායක් අවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රාජ්‍ය අංශයේ ප්‍රමාණය කාලානුරූපීව සැලකිය යුතු අයුරින් වර්ධනය වී ඇත.

රැකියා සුරක්ෂිතතාව, දායකත්ව නොවන විශ්‍රාම වැටුප් ක්‍රමය සහ හිමි වන සමාජ පිළිගැනීම හේතුවෙන් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය බෙහෙවින් ආකර්ශනීයව පවතින්නකි. මේ සඳහා වන ඉහළ මනාපය බොහෝ විට සත්‍ය ආයතනික අවශ්‍යතා ඉක්මවා යමින් රජයේ රැකියා සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව ඉහළ යාමට දායක වී ඇත.

එමෙන්ම, රාජ්‍ය පරිපාලනයේ වැදගත්ම අංගයක් වන සේවක සංඛ්‍යා කළමනාකරණය තුළ රාජ්‍ය අංශයේ මානව සම්පත් සැලසුම් කිරීම, බෙදා හැරීම සහ සංවර්ධනය අන්තර්ගත වේ. කෙසේ වුවද, රජයන් වෙනස්වීමත් සමග බොහෝ අවස්ථාවලදී, සේවක සංඛ්‍යා කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්තීන් ද වෙනස්කම්වලට ලක්වේ. බොහෝවිට, විවිධ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් එම රජයන්ගේ ඉදිරි දැක්ම සහ ප්‍රමුඛතාවලට අනුරූපව නව උපායමාර්ග සහ ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ලැබේ. නවීකරණය සහ ප්‍රතිසංස්කරණය උදෙසා එවැනි වෙනස්කම් ඇතැම්විට අවශ්‍ය වුවද නිරන්තර සහ ස්වයං අභිප්‍රේරිත වෙනස්කම් සේවක සංඛ්‍යා කළමනාකරණයේ අස්ථාවරත්වය සහ අවිධිමත්බව ඇති කිරීමට හේතු විය හැක.

එබැවින්, ඉදිරි බඳවා ගැනීම් ආයතනික අවශ්‍යතාවලට අනුකූලව සිදු වීම සහතික වනු පිණිස බඳවා ගැනීම් සඳහා වන සියලුම යෝජනා අදාළ රේඛීය අමාත්‍යාංශයේ හෝ බලධරයාගේ නිර්දේශ සමග ඉදිරිපත් කළ යුතුය. මෙම බඳවා ගැනීම් සූක්ෂ්ම වැඩ අධ්‍යයන සහ ප්‍රශස්ත කාර්ය මණ්ඩලය පිළිබඳ පැහැදිලි හඳුනා ගැනීමක් මත පදනම් වීම අවශ්‍ය වේ. වැඩිදුරටත් සිදු කරන ගැඹුරු විශ්ලේෂණ හරහා පමණක් එවැනි යෝජනා ගැන සැලකිය යුතුය. එසේම පැවති මහජන හිතෛෂී අභිමානවත් රාජ්‍ය සේවය නැවත ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව දැඩිව පවතින බැවින් රාජ්‍ය සේවයේ පෙරගමන්කරුවා වන සිවිල් සේවය නැවත ප්‍රතිසංවිධානය කර අවශ්‍ය ප්‍රතිසංස්කරණවලට ලක් කර ස්ථාපිත කිරීම කාලෝචිත වේ. සන්නද්ධ හමුදා සහ සෞඛ්‍ය සත්කාර වැනි අංශවල සේවක සංඛ්‍යා කළමනාකරණය ද ඒ හා සමානව සුදුසු පරිදි ප්‍රතිසංස්කරණයන්ට භාජනය විය යුතුය.

එමෙන්ම, විස්තීර්ණ අධ්‍යයනයක් හරහා රාජ්‍ය ආයතනවල කාර්යයන් ද්විකරණය වීම අවම කර ගැනීම සහ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් දැනුවත්භාවය අනවශ්‍ය බඳවා ගැනීම් අවම කර ගැනීමට රුකුලක් වනු ඇත. විශේෂයෙන්ම ඒකාබද්ධ සේවාවන් අතර අතිච්ඡාදනය වන වගකීම් පිළිබඳ සමාලෝචනය කිරීම අත්‍යවශ්‍ය වේ. ක්ෂේත්‍ර කාර්යයන් සඳහා සැබෑ සේවා අවශ්‍යතා පදනම්ව මධ්‍යගත සේවක සංචිත උපරිමයෙන් භාවිත කිරීම මගින් සේවක පිරිසේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කර ඔවුන් ප්‍රශස්ත අයුරින් උපයෝජනය කර ගත හැකිය.

රාජ්‍ය අංශයේ සමස්ත මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවනු පිණිස නැගී එන තාක්ෂණයන් සහ වැඩි දියුණු වන දැනුම් ක්ෂේත්‍ර සැලකිල්ලට ගෙන සේවකයින්ට අවශ්‍ය වන නිපුණතා හඳුනා ගැනීම සඳහා පුළුල් පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කළ යුතුවේ. එම සොයා ගැනීම් මත පදනම්ව, ව්‍යුහගත පුහුණු සහ ධාරිතා සංවර්ධන සැලැස්මක් සම්පාදනය කිරීම ද කළ යුතුය. මෙම සැලැස්ම තුළ විධිමත් සේවාරම්භක පුහුණුව, ආයතනගත පුහුණුව, සේවකයින් උපායමාර්ගිකව නැවත බෙදා හැරීම, ආයතනික ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය, ආයතන ප්‍රතිව්‍යුහගතකරණය ඇතුළු ක්‍රියාමාර්ග මාලාවක් මෙන්ම ඩිජිටල් පරිවර්තන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම ද ඇතුළත් විය යුතුය.

තවද, අදාළ අමාත්‍යාංශ තුළ භාෂා පරිවර්තන සහ තොරතුරු තාක්ෂණ වෘත්තීන් වැනි විශේෂිත නිශ්චිත සේවා සඳහා සම්පත් සංචිත යන්ත්‍රණ යොදා ගැනීම රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගැනීමට දායක වනු ඇත. මෙම භූමිකා එක් එක් ආයතනයන්ට පැවරීම වෙනුවට, මානව සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කර ගැනීම සහතික කරමින් ඉල්ලුම මත පදනම්ව විවිධ ආයතනවලට බෙදා දිය හැකිය.

අවසාන වශයෙන්, මෙහෙයුම් කාර්යක්ෂමතාව තවදුරටත් වැඩි දියුණු කිරීම සහ බාහිර පාර්ශ්වයන් වෙත පැවරීමට හැකි කාර්යයන් පැහැදිලිව හඳුනා ගෙන සුදුසු අවස්ථාවලදී බාහිර සේවා සපයන්නන් යොදවා ගැනීම සුදුසු වේ. මෙමගින් සමස්ත සේවා සැපයුම සහ පිරිවැය ඵලදායිතාව වැඩි දියුණු කරන අතරම මුඛ්‍ය කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීමට රාජ්‍ය ආයතනවලට අවකාශ සැලසේ.

**විශේෂ සටහන 10.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය සඳහා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් නෛතික බලය ලබා දීම**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත බලාත්මක කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලන රාමුව ශක්තිමත් කිරීමට අදාළ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එම පනතේ ප්‍රමුඛ ප්‍රතිපාදන අතරින්, 63 වන වගන්තිය මගින් රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යා කළමනාකරණය සඳහා ශක්තිමත් නෛතික පදනමක් හඳුන්වා දෙන අතර එමගින් රාජ්‍ය අංශය තුළ මානව සම්පත් යොදවා ගැනීමේදී කාර්යක්ෂමතාව, වගවීම සහ මූල්‍ය විනය සනාථ කිරීමට අදාළ මුදල් අමාත්‍යාංශයේ කේන්ද්‍රීය කාර්යභාරය යළි තහවුරු කරයි.

එම පනතේ 63 වන වගන්තියට අනුව, රාජ්‍ය ආයතනවල තනතුරු ඇති කිරීම, සංශෝධනය කිරීම හෝ යටපත් කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් මුදල් අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නීත්‍යානුකූලව ලබා ගැනීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාමාර්ගය මගින් පාලනයකින් තොරව සේවක සංඛ්‍යාව ප්‍රසාරණය වීම වැළැක්වීම, කාර්යයන් ද්විකරණය වීම වැළක්වීම සහ රාජ්‍ය ආයතන සිය මානව සම්පත් ව්‍යුහයන් සිය ආයතනවල අනුමත කාර්යභාරයන්, අයවැය ප්‍රතිපාදන සහ ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුගත කිරීම සහතික කිරීම අපේක්ෂා කෙරේ.

මෙම වගන්තිය මගින්, රාජ්‍ය සේවය තුළ සේවක සංඛ්‍යාව සැලසුම් කිරීම සම්බන්ධ සමායෝජිත ප්‍රවේශයක් සඳහා සහාය වීමට මෙන්ම කාර්ය මණ්ඩල ව්‍යුහ සම්බන්ධ දෘඪ අධීක්ෂණයක් සිදු කිරීමට හැකි නෛතික බලගැන්වීමක් මුදල් අමාත්‍යවරයාගේ නියමය යටතේ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත හිමි කර දෙයි. එමගින්, සේවක සංඛ්‍යා කළමනාකරණය වඩා පුළුල් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සමග ඒකාබද්ධ කිරීම පහසුකාරක වන අතර, විනිවිදභාවය සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිත කිරීම ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

පැහැදිලි නෛතික බලධාරිත්වයක් සහ ක්‍රියාපටිපාටිමය සුරක්ෂිතතාවන් ස්ථාපිත කිරීම තුළින් ආයතනික වගවීම ශක්තිමත් කර රාජ්‍ය ආයතන තුළ තිරසර සහ ප්‍රතිචාරාත්මක මානව සම්පත් කළමනාකරණයට අවශ්‍ය පදනම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 63 වන වගන්තියෙන් සම්පාදනය කර ඇත.

# IV කොටස

## මූල්‍ය ප්‍රකාශ

මූල්‍ය ප්‍රකාශ

## පාඨකයින් සඳහා සටහන්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, අදාළ කරගනු ලැබූ ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් ඇතුළත් 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශ මේ සමඟ ඉදිරිපත් කෙරේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මගින් රජයේ වත්කම් හා බැරකම් පිළිබඳව පෙන්නුම් කරන අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය මගින් ආදායම් එකතු කිරීම සම්බන්ධ රජයේ කටයුතු හා 2023 දෙසැම්බර් 13 දිනැති අංක 34 දරණ විසර්ජන පනත මගින් 2024 වර්ෂය සඳහා විශේෂ වියදම් ඒකක විසිඑකක් (21), රජයේ අමාත්‍යාංශ විසිනවයක් (29), රජයේ දෙපාර්තමේන්තු අනූ අටක් (98) සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසිපහක් (25) සඳහා ලබාදෙනු ලැබූ සම්පත් භාවිතා කළ ආකාරය පෙන්නුම් කෙරේ. තව ද මෙම මූල්‍ය ප්‍රකාශන මගින් වාණිජමය රාජ්‍ය සංස්ථා පනස් තුනක් (53), රජයට අයත් සමාගම්/වැවිලි සමාගම්/ඇමෙරිකානු ඩොලර්වලින් ප්‍රකාශිත සමාගම් ඇතුළත් ආයතන එකසිය එකක් (101), සංවර්ධන බැංකු එකක (01) රජයේ ප්‍රාග්ධන දායකත්වය හෝ කොටස් හිමිකම මෙන්ම, පළාත් සභා නවය (09) සඳහා මධ්‍යම රජය විසින් වෙන් කරන ලද මූල්‍ය සම්පත් පිළිබඳ තොරතුරු හෙළිදරව් කෙරේ.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඇති විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කළ යුතු වේ. මීට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 හා 150 වගන්තිවලට යටත්ව එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බැවින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සෑමවිටම අනුගමනය කළ නොහැක. ඒ අනුව, එලෙස බැහැර වන අවස්ථාවලදී එම බැහැරවීම්වලට හේතු හා අදාළ කරගත් විකල්ප ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කරනු ලැබේ.

වැඩිදියුණු කළ මුදල් පදනම ගිණුම් ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගනු ලබන අතර එහිදී මුදල් පදනම යටතේ සිදුකරන ලද ගනුදෙනු තුළින් පැන නැගුණු වත්කම් හා බැරකම් හැකිතාක්දුරට මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සඳහා පියවර ගෙන ඇත.

පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ මෘදුකාංගය (සිගාස්) වැඩසටහන 2015 වර්ෂයේ සිට මූල්‍ය නොවන වත්කම් තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළින් වාර්තා කිරීමට හැකි වන පරිදි තවදුරටත් නවීකරණය කර ඇත.

## වගකීම පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 හා 150 වගන්තිවලට, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට හා අදාළ භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුකූල වන අතර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මගින් අනාවරණය කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇත.

වාර්තාකරනු ලබන ගනුදෙනු ව්‍යවස්ථාපිත අධිකාරී බලය යටතේ සිදුකරනු ලැබූ බවට හා විසර්ජන පනත හෝ වෙනත් කිසියම් නීතියක් යටතේ ලබාදෙනු ලැබූ ප්‍රතිපාදන භාවිතය පිළිබඳව නිසිපරිදි වාර්තාකර ඇති බව සාධාරණව සහතික වනු පිණිස අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම හා පවත්වාගෙනයාම මහා භාණ්ඩාගාරයේ වගකීම වේ.

මේ සමඟ ඇති "ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශය" හා "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද අධිකාරිය වේ.



ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.



කේ.එම්. මහින්ද සිරිවර්ධන
ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන, සහ
භාණ්ඩාගාර ලේකම්

මහා භාණ්ඩාගාරය
කොළඹ - 01
2025.03.24

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | සටහන | 2024 | 2023 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **අඟය හුවමාරු නොවන ගනුදෙනු** | | | |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1 | 2,193,551,276,468 | 1,412,863,124,621 |
| ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 2 | 481,277,760,408 | 392,449,993,183 |
| ආදායම් බදු | 3 | 1,026,198,562,675 | 911,355,309,961 |
| දඩමුදල් හා රාජසන්තක කිරීම් | 4 | 10,708,177,994 | 8,310,563,255 |
| විදේශීය ප්‍රදානයන් | 5 | 59,968,730,784 | 25,501,817,303 |
| විනිමය ලාභය | 6 | 1,700,523,042,348 | 1,535,584,947,835 |
| | | **5,472,227,550,677** | **4,286,065,756,158** |
| **අඟය හුවමාරු ගනුදෙනු** | 7 | 349,671,549,400 | 353,550,136,968 |
| | | **349,671,549,400** | **353,550,136,968** |
| **අනෙකුත් ආදායම්** | 8 | **1,110,150,162** | **515,895,718** |
| **මුළු ආදායම්** | | **5,823,009,250,238** | **4,640,131,788,843** |
| **වියදම්** | | | |
| සේවක පිරිවැය | 9 | 728,637,059,726 | 672,636,369,933 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 10 | 512,998,335,850 | 439,642,655,314 |
| සහනාධාර, ප්‍රදානයන් සහ මාරුකිරීම් | 11 | 1,551,780,318,606 | 1,317,698,501,982 |
| මූල්‍ය පිරිවැය | 12 | 2,715,276,291,398 | 2,458,179,310,254 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 13 | 202,452,733,785 | 388,580,289,347 |
| | | **5,711,144,739,366** | **5,276,737,126,829** |
| **කාලච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාවය)** | | **111,864,510,872** | **(636,605,337,986)** |

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

### 2023 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2024 | 2023 (සංශෝධිත) |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| දේපළල පිරියත හා උපකරණ | 14 | 4,563,166,869,835 | 2,537,166,871,940 |
| පොදු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය | 15 | 105,730,725,413 | - |
| සාමාජික ගාස්තු ගෙවීම් | 16 | 2,900,368,322 | 2,900,368,322 |
| රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය | 17 | 2,493,231,765,866 | 2,407,633,120,834 |
| මුද්දර තොග ගිණුම | | 2,003,464,229 | 2,059,996,426 |
| කුලී සහ වැඩ අත්තිකාරම් | 18 | 1,260,896,738 | 1,202,805,885 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම් | 19 | 16,761,960,629 | 16,502,219,035 |
| උපණය | 20 | 195,004,063,429 | 190,789,890,831 |
| රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් | 21 | 32,459,591,739 | 30,911,741,726 |
| මුදල් හා මුදල් සමාන දෑ | 22 | 946,691,700,543 | 731,744,112,582 |
| **මූල්‍ය වත්කම්** | | **8,359,211,406,744** | **5,920,911,127,582** |
| **ව්‍යවස්ථාපිත සහ වෙනත් අරමුදල්** | | | |
| අවිනිශ්චිත අවස්ථා අරමුදල | | 500,000,000 | 500,000,000 |
| විදේශ ණය ගැලපුම් ගිණුම | 23 | 54,163,229,354 | 57,388,881,470 |
| විවිධ අරමුදල් | 24 | 3,788,102,959 | 3,245,546,327 |
| පොදු අරමුදල | 25 | (20,951,036,183,468) | (22,860,233,851,636) |
| **මුළු අරමුදල්** | | **(20,892,584,851,155)** | **(22,799,099,423,840)** |
| **වගකීම්** | | | |
| රාජ්‍ය ණය ගැනීම් | 26 | 29,627,609,630,786 | 29,150,389,313,012 |
| විවිධ ගිණුම් | 27 | (21,626,540,752) | (19,144,204,151) |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා වූ මෙහෙයුම් ගිණුම් | 28 | (564,707,594,039) | (611,092,931,190) |
| තැන්පතු | 29 | 105,243,946,916 | 94,412,676,683 |
| බැංකු අයිරාව | 22 | 105,276,814,988 | 105,445,697,067 |
| **මුළු වගකීම්** | | **29,251,796,257,898** | **28,720,010,551,421** |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **8,359,211,406,744** | **5,920,911,127,582** |

මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරන පරිචයන් හා අදාළ භාණ්ඩාගාර වක්‍රලේඛවලට අනුකූල වන අතර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මගින් අනාවරණය කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇත.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

කේ.එම්. මහින්ද සිරිවර්ධන

ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර ලේකම්

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය 2024 රු. | තත්‍ය 2023 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු ලැබීම් | 3,701,027,599,551 | 2,716,668,427,765 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 96,442,457,759 | 94,272,300,123 |
| ලාභ | 33,190,901,922 | 60,496,772,520 |
| වෙනත් ලැබීම් | 165,093,217,383 | 165,642,244,381 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා වූ මෙහෙයුම් ගිණුම් | 46,385,337,151 | - |
| මුද්දර තොග ගිණුම | 56,532,197 | - |
| තැන්පතු | 10,831,270,233 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **4,053,027,316,195** | **3,037,079,744,790** |
| **අඩුකලා: මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,444,088,129,361 | 1,500,859,314,593 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,551,780,318,606 | 1,317,698,501,982 |
| මූල්‍ය පිරිවැය | 2,715,276,291,398 | 2,458,179,310,254 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා අත්තිකාරම් | 259,741,595 | 408,326,052 |
| තැන්පතු | - | 6,738,650,653 |
| මුද්දර තොග ගිණුම | - | 212,713,938 |
| රජයේ දෙපාර්තමේන්තු සඳහා වූ මෙහෙයුම් ගිණුම් | - | 132,760,978,218 |
| රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | 1,547,850,013 | 442,335,236 |
| විවිධ ගිණුම් | 2,482,336,601 | 33,654,727,465 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ආ)** | **5,715,434,667,574** | **5,450,954,858,391** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)** | **(1,662,407,351,379)** | **(2,413,875,113,602)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | 57,763,627,787 | 26,245,034,955 |
| ලාභාංශ | 7,889,522,543 | 15,204,348,243 |
| භිමිකම් ඉවත්වීමේ උත්පාදන හා භෞතික වත්කම් විකිණීම් | 1,110,150,162 | 515,895,718 |
| උපණය අයකර ගැනීම් | 27,841,380,590 | 276,274,960,094 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඈ)** | **94,604,681,081** | **318,240,239,010** |
| **අඩුකලා: මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 476,457,276,590 | 385,393,946,314 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **476,457,276,590** | **385,393,946,314** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ)-(ඉ)** | **(381,852,595,509)** | **(67,153,707,305)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | **(2,044,259,946,888)** | **(2,481,028,820,906)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | 2,853,612,273,223 | 7,541,281,621,843 |
| විදේශීය ණය ගැනීම් | 3,967,308,481,863 | 831,951,611,110 |
| ප්‍රදානයන් ලැබීම් | 59,968,730,784 | 25,501,817,303 |
| විවිධ ගිණුම් | 542,556,632 | 438,229,938 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **6,881,432,042,502** | **8,399,173,280,196** |
| **අඩුකලා: මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | 984,762,291,729 | 4,674,904,561,952 |
| විදේශීය ණය ආපසු ගෙවීම් | 3,634,067,681,728 | 337,296,566,144 |
| විදේශ ණය ගැලපුම් ගිණුම | 3,225,652,116 | 15,100,463,063 |
| ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් | - | 235,638,700,400 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **4,622,055,625,573** | **5,262,940,291,560** |
(අ) ගිණුම්කරණ මූලධර්ම මත පදනම්ව පිළියෙල කර ඇති ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා ඇති පොදු අරමුදලේ ආරම්භක ශේෂයට සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හෝ ඌනතාවයත්, අතීතානුයෝගීව සිදු කරනු ලබන අනෙකුත් ගැලපීම් (Retrospective Adjustments) ඇතුළු සමාලෝචිත වර්ෂයට අදාල වූ ගැලපීම් ඇතුලත් කළ යුතුය. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ විචලනයන්ගෙන් ඒකාබද්ධ අරමුදලේ විචලනයන් සමඟ හිලව් විය යුතු ශේෂයන් සහ විදේශ විනිමය විචලන ලාභය ඉවත් කර අතීතානුයෝගී ගැලපීම් ලෙස, වත්කම් වලින් සිදු වූ බලපෑම් සහ ණය ලබා ගැනීම් වලින් සිදු වූ බලපෑම් ගලපා පොදු අරමුදලේ අවසාන ශේෂය ගණනය කර ස්කන්ධය / ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා තිබුණි. මේ හේතුවෙන් අතීතානුයෝගීව ගැලපීම් නොකළ යුතු ගැලපීම්ද ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට වක්‍ර ලෙස ගැලපී තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් වලට සිදු කරන ලද ගැලපීම්, විදේශීය හා දේශීය ණය ශේෂයන්ට සිදු කරන ලද ගැලපීම් හා වැරදි නිවැරදි කිරීමේ ගැලපීම් පොදු අරමුදලට වක්‍ර ලෙස ගැලපී තිබීම නිසා ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර ඇති ආකාරය ගිණුම්කරණ මූලධර්ම අනුව නිවැරදි නොවන බවත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට එම ගැලපීම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට නොහැකි බවත් නිරීක්ෂණය විය.

(ආ) භෞතික වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම් සහ වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්, එක් එක් වත්කම් පංතිය අනුව විධිමත් වර්ගීකරණය කිරීමකින් තොරව රු.මිලියන 476,457 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් අනුව වත්කම් රු.මිලියන 433,708 කින් පමණක් වැඩි වී තිබුණි. ඒ අනුව රු.මිලියන 42,749 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ පොදු අරමුදලට වක්‍ර ලෙස ගැලපී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 69,424 ක් වැය කර තිබුණ ද ප්‍රාග්ධන දායකත්ව ගිණුම අනුව එය රු.මිලියන 87,285 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගෙවීමකින් තොරව සිදුවූ රු.මිලියන17,861 ක ප්‍රාග්ධන දායකත්වය, වගකීමක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට වත්කම් වලින් සිදුවන බලපෑමක් ලෙස ගිණුම්කරණ මූලධර්ම වලට පටහැනිව පොදු අරමුදලට වක්‍ර ලෙස ගලපා තිබුණි.

(ඇ) ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් ලබා ගෙන, පසුව මහා භාණ්ඩාගාරයට පවරාගෙන තිබූ රු.මිලියන 788,682 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 547,127 ක කාලීන ණය හා රු.මිලියන 224,358 ක

භාණ්ඩාගාර බැඳුම්කර ලෙස පරිවර්තනය කර තිබුණි. එසේ වුවද පරිවර්තනය හේතුවෙන් පැනනැගි තිබූ රු.මිලියන 17,197 ක වෙනස සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය ප්‍රකාශයට ගැලපීමකින් තොරව පොදු අරමුදලට වක්‍ර ලෙස ගලපා තිබුණි.

(ඉ) අයවැය කාර්යසාධන වාර්තාවේ සටහන් අංක 13 අනුව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත ලබා ගෙන, පසුව මහා භාණ්ඩාගාරයට පවරාගත් ණය ශේෂය, කාලීන ණය බවට පරිවර්තනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී ලංකා බැංකුවෙන් රු.මිලියන 484,033 ක් සහ මහජන බැංකුවෙන් රු.මිලියන 167,162 ක් ලෙස එකතුව රු.මිලියන 651,195 ක් ණය ලබා ගැනීම් ආකාරයට දක්වා එයින් කාලීන ණය බවට පරිවර්තනය කිරීම් ලෙස ලංකා බැංකුවට අදාළව රු.මිලියන 410,430 ක් සහ මහජන බැංකුවට අදාළව රු. මිලියන 136,698 ක් අඩු කර දක්වා තිබුණි. මේ හේතුවෙන් මුළු දේශීය ණය ගැනීම් ලෙස ලංකා බැංකුවට අදාළව රු.මිලියන 73,603 ක් ද මහජන බැංකුවට අදාළව රු.මිලියන 30,464 ක් ද ලෙස එකතුව රු.මිලියන 104,067 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිරූපණය වී තිබුණි. නමුත් එම අගය අදාල ණය පරිවර්තනය කිරීමෙන් අනතුරුව ඒ මත හිඟ හිටි පොළිය බවට අනාවරණය විය.

(ඊ) ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත මහජන බැංකුවෙන් ලබා ගෙන, පසුව මහා භාණ්ඩාගාරයට පවරාගත් රු.මිලියන 262,583 ක ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළා සේ සලකා අයවැය කාර්යසාධන වාර්තාවේ සටහන් අංක 13 හි දක්වා, ඉන් රු.මිලියන 224,358 ක් ප්‍රතිව්‍යුහගතකරණය කිරීම ලෙස අඩු කර දක්වා තිබුණි. ඒ අනුව, රු.මිලියන 38,225 ක් දේශීය ණය ගැනීම් වලට වක්‍ර ලෙස එකතු වී තිබුණද එම අගය ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් ප්‍රාග්ධනිත කළ හිඟ හිටි පොළිය බව නිරීක්ෂණය විය.

(උ) ලංකා බැංකුවෙන් ලබාගෙන තිබූ ඇ.ඩො.මිලියන 240 හෙවත් රු. මිලියන 77,742 ක විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය (ව්‍යාපෘති නොවන) සමාලෝචිත වර්ෂය තුළ ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ හිඟ පොළියද ඇතුළුව රු.මිලියන 82,551 ක භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි. මෙහිදී සත්‍ය මුදල් ගලා ඒමක් හෝ ගලා යෑමක් සිදුවී නොතිබුණද, ඒවා ණය ලබා ගැනීම් සහ ණය ආපසු ගෙවීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් රු.මිලියන 2,537,167 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ඊට අනුරූපී ආරම්භක ශේෂය රු.මිලියන 3,250,238 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, මූල්‍ය නොවන වත්කම්වල පෙර වර්ෂයේ විගණිත අවසාන ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර රු.මිලියන 713,071 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 14 අනුව වත්කම් මාරු කිරීම් වලට අදාළ සෘන සටහන් ද (Transfer Out) වත්කම් ඉවත් කිරීම් (Disposal) ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රජය විසින් සත්‍ය වශයෙන්ම ඉවත්කරන ලද වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොවුණි.

(ඒ) මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 15 අනුව 2023 වර්ෂයට අදාළව අතීතානුයෝගී ගැලපීම් ලෙස රු.මිලියන 79,728 ක් ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය මඟින් ද, සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 26,003 ක් ප්‍රාග්ධන වියදමක් ලෙස ද, එකතුව රු.මිලියන 105,731 ක් රජයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ආයෝජන වත්කම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම ආයෝජන සිදු කර ඇති ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව රජයට එවැනි අයිතියක් /ඇල්මක් (interest) පවතින බවට තහවුරු නොවුණි. මූල්‍ය ප්‍රකාශන සටහන අනුව පළාත් සභා සඳහා රජයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ආයෝජන ලෙස එකතුව රු.මිලියන 14,942 ක් දක්වා තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන වල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ පළාත් සභාවල මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් රජයට සැලකිය යුතු පාලනයක් නොමැති බැවින්, පළාත් සභාවල ආදායම සහ වියදම් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස නොසැලකෙන බවද දක්වා තිබුණි.

(ඔ) 2022 ජනවාරි 01 දින සිට ඒකාබද්ධ අරමුදලේ සහ ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ පැවති පිළිවෙලින් රු.මිලියන 990,491ක් සහ රු.මිලියන 14,040,298 ක් වූ සෘන වටිනාකම් එකතු කර රු.මිලියන 15,030,789 ක් පොදු අරමුදල (General Fund) ලෙස එය ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට ගෙන තිබුණි. මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් මඟින් අනෙකුත් අරමුදල් පිළිබඳව හෙළිදරව් කර තිබුණද, පොදු අරමුදල පිහිටවීමේ/ඇතිකිරීමේ පදනම හෙළිදරව් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ශේෂය රු.මිලියන 20,951,036 ක සෘන ශේෂයක් වී තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට පවතින පොදු අරමුදලේ ශේෂය පදනම් කරගෙන ඒකාබද්ධ අරමුදලේ ශේෂය ගණනය කළ හැකි ආකාරය දක්වමින් මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කිරීමේ පහසුව පිණිස විශ්ලේෂණාත්මක සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඕ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ යුරෝ මිලියන 4.5 ක් වූ ණය ගිවිසුමකට අදාළව යුරෝ මිලියන 2.4 ක් හෙවත් රු.මිලියන 738 ක් ණය හිමියන් විසින් අත්හරින ලද (Hair cut) බව දක්වා තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 26 (ii) අනුව මෙම ණය ගිවිසුමට අදාළව යුරෝ මිලියන 1.9 හෙවත් රු.මිලියන 627,588 ක් ප්‍රතිවර්ත (Reverse) කල බවට දක්වා තිබුණද එම සටහනේ පාද සටහනට (Foot Note) අනුව මෙම ණය ගිවිසුම යටතේ ප්‍රාග්ධනීකරණය කරන ලද මුදලින් රු.මිලියන 821ක ණය කපා හැරීමක් (Hair cut) කර ඇති බව දක්වා තිබුණි. තවද, මෙම ණය ශේෂ අත්හැරීම මූල්‍ය කාර්යසාධන

ප්‍රකාශයෙන් අත්හැරී තිබූ අතර ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ පොදු අරමුදලට වක්‍ර ලෙස ගලපා තිබුණි.

(ක) අයවැය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් අංක 11 හි දක්වා තිබූ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් ජනිත වූ ව්‍යාපෘති ණය වලට අදාළ රු. මිලියන 89,097 ක හිඟ හිටි ණය පොළී වටිනාකම සමාලෝචිත වර්ෂය තුළ ලබා ගත් විදේශීය ණය මුදලක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ග) මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 (iv) අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙනුවෙන් ඇ.ඩො.මිලියන 12,281 ක් හෙවත් රු.මිලියන 3,362,306 ක් ගෙවීම් ලෙස දක්වා තිබුණ ද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව එවැනි ගෙවීමක් සිදුකර නොතිබුණි. මෙහිදී කිසිදු මුදල් ගලා යාමක් සිදුවී නොමැති වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙම අගය විදේශීය ණය ගෙවීමක් ලෙස දක්වා තිබුණි. තවද, මෙලෙස ගෙවීම් ලෙස සඳහන් කර තිබූ වටිනාකමට අදාළව රු.මිලියන 624,319 ක හුවමාරු ලාභයක් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගලපා තිබූ අතර එකී ගණනය කිරීමේ පදනම හා ඊට අදාළ අනෙකුත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ව) සමාලෝචිත වර්ෂයේ ස්වෛරීත්ව බැඳුම්කර ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී කිසිදු මුදල් ගලා ඒමක් සිදු නොවූ රු.මිලියන 3,206,577 ක ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද වටිනාකම, ණය ලබා ගැනීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයට පෙර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නාම මාත්‍රික ගිණුමක් ලෙස පැවති විදේශීය ණය චක්‍රීය අරමුදල (Foreign Loan Revolving Fund), විදේශීය ණය ගැලපුම් ගිණුම (Foreign Loan Adjustment Accounts) ලෙස වෙනස් කර තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන වල පටුනේ (Table of Contents) හා පැහැදිලි කිරීමේ සටහන් අංක 09 යටතේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම නමින්ම සඳහන් කර තිබුණු අතර නව ගිණුම් නාමය වන විදේශීය ණය ගැලපුම් ගිණුම පිළිබඳව පැහැදිලි කිරීමේ සටහනක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, විදේශ ව්‍යවහාර මුදලින් පැවති මූල්‍යමය වත්කම් (Monitory Assets) (විදේශ ව්‍යවහාර මුදලින් ඇති ආයෝජන හැර) දේශීය ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීමේදී ඇතිවූ රු.මිලියන 54,163 ක විදේශ විනිමය හුවමාරු අලාභය ගිණුම්කරණ මූලධර්මවලට අනුව සමාලෝචිත වර්ෂයේදී ගිණුම්කරණ අවශ්‍යතාවය මත පදනම්ව පිළියෙල කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් නොකර, විදේශීය ණය ගැලපුම් ගිණුමේ සටහන්කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අරමුදල් ගිණුමක් ලෙස පෙන්වා තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලැබී තිබූ රු.මිලියන 1,110 ක් ඊට අනුරූපී පිරිවැය සමඟ ගලපා ශුද්ධ බලපෑම ගණනය කිරීමකින් තොරව, ලැබී තිබූ මුළු මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අදායමක් ලෙස දක්වා තිබුණි.

(ඩ) විදේශ ව්‍යවහාර මුදල් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී ඇති වන විදේශ විනිමය ලාභය හෝ අලාභය ගිණුම්කරණ පදනම මත පිළියෙල කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් කළ යුතු වුවද, සටහන් අංක 27 හි විවිධ ගිණුම් යටතේ වූ විනිමය සාමාන්‍ය ගැලපීම් රු.මිලියන 125 ක වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගැලපීම් කර නොතිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂයේ ලීසිං වාහන සඳහා රු.මිලියන 464 ක ප්‍රාග්ධන වාරික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් නොකර, එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ සිදු වූ මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි.

(ත) සමාලෝචිත වර්ෂයේදී ද්‍රව්‍ය හා උපකරණ ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 41,899 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස වරදවා දක්වා තිබුණි.

(ද) රජයේ දෙපාර්තමේන්තු සමඟ ක්‍රියාත්මක වන ගිණුම් යටතේ අක්‍රීය ගිණුම් ශේෂ (Non-Operating Accounts) ලෙස රු.මිලියන 4,730 ක් දක්වා තිබුණ ද එහි කාල විශ්ලේෂණයක් සහ එසේ අක්‍රීය ලෙස සැලකීමට හේතු විගණනයට අනාවරණය නොවුණි.

(න) මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.මිලියන 993,765 ක ඉඩම්, නොනිමි වැඩ හැර මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව විවක්ෂණ හා ගැලපුම් සංකල්පවලට අනුව ක්ෂය කළහැකි වත්කම් සම්බන්ධයෙන් සිදුකලයුතු කිසිදු ගැලපිල්ලක් සිදුකර පොත්වලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වියදම හා වත්කම්වල සාධාරණ අගය නිරූපණය නොවන බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ප) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඉදිරි වර්ෂය තුළදී රජය විසින් ගෙවා නිම කළ යුතු බාහිර වගකීම් ප්‍රමාණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත නොහැකි විය.

(බ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව මුළු වත්කම් රු.මිලියන 8,359,211ක් වූවද මුළු බාහිර වගකීම් රු.මිලියන 29,251,796 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් අගය ඍණ රු.මිලියන 20,892,585 ක් වී තිබුණි.

(ම) මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය මත පිළියෙල කර ඇති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් මූල්‍ය හිඟය මූල්‍යනය කර ඇති ආකාරය නිරූපණය නොවුන ද, රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ පරිශීලකයන්ට සටහන් (Note to Readers) යටතේ සමාලෝචිත

වර්ෂයේ මූල්‍ය තිහය, මූල්‍යනය කර ඇති ආකාරය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් නිරූපණය කරන බව දක්වා තිබුණි.

(ය) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 මඟින් විදේශීය මුදලින් ලබා ගෙන තිබූ දේශීය ණය වලට අදාළ විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම හෙළිදරව් කර නොතිබුණි.

(ර) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හර ශේෂ පැවති විවිධ ගිණුම් (Sundry Accounts) සහ රජයේ දෙපාර්තමේන්තු සමඟ ක්‍රියාත්මක වන ගිණුම් (Accounts generating with Government Departments) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වගකීම් යටතේ අඩුකර දක්වා තිබුණි.

(ල) ගිණුම්ගත නොවූ විදේශ ණය

මූල්‍ය ප්‍රකාශන වල පැහැදිලි කිරීමේ සටහන් 02 (Explanatory Notes) යටතේ 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණය වටිනාකම රු.මිලියන 1,070 ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒවායේ ප්‍රතිලබ්ධි කාලයන් හි පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ණය අංකය | මූල්‍ය ප්‍රකාශනය අනුව ප්‍රතිලබ්ධි වූ කාලය | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව ප්‍රතිලබ්ධි වූ කාලය |
|---|---|---|
| 2012017 | 2020 දෙසැම්බර් | 2024 |
| 2012025 | 2023 නොවැම්බර් | 2024 |
| 2016035 | 2022 සැප්තැම්බර් | 2022 සැප්තැම්බර්<br>2023 මාර්තු සහ සැප්තැම්බර් |

(i) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2020 සිට 2023 වර්ෂය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව, ඉහත දක්වා ඇති ණය ප්‍රතිලබ්ධිවී තිබූ බව දක්වා නොතිබුණි. ඒ අනුව, එකම ණය ගනුදෙනුවකට අදළව එකිනෙකට පරස්පර තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ ඒ වගකීම් පැවැරූ දෙපාර්තමේන්තු විසින් විදේශ ණය ප්‍රතිලබ්ධිවීම පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන නොමැති බව අනාවරණය විය. තවද, විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුවද ඉහත ණය පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව, ඉහත විදේශීය ණය ගණුදෙනුවලට අමතරව විධිමත් ලෙස වාර්තා නොවූ වෙනත් විදේශීය ණය පැවතීමේ ඉහළ අවධානමක් පැවතිය හැකි බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම ඊට පෙර වර්ෂ වලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති විදේශ ණය වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(iii) මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ වියදම් හඳුනාගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, සියළුම වියදම්, ගෙවීම් සිදු කර ඇති කාලසීමාව තුළ ගිණුම්ගත කර ඇති බව දක්වා තිබුණ ද, ගිණුම්ගත නොකළ විදේශ ණය මුදල් සඳහා අදාලවන පොලී ඇතුළු එම ණය වලින් සිදු කරන ලද අනෙකුත් වියදම් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත නොවී පැවතිය හැකි බව නිරීක්ෂණය විය.

(ව) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව 2023 වර්ෂය තුල හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී තිබුණද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පිටත පවත්වාගෙන පැමිණි ණය වර්ග 03 ට අදාළව එකතුව රු. මිලියන 15,211 ක් සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්ගත කර තිබුණ ද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. ඒ අනුව, යම්කිසි වර්ෂයක් තුළ ප්‍රතිලබ්ධි වුවත්, අදාල වර්ෂය තුළදීම ගිණුම් ගත කිරීමකින් තොරව විවිධ විදේශ ණය ගනුදෙනු පවත්වාගෙන ඇති බවත් එම ණය ගනුදෙනුවලට අදාල පොළිය ඇතුළු විවිධ වියදම් අදාල කාලච්ඡේදය තුළදීම ගිණුම්ගත වී නොමැති විය හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ස) විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුව ණය ගිවිසුම් 18 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර ශුද්ධ එකතු රු. මිලියන 3,711 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(හ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විදේශීය ණය ප්‍රතිලබ්ධිවීම් සහ විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුව ප්‍රතිලබ්ධිවීම් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| ණය අංකය | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව | තොරතුරු පද්ධතිය අනුව ප්‍රතිලබ්ධිවීම් | වෙනස |
|---|---|---|---|
| 2012024 | USD 947,057 | USD 709,147 | USD 237,910 |
| 2019019 | USD 28,717,515 | USD 24,938,700 | USD 3,778,815 |
| 2019043 | SAR 47,320,932 | SAR 47,284,890 | SAR 36,042 |
| 2015021 | EUR 28,227 | නැත | EUR 28,227 |
| 2012025 | SAR 570,876 | SAR 272,171 | SAR 298,705 |

වෙනසට හේතු සමාලෝචිත වර්ෂය තුළදීම සිදු වූ ප්‍රතිලබ්ධිවීම්ද යන්න විගණනයේදී තහවුරු නොවූණි. එසේ වුවද මෙම ණය ගිවිසුම්වලට අදාළව පෙර වර්ෂ වල ප්‍රතිලබ්ධි වී ගිණුම්ගත නොකළ නමුත් 2024 වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද ප්‍රතිලබ්ධිවීම් ද නොමැති බවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබුණි. ඒ අනුව මෙම

ප්‍රතිලබ්ධිවීම් කුමන කාලපරිච්ඡේදයකට අදාලවේද යන්න විගණනයේදී තහවුරු නොවූ අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ දැනුවත්භාවයකින් තොරව, ප්‍රතිලබ්ධිවීම් ගිණුම්ගත නොවී පවතින බව නිරීක්ෂණය විය.

(ළ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 න් ඉදිරිපත් කර ඇති විදේශීය ණය ශේෂ සඳහා රු.මිලියන 3,022 ක ගැලපීම් සිදු කර තිබූ අතර මෙම ගැලපීම් හේතු කොට ගෙන විදේශීය ණය ශේෂ එම වටිනාකම්න්ම ශුද්ධ වශයෙන් ඉහළ ගොස් තිබුණි. එසේ ගැලපීම් සිදු කිරීමට හේතු වූ කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(අඅ) සමාලෝචිත වර්ෂයේ දී විදේශීය ණය ලබා ගැනීම් 20 කට අදාළව රු.මිලියන 3,969 ක් විවිධ හේතූන් මත අදාළ ණය හිමියන්ට ආපසු ලබා දී (Refund) තිබුණ ද ඊට හේතු මූල්‍ය ප්‍රකාශනවල විධිමත් පරිදි හෙළිදරව් කර නොතිබුණි. තවද ප්‍රතිලබ්ධි වූ ණය අදාළ ණයහිමියන් වෙත ආපසු ලබා දීමේදී එම ණය ප්‍රතිලබ්ධි වූ අවස්ථාවේ සිට නැවත ණය හිමියා වෙත ලබා දෙන තෙක් රඳවා ගත් කාලපරිච්ඡේදය සඳහා ණය පොළිය ගෙවීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය.

(අආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් මුළුමනින්ම පිටතින් පවත්වාගෙන පැමිණි ණය වර්ග 08 කට අදාළව එකතුව රු.මිලියන 518,293 ණය ශේෂ 2022 වර්ෂයේදී ගිණුම්ගත කිරීමේදී, එම අරමුදල් භාවිතාකර තිබූ ආකාරය හෝ එම අරමුදල් උපයෝගීකරගෙන අත්පත් කර ගන්නා ලද කිසිදු වත්කමක් මේ දක්වා හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පොදු අරමුදලේ සෘන ශේෂය තවදුරටත් ඉහළ යෑමට හේතු වී තිබුණි.

(අඇ) මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 (II) අනුව අංක 2024001 දරන ණය ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණයක් ලෙස දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන වල අයවැය කාර්යසාධන වාර්තාවේ සටහන් අංක 11 අනුව සහ Stock and Flow Report No. 01 අනුව මෙය අන්තර්ජාතික සංවර්ධන සංගමයෙන් (International Development Association) ලබා ගත් ණයක් ලෙස දක්වා තිබුණි.

(අඈ) අයවැය ක්‍රියාකාරීත්වය සහ හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශයේ සටහන් අංක 14 මඟින් දේශීය ණය ආපසු ගෙවීම්වලට අදාළ තොරතුරු හෙළිදරව්කර තිබුණ ද, 2024 වර්ෂය තුළදී විදේශ ණය ආපසු ගෙවීම් රු.මිලියන 3,634,067 ට අදාළව තොරතුරු සටහනක් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(අඉ) සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබූ ජාත්‍යන්තර සංවර්ධන බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26(iv) හි පාද සටහන මඟින් විනිමය සාම්‍ය (parity) තුළ ණයහිමියන් අත්හරින ලද ණය ප්‍රමාණයද (Haircut) ඇතුළත් වන බව දක්වා තිබුණි. ඒ

අනුව මූල්‍ය ප්‍රකාශන පරීශීලකයන්ට ජාත්‍යන්තර සංවර්ධන බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණයේදී ණය හිමියන් විසින් අත්හරින ලද ණය ප්‍රමාණය සෘජුව හඳුනාගැනීමට ඇති හැකියාව අහිමි වී තිබුණි.

(අඊ) ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය වෙනුවෙන් දැනට රු.මිලියන 3,212 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රතිපූරණය කර තිබුණි. තවද, එම නියෝජිත ආයතනයන්ට ගිවිසුම් පරිදි ගෙවීමට එකඟ වූ මුළු මුදල, දැනට ගෙවා ඇති සහ තවදුරටත් ගෙවීමට ඇති මුදල ශ්‍රී ලංකා මහ බැංකුවෙන් තොරතුරු ලද වහාම විගණනයට ඉදිරිපත් කරන බවත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට දන්වා තිබුණි.

(අඋ) ප්‍රදායකයන් විසින් එවා තිබූ ණය ශේෂ තහවුරුකිරීම්, මූල්‍ය ප්‍රකාශන සමඟ සහ පරිගණකගත ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No 01 වාර්තාව සමඟ සංසන්දනය කිරීමේදී ණය අංක 19900098 ට අදාළව රු.787,553 ක් වැඩියෙන්ද, ණය අංක 20240010 ට අදාළව රු.මිලියන 87 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කර තිබුණි.

(අඌ) සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 122 සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය (ACA 5 (බී)) ඇතුලත් කර නොතිබූ අතර රජයේ මූල්‍ය ප්‍රකාශනවල එම වැය ශීර්ෂයට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.8 ක ශේෂයක් පැවතුණි.

(අඑ) ශීර්ෂ 123 නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනයේ ACA 5(බී) ආකෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස සඳහන් කර ඇති රු.මිලියන 586 ක් කුලී හා වැඩ අත්තිකාරම් රජයේ මූල්‍ය ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය තුළ එකතු කිරීම් යටතේ දක්වා ඇති බව නිරීක්ෂණය විය.

(අඒ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශීර්ෂය 219 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමකට අදාළව රු.මිලියන 5.7 ක් වූ ආරම්භක ශේෂය, සමාලෝචිත වර්ෂය තුළ දී අයකර ගෙන තිබූ බව සඳහන් වූවද, අදාළ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල එම අගය නොවෙනස්ව පැවතුණි.

(අඔ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 337 කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂය රු.මිලියන 22 ක් ලෙස නොවෙනස්ව පැවතියද, අදාළ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව කිසිදු සඳහනක් නොතිබුණි.

(අඕ) මහා භාණ්ඩාගාරය විසින් 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 06 ක් වෙනුවෙන් ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.මිලියන 218,245 ක් සපයා තිබුණි. එම ආයෝජනයේ

වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 204,367ක් වූ අතර, එක් එක් ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය සෘන රු.මිලියන 412,450 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධන දායකත්වය වත්කමක් ලෙස දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය.

(අක) සමාලෝචිත වර්ෂය ආරම්භක හා අවසාන දිනට රු.මිලියන 1,935,429 ක රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.මිලියන 550,744 ක් පමණක් විය. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල කර ඇති ආයෝජනය අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(අග) රාජ්‍ය ව්‍යවසායන් 21 කට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව ප්‍රාග්ධන දායකත්වය සහ 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රජයේ ප්‍රාග්ධන දායකත්වය අතර රු.මිලියන 25,898 ක වෙනසක් නිරීක්ෂණය විය.

(අච) Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2024 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,574 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 525 ක් විය. කෙසේ වුවද, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම අගයට අමතරව රු.මිලියන 772 ක ප්‍රාග්ධන දායකත්ව ශේෂයක් පැවතුණි.

(අජ) රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,150,312 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 1,167,570 ක් වීම හේතුවෙන් එ් අතර රු.මිලියන 17,258 ක වෙනසක් නිරීක්ෂණය විය.

(අට) රාජ්‍ය සමාගම් 06 කට අදාළ භිමිකාරිත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදී 2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 6,549 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 15,893 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 9,344 ක වෙනසක් නිරීක්ෂණය විය.

(අඩ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 87,285 ක් වූ අතර ඉන් රු.මිලියන 33,674 ක් එනම් සියයට 38 ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළි ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල් වලින් සමන්විත වී තිබුණි.

(අණ) 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 12 ක් වෙනුවෙන් රජයේ ප්‍රාග්ධන දායකත්ව රු.මිලියන 11,601 ක් ලෙස දක්වා තිබුණද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(අත) රාජ්‍ය ව්‍යවසායන් 09 කට අදාළව ඉදිරිපත් කළ සෘජු ශේෂ සනාථ කිරීම් අනුව හා රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම රාජ්‍ය ව්‍යවසායන් වලට අදාළව මහා භාණ්ඩාගාරයට අයත් කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයන් හි වෙනස්කම් නිරීක්ෂණය විය.

(අද) 2024 දෙසැම්බර් 31 දිනට Asian Reinsurance Corporation හි කොටසක් ඇ.ඒ.ජ. ඩොලර් 1000 ක් වූ කොටස් 980 ක, Ceylon Shipping Agency කොටසක් SGD 1ක් වූ කොටස් 24,500 හා International Finance Corporation හි කොටසක් ඇ.ඒ.ඩො. 1,000 ක් වූ කොටස් 7,491 ක් සමන්විත රජයේ ආයෝජනයේ වටිනාකම රු.මිලියන 2,448 ක් වී තිබුණි. කෙසේ වුවද, එම ආයෝජනයන්ට අදාළ තොරතුරු හා ඒ වෙනුවෙන් ලද ආයෝජන ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(අන) සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් 3 කට අදාළව මහා භාණ්ඩාගාරය සතු කොටස් අඩු කිරීමක් හෝ ගැලපීමක් සිදු කර තිබුණද ඒ සම්බන්ධයෙන් විගණනයට තොරතුරු අනාවරණය නොවීය.

(අප) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 අනුව රජය සතු සමාගම් හා අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී ලබා දී තිබූ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 42,356 ක් වුවද, වර්ෂය තුළ ප්‍රාග්ධන දායකත්වයේ රු.මිලියන 10,699 ක වැඩිවීමට අදාළ කොටස් හිමිකමේ වෙනස්වීම ඇතුළු අනෙකුත් තොරතුරු පිළිබඳ විධිමත් අනාවරණයක් සිදුකිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසාන ප්‍රාග්ධන ආයෝජන වටිනාකම ලෙස පමණක් දක්වා තිබූ අතර, එම ආයෝජනවලට අදාල තොරතුරු විගණනයටද ඉදිරිපත් නොවුණි.

(අබ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තැන්පත් ගිණුමේ පැවති රු.මිලියන 14.6 ක් වූ විදේශ ප්‍රදාන අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුලදී රාජ්‍ය අදායමට බැරකර තිබුණි.

(අම) 2024 ජනවාරි 01 දින වන විටත් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදාන ලෙස ලැබී තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාල අරමුණට නොයොදවා අක්‍රියව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු. මිලියන 36.8 ක් විය.

(අය) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළයුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 08 ක එකතුව රු.මිලියන 1,047.6 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් පිළිබඳව නියමිත පරිදි ප්‍රතිපාදන සලසාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(අර) 2019 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ව්‍යාපෘති 12 ක් සමඟ එකතු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 40.32, රෙන්මින්බී මිලියන 2,000, යූරෝ මිලියන 43.13 හා කොරියන් වොන් බිලියන 14.3 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹ තිබුණද ඊට අදාළව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විදේශ ප්‍රදාන ලද බවට විගණනයට තහවුරු නොවුණි.

(අල) වැය ශීර්ෂ 11 කට අදාළව රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල රු.මිලියන 43 ක ශේෂයක් පැවතිය ද, එම එක් එක් ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවල (ACA -3 ) භාණ්ඩාගාරයේ පොත් අනුව එදිනට ශේෂයන් දක්නට නොතිබුණි. තවද, වැය ශීර්ෂයන්ට අදාළව රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබූ අග්‍රිම ගිණුම් අංකය අදාළ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව සඳහන් වූ අග්‍රිම ගිණුම් අංකය හා නොසැසඳුනු අවස්ථා නිරීක්ෂණය විය.

(අව) ආයතනයන් හි මූල්‍ය ප්‍රකාශන වල තැන්පත් ශේෂයන් සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී තැන්පතු ශේෂයන්හි පිළිවෙළින් රු.මිලියන 19 ක හා රු.මිලියන 16 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ආයතන 14 කට අදාළ අවුරුදු 2 ක ඉක්මවූ තැන්පතු ගිණුම් 40 කට අදාළ රු.මිලියන 2,284 ක් වූ ශේෂයන් පැවැතුණි.

(අස) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යම රජයේ, රජයේ නිලධාරීන්ගේඅත්තිකාරම් ශේෂය රු.මිලියන 32,268 ක් වුව ද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම ශේෂය රු. මිලියන 31,370 ක් විය. ඒ අනුව, රු.මිලියන 898 ක වෙනසක් නිරීක්ෂණය විය.

(අහ) උප ණය ලබා දුන් ආයතනවලින් ලද ණය ශේෂ සනාථ කිරීමේ ලිපි සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී රජයේ මූල්‍ය ප්‍රකාශනවල උපණය ශේෂය පිළිවෙලින් රු. මිලියන 861.5 ක හා රු. මිලියන 1,127.8 ක වෙනසක් නිරීක්ෂණය විය.

(අළ) විදේශ ව්‍යවහාර මුදල් මඟින් ලබා දී තිබූ භාණ්ඩාගාර ඇපකර දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති විදේශ විනිමය අනුපාතයන්, විදේශ

සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද විදේශ විනිමය අනුපාතයන්ගෙන් වෙනස් වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර ඇපකර වටිනාකම රු.මිලියන 23,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආඅ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් මස 12 දින ගෙන තිබූ අන්තර්කාලීනව විදේශ ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව, 2022 අප්‍රේල් මස 13 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් දින තෙක් ණය ගිවිසුම් 334 කට අදාළව ණය වාරික තුළ ඇතුළත් රු.මිලියන 479,674 ක මූලික ණය මුදල ද රු.මිලියන 114,130 ක් වූ පොළිය ද ඇතුළුව රු.මිලියන 593,804 ක ණය ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවා තිබුණද, ඒ පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබූ අතර ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් 2022 අප්‍රේල් 12 දින සිට ඉහත ණය ගිවිසුම්වල උපයෝජනය නොකළ ණය ශේෂ මත කැපකරු ගාස්තු (Commitment Fee) ගෙවීමේදී සාමාන්‍ය කැපකරු ගාස්තු වටිනාකම හෝ ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් එම වටිනාකමට වඩා ඉහළ වටිනාකමක් හෝ ගෙවීමට සිදුවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ආආ) 2024 වර්ෂය තුළ ණය ප්‍රදායක ආයතන 04 ක් සමඟ රු.මිලියන 128,663 ක ණය සඳහා ගිවිසුම්ගත වී තිබුණද, එම ණය ගිවිසුම්වලට අදාළ ප්‍රතිලබ්ධි වීම් 2024 වර්ෂය තුළ ලැබී නොමැති බව නිරීක්ෂණය වූ අතර එලෙස ගිවිසුම්ගත වූ නමුත් ප්‍රතිලබ්ධි නොවූ ණය ලබා ගැනීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආඇ) 2024 දෙසැම්බර් 31 දිනට මූලික කටයුතු අවසන් වී ඇති නමුත් ගිවිසුම්ගත වී නොමැති රු.මිලියන 134 ක ණය ලබා ගැනීම් 03 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආඈ) රාජ්‍ය ව්‍යවසායන්වල මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් 05 ක් විසින් රු.මිලියන 3,690 මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු බව දක්වා තිබුණද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂයන් අදාළ ආයතනවලින් ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආඉ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2024 දෙසැම්බර් 31 දිනට ආයතන වලට ලබා දී තිබූ උපණය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු පොළී වටිනාකම රු.මිලියන 10,733 ක් වුවද එය රජයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල රජයේ හිමිකම් දායකත්වය කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්හි කරන ලද ආයෝජනය සහ ලැයිස්තුගත නොවන සමාගම්හි කරන ලද ආයෝජනය ලෙස වර්ගීකරණය කර දක්වා නොතිබුණි. තවද කොළඹ

කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්වල නිමිකාරීත්වයේ වටිනාකම එහි නාමික අගය පදනම් කරගෙන ගිණුම්ගත කර තිබුණද, ඒවායේ 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව බැඳීම් හා බැරකම් රු.මිලියන 84,114 ක් ලෙස හෙළිදරව් කර තිබුණ ද, විගණන නියැදි පරීක්ෂාව අනුව ඊට ඇතුළත් නොවූ ආයතන 21 කට අදාළව එකතුව රු.මිලියන 58,367 ක් වූ බැඳීම් හා බැරකම් පැවැති බව අනාවරණය විය.

(ඇ) විගණනයට ලද තොරතුරු අනුව, ආයතන 15 කට අදාළව අයවැය ප්‍රතිපාදන නොමැතිව එළඹ තිබූ දින 90 ඉක්ම වූ රු.මිලියන 85,722 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) 2023 අංක 34 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනය අනුව 204 දරන ශීර්ෂයට අදාළව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා වූ ලැබීම් වල අවම සීමාව ලභා කර ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි රජයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රජයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළින් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත සන්නිවේදනය කරන ලදී.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත**

(i) 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දිනට එම සීමාව සියයට 94.39 ක් වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| බැරකම් | 2024 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම* රු.බිලියන |
|---|---|
| බැංකු අයිරාව | 105 |
| රාජ්‍ය ණය | 29,627 |
| මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම් : | |
| විදේශ ණය | 01 |
| **මුළු බැරකම්** | **29,733** |
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | 31,500 |
| **මුළු බැරකම ඇස්තමේන්තුගත ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස** | **94.39** |

* රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබා දී තිබූ ඇපකර හා සහන ලිපි වටිනාකම වූ රු.බිලියන 1,454 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවල විගණනයට ඉදිරිපත් කළ බැරකම් හා බැඳීම් ප්‍රකාශය අනුව රු.බිලියන 84 ක් වටිනා බැරකම් ඉහත බැරකම්වලට ඇතුළත් කර නොමැත.

(ii) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3 (අ) වගන්තිය අනුව "*2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දුරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම*" ආණ්ඩුව විසින් අනුගමනය කළ යුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදක වූ පරමාර්ථයක් ලෙස දැක්වේ. එසේවුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි ඇස්තමේන්තු කිරීමටත්, සමාලෝචිත වර්ෂය අවසානයට වූ තත්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි පවත්වාගෙන යාමටත් මුදල්, ක්‍රම සම්පාදන

සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිශතයන් පිළිවෙලින් ඇස්තමේන්තුගත අයවැය පරතරයට අදාළව සියයට 9.93 ක් හා තත්‍ය අයවැය පරතරයට අදාළව සියයට 6.75 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | අයවැය පරතරය | | ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස | තත්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | | |
| රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | සියයට | සියයට |
| 31,500 | 3,128 | 2,126 | 9.93 | 6.75 |

සටහන :
2024 අගෝස්තු 09 දින ගැසට් පත්‍රයේ පළ කරන ලද 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතින් 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ඉවත් කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් 141 ක රු.මිලියන 6,511 ක හර ශේෂ නොපියවී පැවතුණි. ඉන් රු.මිලියන 35 ක ශේෂයන් වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, එම ශේෂයන් මු.රෙ. 373 ප්‍රකාරව, නිරවුල් කර ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3. කළමනාකරණ ක්‍රියාකාරකම්

### 3.1 විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය

(අ) විදේශීය සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව චීනයේ අපනයන ආනයන බැංකුවෙන් ලබාගත් ණය වර්ග 52 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට යොමු කර තිබුණි. ඒ තුළ රජයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 (ii) දැක්වෙන ව්‍යාපෘති ණය 48 ක්ද සටහන් අංක 26 (iii) න් දැක්වෙන විදේශීය මුදල් කාලීන ණය පහසුකම් 04 ක් ද අන්තර්ගත වී තිබුණි.

(i) ව්‍යාපෘති 44 කට අදාළව විදේශ ව්‍යවහාර මුදලින් ගණනය කරන ලද නොගෙවූ ණය පොළිය සහ දඩ පොළිය, 2024 ජනවාරි 01 දිනට පැවති ණය ශේෂයට එකතු කර ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය ශේෂය ගණනය කර පසුව ණය කල්පිරෙන කාලය දීර්ඝ කර ණය පොළී අනුපාතය අඩු කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති 33 කට අදාළව ණය ශේෂ ඇමරිකානු ඩොලර්

මිලියන 236 කින් ද, ව්‍යාපෘති 11 කට අදාළව ණය ශේෂ රෙන්මින්බී (යුආන්) මිලියන 275 කින් ද වැඩි වී තිබුණි.

(ii) විදේශීය මුදල් කාලීන ණය පහසුකම් 04 කට අදාළව ගණනය කරන ලද නොගෙවූ ණය පොළිය සහ දඩ පොළිය 2024 ජනවාරි 01 දිනට පැවති ණය ශේෂයට එකතු කර ප්‍රතිව්‍යුහගතකරණ ලද ණය ශේෂය ගණනය කර, පසුව කල්පිරෙන කාලය දීර්ඝ කර ණය පොළී අනුපාතය අඩු කර තිබුණි. ඒ අනුව ණය පහසුකම් 03 කට අදාළව ණය ශේෂ ඇමෙරිකානු ඩොලර් මිලියන 258 කින් ද, එක් ණය පහසුකමකට අදාළව ණය ශේෂය රෙන්මින්බී (යුආන්) මිලියන 180 කින් ද ඉහළ ගොස් තිබුණි.

(iii) 2024 ජනවාරි 01 දිනට පැවති යුරෝ මිලියන 4.5 ක ණය ශේෂයට හිඟ හිටි ණය පොළිය හා දඩ පොළිය ලෙස යුරෝ 573,924 ක් එකතු කර එයින් යුරෝ මිලියන 2.4 ක් හෙවත් සියයට 48 ක් ණය හිමියා විසින් අත්හැරීමෙන් (Hair cut) අනතුරුව ඉතිරි යුරෝ මිලියන 2.6 ක ශේෂය, 2024 වර්ෂය තුළදී ගෙවා නිම කර තිබුණි.

(iv) ව්‍යාපෘති 03 කට අදාළව රෙන්මින්බී (යුආන්) මිලියන 40 ක ණය ශේෂය කිසිදු ප්‍රතිව්‍යුහගතකරණය කිරීමකින් තොරව 2024 වර්ෂය තුළ ගෙවා නිම කර තිබුණි.

(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 (iv) හි දක්වා ඇති 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 12,550 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය 11 ක් 2024 වර්ෂය තුළ දී ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි. ඒ අනුව එම බැඳුම්කර 11 හි කල් පිරෙන කාලය දීර්ඝ කර ණය හිමියා විසින් නාමිකව ණය අත් හැරීමක් (Nominal Hair cut) කර තිබූ අතර අවම සාමාන්‍ය පොළී අනුපාතයක් නියම කර නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 08 ක් බවට පරිවර්තනය කර ඇති බව දක්වා තිබුණි. තවද මෙම බැඳුම්කර වලට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය පොළිය ඇමෙරිකානු ඩොලර් මිලියන 3,750 ක් වූ අතර ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 08 හි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 10,647 ක් වී තිබුණි.

### 3.2 දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම

(අ) 2024 ජනවාරි 01 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 240 ක් හෙවත් රු.මිලියන 77,742 ක් වූ ලංකා බැංකුවෙන් ලබා ගෙන තිබූ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) ණය මුදල හිඟ හිටි පොළිය රු.මිලියන 6,601 ක් ද සහිතව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර වලට පරිවර්තනය කර තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ලංකා බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු. මිලියන 82,551 ක් වී තිබුණි.

(ආ) බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් ලබා ගෙන, පසුව 2022 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයට පවරාගත් ණය මුදලට අදාළව, 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 2,435 හෙවත් රු.මිලියන 788,682 ක ශේෂය පහත පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි.

(i) ලංකා බැංකුවට ගෙවිය යුතු ණය වටිනාකම වූ රු.මිලියන 410,430 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය වන රු.මිලියන 73,603 ක් ද ඇතුළුව ඇමරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර තිබුණි.

(ii) මහජන බැංකුවට ගෙවිය යුතු ණය මුදලෙන් රු.මිලියන 136,698 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය වන රු.මිලියන 30,464 ක් ද ඇතුළුව ඇමෙරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර තිබූ අතර ඉතිරිය රු.මිලියන 224,358 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය වන රු.මිලියන 38,225 ක් ද ඇතුළුව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

(iii) එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 1,582 ක් හෙවත් රු. මිලියන 462,783 ද මහජන බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 546 ක් හෙවත් රු. මිලියන 159,823 ක් ද මහජන බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 262,583 ක් ද වී තිබුණි.

(ඇ) ඉහත ප්‍රතිව්‍යුහගත කරන ලද දේශීය ණය සම්බන්ධයෙන් ආපසු ගෙවීම් කළ යුතු කාලය හා එකහ වූ පොළී අනුපාතය විගණනයට ඉදිරිපත් නොවීය.

**3.3 රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දේපළ වලට සිදු වූ හානි පූරණය කිරීම**

(අ) වාර්ෂික ඇස්තමේන්තු මඟින් කිසිදු ප්‍රතිපාදනයන් සලසා ගැනීමකින් තොරව, 2022 මාර්තු 31 දින සිට 2022 ජූලි 22 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික නිශ්චල දේපළ වලට සිදු වූ හානි සම්බන්ධයෙන් පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය මඟින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලද පරිපූරක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනයෙන් 2023 වර්ෂයේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 41 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 1,050 ක් හා සමාලෝචිත වර්ෂය තුළ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 32 දෙනෙකුගේ වංචල දේපළ වලට සිදු වූ හානි වෙනුවෙන් රු.මිලියන 178 ක් ලෙස එකතුව රු.මිලියන 1,228 ක් ගෙවා තිබුණි.

(ආ) එසේම අක් මුදල් ලැබී ගෙවීම් සුදානම් කර තිබුණද 2024 දෙසැම්බර් 31 දිනවන විටත් මුදල් ලබා නොගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 9 දෙනෙකුගේ රු.මිලියන 39 ක් පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

### 3.4 රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීම

රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයක් පිහිටුවා 2022 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. 2023 මැයි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලැයිස්තුගත කර තිබූ ආයතන 72 ක් අනුබද්ධිත සමාගම් ලෙස ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වූ පාලක සමාගමක් (HOCO) මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද, එම පාලක සමාගම වෙත පවරාගෙන ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ ලැයිස්තුගත ආයතන 08 ක් පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බැහැර කිරීම් (Divesting) ක්‍රියාවලිය සඳහා ගනුදෙනු උපදේශකවරුන් තෝරාගෙන තිබුණි. කෙසේ වුවද, අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ වුවද තෝරාගත් ආයතන 08න් ආයතන 04 ක් 2022 සහ 2023 වර්ෂයන්හිදී බදු පෙර ලාභයක් උපයා තිබූ ආයතන බව නිරීක්ෂණය විය.

එසේම, තෝරාගත් ආයතන 08න් ආයතන 07ක් සඳහා ගණුදෙනු උපදේශකවරු පත්කිරීම සඳහා 2023 වර්ෂයේදී අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර ගණුදෙනු උපදේශකවරුන් වශයෙන් ගිවිසුම්ගත වූ විදේශීය ආයතන දෙක සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ අංක 18/62P දරන පොදු තැන්පත් ගිණුම මගින් රු. මිලියන 193 ක් ගෙවා තිබුණි. තවද, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය පවත්වාගෙන යාම වෙනුවෙන් 2023 සහ 2024 වර්ෂ දෙක සඳහා එකතුව රු. මිලියන 121 ක් වැයකර තිබූ අතර එයින් රු. මිලියන 58 ක් එම ඒකකයේ වැටුප් ගෙවීම වෙනුවෙන් වැය කර තිබුණි. කෙසේ වුවද, 2025 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වා තිබූ අතර ගෙවූ මුදල නිශ්කාර්ය වියදමක් බවට නිරීක්ෂණය විය.

### 3.5 විදේශීය ව්‍යාපෘති ණය ලබාගැනීමේදී ස්වාධිපත්‍යයේ මුක්තිය අත්හැරීම

2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතුව පැවති ව්‍යාපෘති ණය 755 න් ව්‍යාපෘති ණය 549 කට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව, විදේශීය ව්‍යාපෘති ණය 78 කට අදාළ ණය ගිවිසුම් වල ස්වාධිපත්‍යයේ මුක්තිය විවිධ අයුරින් අත්හැරීමේ (Waiver of Sovereign Immunity) ඡේදයන් අන්තර්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

3.6 වෙනත් නිරීක්ෂණ

(අ) ශීර්ෂ 04 ක් යටතේ වූ රජයේ අනුමත අත්තිකාරම් ගිණුම් 10 ක එකතුව රු.මිලියන 1,344 ක් වූ ශේෂයන් නිසි පරිදි නිරවුල් කිරීමකින් හෝ මු.රෙ. 518 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ, පළාත් සභාවලට ස්ථාන මාරු වූ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලෙස ලබා දුන් රු.මිලියන 191 ක් මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවතුණ ද එම වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ශීර්ෂ 03 ක් යටතේ වූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 03 ක එකතුව රු.මිලියන 9 ක් වූ ශේෂයක් හා ශීර්ෂ 02 ක් යටතේ එකතුව රු.408,233 ක් වූ සෘන ශේෂයක් නිරවුල් නොවී වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.

(ඈ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උපණය ශේෂය රු.මිලියන 195,004 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, අදාළ ආයතන උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ඉක්ම වූ රු.මිලියන 1,304 ක හිඟ උපණය වාරික ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි.

(ඉ) 2024 දෙසැම්බර් 31 දිනට උපණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම එකතුව රු.මිලියන10,733 ක් වූ අතර, ගිවිසුම් ප්‍රකාරව ආයතන 3 ක ට අදාළව වසර 5 ඉක්ම වූ නොගෙවූ පොළිය එකතුව රු.මිලියන 912 ක් වී තිබුණි.

(ඊ) භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 7,920 කට සමාන ඇ.ඩො. මිලියන 60 ක් වී තිබුණි. මේ වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 5,647 ක් දරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ හා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ රු. මිලියන 957 ක වියදමක්ද දරා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 6,605 ක් දරා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආසන්න වශයෙන් වසර 14 ක කාලයක් ගත වී තිබූ මෙම පද්ධතිය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක වන තත්ත්වයට පත් වී නොතිබුණි.

(උ) තවද, මෙම ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුන, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 6.7 ක වියදමක්ද දරා තිබුණි.

(එ) 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, රජයේ අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, පළාත් සභාවල ආයතනවලට මාරු වී ගිය නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනම් කල නිලධාරීන්, සේවය හැරගිය නිලධාරීන්, ද්විතික පදනම මත ස්ථානමාරු/ අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, විදේශගත/දේශිය නිවාඩු මත සිටින නිලධාරීන් හා වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අය විය යුතු වසර 05 ත් 10 ත් අතර ශේෂය රු.මිලියන 108 ක් වූ අතර වසර 10 කට ඉක්මවූ ශේෂය රු.මිලියන 232 ක් වී තිබුණි.

## 4. කාර්යසාධනය

### 4.1 ආදායම් ඇස්තමේන්තු කිරීම

(අ) 2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 29,898 ක් වී තිබුණු අතර 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 27,419 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 2,479 කින් හෙවත් සියයට 9 කින් වැඩි වී තිබුණි.

(ආ) 2023 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය මුල් ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම රු.බිලියන 4,144 ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 3,408 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට වඩා රජයේ ආදායම රු.බිලියන 736 කින් හෙවත් ප්‍රතිශතයක් ලෙස සියයට 22 කින් වැඩි කර රජයේ ආදායම ඇස්තමේන්තු කර තිබුණි.

(ඇ) ඉහත ආදායම් ඇස්තමේන්තුව පදනම් කර ගෙන අයවැය හිඟය ඇස්තමේන්තු කර තිබූ අතර එම ආදායම් ඇස්තමේන්තුව අනුව රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.9 ක් වී තිබුණි. ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම කෙරෙහි සැලැකිලිමත් විය යුතුව තිබුණත්, ඒ කෙරෙහි අවධානය යොමු නොකර ආදායම අධි ඇස්තමේන්තුකරණයක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) 2024 වර්ෂයේ රැස්කළ රජයේ ආදායම රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව රු.බිලියන 4,061 ක් වී තිබූ අතර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී රු.බිලියන 83 කින් අඩු වී තිබුණි. එය 2023 වර්ෂයේ තත්‍ය ආදායම සමඟ සැසඳීමේදී සියයට 32 ක වැඩිවීමක් වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය හිඟය අඩුවීම සියයට 17 ක් පමණක් විය.

### 4.2 ආදායම් ඌනතාවය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වල අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව ආදායමේ ඌනතාවය රු.බිලියන 1,309 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේදී පැවති රු.බිලියන 1,650ට සාපේක්ෂව අඩු වී තිබුණි. 2006 සිට 2023 වර්ෂය

දක්වා කාල පරාසය තුළ ඉහළම ආදායමේ ඌනතාවය 2023 වර්ෂයේදී වාර්තා වී තිබුණි. එම කාල පාරාසය තුළ සෑම වර්ෂයකම රැස්කළ ආදායම රජයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමට අපොහොසත් වී තිබුණි. ආදායමේ ඌනතාවයේ අවම අගය 2007 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර එය රු.බිලියන 43 ක් වී තිබුණු අතර, රැස්කළ රජයේ ආදායමෙන් සියයට 7.52 ක් නියෝජනය වී තිබුණි. එම කාල පරාසය තුළ සමස්ථ ආදායමේ ඌනතාවය රු.බිලියන 9,278 ක් වී තිබූ අතර එම ඌනතාවය පියවා ගැනීමට දේශීය හා විදේශීය ණය සහ විදේශ ප්‍රදාන ලබා ගෙන තිබුණි. මේ අනුව එම කාල පරාසය තුළ දේශීය ණය රු.බිලියන 30,878 ක්ද, විදේශීය ණය රු.බිලියන 12,285 ක් හා විදේශ ප්‍රදාන රු.බිලියන 331 ක් වශයෙන් එකතුව රු.බිලියන 43,494 ක් ලබා ගෙන තිබුණි. එක් එක් වර්ෂයේදී එසේ ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් සියයට 4.44 ක සිට සියයට 45.59 ක පරාසයක ප්‍රතිශතයන් මඟින් ආදායමේ ඌනතාවය මූල්‍යනය කර තිබුණි. ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් ආයෝජනයන් සිදු නොකර පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සියයට 20.25 ක්ද, 2020 වර්ෂයේදී සියයට 45.59 ක්, 2021 වර්ෂයේදී සියයට 42.39 ක්, 2022 වර්ෂයේදී සියයට 30.59 ක්, 2023 වර්ෂයේ දී සියයට 19.65 ක් හා 2024 වර්ෂයේ දී සියයට 19.02 ක් වශයෙන් උපයෝජනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පොළී ලෙස රු.බිලියන 2,689 ක් ගෙවා තිබුණු අතර, එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 50 ක් නියෝජනයක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ පොළී ගෙවීම් රු.බිලියන 2,455 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 51.91 ක් වී තිබුණි. පොළී ගෙවීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.බිලියන 234 කින් වැඩි වී තිබුණි. තවද, එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් 2022 අප්‍රේල් 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශීය ණය ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව 2022 අප්‍රේල් 13 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ඇතැම් ණය වාරික හා පොළී ගෙවීම් අත්හිටුවා තිබුණ නමුත් ඊට අදාළව වූ ගෙවීම් සිදු කලේ නම් එම ඌනතාවය තවදුරටත් වර්ධනය වන බව නිරීක්ෂණය විය. එමෙන්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ලබා ගන්නා ලද දේශීය ණය ප්‍රමාණය සියයට 62 කින් අඩු වී තිබුණද ඒ සඳහා ගෙවූ පොළී ප්‍රතිශතය සියයට 49 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේදී රු.බිලියන 151 ක් වූ පොළී ගෙවීම් 2024 වර්ෂය වන විට රු.බිලියන 2,689 ක් දක්වා සියයට 1,681 කින් වැඩි වී තිබුණි. අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබූ අතර ඒ සඳහා වන පොළී ගෙවීම වාර්ෂිකව වැඩි වී තිබුණි. 2024 වර්ෂයේදී අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව රැස්කරන ලද රු.බිලියන 4,061 ක රජයේ ආදායමෙන් පොළී ගෙවීමට රු.බිලියන 2,689 ක් හෙවත් සියයට 66.21 ක් වැයකර තිබුණි.

(ඇ) ආදායම් රැස්කරන ප්‍රධාන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ ආදායම් ශේෂයේ එකතුව රු.බිලියන 3,186 ක් වී තිබුණි.

(ඈ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයට අදාළව එකතු කළ යුතුව තිබුණු රු.බිලියන 1,150 ක ආදායම්, එකතු නොකර හිඟහිටව පැවැතුණි. එම ආදායම් 2024 වර්ෂයේ දී රැස්කර ගැනීමට

සමත් වුයේ නම් එම වර්ෂයේ ආදායම් ඌනතාවය රු.බිලියන 159 ක් දක්වා එනම්, සියයට 12.13 කින් අඩු කර ගත හැකිව තිබුණි. එම හිඟහිටි ආදායම 2022 හා 2023 වර්ෂ වලදී පිළිවෙලින් රු.බිලියන 904 ක් හා රු.බිලියන 1,066 ක් වී තිබුණි. එම වර්ෂවලද එම හිඟහිටි ආදායම් රැස්කර ගත හැකිව තිබුණේ නම් 2022 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 636 ක් දක්වා සියයට 41.30 කින් ද, 2023 වර්ෂයේදී ආදායම් ඌනතාවය රු.බිලියන 584 ක් දක්වා සියයට 35.37 කින් අඩුකර ගැනීමට හැකියාව පැවතුණි.

(ඉ) ඒ අනුව, බදු පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ පවතින අඩුපාඩු, හිඟ බදු අභියාචනා ක්‍රියාවලියේ දීර්ඝ කාලීන භාවය, හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට විශේෂිත වූ අධිකරණ පද්ධතියක් ස්ථාපිත වී නොතිබීම යන හේතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු අයකිරීමේ ප්‍රමාදයට බලපා තිබුණි.

(ඊ) නිවැරදි ආකාරයට ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හෝ පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු අනුව ආදායම රැස් නොකිරීමත්, අරපිරිමැසුම්දායක ලෙස වියදම් කළමනාකරණය නොකිරීමත් නිසා රාජ්‍ය ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. එම ණය ලබා ගැනීම වාර්ෂිකව වැඩි වී තිබීම නිසා ණය පොලී පිරිවැය වාර්ෂිකව වැඩිවී තිබීම හේතුවෙන් පුනරාවර්තන වියදම වැඩි වී තිබුණි. ඇස්තමේන්තු කළ ආදායම අපේක්ෂිත පරිදි රැස් කර ගැනීමට නොහැකි වීමත්, පුනරාවර්තන වියදම වැඩිවීමත් නිසා වාර්ෂිකව වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ආදායම් ඌනතාවය වාර්ෂිකව වැඩි වී තිබුණි.

### 4.3 අයවැය හිඟය

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2024 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,126 ක් වී තිබූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.11 ක් වී තිබුණි. 2023 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,584 ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.35 ක් වී තිබුණි. 2006 සිට 2024 වර්ෂය දක්වා සමස්ත කාල පරාසය පුරාවට අයවැය හිඟයන් පැවැතුණු අතර, එය 2006 වර්ෂයේ පැවැති රු.බිලියන 300 ක අයවැය හිඟය 2024 වර්ෂය වන විට රු.බිලියන 2,126 ක් දක්වා වර්ධනය වී තිබුණි. එම කාලපරාසය තුළ ඉහළම අයවැය හිඟය 2023 වර්ෂයේදී වාර්තා වී තිබුණි. 2006 සිට 2024 වර්ෂය දක්වා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට එය සියයට 5.55 ක සිට සියයට 14.08 ක් දක්වා පරාසයක පැවතුණි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව තත්‍ය අයවැය හිඟය තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පැවැතිය යුතුව තිබුණු සියයට 5 ක සීමාව එම කාල පරිච්ඡේදය තුළ කිසිම වර්ෂයකදී පවත්වා ගෙන නොතිබුණි. 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් සියයට 5.55 ක්, සියයට 5.69ක් හා 5.59 ක ප්‍රමාණයයන් ගෙන් පවත්වා ගැනීමට සමත් වී තිබුණි.

### 4.4 බදු අභියාචනා ක්‍රියාවලිය

2025 ජනවාරි 31 දින වනවිට බදු අභියාචනා කොමිසම් සභාවේ ලියාපදිංචි කර ඇති එහෙත් විසඳා අවසන් නොවූ අභියාචනා 506ක් පැවති අතර ඊට අදාල බදු වටිනාකම රු. මිලියන 110,395 ක් වී තිබුණි. මේ තුළ රු. බිලියනය ඉක්මවූ එකතුව රු. මිලියන 70,494 ක් වූ අභියාචනා 29 ක් හා රු.මිලියන 100 ත් 1000 ත් අතර එකතුව රු. මිලියන 33,096 ක් වූ අභියාචනා 107 ඇතුළත්වී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ලියාපදිංචි වී තිබුණද කිසිදු විභාග කිරීමක් ආරම්භ කර නොතිබූ බදු අගය රු. මිලියන 3,408 ක්වූ අභියාචනා 27ක් හා විභාග කිරීම ආරම්භ කර ඇතත් නිශ්චයන් ලබා දී නොතිබූ එකතුව රු. මිලියන 106,990 ක් වූ අභියාචනා 483 ඇතුළත්වී තිබුණි. තවද, 2022 සිට 2025 ජනවාරි 28 දින දක්වා අභියාචනා විභාග කිරීම අවසන් වුවත්, අවසන් නිශ්චය ලබා දී නොමැති වූ 'Reserved Cases' 233 ක් පැවැති අතර ඊට අදාළ බදු මුදලෙහි වටිනාකම රු. මිලියන 36,514 ක් වී තිබුණි. මෙසේ බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ කටයුතු දීර්ඝ කාලයක් නිම නොකර සිටීමෙන් රජයට අයකරගත හැකිව පවතින අදායම් එකතුකර ගැනීමේ සැළකියයුතු ප්‍රමාදයක් සිදුවන බව හා එ් හේතුවෙන් රජයට අනවශ්‍ය සෘජු හා වක්‍ර පිරිවැයක් දැරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

### 4.5 ණය ශේෂය වර්ධනය වීම

අයවැය හිඟය වාර්ෂිකව වර්ධනය වීම හේතුවෙන් ණය ලබා ගැනීම් ප්‍රමාණය ද ඊට අනුරූපීව වැඩි වී තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2024 වර්ෂය අවසාන වන විට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු.බිලියන 29,627 ක් වී තිබුණි. එම ශේෂය දේශීය ණය වශයෙන් රු.බිලියන 18,893ක් ද, විදේශ ණය වශයෙන් රු.බිලියන 10,734 ක් වශයෙන් ද පැවතුණි. 2023 වර්ෂයේදී රජයේ ණය ශේෂය රු.බිලියන 29,150 ක් වී තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී ණය ශේෂය රු.බිලියන 478 කින් හෙවත් සියයට 1.6 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ පැවැති රු.බිලියන 2,431 ක රජයේ ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 82.72 ක් වී තිබූ අතර, 2024 වර්ෂය අවසාන වන විට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 94.39 ක් වී තිබුණි. තවද, 2013 අංක 15 දරන සංශෝධිත රාජ්‍ය මුල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව රජයේ බැරකම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 කට වඩා අඩු විය යුතුව තිබුණත්, අනෙකුත් බැරකම් හැර රජයේ ණය බැරකම පමණක් එම සීමාව ඉක්මවා සියයට 94.39 ක් වී තිබුණි. එම තත්ත්වය 2020, 2021,2022 හා 2023 වර්ෂ වලදී ද පැවතුණි.

### 4.6 රාජ්‍ය ණය

#### (අ) රාජ්‍ය ණය ගැනීමේ වැඩසටහන අනුව සැලැසුම් කළ ණය ප්‍රමාණය ඉක්මවා ණය ලබා ගැනීම

සමාලෝචිත වර්ෂයේ මූලික ණය ගැනීමේ වැඩසටහන අනුව සැලසුම්ගත භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 2,409,700 ක් වී තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන

3,071,892 ක් භාණ්ඩාගාර බැඳුම්කර මඟින් ලබා ගෙන තිබුණි. ඒ අනුව රු.මිලියන 662,192 ක් හෙවත් සැලසුම්ගත ප්‍රමාණය ඉක්මවා සියයට 27 ක් භාණ්ඩාගාර බැඳුම්කර මඟින් ණය ලබා ගෙන තිබුණි.

(ආ) 2024 වර්ෂයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි වේ.

| සංවර්ධන පාර්ශවකරුවන් | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු ප්‍රදාන ඇතුලත්ව 2024 (එ.ජ.ඩො. මිලියන) | සත්‍ය ප්‍රතිලබ්ධි අගය ප්‍රදාන ඇතුලත්ව 2024 (එ.ජ.ඩො මිලියන) | විචලනය (එ.ජ.ඩො මිලියන) | විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ( %) |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 397 | 564.9 | 167.9 | 42 |
| ආසියානු සංවර්ධන බැංකුව | 600 | 862.1 | 262.1 | 44 |
| චීනය | 281 | 51.9 | (229.1) | (82) |
| ජපානය | 59 | 37.3 | (21.7) | (37) |
| කොරියාව | 39 | 4.3 | (34.7) | (89) |
| මැද පෙරදිග රටවල් සහ ඔපෙක් අරමුදල | 83 | 39.3 | (43.7) | (53) |
| දකුණු ආසියානු රටවල් | 124 | - | (124) | (100) |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 122 | 7.94 | (114.06) | (93) |
| IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 48 | 16.4 | (31.6) | (66) |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 0 | 334 | 334 | 100 |
| | --- | --- | --- | |
| | **1,753** | **1,918** | **165.1** | |
| | ===== | ==== | ==== | |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2024 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො මිලියන 1,753 ක් වුවද, තත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො මිලියන 1,918 ක් වීම හේතුවෙන් තත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො මිලියන 165.1 කින් එනම් සියයට 9 කින් පමණ වැඩි වී තිබුණි.

(ii) ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යන පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් ණයවල තත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙලින් සියයට 42 හා 44 කින් වැඩි වී තිබුණි.

(iii) චීනය, ජපානය, කොරියාව, මැද පෙරදිග රටවල්, IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හා රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් වලින් ලබා ගැනීමට අපේක්ෂා කල ණය පිළිවෙලින් සියයට 82, 37, 89, 53, 66 සහ 93 කින් අඩු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දී දකුණු ආසියානු රටවල්වලින් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කලද, වර්ෂය අවසාන වන විටත් ණය ලබා ගෙන නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් (IMF) කිසිදු ප්‍රතිලබ්ධිවීමක් අපේක්ෂා නොකළද එ.ජ.ඩො.මිලියන 334 ක් ප්‍රතිලබ්ධි වී තිබුණි.

**4.7 ලාභ හා ලාභාංශ**

(අ) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 2,493,232 ක් වුවද, එම ආයෝජන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 41,080 ක ලාභ හා ලභාංශ ලැබී තිබුණි. එය සිදු කර තිබුණු ආයෝජන වටිනාකමෙන් සියයට 1.6 ක් විය.

(ආ) 2024 වර්ෂය සඳහා ලාභ ආදායම් වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 64,192 ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 33,191 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 51 ක් පමණක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ලාභාංශ ආදායම් සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 5,341ක් වූ අතර තත්ය ආදායම රු.මිලියන 7,890 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු.මිලියන 2,549 ක් රැස් කරගෙන තිබුණි. ඒ අනුව, එය ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 48 ක වැඩිවීමකි.

(ඈ) 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන රජය සතු ව්‍යාපාර සහ අනෙකුත් ආයතන සංඛ්‍යාව 305 ක් වුවද, ඉන් ආයතන 73 ක් සඳහා පමණක් ආදායම් ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර ඉන් ආයතන 43 කින් පමණක් ලාභ හා ලාභාංශ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදය ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද නුබුන්වත් බව සහතික කරන රාජ්‍ය සමාගම්වල බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ගෙන්වා ගත යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය සමාගම් 11 කට අදාළව 2023 වර්ෂයේ ලාභාංශ වලින් එකතුව රු.මිලියන 13,010 ක් වූ ලාභාංශ ආදායමක් එකතුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**4.8 භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි**

(අ) 2024 වර්ෂය තුළ හා ඊට පෙර කල් ඉකුත් වීම මත රු.මිලියන 143,094 ක සහ එකතුව ඇ.ඩො. 2,678.29 ක වටිනාකමින් යුතු භාණ්ඩාගාර ඇපකර 25 කට හා රු. මිලියන 32,550 ක හා ඇ.ඩො. 210 ක වටිනාකමින් යුතු සහන ලිපි 15 කට අදාළ වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දින වන විට නැවත දීර්ඝ කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 11 ක දී නිකුත් කළ රු.මිලියන 102,474.21 ක්, ඇ.ඩො. මිලියන 2,824.31 ක් සහ යුරෝ 12.29 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 17 ක දී නිකුත් කළ එකතුව රු.මිලියන 33,430 ක් සහ ඇ.ඩො. 210 ක් වටිනා සහන ලිපි 2024 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, අදාළ වලංගු කාලය ඉක්මවීමට පෙර විධිමත් පරිදි අවසන් කිරීමට හෝ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 හෝ ඊට පෙර වර්ෂවල ලබා දුන් භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි, වෙනුවෙන් දෙපාර්තමේන්තුව අවස්ථා 7 කට අදාළව ණය වාරික වශයෙන් රු.මිලියන 92 ක් හා ණය පොළිය ලෙස රු.මිලියන1,741 ක් වශයෙන් මුළු එකතුව රු.මිලියන 1,832 ක් අදාළ ආයතනයන්ට 2020 වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ඈ) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය රෝහල ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය මුදලින් 2024 මාර්තු මාසයට අදාළව හිඟව පැවති ණය වාරිකය හා පොළිය පියවීම සඳහා රු. මිලියන 2,200 ක්ද, සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවිය යුතුව පැවති හිඟ ණය සහ පොළිය ගෙවීම සඳහා ඇ.ඩො. මිලියන 8 කට සමාන රු. මිලියන 2,400 ක් ද ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම හේතුවෙන් එකතුව රු.මිලියන 4.6 ක මුදලක් හිඟ ණය හා පොළී ශේෂයන් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයට දැරීමට සිදුව තිබුණි.

**4.9 දේශීය හා විදේශීය ප්‍රදාන**

(අ) සමාලෝචිත වර්ෂයට පෙර ප්‍රදායකයන් 07 දෙනෙකුගෙන් ව්‍යාපෘති 13 කට අදාළව ලැබී තිබූ නමුත් අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදායක වෙත ආපසු යවා තිබූ ප්‍රදාන වල එකතු වටිනාකම රු. මිලියන 326.6 ක් වී තිබුණි.

(ආ) 2024 ජනවාරි 01 දින වන විටත් දේශීය ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 146.5 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ අරමුණට නොයොදවා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) පළාත් සභාවලට අදාල මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා 09 වෙත රජයේ ප්‍රදාන ලෙස රු.මිලියන 428,331 ක් ලබා දී තිබුණි. රජයේ ප්‍රදාන හැර එම පළාත් සභා විසින් රැස්කරන ලද ආදායම රු. මිලියන 93,077 ක් වී තිබු අතර ඒ තුළ රු.මිලියන 8,355 ක ආයෝජන ආදායම් ද අන්තර්ගත වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට සියළු පළාත් සභා සතු මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව රු.මිලියන 41,782 ක් වී තිබු අතර සභා 05 ක් සතුව එකතුව රු. මිලියන 67,511 ක අයෝජන පැවතුණි. ඒ අනුව පළාත් සභා 09 සතුව රු. මිලියන 109,292 ඉහළ ද්‍රවශීල වත්කම් පවතින බවත්, එමඟින් ඉහළ ආයෝජන ආදායමක් උපයන බවත් නිරීක්ෂණය වන අතර රජය විසින් විවිධ මූල්‍යන මාර්ග මගින් ලබාගනු ලබන අරමුදල්, පළාත් සභාවලට රජයේ ප්‍රදාන ලෙස ලබා දීමේදී මෙම තත්ත්වය හා සමස්ථයක් ලෙස රජයට වන පිරිවැය පිළිබඳව විධිමත් සලකා බැලීමක් සිදු කර ඇතිද යන්න විගණනයේදී අනාවරණය නොවුණි.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

# සංඛ්‍යා ලේඛන
# පරිශිෂ්ටය

## 1 සංඛ්‍යා සටහන | ශ්‍රී ලංකාව - ජනගහනය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා

| අයිතමය | | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024[අ] |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මධ්‍ය වාර්ෂික ජනගහනය | '000 | 20,653 | 20,869 | 20,328 | 20,483 | 20,771 | 20,966 | 21,203 | 21,444 | 21,670 | 21,803 | 21,919 | 22,156 | 22,181 | 22,037 | 21,916 |
| මධ්‍ය වාර්ෂික ජනගහනය වයස් කාණ්ඩ අනුව [ආ] | '000 | | | | | | | | | | | | | | | |
| අවුරුදු 0-14 | | 5,431 | 5,488 | 5,132 | 5,171 | 5,235 | 5,288 | 5,348 | 5,411 | 5,470 | 5,504 | 5,534 | 5,596 | 5,603 | 5,568 | 5,538 |
| අවුරුදු 15-64 | | 13,921 | 14,065 | 13,604 | 13,707 | 13,901 | 14,030 | 14,187 | 14,349 | 14,499 | 14,589 | 14,665 | 14,823 | 14,840 | 14,742 | 14,662 |
| අවුරුදු 65 ට වැඩි | | 1,301 | 1,316 | 1,592 | 1,605 | 1,635 | 1,648 | 1,668 | 1,684 | 1,701 | 1,710 | 1,720 | 1,737 | 1,738 | 1,727 | 1,716 |
| ජනගහන වර්ධන අනුපාතය [ඇ] | % | 1.0 | 1.0 | 0.9 | 0.8 | 0.9 | 0.9 | 1.1 | 1.1 | 1.1 | 0.6 | 0.5 | 1.1 | 0.1 | -0.7 | -0.6 |
| ජනගහන ඝනත්වය | පුද්ගලයින් වර්ග කි.මී. 1 ට | 329 | 333 | 324 | 327 | 331 | 334 | 338 | 342 | 346 | 348 | 350 | 353 | 354 | 351 | 350 |
| උපතේ දී ආයු අපේක්ෂාව | අවුරුදු | - | 74.9 | 75.1 | 74.3 | 74.9 | 75.0 | ලැ.නො. | 75.5 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| දළ උපත් අනුපාතය | '000 | 17.6 | 17.4 | 17.5 | 17.9 | 16.9 | 16.0 | 15.6 | 15.2 | 15.1 | 14.6 | 13.8 | 12.9 | 12.4 | 11.2 | 10.1 |
| දළ මරණ අනුපාතය | '000 | 6.2 | 5.9 | 6.0 | 6.2 | 6.2 | 6.3 | 6.2 | 6.5 | 6.4 | 6.7 | 6.0 | 7.4 | 8.1 | 8.2 | 7.8 |
| ළදරු මරණ අනුපාතය | සජීවී උපත්. 000 | – | – | ලැ.නො. | 8.2 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 8.5 | ලැ.නො. | ලැ.නො. | 6.4 | ලැ.නො. | 7.4 | ලැ.නො. | ලැ.නො. |
| මාතෘ මරණ අනුපාතය | 100,000 සජීවී උපත් | 22.0 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 23.2 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 22.6 | ලැ.නො. | ලැ.නො. |
| ශුද්ධ සංක්‍රමික අනුපාතය | '000 | -1.1 | -2.2 | -2.6 | -2.3 | -2.0 | 0.7 | 2.1 | 2.3 | 0.8 | -2.3 | -4.3 | -4.3 | -9.69 | -8.1 | ලැ.නො. |
| යැපුම් අනුපාතය | % | 48.36 | 48.38 | 49.4 | 52.9 | 49.4 | 49.1 | 49.4 | 49.4 | 49.4 | 49.4 | 49.4 | 49.4 | 49.5 | 49.5 | 49.5 |
| යැපුම් අනුපාතය - අවුරුදු 65 ට වැඩි | % | 9.35 | 9.36 | 11.7 | 14.1 | 11.8 | 11.5 | 11.8 | 11.7 | 11.7 | 11.7 | 11.7 | 11.7 | 11.7 | 11.7 | 11.7 |
| සාක්ෂරතාව [ඈ] | මුළු ජනගහනයෙන් % | 91.9 | 92.2 | 95.7 | 92.5 | 93.3 | 93.2 | 93.1 | 92.6 | 92.6 | 92.9 | 93.0 | 93.0 | 93.1 | 93.2 | ලැ.නො. |
| පරිගණක සාක්ෂරතා අනුපාතය [ඉ] | මුළු ජනගහනයෙන් % | 20.3 | 35.0 | 37.0 | 40.0 | 24.9 | 27.1 | 27.6 | 28.6 | 29.0 | 30.8 | 32.3 | 35.0 | 36.0 | 39.0 | ලැ.නො. |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | කිලෝ කැලරි | - | 2,094 | - | 2,111 | - | - | - | 2,095[ඌ] | 2,095[ඌ] | 2,120[ඌ] | 2,120[ඌ] | 2,120[ඌ] | 2,120[ඌ] | 2,120[ඌ] | 2,120[ඌ] |

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශය

[අ] තාවකාලික

[ආ] ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය මත පදනම් වේ.

[ඇ] 2006/2007, 2009, 2014 සහ 2017 පරිගණක සාක්ෂරතා සමීක්ෂණය

[ඈ] 2016 සහ 2019 කුටුම්භ ආදායම හා වියදම් සමීක්ෂණය

[ඉ] ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙහි 2012 ජන හා නිවාස සංගණනය මත පදනම්ව

[ඌ] පළමු මාස 6

[ඍ] රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්තා පරිදි

ලැ.නො. - ලැබී නොමැත

| අයිතමය | ඒකක | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සමස්ත වාර්ෂික වර්ෂාපතනය : සාමාන්‍ය** | මිමි | **1,992** | **2,027** | **1,776** | **1,687** | **2,375** | **2,387** | **1,351** | **1,757** | **1,944** | **2,054** | **1,613** | **2,312** | **1,966** | **2,536** | **2,371** |
| **වැඩිම වර්ෂාපතනය** | | | | | | | | | | | | | | | | |
| වැඩිම වර්ෂාපතනයක් සහිත නගර | මිමි | | | | | | | | | | | | | | | |
| අනුරාධපුරය | | 98.6 | 114.4 | 130.8 | 145.4 | 162.5 | 121.6 | 192.5 | 122.4 | 92.1 | 172.1 | 128.8 | 154.7 | 156.4 | 165.3 | 155.9 |
| බදුල්ල | | 90.9 | 131.6 | 102.9 | 108.6 | 195.9 | 79.4 | 73.8 | 78.8 | 69.7 | 93.4 | 70.4 | 96.6 | 182.2 | 215.3 | 172.0 |
| මඩකලපුව | | 145.5 | 312.2 | 127.5 | 229.2 | 147.8 | 182.9 | 210.6 | 97.4 | 145.9 | 127.3 | 180.3 | 142.4 | 185.3 | 199.7 | 197.4 |
| කොළඹ | | 440.2 | 81.9 | 114.6 | 134.3 | 102.8 | 114.4 | 256.9 | 95.2 | 125.9 | 148.3 | 150.8 | 140.6 | 239.0 | 339.3 | 344.2 |
| හම්බන්තොට | | 82.9 | 100.6 | 176.5 | 104.8 | 112.0 | 92.2 | 104.0 | 75.4 | 60.3 | 94.9 | 40.1 | 99.3 | 74.0 | 204.2 | 116.2 |
| නුවර | | 115.6 | 137.3 | 181.2 | 94.8 | 139.6 | 80.4 | 133.5 | 64.5 | 74.9 | 71.6 | 70.6 | 99.4 | 197.3 | 226.5 | 202.9 |
| කුරුණෑගල | | 135.4 | 144.4 | 315.5 | 139.6 | 162.6 | 97.9 | 156.4 | 85.2 | 104.8 | 188.6 | 100.2 | 93.1 | 224.2 | 240.0 | 249.7 |
| නුවර එළිය | | 68.2 | 94.1 | 109.5 | 73.2 | 77.1 | 120.0 | 78.7 | 73.6 | 65.2 | 106.8 | 62.0 | 91.9 | 182.8 | 215.7 | 179.7 |
| රත්නපුරය | | 139.9 | 166.9 | 99.1 | 114.9 | 178.1 | 82.7 | 136.0 | 348.5 | 181.3 | 184.0 | 193.3 | 147.2 | 437.7 | 478.1 | 485.2 |
| වවුනියාව | | 163.9 | 123.2 | 225.7 | 81.8 | 205.2 | 136.5 | 202.5 | 93.6 | 88.6 | 77.6 | 138.5 | 77.1 | 156.0 | 204.7 | 153.8 |
| **අඩුම උෂ්ණත්වය (වාර්ෂික සාමාන්‍යය)** | $^0$C | | | | | | | | | | | | | | | |
| පහත රට | | 24.9 | 24.7 | 24.2 | 24.3 | 23.4 | 24.3 | 24.7 | 24.4 | 24.1 | 24.6 | 24.7 | 24.5 | 24.3 | 24.8 | 25.1 |
| කඳු රට | | 17.5 | 17.1 | 16.8 | 17.1 | 17.1 | 16.9 | 17.2 | 18.2 | 16.9 | 17.2 | 17.0 | 17.3 | 17.1 | 17.7 | 18.0 |
| **වැඩිම උෂ්ණත්වය (වාර්ෂික සාමාන්‍යය)** | $^0$C | | | | | | | | | | | | | | | |
| පහත රට | | 31.4 | 31.1 | 32.1 | 31.7 | 31.9 | 32.0 | 32.6 | 32.1 | 31.8 | 32.2 | 32.3 | 31.8 | 31.6 | 32.1 | 32.5 |
| කඳු රට | | 25.9 | 26.0 | 26.1 | 25.3 | 25.7 | 25.9 | 26.5 | 27.3 | 25.8 | 27.7 | 25.8 | 26.2 | 25.6 | 26.1 | 26.7 |

මූලාශ්‍රය : කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
සටහන : කඳුරට උෂ්ණත්වය ගණනය කිරීමේ දී බදුල්ල, බණ්ඩාරවෙල, නුවර එළිය සහ කටුගස්තොට ප්‍රදේශ වල උෂ්ණත්වය සැලකිල්ලට ගෙන ඇත.

## 3 සංඛ්‍යා සටහන| දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය සහ විනිමය අනුපාත

| වර්ෂය | ද.දේ.නි.[ඊ] | | | | | | | | උද්ධමනය | | | විනිමය අනුපාත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පවත්නා වෙළෙඳපළ මිල අනුව (රු.මිලි) | පවත්නා වෙළෙඳපළ මිල අනුව (ඇ.ඩො. මිලි.) | ඒක පුද්ගල ආදායම. පවත්නා වෙළෙඳපළ මිල අනුව | මූර්ත ද.දේ.නි. වර්ධනය (%) | ද.දේ.නි. යට දායකත්වය (පවත්නා සාධක මිල අනුව) (%) | | | | ද.දේ.නි. අවධමනකය (%) | වාර්ෂික සාමාන්‍යයෙහි % වෙනස කොප.මී.ද | වාර්ෂික සාමාන්‍යයෙහි % වෙනස ජප.මී.ද. | වර්ෂ අවසාන | | | | වාර්ෂික සාමාන්‍ය | | | |
| | | | | | | | | | | | | ඇ.ඩො. | යෙන් | යුරෝ | ඉන්දියානු රු.) | ඇ.ඩො. | යෙන් | යුරෝ | ඉන්දියානු (රු.) |
| | | | රු. | ඇ.ඩො. | | කෘෂිකර්මාන්ත | කර්මාන්ත | සේවා | | | | | | | | | | | |
| 2010 | 6,413,668 | 56,726 | 310,214 | 2,744 | 8.0 | 8.5 | 26.6 | 54.6 | 7.3 | 6.2[අ] | - | 110.95 | 1.36 | 147.56 | 2.48 | 113.06 | 1.30 | 150.10 | 2.49 |
| 2011 | 7,219,106 | 65,293 | 345,544 | 3,125 | 8.4 | 8.8 | 28.0 | 55.1 | 3.8 | 6.7[අ] | - | 113.90 | 1.47 | 147.42 | 2.15 | 110.57 | 1.39 | 153.86 | 2.38 |
| 2012 | 8,732,463 | 68,434 | 427,538 | 3,351 | 9.1 | 7.4 | 30.1 | 55.6 | 10.8 | 7.6[අ] | - | 127.16 | 1.48 | 168.12 | 2.33 | 127.60 | 1.60 | 164.00 | 2.39 |
| 2013 | 9,592,125 | 74,294 | 465,976 | 3,609 | 3.4 | 7.7 | 29.2 | 56.4 | 6.2 | 6.9[අ] | - | 130.75 | 1.24 | 180.45 | 2.11 | 129.11 | 1.32 | 171.51 | 2.21 |
| 2014 | 10,361,151 | 79,359 | 498,660 | 3,819 | 5.0 | 8.0 | 28.3 | 56.9 | 2.9 | 3.3[අ] | - | 131.05 | 1.10 | 159.42 | 2.07 | 130.56 | 1.24 | 173.59 | 2.14 |
| 2015 | 11,566,987 | 85,110 | 551,597 | 4,059 | 5.0 | 8.2 | 29.5 | 54.2 | 0.6 | 2.2[අ] | 3.8[ආ] | 144.06 | 1.20 | 157.37 | 2.17 | 135.94 | 1.12 | 150.84 | 2.12 |
| 2016 | 12,812,975 | 87,992 | 604,129 | 4,149 | 5.1 | 7.3 | 30.5 | 53.4 | 5.4 | 4.0[අ] | 4.0[ආ] | 149.80 | 1.29 | 157.87 | 2.21 | 145.60 | 1.34 | 161.16 | 2.17 |
| 2017 | 14,387,319 | 94,356 | 670,644 | 4,398 | 6.5 | 7.4 | 31.1 | 52.2 | 5.5 | 6.6[අ] | 7.7[ආ] | 152.85 | 1.36 | 182.49 | 2.39 | 152.46 | 1.36 | 171.73 | 2.34 |
| 2018 | 15,351,933 | 94,749 | 708,442 | 4,372 | 2.3 | 7.6 | 30.1 | 53.6 | 4.3 | 4.3[අ] | 2.1[ආ] | 182.75 | 1.65 | 208.99 | 2.61 | 162.54 | 1.47 | 191.71 | 2.37 |
| 2019[අ] | 15,910,976 | 88,989 | 729,761 | 4,082 | -0.2 | 7.3 | 29.2 | 55.7 | 3.9 | 4.3[අ] | 3.5[ආ] | 181.63 | 1.67 | 203.67 | 2.55 | 178.78 | 1.64 | 200.14 | 2.54 |
| 2020[අ] | 15,646,254 | 84,420 | 713,822 | 3,851 | -4.6 | 8.3 | 28.2 | 57.8 | 3.1 | 4.6[අ] | 6.2[ආ] | 186.40 | 1.80 | 229.42 | 2.55 | 185.52 | 1.73 | 212.06 | 2.50 |
| 2021[අ] | 17,612,370 | 88,611 | 794,926 | 3,999 | 4.2 | 8.8 | 30.0 | 55.9 | 8.0 | 6.0[අ] | 7.0[ආ] | 200.43 | 1.74 | 226.86 | 2.69 | 198.88 | 1.81 | 235.10 | 2.69 |
| 2022[අ] | 24,063,162 | 76,845 | 1,084,882 | 3,464 | -7.3 | 8.5 | 29.8 | 57.0 | 47.5 | 46.4[අ] | 50.4[ආ] | 363.11 | 2.74 | 386.93 | 4.39 | 324.55 | 2.44 | 339.04 | 4.11 |
| 2023[අ] | 27,419,804 | 83,756 | 1,244,262 | 3,801 | -2.3 | 8.1 | 25.8 | 59.8 | 16.7 | 17.4[අ] | 16.5[ආ] | 323.92 | 2.29 | 358.75 | 3.90 | 327.53 | 2.34 | 354.11 | 3.97 |
| 2024[ආ] | 29,898,564 | 98,963 | 1,364,235 | 4,516 | 5.0 | 8.3 | 25.5 | 57.5 | 3.8 | 1.2[ඉ] | 1.6[ඉ] | 292.58 | 1.87 | 304.56 | 3.42 | 302.12 | 2.00 | 327.05 | 3.61 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

[අ] සංශෝධිත

[ආ] තාවකාලික

[ඇ] 2006/07 = 100

[ඈ] 2013 = 100

[ඉ] 2021 = 100

[ඊ] 2003 වසරේ සිට ජාතික ගිණුම් දත්ත ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පදනම් වර්ෂය (2002) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත. .2010 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පදනම් වර්ෂය (2010) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. 2015 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. ජාතික ගිණුම් ඇස්තමේන්තු 1982 සහ 1996 වසරවල ශ්‍රී ලංකා මහ බැංකුව සංශෝධනය කරන ලදී.

## 4 සංඛ්‍යා සටහන | දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2016-2024) ස්ථාවර මිල අනුව

රු. මිලියන

| | අංශය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021(අ) | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **906,100** | **889,557** | **945,292** | **949,582** | **941,046** | **950,548** | **911,252** | **925,822** | **937,104** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 15,972 | 14,371 | 14,676 | 13,355 | 21,342 | 21,949 | 16,507 | 16,920 | 18,758 |
| 2 | වී වගාව | 81,151 | 73,247 | 106,333 | 112,919 | 121,663 | 107,359 | 94,730 | 110,946 | 114,369 |
| 3 | එළවළු වගාව | 110,669 | 104,540 | 105,072 | 102,037 | 111,088 | 109,147 | 103,161 | 106,135 | 109,069 |
| 4 | "උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග" | 3,892 | 3,267 | 3,116 | 3,275 | 4,021 | 3,729 | 3,803 | 3,515 | 3,187 |
| 5 | පළතුරු වගාව | 59,191 | 63,514 | 70,906 | 77,200 | 81,823 | 72,949 | 73,310 | 78,076 | 81,548 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම් වගාව) | 103,335 | 85,798 | 89,706 | 102,800 | 92,197 | 102,490 | 111,196 | 104,725 | 92,703 |
| 7 | තේ වගාව | 70,662 | 73,767 | 75,219 | 72,733 | 67,971 | 74,604 | 62,867 | 61,912 | 62,953 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී.) | 1,492 | 1,407 | 1,748 | 1,302 | 1,613 | 1,352 | 1,229 | 1,136 | 1,110 |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 86,234 | 86,727 | 91,543 | 90,880 | 93,776 | 97,767 | 101,653 | 99,729 | 101,653 |
| 10 | රබර් වගාව | 24,526 | 25,583 | 26,050 | 24,029 | 24,081 | 26,464 | 23,871 | 22,024 | 22,503 |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 25,438 | 26,157 | 27,185 | 28,751 | 29,781 | 26,963 | 27,533 | 29,440 | 25,949 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 81,672 | 90,822 | 94,582 | 90,284 | 86,907 | 94,039 | 83,307 | 83,587 | 95,363 |
| 13 | පැල බෝ කිරීම | 849 | 961 | 795 | 772 | 622 | 813 | 965 | 728 | 626 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 23,156 | 16,811 | 23,159 | 22,969 | 26,102 | 29,019 | 33,062 | 32,888 | 31,868 |
| 15 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 46,078 | 51,611 | 44,606 | 43,133 | 42,587 | 44,348 | 50,931 | 47,221 | 46,209 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 154,249 | 151,558 | 149,782 | 141,700 | 111,307 | 112,814 | 95,447 | 100,099 | 104,947 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 17,536 | 19,417 | 20,815 | 21,444 | 24,166 | 24,742 | 27,682 | 26,739 | 24,290 |
| | **කර්මාන්ත** | **3,670,106** | **4,145,813** | **4,101,467** | **3,933,728** | **3,724,566** | **3,937,895** | **3,308,573** | **3,002,968** | **3,333,008** |
| 18 | පතල් හා කැණීම් කර්මාන්තය | 296,763 | 331,386 | 322,522 | 318,658 | 284,079 | 287,969 | 198,613 | 154,303 | 184,166 |
| 19 | ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 838,355 | 855,603 | 896,813 | 929,371 | 980,863 | 1,014,150 | 869,371 | 899,739 | 954,409 |
| 20 | රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ හා බුමුතුරුණු නිෂ්පාදනය | 419,018 | 441,181 | 463,618 | 469,028 | 416,312 | 473,911 | 511,860 | 450,438 | 500,210 |
| 21 | ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 38,341 | 38,346 | 39,879 | 36,321 | 32,831 | 35,579 | 29,758 | 23,807 | 24,975 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත ksIamdokh | 53,085 | 56,009 | 57,716 | 54,064 | 51,896 | 56,811 | 52,069 | 47,259 | 48,734 |
| 23 | අඟුරු සහ බනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 22,237 | 21,395 | 19,846 | 24,630 | 22,108 | 15,492 | 6,474 | 21,895 | 19,690 |
| 24 | රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 80,785 | 84,781 | 88,399 | 90,144 | 92,157 | 95,793 | 82,349 | 82,949 | 90,994 |
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 91,787 | 102,246 | 101,890 | 98,429 | 81,182 | 97,436 | 67,505 | 56,157 | 60,972 |
| 26 | ලෝහමය නොවන වෙනත් බණිජ නිෂ්පාදන | 87,492 | 97,743 | 102,554 | 107,062 | 102,685 | 119,973 | 85,182 | 84,670 | 86,813 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 66,089 | 76,380 | 84,102 | 80,312 | 77,859 | 81,174 | 58,780 | 60,303 | 70,963 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 58,083 | 63,885 | 64,638 | 66,114 | 65,187 | 73,090 | 59,181 | 50,229 | 53,372 |

## 4 සංඛ්‍යා සටහන | දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2016-2024) ස්ථාවර මිල අනුව (සම්බන්ධිතයි...)

රු. මිලියන

| අංශය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021(අ) | 2022(අ) | 2023(අ) | 2024(ආ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 29 ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 91,297 | 92,650 | 88,078 | 95,470 | 81,651 | 82,694 | 60,837 | 56,089 | 61,740 |
| 30 වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවි කිරීම | 88,689 | 97,692 | 97,155 | 96,432 | 87,586 | 101,048 | 79,088 | 66,747 | 72,427 |
| 31 විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 154,072 | 159,607 | 175,518 | 184,041 | 180,176 | 188,924 | 178,059 | 174,017 | 185,978 |
| 32 ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 17,812 | 18,948 | 15,857 | 14,701 | 15,908 | 13,099 | 14,059 | 11,590 | 11,906 |
| 33 මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 23,196 | 25,562 | 27,271 | 29,253 | 28,960 | 27,992 | 28,070 | 27,955 | 28,319 |
| 34 ඉදිකිරීම් කර්මාන්තය | 1,243,005 | 1,582,397 | 1,455,612 | 1,239,700 | 1,123,127 | 1,172,761 | 927,319 | 734,821 | 877,339 |
| **සේවාවන්** | **6,567,892** | **6,807,557** | **7,099,084** | **7,307,036** | **7,166,506** | **7,410,705** | **7,217,485** | **7,206,496** | **7,381,059** |
| 35 තොග හා සිල්ලර වෙළඳාම | 1,453,289 | 1,509,059 | 1,579,590 | 1,636,752 | 1,650,889 | 1,675,083 | 1,675,528 | 1,677,941 | 1,700,232 |
| 36 මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,299,605 | 1,342,326 | 1,370,263 | 1,398,230 | 1,313,312 | 1,325,233 | 1,364,677 | 1,422,786 | 1,464,296 |
| 37 තැපැල් හා කුරියර් සේවාවන් | 15,957 | 16,385 | 16,495 | 17,099 | 17,620 | 18,886 | 19,780 | 20,349 | 21,627 |
| 38 නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 213,001 | 219,701 | 230,929 | 216,976 | 128,556 | 130,743 | 166,030 | 209,172 | 274,921 |
| 39 ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 45,736 | 45,416 | 40,839 | 42,752 | 43,841 | 42,161 | 37,350 | 36,551 | 37,767 |
| 40 විදුලි සංදේශ සේවාවන් | 70,727 | 79,288 | 87,840 | 103,325 | 118,845 | 131,952 | 140,524 | 137,403 | 143,109 |
| 41 තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 124,840 | 143,360 | 158,565 | 175,634 | 194,893 | 243,971 | 238,455 | 187,341 | 198,512 |
| 42 මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 405,268 | 439,437 | 511,418 | 510,367 | 557,357 | 596,106 | 529,744 | 475,201 | 482,557 |
| 43 රක්ෂණය, ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 91,882 | 95,004 | 111,838 | 120,550 | 117,595 | 148,658 | 78,187 | 103,519 | 89,030 |
| 44 නිවාස අයිතිය හා දේපල වෙළෙඳාම | 512,192 | 549,511 | 580,367 | 610,231 | 604,259 | 630,570 | 554,456 | 521,463 | 543,265 |
| 45 වෘත්තිමය සේවාවන් | 266,733 | 271,832 | 282,095 | 297,462 | 287,781 | 301,890 | 248,467 | 254,360 | 263,382 |
| 46 රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව | 616,412 | 589,829 | 600,932 | 605,938 | 616,176 | 621,834 | 629,031 | 618,542 | 600,314 |
| 47 අධ්‍යාපනය | 256,481 | 269,953 | 267,448 | 283,605 | 284,751 | 290,475 | 302,435 | 307,712 | 314,755 |
| 48 සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 207,484 | 219,153 | 228,368 | 235,136 | 246,735 | 260,482 | 237,677 | 236,087 | 234,358 |
| 49 වෙනත් පෞද්ගලික සේවාවන් | 988,285 | 1,017,303 | 1,032,097 | 1,052,980 | 983,900 | 992,662 | 995,147 | 998,069 | 1,012,933 |
| **සමස්ත එකතු කළ අගය (GVA) මූලික මිළ ගණන් අනුව** | **11,144,098** | **11,842,927** | **12,145,842** | **12,190,346** | **11,832,118** | **12,299,149** | **11,437,311** | **11,135,286** | **11,651,170** |
| **(+) භාණ්ඩ හා සේවා මත අය කරන බදු (-) සහනාධාර** | **1,007,442** | **1,093,685** | **1,089,616** | **1,015,930** | **763,432** | **826,356** | **723,576** | **742,270** | **821,299** |
| **දළ දේශීය නිෂ්පාදිතය (GDP) වෙළෙඳපළ මිල** | **12,151,540** | **12,936,612** | **13,235,458** | **13,206,276** | **12,595,550** | **13,125,505** | **12,160,886** | **11,877,556** | **12,472,469** |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

සටහන : 2015 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පදනම් වර්ෂය 2015 යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොට ගෙන ඇත.

## 5 සංඛ්‍යා සටහන | ඉතුරුම්, ආයෝජන සහ විදේශ අංශයෙහි තෝරාගත් දර්ශක

| අයිතමය | ඒකක | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021(අ) | 2022(අ) | 2023(අ) | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයෝජන (ෆූ) | රු. මිලි. | 1,947 | 2,409 | 3,411 | 3,189 | 3,348 | 3,415 | 3,341 | 4,211 | 5,842 | 5,427 | 5,168 | 6,467 | 6,883 | 6,741 | 8,060 |
| ඉතුරුම් (ෆූ)(ෆූ) | රු. මිලි. | 1,825 | 1,897 | 2,909 | 2,865 | 3,088 | 3,157 | 3,087 | 3,860 | 4,781 | 4,508 | 4,202 | 5,166 | 6,026 | 6,150 | 7,276 |
| ඉතුරුම් - ආයෝජන පරතරය (ෆූ) | රු. මිලි. | -121 | -511 | -502 | -324 | -259 | -259 | -254 | -351 | -1,062 | -919 | -966 | -1,301 | -858 | -592 | -785 |
| ආයෝජන (ෆූ) | ද. දේ. නි. % | 30.4 | 33.4 | 39.1 | 33.2 | 32.3 | 29.5 | 26.1 | 29.3 | 38.1 | 34.1 | 33.0 | 36.7 | 28.6 | 24.6 | 27.0 |
| ඉතුරුම් (ෆූ)(ෆූ) | ද. දේ. නි. % | 28.5 | 26.3 | 33.3 | 29.9 | 29.8 | 27.3 | 24.1 | 26.8 | 31.1 | 28.3 | 26.9 | 29.3 | 25.0 | 22.4 | 24.3 |
| ඉතුරුම් - ආයෝජන පරතරය (ෆූ) | ද. දේ. නි. % | -1.9 | -7.1 | -5.7 | -3.4 | -2.5 | -2.2 | -2.0 | -2.4 | -6.9 | -5.8 | -6.2 | -7.4 | -3.6 | -2.2 | -2.6 |
| භාණ්ඩ අපනයන | ඇ. ඩො. මිලි. | 8,626 | 10,559 | 9,774 | 10,394 | 11,130 | 10,546 | 10,310 | 11,360 | 11,890 | 11,940 | 10,047 | 12,499 | 13,106 | 11,911 | 12,772 |
| භාණ්ඩ ආනයන | ඇ. ඩො. මිලි. | 13,451 | 20,269 | 19,190 | 18,003 | 19,417 | 18,935 | 19,183 | 20,980 | 22,233 | 19,937 | 16,055 | 20,637 | 18,291 | 16,811 | 18,841 |
| වෙළඳ ශේෂය | ඇ. ඩො. මිලි. | -4,825 | -9,710 | -9,417 | -7,609 | -8,287 | -8,388 | -8,873 | -9,620 | -10,343 | -7,997 | -6,008 | -8,138 | -5,185 | -4,900 | -6,069 |
| | ද. දේ. නි. % | -8.5 | -14.9 | -13.8 | -10.2 | -10.4 | -9.9 | -10.1 | -10.2 | -11.0 | -9.0 | -7.1 | -9.2 | -7.0 | -5.9 | -6.1 |
| භාණ්ඩ හා සේවා අපනයන | ඇ. ඩො. මිලි. | 11,092 | 13,644 | 13,562 | 15,079 | 16,735 | 16,943 | 17,448 | 19,084 | 20,264 | 19,414 | 13,083 | 14,974 | 16,169 | 17,327 | 19,682 |
| භාණ්ඩ හා සේවා ආනයන | ඇ. ඩො. මිලි. | 15,210 | 22,256 | 21,678 | 21,508 | 23,142 | 23,006 | 23,442 | 25,401 | 26,841 | 24,562 | 18,271 | 21,526 | 19,244 | 19,174 | 22,317 |
| භාණ්ඩ හා සේවා අපනයන සහ ආනයන | ඇ. ඩො. මිලි. | 26,301 | 35,899 | 35,239 | 36,587 | 39,877 | 39,949 | 40,890 | 44,485 | 47,105 | 31,877 | 26,103 | 33,136 | 31,397 | 28,722 | 31,613 |
| විදේශ ප්‍රේෂණ | ඇ. ඩො. මිලි. | 4,116 | 5,145 | 5,985 | 6,407 | 7,018 | 6,980 | 7,242 | 7,164 | 7,015 | 6,717 | 7,104 | 5,491 | 3,789 | 5,970 | 6,575 |
| සංචාරක කර්මාන්තයෙහි ඉපැයීම් | ඇ. ඩො. මිලි. | 576 | 830 | 1,039 | 1,715 | 2,431 | 2,981 | 3,518 | 3,925 | 4,381 | 3,607 | 682 | 507 | 1,136 | 2,068 | 3,169 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ සේවාවන්වල ඉපැයීම් | ඇ. ඩො. මිලි. | 265 | 355 | 564 | 604 | 628 | 677 | 724 | 786 | 848 | 899 | 971 | 1,168 | 1,066 | 795 | 848 |
| ජංගම ගිණුමේ ශේෂය | ඇ. ඩො. මිලි. | -1,075 | -4,615 | -3,982 | -2,541 | -1,988 | -1,883 | -1,742 | -2,309 | -2,799 | -1,848 | -1,083 | -3,284 | -1,448 | 1,439 | 1,206 |
| | ද. දේ. නි. % (ආ) | -1.9 | -7.1 | -5.8 | -3.4 | -2.5 | -2.2 | -2.0 | -2.4 | -3.0 | -2.1 | -1.3 | -3.7 | -1.9 | 1.7 | 1.2 |
| විදේශ සෘජු ආයෝජන (ණය ඇතුළත්ව) | ඇ. ඩො. මිලි. | 516 | 1,066 | 1,382 | 1,438 | 1,635 | 1,160 | 1,078 | 1,839 | 2,071 | 1,112 | 593 | -928 | 1,151 | 707 | 736 |
| ගලා ඒම | ඇ. ඩො. මිලි. | 478 | 956 | 941 | 933 | 894 | 680 | 897 | 1,373 | 1,614 | 743 | 434 | 592 | 884 | 713 | 761 |
| ගලා යාම | ඇ. ඩො. මිලි. | 43 | 60 | 64 | 65 | 67 | 53 | 237 | 72 | 68 | 77 | 15 | 17 | 15 | 51 | 110 |
| ණය සහ අනෙකුත් | ඇ. ඩො. මිලි. | 81 | 170 | 505 | 571 | 808 | 533 | 418 | 538 | 525 | 445 | 174 | -1,503 | 282 | 46 | 85 |
| විවිධ ආයෝජන | ඇ. ඩො. මිලි. | -230 | -171 | 2,126 | 2,068 | 2,065 | 686 | 993 | 1,771 | 129 | 2,313 | 2,383 | -1,547 | 370 | 758 | 121 |
| ගලා ඒම | ඇ. ඩො. මිලි. | 819 | 452 | 2,116 | 2,068 | 2,065 | 686 | 993 | 1,771 | 129 | 2,313 | 2,383 | -1,547 | 370 | 931 | 301 |
| ගලා යාම | ඇ. ඩො. මිලි. | 1,049 | 623 | -10 | ... | -0.2 | ... | ... | ... | ... | ... | ... | ... | .... | 173 | 180 |
| මුළු සංචිත | ඇ. ඩො. මිලි. | 8,621 | 7,991 | 8,586 | 8,574 | 9,884 | 9,337 | 8,433 | 10,436 | 9,583 | 10,402 | 8,521 | 6,122 | 5,874 | 9,373 | 11,230 |
| නිල සංචිත (දළ) | ඇ. ඩො. මිලි. | 7,197 | 6,749 | 7,106 | 7,495 | 8,208 | 7,304 | 6,019 | 7,959 | 6,919 | 7,642 | 5,664 | 3,139 | 1,898 | 4,392 | 6,122 |
| මුළු විදේශ ණය | ඇ. ඩො. මිලි. | 21,438 | 32,748 | 37,098 | 39,905 | 42,989 | 44,839 | 46,418 | 51,604 | 52,412 | 54,811 | 49,041 | 51,775 | 49,667 | 54,257 | 57,133 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

... සැලකිය යුතු නොවේ.

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ෆූ) 2018 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු උපයෝගී කොට ඇත.

(ෆූ) ජාතික ඉතුරුම් පමණක් අදාල වේ.

සටහන : 2012 සිට, පරිගනක සේවා සහ විවිධ ආයෝජන දත්ත BPM6 සංස්කරණයට අනුව නිරූපනය වේ.

## 6 සංඛ්‍යා සටහන | ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය මූල්‍ය කටයුතු

රු. මිලියන

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1. ආදායම් සහ ප්‍රදාන** | **834,188** | **983,003** | **1,067,533** | **1,153,306** | **1,204,621** | **1,460,892** | **1,693,557** | **1,839,562** | **1,932,459** | **1,898,808** | **1,373,308** | **1,463,810** | **2,012,589** | **3,074,324** | **4,090,808** |
| 1.1 මුළු ආදායම | 817,279 | 967,862 | 1,051,462 | 1,137,447 | 1,195,206 | 1,454,878 | 1,686,061 | 1,831,531 | 1,919,974 | 1,890,899 | 1,367,960 | 1,457,071 | 1,979,184 | 3,048,822 | 4,030,838 |
| බදු | 724,747 | 845,697 | 908,915 | 1,005,895 | 1,050,362 | 1,355,779 | 1,463,689 | 1,670,178 | 1,712,318 | 1,734,925 | 1,216,542 | 1,298,019 | 1,751,132 | 2,720,563 | 3,704,577 |
| බදු නොවන | 92,532 | 122,165 | 142,547 | 131,552 | 144,844 | 99,099 | 222,372 | 161,353 | 207,656 | 155,974 | 151,417 | 159,052 | 228,052 | 328,259 | 326,261 |
| 1.2 ප්‍රදාන | 16,909 | 15,141 | 16,071 | 15,859 | 9,415 | 6,014 | 7,496 | 8,031 | 12,485 | 7,909 | 5,348 | 6,740 | 33,405 | 25,502 | 59,970 |
| **2. වියදම සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම්** | **1,280,206** | **1,433,182** | **1,556,497** | **1,669,396** | **1,795,866** | **2,290,394** | **2,333,883** | **2,573,056** | **2,693,228** | **3,337,896** | **3,040,996** | **3,521,735** | **4,472,556** | **5,356,591** | **6,130,739** |
| 2.1 පුනරාවර්තන | 937,094 | 1,024,906 | 1,131,021 | 1,205,180 | 1,322,899 | 1,701,657 | 1,757,782 | 1,927,692 | 2,089,714 | 2,424,582 | 2,548,359 | 2,747,512 | 3,519,633 | 4,699,679 | 5,339,941 |
| එයින් හිඟ | - | – | - | - | - | – | - | - | - | 123,428 | -123,428 | - | - | - | - |
| 2.2 ප්‍රාග්ධන සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් | 343,112 | 408,276 | 425,476 | 464,216 | 472,967 | 588,737 | 576,101 | 645,364 | 603,514 | 913,314 | 492,638 | 774,223 | 952,923 | 656,912 | 790,798 |
| එයින් රාජ්‍ය ආයෝජන | 356,519 | 422,300 | 443,973 | 481,204 | 486,610 | 602,768 | 594,012 | 657,386 | 624,969 | 631,235 | 811,773 | 789,636 | 1,014,293 | 932,745 | 817,092 |
| හිඟ | - | – | - | - | - | – | - | - | - | 299,178 | -299,178 | - | - | - | - |
| **3. වර්තන ගිණුමේ අතිරික්තය (+) හිඟය (-)** | **-119,815** | **-57,043** | **-79,560** | **-67,733** | **-127,693** | **-246,779** | **-71,721** | **-96,161** | **-169,740** | **-533,683** | **-1,180,399** | **-1,290,441** | **-1,540,448** | **-1,650,857** | **-1,309,103** |
| **4. අයවැය හිඟය** | **-446,017** | **-450,180** | **-488,964** | **-516,090** | **-591,244** | **-829,502** | **-640,326** | **-733,494** | **-760,769** | **-1,439,088** | **-1,667,688** | **-2,057,925** | **-2,459,967** | **-2,282,267** | **-2,039,931** |
| **5. අයවැය හිඟය මූල්‍යනය** | **446,017** | **450,180** | **488,964** | **516,090** | **591,244** | **829,502** | **640,326** | **733,494** | **760,769** | **1,439,088** | **1,667,688** | **2,057,925** | **2,459,967** | **2,282,267** | **2,039,931** |
| 5.1. මුළු විදේශීය මූල්‍යනය (ශුද්ධ) | 194,912 | 193,888 | 180,760 | 88,421 | 315,564 | 369,257 | 429,130 | 381,956 | 464,593 | 542,641 | -83,199 | -13,901 | 424,822 | 494,655 | 333,241 |
| දළ ණය ගැනීම් | 270,004 | 287,060 | 364,593 | 183,317 | 422,543 | 556,370 | 574,249 | 601,306 | 771,608 | 935,101 | 600,888 | 516,606 | 783,326 | 831,952 | 3,967,308 |
| ණය ආපසු ගෙවීම් | -75,092 | -93,172 | -183,833 | -94,896 | -106,979 | -187,113 | -145,119 | -219,350 | -307,015 | -572,338 | -504,209 | -530,508 | -358,505 | -337,297 | -3,634,068 |
| හිඟ | - | – | - | - | - | – | - | - | - | 179,878 | -179,878 | - | - | - | - |
| 5.2. මුළු දේශීය මූල්‍යනය (ශුද්ධ) | 251,104 | 256,291 | 308,204 | 427,669 | 275,680 | 460,245 | 211,196 | 351,538 | 296,176 | 896,448 | 1,750,887 | 2,071,826 | 2,035,145 | 1,787,612 | 1,706,691 |
| බැංකු නොවන මූල්‍යනය (ශුද්ධ) | 193,891 | 44,171 | 70,984 | 256,942 | 192,812 | 196,737 | 398,575 | 120,165 | 279,653 | 477,221 | 1,783,764 | 1,897,760 | 3,609,879 | 3,295,295 | 2,087,463 |
| දළ ණය ගැනීම් | 583,563 | 484,065 | 486,425 | 862,081 | 652,970 | 817,741 | 995,004 | 2,173,081 | 2,416,279 | 2,487,326 | 3,922,608 | 5,583,397 | 12,315,871 | 23,281,606 | 10,972,507 |
| ණය ආපසු ගෙවීම් | -389,672 | -439,894 | -415,441 | -605,139 | -460,158 | -621,004 | -596,429 | -2,052,916 | -2,136,627 | -2,010,105 | -2,138,844 | -3,685,637 | -8,705,992 | -19,986,311 | -8,885,044 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 48,875 | 25,068 | 105,693 | 140,148 | 20,971 | 222,967 | -120,516 | 53,289 | -129,461 | -49,982 | -83,771 | -68,324 | -380,069 | -350,705 | - |
| බැංකු මූල්‍යනය (ශුද්ධ) | -1,892 | 191,850 | 131,527 | 30,578 | 61,897 | 40,541 | -66,863 | 133,407 | 38,101 | 166,787 | 206,395 | 229,550 | -809,630 | -957,417 | -293,800 |
| අනෙකුත් මූල්‍යනය (ශුද්ධ)(ආ) | 10,230 | -4,798 | - | - | - | – | - | 44,677 | 107,883 | 59,694 | 87,226 | 12,840 | -385,035 | -199,562 | -86,972 |
| හිඟ | - | – | - | - | - | – | - | - | - | 242,728 | -242,728 | - | - | - | - |

මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) දේශීය ප්‍රදාන, පැවරීමෙන් ලත් මුදල් හා වෙනත් වෙළඳපළ නොවන ණය ඇතුළත්ය.

## 7 සංඛ්‍යා සටහන | ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය මූල්‍ය කටයුතු

ද.දේ.නි. % ලෙස

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1. ආදායම් සහ ප්‍රදාන** | **13.0** | **13.6** | **12.2** | **12.0** | **11.6** | **12.6** | **13.2** | **12.8** | **12.6** | **11.9** | **8.8** | **8.3** | **8.4** | **11.2** | **13.7** |
| 1.1 මුළු ආදායම | 12.7 | 13.4 | 12.0 | 11.9 | 11.5 | 12.6 | 13.2 | 12.7 | 12.5 | 11.9 | 8.7 | 8.3 | 8.2 | 11.1 | 13.5 |
| බදු | 11.3 | 11.7 | 10.4 | 10.5 | 10.1 | 11.7 | 11.4 | 11.6 | 11.2 | 10.9 | 7.8 | 7.4 | 7.3 | 9.9 | 12.4 |
| බදු නොවන | 1.4 | 1.7 | 1.6 | 1.4 | 1.4 | 0.9 | 1.7 | 1.1 | 1.4 | 1.0 | 1.0 | 0.9 | 0.9 | 1.2 | 1.1 |
| 1.2 ප්‍රදාන | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.05 | 0.03 | 0.04 | 0.14 | 0.09 | 0.20 |
| **2. වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම්** | **20.0** | **19.9** | **17.8** | **17.4** | **17.3** | **19.8** | **18.2** | **17.9** | **17.5** | **21.0** | **19.4** | **20.0** | **18.6** | **19.5** | **20.5** |
| 2.1 පුනරාවර්තන | 14.6 | 14.2 | 13.0 | 12.6 | 12.8 | 14.7 | 13.7 | 13.4 | 13.6 | 15.2 | 16.3 | 15.6 | 14.6 | 17.1 | 17.9 |
| එයින්: හිඟ | - | - | - | - | – | – | – | – | – | 0.8 | -0.8 | - | - | - | - |
| 2.2 ප්‍රාග්ධන සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් | 5.3 | 5.7 | 4.9 | 4.8 | 4.6 | 5.1 | 4.5 | 4.5 | 3.9 | 5.7 | 3.1 | 4.4 | 4.0 | 2.4 | 2.6 |
| එයින්: රාජ්‍ය ආයෝජන | 5.6 | 5.8 | 5.1 | 5.0 | 4.7 | 5.2 | 4.6 | 4.6 | 4.1 | 4.0 | 5.2 | 4.5 | 4.2 | 3.4 | 2.7 |
| හිඟ | - | - | - | - | – | – | – | – | – | 1.9 | -1.9 | - | 0.0 | 0.0 | 0.0 |
| **3. වර්තන ගිණුමේ අතිරික්තය (+) හිඟය (-)** | **-1.9** | **-0.8** | **-0.9** | **-0.7** | **-1.2** | **-2.1** | **-0.6** | **-0.7** | **-1.1** | **-3.4** | **-7.5** | **-7.3** | **-6.4** | **-6.0** | **-4.4** |
| **4. අයවැය හිඟය** | **-7.0** | **-6.2** | **-5.6** | **-5.4** | **-5.7** | **-7.2** | **-5.0** | **-5.1** | **-5.0** | **-9.0** | **-10.7** | **-11.7** | **-10.2** | **-8.3** | **-6.8** |
| **5. අයවැය හිඟය මූල්‍යනය** | **7.0** | **6.2** | **5.6** | **5.4** | **5.7** | **7.2** | **5.0** | **5.1** | **5.0** | **9.0** | **10.7** | **11.7** | **10.2** | **8.3** | **6.8** |
| 5.1. මුළු විදේශීය මූල්‍යනය (ශුද්ධ) | 3.0 | 2.7 | 2.4 | 0.9 | 3.0 | 3.2 | 3.3 | 2.7 | 3.0 | 3.4 | -0.5 | -0.1 | 1.8 | 1.8 | 1.1 |
| දළ ණය ගැනීම් | 4.2 | 4.0 | 4.2 | 1.9 | 4.1 | 4.8 | 4.5 | 4.2 | 5.0 | 5.9 | 3.8 | 2.9 | 3.3 | 3.0 | 13.0 |
| ණය ආපසු ගෙවීම් | -1.2 | -1.3 | -2.1 | -1.0 | -1.0 | -1.6 | -1.1 | -1.5 | -2.0 | -3.6 | -3.2 | -3.0 | -1.5 | -1.2 | -11.9 |
| හිඟ | - | - | - | - | – | – |  | – | – | 1.1 | -1.1 | - | 0.0 | 0.0 | 0.0 |
| 5.2. මුළු දේශීය මූල්‍යනය (ශුද්ධ) | 3.9 | 3.6 | 4.5 | 3.3 | 2.7 | 4.0 | 1.6 | 2.4 | 1.9 | 5.6 | 11.2 | 11.8 | 8.5 | 6.5 | 65.1 |
| බැංකු නොවන මූල්‍යනය (ශුද්ධ) | 3.0 | 0.6 | 2.2 | 2.7 | 1.9 | 1.7 | 3.1 | 0.8 | 1.8 | 3.0 | 11.4 | 10.8 | 15.0 | 12.0 | 66.4 |
| දළ ණය ගැනීම් | 9.1 | 6.7 | 5.6 | 9.0 | 6.3 | 7.1 | 7.8 | 15.1 | 15.7 | 15.6 | 25.1 | 31.7 | 51.2 | 84.9 | 36.7 |
| ණය ආපසු ගෙවීම් | -6.1 | -6.1 | -4.8 | -6.3 | -4.4 | -5.4 | -4.7 | -14.3 | -13.9 | -12.6 | -13.7 | -20.9 | -36.2 | -72.9 | 29.7 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 0.8 | 0.3 | 1.2 | 1.5 | 0.2 | 1.9 | -0.9 | 0.4 | -0.8 | -0.3 | -0.5 | -0.4 | -1.6 | -1.3 | 0.0 |
| බැංකු මූල්‍යනය (ශුද්ධ) | 0.0 | 2.7 | 0.7 | 0.6 | 0.6 | 0.4 | -0.5 | 0.9 | 0.2 | 1.0 | 1.3 | 1.3 | -3.4 | -3.5 | -1.0 |
| අනෙකුත් මූල්‍යනය (ශුද්ධ)(ආ) | 0.2 | -0.1 | 1.5 | - | – | – | – | 0.3 | 0.7 | 0.4 | 0.6 | 0.1 | -1.6 | -0.7 | -0.3 |
| හිඟ | - | - | - | - | – | – | – | – | – | 1.5 | -1.6 | - | - | – | - |

මූලාශ්‍ර: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) දේශීය ප්‍රදාන, පැවරීමෙන් ලත් මුදල් හා වෙනත් වෙළඳපළ නොවන ණය ඇතුළත්ය.

සටහන : 2015 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පදනම් වර්ෂය 2015 යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොට ගෙන ඇත .

## 8 සංඛ්‍යා සටහන | ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය ආදායම

රු. මිලියන

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1. බදු ආදායම** | **724,748** | **845,697** | **908,914** | **1,005,894** | **1,050,360** | **1,355,778** | **1,463,688** | **1,670,177** | **1,712,318** | **1,734,925** | **1,216,542** | **1,298,019** | **1,751,132** | **2,720,563** | **3,704,577** |
| අදායම් බදු | 135,624 | 157,310 | 172,594 | 205,666 | 198,115 | 262,583 | 258,857 | 274,562 | 310,450 | 427,699 | 268,249 | 302,115 | 534,021 | 911,355 | 1,026,199 |
| පුද්ගල සහ සාමූහික ආදායම් බදු | 78,914 | 97,814 | 98,124 | 121,136 | 122,343 | 193,531 | 182,493 | 176,508 | 211,057 | 322,047 | 243,310 | 288,977 | 513,980 | 753,198 | 862,164 |
